# ක්‍රියාකාරි විම සදහා සන්නද්ධ

# කිරිමේ ක්‍රම වේද

## භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි.
මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


| | | |
|---|---|---|
| අත්පොත භාවිත කරන ආකාරය | | 2 |
| කණ්ඩායම් වැඩ සඳහා යෝජනා | | 3 |
| හැඳින්වීම | | 6 |
| පාඨමාලාවේ අරමුණු | | 7 |
| 1. | සන්නද්ධ කිරීමද අන් පුද්ගලයන් මගින් තමා හැසිරවීමද? | 17 |
| 2. | සන්නද්ධ කිරීමේ බයිබලීය පදනම | 23 |
| 3. | දෙවියන්වහන්සේගේ ගින්න | 38 |
| 4. | දෙවියන්වහන්සේගේ තේජාලංකාරය | 55 |
| 5. | දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ පරමාර්ථය | 63 |
| 6. | දෙවියන්වහන්සේ මහිමයට පත්කරන්නේ කෙසේද? | 74 |
| 7. | දෙවියන්වහන්සේගේ තේජාලංකාරය | 84 |
| 8. | දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීම | 96 |
| 9. | නමස්කාරකරන්නන් අවශ්‍යව ඇත | 118 |
| 10. | නමස්කාර කරන්නේ කෙසේද? | 135 |
| 11. | පිබිදීම යනු කුමක්ද? | 144 |
| 12. | පැරණි ගිවිසුමේ පිබිදීම් | 161 |
| 13. | පිබිදීම පිළිබඳ බයිබලීය මූලධර්ම | 167 |
| 14. | සන්නද්ධ කරන්න | 163 |
| 15. | සන්නද්ධ වීම | 175 |
| 16. | විනිවිද යෑමේ මූලධර්ම | 181 |
| 17. | ආකෝර්වලින් පසු | 191 |
| 18. | තෙනුවරක කතන්දරය | 200 |
| 19. | දිමනා-පාදක කරගත් සන්නද්ධ කිරීම | 206 |
| උපග්‍රන්ථය | | 216 |
| ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු | | 227 |

# අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ‍ට

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණය ද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා
# පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයන්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයන්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කීපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයන් ඔවුන්ට නියමිත පරිච්ජේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ජේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ජේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ජේදයක එක් එක් කොටස සාකච්ජා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයන්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයන්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්**: ශිෂ්‍යයන් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයන් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය

**මොඩියුලය** : සන්නද්ධ කිරීම
**පාඨමාලාව** : ක්‍රියාකාරි වීම සඳහා සන්නද්ධ කිරීමේ ක්‍රමවේද

# හැඳින්වීම

"සන්නද්ධ කිරීම" යනු " ක්‍රියාකාරි සේවයක් සඳහා යම් කෙනෙකු සූදානම් තත්ත්වයකට ගෙන ඒම, යම් කෙනෙකුගේ ශක්තිය ක්‍රියාවක් සඳහා භාවිත කිරීම" වේ. "ක්‍රමවේදයක්" යනු සැලැස්මක් හෝ දර්ශනයක් සාක්ෂාත් කර ගැනීමේ පැහැදිලි ක්‍රියා මාර්ගයකි.

ලෝකයේ පෙලඹවීමේ උපක්‍රම අවධාරණය කරන්නේ තෘෂ්ණාව හා ආත්මාර්ථකාමී ඉපයීම් සඳහා මිනිසුන් හා සම්පත් මෙහෙයවන ආකාරය වේ. අන් අය "පෙලඹවීම්" සඳහා ඉල්ලීම් කේන්ද්‍රගත කර ඇත්තේ මාංසයට ප්‍රියමනාප දේ කෙරෙහිය. නැතහොත් ඒවා ලබා ගන්නේ වරදකාරි හැඟීමක් ඇති කිරීමෙන්, පීඩනයෙන් හා බලකිරීමෙනි. සන්නද්ධ කිරීම මීට වෙනස් වේ. එය බයිබලීය මූලධර්ම මත පදනම් වන අතර ඒ සඳහා පෙලඹවීම පැමිණෙන්නේ මිනිසාගෙන් නොව දෙවියන්වහන්සේගෙනි. සන්නද්ධ කිරීම දෙවියන්වහන්සේගේ සර්වබලධාරී ස්පර්ශයේ ප්‍රතිඵලයක් මිස හැඟීම් තුළින් මාංසයට කෙරෙන බාල ඉල්ලීම් නොවේ.

ඔබ මෙම පාඨමාලාවෙන් සන්නද්ධ කිරීම හා වෙනත් පුද්ගලයෙක් මගින් තමාව හැසිරවීම යන දෙක අතර වෙනස ඉගෙන ගන්නෙහිය. සන්නද්ධ කිරීමේ බයිබලීය පදනම ඔබ අධ්‍යයනය කරන අතර දෙවියන්වහන්සේගේ ගින්න, මහිමය හා නමස්කාරය දෙවියන්වහන්සේගේ සෙනඟ සන්නද්ධ කිරීම සඳහා සම්බන්ධ වන ආකාරය ඉගෙන ගන්නෙහිය. ඔබ පිබිදීමේ බයිබලීය මූලධර්ම අධ්‍යයනය කරන අතර ආත්මික දර්ශනය අත්පත් කර ගැනීමට අවශ්‍ය පෙලඹවීම පවත්වාගෙන යෑමේ වැදගත්කම ඉගෙන ගන්නෙහිය.

එමෙන්ම පොරොන්දු භූමිය වූ කානාන් දේශය ලබා ගැනීම සඳහා දෙවියන්වහන්සේගේ සෙනඟ ජෝෂුවා සන්නද්ධ කළ ආකාරයද, ජෝෂුවා පිළිබඳ බයිබලීය වාර්තාද අධ්‍යයනය කරන්නෙහිය. සන්නද්ධ කිරීම සඳහා දෙවියන්වහන්සේ යොදා ගන්නා මනුෂ්‍යයා කවර ආකාරයේදැයි ඔබ අධ්‍යයනය කරන්නෙහිය. එමෙන්ම අන් අය නිෂ්ක්‍රිය ක්‍රියාකාරිකමක් තළින් සක්‍රිය ක්‍රියාකාරිකමක් සඳහා පොලඹවා ගන්නා ආකාරයද ඉගෙන ගන්නෙහිය.

එමෙන්ම දෙවියන්වහන්සේ උදෙසා ජාතියක්, නගරයක් හෝ ගමක් තුළට ඇතුල් වීමට යොදා ගත හැකි මූලධර්මද ඉගෙන ගන්නෙහිය. "ආකෝර් මිටියාවතේ" අත්දැකීම ලත් පසු කළ යුතු දේ හා ඒ භූමියේ සිටින ආත්මික යෝධයන්ට මුහුණ දෙන ආකාරය ද ඔබ ඉගෙන ගන්නෙහිය.

මෙම පාඨමාලාවෙන් ඉදිරිපත් කෙරෙන්නේ, ලෝක ව්‍යාප්ත ආත්මික අස්වැන්න නෙළා ගැනීමේ දර්ශනය අත්පත් කර ගැනීම සඳහා ඇදහිලිවතුන් සන්නද්ධ කරගන්නා ආකාරයේ (ඔවුන්ගේ හැකියාවන් ක්‍රියා කිරීම් සඳහා යොමු කිරීම) ක්‍රම (පැහැදිලිව තේරුම් ගත හැකි මාර්ග) වේ. මෙම පාඨමාලාව "හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ" පාඨමාලා ශ්‍රේණියක කොටසක් වන අතර එය සැලසුම් කර ඇත්තේ දෙවියන්වහන්සේ විසින් තමා සේවයේ යොදා ගැනීමට කැමති හා ඒ කැමැත්ත ආශාවේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා පරිවර්තනය කිරීමට අවශ්‍ය ඇදහිලිවන්තයෙකු සඳහා වේ.

"දෘශ්‍යකරණය" ලෙස හැඳින්වෙන පළමුවන මොඩියුලයෙන් සියලු සැබෑ ඇදහිලිවතුන් කැඳවා ඇති ආත්මික කෙත්වතු පිළිබඳ දර්ශනය ගැන ශිෂ්‍යයන්ට අභියෝග කර ඇත. "නියෝජනය කිරීම" නමැති දෙවන මොඩියුලයේ අස්වැන්න නෙළාගන්නා කෙනෙකු වීමට අවශ්‍ය ආත්මික පදනම, පාඨමාලා බොහොමයක් මඟින් තහවුරු කෙරේ.

"ගුණනය කිරීම" නමැති තෙවන මොඩියුලයෙන් ශිෂ්‍යයන්ට ඔවුන් ගුණ කරමින් අන් අය සමඟ තමා උගත් දේ බෙදා ගනිමින් ආත්මික පිටපත් ඇති කිරීමට අභියෝග කෙරේ.

"සංවිධානය කිරීම" ලෙස හඳුන්වා ඇති සතරවන මොඩියුලය, "ගුණනය කිරීමේ" ප්‍රතිඵලයක් ලෙස වැඩි වර්ධනය වීමේ ආත්මික සම්පත් සංවිධානය කරන ආකාරය පැහැදිලි කෙරේ. ඊළඟට ඇත්තේ " සන්නද්ධ කිරීමේ" නමැති මෙම මොඩියුලය වේ. ඉන් දෙවියන්වහන්සේ උදෙසා ආත්මික

බලවේග එක්රැස් කිරීමේ ක්‍රම ඉදිරිපත් කෙරෙන අතර සේවයේ සුවිශේෂී ක්ෂේත්‍රයන් වෙත භාවස්ටයිම් දර්ශනය ප්‍රායෝගිකව යොදා ගැනීම පැහැදිලි කෙරේ.

මීට පෙර ඇති සියලුම භාවස්ටයිම් පාඩමාලා ඉතා වැදගත් වේ. පදනමක් නොමැතිව ඔබ සන්නද්ධ කිරීමට උත්සාහ කළහොත් ඔබට ඇත්තේ අවබෝධයක් නොමැති උනන්දුවකි. සෙනඟ නොමැතිව ඔබට සන්නද්ධ කිරීමට නොහැකිය. ගුණනය කිරීම වැදගත් වන්නේ එබැවිනි. සංවිධානය නොකර ඔබ සන්නද්ධ කිරීමට උත්සාහ කළහොත් ඔබට නිසි සැලැස්මක් නැති ක්‍රියාවක් ඇත.

කිතුනු සේවයේ බොහෝ අවස්ථාවල අපගේ උපරිමය දෙවියන්වහන්සේට ඔප්පු කර එය ප්‍රමාණවත්යයි අපි සිතමු. අපගේ උපරිමය කිසිදා ප්‍රමාණවත් නොවේ. සංවිධානය ප්‍රමාණවත් නැත. ආත්මික පිටපතක් ඇති කිරීම ප්‍රමාණවත් නැත. ඉතා හොඳ දේවවේදිය පදනමක් වුවද ප්‍රමාණවත් නොවේ. අපගේ උපරිමය දිය යුතු බව සැබවි. එහෙත් අප දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ශුද්ධ ගින්න, මහිමය හා ආත්මික පිබිදීම එක් කරන පිණිස උන්වහන්සේ දෙස බැලිය යුතුය. අපගේ පුහුණුව, අත්දැකීම් හා සංවිධානය කෙරෙහි අප රඳා නොපැවතිය යුතුය. ඒ වෙනුවට අප කරන වැඩ කෙරෙහි දෙවියන්වහන්සේගේ ස්පර්ශය ගැන විශ්වාසය තැබිය යුතුය. අස්වැන්න නෙළා ගන්නන් ලෙස අස්වැන්න නෙළා ගැනීමට අප සන්නද්ධ වන්නේ එවිට පමණි.

> **"රත්නිල් වස්ත්‍ර සහ සිහින් රෙදි ඇන්දාවූ දවස්පතා සැපජීවිකාවෙන් කාලය ගත කළාවූ එක්තරා ධනවතෙක් සිටියේය." (ලූක් 16:19)**
>
> **"අපේ දෙවිවූ ස්වාමීන්ගේ අලංකාරය අප කෙරෙහි වේවා. අපේ අත්වල වැඩ අප කෙරෙහි ස්ථිර කළ මැනව: එසේය අපේ අත්වල වැඩ ස්ථිර කළ මැනව." (ගීතාවලිය 90:17)**

# පාඨමාලාවේ අරමුණු

මෙම පාඨමාලාව අවසන් කිරීමෙන් පසු ඔබට

- සන්නද්ධ කිරීම නිර්වචනය කිරීමට
- සන්නද්ධ කිරීම හා වෙනත් පුද්ගලයෙක් මගින් තමා හැසිරවීම අතර වෙනස පැහැදිලි කිරීමට
- සන්නද්ධ කිරීම හා ශුභාරංචිය පැතිරවීම අතර සබඳතාව පැහැදිලි කිරීමට
- සන්නද්ධ කිරීමේ බයිබලීය පදනම සාරාංශ කිරීමට
- පහත දැක්වෙන සන්නද්ධ කිරීමේ සෑම ආත්මික බලවේගයක්ම සාකච්ඡා කිරීමට
    - දෙවියන්වහන්සේගේ ගින්න
    - දෙවියන්වහන්සේගේ මහිමය
    - දෙවියන්වහන්සේ නමස්කාර කිරීම
    - දෙවියන්වහන්සේ වෙතින් පැමිණෙන පිබිදීම
- ආත්මයෙන් හා සැබෑකමින් නමස්කාර කිරීම යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කිරීමට
- දෙවියන්වහන්සේට අප නමස්කාර කළ යුතු අන්දම සාකච්ඡා කිරීමට
- පිබිදීමේ බයිබලීය මූලධර්ම හඳුනා ගැනීමට
- නිෂ්ක්‍රිය අය සන්නද්ධ කරන ආකාරය පැහැදිලි කිරීමට
- අසාර්ථකත්වයට මුහුණ දෙන ආකාරය පැහැදිලි කිරීමට
- ජෝෂුවා පොතේ සඳහන් ඇතුල් වී අත්පත් කර ගැනීම පිළිබඳ බයිබලීය මූලධර්ම හඳුනා ගැනීමට
- අන් අය සන්නද්ධ කිරීම සඳහා අවශ්‍ය ගති ලක්ෂණ හඳුනා ගැනීමට
- ආත්මික දීමනා පදනම් කරගෙන ඔබගේ සභාව සන්නද්ධ කිරීමට හැකිවනු ඇත.

# පළමුවන පරිච්ජේදය

## සන්නද්ධ කිරීමද අන් පුද්ගලයන් මගින් තමා හැසිරවීමද?

### අරමුණු

මෙම පරිච්ජේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "අන් පුද්ගලයන් මගින් තමා හැසිරවීම" නිර්වචනය කිරීමට
- " සන්නද්ධ කිරීම" නිර්වචනය කිරීමට
- ආත්මික සන්නද්ධ කිරීම හා අන් පුද්ගලයන් මගින් තමා හැසිරවීම අතර වෙනස පැහැදිලි කිරීමට
- නිෂ්ක්‍රිය හා සන්නද්ධ කරන ලද පුද්ගලයෙකු අතර වෙනස පැහැදිලි කිරීමට
- සන්නද්ධ කිරීම හා ශුභාරංචිය පැතිරවීම අතර සබඳතාව සාරාංශ කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**නුමුත් යේසුස්වහන්සේ ඔවුන් තමන් ළඟට කැඳවා, අන්‍යජාතීන්ගේ ආණ්ඩුකාරයන් ඔවුන් කෙරේ අධිපතිකම් කරන බවත් ඔවුන්ගේ උත්තමයන් ඔවුන් කෙරේ බලය පත්වන බවත් නුඹලා දනිහුය. නුඹලා අතරේ එසේ නොවන්නේය. නුඹලා අතරේ යමෙක් උතුම් වෙන්ට කැමතිනම් ඔහු නුඹලාගේ සේවකයා වන්නේය. (මතෙව් 20: 25,26)**

### හැඳින්වීම

"ඕනෑම ව්‍යාපාරයක සාර්ථක පැතිරීම සැමවිටම එහි විශ්වාසයන් පරමාර්ථයන් හා දර්ශනය නිරන්තරයෙන් ප්‍රචලිත කිරීම සඳහා එහි සාමාජිකයන් සියලු දෙනාවම සහභාගි කර ගැනීමට හා සන්නද්ධ කිරීමට ඇති හැකියාවට අනුලෝමව සමානුපාතික බව" පැවසේ.

අරමුණක් අත්පත් කර ගැනීමට හා දර්ශනයක් සම්පූර්ණ කර ගැනීමට නම් ඔබ ක්‍රියා කළ යුතුය. ඔබ සැලසුම් හා වැඩසටහන් ඇතිව පමණක් වැඩ කළහොත් ඔබට සංවිධානයක් ඇත. එහෙත් ඔබ සෙනඟ ක්‍රියාවේ යෙදීමට සන්නද්ධ කළහොත් ඔබට ජීවයක් සහිත කණ්ඩායමක් ඇත. එමෙන්ම එම ජීවී කණ්ඩායමේ සෑම කෙනෙක්ම දර්ශනයක් අත්පත් කර ගැනීමේ කොටස්කරුවෙක් වන්නේය.

පිටස්තර සන්නද්ධ කිරීම අභ්‍යන්තර පෙලඹවීමේ ප්‍රතිඵලයකි. සෑම කෙනෙක්ම යම් දෙයක් කිරීමට පෙලඹෙති. ඵලදායි දේව සේවයේ වැදගත් දෙයක් වන්නේ දේව සේවයේ කටයුතු සඳහා දෙවියන්වහන්සේගේ සෙනඟ සන්නද්ධ කිරීම හා පෙලඹවීම වේ.

### අන් පුද්ගලයන් මගින් තමා හැසිරවීම

සන්නද්ධ කිරීමේ ලෞකික උපක්‍රමික කේන්ද්‍රගත වන්නේ ස්වයං වාසිය සඳහා සෙනඟ හැසිරවීම මතය. "හැසිරවීම" යනු "ආත්මාර්ථකාමී පරමාර්ථයන් සඳහා යම් පුද්ගලයෙකු දක්ෂ ලෙස පාලනය කිරීම හෝ යොමු කිරීම වේ". හසුරුවන්නෙකු අන් අය තමාගේ අරමුණු ඉටු කිරීමට "ද්‍රව්‍ය" ලෙස භාවිත කරයි. සූරාකයි.

මෙවැනි හැසිරවීමකදී සෙනඟ සන්නද්ධ කිරීමේ ප්‍රයත්නය කේන්ද්‍රගත වන්නේ මාංසයට ලැදි දේ කෙරෙහිය. යම් කෙනෙකුට ඔහුගේ ආත්මාර්ථකාමී අරමුණු, අවශ්‍යතා හෝ ආසාවන්, යම් ක්‍රියාවක් මඟින් ඉටු කරගැනීමට හැකි බවට ඒත්තු ගන්වනු ලැබේ. ඔහු අන් අයගේ අවධානය සහ

ප්‍රශංසාව මත ශක්තිමත් වේ. ඔහු තත්ත්වය හා මට අයත්ය යන හැඟීම සඳහා වෙහෙසෙයි. බොහෝ විට මුල්‍යමය හා ද්‍රව්‍යමය වාසි ඇතුලත් වේ. මේවා ඔහු ක්‍රියාවට යෙදවීමේ අභ්‍යන්තර පෙලඹවීම් සමහරකි.

අන් පුද්ගලයන් මගින් කරන හැසිරවීම අවශ්‍යතා පදනම් වූවකි. නායකයා යම් අවශ්‍යතාවක් දකින අතර එම අවශ්‍යතාව ඉටු කරගැනීමට සෙනඟ හා සම්පත් හසුරුවයි. ඔබගේ "පෙලඹවීම අවශ්‍යතාව" අනුව නම් ඔබ "අවශ්‍යතා මඟින් පාලනය වෙන්නෙකු" බවට පත්වෙයි. සෙනඟ ඔවුන්ගේ අවශ්‍යතාවන් ඉටු කරගැනීම සඳහා ඔබ පාලනය කරනු ඇත. හසුරුවනු ඇත.

මූලිකවම අන් පුද්ගලයන් මගින් කරන හැසිරවීමේ ක්‍රම දෙකක් තිබේ. එකක් "බල කිරීමේ හැසිරවීමකි". එය එහි බලය ලෙස බිය කිරීම යොදා ගනී. අනෙක "ඇදීමේ පෙලඹවීමකි". එය ප්‍රතිලාභ ලෙස මාංසික පෙලඹවීම් යොදා ගනී. දේව රාජ්‍යයේ වැඩකටයුතුවල නියැලීම උදෙසා ඇදහිලිවතුන්ට බල කිරීමට හෝ ඔවුන්ව ඇදීමට හෝ සිදුවන්නේ නම් යම් කිසි වැරැද්දක් ඇති බව පැහැදිලිය.

අන් පුද්ගලයන් මගින් කරන හැසිරවීමේදී මිනිසුන්ට බොහෝ විට සලකන්නේ පක්ෂපාතීත්වයෙන් වන අතර ඇතැම්විට නායකයෝ නොයෙකුත් දේ කර ගැනීම සඳහා තර්ජනය කිරීම් වරදකරුවන් බව හැඟවීම හා බලය යොදා ගනිති. එහෙත් එසේ නොකරන ලෙස බයිබලය ආත්මික නායකයන්ට අනතුරු අඟවයි.

> **ස්වාමිවරුනි, නුඹලාගෙත් ඔවුන්ගෙත් ස්වාමින්වහන්සේ ස්වර්ගයෙහි සිටින බවද උන්වහන්සේ මනුෂ්‍යයන්ගේ තරාතිරම් නොබලන බවද දැන, තර්ජන කිරීමෙන් වැලකී ඔවුන්ට එම දේවල් කරන්න. (එපීස 6:9)**

මින් අදහස් වන්නේ ඔබ මඟ පෙන්වන අයට දෙවියන්වහන්සේ ඔබට දක්වන සබඳතාවම ඔබ ඔවුන්ට දැක්විය යුතු බවය.

"කොඩිවින" මාංසික තෘෂ්ණාවල පල විපාකයක් බව ගලාති 5:20හි සඳහන් කර ඇත. මෙම කොටසෙහි කොඩිවින, සාතන්ගේ අනුගාමිකයන් වන යක්ෂයන්ගේ නපුරු ක්‍රියාවක් ලෙස පමණක් නොව තමාගේම ආසාවන් හා පරමාර්ථයන් උදෙසා අන් අය මාංසිකව "හැසිරවීමක්" ලෙසද පෙන්වයි.

එවැනි ලෞකික ක්‍රම හා නායකත්ව භාවිත නොකරන ලෙස යේසුස්වහන්සේ ඇදහිලිවතුන්ට අවවාද කර ඇත.

> **නුමුත් යේසුස්වහන්සේ ඔවුන් තමන් ළඟට කැඳවා, අන්‍යජාතීන්ගේ ආණ්ඩුකාරයන් ඔවුන් කෙරේ අධිපතිකම් කරන බවත් ඔවුන්ගේ උත්තමයන් ඔවුන් කෙරේ බලය පත්වන බවත් නුඹලා දනිහුය. නුඹලා අතරේ එසේ නොවන්නේය. නුඹලා අතරේ යමෙක් උතුම් වෙන්ට කැමතිනම් ඔහු නුඹලාගේ සේවකයා වන්නේය. (මතෙව් 20: 25,26)**

## සන්නද්ධ කිරීම

ඇදහිලිවතුන් අන් පුද්ගලයන් මගින් හසුරුවනු ලැබීම හෝ අන් පුද්ගලයන් හසුරුවන අය හෝ නොවිය යුතුය. එහෙත් ඔවුන් සන්නද්ධ කළ යුතුය. දෙවියන්වහන්සේ සෑම විටම ක්‍රියා කර ඇත්තේ ක්‍රියා කිරීම සඳහා පෙලඹවීම ලද මනුෂ්‍යයන් තුළිනි. බයිබලීය වාර්තාවන් පුරාම උන්වහන්සේ භෞතික ආත්මික හා මූල්‍යමය සම්පත් සිය සැලසුම් හා පරමාර්ථයන් අත්පත් කර ගැනීම සඳහා සන්නද්ධ කරන ලෙස පවසා ඇත.

"සන්නද්ධ කිරීම" යනු "ක්‍රියාකාරී සේවයක් සඳහා යම් කෙනෙකු සූදානම් තත්ත්වයකට ගෙන ඒම, යම් කෙනෙකු ගේ ශක්තිය ක්‍රියාවක් සඳහා භාවිත කිරීම" වේ. පුළුල්ව බැලූවිට සන්නද්ධ කිරීම යන්නෙන් දක්වන්නේ, ලෝකයා ඉවැන්ජලිස්ත කිරීමේ කාර්යය සම්පූර්ණ කිරීමට තමාගේ උපක්‍රමික ස්ථානය සොයාගන්නා තුරු දෙවියන්වහන්සේගේ සෙනඟ අවදි කරන, සිත් යොමු කරන හා වර්ධනය වන සිද්ධියකට වේ.

ආත්මික සන්නද්ධ කිරීම අන් පුද්ගලයන් මගින් හැසිරවීමට වඩා වෙනස් වේ. මන්ද එය පදනම් වන්නේ බයිබලීය මූලධර්ම මත වන අතර එහි පෙලඹවීම කේන්ද්‍රගත කර ඇත්තේ මනුෂ්‍යයා වෙත නොව දෙවියන්වහන්සේ වෙත බැවිනි. එය මාංසය මත හෝ තමා වෙත කේන්ද්‍ර ගත කර ගෙන නැත. එය අවශ්‍යතා මුල් කර ගත් සේවයක් නොව නියෝග මුල් කර ගත් සේවයකි.

නිදසුනක් ලෙස යේසුස්වහන්සේ බෙත්සෙයිදා පොකුණ වෙත පැමිණි විට එතැන කොරවූ හා නොයෙකුත් අසනීපවලින් පෙළෙන අය රාශියක් සිටියහ. එහෙත් යේසුස්වහන්සේ සුව කළේ එක්කෙනෙකු පමණි. යේසුස්වහන්සේ අවශ්‍යතා මුල් කර ගත් කෙනෙකු නොව නියෝග මුල් කර කෙනෙකු වූ සේක. උන්වහන්සේ අන් අය කෙරෙහි අනුකම්පාවක් නොතිබූ බවක් මින් අදහස් නොවේ. එහෙත් දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේට මඟ පෙන්වූයේ මේ මිනිසාට සේවය කිරීම සඳහා වේ.

ඔබ සේවයේදී අවශ්‍යතා මුල් කර ගත් කෙනෙකු වුවහොත් ඔබ වටා ඇති අවශ්‍යතාවලින් ඔබ යටවී යනු ඇත. අවසානයේදී ඔබ අවශ්‍යතා මගින් පාලනය වන කෙනෙකු වනු ඇත. ඔබගේ ජීවිතය හා සේවය මනුෂ්‍යයන්ගේ අවශ්‍යතාවලින් පාලනය කෙරෙනු ඇත. ඒවා මඟින් ඔබව හසුරුවන අතර ඔබ මෙම අවශ්‍යතා සපුරාලීම පිණිස හසුරුවන්නෙකු බවට පත්වන්නෙහිය.

ඔබ අවශ්‍යතා මුල් කර ගත් කෙනෙකු නොව නියෝග මුල් කර කෙනෙකු වුවහොත් ඔබගේ සේවය මනුෂ්‍යයා වෙත යොමු කරන්නක් නොව දෙවියන්වහන්සේ වෙත යොමු කරන්නක් වනු ඇත. ඔබ පොලඹවනු හා සේවයේ යොදවනු ලබන්නේ දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයාගේ අවශ්‍යතා මඟින් හා ඔවුන්ගේ හැසිරවීමෙන් නොවේ.

## නිෂ්ක්‍රිය හා සන්නද්ධ වූ අය

සන්නද්ධ වූවන් යන්නෙහි විරුද්ධාර්ථය වන්නේ නිෂ්ක්‍රිය වූවන් වේ. ඔබ අක්‍රිය ඇදහිලිවන්තයන් පෙලඹවීමට යන්නෙහි නම් මේ දෙක අතර වෙනස දැනගැනීම වැදගත් වේ.

### නිෂ්ක්‍රිය පුද්ගලයෙක් :

"නිෂ්ක්‍රිය වීම" යන්නෙන් අදහස් වන්නේ, "නොසැලකිලිමත් වීම, අක්‍රිය වීම, ප්‍රතිචාරයක් නොදැක්වීම, උදාසීන වීම, හැඟීමක් නොමැති වීම" ආදිය වේ. මනුෂ්‍යයන් නිෂ්ක්‍රිය වීමට දෙවියන්වහන්සේගේ වැඩ ගැන උදාසීන වීමට, උනන්දු නොවීමට හා ඒවායේ නොයෙදීමට හේතු සමහරක් පහත දැක්වේ.

- ඔවුහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමීත්වය යටතේ නොවෙති.
- ඔවුන් ශ්‍රේෂ්ඨ පැවරීමේ අදහස ග්‍රහණය කර ගෙන නොමැත.
- ඔවුහු ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ ඔවුන්ගේ කොටස නොදනිති.
- ඔවුන්ට අරමුණක්, දර්ශනයක් හෝ මඟ පෙන්වීමක් නොමැත.
- ඔවුන්ට එක් දර්ශනයක් නොමැත. (කළ යුතු බොහෝ දේ ඔවුන් දකිති. ඔවුන්ගේ භූමිකාව පිළිබඳ පැහැදිලි දර්ශනයක් ඔවුන්ට නැත. එබැවින් ඔවුන් අධෛර්යයවත් වී කිසිවක් කරන්නේ නැත.)
- ඔවුහු ලෝකයේ අපේක්ෂාවන් හා ඇලීම්වල ගැලී සිටිති.
- ඔවුන්ගේ සහභාගිවීමට ඇති කැමැත්තෙන් අන් අය ප්‍රයෝජන ගනීවි යයි ඔවුහු බිය වෙති.
- ඔවුන්ගේ සහභාගිවීම සියලු දේ කරන අධිකාරීත්ව නායකත්වය මඟින් වළක්වාලයි. මෙය දෙවියන්වහන්සේගේ කාර්යයයෙහි සියලු සාමාජිකයන් සහභාගි වන "ක්‍රිස්තු දේහ" සේවයක් වෙනුවට "පෞද්ගලිකත්වය මත පදනම් වූ" සේවයකි. (පාලකතුමා හෝ ආත්මික නායකයා හෝ තනිවම වැඩ නොකළ යුතුය. සේවයේ කටයුතු සඳහා සාමාජිකයන් සහභාගි කර ගත යුතුය.)

- ඔවුහු අතීතයේ ජීවත් වෙති. "ලොත්ගේ භාර්යාව මතක් කරන්නැ"යි බයිබලය අනතුරු අඟවයි. "ඒ කෙතරම් සුන්දර කාලයක්ද!" හෝ "එකල මේවා සිදුවූයේ කෙසේද?" ආදී වශයෙන් සිතමින් ආපසු බැලීමෙන් වර්තමානයේ ක්‍රියාකිරීම වළකී.
- ඔවුහු මාංසයේ ගමන් කරති. යම් කෙනෙක් මාංසයේ ගමන් කරන විට ඔහුට ආත්මික ඉලක්ක සපුරාලිය නොහැකිය. "මා කරන්නට කැමති දේ" (රෝම 7:15) මාංසය වළක්වයි. මාංසයේ ගමන් කරන බවට ලක්ෂණ වන්නේ කලකිරීම්, බෙදීම් හා නොවිසඳුණු ගැටුම් වේ. මේවා හා මේ සමාන හැසිරීම් නිසා මනුෂ්‍යයෝ දේව රාජ්‍යයේ අක්‍රිය වෙති.
- දෙවියන්වහන්සේගේ ආලේපය, උන්වහන්සේගේ ගින්න, මහිමය හා පිබිදීම ගලා යෑමට පාපය බාධා කරයි. මේවා ඇදහිලිවතුන් ක්‍රියාවේ යොදවන ආත්මික බලවේග නිසා නිරන්තරයෙන් පාපයේ ගැලී සිටින අයගේ පෙලඹවීම ඉක්මණින්ම නැතිවේ.
- අධෛර්යයට පත් වීම, නිෂ්ක්‍රිය වීමට හේතු වේ. අධෛර්යයට පත්වූ පුද්ගලයෙකුගේ මනස වැසී ඇත. ඔහුට බලය, පාලනය හා තමාට ආගා පරිදි වැඩ කිරීම අවශ්‍යය. ඔහු පෞද්ගලික වගකීම් මඟ හරියි. ප්‍රශ්න සඳහා අන් අයට දොස් පවරයි. පළිගැනීමට කැමතිවේ. ඔහු අස්ථායිය. පක්ෂපාති නොවේ. (මෙම පාඩමේ "තව දුරටත් අධ්‍යයනය සඳහා" කොටස බලන්න.)
- "වෘත්තිමය" ආකල්පයක් ඇත. මෙය, නවීන සහා යුගයේ මිනිසුන් අක්‍රිය කරවන ගැටලුවකි. "කුළියක් ගෙවා එය කරවමු" යයි කියන්නේ මෙම වෘත්තිමය ආකල්පය වේ.

## නිෂ්ක්‍රිය සෙනඟ

නිෂ්ක්‍රිය පුද්ගලයන්ගේ ප්‍රතිඵලය වන්නේ සාමූහික නිෂ්ක්‍රිය සෙනඟක් වේ. මූලිකවම නිෂ්ක්‍රිය සභාව එළිදරව්ව 3:1 හි සඳහන් සර්දිස් සභාවේ විස්තරය හා ගැළපේ. "නමින් ඔබ ජීවත්ව සිටියත් සැබවින්ම ඔබ මළ කෙනෙකි". නිෂ්ක්‍රිය සභාව සඳහා "සැසඳුම් ලැයිස්තුවක්" පහත දැක්වේ. ඔබේ සභාව මේ අනුව කෙසේදැයි බලන්න.

- සභාවෙහි බඩුබාහිරාදිය භෞතිකව රැකබලා ගැනීම සාමාන්‍ය තත්ත්වයට වඩා පහත් මට්ටමක පවතින අතර "මට කමක් නැත" වැනි ආකල්පයක් තිබේ.
- සභාවේ වැඩකටයුතු පාලකතුමා හෝ වැටුප් ලබන කාර්යය මණ්ඩලය හෝ මත බොහෝ දුරට රඳා පවතී.
- වර්තමානයට වඩා "යහපත් පැරණි දවස්" හොඳ බවට විශ්වාස කරන බැවින් අතීතය දෙස ප්‍රබල ලෙස බලයි.
- සභා සාමාජිකත්වය අඩුවෙමින් පවතී.
- අක්‍රිය සාමාජිකයෝ බොහෝ සිටිති.
- වැඩිහිටියන් අක්‍රියව සිටින අතර අවධානය යොමුවන්නේ සංගීතය, ළමයින් හා තරුණයන් වෙත වේ.
- තීරණ ගැනීමෙහිදී ඇදහිල්ලේ පියවරවලට වඩා ආර්ථිකය වැදගත් වේ.
- සාමාජිකයන් පාලකතුමා හා කාර්යය මණ්ඩලය අතර සන්නිවේදනය දුර්වලය.
- පැමිණීම අඩුවීමෙන් පෙන්වන්නේ හැඟීම් පහත මට්ටමක ඇති බවය.
- ඉවැන්ජලිස්ත සේවයට ලැදිකමක් නැත.
- ප්‍රතිපත්ති සකස් කරන්නන් හා ක්‍රියාකාරී සාමාජිකයන් වැඩි වශයෙන්ම සභාවේ ආරම්භකයෝ හෙවත් "පැරණි අය" වෙති.
- දේවගැතිතුමා තම සේවය දෙස බලන්නේ අනාගතය උදෙසා නොව අතීතයේදී මෙනි.
- තම දේවගැතිතුමා වෙනුවට "සුපිරි පාලකතුමෙකු" ලබා ගත හැකිනම් තම ගැටලු සියල්ල විසඳෙනු ඇති බවට සමූහනය සිතති.
- සමූහනයේ පාලක මණ්ඩලය (මන්ත්‍රණ සභාව ආදිය) තම මූලික කටයුත්ත ලෙස දකින්නේ, මෙය කළ නොහැකි බව පවසන අවසර නොදීමේ ක්‍රියාව වේ. (ක්‍රියාකාරී සභාවක පාලන

මණ්ඩලය, නවෝත්පාදන, නිර්මාණ, ඇදහිල්ලේ පියවර ආදිය දිරිගන්වන අතර හැකි සෑම අවස්ථාවකම අවසර දීමට මිස නොදීමට උත්සාහ නොකරයි.)

- අලුත් සැලසුම් "එය මෙහි කළ නොහැකිය" බවට තර්ක ඉදිරිපත් කරමින් වළක්වාලයි.
- වැඩි වශයෙන් අවධාරණය කෙරෙන්නේ ඉගෙනීම මිස කිරීම නොවේ.
- සමූහනයේ පස් දෙනෙකුගේ නම්වත් සාමාන්‍ය සාමාජිකයෝ නොදනිති.
- සිදුවන හෝ සිදු නොවන දේ ගැන සෙනඟ විවේචනය කරති.
- අලුත් සාමාජිකයන්ට තමා අයත් බව හෝ අවශ්‍ය බව හෝ නොහැඟේ.

මේ සියලුම කරුණුවලින් පෙන්නුම් කෙරෙන්නේ නොසැලකිල්ල හැඟීමක් නැති බව හා සහභාගිවීමක් නොමැති බව වේ.

## සන්නද්ධ කරන ලද පුද්ගලයෙක්

සන්නද්ධ කරන ලද පුද්ගලයෙක් සැමවිටම ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟ පෙන්වීම අනුව සැකසෙයි. එමෙන්ම ප්‍රතිචාර දක්වයි. ඔහු තමාගේම ආත්මාර්ථකාමී ක්‍රම අනුගමනය නොකරයි. ඔහු ඔහුගේ ආත්මික භාජනය (ඔහුගේ සම් භාජනය) "අලුත් මිදියුස" සඳහා සූදානම් කර ඇත. (දෙවියන්වහන්සේ කරන අලුත් දේවල්). සන්නද්ධ කරන ලද පුද්ගලයෙක් සැමවිටම ස්වයං-යැපෙන්නෙකුට වඩා දෙවියන්වහන්සේ මත යැපෙන්නෙක් වේ. ඔහු පොලඹවන්නේ ආත්මිකව මිස මාංසිකව නොවේ. ඔහු දෙවියන්වහන්සේගේ වැඩ ගැන උදෙන්ගිමත් වන අතර දේව රාජ්‍යයේ කටයුතුවල නිරත වෙයි.

සන්නද්ධ කරන ලද පුද්ගලයෙක් ක්‍රියා කිරීමට කැමති වෙයි. ඇදහිල්ලෙන් අවදානම් දේ වුවද කරයි. තම ක්‍රියාවන් වෙනුවෙන් වගකීම භාර ගනී. සන්නද්ධ කරන ලද පුද්ගලයෙක් ස්ථායි වේ. පක්ෂපාති වේ. අර්බුද ඇතිවිට පළිගැනීම වෙනුවට විසඳුමක් සොයයි. ඔහු අවශ්‍යතා මුල් කර ගත් කෙනෙකු නොව නියෝග මුල් කර ගත් කෙනෙක් වේ. ඔහු අන් අය බලෙන් හසුරුවන්නේ හෝ ඔවුන්ගෙන් අයුතු ප්‍රයෝජන ගන්නේ හෝ නොවේ. ඔහු සානුකම්පිතය. ප්‍රේමණීයය. එමෙන්ම දේව රාජ්‍යයේ කටයුතුවලට සහභාගි වෙයි. උදෙන්ගිමත් වෙයි.

## සන්නද්ධ කරන ලද සෙනඟ

මෙම පාඩමේ කලින් සඳහන් කළ නිෂ්ක්‍රිය සභාවක ලක්ෂණ නැවත බලන්න. මේ සෑම ලක්ෂණයකම ප්‍රතිවිරුද්ධ දේ ගැන සිතන්න. මේ සෑම හැසිරීමකම ප්‍රතිවිරුද්ධ දේ සන්නද්ධ කරන ලද පෙලඹවීමක් ඇති සභාවක් විස්තර කරයි.

සන්නද්ධ කරන ලද සභාවක් ආත්මිකව අලුත් වී ඇත. සන්නද්ධ කරන ලද සභාවක් පොලඹවීමක් ලද ප්‍රේමයෙන් ඇවිලෙමින් හා දෙවියන්වහන්සේ නොදන්නා අය වෙනුවෙන් අනුකම්පාවෙන් පිරී සභාවකි. එය සමන්විත වන්නේ ශ්‍රේෂ්ඨ පැවරුම සාක්ෂාත් කිරීමට ක්‍රියාකාරීව සම්බන්ධවන සෙනඟ කණ්ඩායමකිනි. එයට ඇත්තේ නිකායයන් පිළිබඳ මානසිකත්වයක් නොව දේව රාජ්‍යය පිළිබඳ මානසිකත්වයකි. එය නමස්කාර කරන දෙවියන්වහන්සේගේ මහිමයෙන් හා බලයෙන් පූර්ණවූ පිබිදුණු සභාවකි.

# සන්නද්ධ කරන්නෙකුගේ ගුණාංග

ශ්‍රීමත් අයිසැක් නිව්ටන් නමැති ප්‍රසිද්ධ විද්‍යාඥයෙක් සිටියේය. ඔහු චලිතය පිළිබඳ නියම අධ්‍යයනය කර වාර්තා කළේය.

"චලිතයේ යෙදෙන වස්තුවක් චලිතයේ යෙදී සිටීමටම උත්සාහ කරන අතර නිශ්චලතාවයේ ඇති වස්තුවක් නිශ්චලව සිටීමටම උත්සාහ කරයි."

මෙය ආත්මිකවද සැබෑවකි. දේව රාජ්‍යයේ වැඩ උදෙසා පෙලඹවූයේ හා සන්නද්ධ කළේ නොමැති නම් මනුෂ්‍යයන් උදාසීනව, කිසිදු හැඟීමක් නොමැතිව අක්‍රියව සිටිනු ඇත.

"සන්නද්ධ කරන්නෙකුගේ" සේවය අවශ්‍ය වන්නේ මෙවිට වේ. සන්නද්ධ කරන්නෙකු යනු අන් අයව සන්නද්ධ කරන්නෙකු විය යුතුය. එහෙත් එසේ කිරීමට නම් පළමුව තමාව සන්නද්ධ කර සිටිය යුතුය. එවිට සන්නද්ධ කරන්නෙකු බලෙන් හෝ බිය ගැන්වීමෙන් හෝ නොව ආදර්ශයෙන් හා දිරිමත් කිරීමෙන් අන් අය සන්නද්ධ කරනු ඇත.

ශ්‍රේෂ්ඨ පැවරුමේ සුවිශේෂිය කාර්යය කෙරෙහි සන්නද්ධ කරන්නෙකු කැපවී සිටී. ඔහු තමාගෙන් ද තම පෞද්ගලික හා ආත්මාර්ථකාමී අවශ්‍යතාවලින් ද බැහැරව කටයුතු කරයි. ඔහු සංවිධානයකට හෝ නිකායකට බරවූ කෙනෙකු නොවේ. ඔහු දේව රාජ්‍යයේ කෙනෙකි. ඔහුගේ පරමාර්ථයන් ඉලක්කයන් හා අරමුණු දේව රාජ්‍යය කෙරෙහි අවධානය යොමු කිරීමට වේ.

සන්නද්ධ කරන්නෙකු අන් අය දේව සේවයේ වැඩ සඳහා සන්නද්ධ කරන්නේ ඔවුන්ට ආත්මික දර්ශනයක් තුළින් අභියෝග කරමින් ඇදහිල්ලේ පදනම ඔවුන්ට පැහැදිලි කරමින් හා ආත්මික ලෙස තමා සමාන තවත් අය බිහි කිරීමෙන් හා ඔවුන්ට අභියෝග කරමින්ද වේ. ඔහු මනුෂ්‍යයන්ට තම හැකියාවන් සොයා ගැනීමට හා නිදහස් කිරීමට උපකාර කරයි. එහෙත් ඒ නිසා තම ආත්මික වර්ධනයට හා දේව රාජ්‍යයේ ඉදිරියට යෑමට තර්ජනයක් ඇති වේ යයි නොහැඟේ.

ප්‍රේරිතවරුන්, දිවැසිවරුන්, ඉවැන්ජලිස්තවරුන්, සභාපාලකවරුන් හා ගුරුවරුන් ලෙස දෙවියන්වහන්සේ සභාවෙහි තබන ආත්මික නායකයන් සියලු දෙනාම සන්නද්ධ කරන්නන් විය යුතුය. ඔවුන්ගේ පරමාර්ථය වන්නේ සේවයේ කටයුතු සඳහා අන් අය සන්නද්ධ කිරීම වේ (එපිස 4:11-12).

සන්නද්ධ කරන්නෙකු සෙනඟ දකින්නේ යම් දෙයක් කර ගැනීමට භාවිත කරන අජීවී වස්තුවක් ලෙස නොවේ. සන්නද්ධ කිරීම යනු, "මෙය කරන්න" යයි කීම හා එය යම් කෙනෙකු ලවා කරවීමට වඩා වැඩි දෙයක් බව ඔහු දනී. අනෙක් මිනිසුන් දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවනු ලැබූ අය හා දේව රාජ්‍යයේ කටයුතුවලදී වුවද "දේවල්" ලෙස යොදා ගත නොයුතු බව ද ඔහු පිළිගනී.

සන්නද්ධ කරන්නෙක් විරෝධතා මාධ්‍යයේ ධෛර්යවත්ව සිටියි. එමෙන්ම ඔහුට ගැඹුරු ආත්මික අත්දැකීමක් ඇත. ඔහුගේ ජීවිතය දෙවියන්වහන්සේගේ බලයෙන් හා මහිමයෙන් ස්පර්ශ වී තිබේ. ඔහු අවංකය, ස්වාමින්වහන්සේ සමඟ සමීප, පෞද්ගලික සබඳතාවක් පවත්වා ගෙන යයි.

ජෝෂුවා, එනම් පොරොන්දු දේශය වෙත යෑම සඳහා ඉශ්‍රායෙල්වරුන්ව සන්නද්ධ කිරීමට දෙවියන්වහන්සේ තෝරාගත් තැනැත්තා, සන්නද්ධ කරන්නෙකු සඳහා කදිම නිදසුනකි. ඔහු පිළිබඳව හා සන්නද්ධ කරන්නෙකුගේ ගුණාංග පිළිබඳව ඔබ වැඩිදුරටත් මෙම පාඨමාලාවේ දහහතර වන පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නෙහිය.

බොහෝ ඇදහිලිවන්තයන් ආත්මිකව මියගිය අය වෙති. මන්ද ඔවුන්ට දේශනා කරන්නේ මිය ගිය අය බැවිනි. ඔවුන් අක්‍රිය, උනන්දුවක් නොමැති, නොසැලකිලිමත් හා හැඟීමක් නැති අය වෙති. ඔබට දැවෙන හදවතක් නොමැති නම්, ඔබ මඟ පෙන්වන අයට එවැන්නක් නොමැත.

උනන්දුවක් නොමැති ආගමක් අද ලෝකය පුරා පැතිරෙන සතුරාගේ ගින්න නිවා දැමීමට සමත් වන්නේ නැත. ගින්නක් සමඟ සටන් කිරීමට උචිතම ක්‍රමය ගින්නක් යොදා ගැනීම වේ. එලියා උගත් පරිදි, දර ප්‍රමාණවත් නොවේ. පූජාසනයක් ද ප්‍රමාණවත් නොවේ. අපගේ කැපවීම් වුවද ප්‍රමාණවත් නොවේ. දෙවියන්වහන්සේගේ ගින්නෙන් අප ස්පර්ශ විය යුතුය.

මළවුන් හා ජීවතුන් අතර, ජීවනයේ පාලමක් සපයමින්, සිටගැනීමට දෙවියන්වහන්සේ ආරොන් භාවිත කළ ආකාරය ගණන් කථාව 16:46-48හි සඳහන් වේ. සන්නද්ධ පුද්ගලයෙකු කරන්නේ මේ දෙය වේ. ඔහු මළවුන් (නිෂ්ක්‍රිය) හා ජීවතුන් (ක්‍රියාශීලී) අතර සිටගනී. ඇදහිලිවතුන් ක්‍රියාවේ යෙදවීම සඳහා සූදානම්ව තැබීමට දෙවියන්වහන්සේ ඔහු යොදා ගන්නා සේක. ඔහු දෙවියන්වහන්සේගේ ගින්නෙන් පිරුණු ධූම පාත්‍රය, එහි දැල්ලෙන් ස්පර්ශ කරන සෑම ජීවිතයක්ම දල්වමින් රැගෙන යයි.

බොහෝ අය කිසිදා නොඇවිළුණු හදවත් ඇතිව හෝ දැල්ල නිවීගිය හදවත් ඇතිව හෝ දෙවියන්වහන්සේගේ සෙනඟට මඟ පෙන්වීමට හා දෙවියන්වහන්සේගේ කටයුතු කිරීමට උත්සාහ කරති. අප දෙවියන්වහන්සේ වෙනුවෙන් දැවෙමින් නොසිටින්නේ නම් මෝසෙස්ගේ කාලයේ

පාළුකරයේ පඳුර දැල්වූ ගින්නෙන් අපගේ හදවත් දැල්විය හැකිද? පියවරෙන් පියවර ඉශ්රායලයෙන් පලාගිය, එසකියෙල් දුටු ගින්න, අද අපට නැවත ගෙන්වා ගත හැකිද?

## සන්නද්ධ කිරීම හා ඉවැන්ජලිස්ත කිරීම

අප සෙනඟ සන්නද්ධ කරන්නේ කුමක් පිණිසද? නිෂ්ක්‍රිය සෙනඟ පෙලඹවීමට අප උත්සාහ කළ යුත්තේ මන්ද? අපගේ සභාව තුළ සෙනඟ සුව පහසුවෙන් සිටිත් නම් හා ඔවුන්ගේ අවශ්‍යතා සපිරේ නම්, අප කැළඹිලි යුත්තේ මන්ද?

ආත්මික සම්පත් සන්නද්ධ කිරීම ගැන අප සැලකිලිමත් විය යුතුය. මන්ද අප ලෝකයේ මහා ආත්මික අස්වැන්න නෙළා ගත හැක්කේ එවිට බැවිනි. අප ආත්මික සම්පත් සන්නද්ධ කරන්නේ ඉවැන්ජලිස්ත සේවය සඳහා වේ.

සන්නද්ධ කිරීම හා ඉවැන්ජලිස්ත සේවය සඳහා ඇති අනෙකුත් පිවිසුම් අතර වෙනසක් තිබේ. බොහෝ ඉවැන්ජලිස්ත වැඩසටහන්වල අවධානය යොමුවන්නේ “දීමනා ලද” (නැතහොත් අද සභාවේ “වෘත්තිමය”) ඉවැන්ජලිස්තවරයා වෙත වේ. මේ ආකාරයේ ඉවැන්ජලිස්ත ක්‍රමයේ අවධානය, අසන්නන් සංඛ්‍යාව වැඩි කර ගැනීම සඳහා වේ. ප්‍රචාරය කිරීම්, ආරාධනා, රූපවාහිනී හා ගුවන් විදුලි සම්මුඛ සාකච්ඡා හා වෙනත් බොහෝ ක්‍රම මේ සඳහා භාවිත වේ. ඉවැන්ජලිස්තවරයාගේ සේවයේ බලපෑම වැඩි වර්ධනය කර ගැනීමට හැකි සෑම දෙයක්ම කරනු ලැබේ.

මෙම ක්‍රමවල කිසිදු වරදක් නැත. දෙවියන්වහන්සේ සභාවෙහි තබා ඇති “ඉවැන්ජලිස්තවරුන්” නමැති දීමනාවන් ඇති අයගෙන් අප සම්පූර්ණ ප්‍රයෝජන ගත යුතුය. එහෙත් අප වෙත ඇති අවසාන කාලයේ ආත්මික අස්වැන්න නෙළා ගැනීමේ අභියෝගයට මුහුණ දීම සඳහා ඉවැන්ජලිස්ත සේවය සඳහා අප “සන්නද්ධ කිරීමේ පිවිසුමක්” පිළිගත යුතු වේ.

ඉවැන්ජලිස්ත සේවය සඳහා සන්නද්ධ කිරීමේ පිවිසුම ඉවැන්ජලිස්තවරයෙකුගේ විශේෂ දීමනාවක් ඇති අය කෙරෙහිම නොව සියලුම ඇදහිලිවතුන් කෙරෙහි අවධානය යොමු කරයි. එය “ඉවැන්ජලිස්ත සේවය” සඳහා දෙවියන්වහන්සේගේ මිනිසුන් සෑම කෙනෙක්ම පෙලඹවීමෙන් දෙවියන්වහන්සේ වෙතට හැරෙන අයගේ සංඛ්‍යාව ගුණ කිරීමට සොයා බලයි. (2 තිමෝති 4:5)

සභාවේ මේ ආකාරයේ සන්නද්ධ කිරීම කරනුයේ බයිබලිය රාමුව ඇතුළත වේ. මෙය සෑම කෙනෙක්ම තම ආත්මික දීමනා මත සේවය සඳහා තමාගේ ස්ථානය පිළිගන්නා අතර එය “ශාරීරික සේවයක්” ලෙස හැඳින්වේ. එවිට ශ්‍රේෂ්ඨ පැවරුම සමඟ සුසංගත වන විශ්වීය අරමුණු අත්පත් කර ගැනීම සඳහා මුළු ශරීරයම ක්‍රියා කරයි. ඉවැන්ජලිස්ත සේවය සඳහා සන්නද්ධ කිරීමේදී ශුභාරංචිය සියලු මිනිසුන්ට ඉදිරිපත් කරමින් සමාජයේ සෑම මට්ටමකට ළඟාවිය හැකි වීම සඳහා පවතින සියලු ක්‍රම භාවිත කරනු ලැබේ.

## සන්නද්ධ කිරීම සඳහා නියමිත කාලය

සාමාන්‍ය හමුදාවක භට කණ්ඩායම් සන්නද්ධ කරන්නේ යුධ කාලයේදී හෝ අවශ්‍යතාවන් ඇතිවූ විටය. ආත්මිකව දැන් යුධ සමයකි. අපි, මුළු ලෝකයේම සිටින මිනිසුන්ගේ හදවත්, ආත්ම හා සිත් වෙනුවෙන් මහත් සංග්‍රාමයක යෙදී සිටින්නෙමු. මෙය මහත් අවශ්‍යතාවක් ඇති අවස්ථාවකි. අපි ලෝකයේ ඇති ආත්මික අස්වන්න, කෙත්වතු දෙස බලන විට අවශ්‍යතාව දකිමු. ඒවා නෙළීමේ කාලය පැමිණ තිබේ. එහෙත් මෙම අවස්ථාවේ මහත් සේ වෙහෙස වී වැඩකරන ගොවීන් විරලය. දෙවියන්වහන්සේගේ සෙනඟ සන්නද්ධ කිරීමේ කාලය මෙය වේ. මීකා දිවැසිවරයා පවසන්නාක් මෙන් “හමුදා රැස් කරන්න. සතුරෝ ... වටලාගෙන සිටිති”. (මීකා 5:1)

එහෙත් මිනිසුන් සන්නද්ධ කිරීම සඳහා අප අවශ්‍යතා මුල් කර ගත් සේවයකට වඩා දෙවියන්වහන්සේ නියෝග මුල් කර ගත් සේවයකට යොමු විය යුතුය. අප තමා කෙරෙහි නොව දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය යුතුය. සංවිධානය, සහයෝගය, ගුණනය වීම, දේව ධර්මය ... මේ සියල්ල වැදගත්ය. එහෙත් තම සෙනඟ සන්නද්ධ කිරීම පිණිස පිබිදීම, ගින්න හා මහිමය එවිය හැක්කේ දෙවියන්වහන්සේට පමණි. ශුද්ධාත්මයාණන්වහන්සේගේ හුස්ම හා ජීවනය

නොමැතිව දෙවියන්වහන්සේගේ සෙනඟ සංවිධානය වී, එක්සත් වී හා යහපත් දේව ධර්මයක් ඇතුව සිටියද සෙනඟ හුස්ම හා ජීවය නොමැති ශරීරයක් මෙන් වේ.

ඔබ ඔබගේ අධ්‍යාපනය මත විශ්වාසය තැබුවහොත් ඔබට අත්පත් කර ගත හැක්කේ අධ්‍යාපනයට කළ හැකි දේ පමණි. ඔබ දක්ෂතා හා වෙහෙස මත විශ්වාසය තැබුවහොත් ඔබට ඔබගේ වෙහෙසෙහි හා දක්ෂතාවල ප්‍රතිඵල ලැබෙනු ඇත. ඔබ කමිටු කෙරෙහි විශ්වාසය තැබුවහොත් බොහෝ දේ කළ හැකිය. එහෙත් ඒ කමිටුවලට කළ හැකි දේ පමණි. එහෙත් ඔබ දෙවියන්වහන්සේ මත විශ්වාසය තැබුවහොත් ඔබට දෙවියන්වහන්සේට කළ හැකි දේ ලබා ගත හැකිය.

මනුෂ්‍ය ප්‍රයත්නයක් මඟින් වැඩක් කර ගත නොහැකිය. අවසන් කාලයේ මහා අස්වැන්න මාංසික ක්‍රම මඟින් නෙළා ගත නොහැකි වේ.

> **" නුඹලා මෙපමණ අඥානද? ආත්මයාණන් තුළ පටන් ගත් නුඹලා දැන් මාංසයෙහි සම්පූර්ණව සිටිහුද?" (ගලාති 3:2,3)**

මෙම කාර්යයන් මනුෂ්‍ය බලයෙන් හෝ ශක්තියෙන් හෝ මනුෂ්‍ය හැසිරවීමෙන් හෝ සාක්ෂාත් කර ගත නොහැකිය.

> **"එකල ඔහු මට උත්තර දෙමින් : සෙරුබ්බාබෙල්ට ස්වාමින්වහන්සේගේ වචනය මේය. එනම්, බලයෙන්වත් ශක්තියෙන්වත් නොව මාගේ ආත්මයෙන්යයි සේනාවල ස්වාමින්වහන්සේ කියන සේක." (සෙකරියා 4:6)**

බොහෝ කලකට පෙර දෙවියන්වහන්සේ සෙකරියා නම් වූ දිවැසිවරයෙකුට ස්වර්ණමය වූ පහන් රුකක් පිළිබඳ දර්ශනයක් දුන් සේක. පහන් රුක ආලෝකය සැපයුයේ, ජීවී ඔලිව ගසකින්, නළ මගින් ලැබෙන, තෙල් මගිනි. තෙල් ලැබෙන තුරු පහන දැල්විණි.

ඔබට දෙවියන්වහන්සේගේ ආලේපය නිරන්තරයෙන් නොලැබෙන්නේ නම් දෙවියන්වහන්සේගේ වැඩ කටයුතු කළ නොහැකිය. ඔබ ප්‍රාණවත් ඔලිව ගසට සම්බන්ධව සිටිය යුතුය. පල දරන අත්තක් මෙන් ඔබ මිදිවැලට බද්ධව සිටිය යුතුය (යොහන් 15). මෙය දිව්‍යමය පෙලඹවීමකි. මෙය සර්වබලධාරී සන්නද්ධ කිරීමකි.

යේසුස්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙම ගින්න මගින් සන්නද්ධ කරන ලද්දේය (ලූක් 4:18). පෙන්තකොස්ත දිනයේ බලය මගින් පළමු සභාව ගිනි දැල්විණි (ක්‍රියා 2). දාවිත් ආත්මයාණන්ගේ බලය දැන සිටියේය (2 සාමුවෙල් 23:2). එසකියෙල් ඊට නිරන්තරයෙන් සාක්ෂි දැරීය. එස්රාට (එස්රා 7:6) හා නෙහෙමියාට (නෙහෙමියා 2:18), දෙවියන්වහන්සේගේ හස්තය ඔවුන් මත වූ විට දෙවියන්වහන්සේගේ පෙලඹවීම හා සන්නද්ධ කිරීමේ බලය දැනිනි. ප්‍රේරිත වූ පාවුලුතුමාද මෙය දැන සිටියේය (2 කොරින්ති 1:21-22).

ඔබටද එය දැනගත හැකිය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "අන් අය මගින් හැසිරවීම" නිර්වචනය කරන්න.

3. "සන්නද්ධ කිරීම" නිර්වචනය කරන්න.

4. ආත්මික සන්නද්ධ කිරීම හා අන් අය මගින් හැසිරවීම අතර වෙනස පැහැදිලි කරන්න.

5. නිෂ්ක්‍රිය හා සන්නද්ධ පුද්ගලයෙකු අතර වෙනස පැහැදිලි කරන්න.

6. සන්නද්ධ කිරීම හා ශුභාරංචිය පැතිරවීම අතර සබඳතාව සාරාංශ කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

# තව දුරටත් අධ්‍යයනය සඳහා

1. 1 සාමුවෙල් 30හි දාවිත්ගේ හමුදාව පිළිබඳ කතාව කියවන්න. මේ අය අධෛර්යයට පත්වූ පුද්ගලයෙකු පිළිබඳ විස්තරයට ගැළපෙන්නේ කෙසේද?
   "අධෛර්යයට පත් වූ කෙනෙකු සංවෘත මනසක් සහිතය, ඔහුට බලය, පාලනය හා තමාට අවශ්‍ය පරිදි ක්‍රියා කිරීමේ අවශ්‍යතාවක් ඇත. ඔහු පෞද්ගලික වගකීම මඟ හරියි. ගැටලු ගැන අන් අයට දොස් පවරයි. පළිගැනීමට පෙලඹෙයි. ඔහු අස්ථායිය. පක්ෂපාතී නැත."
   මේ තත්ත්වය වෙනස් කිරීමට දාවිත් කුමක් කළේද? අධෛර්යයට පත් වූ අය ඔබ දන්නෙහිද? ඔවුන් ධෛර්යයවත් කළ හැක්කේ කෙසේද?

2. මනුෂ්‍ය පෙලඹවීමේ ස්වභාවය ඒබ්‍රහම් මාස්ලෝ නමැත්තෙක් අධ්‍යයනය කළේය. ඔහු පැවසුවේ මිනිසුන් ක්‍රියා කරවීමට පෙලඹවීම සඳහා ඔවුන්ගේ මූලික අවශ්‍යතාවන් ගැන සැලකිලිමත් විය යුතු බවය. ඉන් සමහරක් මෙසේ වේ:

   - යම් කෙනෙකුගේ හැකියාවන් සම්පූර්ණ කිරීමට
   - වැඩීමට හා වර්ධනය වීමට
   - නිර්මාණාත්මක වීමට
   - අන් අය තමා උසස් ලෙස සැලකීම
   - තමා තමාව උසස් ලෙස සැලකීම
   - අයත් වීමට
   - ප්‍රේම කිරීමට
   - ප්‍රේමය ලැබීමට
   - නිවහනක්
   - ආරක්ෂාව
   - ලිංගික අවශ්‍යතා
   - පිපාසය
   - කුසගින්න

   මේවා මෙලොව ජීවිතය සඳහා අවශ්‍ය වුවද ඒ සියල්ල මාංසික ආශාවන් වේ. මෙවැනි අවශ්‍යතාවන් තුළින් සන්නද්ධ වන අය තුළ දිගුකලක් පෙලඹවීම යෙදෙන්නේ නැත. ඔවුන්ගේ ආත්මාර්ථකාමී අවශ්‍යතා ඉටු නොවූ විට ඔවුන් අක්‍රිය වනු ඇත.

   මාංසික අවශ්‍යතා පදනම් කරගෙන ආත්මික පරමාර්ථයන් උදෙසා මිනිසුන් සන්නද්ධ කළ නොහැකිය. ආත්මික පරමාර්ථයන් උදෙසා ඔබ ඔවුන් සන්නද්ධව තැබිය යුත්තේ ආත්මික මූලධර්ම මත වේ.

# දෙවන පරිච්ඡේදය

## සන්නද්ධ කිරීමේ බයිබලීය පදනම

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සන්නද්ධ කිරීම දිව්‍යමය ලෙස සහතික කරන ලද දෙයක් වන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට
- සන්නද්ධ කිරීම යන්න ගම්‍යවන විස්තරාත්මක බයිබලීය නම් හඳුනා ගැනීමට
- ඇදහිලිවතුන් සන්නද්ධ කිරීමේ බයිබලීය ආඥාවක් හඳුනා ගැනීමට
- නව ගිවිසුම් සභාවේ සන්නද්ධ කිරීම ක්‍රියාත්මක වූ ආකාරය පැහැදිලි කිරීමට
- සන්නද්ධ කිරීමේ පැරණි ගිවිසුම් නිදසුන් ලයිස්තුගත කිරීමට
- ගිඩියොන්ගේ ජීවිතයෙන් සන්නද්ධ කිරීම පිළිබඳව ඔබ උගත් දේ සාරාංශ කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**එබැවින් විසුරුවනු ලැබූ ඔවුහු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය. (ක්‍රියා 8:4)**

## හැඳින්වීම

බයිබලීය වාර්තාවලින් පෙන්නුම් කෙරෙන්නේ දෙවියන්වහන්සේ සිය සැලැස්ම ක්‍රියාත්මක කර සිය පරමාර්ථයන් සාක්ෂාත් කරගත්තේ ක්‍රියා කිරීම සඳහා සන්නද්ධ වී සිටි මනුෂ්‍යයන් තුළින් බවය. සන්නද්ධ කිරීම දිව්‍යමය ලෙස සහතික කර ඇති බවත් බයිබලීය පාඨයන්ගෙන් විස්තරාත්මකව ගම්‍ය කර ඇති බවත් ශුද්ධ ලියවිල්ලෙන් එළිදරව් වේ. එය පැරණි ගිවිසුමේ හා අලුත් ගිවිසුමේ සභාවේ පෙන්නුම් කර ඇති අතර ශ්‍රේෂ්ඨ පැවරුම ඉටු කිරීම සඳහා ඇදහිලිවතුන්ට දී ඇති ආඥාවට මූලික වේ.

සන්නද්ධ කිරීම සඳහා වන බයිබලීය පදනම ඔබ මෙම පාඩමෙන් ඉගෙන ගන්නවා ඇත. එමෙන්ම බයිබලීය සන්නද්ධ කිරීමේ ප්‍රධාන සත්‍යය ද ඔබ ඉගෙන ගන්නෙහිය. විශාල ලෙස භෞතික හෝ මූල්‍යමය හෝ සම්පත් ලබා ගැනීම මත මෙවැනි සන්නද්ධ කිරීමක් පදනම් වී නොමැති බව වැදගත් කරුණකි. ක්‍රියා කිරීම සඳහා සන්නද්ධව සිටින හා සිය කැඳවීමට පිළිතුරු දුන් ස්වල්ප දෙනෙක් තුළින් දෙවියන්වහන්සේ මහත් දේ කරන සේක.

## සන්නද්ධ කිරීම දිව්‍යමය ලෙස සහතික කර ඇත.

එපීස 4:11-16 කියවන්න. මෙම කොටසින් එළිදරව් වන්නේ ස්වාමීන්වහන්සේ සභාවට විශේෂ නායකත්ව දීමනා දී ඇත්තේ දේව සේවය සඳහා මනුෂ්‍යයන් සන්නද්ධ කිරීම සඳහා බවය. ප්‍රේරිතයන්, දිවැසිවරුන්, ඉවැන්ජලිස්තවරුන්, සභා පාලකයන් ගුරුවරුන් යන සියලු දෙනා "සන්නද්ධ" කරන්නෝ වනු ඇත. ඔවුන් දේව සේවයේ වැඩකටයුතු සඳහා ඇදහිලිවතුන් සන්නද්ධ කිරීමට දෙවියන්වහන්සේ දී ඇති විශේෂ සේවක දීමනා වේ.

ශුද්ධාත්මයාණන්වහන්සේ සෑම ඇදහිලිවන්තයෙකු තුළම වැඩ වාසය කිරීමෙන් හා ඔවුන්ට ආත්මික දීමනා උරුම කොට දීමෙන් සහතික කෙරෙන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ මුළු ශරීරයම සන්නද්ධ කිරීම දිව්‍යමය ලෙස නියම කර ඇති බවය (රෝම 12: 3-8 හා 1 කොරින්ති 12: 1-31).

## සන්නද්ධ කිරීම් විස්තරාත්මක පදවලින් ගම්‍ය කෙරේ.

සභාව සඳහා භාවිත කර ඇති විස්තරාත්මක පදවලින්ද සන්නද්ධ කිරීම ගම්‍ය කෙරේ. රෝම 12: 3-8 හා 1 කොරින්ති 12: 1-31 හි සභාව "ශරීරයක්" ලෙස ක්‍රියාකරන බව සඳහන් කෙරේ. සෑම ඇදහිලිවන්තයෙකුම සිය සුවිශේෂී පරමාර්ථයන් ඉටු කිරීම සඳහා සන්නද්ධ කර ඇත. හෙබ්‍රෙව්

10:19-22 1 පේතෘස් 2:9 හා එළිදරව් 1:6 හි විස්තර කර ඇති සියලු ඇදහිලිවතුන්ගේ පූජකත්වය මගින්ද ගම්‍ය වන්නේ දේව රාජ්‍යයේ වැඩ කටයුතු සඳහා මුළු සභාවම සන්නද්ධ කර ඇති බවය.

## සන්නද්ධ කිරීම බයිබලීය නියෝගවලට කේන්ද්‍රීය වේ.

ඇදහිලිවතුන්ට දී ඇති බයිබලීය නියෝගවලට සන්නද්ධ කිරීම කේන්ද්‍රීය වේ. නිදසුනක් ලෙස ඇදහිලිවතුන් මවා ඇත්තේ යහපත් ක්‍රියා කිරීමට බව ශුද්ධ ලියවිල්ල පැහැදිලිව ප්‍රකාශ කරයි. (එපීස 2:10 තිතස් 2:14 3:8 යාකොබ් 2:17 හා 1 පේතෘස් 2:12 බලන්න). අප මේවා අත්පත් කර ගැනීමට නම් අප ක්‍රියා කිරීමට සන්නද්ධ වී සිටිය යුතු වේ.

එමෙන්ම ශුභාරංචිය ලෝකයේ සියලු ජාතීන් වෙත ගෙනයාමේ ශ්‍රේෂ්ඨ පැවරුම සම්පූර්ණ කිරීමට කේන්ද්‍රීය වන්නේ සන්නද්ධ කිරීම වේ.

> **එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බෞතිස්ම කරන්න. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමියි කී සේක. (මතෙව් 28:19-20)**

යන්න, දේශනා කරන්න, උගන්වන්න, බව්තීස්ම කරන්න ... මේ සියල්ලම ක්‍රියා කිරීමේ පද වේ. මේ නියෝග ඉටු කිරීමට ඇදහිලිවතුන්ගේ සන්නද්ධ බලකායක් අවශ්‍ය වේ.

## සන්නද්ධ කිරීම අලුත් ගිවිසුමේ ක්‍රියාත්මක කෙරේ.

අලුත් ගිවිසුමේ සභාව සන්නද්ධ කළ සෙනඟ කණ්ඩායමක් විය. ඔවුහු දිනපතාම දේව මාළිගාවේ හා සෑම නිවසකම සේවය කළහ. ඔවුන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් නමස්කාර කළ අතර ස්වාමීන්වහන්සේ දවසින් දවස ඔවුන්ගේ සංඛ්‍යාව වැඩි කළ සේක (ක්‍රියා 2:47).

දරුණු පීඩාවලින් වුවද ඔවුන්ගේ උදෙහ්ගය අඩු වූයේ නැත. පීඩාකිරීම් නිසා ඔවුන්ගේ සාමාජිකයෝ විසුරුවනු ලැබුහ. නමුත්,

> **"එබැවින් විසුරුවනු ලැබූ ඔවුහු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය." (ක්‍රියා 8:4)**

පළමු සභාව ධර්මදූත කණ්ඩායම් සාදා එම කණ්ඩායම් අනෙකුත් ජාතීන් වෙත යවනු ලැබීය (ක්‍රියා 13:1-3). ඔවුහු ජෙරුසලමේ සිට ජුදයට ද සමාරිය හා එකල දැන සිටි ලෝකයේ ඈත පෙදෙස්වලට ගියහ. ඔවුහු දෙවියන්වහන්සේ වෙනුවෙන් "ලෝකය උඩුයටිකුරු කළහ" (ක්‍රියා 17:10).

## සන්නද්ධ කිරීම පැරණි ගිවිසුමේද පැහැදිලි කර තිබේ.

සන්නද්ධ කිරීම පැරණි ගිවිසුමේද පැහැදිලි කර තිබේ. දෙවියන්වහන්සේ සිය සෙනඟ නොයෙකුත් දේ සඳහා සන්නද්ධ කළ ආකාරය කියවන්න.

- මණ්ඩපය ගොඩනැගීම — නික්මයාම 35:4-29
- පොරොන්දු දේශය අත්පත් කර ගැනීම — ජෝෂුවා 1:10-15
- පළමු දේව මාළිගාව ගොඩනැඟීම — 1 රාජාවලිය 5:13-18 1 වංශාවලිය 29:1-9
- දෙවන දේව මාළිගාව ගොඩනැඟීම — එස්රා 1:5-6 3:18-13 හග්ගයි 1:2-15
- ජෙරුසලමේ පවුරු නැවත ගොඩනැඟීම — නෙහෙමියා 2:17-6:15

සතුරාගේ බලය මැඩ පැවැත්වීමට දෙවියන්වහන්සේ සිය සෙනඟ සන්නද්ධ කළ ආකාරය ද දැන ගැනීමට පැරණි ගිවිසුමේ සඳහන් යුද්ධ පිළිබඳ වාර්තා අධ්‍යයනය කළ හැකිය. ගිඩියොන් පිළිබඳ කථාව මේ සඳහා මනා නිදසුනකි.

## ගිඩියොන් සාධකය

සන්නද්ධ කිරීමේ එක් ශ්‍රේෂ්ඨ බයිබලීය මූලධර්මයක් වන්නේ දෙවියන්වහන්සේ සිය පරමාර්ථයන් සඳහා සුළු සෙනඟක් සන්නද්ධ කිරීම තුළින් මහත් දේ කිරීම වේ. අපි මෙය සන්නද්ධ කිරීමේ "ගිඩියොන් සාධකය" ලෙස හඳුන්වමු. ඊට හේතුව වන්නේ ගිඩියොන් ලෙස හඳුන්වන එක් මිනිසෙකු මඟින් මෙය පෙන්නුම් කෙරෙන බැවිනි.

විරාවලිය 6:11-24 කියවන්න. දේව දූතයා ගිඩියොන්ට දර්ශනය වන විට ගිඩියොන් සටන් කිරීම ගැන හෝ දේශය ගැන හෝ කතා කරමින් සිටියේ නැත. ඔහු ඇත්තෙන්ම කරමින් සිටියේ ඊට ප්‍රතිවිරුද්ධ දේ වේ. එනම් ඉශ්‍රායෙල්වරුන් බීජ වපුළ පසු එම දේශයට පැමිණි සතුරන්ගෙන් ඔහු සැඟවී සිටියේය. සතුරෝ අස්වැන්න කොල්ල කමින් සිටියහ. ගිඩියොන් රහසින් හා බියෙන් අස්වැන්නෙන් සීමිත කොටසක් නෙළා ගැනීමට උත්සාහ කරමින් සිටියේය.

මෙය අද ලෝකයේ "නෙළා ගැනීමේ" ක්‍රියාව බොහෝ සේ පෙන්වන පින්තූරයකි. මනුෂ්‍යයෝ බියෙන් යුතුව සතුරාගෙන් සැඟවෙමින් දෙවියන්වහන්සේ වෙනුවෙන් ආත්මික අස්වැන්න නෙළා ගැනීමට උත්සාහ කරමින් සිටිති. අප මෙම ආරක්ෂාකාරී තත්ත්වයෙන් සිටිනතෙක් ධාන්‍ය "ඇඹරීම" සීමාසහිත වනු ඇත. ඉශ්‍රායෙල්වරුන් මෙන් අපිද "බොහෝ දුප්පත් වන්නෙමු".

"ධෛර්යවත් බලවත් මනුෂ්‍යයා" යයි කියමින් දේව දූතයා ගිඩියොන්ව අමතන විට ඔහු වටපිට බලමින් "බලවත් සටන්කරුවන් මට පෙනෙන්නේ නැතැ" යි පවසන්නට ඇතැයි අපට සිතිය හැකිය. "සමිඳාණන් ඔහු සමඟ" බව ඔහු හැඳිනගත්තේ නැත.

ගිඩියොන් දැක්කේ ඔහු වටා තිබුනාවූ පරාජිත පරිසරය පමණය. ඔහු ඇසුවේ "සමිඳාණන්වහන්සේ අප සමඟ සිටින සේක් නම් මේ සියල්ල අපට සිදුවී තිබෙන්නේ කුමක් නිසාද? දෙවියන්වහන්සේගේ හාස්කම් කිරීමේ බලය කොහේද? යන ප්‍රශ්නය වේ.

ලෝකයේ හා ඔබගේ රටේ තත්ත්වය ගැන සිතනවිට "සමිඳාණන්වහන්සේ අප සමඟ සිටින සේක් නම් මේ සියල්ල අපට සිදුවී තිබෙන්නේ කුමක් නිසාද?යි යන ප්‍රශ්නය ඔබ අසනු ඇත. මේවායින් අප අධෛර්යවත් කෙරේ. අප පරාජය කෙරේ. දෙවියන්වහන්සේගේ හාස්කම් කිරීමේ බලය කොහේද?

අවිශ්වාසය හා බිය සහිත මේ වටාපිටාව තුළ දෙවියන්වහන්සේ අද "ගිඩියොන්වරුන්ට" කතා කරන සේක. "ගිඩියොන් සාධකයේ" සත්‍යය වන්නේ බලවත් දේ කිරීමට දෙවියන්වහන්සේ දුර්වල අය කැඳවීමයි. දේවදූතයා ගිඩියොන්ට පැවසුයේ "නුඹට ඇති බලසම්පන්නකම මෙහෙයවා .... නුඹ යවන්නේ මමය" යනුවෙනි. අපගේ පරම්පරාවේ අසීරු අභියෝගයන්ට මුහුණ දීමට අපට ඇති එකම පෙලඹවීම ස්වාමීන්වහන්සේ අප සමඟ සිටීමේ පොරොන්දුව වේ. උන්වහන්සේගේ වැඩ සිටීමේ පොරොන්දුව දී ඇත්තේ ක්‍රියා කිරීම සඳහා සන්නද්ධ කර ඇති හා "යන්න" යන උන්වහන්සේගේ කැඳවීමට ප්‍රතිචාර දක්වා ඇති අයටය.

> **එබැවින් නුඹලා ගොස් සකල ජාතීන් ගෝලයන් කරන්න. මම ද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමි. (මතෙව් 28:19-20හි කොටසකි.)**

ගිඩියොන් දේවදූතයාගෙන් මෙසේ ඇසීය, "මා මෙය කරන්නේ කෙසේද? මාගේ ගෝත්‍රය ඉතා දුබලය, මම ඒ පවුලේ ඉතාම සුළු තැනැත්තා වෙමි." මෝසෙස්ට ද මෙසේ හැඟුණි. ජෙරෙමියා හා ප්‍රේරිත වූ පාවුල්තුමා වුවද මෙසේ වූහ. ඔබට ද එසේ හැඟෙන්නට පුළුවන. ඔබට ද ඔබගේ සමාජ තත්ත්වය, මුදල් තත්ත්වය, අධ්‍යාපන පසුබිම හෝ හැකියාවන් ආදිය නිසා සීමිත බවක් හැඟෙන්නට පුළුවන.

එහෙත් දෙවියන්වහන්සේ ක්‍රියා කරන්නේ උන්වහන්සේගේ කැඳවීමට ප්‍රතිචාර දැක්වීමට සන්නද්ධ කර ඇති දුබල අය තුළින් වේ.

> **"මක්නිසාද සහෝදරයෙනි, නුඹලාගේ කැඳවීම, එනම් මාංසය ලෙස ප්‍රඥාවන්ත බොහෝ දෙනෙක්වත් බලවන්ත බොහෝ දෙනෙක්වත් වංශවත් බොහෝ දෙනෙක්වත් කැඳවනු නොලැබූ බව බලන්න. නුමුත් දෙවියන්වහන්සේ ප්‍රඥාවන්තයන් ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ මෝඩ දේවල් තෝරා ගත් සේක. දෙවියන්වහන්සේ ශක්තිමත් දේ**

**ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ දුර්වල දේවල් තෝරා ගත් සේක. ඇත්තාවූ දේවල් නැති කරන පිණිස නැති දේවල් වැනි ලෝකයේ පහත් දේවල්ද සුළුකොට සිතනු ලබන දේවල්ද දෙවියන්වහන්සේ තෝරා ගත් සේක. එසේ කළේ කොයි මනුෂ්‍යයෙක්වත් දෙවියන්වහන්සේ ඉදිරියෙහි පාරට්ටු කර නොගන්නා පිණිසය." (1 කොරින්ති 1:26-29)**

දෙවියන්වහන්සේ ගිඩියොන්ට දුන් විශේෂ දක්ෂතාව හමුදාවකට අණ කිරීමේ හැකියාව පමණක්ම නොවේ. මෙම කාර්යයට සම්බන්ධ වීම සඳහා අන් අය පෙලඹවීමේ දක්ෂතාවය ද ඔහුට දුන් සේක. මේ බව, 32,000ක මිනිසුන් සංඛ්‍යාවකට ආයුධ ගැනීමට ඔහු කළ කැඳවීමට ප්‍රතිචාර දැක්වීමෙන් ඔප්පු වේ.

එහෙත් බඳවාගැනීමේ ප්‍රයත්නයට දෙවියන්වහන්සේ ගිඩියොන්ව දිරිමත් කළ පසු, මහත් සංඛ්‍යාවකින් මෙන්ම සුළු සංඛ්‍යාවකින්ද උන්වහන්සේ ක්‍රියා කරන බව පෙන්වූ සේක. දෙවියන්වහන්සේ සටන්කරුවන් 22,000ක් ඉවත් කළ සේක. භයද තැතිගැන්මද ඇති අයට නිවෙස්වලට හැරියාමට ඉඩ හැරි සේක.

ඉන්පසු තවත් 9700ක පිරිසක් ඉවත් කිරීමට දෙවියන්වහන්සේ කටයුතු කළ සේක. සැලකිල්ලක් නොමැතිව හා අවදිව නොසිටි අය (ජලය පානය කරන විට කල්පනාකිරි නුවූ අය) ද නිවෙස්වලට යවන ලදී. මේ නිසා ඉතිරි වූයේ මිනිසුන් 300ක් පමණි. මුල් ස්වේච්ඡා කණ්ඩායමෙන් සියයට එකකි. 135,000ක හමුදාවකට මුහුණ දෙන විට ගිඩියොන්ට කුමක් හැඟෙන්නට ඇතිද? මිදියන්වරුන් හාරසිය පණහකට සිටියේ ඉශ්රායෙල්වරුන්ගෙන් එක්කෙනෙකි. එහෙත් මේ සුළු පිරිස තුළින් දෙවියන්වහන්සේ මහත් දේ කළ සේක. සතුරන් සමඟ සටනින් ඔවුහු ජය ගත්හ. නීත්‍යනුකූලව ඔවුන්ට අයත්වූ ප්‍රදේශ ඔවුහු නැවත ලබා ගත්හ. ඔවුන්ගේ අස්වැන්න නෙළාගැනීමට ඔවුන්ට හැකිවිය.

මිදියන්වරුන්ගෙන් අමලෙක්වරුන්ගෙන් හා අනෙකුත් අයගෙන් සමන්විත ප්‍රබල ඒකාබද්ධ හමුදාව දෙවියන්වහන්සේගේ සෙනඟට විරුද්ධව රැස්වූ විට, ස්වාමීන්වහන්සේගේ ආත්මය ගිඩියොන් වෙත පහළ වුයේය. "පහළ වුයේය" ලෙස පරිවර්තනය කර ඇති හෙබ්‍රෙව් වචනයෙහි තේරුම "ඇඳ පැළඳ සිටීම" වේ. දෙවියන්වහන්සේගේ බලය ගිඩියොන්ට දෙන ලද්දේ අවශ්‍ය වූ විට වේ. ඊට කලින් හෝ පසුව හෝ නොවේ. ඔබගේ ජීවිතයේ ද මෙය සත්‍ය බව ඔබට පෙනෙනු ඇත. "යන්න" යන උන්වහන්සේගේ කැඳවීමට ඔබ අවනත වන තුරු දෙවියන්වහන්සේගේ සන්නද්ධ වීමේ බලය ඔබ වෙත පහළ නොවන්නේය.

ආක්‍රමණය කිරීමට පැමිණි සතුරු කඳවුර විස්තර කර ඇත්තේ "පළඟැටි සමූහයක් මෙන් විශාල ගණනක් මිටියාවතේ පැතිර සිටියෝය" යනුවෙනි. ඔවුන්ගේ ඔටුවෝ "මුහුදු වෙරළේ වැලි මෙන්" වූහ. එය විශාල සමූහයකි. හොරණෑ පිඹීමෙන් හා පන්දම් වැනීමෙන් ගිඩියොන් සතුරා විස්මයට පත් කළේය. මෙය ඇතැම්විට ඉතිහාසයේ ඔටුවන් කලබලවූ විශාලතම අවස්ථාව විය හැකිය. ගිඩියොන්ගේ ජයග්‍රහණයට හොඳ උපක්‍රම හා මනාසේ සැලසුම් කළ ඒකාබද්ධ ක්‍රියාවන් හේතුවිය. එහෙත් ඊටත් වඩා වැඩි දෙයක් තිබුණි. එය දෙවියන්වහන්සේගේ බලය සහතික කළ හා සන්නද්ධ කළ ප්‍රයත්නයකි.

ඔබ දුබල හා බියගුලු සුළු පිරිසක් සමඟ වැඩ කරන දුර්වල බියගුලු කෙනෙක් විය හැකිය. එහෙත් දෙවියන්වහන්සේ ගිඩියොන්ට දුන්නාක් මෙන් ඔබටද උන්වහන්සේගේ බලය දිය හැකිය. ඔබට මිනිස්, මූල්‍යමය හා ද්‍රව්‍යමය සම්පත් හිඟද? ප්‍රීතිවන්න... සීමිත ස්වාභාවික මාර්ග මගින් විශාල දේ කිරීමට දෙවියන්වහන්සේ ප්‍රීති වන සේක. එසේ කළ විට උන්වහන්සේට මහිමය ලැබේ.

ගිඩියොන්ගේ කතාවෙන් පෙන්වන්නේ සටන්කාමීන් ස්වල්ප දෙනෙකුට දෙවියන්වහන්සේගේ බලයෙන් සන්නද්ධ කළ හා පොදු දෘෂ්ටියක් හා උපාය මාර්ගයක් වටා සංවිධානය වූ විට මහත් දේ කළ හැකි බව වේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. සන්නද්ධ කිරීම දිව්‍යමය ලෙස සහතික කරන්නේ කෙසේද?

3. සන්නද්ධ කිරීම ගම්‍ය කෙරෙන විස්තරාත්මක බයිබල් පද සමහරක් මොනවාද?

4. ඇදහිලිවතුන් සන්නද්ධ කෙරෙන එක් බයිබලීය නියෝගයක් හඳුනාගන්න.

5. අලුත් ගිවිසුම් සභාවේ සන්නද්ධ කිරීම යොදාගත් ආකාරය පැහැදිලි කරන්න.

6. පැරණි ගිවිසුමේ සඳහන් සන්නද්ධ කිරීම සඳහා නිදසුන් ලයිස්තු ගත කරන්න.

7. සන්නද්ධ කිරීම පිළිබඳ ගිඩියොන්ගේ ජීවිතයේ ඔබ උගත් දේ සාරාංශ කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

ජේසුස්වහන්සේ විසින් පවසන ලද නව ගිවිසුමේ සඳහන් උපමා කතා බොහොමයකින් සන්නද්ධ කිරීමේ වැදගත්කම එළිදරව් වේ. පහත දැක්වෙන උපමා කතා අධ්‍යයනය කරන්න.

1. පාපයේ නැතිවූ අය සෙවීම සඳහා ඇදහිලිවතුන් සන්නද්ධ කළ යුතුය.

- නැතිවුණු බැටළුවා පිළිබඳ උපමාව — මතෙව් 18:12-14, ලූක් 15:4-7
- නැතිවුණු කාසිය පිළිබඳ උපමාව — ලූක් 15:8-10
- නැතිවුණු පුත්‍රයා පිළිබඳ උපමාව — ලූක් 15: 11-32

2. ජේසුස්වහන්සේගේ නැවත පැමිණීම සඳහා සූදානම් වීමට ඇදහිලිවතුන් සන්නද්ධ කළ යුතුය.

- තලෙන්ත පිළිබඳ උපමාව — මතෙව් 25:14-30, ලූක් 19:11-27
- දිගු ගමනක් ගිය මිනිසා පිළිබඳ උපමාව — මාර්ක් 13: 34-37
- දාසයන් පිළිබඳ උපමාව — මතෙව් 24:43-51, ලූක් 12:39-46
- බලා සිටි සේවකයන් පිළිබඳ උපමාව — ලූක් 12:36-38
- කන්‍යාවන් දසදෙනා පිළිබඳ උපමාව — මතෙව් 25:1-12

3. ශුභාරංචිය පැතිරවීමේ දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් උදෙසා ඇදහිලිවතුන් සන්නද්ධ කළ යුතුය.

- වපුරන්නාගේ උපමාව — මතෙව් 13:3-8, මාර්ක් 4:3-8
- තිරිඟු හා කිරිඳි පිළිබඳ උපමාව — මතෙව් 13: 24-30
- දැල පිළිබඳ උපමාව — මතෙව් 13: 47-50
- අබ ඇටය පිළිබඳ උපමාව — මතෙව් 13:31-32, මාර්ක් 4:31-32, ලූක් 13: 19
- තලෙන්ත පිළිබඳ උපමාව — මතෙව් 25: 14-30, ලූක් 19: 11-27
- අස්වැන්න පිළිබඳ උපමාව — මතෙව් 9: 37-38, ලූක් 10:2

# තෙවන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේගේ ගින්න

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ස්වාභාවික ගින්නක ඇති වාසිවල ආත්මික සමාන්තරතා සාකච්ඡා කිරීමට
- " දෙවියන්වහන්සේගේ ගින්න" යන්න නිර්වචනය කිරීමට
- පෙන්තකොස්ත දිනයේ ගින්න පිළිබඳ බයිබලීය ඉගැන්වීම් සාරාංශ කිරීමට
- දෙවියන්වහන්සේගේ ගින්නේ පරමාර්ථ හඳුනා ගැනීමට
- දෙවියන්වහන්සේගේ ගින්න අත්දකින්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**සාලමොන් යාච්ඤා කොට නිමකළ විට අහසින් ගිනි බැස ඇවිත් දවන පූජාවද යාගයන්ද දවා දැම්මේය. ස්වාමින්වහන්සේගේ තේජසින් ගෘහය පිරී ගියේය. ස්වාමින්වහන්සේගේ තේජසින් සවාමින්වහන්සේගේ ගෘහය පිරී තිබුණු නිසා පූජකයන්ට ස්වාමින්වහන්සේගේ ගෘහයට ඇතුල්වෙන්ට බැරිවිය. සියලු ඉශ්රායෙල් පුත්‍රයෝ ගිනි බසිනවාත් ස්වාමින්වහන්සේගේ තේජස ගෘහය පිට තිබෙනවාත් දැක, ගල් අතුළ බිමට තමුන්ගේ මුහුණු නමා නමස්කාර කොට: මක්නිසාද උන්වහන්සේ යහපත්ය, උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය කියමින් ස්වාමින්වහන්සේට ස්තුති කළෝය. (2 ලේකම් 7:1-3).**

## හැඳින්වීම

දෙවන පරිච්ඡේදයෙන් ඔබ සන්නද්ධ කිරීම සඳහා බයිබලීය පදනම විමසූ අතර, දෙවියන්වහන්සේ සන්නද්ධ කළ සෙනඟ තුළින්, ටික දෙනෙක් වුවද විශාල සංඛ්‍යාවක් වුවද, ගමන් ක්‍රියාකරන බව ඉගෙන ගත්තෙහිය. මෙම පරිච්ඡේදය දෙවියන්වහන්සේගේ සෙනඟ සන්නද්ධ කෙරෙන ආත්මික සාධක වෙත අවධානය යොමු කරන පරිච්ඡේද කිපයකින්, පළමුවැන්න වේ. මෙයින් හා ඊළඟ පාඩම් කිපයෙන් ඔබ දෙවිඳුන්ගේ ගින්න, දෙවිඳුන්ගේ මහිමය හා දෙවිඳුන් නමස්කාර කිරීම ගැන අධ්‍යයනය කරන්නෙහිය.

මඳක් නැවතී මෙම පාඩමේ ප්‍රධාන පද නැවත කියවන්න. (2 ලේකම් 7:1-3). පළමුව දෙවිඳුන්ගේ ගින්න බැස ආ බවත්, ඉන්පසු දෙවිඳුන්ගේ මහිමය (තේජස) එළිදරව් වූ බවත් අවසාන වශයෙන් දෙවියන්වහන්සේගේ සෙනඟ සැබෑ නමස්කාරය සඳහා පැමිණි බවත් ඔබට පෙනෙනු ඇත. දෙවිඳුන්ගේ ගින්නත් දෙවිඳුන්ගේ මහිමයත් සැබෑ නමස්කාරයත් යන සියල්ලම, දෙවියන්වහන්සේගේ සෙනඟ ක්‍රියා කිරීම සඳහා සන්නද්ධ කෙරෙන ආත්මික බලවේග වේ.

## ස්වාභාවික ගින්න

ස්වාභාවික ලෝකයෙහි ගින්නෙහි ධනාත්මක වාසි බොහෝ තිබේ. ගින්න ශක්තිය හා උණුසුම සපයයි. එය ආහාර පිළියෙල කිරීමට භාවිත කරයි. පාලනය කළ ගින්නකින්, වඩාත් යහපත් අස්වැන්නක් ලබා ගැනීමට පොළොව සාරවත් කරන අළු ලැබේ.

ගින්න අපද්‍රව්‍ය දවාලයි. එය රන් හා රිදීවල අපද්‍රව්‍යද දවාලයි. ගින්න මිනිසුන් ආකර්ෂණය කරයි. යම්කිසි දෙයක් ගිනි ගත් විට එතැනට රැස්වෙන සෙනඟගෙන් මෙය පෙනේ. ගින්නක් තවත් ගිනි දල්වයි. එහෙත් අඛණ්ඩව ඉන්ධන නොසපයුවහොත් ගින්නක් නිවී යෑම සාමාන්‍ය දෙයකි.

කෙසේ වුවද නිවෙන්නට ආසන්න ගිනි දැල්ලක්, පවන් ගැසීමෙන් නැවතත් දීප්තිමත් ලෙස ඇවිළිය හැකිය.

## ආත්මික ගින්න

ස්වාභාවික ගින්න, ආත්මික ගින්නට සමාන්තර වේ. දෙවිඳුන්ගේ ගින්න දෙවියන්වහන්සේගේ වැඩවලට ශක්තිය සපයයි. එය සීතල, උදාසීන ආත්මයක් උණුසුම් කරයි. එය ආත්මික ආහාර හා බහුල ආත්මික අස්වැන්නක් ලබා දෙයි. දෙවිඳුන්ගේ ගින්න ස්වාභාවික ලෝකයේ රන් හා රිදීවල අපද්‍රව්‍ය ගින්නෙන් දවාලන්නාක් මෙන්ම, ඔබගේ ජීවිතයේ අපද්‍රව්‍ය ද දවාලයි.

දෙවියන්වහන්සේගේ ගින්නෙන් දැල්වුණු පිරිමියෙක් හෝ ගැහැණියෙක් දේව වචනයේ පණිවුඩයට සෙනඟ ආකර්ෂණය කරයි. ස්වාභාවික ගින්නක් මෙන්ම ආත්මික ගින්නක්ද වෙනත් ගිනි දල්වයි. දෙවියන්වහන්සේගේ බලය පෙන්වමින් විනාශයට යන සෙනඟ වෙනුවෙන් බලවත් ඇල්මකින් දැවෙන ඇදහිලිවන්තයෙක් තමා වටා සිටින අයගේ ජීවිත දල්වයි.

එහෙත් ලෝකයේ ගින්නක මෙන්ම ආත්මික ගින්නක ද නිරන්තරයෙන්ම ඉන්ධන අවශ්‍යය. ඔබ අදට වඩා ආත්මිකව ගින්නෙන් දැල්වුණු අවස්ථාවක් තිබුණේද? නිවෙන්නට ආසන්න දැල්ලක් පවන් ගැසීමෙන් දීප්තිමත් දැල්ලක් බවට පත් කළ හැකිය.

දවන යාග පූජාවේ පූජාසනය සඳහා දෙවියන්වහන්සේ ගිනි සැපයූ ආකාරයෙන්ම, ඔබගේ ආත්මය ස්පර්ශ කිරීමට උන්වහන්සේ, උන්වහන්සේගේ ගින්න ස්වර්ගයෙන් සපයන සේක. එහෙත් ඒ දැල්ල නොනිවී පවත්වා ගෙන යෑමේ වගකීම ඇත්තේ ඔබටය (ලෙවී 9:24, 2 ලේකම් 7:11). ඔබ ආත්මිකව දැවෙන සුලුය. ඔබගේ ආත්මික ස්වභාවය මවා ඇත්තේ දෙවියන්වහන්සේගේ ආත්මයෙන් ගිනි දැල්වීමට වේ. ඔබ මෙම පාඩම ඉගෙන ගන්නා විට අපගේ යාච්ඤාව වන්නේ "දෙවියන්වහන්සේ වෙනුවෙන් ඇවිලෙන්න" යන්න වේ.

## දෙවියන්වහන්සේ හා ගින්න

බයිබලය බොහෝ විට දෙවියන්වහන්සේගේ ගින්නක් ගැන කතා කරයි.

> **මක්නිසාද නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේ විනාශකරන ගින්නක් වන, ස්වකීය ගෞරවය රක්ෂා කරන්නාවූ දෙවි කෙනෙක්ය. (ද්විතීය කතාව 4:24)**
>
> **මක්නිසාද අපගේ දෙවියන්වහන්සේ විනාශ කරන ගින්නක්ය.** (හෙබ්‍රෙව් 12:29)

දෙවියන්වහන්සේ දර්ශනය වූ බයිබල් යුගයේ මිනිසුන් වාර්තා කර ඇත්තේ උන්වහන්සේ ගින්නක් මෙන් බවය.

> **මම බැලූ විට ගින්නේ පෙනීමක් වැනි ස්වරූපයක් දුටිමි: උන්වහන්සේගේ ඉඟටිය වැනිවූ පෙනීමේ සිට පහළට ගිනිද උන්වහන්සේගේ ඉඟටියේ සිට ඉහළට දීප්තිමත් පිත්තලවල දීලිහිම මෙන් බැබළෙන පෙනීමක්ද තිබුණේය. (එසකියෙල් 8:2)**
>
> **මා බලා සිටින අතර සිංහාසන පිහිටුවා, පුරාතන කෙනෙක් වාඩි වුණේය. උන්වහන්සේගේ වස්ත්‍ර හිම මෙන් සුදුව තිබුණේය. උන්වහන්සේගේ හිසකේ පිරිසිදු ලොම් මෙන්ය: උන්වහන්සේගේ සිංහාසනය ගිනි දළුවක්ය, ඒකේ චක්‍ර ඇවිළෙන ගිනිය. (දානියෙල් 7:9)**
>
> **ඔහුගේ ශරීරය රන්කාන්තියක් මෙන්ය, ඔහුගේ මුහුණේ පෙනීම විදුලියේ පෙනීම මෙන්ය, ඔහුගේ ඇස් ගිනි පහන් මෙන්ය, ඔහුගේ හස්ත සහ පාද ඔප් නැගූ පිත්තල මෙන්ය, ඔහුගේ වචනවල හඬ සමූහයක හඬ මෙන්ය. (දානියෙල් 10:6)**
>
> **උන්වහන්සේගේ හිසද හිසකේද සුදු ලොම් සහ හිම මෙන් සුදුය: උන්වහන්සේගේ ඇස් ගිනිදැල්ලක් හා සමානය. (එළිදරව් 1:14) (එළිදරව් 3:18 හා 19:12 ද ගීතාවලිය 18:8, 12 ද බලන්න).**

## දෙවියන්වහන්සේගේ ගින්න යනු කුමක්ද?

අප "දෙවියන්වහන්සේගේ ගින්න" ගැන කතා කරන විට අප කතා කරන්නේ ස්වාභාවික ගින්න ගැන නොවේ. යේසුස්වහන්සේ මෙසේ වදාළ සේක :

> **පොළොව මතුයෙහි ගිනිලන්ට ආවෙමි: එය දැනටම ඇවිළ තිබේ නම් මම කොපමණ කැමති වෙම්ද? (ලූක් 12:49)**

දෙවියන්වහන්සේගේ ගින්න යනු කුමක්ද? අප "දෙවියන්වහන්සේගේ ගින්න" ගැන කතා කරන විට අප කතා කරන්නේ පළමුවරට ශුද්ධාත්මයාණන්වහන්සේගේ ප්‍රදානය සැබවින්ම දෘශ්‍යව ප්‍රදර්ශනය වූ පෙන්තකොස්ත දින ගින්න ගැන වේ.

> **ගිනි වැනි වූ දිව් බෙදී යනවා ඔවුන්ට පෙණුනේය: එය ඔවුන් එක් එක්කෙනා කෙරෙහි පිහිටුණේය. ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන් ඔවුන්ට කතා කරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කතා කරන්ට පටන් ගත්තෝය. (ක්‍රියා 2:3-4)**

දෙවියන්වහන්සේගේ ගින්න යනු පෙන්තකොස්ත දින අත්දුටු ගින්න වේ. එය කතා කිරීම සඳහා ඔබගේ දිව ලිහා දමනු ලබන ගින්නකි. එය ශ්‍රේෂ්ඨ පැවරුම සාක්ෂාත් කිරීමට ඔබට බලය දෙන ගින්නකි.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කී සේක. (ක්‍රියා 1:8)**

යේසුස්වහන්සේ මෙසේ කී සේක:

> **මම වනාහි පසුතැවිල්ල පිණිස නුඹලා වතුරෙන් බෞතිස්ම කරමි. නුමුත් මට පසුව එන තැනැත්තේ මට වඩා බලවත්ය. මම උන්වහන්සේගේ වහන් ගෙනයන්ටවත් නොවටිමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන්ද ගින්නෙන්ද නුඹලා බව්තිස්ම කරන සේක. (මතෙව් 3:11)**

## පෙන්තකොස්ත දින ගින්න

පෙන්තකාස්ත දින ගින්න පිළිබඳ කරුණු සමහරක් මෙසේ වේ:

**එය දෙවියන්වහන්සේ විසින් දල්වනු ලබන සේක.**

දේව වචනයේ දෙවියන්වහන්සේ නැවත නැවත "මම ගිනිලන්නෙමි" යි පවසන සේක. (ජෙරෙමියා 21:14, 22:7, 49:27, 50:32, ආමොස් 1:14, 2:2, 5 බලන්න). දෙවියන්වහන්සේගේ ගින්න චිත්ත වේගයක් නොවේ. එය වේගවත් සංගීතයෙන් හෝ හඬ නගා දේශනා කිරීමෙන් නොදැල්වේ. එය දල්වන්නේත් එම ගින්න පතුරුවන්නේත් දෙවියන්වහන්සේම වේ. පෙන්තකොස්ත දින ගින්න දැල්වූයේ දෙවියන්වහන්සේම වේ.

> **නුමුත් මේ වනාහි අනාගතවක්තෘවූ යෝවෙල් කරණකොටගෙන කියන ලද කාරණයය. කෙසේදයත් : අන්තිම දවස්වලදී මාගේ ආත්මය සියලු මනුෂ්‍යයන් පිට වගුරු වන්නෙමි. නුඹලාගේ පුත්‍රයෝද දූවරුද අනාගතවාක්‍ය කියන්නෝය, නුඹලාගේ තරුණයෝද දර්ශන දකින්නෝය, නුඹලාගේ මහල්ලන්ද ස්වප්න දකිනවා ඇත. එසේය, ඒ දවස්වලදී මාගේ දාසදාසීන් කෙරෙහි මාගේ ආත්මය වගුරුවන්නෙමි, ඔවුහු අනාගතවාක්‍ය කියන්නෝය. (ක්‍රියා 2:16-18)**

## එම ගින්න ඉන්ධන රහිතය.

මෝසෙස් හා ගිනි පඳුර ගැන නික්මයාම 3 හි කියවන්න. මෙය මහා ආත්මික සත්‍යයක ස්වාභාවික නිදසුනකි. දෙවියන්වහන්සේගේ ගින්න පඳුරේ ඉන්ධන ශක්තිය නොසලකා හරිමින් දිගටම දැල්විණි. මෙහි භාස්කම වන්නේ ගින්නෙන් ඇවිළී ගිය පඳුර නොව ඉන්ධන රහිත ගින්න වේ.

දෙවියන්වහන්සේ තමා කැඳවා ඇති ආත්මික වැඩ සඳහා තමාගේම හැඟීම් හෝ බලය හෝ ගැන විශ්වාසය නොතැබිය හැකි බව මිසර ජාතිකයා මැරීමේ අත්දැකීමෙන් මෝසෙස් දැන සිටියේය. ගිනි ඇවිළෙන පඳුරෙන් දෙවියන්වහන්සේ පෙන්නුම් කළේ උන්වහන්සේගේ ගින්න ස්වාභාවික ඉන්ධන නොමැතිව දැල්වෙන බවය. දෙවියන්වහන්සේගේ වැඩ කිරීමට ඔබ උත්සාහ කර අසාර්ථක වන්නට ඇත. එහෙත් දෙවියන්වහන්සේගේ ගින්න ස්වාභාවික දීමනා හා හැකියාවන් නමැති "ඉන්ධන" නොසලකා හරී.

## එම ගින්න නිරතුරුවේ

දෙවියන්වහන්සේ ගින්න ලබා දේ. එහෙත් දැල්වෙමින් තබා ගැනීමේ වගකීම අයති වන්නේ ඔබටය.

> **ගින්න පූජාසනය පිට නිතර දැල්වෙමින් නොනිවී තිබිය යුතුය. (ලෙවී කතාව 6:13)**

ඔබ, ඔබගේ ආත්මයේ ගිනි අඟුරුවලට පවන් ගැසීම දෙවියන්වහන්සේට අවශ්‍යය. දේව රාජ්‍යය උදෙසා ඔබ ගිනි දැල්වී තිබීම උන්වහන්සේට අවශ්‍යය.

**එය උන්වහන්සේගේ ස්වභාවයට සම්බන්ධය.**

දෙවියන්වහන්සේගේ ආත්ම හත ගින්නට සම්බන්ධය.

> **සිංහාසනයෙන් විදුලිද ශබ්දද ගර්ජනාද නික්මුණේය. සිංහාසනය ඉදිරියෙහි ගිනි පහන් සතක් දැල්වෙමින් තිබුණේය, ඒවා නම් දෙවියන්වහන්සේගේ ආත්මයාණන් සත්දෙනාය. (එළිදරව් 4:5)**

දෙවියන්වහන්සේගේ ආත්මයෝ සත්දෙනා මෙසේ වේ:

| | |
|---|---|
| 1. සත්‍යය | යොහන් 16:13 |
| 2. අනුග්‍රහය | හෙබ්‍රෙව් 10:29 |
| 3. ජීවනය | රෝම 8:2 |
| 4. දරුකමට හදා ගැනීම | රෝම 8:15 |
| 5. ශුද්ධවන්තකම | රෝම 1:4 |
| 6. ප්‍රඥාව හා එළිදරව්ව | එපීස 1:17 |
| 7. තේජස | 1 පේතෘස් 4:14 |

දෙවියන්වහන්සේගේ ගින්නෙන් ඔබගේ ජීවිතය ස්පර්ශ වූ උන්වහන්සේගේ දරුකමට හදා ගැනීමේ ආත්මය ඔබ තුළ ක්‍රියා කරනු ඇත. උන්වහන්සේගේ සත්‍යය, අනුග්‍රහය, ජීවනය, ශුද්ධවන්තකම, ප්‍රඥාව හා තේජස ඔබගේ ජීවිතය තුළ දැල්වෙන්නේය.

## එය ඔබගේ යාච්ඤාවට සම්බන්ධය.

කර්මෙල් කන්ද මත සිටි එලියා පිළිබඳ කතන්දරය 1 රාජාවලිය 18හි කියවන්න. එලියා යාච්ඤා කළ විට දෙවියන්වහන්සේගේ ගින්න බැස ආවේය. පෙන්තකොස්ත ගින්න අපට අත්දැකීමට අවශ්‍ය නම්, අප යාච්ඤා කිරීමට ඉගෙන ගත යුතුය. උඩුමහල් මැදුරේදී ඇදහිලිවතුන් දින ගණනාවක් යාච්ඤා කර ඉන්පසු මිනිත්තු දහයක පණිවුඩයක් දේශනා කළහ. අපි මිනිත්තු දහයක් යාච්ඤා කර පැය ගණනාවක් දේශනා කරන්නෙමු. ඉන්පසු දෙවියන්වහන්සේගේ ගින්න නොපැමිණෙන්නේ මන්දැයි සිතන්නෙමු.

## එය උන්වහන්සේගේ වචනයට සම්බන්ධය.

දෙවියන්වහන්සේගේ වචනය ගින්න හා සසඳා තිබේ.

**මාගේ වචනය ගින්නක් මෙන්ද ... ස්වාමීන්වහන්සේ කියනසේක (ජෙරෙමියා 23:29)**

**උන්වහන්සේ සඳහන් නොකරන්නෙමියි කියාද උන්වහන්සේගේ නාමයෙන් තවත් කතා නොකරන්නෙමියි කියාද කියම් නම්, එය මාගේ ඇට තුළේ වැසී ඇවිලෙන ගින්නක් මෙන් මාගේ සිත තුළ තිබේ. දරන්ට මා වෙහෙසන නුමුත් මට බැරිය. (ජෙරෙමියා 20:9)**

**එබැවින් නුඹලා ඔය වචනය කියන නිසා සේනාවල දෙවි වූ ස්වාමීන්වහන්සේ මෙසේ කියන සේක: බලව, නුඹේ මුඛයේ තිබෙන මාගේ වචන ගින්නක්ද මේ සෙනඟ දරද කරන්නෙමි, එයින් ඔවුන් දාලා යනවා ඇත. (ජෙරෙමියා 5:14)**

**නුඹ ධනවත් වන පිණිස ගින්නෙන් පවිත්‍ර කරන ලද රන්ද, නුඹේ නග්නභාවයේ ලජ්ජාව ප්‍රකාශ නොවන පිණිස හැඳගන්ට සුදු වස්ත්‍රද, නුඹේ ඇස් පෙනෙන පිණිස ඇස්වල ගාගන්ට අඳුන්ද මාගෙන් ලබාගන්ට නුඹට අවවාද කරමි. (එළිදරව් 3:18)**

**පොළොවේ උදුනක සත්වරක් පවිත්‍ර කළ රිදී මෙන් ස්වාමීන්ගේ වචන පිරිසිදුය. (ගීතාවලිය 12:6)**

දෙවියන්වහන්සේගේ ගින්න ඔබගේ ආත්මය ස්පර්ශ කළ විට, උන්වහන්සේගේ වචන ඔබගේ ඇට මිදුළුවල වසා තැබූ ගින්නක් වැනිය. එය දිවා රාත්‍රියෙහි ඔබ තුළ දැල්වෙනු ඇත. ජෙරෙමියා 36 කියවන්න. මේ කතාවේ, රජතුමා දේව වචනය විනාශ කිරීමට උත්සාහ කළ නුමුත් ඔහුට වචනයේ ගින්න නවතාලීමට නොහැකි බව පෙණුනි.

## එය ශාන්තිකර පූජාවට සම්බන්ධය.

දෙවියන්වහන්සේගේ ගින්න දැවීම සඳහා ශුද්ධවූ භාජනයක් අවශ්‍ය වේ. දේව මාළිගාවේ හා මණ්ඩපයේ ගිනි දැල්වීම සඳහා භාජනය කළ සෑම භාජනයක්ම ශුද්ධ විය. ඔබට ශුද්ධ විය හැක්කේ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශාන්තිකර පූජාවේ පිරිසිදු කිරීමේ ගින්න ඔබගේ ජීවිතය තුළ දැල්වෙන විට පමණක්ය. ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශාන්තිකර පූජාවට හා ගින්න අතර ඇති සබඳතාව, ආරොන් ජීවත්වන්නවුන් හා මළවුන් අතර සිටි අවස්ථාවේ පැහැදිලි විය.

**එවිට මෝසෙස් ආරොන්ට කතා කොට: නුඹේ ධූප භාජනය රැගෙන පූජාසනයෙන් ගිනි අරන් එහි බහා, සුවඳ ද්‍රව්‍ය ලා, වහාම සභාව ළඟට ගෙන ගොස් ඔවුන් උදෙසා සමගිකමක් කරන්න. මක්නිසාද ස්වාමීන්වහන්සේ කෙරෙන් උදහස නික්ම ගියේය, වසංගතය පටන් ගත්තේයයි කීවේය. (ගණන් කථාව 16:46)**

## දෙවියන්වහන්සේගේ ගින්නෙහි පරමාර්ථය

දෙවියන්වහන්සේගේ ගින්නෙහි, පහත දැක්වෙන පරමාර්ථයන් ඔබ අධ්‍යයනය කරන විට සන්නද්ධ කිරීමට හා පෙලඹවීමට ආත්මික ගින්න මෙතරම් වැදගත් මන්දැයි ඔබට අවබෝධ වනු ඇත .

## එය ඔබගේ සේවය සවිබල කරයි.

දෙවියන්වහන්සේ ඔබ තෝරා ගෙන ඇත්තේ විපත්ති නමැති ගිනි මධ්‍යයේ වේ. උන්වහන්සේගේ දවාලන ගින්න මඟින් ඔබගේ සේවය ඉටු කිරීමට දෙවියන්වහන්සේ ඔබ සවිබල කර ඇත.

**ගින්න කැලෑව දල්වන්නාක් මෙන්ද ගින්න වතුර උතුරවන්නාක් මෙන්ද ඔබ ඉදිරියෙන් කඳු දියවයන්ටත් යෙදුණොත් හොඳය. (යෙසායා 64:2)**

**බලව, මම නුඹ පවිත්‍ර කළෙමි, නුමුත් රිදී මෙන් නොවේය, පීඩා නමැති උදුනේදී නුඹ තෝරා ගතිමි. (යෙසායා 48:10)**

**උන්වහන්සේ හුළං ස්වකීය දූතයන්ද ඇවිළෙන ගිනි දළු ස්වකීය මෙහෙකරුවන්ද කරගන්න සේක. (ගීතාවලිය 104:4)**

## එය දෙවියන්වහන්සේගේ අභිමුඛය පෙන්වයි.

දෙවියන්වහන්සේගේ වැඩ සිටීම පෙන්වීමට පැරණි ගිවිසුමේ සැමවිටම භාවිත කළේ ස්වාභාවික ගින්නේ සංකේතය වේ.

**ස්වාමින්වහන්සේ ගිනි මැද සිට නුඹලාට කතා කළ සේක. නුඹලා වචන හඬ ඇසූ නුමුත් කිසි රූපාකාරයක් දුටුවේ නැත, හඬ පමණක් නුඹලාට ඇසුණේය. (ද්විතිය කතාව 4:12)**

**මක්නිසාද, මණ්ඩපය උඩ දවාලේ ස්වාමින්වහන්සේගේ වලාකුළද රාත්‍රියේ ගින්නද මුළු ඉශ්‍රායෙල් වංශයේ ඇස් ඉදිරියෙහි ඔවුන්ගේ සියලු ගමන්වලදී වූයේය. (නික්මයාම 40:38) (ගණන් කතාව 9:15ද බලන්න.)**

දෙවියන්වහන්සේගේ ආත්මික ගින්න ඔබගේ ප්‍රාණය තුළ දැවීමේදීද උන්වහන්සේගේ අභිමුඛය පෙන්වයි. ඔබගේ සේවය වලංගු කෙරෙන්නේ දෙවියන්වහන්සේගේ අභිමුඛය මඟින් වේ.

## එය මඟ පෙන්වයි.

දෙවියන්වහන්සේගේ වැඩ උදෙසා මනුෂ්‍යයන් සන්නද්ධ කළ විට ඔවුන්ට මඟ පෙන්වීමක් අවශ්‍ය වේ. උන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟට මඟ පෙන්වන සංකේතය වන්නේ දෙවියන්වහන්සේගේ ගින්නය.

**තවද ඔවුන් දවාලෙත් රාත්‍රියෙත් ගමන් කරන පිණිස ස්වාමින්වහන්සේ ඔවුන්ට මඟ පෙන්වීමට දාවල් වලා ටැඹකින්ද රාත්‍රියේ ඔවුන්ට එළිය දීමට ගිනි ටැඹකින්ද ඔවුන්ට පෙරටුව ගිය සේක. දාවල් වලා ටැඹද රාත්‍රියේ ගිනි ටැඹද සෙනඟ ඉදිරියෙන් පහව නොගියේය. (නික්මයාම 13:21-22)**

**ඔවුහු මේ දේශයේ වැසියන්ටද ඒක කියන්නාහුය. ස්වාමින්වහන්ස, ඔබ මේ සෙනඟ මැද සිටින සේකැයි ඔවුන් අසන ලද්දේය. මක්නිසාද, ස්වාමින්වහන්ස, ඔබ මුහුණට මුහුණ ලා දක්නා ලබන සේක, ඔබගේ වළාකුල මොවුන් මතුයෙහි තිබේ. ඔබ දවාලෙහි වළා ටැඹකින්ද රාත්‍රියෙහි ගිනි ටැඹකින්ද මොවුන්ට පෙරටුව යන සේක. (ගණන් කතාව 14:14) (නෙහෙමියා 9:12, 19, ගීතාවලිය 78:14, 105:39ද බලන්න.)**

**එහෙත් නුඹලා යා යුතු මාර්ගය රාත්‍රියෙහි ගින්නෙන්ද දවාලේ වළාකුලෙන්ද නුඹලාට පෙන්වමින්, නුඹලාට කූඩාරම් ගසාගන්ට ස්ථානයක් සොයා දෙන පිණිස මාර්ගයෙහි නුඹලාට පෙරටුව ගියාවූ, නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේ නුඹලා මේ කාරණයේදී විශ්වාස කළේ නැත. (ද්විතිය කතාව 1:32,33)**

## එය ශුද්ධ කර පවිත්‍ර කරයි.

පැරණි ගිවිසුම් යුගයේ අශුද්ධ වූ ඕනෑම දෙයක් විනාශ කිරීමට ගින්න භාවිත කළේය.

- ලාදුරු රෝගයට භාජනය වූ ඕනෑම දෙයක් ගින්නෙන් දවන ලදි. ලෙවී කතාව 13:52
- පිළිම ගින්නෙන් දැවිය යුතු විය. ද්විතිය කතාව 7:5, 25, 9:21, 12:3, 1 ලේකම් 14:12, යෙසායා 37:19, ජෙරෙමියා 43:13, මීකා 1:7
- සතුරාගෙන් කොල්ල කා ගත් දේ ගින්නෙන් පුලුස්සා දැමිය යුතුය. ද්විතිය කතාව 13:16
- ඇදහිලිවන්තයෙකු තුළ ඇති දෙවියන්වහන්සේගේ ගින්න, අශුද්ධ දේ දවාලන, පවිත්‍ර කිරීමේ ගින්නකි.

**අඟුරු ගින්න පිඹ නියම වැඩයට ආයුධයක් සාදන්නාවූ ආචාරියා මැවුවේ මමය, වැනසීමට නාස්තිකාරයා මැවුවෙත් මමය. (යෙසායා 54:16)**

**තුන්වෙනි කොටස මම ගින්නට පමුණුවා, රිදී පවිත්‍ර කරන්නාක් මෙන් ඔවුන් පවිත්‍ර කරන්නෙමි, රන් පරීක්ෂා කරන්නාක් මෙන් ඔවුන් පරීක්ෂා කරන්නෙමි. ඔවුහු මාගේ නාමය කියා යාච්ඤා කරන්නෝය, මම ඔවුන්ට උත්තර දෙන්නෙමි. ඔවුහු මාගේ සෙනඟයයි කියන්නෙමි. ඔවුන්ද: ස්වාමින්වහන්සේ මාගේ දෙවියන්වහන්සේයයි කියනවා ඇත. (සෙකරියා 13:9)**

**නුමුත් උන්වහන්සේගේ ඊමේ දවස දරන්ට පුළුවන් කාටද? උන්වහන්සේ පෙනෙන කල සිටින්ට පුළුවන් කාටද? මක්නිසාද උන්වහන්සේ රන්කරුවෙකුගේ ගින්නද අපුල්ලන්නන්ගේ සබන්ද මෙන්ය. (මලාකි 3:2)**

දෙවියන්වහන්සේ ඔබ භාවිත කරන සේක් නම්, ඔබගේ ජිවිතයේ ඇති අපද්‍රව්‍ය පුලුස්සා දැමිය යුතුය. ඔබ මෙම පවිත්‍ර කිරීමේ ක්‍රියාවලිය ප්‍රතික්ෂේප කරන්නෙහි නම්, ඔබ අපවිත්‍ර (ශුද්ධ නොකළ) කිසි වැදගැම්මකට නැති රිදී මෙන් වේ.

**ඔවුන් සියල්ලෝම මුරණ්ඩු වූ කැරලිකාරයෝව, කේළාම් කියා ඇවිදින්නෝව, පිත්තල හා යකඩ වැනිව සිටිති. සියල්ලෝම දූෂ්‍යකම් කරන්නෝය. මයිනහම සැරෙන් පිඹිනු ලැබේ, ඊයම්ද ගින්නෙන් දා ගියේය. ඔවුන්ගේ උණු කිරීම නිෂ්ඵලය, මක්නිසාද දුෂ්ටයෝ වෙන් කරනු නොලද්දෝය. ස්වාමින්වහන්සේ ඔවුන් එපා කළ නිසා: වෙට්ට රිදියයි මනුෂ්‍යයෝ ඔවුන්ට නම් තබන්නෝය. (ජෙරෙමියා 6:28-30)**

## එය වෙන්කරයි.

ස්වාභාවික ලෝකයේ මෙන්ම ආත්මික ලෝකයේ ද වෙන් කිරීමේ ක්‍රියාවලියට ගින්න භාවිත වේ.

**සියලු දේ ගින්නෙහි දමා අරගන්න. එවිට ඒවා පවිත්‍ර වන්නේය. එසේවී නුමුත් අපවිත්‍රකම පහ කිරීමේ වතුරෙන් ඒවායේ දෝෂ පහ කළ යුතුය. එහෙත් ගිනි ඉසිලිය නොහැකි සියල්ල වතුරෙහි දමා ගත යුතුය. (ගණන් කතාව 31:23)**

**ගිනි දැල්ලට ඉපනැලි දාලායන්නාක් මෙන්ද වියළි තෘණ ගින්නට වැටියන්නාක් මෙන්ද ... (යෙසායා 5:24)**

**තවද දැනටම පොරොව ගස් මුලට තබා තිබේ. එබැවින් හොඳ ඵල නොදරන සියලු ගස් කපනු ලැබ ගින්නෙහි දමනු ලැබේ. (මතෙව් 3:10) (මතෙව් 7:19 හා 13:40-42 ද බලන්න).**

**නුඹලා මා තෝරාගත්තා නොව මම නුඹලා තෝරාගෙන පත්කළෙමි. එසේ කළේ නුඹලා ගොස් ඵල දරන පිණිසත් නුඹලාගේ ඵල පවතින පිණිසත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේගෙන් නුඹලා ඉල්ලන කොයි දෙයක් නුමුත් උන්වහන්සේ නුඹලාට දෙන පිණිසත්ය (ජොහාන් 15:6).**

ඔබ සැබවින්ම දෙවියන්වහන්සේ සඳහා සන්නද්ධ කළ විට, ඔබ පාපයෙන් හා මේ ලෝකයේ දේවලින් වෙන් කෙරෙනවා ඇත. ඔබ උන්වහන්සේගේ පරමාර්ථයන් උදෙසා හා දේව රාජ්‍යයේ වැඩ උදෙසා වෙන් කෙරේ.

## එය සෝදිසි කරයි.

දෙවියන්වහන්සේගේ ගින්න "සෝදිසි කිරීමේ" ගින්නකි. එම ගින්න දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඔබගේ ඇදහිල්ල සෝදිසි කර බලයි.

**එසේ ශෝකයට පත් වන්නේ නාස්ති වී යන්නාවූ, එසේද වුවත් ගින්නෙන් සෝදිසි කරන්නාවූ රනට වඩා අගේව තිබෙන නුඹලාගේ අදහිල්ල පරීක්ෂා කිරීමෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්වීමේදී ප්‍රශංසාවත් මහිමයත් ගෞරවයත් පැමිණෙන පිණිසය. (1 පේතෘස් 1:7)**

එම ගින්න දෙවියන්වහන්සේට කෙරෙන ඔබගේ වැඩ ද පරීක්ෂා කර බලයි.

**එක් එක්කෙනාගේ කර්මාන්තය ප්‍රකාශ වන්නේය. මක්නිසාද එය ගින්නෙන් එළිදරව් වන නිසා ඒ දවස තෙමේ එය ප්‍රකාශ කරන්නේය, එක් එක්කෙනාගේ කර්මාන්තය කොයි ආකාරදැයි ගින්නෙන්ම ඔප්පු වන්නේය. ඒ පිට ගොඩ නැගුවාවූ යම් කෙනෙකුගේ කර්මාන්තය පවතී නම්, ඔහු විපාකයක් ලබන්නේය. යම් කෙනෙකුගේ කර්මාන්තය දැවී**

**යන්නේ නම් ඔහුට අලාභ වන්නේය. නුමුත් ඔහුම ගැළවෙන්නේය, එහෙත් ගිනි මැදින් ගැළවුණාක් මෙන්ය. (1 කොරින්ති 3:13-15)**

දර, පිදුරු හා ඉපනැලි (පොළොවෙන් උඩ ඇති දේ) ගින්නෙන් දැවී යයි. රන් හා රිදී (පොළොව යට ඇති ඒවා) ගින්නෙන් විනාශ වන්නේ නැත. මනුෂ්‍යයන්ට පෙනෙන පිණිස ඔබ කරන දේ හා දෘශ්‍යමාන දේ දෙවියන්වහන්සේගේ ගින්නෙන් විනාශ වන දේ වේ. කල් පවතින වටිනාකමක් ඇති සැබෑ වැඩ බොහෝ විට නොපෙනේ, මනුෂ්‍යයන්ගේ ගෞරවයට භාජනය නොවේ.

## එය දෙවියන්වහන්සේගේ අනුමැතිය ප්‍රදර්ශනය කරයි.

කැරලිකාර කෝරාගේ කතාව ගණන් කතාව 16න් කියවන්න. ගින්න පැමිණිකල එය කැරලිකාර පිරිස දවාලිය. දෙවියන්වහන්සේ තෝරා ගත් නායකයන් කෙරෙහි උන්වහන්සේගේ අනුමැතිය ඇති බව ඉන් ප්‍රදර්ශනය විය. 2 රාජාවලිය 1:10-14හි ඇති පරිදි දෙවියන්වහන්සේගේ ගින්න අහසින් බැස ඇවිත් පනසාධිපතියා හා ඔහුගේ මිනිසුන් දවා දැමූ විට එලියා උන්වහන්සේගේ මනුෂ්‍යයෙකු බව ඔප්පු විය. දෙවියන්වහන්සේ තම අනුමැතිය පෙන්වීමට සැබෑ ගින්නක් නොඑවුවද ඔබගේ ජීවිතයෙහි පවතින ආත්මික ගින්න උන්වහන්සේගේ අනුමැතිය පෙන්වනු ඇත.

## එය දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කරයි.

1 රාජාවලිය 18හි සඳහන් කර්මෙල් කන්දෙහි සිටින එලියා පිළිබඳ කතාව නැවත බලන්න. මේ අවස්ථාවේ දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කළේ සැබෑ ගින්නකිනි. ඔබගේ සේවයේදී උන්වහන්සේ සැබෑ ගින්නකින් තම බලය ප්‍රදර්ශනය නොකරනු ඇත. එහෙත් උන්වහන්සේ "එම ගින්න" ආත්මිකව ප්‍රදර්ශනය කරන සේක. බලගතු වචනය හා ඉන්පසු ලැබෙන ලකුණු මිනිසුන් දකින විට ඔවුහු එකම සැබෑ දෙවියන්වහන්සේ පිළිගනිති.

## එය ආත්මික අවියකි.

දෙවියන්වහන්සේගේ ගින්න ආත්මික අවියක් වේ.

**තවද ස්වාමින්වහන්සේ උයද යාමෙහි ගිනි සහ වළා ටැඹ මැදින් මිසර සේනාව දෙස බලා මිසර සේනාව වියවුල් කළ සේක. (නික්මයාම 14:24)**

**එබැවින් නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේම විනාශ කරන ගින්නක්ව නුඹට පෙරටුව යන බව අද දැන ගන්න. උන්වහන්සේම ඔවුන් විනාශ කරනවා ඇත, උන්වහන්සේම ඔවුන් නුඹ ඉදිරියෙහි යටත් කර දෙනවා ඇත. මෙසේ ස්වාමින්වහන්සේ නුඹට කී ලෙස නුඹ ඔවුන් පන්නා දමා ඉක්මනින් නැති කර දමනවා ඇත. (ද්විතීය කතාව 9:3)**

**උන්වහන්සේ පොළෝ කෙළවර දක්වා යුද්ධ නවත්වන සේක. දුන්න බිඳ, හෙල්ලය කපා දමා, රථ ගින්නෙන් දවන සේක. (ගීතාවලිය 46:9)**

**අපේ දෙවියන්වහන්සේ වඩින සේක. නිශ්ශබ්ද නොවන සේක. උන්වහන්සේ ඉදිරියෙහි ගින්නක් විනාශ කරන්නේය. උන්වහන්සේ හාත්පසින්ද සැර කුණාටු අධික වන්නේය. (ගීතාවලිය 50:3)**

ඔබගේ ජීවිතයේ සියලුම යහපත් හා පිරිසිදු දේ විනාශ කිරීමට සතුරා අත දවාලන ගින්නක් ඇත. (මෙම පාඩමේ "තව දුරටත් අධ්‍යයනය සඳහා" යන කොටස බලන්න). ඔබ ස්වාභාවික ලෝකයේ "ගින්නක් සමඟ ගින්නකින්ම සටන් කරන" ආකාරයට සතුරාගේ ගින්න සමඟ සටන් කරන්නේ දෙවියන්වහන්සේගේ ආත්මික ගින්නෙනි.

**එවිට ඉශ්‍රායෙල් නුවරවල වැසියෝ පිටතට ගොස්, ගිනි පත්තු කර, ආයුධවන පලිස්ද මහ පලිස්ද දුනුද ඊගස්ද මුගුරුද සෙල්ලද දවන්නෝය, සත් අවුරුද්දක් ඒවායින් ගිනි පත්තු කරනවා ඇත. ඔවුන් වනයෙන් දර ගෙනෙන්නේවත් මුකළාන්වලින් ඒවා කපාගන්නේවත් නැත. මක්නිසාද ඔවුහු ආයුධවලින් ගිනි පත්තුකරන්නෝය. තමුන්ගෙන් කොල්ල කෑ අයගෙන් කොල්ල කන්නෝය. තමුන්ගේ සම්පත් උදුරා ගත් අයින්ගෙන් සම්පත් උදුරා ගන්නෝයයි ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන සේක. (එසකියෙල් 39:9-10)**

දෙවියන්වහන්සේගේ ගින්න මඟින් සතුරාගේ ගින්න නිවාලන්නේය.

> **ඔවුහු මී මැස්සන් මෙන් මා වට කළෝය. කටු දර ගින්නක් මෙන් නිවී ගියෝය. ස්වාමීන්ගේ නාමයෙන් ඔවුන් සිඳ දමන්නෙමි. (ගීතාවලිය 118:12)**
>
> **ඔවුන් පිට ගිනි අඟුරු වැටේවා. ඔවුහු ගින්නෙහිද ගොඩ එන්ට බැරි ගැඹුරු වලවලද හෙළනු ලැබේවා. (ගීතාවලිය 140:10)**
>
> **එසේ, නුඹ ඔහුගේ ඉස පිට ගිනි අඟුරු ගොඩ කරන්නෙහිය. ස්වාමින්වහන්සේද නුඹට විපාක දෙන සේක. (හිතෝපදේශ 25:22)**
>
> **උන්වහන්සේ ඉදිරියේ ගින්නක් යමින් හාත්පස උන්වහන්සේගේ විරුද්ධකරයන් දවයි. (ගීතාවලිය 97:3)**
>
> **ඔවුන්ගේ කණ්ඩායම මැද ගින්නක් ඇවුළුණේය. ගිනි දැල දුෂ්ටයන් දවා දැමීය. (ගීතාවලිය 106:18)**

ස්වාභාවික ලෝකයේ ප්‍රේරිත වූ පාවුල්තුමා කළ ආකාරයටම, අප ද සතුරාගේ ප්‍රහාරයන් දෙවියන්වහන්සේගේ ගින්නට ගසා දැමිය යුතුය.

> **නුමුත් ඔහු ඒ සතා ගින්නට ගසාදමා කිසි උපද්‍රවයකට නොපැමිණ සිටියේය. (ක්‍රියා 28:5)**

හෙබ්‍රෙව් 11හි පවසා ඇත්තේ ඇදහිල්ලේ මිනිසුන් හා ස්ත්‍රීන් “රෞද්‍ර ගිනි ජාලා නිවාලූ” බවය. (හෙබ්‍රෙව් 11:34)

## දෙවියන්වහන්සේගේ ගින්න අත්දකින්නේ කෙසේද?

දෙවියන්වහන්සේගේ ගින්න අත්දකින්නේ හා එය නිරන්තරයෙන්ම ඔබගේ ජීවිතය තුළ පවත්වා ගෙන යන්නේ මේ ආකාරයට වේ:

**නැවත උත්පාදනය ලැබිය යුතුවේ.**

දෙවියන්වහන්සේගේ ගින්න ආත්මික ගින්නක් බැවින්, ඔබ එය අත්දැකිය යුත්තේ ආත්මිකව වේ. මින් අදහස් වන්නේ ඔබගේ පාපය ගැන පසුතැවිලි වී ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ පෞද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගැනීමෙන් ඔබ පළමුව නැවත ඉපදිය යුතු බවය.

**ශුද්ධාත්මයාණන්ගේ බෞතිස්මය ලබා ගන්න.**

දෙවියන්වහන්සේගේ ගින්න පෙන්තකොස්ත දින අත් දුටු ශුද්ධාත්මයාණන්ගේ බව්තිස්මයට සම්බන්ධ බව ඔබ ඉගෙන ගත්තෙහිය. *“ශුද්ධාත්මයාණන්ගේ සේවය”* නමැති පාඩමාලාවක් “හාවස්ටයිම් ජාත්‍යන්තර ජාලයේ” ඇති අතර එය ශුද්ධාත්ම බව්තිස්මයට ඔබට මඟ පෙන්වනු ඇත.

**ඔබගේ ජීවිතය පවිත්‍ර කිරීමට එම ගින්නට ඉඩ දෙන්න.**

රන් හා රිදීවල අපද්‍රව්‍ය ස්වාභාවික ගින්නෙන් දවාලන්නා සේම දෙවියන්වහන්සේගේ ගින්න ඔබගේ ආත්මික ජීවිතයේ අපද්‍රව්‍ය දවාලනු ඇත. දෙවියන්වහන්සේගේ ගින්නේ බලය අඛණ්ඩව අත්දැකීම සඳහා පවිත්‍ර කිරීමේ කාර්යය දෙවියන්වහන්සේගේ ගින්න මඟින් ඉටු කිරීමට ඔබ ඉඩ දිය යුතුය. මෙම අපද්‍රව්‍ය දවාලන ගින්නට ඔබ එරෙහි වූ විට, එය ස්වාභාවික ගින්නකට ජලය වත් කිරීමක් වැනිය. දැල්ල නිවීයනු ඇත.

**අනිකුත් ගිනි දල්වන්න.**

ස්වාභාවික ලෝකයේ ගින්නක තීව්‍රතාවය හා ප්‍රමාණය වැඩිවන්නේ එමඟින් අවට තවත් ගිනි දැල්වූ විට වේ. ආත්මික ලෝකයට ද මෙය සත්‍ය වේ. ඔබට දෙවියන්වහන්සේගේ ගින්න අඛණ්ඩව අත්

දැකීමට අවශ්‍ය නම්, ඔබ ඔබ වටා ඇති අය දැල්වීමට ක්‍රියාකාරී විය යුතුය. ශ්‍රේෂ්ඨ පැවරුම ඉටු කිරීමෙන් හා ශුභාරංචිය අන් අය සමඟ බෙදා ගැනීමෙන් ඔබට එය කළ හැකිය. ගින්න මිනිසුන් ආකර්ෂණය කරයි. මේ බව ගින්නක් ඇතිවූ විට එය වටා රැස්වෙන විශාල සෙනඟ මඟින් පෙනේ. ඔබ තුළ ඇති දෙවියන්වහන්සේගේ ගින්න, අන් අයගේ ආත්මික දැල්ල දල්වමින් ඔවුන්ව ආකර්ෂණය කෙරේවා !

**නිරන්තරයෙන්ම ගින්නට ඉන්ධන දමන්න.**

ස්වාභාවික ලෝකයේ ප්‍රවණතාව වන්නේ ගින්නකට අඛණ්ඩව ඉන්ධන නොසැපයුවහොත් එය නිවී යැම වේ. ආත්මික ලෝකයේද මෙය සත්‍යයකි. යාච්ඤාවෙන් හා දේව වචනය අධ්‍යයනය කිරීමෙන් ඔබ අඛණ්ඩව ආත්මික ගින්නට ඉන්ධන සැපයිය යුතු වේ. නිවී යන්නට ආසන්න සෙලවෙන දැල්ලකට පවන් ගැසීමෙන් එය නැවත දීප්තිමත් දැල්ලක් බවට පත් කළ හැකිය.

**ගින්න, මහිමය හා නමස්කාරය**

දෙවියන්වහන්සේගේ ගින්න උන්වහන්සේගේ මහිමය හා සබැඳේ.

> **මක්නිසාද මම්ම ඒක අවට ගිනි පවුරක්ව ඒක තුළ තේජසව සිටින්නෙමියි කියා ස්වාමින්වහන්සේ කියන සේකැයි කියන්නැයි කීය. (සෙකරියා 2:5)**
>
> **ස්වාමින්වහන්සේගේ තේජසේ පෙනීම කන්ද මුදුනේ ඇවිළී යන ගිනි මෙන් ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ ඇස්වලට පෙනුණේය (නික්මයාම 24:17... ද්විතීය කතාව 5:24 බලන්න).**
>
> **එබැවින් සේනාවල ස්වාමිවූ ස්වාමින්වහන්සේ ඔහුගේ තර අය පිටට කෙට්ටුකම යවන සේක. ඔහුගේ ඉසුර යටද ගිනි ඇවිළීමක් මෙන් ඇවිළීමක් වන්නේය (යෙසායා 10:16).**
>
> **...මක්නිසාද මුළු තේජස පිට ඉහළින් වියනක් වන්නේය (යෙසායා 4:5).**
>
> **එබැවින් නැගෙනහිර දිසාවලදී ස්වාමින්වහන්සේටත් මුහුදේ දිවයින්වලදී ඉශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමින්වහන්සේගේ නාමයටත් ගෞරව කරන්න. (යෙසායා 24:15)**

ගින්න හා දෙවියන්වහන්සේගේ තේජස නමස්කාරයටද සම්බන්ධය. ගින්න, තේජස හා නමස්කාරය ඒ අනුපිළිවෙළට ඇති බව මතක තබාගන්න.

> **සාලමොන් යාච්ඤා කොට නිමකළ විට අහසින් ගිනි බැස ඇවිත් දවන පූජාවද යාගයන්ද දවා දැම්මේය. ස්වාමින්වහන්සේගේ තේජසින් ගෘහය පිරී ගියේය. ස්වාමින්වහන්සේගේ තේජසින් සවාමින්වහන්සේගේ ගෘහය පිරී තිබුණු නිසා පූජකයන්ට ස්වාමින්වහන්සේගේ ගෘහයට ඇතුල්වෙන්ට බැරිවිය. සියලු ඉශ්‍රායෙල් පුත්‍රයෝ ගිනි බසිනවාත් ස්වාමින්වහන්සේගේ තේජස ගෘහය පිට තිබෙනවාත් දැක, ගල් අතුළ බිමට තමුන්ගේ මුහුණු නමා නමස්කාර කොට: මක්නිසාද උන්වහන්සේ යහපත්ය, උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය කියමින් ස්වාමින්වහන්සේට ස්තුති කළෝය. (2 ලේකම් 7:1-3).**

ලාබ චිත්ත වේගයන්ගෙන් දේව සේවයේ වැඩවලට අප සන්නද්ධ කළ නොහැකිය. එය ජීවමාන දෙවිඳුන්ගේ සැබෑ ගින්න විය යුතුය. තමාගේ හෝ මෙම ලෝකයේ තේජසින් අප සන්නද්ධ කළ නොහැකිය. අප සන්නද්ධ කළ යුත්තේ දෙවියන්වහන්සේගේ තේජසිනි. අපට උණුසුමක් නොමැති විධිමත් නමස්කාරයකට සහභාගි විය නොහැකිය. අපගේ නමස්කාරය ගින්නෙන් හා දෙවියන්වහන්සේගේ තේජසින් පිරී තිබිය යුතුය.

ගින්න, තේජස හා නමස්කාරය ඒ අනුපිළිවෙළට වේ.
ඊළඟ පාඩමෙන් ඔබ "තේජස" ගැන අධ්‍යයනය ආරම්භ කරනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ස්වභාවික ගින්නේ වාසිවල ආත්මික සමාන්තරතා සාකච්ජා කරන්න.

3. “දෙවියන්වහන්සේගේ ගින්න” නිර්වචනය කරන්න.

4. පෙන්තකොස්ත දින ගින්න පිළිබඳව බයිබලය උගන්වන දෙය සාරාංශ කරන්න.

5. දෙවියන්වහන්සේගේ ගින්නේ පරමාර්ථ හඳුන්වන්න.

6. ඔබගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ ගින්න අත්දකින හා පවත්වා ගෙන යන ආකාරය පැහැදිලි කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

1. දෙවියන්වහන්සේගේ ගින්න, සතුරාගේ ගින්න හා පටලවා නොගැනීමට ඔබ සැලකිලිමත් විය යුතුය.

**"දෙවියන්වහන්සේගේ ගිනි අහසෙන් වැටී බැටළුවන්ටත්, මෙහෙකරුවන්ටත් ඇවිළී ඔවුන් දවා දැමුවේය." (ජෝබ් 1:16)** යනුවෙනි.

ඔබ ජෝබ් 1 හා 2 පරිච්ඡේද අධ්‍යයනය කළහොත් මේ ගින්න දෙවියන්වහන්සේගෙන් නොවන බව ඔබට පැහැදිලි වනු ඇත. සතුරාගේ ගින්නේ ගති ලක්ෂණ කිපයක් මෙසේ වේ:

### එය විනාශකාරී ගින්නකි.

**තවද, ඒ ආත්මය නොයෙක්වර ඔහු විනාශ කරන පිණිස ගින්නෙහිද, වතුරෙහිද හෙළීය. ඔබට යමක් කරන්ට පුළුවන් නම් අපට අනුකම්පා කර පිහිට වුව මැනවයි කීවේය. (මාර්ක් 9:22)**

### එයට අවශ්‍ය ඉන්ධනය තෘෂ්ණාව වේ

**මනුෂ්‍යයෙක් ගින්න තමාගේ ළයට ගත්තොත් ඔහුගේ ඇඳුම් නොපිළිස්සේද? (හිතෝපදේශ 6:27)**

### එය විපතේ ගින්නකි

හෙබ්‍රෙව් ඇදහිලිවතුන් තිදෙනා ගැන දානියෙල් 3හි කියවන්න. දෙවියන්වහන්සේගේ සතුරන් විසින් බොහෝ විට කිතුනුවන් විපතේ ගින්නට හෙළනු ලැබේ.

### එය දුෂ්ටය

**මක්නිසාද, දුෂ්ටකම ගින්න මෙන් දවයි. ඒක කටුගස්ද, ගොකටුද නාස්ති කරයි. එසේය එය කැලෑවේ අකුල්වල ඇවිළී ඝනවූ දුම් වලාකුළු ඉහළට නගිති. (යෙසායා 9:18)**

### එය ඔබගේ වැඩ කෙරෙහි බලපායි

දෙවියන්වහන්සේ සඳහා ඔබ කරන වැඩ තම ගින්නෙන් විනාශ කිරීමට සතුරාට අවශ්‍යය. මෙම තර්ජනය ගැන ඔබ නොදැන සිටියහොත් "මාගේ කෙතට ගිනි තැබුවේ කවුද?" යයි ප්‍රශ්න කළ ජෝවාබ් මෙන් වනු ඇත. (2 සාමුවෙල් 14:31)

### එය ඔබගේ පවුල ඉලක්ක කරයි

සතුරා ශික්ලැග් ගිනි තබා විනාශ කර සිය පවුලේ අය හා අනෙකුත් මනුෂ්‍යයන් වහල්කමට ගෙන ගොස් ඇති බව දාවිත් දැනගත්තේය (1 සාමුවෙල් 30:1). සාතන් නිවෙස හා පවුල ඉලක්ක කරයි.

**ස්වාමින්වහන්සේගේ ගෘහයද, රජ ගෙයද, යෙරුසලමේ සියලු ගෙවල්ද ගිනි ලෑවේය. ලොකු ගෙවල් සියල්ලම ඔහු ගින්නෙන් දවා දැමුවේය. (2 රාජාවලිය 25:9) (ජෙරෙමියා 15:13 ද බලන්න.)**

### එය ඔබගේ ආත්මික බලකොටු ඉලක්ක කරයි

සතුරා ඉශ්රායෙල්හි බලකොටුවලට ගිනි තැබීය. (2 රාජාවලිය 8:12)

### එය අලංකාර දේ ගිනි තබයි

සතුරා ජෙරුසලමේ තිබූ සියලුම මාළිගාවල් ගිනි තැබිය. (2 ලේකම් 36:19)

## එය ඔබගේ ආත්මික ආරක්ෂාවන් විනාශ කරයි

සතුරා ජෙරුසලමේ දොරටු ගිනි තැබිය, ඒවා ඔබගේ ආරක්ෂාවේ ආත්මික දොරටුවල සංකේත වේ. නෙහෙමියා 1:3, 2:13,17.

## එය ඔබගේ මුදල්වලට බලපායි

සතුරාගේ ගින්න ගැන මෙසේ පැවසේ:

**එය විනාශය දක්වාම දවන ගින්නක්ය. එයින් මාගේ මුළු සම්පත උදුරා දමනු ලබන්නේය. (ජෝබ් 31:12)**

## එහි උපකරණය වන්නේ ඔබගේ දිවය.

**දර නැති තැන ගින්න නිවී යයි. එසේම කේළාම්කියන්නෙක් නැති කළ තරඟය නවතින්නේය. (හිතෝපදේශ 26:20)**

**එලෙසම දිව කුඩා අවයවයක් නමුත් ලොකුවට පාරට්ටු කරයි. කුඩා ගින්නකින් කොපමණ මහත් වනාන්තරයක් පත්තු වෙනවා නොවේද? දිවද ගින්නක්ය. එය අපේ අවයවයන් අතරේ අධර්මිෂ්ඨකමේ ලෝකයක්ය. ඒක මුළු ශරීරය කිලුටු කොට සකල ලෝකයට ගිනි අවුළුවයි. ඒකට ගිනි ඇවිළෙන්නේ නිරයෙන්ය. (ජාකොබ් 3:5-6)**

**දුර්ජන මනුෂ්‍යයා නපුරු උපා යොදයි. ඔහුගේ තොල්වල ඇවිළෙන ගිනිවැන්නක් තිබේ. (හිතෝපදේශ 16:27)**

## එය පුදුමාකාර ගින්නකි

ආත්මික දේ වෙත යොමු කරමින් ඇතැමුන් පවසා ඇත්තේ "ගින්නක් නොමැතිකමට වඩා කැලෑ ගින්නකට මම කැමති වෙමි." එහෙත් එය හොඳ දෙයක් නොවේ. පාලනයක් නොමැති ගින්නක් ස්වාභාවික ලෝකයේ මෙන්ම ආත්මික ලෝකයේ ද භයානක වේ.

**ආරොන්ගේ පුත්‍රයෝ වූ නාදාබ් සහ අබීහු තම තමාගේ ධූම භාජනය රැගෙන එහි ගිනි බහා ඒ පිට සුවඳ ද්‍රව්‍ය දමා ස්වාමීන්වහන්සේ ඔවුන්ට අණ නොකළාවූ අන්‍ය ගින්නක් උන්වහන්සේ ඉදිරියෙහි ඔප්පු කළෝය. තවද ස්වාමීන්වහන්සේ කෙරෙන් ගිනි නික්ම අවුත් ඔවුන් දවා දැම්මේය. එසේ ඔවුහු ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි මළෝය. එකල්හි මෝසෙස් ආරොන්ට කතා කොට මා ළඟට පැමිණෙන්නන් කරණ කොටගෙන මා විශුද්ධ බව දක්වා මුළු සෙනඟ ඉදිරියෙහි ගෞරවය ලබන්නෙමියි ස්වාමීන්වහන්සේ කී කාරණය මේයයි කීවේය. ආරොන් නිශ්ශබ්දව සිටියේය. (ලෙවී කතාව 10:1-3)**

**එහෙත් නාදාබ් සහ අබීහු සීනයි කාන්තරයේදී ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි අන්‍ය ගින්නක් ඔප්පු කළ කල්හි ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි මළෝය. ඔවුන්ට දරුවෝ නොසිටින්නෝය. එලෙයාසර් සහ ඊතාමාර් තමන්ගේ පියවූ ආරොන් ඉදිරියෙහි පූජක තනතුරේ සේවය කළෝය. (ගණන් කතාව 3:4)**

**ඔවුහු ඔබගේ ශුද්ධස්ථානය ගිනිලෑවෝය. ඔබගේ නාමයේ නිවාසය බිම හෙළා දූෂණය කළෝය. (ගීතාවලිය 74:7)**

සතුරාගේ ගින්න ඉතා බලවත් බව ඔබට මෙම කෙටි අධ්‍යයනයෙන් දකින්නට පුළුවන. එහෙත් සතුරාගේ ගින්නට බිය නොවන්න. මන්ද දෙවියන්වහන්සේ මෙසේ පොරොන්දු වී ඇත.

**එසේය දුෂ්ටයාගේ එළිය නිවී යන්නේය. ඔහුගේ ගිනිදැල්ද නොබැබළෙන්නේය.**

**(ජෝබ් 18:5)**

**ගිනි මැදින් හා ජල මැදින්ද ගියෙමුව. නුමුත් ඔබ අප එයින් සාරවත් වූ තැනකට පැමිණෙවූ සේක. (ගීතාවලිය 66:12)**

**නුඹ ජල මැදින් යනවිට මම නුඹ සමඟ සිටින්නෙමි. නුඹ ගංගා මැදින් යනවිට ඒවා නුඹට උඩින් ගලායන්නේ නැත. නුඹ ගිනි මැදින් යනවිට නොදැවෙන්නෙහිය. ගිනි දැල්ල නුඹ කෙරෙහි නොඇවිළෙන්නේය. (යෙසායා 43:2)**

2. දෙවියන්වහන්සේගේ ගින්න විනිශ්චයේ ගින්නද වේ. පහත දැක්වෙන යොමුවන් අධ්‍යයනය කරන්න.
උත්පත්ති 19:24, 22:6, නික්මයාම 9:23-24, ලෙවී කතාව 10:2, 20:14, 21:9, ගණන් කතාව 11:1-3, 26:10, විලාප ගී 2:3-4, 4:11, ද්විතීය කතාව 32:22, ජෝෂුවා 6:24, 7:15, 25, 8:8, 19, ගීතාවලිය 11:6, 78:21, 89:46, යෙසායා 30:27, 42:25, එසකියෙල් 15, ජෙරෙමියා 15:14, 34:2, එළිදරව් 4:5, 8:5, 7-8, 9:17-18, මතෙව් 18:8,9, 25:41, ලූක් 17:29, එළිදරව් 20: 9-10, 14-15, 21:8

දෙවියන්වහන්සේගේ විනිශ්චයේ ගින්න වන්නේ :

- පළිගැනීම - 2 තෙසලෝනික 1:8
- දඬුවම් කිරීම - ආමොස් 7:4
- ගිල දැමීම - යෙසායා 29:6, 30:30, ජෙරෙමියා 17:27, එසකියෙල් 23:25, ආමොස් 1:14, නාහුම් 3:15, සෙකරියා 9:4 ,11:1
- දවාලීම - එසකියෙල් 22:31
- ඊර්ෂ්‍යාව - ගීතාවලිය 79:5, ප්‍රේම ගී 8:6, එසකියෙල් 36:5, 38:19, ශෙපනියා 1:18, 3:8
- කෝපය - යෙසායා 65:5
- ක්‍රෝධය - එසකියෙල් 21:31, 38:19, ගීතාවලිය 21:9
- උණුවීම - එසකියෙල් 22:20
- තරවටු කිරීම - යෙසායා 66:15
- නිවන්නට බැරි වීම - ජෙරෙමියා 4:4, 17:27
- උදහස - නාහුම් 1:6
- සදාතනික - ජුද් 1:7

අප දැන් දන්නා පරිදි දෙවියන්වහන්සේගේ ගින්න විනිශ්චයේ අවසාන කාලයේදී පැමිණේ.

- අහසත් පොළොවත් විනිශ්චය කර දෙවියන්වහන්සේගේ ගින්නෙන් විනාශ කෙරේ. 2 පේතෘස් 3:7-12
- නිරය, සදාතන විනිශ්චයේ හා ගින්නේ ස්ථානයකි. මාර්ක් 9:44-48
- සාතන්ගේ අවසානය ගින්න වේ. එළිදරව් 20:10
- මරණයේ හා නිරයේ අවසානය ගින්න වේ. එළිදරව් 20:14
- ජීවන පොතෙහි නම ලියවී නැති අය ගිනි විලට හෙළනු ලැබේ. එළිදරව් 20:15 හා 21:8

දෙවියන්වහන්සේගේ විනිශ්චයේ ගින්න පිළිබඳ කරුණු සමහරක් මෙසේ වේ:

- ඔබට විනිශ්චයේ ගින්නෙන් සැඟවීමට නොහැකිය. ආරක්ෂාවක් නැත. නාහුම් 3:3

- ඔබට ඔබම ගලවා ගත නොහැකිය.

  **බලව, ඔව්හු ඉපනැලි මෙන් වන්නෝය. ගින්න ඔවුන් දවන්නේය, ඔව්හු ගිනිදැල්ලේ බලයෙන් තමුන්ම ගළවා නොගන්නෝය. එය ගිනි තපින්ට අඟුරක්වත් ළංව ඉන්ට ගින්නක්වත් නොවන්නේය. (යෙසායා 47:14)**

- ඔබට ඉන් ගැලවී යා හැකිය. පසුතැවිලි වීම තුළින් ඔබව ගින්නෙන් "ගිනි පෙනෙල්ලක්" එළියට ගන්නාක් මෙන් ඇදගත හැකිය. සෙකරියා 3:2

- ඔබට විනිශ්චයේ ගින්න වළක්වා ගත හැකිය.

  **මා සොයාපල්ලා, එවිට නුඹලා ජීවත්වන්නහුය. නුමුත් බෙතෙල් නොසොයල්ලා, ගිල්ගාල්ට ඇතුල් නොවෙල්ලා. බෙයර්-ෂෙබාට නොයල්ලා, මක්නිසාද ගිල්ගාල් සැබවින් වහල්කමට යනවා ඇත. බෙතෙල් ද හිස්කමට පැමිණෙනවා ඇත. (ආමොස් 5:5)**

- දෙවියන්වහන්සේගේ විනිශ්චයේ ගින්නෙන් අන් අය බේරා ගැනීමට ඔබ පත් කර ඇත.

  **අනුමානයෙහි සිටින සමහරුන්ට දයාව පෙන්වන්න. සමහරෙකුන් ගින්නෙන් ඇදලා ගලවන්න. භයින් යුක්තව සමහරුන්ට දයාව පෙන්වන්න. (යූද් 1:23)**

3. ප්‍රේරිත වූ පේතෘස්ගේ ගින්නවල් තුන ගැන අධ්‍යයනය කරන්න.
   - යොහන් 18:18 - සතුරාගේ ගින්න වටා උණුසුම් වී අකීකරු වීමට පොලඹවයි.
   - යොහන් 21:9 - කැපවීමේ ගින්න - යේසුස්වහන්සේ තම බැටළුවන් පෝෂණය කිරීමට හා දිවි පිදීමට කැඳවූ සේක.
   - ක්‍රියා 2:3 - ශුද්ධාත්මයාණන්ගේ ගින්න

4. ශුද්ධාත්මයාණන්ගේ බව්තිස්මය ඔබ අත්දැක නොමැති නම් "ශුද්ධාත්මයාණන්ගේ සේවය" නමැති හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව ලබා ගන්න. එම පාඨමාලාව "පෙන්තකොස්ත ගින්නෙන්" පූර්ණ වන ආකාරය පැහැදිලි කෙරේ.

# හතරවන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේගේ තේජාලංකාරය

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට
- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "තේජාලංකාරය" යන්න නිර්වචනය කිරීමට
- තේජාලංකාරයේ ප්‍රභවය හඳුනා ගැනීමට
- දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ ගති ලක්ෂණ පැහැදිලි කිරීමට
- දෙවියන්වහන්සේ සිය තේජාලංකාරය එළිදරව් කරන්නේ කොතනකදැයි සාකච්ඡා කිරීමට
- දෙවියන්වහන්සේගෙන් ත්‍යාගයක් ලෙස "තේජස" ලබා ගැනීමට

හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

> **නැගිට බැබළියන්න. මක්නිසාද නුඹේ ආලෝකය පැමිණුණේය. ස්වාමීන්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි උදාවිය. එසේය පොළොව අන්ධකාරයෙන්ද ජනයෝ තද අන්ධකාරයෙන්ද වසනු ලබන්නෝය. නුමුත් නුඹ කෙරෙහි ස්වාමීන්වහන්සේ උදාවන සේක. උන්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි පෙනෙන්නේය. (යෙසායා 60:1-2)**

### හැඳින්වීම

මෙම පාඩම් මාලාව ආරම්භයේදී දෙවියන්වහන්සේගේ ගින්න, තේජාලංකාරය හා සැබෑ නමස්කාරය දෙවියන්වහන්සේගේ සෙනඟ ක්‍රියා කිරීමට සන්නද්ධ කරන හා යොදවන ආත්මික බලවේග ලෙස අපි පැහැදිලි කළෙමු (2 ලේකම් 7:1-3). පසුගිය පරිච්ඡේදයෙන් ඔබ අධ්‍යයනය කළේ දෙවියන්වහන්සේගේ ගින්නත් එය දේව සේවයේ වැඩ සඳහා ඔබ සන්නද්ධ කිරීමට ඇති වැදගත්කමත් එමගින් දෙවියන්වහන්සේගේ අභිමුඛය, බලය හා අනුමැතිය ප්‍රකාශ කිරීම තුළින් ඔබගේ සේවයට ශක්තිය, පවිත්‍රතාව, ශුද්ධ කිරීම, වෙන් කිරීම, උත්සාහ කිරීම හා මාර්ගෝපදේශ සැපයීම ලබා දෙන බවය. එමෙන්ම ඔබගේ සතුරා වන සාතන්ට විරුද්ධව භාවිත කිරීමේ ආත්මික ආයුධයක් ලෙස එහි ඇති වටිනාකමද ඔබ උගත්තෙහිය.

මෙම පරිච්ඡේදය දෙවියන්වහන්සේගේ තේජාලංකාරය පිළිබඳ පාඩම් හතරකින් පළමුවැන්න වේ. උන්වහන්සේගේ තේජාලංකාරය පිළිබඳ මූලික සත්‍යයන් මෙම පාඩමෙන් හඳුන්වා දෙනු ලැබේ. පස්වන පරිච්ඡේදයෙන් ඔබ "දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ පරමාර්ථයද" හයවන පරිච්ඡේදයෙන් "දෙවියන්වහන්සේ මහිමයට පත්කරන්නේ කෙසේද" යන්නද ඉගෙන ගන්නවා ඇත. හත හා අට පරිච්ඡේදවලින් ඔබ ඉගෙන ගන්නේ දෙවියන්වහන්සේගේ තේජාලංකාරය නැතිවූ විට එය නැවත ප්‍රතිස්ථාපනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව වේ.

ඔබ අධෛර්යයට පත්ව සිටිනවා ඇත. බලාපොරොත්තු නැතිව සිටිනවා ඇත. ආත්මිකව අප්‍රාණික හා සිසිල්ව සිටිනවා ඇත. එහෙත් දේව වචනය ඔබට මෙසේ පවසන්නේය:

> **නැගිට බැබළියන්න. මක්නිසාද නුඹේ ආලෝකය පැමිණුණේය. ස්වාමීන්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි උදාවිය. එසේය පොළොව අන්ධකාරයෙන්ද ජනයෝ තද අන්ධකාරයෙන්ද වසනු ලබන්නෝය. නුමුත් නුඹ කෙරෙහි ස්වාමීන්වහන්සේ උදාවන සේක. උන්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි පෙනෙන්නේය. (යෙසායා 60:1-2)**

මෙම පද ඉශ්රායෙලය පිළිබඳ අනාවැකියක කොටසකි. ඉශ්රායෙල් ජාතිය සභාව වැනිය. ඔබ සභාවේ කොටසකි. එබැවින් දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ඔබ (ඒක වචන) මතද එමෙන්ම

ඔබ (බහු වචන සභාව) මතද රඳා පවත්නා බව මෙම පදයෙන් පෙන්නුම් කෙරේ. දෙවියන්වහන්සේ මෙසේ ද පොරොන්දු වී ඇත.

> **එවිට ස්වාමීන්වහන්සේගේ තේජස ප්‍රකාශ වන්නේය. සියලු මනුෂ්‍යයෝ එක්ව එය දකින්නෝය. මක්නිසාද ස්වාමීන්වහන්සේගේ මුඛය එය වදාළ සේකැයි මොරගසන්නෙකුගේ හඬක් වන්නේය (යෙසායා 40:5).**

මෙම පදයෙන් පෙන්නුම් කෙරෙන්නේ "සකල මිනිස් වර්ගයා" සමිඳාණන්වහන්සේගේ තේජාලංකාරය දකින බවය. දෙවියන්වහන්සේගේ තේජාලංකාරය සමඟ මුසු වීමට "මිනිස් වර්ගයා" නුසුදුසු බවක් හැඟේ. එහෙත් මෙය දෙවියන්වහන්සේගේ පොරොන්දුව වේ. ඔබ දෙවියන්වහන්සේගේ තේජාලංකාරය දැකීමට නම් හා එය ඔබ තුළින් එළිදරව් වීමට නම් එය කුමක්දැයි ද එහි පරමාර්ථයද දෙවියන්වහන්සේ මහිමවත් කරන්නේ කෙසේද යන්නද ඔබ අවබෝධ කර ගත යුතුය.

## තේජාලංකාරයේ නිර්වචනය

"තේජාලංකාරය" යන්න ඉතා විශිෂ්ට වචනයකි. ඊට සමාන පදයක් ලෙස එක් වචනයක් නොමැත. එහෙත් "තේජාලංකාරය" විස්තර කළ හැකි පද කීපයක් මෙසේ වේ:

ගෞරවය, ප්‍රශංසාව, ප්‍රශස්ත බව, දීප්තිය, බලය, මහේශාඛ්‍ය බව, වටිනාකම, සමානත්වය, අලංකාරය, කීර්තිය, තරාතිරම.

දෙවියන්වහන්සේ පිළිබඳව තේජාලංකාරය යන වචනය භාවිත කළ විට ඉන් ප්‍රකාශ වන්නේ උන්වහන්සේගේ දිව්‍යමය සාරය වේ. දෙවියන්වහන්සේගේ තේජාලංකාරය යනු උන්වහන්සේගේ විශිෂ්ටත්වය, අලංකාරය, මහේශාඛ්‍ය බව, බලය හා පරිපූර්ණත්වය ප්‍රදර්ශනය කිරීමකි. මෙම ආශ්චර්යවත් තේජාලංකාරය ඔබ මතද පැමිණ ඇති බව මතක තබා ගන්න.

## තේජාලංකාරයේ ප්‍රභවය

අප කතා කරන තේජාලංකාරයේ ප්‍රභවය දෙවියන්වහන්සේ වේ. උන්වහන්සේ "මහිමාන්විත දෙවියන්වහන්සේ" (ක්‍රියා 7:2) ලෙස හඳුන්වා දී ඇත. මිනිසුන්ට මහිමය දෙන තැනැන්වහන්සේ දෙවියන්වහන්සේය. දානියෙල් දිවැසිවරයා රජතුමාට මෙසේ පැවසීය:

> **රජ්ජුරුවෙනි ඔබ රජවරුන්ගේ රජය. මක්නිසාද ස්වර්ගයේ දෙවියන්වහන්සේ රජකමද බලයද පරාක්‍රමයද ඓශ්වර්යයද ඔබට දී තිබේ. (දානියෙල් 2:37)**

## දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ ගති ලක්ෂණ

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය පිළිබඳ වැදගත් කරුණු කිහිපයක් මෙසේ වේ:

**එය සදාතනිකය.**

> **ස්වාමීන්ගේ මහිමය සදාකල් පවතිවා. ස්වාමීන්වහන්සේ ස්වකීය කර්මාන්ත කෙරෙහි සන්තෝෂ වන සේක්වා. (ගීතාවලිය 104:31)**
>
> **ඉඳින් අමරණීය වූ අදෘශ්‍යමාන වූ එකම දෙවිවූ සදාකාල රජ්ජුරුවන්වහන්සේට ගෞරවයද තේජසද සදාකාලේටම වේවා. ආමෙන්. (1 තිමෝති 1:17)**
>
> **උන්වහන්සේට සදාකාලේටම පරාක්‍රමය වේවා. ආමෙන්. (1 පේතෘස් 5:11)**

(2 තිමෝති 2:10 1 පේතෘස් 5:10 ගලාති 1:5 හා හෙබ්‍රෙව් 13:21 ද බලන්න.)

**එය උන්වහන්සේගේ මහේශාඛ්‍ය බව හා සම්බන්ධය.**

> **මම ඔබගේ ගෞරවයේ තේජෝමහිමයත් ඔබගේ පුදුම ක්‍රියාත් මෙනෙහි කරන්නෙමි. (ගීතාවලිය 145:5)**

"එතුමන්ගේ බලයේ තේජාලංකාරය" ගැන යෙසායා 2: 10, 19 හා 21 හි සඳහන් වේ.

**එය උන්වහන්සේගේ හඬ හා සම්බන්ධය.**

> **ස්වාමින්වහන්සේ ද තමන්ගේ මහිමාන්විත හඬ අස්වනසේක. (යෙසායා 30:30)**

**එය උන්වහන්සේගේ ඇස් හා සම්බන්ධය.**

"උන්වහන්සේගේ තේජාන්විත ඇස් " ගැන යෙසායා කතා කරයි. (යෙසායා 3:8)

**එය අද්විතියය.**

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය වෙන කිසිවෙකුටත් නොදිය යුතුය.

> **මම ස්වාමින්වහන්සේය. මාගේ නාමය ඒකය. මාගේ ගෞරවය අන් කෙනකුටවත් මාගේ ප්‍රශංසාව රූපවලටවත් නොදෙන්නෙමි. (යෙසායා 42:8)**
>
> **ඉශ්රායෙල් යන නාමය දරන්නාවූ යූදා උල්පතෙන් නික්මුණාවූ සැබෑකමෙන්වත් ධර්මිෂ්ටකමෙන්වත් නොවන නුමුත් ස්වාමින්වහන්සේගේ නාමයෙන් දිවුරා ඉශ්රායෙල්ගේ දෙවියන්වහන්සේ සඳහන් කරන්නාවූ තැනැත්තන් වන යාකොබ්ගේ වංශය මේක අසන්න. (යෙසායා 48:1)**

**එය උන්වහන්සේගේ ශුද්ධවන්තකම හා සම්බන්ධය.**

> **ස්වාමින්වහන්ස දෙවිවරුන් අතරේ ඔබට සමාන කවුද? ශුද්ධකමින් මහිමවත් වූ ප්‍රශංසාවලින් භයංකරවූ පුදුම දේ කරන්නාවූ ඔබ සමාන කවුද? (නික්මයාම 15:11)**
>
> **ආකාශය උන්වහන්සේගේ ධර්මිෂ්ටකම ප්‍රකාශ කරයි. සියලු මනුෂ්‍ය වර්ගයෝ උන්වහන්සේගේ මහිමය දුටුවෝය. (ගීතාවලිය 97:6)**

**එය උන්වහන්සේගේ නාමය හා සම්බන්ධය.**

> **පියාණෙනි ඔබගේ නාමය මහිමයට පැමිණෙවුව මැනවයි කී සේක. එවිට මම එය මහිමයට පැමිණවීමි. නැවතත් මහිමයට පමුණුවන්නෙමියි අහසෙන් හඬක් නික්මුණේය. (යොහන් 12:28)**
>
> **නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේ යන මේ මහිමවත් භයානක නාමයට භයවෙන හැටියට මේ පොතෙහි ලියා තිබෙන මේ ව්‍යවස්ථාවේ සියලු වචන රක්ෂා කරන්ට බලා නොගනින්නෙහි නම්... (ද්විතිය කතාව 28:58)**

**එය ස්වර්ගයෙන් එපිට වේ.**

> **අපගේ ස්වාමි වූ ස්වාමින්වහන්ස ඔබගේ නාමය පෘථිවිය මුළුල්ලෙහි කොපමණ උතුම්ද? ඔබ ස්වකීය මහිමය අහස්තල මත්තෙහි තැබූ සේක. (ගීතාවලිය 8:1)**
>
> **ස්වාමින්වහන්සේ සියලු ජාතීන්ට උසස්ව සිටින සේක. උන්වහන්සේගේ තේජස ස්වර්ගවලට වඩා උසස්ය. (ගීතාවලිය 113:4)**

**එය පොළොවෙන් එපිට වේ.**

> **දෙවියන්වහන්ස ඔබ ස්වර්ගවලට වඩා උසස් වුව මැනව. ඔබගේ මහිමයද මුළු පොළොවෙහි උසස් වේවා. (ගීතාවලිය 108:5, සහ ගීතාවලිය 57:5)**

**එය උන්වහන්සේගේ රාජ්‍යය හා සම්බන්ධය.**

දෙවියන්වහන්සේගේ රාජ්‍යය තේජවන්ත වේ.

> **දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියාත් උන්වහන්සේගේ රාජ්‍යයේ තේජෝමහිමයත් මනුෂ්‍ය පුත්‍රයන්ට දන්වන පිණිස... (ගීතාවලිය 145:11)**

12 වන පදයේ උන්වහන්සේගේ රාජ්‍යයේ තේජස් මහිමය ගැන සඳහන් වේ. (දානියෙල් 7:14ද බලන්න.)

**එය උන්වහන්සේගේ සිංහාසනය හා සම්බන්ධය.**

දෙවියන්වහන්සේගේ සිංහාසනය "තේජසේ සිංහාසනය" ලෙස හැඳින්වේ. (1 සාමුවෙල් 2:8, යෙරෙමියා 14:21, 17:12)

**එය උන්වහන්සේගේ ක්‍රියා හා සම්බන්ධය.**

දෙවියන්වහන්සේගේ ක්‍රියා ගෞරවයෙන් හා මහිමයෙන් පූර්ණ බව බයිබලය පවසයි. (ගීතාවලිය 111:3)

**එය උන්වහන්සේගේ බලය හා සම්බන්ධය.**

දේව වචනය උන්වහන්සේගේ "බලයේ තේජස" ගැන කතා කරයි. (2 තෙසලෝනික 1:9)

**එය උතුම්ය.**

> **එසේය. ස්වාමින්වහන්සේගේ මහිමය උතුම් නිසා ඔවුහු ස්වාමින්ගේ මාර්ග ගැන ගීතිකා කරන්නෝය. (ගීතාවලිය 138:5)**

මෙම පදවලින් පෙන්නුම් කරන්නේ දෙවියන්වහන්සේ තේජාලංකාරයෙන් ලකුණු කර, නියෝජනය කර හා වටකර ඇති බවය. තේජාලංකාරය උන්වහන්සේගේ ස්වභාවයේ ලකුණකි. දෙවියන්වහන්සේ නියමාකාරයෙන් දැන ගැනීම යනු උන්වහන්සේගේ තේජාලංකාරය තුළ උන්වහන්සේ දැන ගැනීම වේ.

**දෙවියන්වහන්සේ සිය තේජාලංකාරය එළිදරව් කරන ස්ථානය**

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය පිළිබඳව මූලික සත්‍යයන් එළිදරව් කිරීමට අමතරව දෙවියන්වහන්සේ සිය තේජාලංකාරය එළිදරව් කරන්නේ කොතැනකදැයි බයිබලය පෙන්වා දෙයි.

**මැවීමේදී**

දෙවියන්වහන්සේ සිය තේජාලංකාරය මිනිසාට එළිදරව් කළ පළමු ක්‍රමය අහස හා පොළොව මැවීමේදී වේ.

> **අහස දෙවියන්වහන්සේගේ මහිමය ප්‍රකාශ කරයි. ගුවන් තලය උන්වහන්සේගේ හස්ත කර්මාන්තය දක්වයි. (ගීතාවලිය 19:1)**

මැවීමේදී දෙවියන්වහන්සේ තමන්වහන්සේ එළිදරව් කරන ආකාරය පිළිබඳ ජෝබ් පරිච්ඡේද කිපයකින් පෙන්වයි (ජෝබ් 38-41 බලන්න). ගිගුරුම හා ජලය වැනි මූලික දේ තුළින් වුවද දෙවියන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව් වේ (ගීතාවලිය 29:3).

පරිණාමවාදය වැනි ප්‍රබල බොරුවලින් සාතන් දිව්‍යමය මැවීමේ සත්‍යය සමඟ සටන් කරයි. මන්ද මැවිල්ල තුළ දෙවියන්වහන්සේ එළිදරව් වන බව ඔහු දන්නා බැවිනි.

**මක්නිසාද ලෝකය මැවූ තැන් පටන් දෙවියන්වහන්සේගේ අදෘශ්‍යමාන දේ වන උන්වහන්සේගේ සදාකාලික බලය හා දෙව්කම මවන ලද දේවලින් තේරුම් ගොස් පැහැදිලි ලෙස පෙනී යන්නේය. එබැවින් ඔවුහු නිරුත්තරව සිටිති. (රෝම 1:20)**

**අහසේදී හා පොළොවේදී**

ඇදහිලිවන්තයන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමෙන්, නමස්කාරයෙන් හා ශුභාරංචිය අන් අය සමඟ බෙදා ගැනීමෙන් දෙවියන්වහන්සේ එළිදරව් කරන විට දෙවියන්වහන්සේගේ තේජාලංකාරය අහසේත් පොළොවේත් විද්‍යමාන වේ.

**දෙවියන්වහන්ස ඔබ අහසට වඩා උසස් වුව මැනව. ඔබගේ මහිමය මුළු පොළොවට ඉහළින් තිබේවා. (ගීතාවලිය 57:11)**

**උන්වහන්සේගේ ශ්‍රීමත් නාමයට සදාකල් ප්‍රශංසා වේවා. මුළු පොළොව උන්වහන්සේගේ මහිමයෙන් පිරේවා. ආමෙන් ආමෙන්. (ගීතාවලිය 72:19)**

**...උන්වහන්සේගේ මහිමය ස්වර්ගය වසා ගත්තේය. පොළොවද උන්වහන්සේගේ ප්‍රශංසාවෙන් පිරුණේය. (හබක්කුක් 3:3)**

**මක්නිසාද ජලයෙන් මුහුද වැසී තිබෙන්නාක් මෙන් ස්වාමීන්වහන්සේගේ තේජස දැන ගැන්මෙන් පොළොව පිරී යන්නේය. (හබක්කුක් 2:14)**

**... මුළු සෙනඟ ඉදිරියෙහි ගෞරවය ලබන්නෙමියි ස්වාමීන්වහන්සේ කී කාරණය මේයයි කීවේය. (ලෙවී කථාව 10:3)**

**එහෙත් මා ජීවත්ව සිටිනවාත් මුළු පොළොව ස්වාමීන්වහන්සේගේ තේජසෙන් පූර්ණ කරනු ලබනවාත් සැබෑවා සේම ... (ගණන් කතාව 14:21)**

**ජාතීන් අතරෙහි උන්වහන්සේගේ මහිමයද සියලු ජනයන් අතරෙහි උන්වහන්සේගේ ආශ්වර්යමත් ක්‍රියාද පතළ කරව්. (1 ලේකම් 16:24)**

**ඔවුහු එක්කෙනෙක් අනිකෙකුට මොර ගසමින් : සේනාවල ස්වාමීන්වහන්සේ ශුද්ධය ශුද්ධය ශුද්ධය මුළු පොළොව උන්වහන්සේගේ තේජසින් පිරී තිබේයයි කීවෝය. (යෙසායා 6:3)**

**නුමුත් ඔහු ශුද්ධාත්මයෙන් පූර්ණව ස්වර්ගය දෙස බලා දෙවියන්වහන්සේගේ මහිමයත් දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ යේසුස්වහන්සේ නැගිට සිටිනවාත් දැක... (ක්‍රියා 7:55)**

**උන්වහන්සේගේ ක්‍රියාවලින්**

දෙවියන්වහන්සේගේ ක්‍රියා උන්වහන්සේගේ තේජාලංකාරය පෙන්වයි.

**ස්වාමීනි ඔබගේ සියලු කර්මාන්තයෝ ඔබට ස්තුති කරන්නෝය. ඔබගේ ශුද්ධවන්තයෝද ඔබට ප්‍රශංසා කරන්නෝය. දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියාත් උන්වහන්සේගේ රාජ්‍යයේ තෝජෝ මහිමයත් මනුෂ්‍ය පුත්‍රයන්ට දන්වන පිණිස ඔවුහු ඔබගේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරන්නෝය. ඔබගේ බලය ගැනද කතා කරන්නෝය. ඔබගේ රාජ්‍යය සදාකාලික රාජ්‍යයක්ය. ඔබගේ අධිපතිකමද සියලු පරම්පරාවලම පවත්නේය. (ගීතාවලිය 145:10-13)**

**යේසුස්වහන්සේ තුළින්**

ආරම්භයටත් පෙර දෙවියන්වහන්සේගේ තේජාලංකාරය හිමිව තිබූ යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ තේජාලංකාරය පෙන්නුම් කෙරේ.

**දැන් පියාණෙනි ලෝකය තිබෙන්ට පළමුවෙන් ඔබ වෙත මට තිබුණු මහිමයෙන් ඔබ වෙත මා ගෞරවයට පැමිණෙවුව මැනව. (යොහන් 17:5)**

දෙවියන්වහන්සේ සිය තේජශ්‍රියේ ප්‍රභවය වූ සේක. යේසුස්වහන්සේ තමාගේ මහිමය සෙව්වේ නැත. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ මහිමයට පත් කළ සේක (යොහන් 8:50). යේසුස්වහන්සේ තමාවම මහිමයට පත් කර ගත්තේ නැත. දෙවියන්වහන්සේ උන්වහන්සේ මහිමයට පත් කළ සේක (හෙබ්‍රෙව් 5:5) .

**ඔහු පිටතට ගිය කල යේසුස්වහන්සේ කියන සේක්: දැන් මනුෂ්‍ය පුත්‍රයා මහිමයට පැමිණුණේය. දෙවියන්වහන්සේද ඔහු තුළ මහිමයට පැමිණි සේක. දෙවියන්වහන්සේ තමන් තුළම ඔහුව මහිමයට පමුණුවන සේක. උන්වහන්සේ ඔහුව වහාම මහිමයට පමුණුවන සේක. (යොහන් 13:31-32, යොහන් 17:1 ද බලන්න).**

**මක්නිසාද මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. මොහු කෙරෙහි මම ප්‍රසන්නව සිටිමියි යන හඬක් උත්කෘෂ්ඨ තේජසින් උන්වහන්සේ කරා පහළ වූ කල්හි පිය වූ දෙවියන්වහන්සේගෙන් ගෞරවයත් තේජසත් උන්වහන්සේ ලැබූ සේක. (2 පේතෘස් 1:17)**

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය යේසුස්වහන්සේ තුළ එළිදරව් විම පිළිබඳව ශුද්ධ ලියවිල්ල උගන්වන්නේ මෙසේ වේ:

- ශ්‍රාවකයෝ යේසුස්වහන්සේ ගැන මෙසේ කීහ. "පුත්‍රයාණන්ගේ තේජශ්‍රිය අපි දුටිමු." යොහාන් 1:14
- යේසුස්වහන්සේගේ ක්‍රියා උන්වහන්සේගේ තේජශ්‍රිය ප්‍රකාශ කළ සේක. යොහන් 2:11
- උන්වහන්සේ මරණයෙන් උත්ථානයට පත් කළේ තේජශ්‍රියෙනි. 1 පේතෘස් 1:21 1:11
- උන්වහන්සේ ඔසවනු ලැබුවේ තේජශ්‍රියෙනි. 1 තිමෝති 3:16
- උන්වහන්සේ තේජශ්‍රියෙන් වඩින සේක. මතෙව් 16:27 24:30 25:31 මාර්ක් 8:38 13:26 ලූක් 9:26 21:27 තිතස් 2:13
- උන්වහන්සේ මහිමාන්විතව සිංහාසනයේ වැඩ හිඳින සේක. මතෙව් 19:28 25:31 මාර්ක් 10:37
- උන්වහන්සේ තේජස හා ගෞරවය නමැති කිරුළ පැළඳ සිටින සේක. හෙබ්‍රෙව් 2:9
- උන්වහන්සේ "තේජශ්‍රියෙන් වැජඹෙන ස්වාමීන්" ලෙස හඳුන්වන සේක. ජාකොබ් 2:1
- දෙවියන්වහන්සේට මෙන් උන්වහන්සේටද මහිමය ආරෝපණය කරනු ඇත. 2 පේතෘස් 3:18
- දුක් විඳීම තුළින් යේසුස්වහන්සේ තේජශ්‍රිය අප වෙත ගෙනා සේක. හෙබ්‍රෙව් 2:10
- උන්වහන්සේගේ මරණයෙන් හා නැවත නැගිටීමෙන් යේසුස්වහන්සේ උන්වහන්සේගේ අවසාන මහිමාන්විත තත්ත්වයට පැමිණි සේක. යොහන් 12:23 ලූක් 24:26 යොහන් 7:39 12:16
- දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ පොරොන්දු හා තේජශ්‍රිය යේසුස්වහන්සේ තුළින් එළිදරව් කරන සේක. 2 කොරින්ති 1:20
- අපි යේසුස්වහන්සේ මඟින් දෙවියන්වහන්සේ මහිමයට පත් කරමු. එපීස 3:21 රෝම 16:27

### ගැලවීම තුළින්

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ගැළවීමේ සැලැස්මෙන් එළිදරව් වේ.

### සුවිශේෂී ස්ථාන.

දෙවියන්වහන්සේ සුවිශේෂී ස්ථානවල සිය තේජාලංකාරය එළිදරව් කර ඇත. අතීතයේදී උන්වහන්සේ සුවිශේෂී භූගෝලීය ස්ථානවල එය එළිදරව් කළ සේක. උන්වහන්සේ සිය තේජාලංකාරය පැරණි ගිවිසුමේ කූඩාරමේදී ද දේව මාළිගාවේදී ද එළිදරව් කළ සේක.

දෙවියන්වහන්සේ ඉශ්රායෙල්හිදී සිය තේජාලංකාරය එළිදරව් කළ අතර දැන් සභාවට සාමූහිකවත් ඇදහිලිවතුන්ට පුද්ගලිකවත් එළිදරව් කරන සේක.

**1. භූගෝලීය පිහිටීම්**

දෙවියන්වහන්සේ එසකියෙල්ට එතැනට (මිටියාවතට) යන්නැයි පැවසූ සේක. කෙබාර් ගඟ ළඟදී ඔහු දුටුවාක් මෙන් උන්වහන්සේ උන්වහන්සේගේ තේජාලංකාරය එහිදී එළිදරව් කරන/කළ සේක.

> **එකල මම නැගිට සමභූමියට ගියෙමි. එවිට කෙබාර් ගඟ ළඟදී මා දුටු තේජස මෙන් ස්වාමින්වහන්සේගේ තේජස එහි තිබෙනවා දුටිමි. මම මුහුණින් වැටුණෙමි. (එසකියෙල් 3:23)**

> **එවිට මා විසින් සම භූමියෙහි දුටු පෙනීම මෙන් ඉශ්රායෙල් දෙවියන්වහන්සේගේ තේජස එහි තිබෙනවා දුටිමි. (එසකියෙල් 8:4)**

මෝසෙස්ට පර්වතයක් මත සිටින්නැයි පැවසූ අතර දෙවියන්වහන්සේ **එහිදී** තමන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව් කරනු ඇත යයි දෙවියන්වහන්සේ පැවසූ සේක. (නික්මයාම 33:22)

**2. කූඩාරමේදී (සම්මුඛ මණ්ඩපයේදී)**

පැරණි ගිවිසුමේ සම්මුඛ මණ්ඩපයේදී දෙවියන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව් විය.

> **එහිදී මම ඉශ්රායෙල් පුත්‍රයන්ට සම්මුඛ වන්නෙමි. මාගේ මහිමයෙන් කූඩාරම විශුද්ධ කරනු ලබන්නේය. (නික්මයාම 29:43)**

> **එවිට වලාකුළ සම්මුඛවීමේ කූඩාරම වසා ගත්තේය. ස්වාමින්වහන්සේගේ තේජසෙන් මණ්ඩපය පිරී ගියේය. (නික්මයාම 40:34)**

> **වලාකුළ ඊ පිට රැඳුණු බැවින්ද ස්වාමින්වහන්සේගේ තේජසෙන් මණ්ඩපය පිරී ගිය බැවින්ද මෝසෙස්ට සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල්වෙන්ට නොහැකි විය. (නික්මයාම 40:35)**

> **ස්වාමින්වහන්සේගේ මහිමයද සම්මුඛ වීමේ කූඩාරමේදී සියලු ඉශ්රායෙල් පුත්‍රයන්ට පෙණුනේය. (ගණන් කථාව 14:10)**

**3. දේව මාළිගාවේදී**

පැරණි ගිවිසුම් යුගයේදී දෙවියන්වහන්සේ සිය තේජාලංකාරය දේව මාළිගාවේදීද එළිදරව් කළ සේක.

> **එවිට ආත්මය මා ඔසවාගෙන ඇතුල් මළුවට මා පැමිණෙවුවේය. ගෘහය ස්වාමින්වහන්සේගේ තේජසින් පිරී තිබෙන බව දුටිමි. (එසකියෙල් 43:5)**

> **එවිට ඔහු උතුරු දොරටුවේ මාර්ගයෙන් ගෘහයේ ඉස්සරහ පැත්තට මා පැමිණෙවුවේය. මම බැලූ විට ස්වාමින්වහන්සේගේ ගෘහය ස්වාමින්වහන්සේගේ තේජසින් පිරී තිබෙන බව දැක මුහුණින් වැටුණෙමි. (එසකියෙල් 44:4)**

> **මා විසින් ගෘහය කෙරෙහි ප්‍රසන්න වී ගෞරව ලබන පිණිස නුඹලා කඳු රටට නැගී ගොස් ලී ගෙනැවුත් ඒක ගොඩනගන්නැයි ස්වාමින්වහන්සේ කියන සේක. (හග්ගයි 1:8)**

> **... මේ ගෘහය තේජසින් පුරවන්නෙමියි සේනාවල ස්වාමින්වහන්සේ කියන සේක. (හග්ගයි 2:7)**

> **වලාපටලය නිසා පූජකයන්ට සේවය කිරීම පිණිස සිටින්ට නොහැකි විය. මක්නිසාද ස්වාමින්වහන්සේගේ තේජසින් ස්වාමින්වහන්සේගේ ගෘහය පිරුණේය. (1 රාජාවලිය 8:11)**

**සාලමොන් යාච්ඤා කොට නිමකළ විට අහසින් ගිනි බැස ඇවිත් දවන පූජාවද යාගයන්ද දවා දැම්මේය. ස්වාමීන්වහන්සේගේ තේජසින් ගෘහය පිරී ගියේය. ස්වාමීන්වහන්සේගේ තේජසින් ස්වාමීන්වහන්සේගේ ගෘහය පිරී තිබුණු නිසා පූජකයන්ට ස්වාමීන්වහන්සේගේ ගෘහයට ඇතුල්වෙන්ට බැරි විය. සියලු ඉශ්රායෙල් පුත්‍රයෝ ගිනි බසිනවාත් ස්වාමීන්වහන්සේගේ තේජස ගෘහය පිට තිබෙනවාත් දැක ගල් අතුළ බිමට තමුන්ගේ මුහුණු නමා නමස්කාරකොට: මක්නිසාද උන්වහන්සේ යහපත්ය. උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය කියමින් ස්වාමීන්වහන්සේට ස්තුති කළෝය. (2 ලේකම් 7:1-3)** (නික්මයාම 40:34 ;14:4, 17; 16:10 එසකියෙල් 1:28; 8:4 10:30-34; 11:22-23; 2 ලේකම් 5:13-14; 7:1-3 ද බලන්න.)

## 4. ඉශ්රායෙල්හිදී

ඉශ්රායෙලය තෝරා ගනු ලැබුවේ

**"... මට සෙනඟක්ද නාමයක්ද ප්‍රශංසාවක්ද තේජසක්ද වන පිණිස මුළු ඉශ්රායෙල් වංශයද මුළු යුදා වංශයද මට ඇලුම් වන්නට සැලැස්වීමි. නමුත් ඔව්හු අසන්නට අකමැතිවූවෝය. (යෙරෙමියා 13:11)**

"දෙවියන්වහන්සේ ඔබේ සෙනඟ වන ඉශ්රායෙල්වරුන්ගේ මහිමයද වේ." (ලූක් 2:32) යයි පවසා තිබේ. දෙවියන්වහන්සේ ඉශ්රායෙල්වරුන්ට මෙසේ පැවසූ සේක :

**ඉශ්රායෙල් නුඹ මාගේ මෙහෙකරුවාය. නුඹ කරණකොටගෙන ගෞරව ලබා ගන්නෙමියි මට කී සේක. (යෙසායා 49:3)**

**ස්වර්ගයෙනි ගී කියන්න. මක්නිසාද ස්වාමීන්වහන්සේ ඒක කළ සේක. පොළොවේ පහත් තැන් ඝෝෂා කරන්න. කඳුද වනයද එහි සියලු ගස්ද යන නුඹලා ප්‍රීතියෙන් ශබ්ද නගන්න. මක්නිසාද ස්වාමීන්වහන්සේ යාකොබ් මිදූ සේක. ඉශ්රායෙල් කරණකොටගෙන ගෞරව ලබා ගන්න සේක. (යෙසායා 44:23)**

එහෙත් ඉශ්රායෙලය ඔවුන් තුළ දෙවියන්වහන්සේගේ තේජාලංකාරය පූර්ණ ලෙස එළිදරව් කිරීමට ඉඩ දුන්නේ නැත.

**යම් ජාතියක් තමුන්ගේ දෙවිවරුන් දෙවි නොවන නුමුත් ඔවුන් මාරු කළෝද? එහෙත් මාගේ සෙනඟ තමුන්ගේ මහිමය ප්‍රයෝජන නොවන දේවලට මාරු කර ගත්තෝය. (යෙරෙමියා 2:11)**

## 5. සභාව තුළදී

නව ගිවිසුම් යුගයේදී දෙවියන්වහන්සේ සභාව ලෙස හැඳින්වෙන නව සෙනඟ කණ්ඩායමක් තුළින් සිය තේජාලංකාරය එළිදරව් කිරීමට පටන් ගත් සේක.

**ඔවුහු ඉශ්රායෙල්වරුය. පුත්‍රකමත් මහිමයත් ගිවිසුමුත් ව්‍යවස්ථාව දීමත් දේව සේවයත් පොරොන්දුත් ඔවුන්ගේය. (රෝම 9:4)**

**ඒ නිසා නුඹලා තවත් විදේශිකයෝවත් ආගන්තුකයෝවත් නොව ශුද්ධවන්තයන් සමඟ එක නුවර වැසියෝව දෙවියන්වහන්සේගේ පවුලේ අයවල්ව සිටින්නහුය. නුඹලා ප්‍රේරිතයන්ගෙත් ප්‍රොපේතවරුන්ගෙත් අත්තිවාරම පිට ඉදිකරනු ලැබ සිටින්නහුය. ක්‍රිස්තුස් යේසුස්වහන්සේම එහි කොණේ ප්‍රධාන ගලව සිටින සේක. උන්වහන්සේ තුළ මුළු ගොඩනැගිල්ල හොඳ හැටියට එකතුකරනලදුව ස්වාමීන්වහන්සේ තුළ ශුද්ධවූ මාළිගාවක්ව සෑදී ගෙන යන්නේය. උන්වහන්සේ තුළ නුඹලාත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ වාසය පිණිස එකට ගොඩ නගන ලද්දහුය. (එපීස 2:19-22)**

දෙවියන්වහන්සේට අවශ්‍ය සිය තේජාලංකාරයෙන් පිරුණු තේජාන්විත සභාවකි.

**තේජවත් සභාවක් කොට තමන්ට ඔප්පු කර ගැනීම සඳහා වචනය නමැති වතුරෙන් සේදීමෙන් උන්වහන්සේ එය පවිත්‍ර කොට පිරිසිදු කරන පිණිසය. (එපීස 5:27)**

**6. එක් එක් ඇදහිලිවන්තයන් තුළ**

සභාව පෞද්ගලික ඇදහිලිවතුන්ගෙන් සමන්විත වේ. සභාවේ සාමුහිකව දෙවියන්වහන්සේගේ තේජස එළිදරව් වීම සඳහා පෞද්ගලිකව සෑම ඇදහිලිවන්තයෙකු තුළම එය එළිදරව් විය යුතුය.

**නුඹලා දෙවියන්වහන්සේගේ මාළිගාව බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන බවද නොදනිවුද? (1 කොරින්ති 3:16)**

**නොහොත් නුඹලාගේ ශරීරය දෙවියන්වහන්සේගෙන් ලැබූ නුඹලා තුළ ඇත්තාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාළිගාව බව නොදනිවුද? නුඹලා නුඹලාටම අයිති නැත. මක්නිසාද නුඹලා මිලේට ගනු ලැබුවහුය. එබැවින් නුඹලාගේ ශරීරයෙන් දෙවියන්වහන්සේට ගෞරව කරන්න. (1 කොරින්ති 6:19-20)**

දැන් ඔබගේ අධ්‍යයනය මඳකට නවත්වා හග්ගයි 2:3-9 කියවන්න. සමිඳාණන්වහන්සේගේ මහත්ම තේජාලංකාරය එළිදරව් වන්නේ “පැරණි දේවමාළිගාවේදී” (අපගේ ශරීර මාළිගාවන් ලෙස) වේ.

**නුමුත් ඒ බලයේ ඉතා උතුම්කම අපට නොව දෙවියන්වහන්සේට අයිති වන පිණිස මේ වස්තුව අපි මැටි භාජනවල දරමුව. (2 කොරින්ති 4:7)**

තේජාලංකාරය (වස්තුව) ඇත්තේ මැටි භාජනවලය. ඒවා රන් භාජනවල තිබුණේ නම් සෙනඟ ආකර්ෂණය වන්නේ භාජනයට මිස එහි අන්තර්ගතයට නොවේ.

**අපි සියල්ලෝද මුහුණ වැස්මක් නැතුව ස්වාමීන්වහන්සේගේ තේජස කැඩපතකින් මෙන් දක්වමින් ආත්මයාණන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට වෙනස් කරනු ලබමුව. (2 කොරින්ති 3:18)**

**තවද දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නන්ට එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබුවන්ට සියලු දේම යහපත පිණිස එකට ක්‍රියා කරන බව අපි දනිමුව. මක්නිසාද උන්වහන්සේ පූර්වයෙන් ඇඳිනගත්තවුන් තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුලුඳුලා වන පිණිස ඒ පුත්‍රයාගේ ස්වරූපයට සමාන වෙන්ට පූර්වයෙන් නියම කළ සේක. පූර්වයෙන් නියම කළ වුන් උන්වහන්සේ කැඳවා ගත් සේක. කැඳවාගත්තවුන් උන්වහන්සේ ධර්මිෂ්ඨ කළ සේක. ධර්මිෂ්ඨ කළ අය උන්වහන්සේ මහිමයට පැමිණෙවූ සේක. (රෝම 8:28-30)**

## ක්‍රිස්තුස්වහන්සේගේ තේජාලංකාරය

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ක්‍රිස්තුස්වහන්සේ තුළ එළිදරව් වන ආකාරය ඔබ දැනටමත් ඉගෙන ගෙන ඇත. එහෙත් ඔබද ක්‍රිස්තුස්වහන්සේගේ තේජාලංකාරය වන බව ඔබ දැන සිටියෙහිද?

**“ ... උන්වහන්සේ නුඹට ගෞරව කර තිබේ.” (යෙසායා 55:5)**

**එනම් මාගේ නාමය දරන්නාවූ මාගේ ගෞරවය පිණිස මා විසින් මවා තනා සෑදුවාවූ සියල්ලන් ගෙනෙන්නැයි කියාත් කියන්නෙමි. (යෙසායා 43:7)**

“දෙවියන්වහන්සේගේ රාජ්‍යයටත් මහිමයටත් කැඳවනු ලැබූ ඔබ” උන්වහන්සේට ඔබින පරිදි ජීවත් විය යුතුය. (1 තෙසලෝනික 2:12)

අපි සභාවේ පණිවුඩකරුවන් වන අතර ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය වමු (2 කොරින්ති 8:23). අපි දෙවියන්වහන්සේගේ මහිමයේ ප්‍රශංසාව වන පිණිස තෝරා ගනු ලැබූ අය වෙමු (එපීස 1:12).

**නුඹ ස්වාමීන්වහන්සේගේ අතෙහි අලංකාර ඔටුන්නක්ද නුඹේ දෙවියන්වහන්සේගේ අතෙහි රාජ කිරීටයක්ද වන්නෙහිය. (යෙසායා 62:3)**

**මහිමය පිණිස පූර්වයෙන් තමන්වහන්සේ විසින් සූදානම් කරන ලද දයාවේ භාජන වූ... (රෝම 9:23)**

**එහෙයින් දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස ක්‍රිස්තුස්වහන්සේ නුඹලා පිළිගත් ලෙසම නුඹලාත් එකිනෙකා පිළිගන්න. (රෝම 15:7)**

**පියෙකු තමාගේ දරුවන්ට මෙන් අප විසින් නුඹලාට අවවාද කරමින් ධෛර්යය දෙමින් අණ දෙමින් නුඹලා එක් එක්කෙනාට ක්‍රියා කළ හැටි නුඹලා දනිහුය. (1 තෙසලෝනික 2:12)**

අපි "ක්‍රිස්තුස්වහන්සේ මඟින් ස්වකීය සදාතන තේජසට කැඳවූ" අය වෙමු. (1 පේතෘස් 5:10)

**මක්නිසාද තමන්වහන්සේගේ මහිමයෙන් හා ගුණවන්තකමෙන් අප කැඳවාගත් තැනැන්වහන්සේ දැනගැනීම කරණ කොටගෙන උන්වහන්සේගේ දිව්‍ය බලයෙන් ජීවිතයටත් දේව භක්තියටත් අදාළ වූ සියලු දේ අපට දී තිබේ. (2 පේතෘස් 1:3)**

**අපගේ ගෞරවය පිණිස ලෝකවලට ප්‍රථම දෙවියන්වහන්සේ විසින් කලින් නියමකරනලද්දාවූ සගවා තිබූ දෙවියන්වහන්සේගේ ප්‍රඥාව අභිරහසක් ලෙස කථාකරමු. (1 කොරින්ති 2:7)**

**නුඹලා නුඹලාගේ කැඳවීමට සුදුස්සෝයයි අපගේ දෙවියන්වහන්සේ විසින් ඒත්තු ගෙන යහපත්කමේ සියලු ආශාද ඇදහිල්ලේ සියලු ක්‍රියාද ස්වකීය බලයෙන් සම්පූර්ණ කරන මෙන් අපි නිතරම නුඹලා ගැන යාච්ඤා කරමුව. (2 තෙසලෝනික 1:12)**

**අපේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ තේජස ලබා ගැනීම පිණිස උන්වහන්සේ අපේ ශුභාරංචිය කරණකොටගෙන නුඹලා ඊට කැඳවූ සේක. (2 තෙසලෝනික 2:14)**

අප "උන්වහන්සේගේ මහිමයේ ප්‍රශංසාව" විය යුතුය. (එපීස 1:12)

**" ... ජීවත්වන්නවුන්ගේ දේශයේ මම මහිමය තබන්නෙමි." (එසකියෙල් 26:20)**

තේජාන්විත සම්පත අප දැනගැනීම දෙවියන්වහන්සේට අවශ්‍යය (කොලොස්සි 1:27).

අප තේජාලංකාරයේ පණිවුඩකරුවන් විය යුතුය. මුල් ඇදහිලිවතුන් "ක්‍රිස්තුස්වහන්සේට ගෞරවයක්ව සිටින සභාවන්හි නියෝජිතයෝ" ලෙස හඳුන්වනු ලැබූහ. (2 කොරින්ති 8:23)

**ජාතීන් අතරෙහි උන්වහන්සේගේ මහිමයද සියලු ජනයන් අතරෙහි උන්වහන්සේගේ ආශ්චර්යවත් ක්‍රියාද පතළ කරව්. (1 ලේකම් 16:24)**

ඔබ දෙවියන්වහන්සේගේ තේජාලංකාරය පෙන්නුම් කළ යුතු බව දැන් ඔබට අවබෝධ වී ඇත. දැන් "මෙම තේජාලංකාරය ලබා ගන්නේ කොතැනකින්ද කෙසේද"යයි ඔබ අසන්නට පුලුවන.

## තේජාලංකාරයේ ත්‍යාගය

දෙවියන්වහන්සේගේ මෙම අගනා තේජාලංකාරය ඔබට ත්‍යාගයක් ලෙස වෙන් කර තිබේ. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක :

**"ඔබ මට දුන් මහිමය මම ඔවුන්ට දුනිමි." (යොහන් 17:22)**

පියාණන්වහන්සේ විසින් තමා මහිමයට පත් කළ තේජශ්‍රීයම ඔබට ලැබීම සමිඳුන්ගේ ආශාව වේ. එය ත්‍යාගයකි. ඔබ කළ යුත්තේ එය ඉල්ලීම පමණකි.

**මක්නිසාද දෙවිවූ ස්වාමින්වහන්සේ සූර්යයෙක්ය. පලිහක්ය. ස්වාමින්වහන්සේ අනුග්‍රහයත් මහිමයත් දෙන සේක. අවංක ලෙස හැසිරෙන්නන්ගෙන් කිසි යහපතක් නොවලක්වන සේක. (ගීතාවලිය 84:11)**

දේව වචනයෙන් යාච්ඤාවෙන් හා ඔබ ගත කරන ජිවිතයේ අත්දැකීම්වලින් ඔබ වෙනස් වන විට ඔබ මෙම තේජශ්‍රීය ලැබීමේ ක්‍රියාවලියේ සිටී.

**අපි සියල්ලෝද මුහුණ වැස්මක් නැතුව ස්වාමීන්වහන්සේගේ තේජස කැඩපතකින් මෙන් දක්වමින් ආත්මයාණන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට වෙනස් කරනු ලබමුව. (2 කොරින්ති 3:18)**

තේජශ්‍රීය කැඩපතින් (දේව වචනයෙන්) ඔබගේ ජිවිතයට පරාවර්තනය වේ. සිය තේජශ්‍රීය කෙසේවත් නොමැති ඒ දෙය ගෙන එය සිය තේජශ්‍රීය එළිදරව් කරන උපකරණයකට වෙනස් කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍යය.

ඔබ "මහිමයෙන් මහිමයට" පත්වීම අවශ්‍යය. පරාජයෙන් පරාජයට නොවේ. ඔබ වෙත ඇති සන්නද්ධ කිරීමේ බලය දෙවියන්වහන්සේගේ තේජශ්‍රීය වේ. වෙන කිසිදාකට වඩා අද මිනිසුන් පවසන්නේ "අපි යේසුස්වහන්සේ දකින්නෙමු" යනුවෙනි.

**"... ස්වාමින්වහන්සේ නුඹට සදාකාල එළියක්ද නුඹේ දෙවියන්වහන්සේ නුඹේ තේජසද වන්සේක (යෙසායා 60:19).**

**එසේය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මුහුණෙහි දෙවියන්වහන්සේගේ තේජස දැනගැන්ම නැමති ආලෝකය බැබළෙන පිණිස අපගේ සිත්වල බැබළුවේ අන්ධකාරයෙන් ආලෝකය බැබළෙන්ට කිවාවූ දෙවියන්වහන්සේය. (2 කොරින්ති 4:6)**

ඔබගේ මොර ගැසීම මෝසෙස්ගේ මොර ගැසීමම වේවා.

**"ඔබේ තේජස මට පෙන්නුව මැනව". (නික්මයාම 33:18)**

එය දාවිත්ගේ මෙන්ද වේවා.

**මෙසේ ඔබගේ බලයත් ඔබගේ මහිමයත් දකින පිණිස ශුද්ධස්ථානයේදී ඔබ දෙස බලා සිටියෙමි. (ගීතාවලිය 63:2)**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "තේජාලංකාරය" නිර්වචනය කරන්න.

3. තේජාලංකාරයේ ප්‍රභවය කවුරුන්ද?

4. දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ ගති ලක්ෂණ සාරාංශ කරන්න.

5. දෙවියන්වහන්සේ සිය තේජාලංකාරය එළිදරව් කරන්නේ කොතැන්හිද?

6. මෙම ප්‍රකාශය හරිද වැරදිද? දෙවියන්වහන්සේගෙන් මහිමය ලැබීමට ඔබ යහපත් ක්‍රියා කළ යුතුය. එය ත්‍යාගයක් නොවේ. මෙම ප්‍රකාශය"

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

1. මෙම පරිච්ඡේදයේ ඔබ දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ගැන ඉගෙන ගත්තෙහිය. බයිබලය **"නිෂ්ඵල තේජස"** යන තවත් තේජසක් ගැන විස්තර කරයි. මෙම ආකාරයේ තේජස වන්නේ,

**මනුෂ්‍යයාගේ තේජස වේ.**

සියලුම මනුෂ්‍යයෝ යම් ආකාරයක තේජසක් සොයති. එය දෙවියන්වහන්සේගේ තේජස නොවේ නම් එය නිෂ්ඵල තේජසකි. ඇතැමුන් දෙවියන්වහන්සේගේ තේජසට වඩා මනුෂ්‍යයන්ගේ තේජසට ඇලුම් කරති.

> **එබැවින් නුඹ දන්දෙන කල්හි මනුෂ්‍යන්ගෙන් ප්‍රශංසා ලබන පිණිස සිනගෝගවලදීත් වීථිවලදීත් වංචාකාරයන් කරන්නාක් මෙන් නුඹට පෙරටුවෙන් හොරණෑවක් නොපිඹින්න. සැබවක් නුඹලාට කියමි: ඔවුන්ගේ විපාකය ඔවුන්ට ලැබී තිබේ. (මතෙව් 6:2)**

මනුෂ්‍යයන්ගෙන් ගෞරවය ලැබීමට ඔබ කරන ඕනෑම දෙයක ප්‍රතිලාභය වන්නේ ඔවුන්ගේ ප්‍රශංසාවය. "පෙනීමෙන් පාරට්ටු කිරීමක්" ගැන පාවුලුතුමා කතා කරයි. එය හදවතින් කෙරෙන්නක් නොවේ (2 කොරින්ති 5:12).

මනුෂ්‍යයාගේ තේජාලංකාරය දිගුකල් නොපවතී.

> **කුමක් හෙයින්ද මාංසමය වූ සියල්ලෝම තණකොළ මෙන්ය. ඔවුන්ගේ මුළු තේජස තණ මල මෙන්ය. තණකොළ වියළී යයි. මල් වැටේ. නුමුත් ස්වාමින්වහන්සේගේ වචනය සදාකාලේටම පවතින්නේය. මේ වනාහි නුඹලාට දේශනා කරන ලද ශුභාරංචි වචනයය. (1 පේතෘස් 1:24-25)**

ඔබ මනුෂ්‍යයාගේ තේජසට ඇලුම් නොවිය යුතුය.

> **එහෙත් මම පාරට්ටු කරගන්ට කැමති වෙතත් අඥානයෙක් නොවන්නෙමි. මක්නිසාද මම ඇත්ත කියන්නෙමි. එසේවී නුමුත් මා කෙරෙහි දකින දේට නොහොත් මාගෙන් අසන දේට වඩා මම උතුමැයි කිසිවෙකු නොසිතන පිණිස එයින් වලකිමි. (2 කොරින්ති 12:6)**
>
> **මම අඥානයෙක් වී සිටිමි. ඊට නුඹලා මා සැලැස්සුවහුය. මා ගැන සාක්ෂි දෙන්ට යුතුව තිබුණේ නුඹලා විසින්ය. මක්නිසාද මම කිසිත් නොවෙමි නුමුත් ඔය උත්කෘෂ්ට ප්‍රේරිතයන්ට වඩා කොයි ආකාරයකටත් අඩු නොවීමි. (2 කොරින්ති 12:11)**
>
> **එහෙයින් කවරෙක්වත් මනුෂ්‍යයින් ගැන පාරට්ටු නොකෙරේවා ( 1 කොරින්ති 3:21)**
>
> **"අපි කිසි දිනක මනුෂ්‍ය ගෞරවය නොසෙවුවෙමු" යි පාවුලු තුමා කිය. (1 තෙසලෝනික 2:6).**

ඔබ ලබන ඕනෑම ප්‍රශංසාවක් දෙවියන්වහන්සේ වෙතට නැවත හැරවිය යුතුය. පාවුලු තුමා මෙසේ පවසයි.

> **ඔවුහු මා ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කළෝය. (ගලාති 1:24)**

**ස්වයං තේජස**

ඔබවම තේජසට පත් කර ගැනීමෙන් ඔබද නිෂ්ඵල තේජසට වරදකරුවෙකු විය හැකිය.

> **බොහෝ මී පැණි කෑම හොඳ නැත. එමෙන්ම මනුෂ්‍යයන්ට තමුන්ගේම ගෞරවය සෙවීම ගෞරවයක් නොවේ. (හිතෝපදේශ 25:27)**
>
> **මක්නිසාද නුඹට වෙනස් වෙන්ට සලස්වන්නේ කවුද? නුඹට ලැබුණු දේ හැර නුඹට ඇත්තේ කිමෙක්ද? ඉදින් එය ලැබුන නම් එය නොලැබුණක් මෙන් පාරට්ටු කර ගන්නේ මක්නිසාද?( 1 කොරින්ති 4:7)**

**නුඹලාගේ පාරට්ටු කර ගැනීම හොඳ නැත. මුහුන් ටිකකින් මුළු පිඬ පිපෙන බව නොදනිවුද? (1 කොරින්ති 5:6)**

**තමාම උපදවන දේ කියන්නා තමාගේම ගෞරවය සොයයි. නුමුත් තමා එවූ තැනැන්වහන්සේගේ ගෞරවය සොයන්නා සැබෑවූ කෙනෙක්ය. ඔහු තුළ අධර්මිෂ්ඨකමක් නැත. (යොහන් 7:18)**

බොහෝ අය මාංසයේ මහිමය සොයා යති (2 කොරින්ති 12:6). “ලජ්ජා විය යුතු දේ (හෙවත් පාපය) ගැන පාරට්ටු කරගන්නා” අය සිටිති (පිලිප්පි 3:19). ඔවුන්ගේ අවසානය විනාශය බව දෙවියන්වහන්සේ කියනසේක. යාකොබ් 3:14හි සඳහන් වන්නේ අපගේ සිත්වල දැඩි ඊර්ෂ්‍යාවද උන්නති කාමයද ඇත්නම් අප පාරට්ටු කර ගනිමින් “සත්‍යයට විරුද්ධව ක්‍රියා නොකළ” යුතු බවය.

**මක්නිසාද මම ශුභාරංචිය දේශනා කරම් නුමුත් පාරට්ටු කර ගැනීමට මට කිසිත් නැත. මක්නිසාද එසේ කිරීමට බැඳී සිටිමි. ශුභාරංචිය දේශනා නොකළොත් මට දුක්වේ. (1 කොරින්ති 9:16)**

**නුමුත් දෙවියන්වහන්සේ ප්‍රඥාවන්තයන් ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ මෝඩ දේවල් තෝරාගත් සේක. දෙවියන්වහන්සේ ශක්තිමත් දේ ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ දුර්වල දේවල් තෝරා ගත් සේක. ඇත්තාවූ දේවල් නැති කරන පිණිස නැති දේවල් වැනි ලෝකයේ පහත් දේවල්ද සුළු කොට සිතනු ලබන දේවල්ද දෙවියන්වහන්සේ තෝරා ගත් සේක. එසේ කළේ කොයි මනුෂ්‍යයෙක්වත් දෙවියන්වහන්සේ ඉදිරියේ පාරට්ටු කර නොගන්නා පිණිසය. (1 කොරින්ති 1:27-29)**

දාවිත් මෙන් ඔබ මොර ගැසිය යුත්තේ මෙසේය:

**ස්වාමිනි අපට නොව, අපට නොව ඔබගේ කරුණාව නිසාත් සැබෑකම නිසාත් ඔබගේ නාමයට ගෞරවය දුන මැනව. (ගීතාවලිය 115:1)**

“තේජාලංකාර ජිවිතය” ආත්මාර්ථකාමී නොවන ජිවිතයකි.

**නුමුත් මම මාගේම ගෞරවය නොසොයමි. එය සොයන්නාවූ විනිශ්චය කරන්නාවූ කෙනෙක් සිටින සේක. (යොහන් 8:50)**

ඔබ කරන ඕනෑම පාරට්ටුවක් ආත්මාර්ථකාමී නොවිය යුතුය. සමිඳාණන්වහන්සේ ගැන විය යුතුය.

**එහෙයින් ලියා තිබෙන ලෙස ගරුකම් කියන්නා ස්වාමීන්වහන්සේ කෙරෙහි ගරුකම් කියාවා. (1 කොරින්ති 1:31 සහ 2 කොරින්ති 10:17)**

සමිඳාණන්වහන්සේට අයත් දේ ගැනද ඔබට පාරට්ටු කළ හැකිය.

**එහෙයින් දෙවියන්වහන්සේට අදාළ කාරණා ගැන ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මාගේ පාරට්ටු කර ගැනීමක් තිබේ. (රෝම 15:17)**

කුරුසිය හා එය නියෝජනය කරන සියල්ල ගැන ඔබට පාරට්ටු කළ හැකිය.

**නුමුත් අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය ගැන මිස වෙන කිසි දෙයක් ගැන පාරට්ටු කරගන්ට මට නම් සිද්ධ නොවේවා. ඒ කරණකොටගෙන ලෝකය මට ද මා ලෝකයට ද කුරුසියෙහි ඇණ ගසනු ලද්දේ විය. (ගලාති 6:14)**

## ලෝකය හා එහි රාජ්‍යයන් පිළිබඳ තේජාලංකාරය

තවත් ආකාරයේ “නිෂ්ඵල තේජසක්” මේ ලෝකයේ හා එහි රාජ්‍යයන්ගේ තේජසක් වේ.

**නැවතත් යක්ෂයා උන්වහන්සේ උස් කන්දකට පමුණුවා ලෝකයේ සියලු රාජ්‍යයන්ද එහි ඓශ්වර්යයන්ද උන්වහන්සේට පෙන්වා ... (මතෙව් 4:8 හා ලූක් 4:6 ද බලන්න.)**

**යමෙක් ධනවත් වන කල්හිද ඔහුගේ ගෙයි ඓශ්වර්යය වැඩි වන කල්හිද භය නොවෙව. මක්නිසාද ඔහු මැරෙන කල කිසිවක් ගෙන නොයන්නේය. ඔහුගේ ඉසුරු ඔහු අනුව නොයන්නේය. (ගීතාවලිය 49:16-17)**

රජුන්ගේද බිසෝවරුන්ගේද ජාතීන්ගේද “මහිමයේ කිරුළු” නැති විය. (යෙසායා 8:7, යෙරෙමියා 13:18, 48:18, දානියෙල් 4: 34-36, 5:18-20)

(ලෞකික මහිමය පිළිබඳ අමතර පද කීපයක් මෙසේය: දානියෙල් 11:39, හොෂෙයා 9:11, 10:5, මීකා 2:9, හබක්කුක් 2:16, සෙකරියා 11:3)

ජාතීන් තම බලය හා ශක්තිය මත නොව සමිඳාණන්වහන්සේ තුළ මහිමාන්විත විය යුතුය.

**නුඹ, ස්වාමීන්වහන්සේ ජීවමාන බව සැබෑවා සේම කියා සැබෑකමින්ද යුක්තියෙන්ද ධර්මිෂ්ඨකමින්ද දිවුරුවොත්, ජාතිහු උන්වහන්සේගේ නාමයෙන් තමුන්ටම ආශිර්වාද කරගෙන උන්වහන්සේ තුළ පාරට්ටු කර ගන්නෝය. (යෙරෙමියා 4:2)**

(1 සාමුවෙල් 35:2, යෙසායා 24:23, 25:3, 26:15, 41:16, 60:9, ගීතාවලිය 86:9, 102:15-16ද බලන්න.)

2. නිෂ්ඵල තේජස ගැන බයිබලය පහත දැක්වෙන අවවාද දෙයි.

**ස්වාමීන්වහන්සේ මෙසේ කියන සේක: ප්‍රඥාවන්තයා තමාගේ ප්‍රඥාව ගැන පාරට්ටුකර නොගනීවා. බලවන්තයාද තමාගේ බලය ගැන පාරට්ටු කර නොගනීවා. වස්තුකාරයා තමාගේ වස්තුව ගැන පාරට්ටු කර නොගනීවා. නුමුත් පාරට්ටු කරගන්නා පොළොවෙහි කරුණාවත් විනිශ්චයත් ධර්මිෂ්ඨකමත් පවත්වන ස්වාමීන්වහන්සේ මම යයි තේරුම්ගෙන මා දැන ගැනීම නම් වූ කාරණය ගැනම පාරට්ටු කර ගනීවා. මක්නිසාද මා ප්‍රිය වෙන්නේ මේ දේවලටයයි ස්වාමීන්වහන්සේ කියන සේක. (යෙරෙමියා 9:23-24)**

**අපි ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන ජීවත් වෙමු නම් ආත්මයාණන්වහන්සේ කරණ කොටගෙන හැසිරෙමු. නිෂ්ඵල පාරට්ටු නොකරමු. එකිනෙකා කෝප නොකරමු. එකිනෙකාට ඊරිෂ්‍යා නොවෙමු. (ගලාති 5:25)**

**පක්ෂවාදීකමෙන්වත් නිෂ්ඵල පාරට්ටුකමෙන්වත් කිසි දෙයක් නොකොට එකිනෙකා තම තමාට වඩා වෙන කෙනෙක් උතුමැයි යටහත්කමෙන් සිතාවා. (පිලිප්පි 2:3)**

3. නිෂ්ඵල තේජසේ වර්තමාන ප්‍රතිඵල බයිබලය එළිදරව් කරයි.

**සියලු අලංකාරකම්වල උඩඟුකම කෙළහන්ටත් පොළොවේ සියලු නම්බුකාරයන් නින්දාවට පමුණුවන්ටත් සේනාවල ස්වාමීන්වහන්සේ එය යෝජනා කළ සේක. (යෙසායා 23:9)**

ලෝකයේ තේජාලංකාරය “මලක් මෙන් මැලවී යන්නේය”. අවාරයේ හටගත් ඵල මෙන් වන්නේය (කුණු වී යයි.) (යෙසායා 28:1-4)

එය නිෂ්ඵල තේජසේ අනාගත ප්‍රතිඵලද හෙළිකරයි.

**එබැවින් මිනීවල ස්වකීය ආශාව අධික කොට ප්‍රමාණයක් නැතුව කට ඇර ගත්තේය. ඔවුන්ගේ ඉසුරුද ඔවුන්ගේ සමූහයාද ඔවුන්ගේ ඝෝෂාවද ඔවුන් අතරේ ප්‍රීතිවන්නාද ඊට බැස යනවා ඇත. (යෙසායා 5:14)**

අන්තිමේදී ජාතීන්ගේ සියලු තේජස උන්වහන්සේගේ වන්නේය.

**ජාතිහු එහි එළියෙහි ඇවිදිති. පොළොවේ රජවරු තමන්ගේ තේජස ඊට ගෙනෙති. එහි දොරටු දවාලේ කිසිසේත් වසනු නොලබන්නේය. මක්නිසාද, එහි රාත්‍රියක් නොවන්නේය. ඔවුහු ජාතීන්ගේ තේජසත් ගෞරවයත් ඊට ගෙනෙනවා ඇත. (එළිදරව් 21:24-26)**

4. දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ගැන අතිරේක තොරතුරු සමහරක් මෙසේ වේ. අධ්‍යයනය කරන්න.

**දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ ප්‍රථම පෙනී සිටීම.**

ආබ්‍රහම් මෙසෙපොතේමියාවේ සිටියදී දෙවියන්වහන්සේගේ තේජස දර්ශනය විය. ක්‍රියා 7:2

**දේව වචනයේ පළමු සිද්ධිය**

සමිඳාණන්වහන්සේගේ මහිමාලංකාරය වලාකුළක දිස් විය. නික්මයාම 16:10

පුදුමයට කරුණක් ලෙස මේ දිස්වීම ඉශ්‍රායෙල්වරුන්ගේ මැසිවිලිවලට ප්‍රතිචාරයක් ලෙස සිදුවිය.

**දෙවියන්වහන්සේට පළමු වරට ප්‍රශංසා කරන ලද්දේ**

පළමු වරට දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන ලද්දේ ඉශ්‍රායෙල්වරුන් මිසරයේ සිට රතු මුහුද හරහා පැමිණි පසු මිරියම් ගැයූ ගීතයෙනි.

**සමිඳුනි දෙවිවරුන් අතරේ ඔබට සමාන කවුද? ශුද්ධකමින් මහිමවත්වූ ප්‍රශංසාවලින් භයංකර වූ, පුදුම දේ කරන්නාවූ ඔබ සමාන කවුද? (නික්මයාම 15:1-21)**

**දෙවියන්වහන්සේගේ තේජාලංකාරය අතීතයේ එළිදරව් වීම් වලදී දිස්වුණේ කෙසේද?**

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය අතීතයේදී දෘශ්‍යමානව එළිදරව් වූ විට දිස්වුණු ආකාරය බයිබලයේ වාර්තා වී ඇත. එය :

**දේදුන්නක් හා සමාන විය.**

**වටකර තිබුණු දීප්තිමත්කමේ පෙනීම වර්ෂා දවසක වලාකුළේ තිබෙන දේදුන්නේ පෙනීම මෙන්ය. මේ වනාහි ස්වාමීන්වහන්සේගේ තේජසේ ස්වරූපයේ පෙනීමය. මම එය දුටු කල මුහුණින් වැටුණෙමි. කතා කරන කෙනෙකුගේ හඬ මට ඇසුණේය. (එසකියෙල් 1:28)**

**නැගිට සිටිමින් තිබිණි.**

**එකල මම නැගිට සම භූමියට ගියෙමි. එවිට කෙබාර් ගඟ ළඟදී මා දුටු තේජස මෙන් ස්වාමීන්වහන්සේගේ තේජස එහි තිබෙනවා දුටිමි. මම මුහුණින් වැටුණෙමි. (එසකියෙල් 3:23)**

**නැගෙනහිරින් මහත් හඬකින් විය.**

**එවිට ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේගේ තේජස නැගෙනහිර දිශාවෙන් එනවා දුටිමි. උන්වහන්සේගේ ශබ්දය බොහෝ ජල ඝෝෂාවක ශබ්දය මෙන් විය. පොළොවද උන්වහන්සේගේ තේජසින් බැබළුණේය. (එසකියෙල් 43:2)**

**දීප්තිමත් ආලෝකයක් මෙන් විය.**

හෙබ්‍රෙව් 1:3හි පාවුලු තුමා "මහිමතාවයේ ප්‍රභාවය" ගැන සඳහන් කරයි. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක: "මම ලෝකයේ ආලෝකය වෙමි". පාවුලු තුමා මෙසේ කීය: "ඒ ආලෝකයේ උද්දීප්තිය නිසා මාගේ ඇස් නොපෙනී ගියේය" (ක්‍රියා 22:11). නව ජෙරුසලම විස්තර කර ඇත්තේ දේව තේජසින් ආලෝක වූවා ලෙසිනි.

**දෙවියන්වහන්සේගේ තේජසින් නුවර ආලෝක වූ බැවින්ද බැටළු පැටවාණන් එහි පහන වන බැවින්ද එහි බැබළීමට සූර්යයාවත් චන්ද්‍රයාවත් ඕනෑ නැත. (එළිදරව් 21:23)**

**දෙවියන්වහන්සේගේ තේජසින් නුවර ආලෝක වූ බැවින්ද බැටළු පැටවාණන් එහි පහන වන බැවින්ද එහි බැබළීමට සූර්යයාවත් චන්ද්‍රයාවත් ඕනෑ නැත. ජාතිහු එහි එළියෙහි ඇවිදිති. පොළොවේ රජවරු තමන්ගේ තේජස ඊට ගෙනෙති. එහි දොරටු දවාලේ කිසිසේත් වසනු නොලබන්නේය. මක්නිසාද එහි රාත්‍රියක් නොවන්නේය. ඔවුහු ජාතීන්ගේ තේජසත් ගෞරවයත් ඊට ගෙනෙනවා ඇත. (එළිදරව් 21:23-26)**

කිසිදු මිනිසෙකුට ළඟා විය නොහැකි ආලෝකයේ දෙවියන්වහන්සේ වැඩ වාසය කරන සේක. (1 තිමෝති 6:15-16)

**දුමක් විය.**

**දෙවියන්වහන්සේගේ තේජස සහ බලයෙන් නිකුත් වූ ධූමයෙන් දේව මාළිගාව පිරුණේය. දේවදූතයන් සත්දෙනාගේ පීඩා සත කෙළවරවනතුරු දේව මාළිගාවට ඇතුල්වෙන්ට කිසිවෙකුට නුපුළුවන් විය. (එළිදරව් 15:8)**

දුමක් ඇති තැන ගින්නක් තිබේ. එය නිවා දැමිය නොහැකි ගින්නකි.

**ස්වාමීන්වහන්සේගේ තේජසේ පෙනීම කන්ද මුදුනේ ඇවිළී යන ගිනි මෙන් ඉශ්රායෙල් පුත්‍රයන්ගේ ඇස්වලට පෙණුනේය. (නික්මයාම 24:17)**

**සියලු ඉශ්රායෙල් පුත්‍රයෝ ගිනි බසිනවාත් ස්වාමීන්වහන්සේගේ තේජස ගෘහය පිට තිබෙනවාත් දැක ගල් අතුළ බිමට තමුන්ගේ මුහුණු නමා නමස්කාර කොට : මක්නිසාද උන්වහන්සේ යහපත්ය. උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය කියමින් ස්වාමීන්වහන්සේට ස්තුති කළෝය. (2 ලේකම් 7:3)**

**බලව අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ තමන්ගේ තේජසද මහත්තත්ත්වයද දැක්වූ සේක. උන්වහන්සේගේ හඬද ගින්න මැදින් අපට ඇසුණේය. දෙවියන්වහන්සේ මනුෂ්‍යයා සමඟ කතා කරලාත් ඔහු ජීවත්ව සිටින බව අද දවසේදී අපි දුටිමුව. (ද්විතීය කතාව 5:24)**

**වලාකුළක් මෙන් විය.**

**ආරොන් ඉශ්රායෙල් පුත්‍රයන්ගේ මුළු සභාවට කතා කළ කල්හි ඔවුහු වනාන්තරය දෙස බැලුවෝය. බලව ස්වාමීන්වහන්සේගේ තේජස වලාකුළෙහි පෙණුණේය. (නික්මයාම 16:10)**

**ස්වාමීන්වහන්සේගේ තේජස සීනයි කන්දේ පැවතුණේය. වලාකුළ සදවසක් ඒක වසා සිටියාය. සත්වෙනි දින උන්වහන්සේ වලාකුළ මැදින් මෝසෙස්ට හඬ ගැසූ සේක. (නික්මයාම 24:16)**

**එවිට වලාකුළ සම්මුඛ වීමේ කූඩාරම වසා ගත්තේය. ස්වාමීන්වහන්සේගේ තේජසෙන් මණ්ඩපය පිරී ගියේය. වලාකුළ ඊ පිට රැඳුණු බැවින්ද ස්වාමීන්වහන්සේගේ තේජසින් මණ්ඩපය පිරී ගිය බැවින්ද මෝසෙස්ට සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල්වෙන්ට නොහැකි විය. (නික්මයාම 40:34-35)**

**තවද සභාව මෝසෙස් සහ ආරොන්ට විරුද්ධව රැස්ව සිටිද්දී ඔවුහු සම්මුඛ වීමේ කූඩාරම දෙස බැලූ කල වලාකුළක් ඒක වසාගෙන තිබුණේය. ස්වාමීන්වහන්සේගේ තේජසද දෘශ්‍යමාන විය. (ගණන් කතාව 16:42)**

# පස්වන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ පරමාර්ථය

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ පරමාර්ථය සාරාංශ කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**එවිට ස්වාමින් වහන්සේගේ තේජස ප්‍රකාශවන්නේය. සියලු මනුෂ්‍යයෝ එක්ව එය දකින්නෝය. මක්නිසාද ස්වාමින්වහන්සේගේ මුඛය එය වදාළ සේකැයි මොරගසන්නෙකු ගේ හඬක් වන්නේය. (යෙසායා 40:5)**

### හැඳින්වීම

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය, එය කවරක් ද උන්වහන්සේ සිය තේජාලංකාරය එළිදරව් කරන ස්ථානය හා තේජාලංකාරයේ ත්‍යාගය ඔබට දී ඇති බව යනාදියේ මූලික කරුණු ඔබ පසුගිය පාඩමෙන් ඉගෙන ගත්තෙහිය. මෙම පුදුමාකාර තේජාලංකාරයේ ත්‍යාගයට ඔබගේ ජීවිතයේ පරමාර්ථ බොහොමයක් ඇත. මේ සියල්ල දෙවියන්වහන්සේගේ සැලැස්මේ ඔබගේ කොටස සම්පූර්ණ කරගැනීම සඳහා ඔබව සන්නද්ධ කරන ක්‍රියාවේ යොදවයි.

### දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ පරමාර්ථය

ජාතීන් තමන්වහන්සේ දැනගන්නා පිණිස තම තේජාලංකාරය එළිදරව් කරන බව දෙවියන්වහන්සේ ශුද්ධ ලියවිල්ලේ නැවත නැවත ප්‍රකාශ කර ඇත.

**නුඹේ සෙනඟ සියල්ලෝම ධර්මිෂ්ඨව, මා විසින් සිටෙවූ පැළයක්ව, මාගේ අත්වල කර්මාන්තයව සිට මා ගෞරවය ලබන පිණිස සදාකාලේටම පොළොව භුක්තිවිඳින්නෝය (යෙසායා 60:21).**

එහෙත් දෙවියන්වහන්සේගේ තේජාලංකාරය සඳහා තවත් පරමාර්ථ බොහොමයක් ඇත. ඉන් බොහොමයක් ඔබට පෞද්ගලිකව සම්බන්ධ වේ. තේජාලංකාරය දී ඇත්තේ.

### සැපයීම සඳහාය

දෙවියන්වහන්සේගේ කාර්යයක් කිරීමට ඔබ සන්නද්ධ කර ඇති විට, ඔබට ස්වභාවික මෙන්ම ආත්මික අවශ්‍යතා ද ඇත. දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ඔබගේ ස්වභාවික අවශ්‍යතා සපුරයි.

**මාගේ දෙවියන්වහන්සේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තමන්ගේ තේජස් සම්පතේ ප්‍රකාරයට නුඹලාගේ සියලු හිඟකම් සම්පූර්ණ කරන සේක (පිලිප්පි 4:19).**

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ඔබගේ ආත්මික අවශ්‍යතා ද සපුරයි.

**උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නුඹලාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹලා බලයෙන් ශක්තිමත් වන පිණිසත්... උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤා කරමි. (එපීස 3:16,19)**

## ශක්තිය සඳහාය

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය සේවය කිරීම සඳහා ඔබට ශක්තිය ගෙන දෙයි.

> **"ඔවුන්ගේ ශක්තියේ අලංකාරය නම් ඔබය . . ." (ගීතාවලිය 89:17)**
>
> **". . .උන්වහන්සේගේ තේජසේ පරාක්‍රමයේ හැටියට සියලු ආකාර බලයෙන් ශක්තිමත් වෙමින්" (කොලොස්සි 1:11).**

## ප්‍රීතිය සඳහාය

ඔබ සේවය කරන අතරතුර දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ඔබට ප්‍රීතිය ගෙන දෙයි.

> **ශුද්ධවන්තයෝ මහිමයෙන් යුක්තව සන්තෝෂවෙත්වා, තමුන්ගේ යහන්වල ඉඳ ප්‍රීතියෙන් ගායනාකෙරෙත්වා (ගීතාවලිය 149:5).**
>
> **ස්වාමින්වහන්සේගේ වචනයට වෙවුලන තැනැත්තෙනි, උන්වහන්සේගේ වචනය අසාපල්ලා. මාගේ නාමය නිසා නුඹලාට වෛරවී නුඹලා පන්වා දැමුවාවූ නුඹලාගේ සහෝදරයෝ: ස්වාමින්වහන්සේ ගෞරව ලබාගන්නසේක්වා, එවිට නුඹලාගේ ප්‍රීතිය අපට දකින්ට ලැබේයයි කියති: නුමුත් ඔවුන්ම ලජ්ජාවට පැමිණෙනවා ඇත (යෙසායා 66:5)**
>
> **නුඹලා උන්වහන්සේ නුදුටු නුමුත් උන්වහන්සේට ප්‍රේම කරන්නහුය. දැන් උන්වහන්සේ නොදකින නුමුත් නුඹලා උන්වහන්සේ කෙරෙහි අදහා, (1 පේතෘස් 1:8)**
>
> **උන්වහන්සේගේ ශුද්ධවූ නාමය ගැන පාරට්ටුකරගනිව්. ස්වාමින්වහන්සේ සොයන්නවුන්ගේ සිත් ප්‍රීතිමත් වේවා (1 ලේකම් 16:10).**

## නිදහස සඳහාය

වහල්කමින් නිදහස ලැබීම සඳහා සමිඳුණන්වහන්සේගේ තේජාලංකාරය වගකියනු ඇත. ඔබ සේවය කරන අයට ද ඒ දෙයම කරන්නේ උන්වහන්සේගේ තේජාලංකාරය වේ.

> **නැගිට බැබළියන්න. මක්නිසාද නුඹේ ආලෝකය පැමුණුණේය. ස්වාමින්වහන්සේගේ තේජස ද නුඹ කෙරෙහි උදාවිය (යෙසායා 60:1).**
>
> **දෙවියන්වහන්සේගේ දරුවන්ගේ මහිමයේ නිදහස්කමට පැමිණෙන්නේය යන බලාපොරොත්තුවෙන් එය යටත්කළාවූ තැනන්වහන්සේ නිසාය (රෝම 8:21).**

## විවේකය ලැබීමටය

ඔබ වෙහෙස වී වැඩ කළ විට දෙවියන්වහන්සේ ඔබට මහිමයෙන් පිරි විවේකයක් දෙන සේක.

> **තවද ඒ දවසෙහි ජනයන්ට කොඩියක් ලෙස සිටින්නාවූ, යෙස්සේගේ රිකිල්ලවූ උන්වහන්සේ වෙතට ජාතීහු රැස්වන්නෝය. උන්වහන්සේගේ නිවාසස්ථානයද තේජවත් වන්නේය (යෙසායා 11:10).**

## පාරිශුද්ධිකරණය පිණිසය

මහිමය ඔබ පාරිශුද්ධකර දෙවියන්වහන්සේට භාවිත කිරීමට හැකිවන සේ ඔබ ශුද්ධවූ භාජනයක් කරන සේක.

> **එහිදී මම ඉශ්රායෙල් පුත්‍රයන්ට සම්මුඛ වන්නෙමි: මාගේ මහිමයෙන් කූඩාරම විශුද්ධ කරනු ලබන්නේය (නික්මයාම 29:43).**

(අප සභාවේ පාපය මෙතරම් දකින්නට හේතුව දෙවියන්වහන්සේගේ මහිමය එහි නොමැති වීමය)

## ඒකත්වය සඳහාය

දෙවියන්වහන්සේගේ තේජස ඒකත්වය ගෙන එයි. එය ශ්‍රේෂ්ඨ පැවරුම ඉටු කිරීම සඳහා සභාව එක් ශරීරයක් සේ සන්නද්ධ කිරීමට වැදගත් වේ.

> **අප ඒකත්වයක්ව සිටින්නාසේම ඔවුනුත් ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන් මහිමය ඔවුන්ට දුනිමි (යොහන් 17:22).**

## මගපෙන්වීම සඳහාය

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ තේජස මගින් ඔබට මගපෙන්වන සේක.

> **මෝසෙස්ගේ දකුණත ළඟ ස්වකීය තේජවත් බාහුව යන්ට සැලැස්සුවාවූ, තමන්ට සදාකාල නාමයක් ලබාගැනීමට ඔවුන් ඉදිරියෙන් ජලය බෙදා, (යෙසායා 63:12)**
>
> **ගවරැළ මිටියාවතට බසින්නාක්මෙන් ස්වාමින්වහන්සේගේ ආත්මය ඔවුන් නිශ්චල භාවයට පැමිණෙවූසේක. තේජවත් නාමයක් ලබාගැනීමට ඔබ එසේ ඔබගේ සෙනඟ ගෙනගිය සේක (යෙසායා 63:14).**

## ප්‍රඥාව සඳහාය

ඵලදායි සේවයක් සඳහා ඔබට අවශ්‍ය ප්‍රඥාව ලැබෙන්නේ දෙවියන්වහන්සේගේ තේජසිනි.

> **එසේ කරන්නේ මහිමයේ පියාණන් වන අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවියන්වහන්සේ, උන්වහන්සේ ගැන දැනගැන්මට ප්‍රඥාවේද එළිදරව්කිරීමේද ආත්මයක් නුඹලාට දෙන ලෙසත්, උන්වහන්සේගේ කැඳවීමේ බලපොරොත්තුව කිමෙක්ද කියාත්, ශුද්ධවන්තයන් තුළවූ උන්වහන්සේගේ උරුමයේ මහිමයේ සම්පත කිමෙක්ද කියාත්, (එපීස 1:17-18)**

## එළිදරව්ව පිණිසය

ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට දෙවියන්වහන්සේගේ දේ එළිදරව් කරද්දී දෙවියන්වහන්සේ මහිමයට පමුණුවන සේක.

> **උන්වහන්සේ මා ගෞරවයට පමුණුවනසේක. මක්නිසාද උන්වහන්සේ මා සන්තක දෙයින් රැගෙන නුඹලාට ප්‍රකාශකරන සේක (යොහන් 16:14).**

## උන්වහන්සේගේ වචනය මහිමයට පත්කිරීම

එළිදරව් කිරීම් සැමවිටම දේව වචනය මහිමයට පත් කරයි. ගැළවීම විජාතීන්ට ද අයත් බව එළිදරව් වූ විට:

> **අන්‍යජාතිහු ඒ අසා සන්තෝෂව, දෙවියන්වහන්සේගේ වචනයට ගෞරව කළෝය. සදාකාල ජීවනය ලැබීමට නියමකරන ලද සියල්ලෝම අදහාගත්තෝය. (ක්‍රියා 13:48)**

දෙවියන්වහන්සේගේ වචනය ඔබගේ ජීවිතය තුළ ක්‍රියා කිරීමට ඉඩදුන් විට, එය මහිමයට පත් කෙරේ.

> **ඉතින්, සහෝදරයෙනි, නුඹලා අතරෙහි සිද්ධවුණාක්මෙන් (වෙන තැන්වලත්) ස්වාමින්වහන්සේගේ වචනය පතළවී ගොස් ගෞරවයට පැමිණෙන පිණිසද, හිතුවක්කාර නපුරු මනුෂ්‍යයන්ගෙන් අප ගළවනු ලබන පිණිසද අප උදෙසා යාච්ඤා කරපල්ලා. මක්නිසාද සියල්ලන්ටම ඇදහීම නැත. (2 තෙසලෝනික 3:1,2)**

## මරණයෙන් නැගුටුවණු ලැබීම

සමිඳුණන්වහන්සේගේ තේජසින් ඔබ "මරණයෙන් නැගුටුවණු ලැබේ". ඔබගේ පහත්කමේ ශරීරය තේජාන්විත ශරීරයක් බවට වෙනස් කිරීමේ ක්‍රියාවලියෙහි දෙවියන්වහන්සේ නිරතව සිටින සේක (පිලිප්පි 3:21). ක්‍රිස්තුන්වහන්සේ ප්‍රකාශ වන විට ඔබ ද උන්වහන්සේ සමග "මහිමයෙන් යුක්තව" ප්‍රකාශ වනු ඇත (කොලොස්සි 3:4, 1 කොරින්ති 15:43 ද බලන්න).

## යුද සංග්‍රාම සඳහාය

ඔබගේ තේජස සොරකම් කිරීමට සතුරාට අවශ්‍යව ඇත.

> **ස්වකීය ශක්තිය වහල්කමටත් ස්වකීය මහිමය එදිරිකාරයාගේ අතටත් පාවාදුන්සේක (ගීතාවලිය 78:61).**

ඔබගේ තේජස සොරකම් කිරීමට සතුරාට අවශ්‍ය වන්නේ, ඔබ සමිඳුණන්වහන්සේගේ වැඩ සඳහා සන්නද්ධ කිරීම සඳහා තේජසේ ඇති වැදගත්කම සාතන් දන්නා බැවිනි. එමෙන්ම ආත්මික යුද්ධයක දී දෙවියන්වහන්සේගේ තේජස ඵලදායි ආයුධයක් බවද ඔහු දනී.

> **...ස්වාමින්වහන්සේ ගෞරව ලබාගන්නාසේක්වා, එවිට නුඹලාගේ ප්‍රීතිය අපට දකින්ට ලැබේයයි කියති. නුමුත් ඔවුන්ම ලජ්ජාවට පැමිණෙනවා ඇත (යෙසායා 66:5).**
>
> **මාගේ ගැළවීමත් මාගේ උතුම්කමත් දෙවියන්වහන්සේගෙන්ය. මාගේ ශක්තියේ පර්වතයත් මාගේ රක්ෂාස්ථානයත් දෙවියන්වහන්සේ තුළෙහිය (ගීතාවලිය 62:7).**
>
> **නුමුත් ස්වාමිනි, ඔබ මා අවට පලිහක්ද මාගේ ගෞරවයද මාගේ හිස ඔසවන්නාද වනසේක (ගීතාවලිය 3:3).**
>
> **එවිට නුඹේ එළිය පහන්වෙලාව මෙන් උදාවන්නේය. නුඹේ සුවය ද ඉක්මනින් හටගන්නේය. නුඹේ ධර්මිෂ්ඨකම නුඹට පෙරටුවෙන් යන්නේය. ස්වාමින්වහන්සේගේ තේජස ද නුඹට පස්සෙන් එන්නේය (යෙසායා 58:8).**
>
> **ස්වාමින්වහන්ස, ඔබගේ දකුණත පරාක්‍රමයෙන් මහිමවත්ය. ස්වාමින්වහන්ස, ඔබගේ දකුණත සතුරා කැබලිකරදමයි.**
> **මිරියාම් ඔවුන්ට උත්තරදෙමින්: ස්වාමින්වහන්සේට ගායනාකරව්, මක්නිසාද උන්වහන්සේ තේජාන්විත ලෙස ජයගත්සේක. උන්වහන්සේ අශ්වයා සහ අසරුවා මුහුදට හැළුසේකැයි කීවාය (නික්මයාම 15:6, 21).**
>
> **ස්වාමින්වහන්සේ සියොන් කන්දේ මුළු වාසස්ථානයටත් එහි රැස්වීම්වලටත් ඉහළින් දවාලේ වලාකුළක් හා දුමාරයක්ද රාත්‍රියෙහි ඇවිළෙන ගින්නක දීප්තියද මවා තබනසේක. මක්නිසාද මුළු තේජස පිට ඉහළින් වියනක් වන්නේය (යෙසායා 4:5).**
>
> **මක්නිසාද මම්ම ඒක අවට ගිනි පවුරක්ව ඒක තුළ තේජසව සිටින්නෙමියි කියා ස්වාමින්වහන්සේ කියනසේකැයි කියාපන්නැයි කීය (සෙකරියා 2:5).**
>
> **එවිට බස්නාහිර සිට ස්වාමින්වහන්සේගේ නාමයටත් නැගෙනහිර සිට උන්වහන්සේගේ තේජසටත් මනුෂ්‍යයෝ භයවන්නෝය. මක්නිසාද ස්වාමින්වහන්සේගේ හුස්මෙන් පිඹහරින්නාවූ, හිර වෙච්ච ගලන්නාවූ ජලධාරාවක් මෙන් උන්වහන්සේ එනසේක (යෙසායා 59:19).**
>
> **මක්නිසාද සේනාවල ස්වාමින්වහන්සේ මෙසේ කියනසේක. ගෞරව පැමුණුණායින් පසු උන්වහන්සේ නුඹලාගෙන් කොල්ලකෑ ජාතීන් ළඟට මා ඇරිය සේක. මක්නිසාද නුඹලාට අත ගසන්නා උන්වහන්සේගේ ඇසේ කළු ඉංගිරියාවට අතගසන්නේය. (සෙකරියා 2:8).**

දෙවියන්වහන්සේගේ තේජස ඔබගේ ආරක්ෂක යුද්ධායුධවල කොටසකි. ඔබ එම තේජස යුද්ධයේ දී භාවිත කරන විට ක්‍රියාත්මක වන චක්‍රයක් ඇත. උන්වහන්සේගේ තේජස ඔබගේ ආරක්ෂාව වේ.

ඔබට මිදීම ලැබූ විට ඔබ ප්‍රශංසා කළ යුතුය. එසේ ඔබ ප්‍රශංසා කරන විට ඔබට තව තවත් තේජස ලැබෙනු ඇත.

> **අපේ ගැළවීමේ දෙවියන්වහන්ස, ඔබගේ ශුද්ධවූ නාමයට ස්තුතිකරන පිණිසත්, ඔබගේ ප්‍රශංසා ගැන ජයඝෝෂා පවත්වන පිණිසත්, අප ගළවා, ජාතීන් අතරෙන් අප රැස්කොට, අප නිදහස්කළ මැනවයි කියව් (1 ලේකම් 16:35).**
>
> **තවද විපත්ති දවසේදී මට යාච්ඤාකරව, මම තා මුදාහරින්නෙමි, තෝ මට ගෞරවකරන්නෙහිය (ගීතාවලිය 50:15).**
>
> **එවිට ස්වාමින් වහන්සේගේ තේජස ප්‍රකාශවන්නේය. සියලු මනුෂ්‍යයෝ එක්ව එය දකින්නෝය. මක්නිසාද ස්වාමින්වහන්සේගේ මුඛය එය වදාළ සේකැයි මොරගසන්නෙකු ගේ හඬක් වන්නේය. (යෙසායා 40:5)**

දේව සේවයේ කටයුතු සඳහා දෙවියන්වහන්සේගේ තේජස, ඔබ සන්නද්ධ කිරීමේ වැදගත් පරමාර්ථය දැන් ඔබට අවබෝධ වී ඇති බැවින්, දෙවියන්වහන්සේගේ තේජස අත්දකින්නේ කෙසේදැයි ඔබ දැනගැනීම අවශ්‍යය. ඊළඟ පරිච්ඡේදයෙන් ඔබ ඉගෙන ගන්නේ එය වේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

________________________________________

________________________________________

________________________________________

2. දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ පරමාර්ථය ඔබ මෙම පාඩමෙන් උගත් පරිදි සාරාංශ කරන්න.

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දෙවියන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව්වීම වටිනාකමින් යුත් අය මත රඳා නොපවතී. දෙවියන්වහන්සේ තම තේජාලංකාරය එළිදරව් කළ පහත දැක්වෙන අය ගැන අධ්‍යයනය කරන්න.

**ආබ්‍රහම් : බොරු කී මිනිසෙකි**

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව්වීම නිසා දෙවියන්වහන්සේගේ නියෝගයෙන් ඔහුට සියල්ල දමා යෑමට සිදුවිය (උත්පත්ති 12:1-4). බයිබලය මෙසේ පවසයි. “ඔහු . . . ඇදහිල්ලෙන් බලවත්ව, උන්වහන්සේට ගෞරව කළේය” (රෝම 4:20).

**මෝසෙස් : ගොත ගසන එඬේරෙකි.**

තේජාලංකාරය එළිදරව් වීම නිසා ඔහු ජාතියක් වහල්කමින් මුදා ගත්තේය (නික්මයාම 34:29).

**ජාකොබ් : පැනයන රැවටිලිකාරයෙකි.**

එහෙත් දෙවියන්වහන්සේ සිය තේජාලංකාරය දර්ශනයකින් එළිදරව් කළ අතර ජාකොබ් ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙක් කළේය. : (උත්පත්ති 28 :10-15).

**යෙසායා : අපිරිසිදු තොල් සහිත තරුණයෙකි.**

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය පිළිබඳ දර්ශනයක ප්‍රතිඵලය වූයේ ශ්‍රේෂ්ඨ අනාවැකි සේවයකි (යෙසායා 6).

**සාවුල් (පාවුල්) : මුලින් දෙවියන්වහන්සේගේ සෙනඟ මරා දැමූ වධ හිංසා පමුණුවන්නෙකි.**

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව් වීමෙන් ඔහුගේ ජීවිතය වෙනස් විය (ක්‍රියා 9). දෙවියන්වහන්සේ පුද්ගලයන් ගරු කරන්නෙක් නොවේ. දෙවියන්වහන්සේ නොවටිනා අය ලෙස පෙනෙන මොවුන්ට තමන්වහන්සේගේ තේජස එළිදරව් කළ සේක් නම් උන්වහන්සේ **ඔබට** සිය තේජාලංකාරය එළිදරව් කරන සේක.

**ඉවසීම ඇතුව යහපත්කම් කිරීමෙන් මහිමයද ගෞරවයද අමරණභාවයද සොයන්නන්ට සදාකාල ජීවනය දෙනසේක.**

**නුමුත් යහපත්කම් කරන්නාවූ සියලු මනුෂ්‍යයන්ට, එනම් පළමුකොට යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද, මහිමයත් ගෞරවයත් සමාදානයත් ලැබෙන්නේය. මක්නිසාද දෙවියන්වහන්සේ තරාතිරම් නොබලනසේක (රෝම 2:7, 10-11).**

2. යේසුස්වහන්සේගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ තේජාලංකාරය පිළිබඳ පරමාර්ථයන් අධ්‍යයනය කරන විට යොහන් 17 පරිච්ඡේදය යොමු කරන්න. යේසුස්වහන්සේ “ඔබ මට දුන් තේජශ්‍රීය මම ඔවුන්ට දුනිමි” යි පැවසූ විට, එම තේජස වූයේ කුමක්ද? (1 හා 22 පද බලන්න)?

   දෙවියන්වහන්සේගේ තේජශ්‍රීය යේසුස්වහන්සේට දෙන ලද්දේ
   - සැබෑ දෙවියන්වහන්සේ වෙත අන් අය ගෙන යෑමේ බලය :3
   - දෙවියන්වහන්සේගේ මෙහෙය සම්පූර්ණ කිරීමේ හැකියාව : 4
   - දේව සේවයට බැඳීම සඳහා මිනිසුන්ට හැකියාව ලබා දීම: 6, 9, 11, 12
   - සත්‍යයේ වචන :8, 14
   - උන්වහන්සේගේ පැවරුම : 8, 18, 23, 25
   - සභාව (“ඔබ මට දුන් අය”) : 2, 24
   - පියාණන්වහන්සේම :23
   - ප්‍රේමය : 23, 24, 26
   - ඒකත්වය : 21, 22

- ප්‍රීතිය :13

3. දෙවියන්වහන්සේගේ ගින්න, විනිශ්චය හා සම්බන්ධ වන ආකාරය ඔබ කලින් ඉගෙන ගත්තෙහිය. දෙවියන්වහන්සේගේ තේජස විනිශ්චයේ දී ද එළිදරව් වේ. ගණන් කථාව 16 කියවන්න. කෝරා හා ඔහුගේ කැරලිකරුවන් සම්මුඛ මණ්ඩපය ඉදිරියට පැමිණි විට "සමිඳාණන්වහන්සේගේ මහිමාලංකාරය" විනිශ්චයේ දී දර්ශනය විය.

දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක.

**මමද මාගේ තේජස ජාතීන් අතරෙහි පෙන්වන්නෙමි, සියලු ජාතිහු මා ඉෂ්ටකළ විනිශ්චය සහ මා ඔවුන් කෙරෙහි තැබූ මාගේ හස්තය දකින්නෝය (එසකියෙල් 39:21).**

රෝම 2:5-10 කියවන්න. දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ ත්‍යාගය වන්නේ උන්වහන්සේගේ සදාතන තේජස පරිනැමීම වේ. අති දරුණු අවසාන විනිශ්චය වන්නේ මෙම තේජසෙන් මනුෂ්‍යයා ඉවත් කිරීම වේ.

**ඒ දවසේදී ස්වාමින්වහන්සේ තමන් ශුද්ධවන්තයන් තුළ මහිමය ලබන්ටත් අපේ සාක්ෂිය අදහාගත් නුඹලා සමග අදහාගත් සියල්ලන් තුළ මවිතලෙස පෙනෙන්ටත් එන කල්හි, (2 තෙසලෝනික 1:9)**

# හයවන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේ මහිමයට පත්කරන්නේ කෙසේද?

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට
- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දෙවියන්වහන්සේ මහිමයට පත්කරන ආකාරය පැහැදිලි කිරීමට
- මහිමය දෙන හා ලැබෙන අඛණ්ඩ චක්‍රය සාකච්ඡා කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **යේසුස්වහන්සේ : නුඹ විශ්වාස කළොත් දෙවියන්වහන්සේගේ මහිමය දකින්නෙහිය කියා මා කීවා නොවේදැයි ඈට කීසේක. (යොහන් 11:40)**

### හැඳින්වීම

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය හා එහි පරමාර්ථයන් ගැන ඔබ පෙර පරිච්ඡේද දෙකෙන් අධ්‍යයනය කළෙහිය. ඔබ මවා ඇත්තේ උන්වහන්සේට ගෞරව කිරීමට හා උන්වහන්සේගේ තේජාලංකාරය ඔබගේ ජීවිතය හා සේවය තුළින් පෙන්නුම් කිරීමට බවද උගත්තෙහිය.

ඔබ දෙවියන්වහන්සේගේ තේජාලංකාරය අත්දැකීමට හා අන් අයට එය අත්දැකීමට මඟපෙන්වීමට නම් උන්වහන්සේ මහිමයට පත්කරන ආකාරය ඔබ ඉගෙන ගත යුතුය. ඔබ දෙවියන්වහන්සේ මහිමයට පත්කරන විට උන්වහන්සේ ඔබට උන්වහන්සේගේ මහිමය තව තවත් එළිදරව් කරනු ඇත. මෝසෙස් දෙවියන්වහන්සේගේ මහිමාලංකාරය අත්දුටු අතර අන් අයට ද එය අත්දැකීමට මඟපෙන්විය.

> **මෝසෙස් ද: නුඹලා විසින් කළ යුතුයයි ස්වාමින්වහන්සේ අණකළ දේ මේය. එවිට ස්වාමින්වහන්සේගේ තේජස නුඹලාට පෙනෙන්නේයයි කීය.**
>
> **මෝසෙස් සහ ආරොන් සම්මුඛවීමේ කූඩාරමට ඇතුල්ව පිටට අවුත් සෙනඟට ආශිර්වාද කළෝය. එවිට ස්වාමින්වහන්සේගේ මහිමය මුළු සෙනඟට පෙනුණේය. (ලෙවී. 9:6. 23)**

දෙවියන්වහන්සේගේ මහිමාලංකාරය අත්දැකීමට මෝසෙස් අන් අයට මඟපෙන්විය. ඔබට ද එසේ කළ හැකිය. මෙම පාඩමෙන් දෙවියන්වහන්සේ මහිමයට පත්කරන ආකාරය පැහැදිලි කිරීම සඳහා බයිබලීය මූලධර්ම ඉදිරිපත් කෙරේ.

### දෙවියන්වහන්සේ මහිමයට පත්කරන්නේ කෙසේද?

ශුද්ධ ලියවිල්ලට අනුව, පහත දැක්වෙන ආකාරයට දෙවියන්වහන්සේ මහිමයට පත්කිරීමට හැකිය.

**ඇදහිල්ලෙන්:**

ඇදහිල්ලෙන් ක්‍රියා කිරීමට හා විශ්වාස කිරීමට ඔබ සන්නද්ධ කළ විට දෙවියන්වහන්සේගේ තේජස එළිදරව් වේ.

> **යේසුස්වහන්සේ : නුඹ විශ්වාස කළොත් දෙවියන්වහන්සේගේ මහිමය දකින්නෙහිය කියා මා කීවා නොවේදැයි ඈට කීසේක. (යොහන් 11:40)**

ආබ්‍රහම් ගැන දේව වචනය මෙසේ පවසයි.

**එසේය, දෙවියන්වහන්සේගේ පොරොන්දුව දෙස බලා ඇදහිල්ලෙන් බලවත්ව. දෙවියන්වහන්සේට ගෞරව කරමින්. (රෝම 4:20)**

**මිදීම ලැබීමෙන්:**

ඔබ පාපයෙන් මිදීම ලැබූ විට දෙවියන්වහන්සේ මහිමයට පත් කෙරේ. මහිමයට පත්කිරීම, ගැළවීම හා පරිපූර්ණත්වයට පැමිණීම ලෙස හැඳින්වේ.

**පූර්වයෙන් නියම කළවුන් උන්වහන්සේ කැඳවාගත්සේක. කැඳවාගත්තවුන් උන්වහන්සේ ධර්මිෂ්ඨ කළ සේක. ධර්මිෂ්ඨ කළ අය උන්වහන්සේ මහිමයට පැමිණවූ සේක. (රෝම 8:30)**

**පසුතැවිලිවීමෙන්:**

ඔබගේ පළමු පසුතැවිලිවීමෙන් හා පාපයෙන් හැරීමෙන් ද පව් කළ සෑමවිටකම අඛණ්ඩ පසුතැවිලිවීමෙන්ද දෙවියන්වහන්සේ මහිමයට පත් කෙරේ.

**යෝෂුවා අකාන්ට කථා කොට : මාගේ පුත්‍රය. ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමින්වහන්සේට ගෞරව දී උන්වහන්සේට ඇත්ත කියා, නුඹ කළ දේ මාගෙන් නොසඟවා මට දන්වාපන්නැයි කිවේය. (යෝෂුවා 7:19)**

පසුතැවිලිවීමට, පාපි ආකල්ප හා ක්‍රියාවලින් ඔබ පවිත්‍රවීම ද ඇතුළත් වේ. මෙමගින් දෙවියන්වහන්සේ මහිමයට පත් කෙරේ.

**ධර්මිෂ්ඨයා ස්වාමින් තුළ සන්තෝෂ වන්නේය. උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්නේය. අවංක සිත් ඇති සියල්ලෝ ද ජය ප්‍රකාශ කරන්නෝය. (ගීතාවලිය 64:10)**

**තේජවත් සභාවක් කොට තමන්ට ඔප්පුකරගැනීම සඳහා වචනය නමැති වතුරෙන් සේදීමෙන් උන්වහන්සේ එය පවිත්‍රකොට පිරිසිදුකරන පිණිසය. (එපීස 5:27)**

**පාපය කියා දීමෙන් :**

යේසුස්වහන්සේ සමිඳාණන්වහන්සේ බව කියා දීමෙන් ඔබ දෙවියන්වහන්සේ මහිමයට පත් කරනු ඇත.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමින්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඒත්තුගන්න පිණිසත්ය. (පිලිප්පි 2:11)**

**ඔබ නිහතමානිවීමෙන් :**

ඔබ නිහතමානි වූ විට දෙවියන්වහන්සේ මහිමයට පත් කෙරේ.

**මෝසෙස් හා ආරොන් සභාව ඉදිරියෙන් සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ ළඟට ගොස් මුහුණින් වැටුණෝය. ස්වාමින්වහන්සේගේ තේජස ඔවුන්ට පෙනුණේය. (ගණන් කථාව 20:6)**

නිරාහාරව සිටීම හා යාච්ඤා කිරීම නිහතමානිකමට ඇතුළත්ය.

**එවිට නුඹේ එළිය පහන්වේලාව මෙන් උදාවන්නේය. නුඹේ සුවයද ඉක්මනින් හටගන්නේය. නුඹේ ධර්මිෂ්ඨකම නුඹට පෙරටුවෙන් යන්නේය. ස්වාමින්වහන්සේගේ තේජසද නුඹට පස්සෙන් එන්නේය. (යෙසායා 58:8)**

ඔබ නිහතමානි වී යාච්ඤා කරන විට, දෙවියන්වහන්සේ ඔබගේ යාච්ඤාවලට පිළිතුරු සපයන අතර එමගින් දෙවියන්වහන්සේට වඩ වඩා මහිමය ලැබේ.

**නුඹලා මාගේ නාමයෙන් ඉල්ලන කොයි දෙයක් වුවත් පුත්‍රයා තුළ පියාණන්වහන්සේ මහිමය ලබන පිණිස මම ඒක ඉෂ්ටකරන්නෙමි. (යොහන් 14:13)**

නිහතමානී වීම යනු ඔබගේ ශරීරය ජීවමාන යාගයක් ලෙස පූජා කිරීමය.

> **නුඹලා නුඹලාටම අයිති නැත. මක්නිසාද නුඹලා මිලේට ගනු ලැබුවහුය. එබැවින් නුඹලාගේ ශරීරයෙන් දෙවියන්වහන්සේට ගෞරව කරපල්ලා. (1 කොරින්ති 6:20)**

**උන්වහන්සේගේ අභිමුවෙහි සිටීමෙන් :**

ඔබ උන්වහන්සේ අභිමුවෙහි සිටීමෙන් (නිරාහාරයෙන් ජීවත්වීමෙන්) ඔබ දෙවියන්වහන්සේට මහිමය ගෙන දෙනු ඇත.

> **ගෞරවයද මහන්තත්වයද උන්වහන්සේ ඉදිරියෙහි පවත්නේය. ශක්තියද සන්තෝෂයද උන්වහන්සේගේ ස්ථානයෙහි ඇත්තේය. (1 ලේකම් 16:27)**

ක්‍රිස්තුස්වහන්සේ ඔබ තුළ ජීවත්වීමට ඉඩ හැරීමෙන් ඔබ දෙවියන්වහන්සේ අබිමුවෙහි සිටී.

> **මා සන්තක සියල්ල ඔබගේය. ඔබ සන්තක සියල්ල මාගේය. මමද ඔවුන් තුළ ගෞරවයට පැමිණ සිටිමි. (යොහන් 17:10)**

ඔබ තුළ සිටීමට හා වැඩ කිරීමට දෙවියන්වහන්සේට ඉඩදීමෙන් ඔබ උන්වහන්සේ අබිමුවෙහි සිටී.

> **ඒ දවසෙහි සේනාවල ස්වාමින්වහන්සේ තමන්ගේ ඉතිරි සෙනඟට අලංකාර ඔටුන්නක්ද දීප්තිමත් කිරීටයක්ද, (යෙසායා 28:5)**

**දුක්විඳීමේදී**

ඔබ ගැටලු, පරීක්ෂාවන් හා දුක්විඳීම්වලට මුහුණ දෙන විට, ඔබ ඒවාට නියමාකාරයෙන් ප්‍රතිචාර දැක්වීමෙන් ඔබ විසින් දෙවියන්වහන්සේ මහිමයට පමුණුවනු ලැබේ.

> **තවද දරුවෝ නම් උරුමක්කාරයෝය. දෙවියන්වහන්සේගේ උරුමක්කාරයෝය. ක්‍රිස්තුස්වහන්සේ හා සමඟ හවුල් උරුමක්කාරයෝය. උන්වහන්සේ හා සමඟ මහිමය ලබන පිණිස, උන්වහන්සේ සමඟ දුක්විඳමු නම්, මෙසේ වන්නේය.**
>
> **මක්නිසාද මේ වර්තමාන කාලයේ දුක් වනාහි අප කෙරෙහි එළිදරව් කරනු ලබන්නාවූ මහිමයට සමාන කරනු ලබන්ට නොවටියයි සිතමි. (රෝම 8:17-18)**
>
> **ක්‍රිස්තුස්වහන්සේ ඒ දේ විඳලාම ස්වකීය මහිමයට පැමිණෙන්ට යුතුව තිබුණා නොවේද කියා (ලූක් 24:26)**

පාවුලුතුමා මෙසේ පැවසීය.

> **එපමණකුත් නොව, පීඩා විඳීමෙන් ඉවසිල්ලද, ඉවසිල්ලෙන් සහතිකකමද සහතිකකමෙන් බලාපොරොත්තුවීම ද උපදින බව දැන, අප විඳින පීඩාවලදීත් ප්‍රීතිමත්වෙමු.**
>
> **බලාපොරොත්තුව ලජ්ජාවට නොපමුණු වන්නේය. මක්නිසාද අපට දෙනලද ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හෘදවල වගුරුවන ලද්දේය.**
>
> **මක්නිසාද අප දුර්වලව සිටියදීම නියම කාලයේදී ක්‍රිස්තුස්වහන්සේ අභක්තිකයන් උදෙසා මළසේක. (රෝම 5:3-6)**

සියල්ල ඔබ සඳහාය. මහිමයේ බහුලත්වය, බොහෝ දෙනෙකුගේ තුති පිදීම මගින් දෙවියන්වහන්සේගේ මහිමය පිණිස පවතිනු ඇත.

> **මක්නිසාද අනුග්‍රහය වැඩිදෙනා කරණකොටගෙන අධිකවී, ස්තුතිකිරීම දෙවියන්වහන්සේගේ තේජස සඳහා අධිකවන පිණිස ඒ සියල්ල නුඹලා උදෙසා වන්නේය.**

**එහෙයින් අපි ක්ලාන්ත නොවමුව, අපේ පිටත මනුෂ්‍යයා ක්ෂයවෙන නුමුත්, අපේ ඇතුල් මනුෂ්‍යා දවසින් දවස අලුත්කරනු ලබන්නේය.**

**මොහොතකට පවතින අපේ සැහැල්ලුවූ දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලා සිටින්නාවූ අපට, (2 කොරින්ති 4:15,16, 17)**

**මා විසින් පාරට්ටුකරන්ට යුතුනම් මාගේ දුර්වලකම සම්බන්ධ කාරණා ගැන පාරට්ටුකරන්නෙමි. (2 කොරින්ති 11:30)**

**එබඳු තැනැත්තෙකු ගැන පාරට්ටුකරමි. නුමුත් මාගේ දුර්වලකම් ගැන මිස මා ගැනම පාරට්ටු නොකරමි. (2 කොරින්ති 12:5)**

**උන්වහන්සේද: මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණ වෙන්නේයයි මට කීසේක. එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටුකරන්නෙමි. (2 කොරින්ති 12:9)**

**එහෙයින් නුඹලාගේ ගෞරවයට හේතුවූ, නුඹලා නිසා මා විඳින්නාවූ දුක් ගැන ක්ලාන්ත නොවෙන ලෙස ඉල්ලමි. (එපීස 3:13)**

**එසේ ශෝකයට පත්වන්නේ නාස්තිවී යන්නාවූ, එසේද වුවත් ගින්නෙන් සෝදිසිකරන්නාවූ රනට වඩා අගේව තිබෙන නුඹලාගේ ඇදහිල්ල පරීක්ෂාකිරීමෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්වීමේදී ප්‍රශංසාවත් මහිමයත් ගෞරවයත් පැමිණෙන පිණිසය. (1 පේතෘස් 1:7)**

**මක්නිසාද නුඹලා වරදකොට ඒ ගැන පහර ලබන කල්හි ඉවසන්නහු නම්, එය මොන උතුම්කමක්ද? නුමුත් යහපත්කම් කොට ඒ ගැන දුක්විඳින කල්හි ඉවසන්නහු නම්, ඒක දෙවියන්වහන්සේ ඉදිරියෙහි ප්‍රශංසනීය දෙයක්ය. (1 පේතෘස් 2:20)**

**නුමුත් ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ එළිදරව්වීමේදීත් නුඹලා ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීතිවන පිණිස උන්වහන්සේගේ දුක් විඳීමෙහි නුඹලා පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීතිවෙයල්ලා.**
**ක්‍රිස්තුස්වහන්සේගේ නාමය නිසා නින්දාකරනු ලබන්නහු නම් නුඹලා ආශිර්වාදලද්දහුය. මක්නිසාද මහිමයේ ආත්මයාණන්වහන්සේ වන දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි රඳනසේක.**
**නුඹලාගෙන් කිසිවෙක් මිනීමරන්නෙක්වත් සොරෙක්වත් නපුර කරන්නෙක්වත් අනුන්ගේ කාරණාවලටම දිවන්නෙක්වත් මෙන් දුක් නොවිඳීවා,**
**නුමුත් යමෙක් ක්‍රිස්තියානිකාරයෙකු මෙන් දුක්විඳී නම්, ඔහු ලජ්ජා නොවී, ඒ නාමය සම්බන්ධයෙන් දෙවියන්වහන්සේට ගෞරව කරාවා. (1 පේතෘස් 4:13-16)**

1 පේතෘස් 5:1 හා 4 න් පෙන්වන්නේ ඔබ උන්වහන්සේගේ දුක්විඳීමේ පංගුකාරයෙකු වන විට උන්වහන්සේගේ මහිමයේ ද පංගුකාරයෙකු වනු ඇත. රෝගයක් වුවද සුව වූ විට දෙවියන්වහන්සේගේ මහිමය සඳහා යොදාගත හැකිය.

**නුමුත් යේසුස්වහන්සේ ඒ අසා: ඒ රෝගය මරණය පිණිස නොව එයින් දෙවියන්වහන්සේගේ පුත්‍රයා මහිමයට පමුණුවනු ලබන පිණිස දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහායයි කීසේක. (යොහන් 11:4)**

යේසුස්වහන්සේගේ රූප විපර්යාසය සිදුවුයේ උන්වහන්සේට මුහුණ දීමට නියමිත දුක්විඳීම නිසා වේ. මහිමය දැකීම සඳහා පරීක්ෂාව රූපවිපර්යාසය වේ.

**ඔබගේ සේවය ඉටු කිරීමෙන් :**

ඔබ කැඳවා ඇති සේවය ඉටු කිරීමෙන් දෙවියන්වහන්සේ මහිමයට පමුණුවනු ලැබේ.

**යමෙක් කථාකෙරේ නම්, දෙවියන්වහන්සේගේ වාක්‍ය වශයෙන් කථාකරාවා, යමෙක් සේවය කෙරේ නම්, දෙවියන්වහන්සේ සපයාදෙන ශක්තියේ ප්‍රකාර සේවයකරාවා. දෙවියන්වහන්සේට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන සියලු කාරණාවලදී ගෞරව පැමිණෙන පිණිස එසේ**

**කරන්ට ඕනෑය. මහිමයත් පරාක්‍රමයත් සදාකාලේටම උන්වහන්සේගේය. ආමෙන්. (1 පේතෘස් 4:11)**

**එබැවින් අපගේ දෙවියන්වහන්සේගෙත් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙත් කරුණාව ලෙස නුඹලා තුළ අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය ද උන්වහන්සේ තුළ නුඹලාද ගෞරවයට පැමිණෙන පිණිස, නුඹලා නුඹලාගේ කැඳවීමට සුදුස්සෝයයි අපගේ දෙවියන්වහන්සේ විසින් ඒත්තුගෙන, යහපත්කමේ සියලු ආශා ද ඇදහිල්ලේ සියලු ක්‍රියාද ස්වකීය බලයෙන් සම්පූර්ණකරන මෙන් අපි නිතරම නුඹලා ගැන යාච්ඤා කරමුව. (2 තෙසලෝනික 1:11-12)**

ඔබගේ සේවයට යහපත් ක්‍රියා ඇතුළත්ය. ඔබ මේ දේවල් කරන විට දෙවියන්වහන්සේ මහිමයට පත් කෙරේ.

**නුමුත් යහපත්කම් කරන්නාවූ සියලු මනුෂ්‍යයන්ට, එනම් පළමුකොට යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද මහිමයත් ගෞරවයත් සමාදානයත් ලැබෙන්නේය. (රෝම 2:10)**

**එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරවකරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා. (මතෙව් 5:16)**

ඔබගේ හැසිරීම හා කතාව යහපත ක්‍රියාවලට ඇතුළත්ය. 2 පේතෘස් 2:12 න් පෙන්වන්නේ ඔබගේ හැසිරීම හා කතාව යහපත් නම් දෙවියන්වහන්සේ මහිමයට පත්කෙරෙන බවය. ආත්මික ඵල දැරීම ද යහපත් ක්‍රියාවලට ඇතුළත් වේ. මෙමගින් ද දෙවියන්වහන්සේ මහිමයට පමුණුවනු ලැබේ.

**මාගේ පියාණන්වහන්සේට ගෞරව ලැබෙන්නේ නුඹලා විසින් බොහෝ ඵල දැරීමෙන්ය. මෙසේ නුඹලා මාගේ ගෝලයෝ වන්නෝය. (යොහන් 15:8)**

ධර්මිෂ්ටකමේ ඵල ද දෙවියන්වහන්සේ මහිමයට පත්කරනු ලැබේ.

**නුඹලාගේ ප්‍රේමය දැනගැන්මෙන් හා සියලු අකාර විමසීමෙන් තව වඩා වඩා බොහෝ වන පිණිස යාච්ඤා කරමි. (පිලිප්පි 1:11)**

දෙවියන්වහන්සේගේ මහිමය ජාතීන්ට එළිදරව් කරන ශුභාරංචි පණිවුඩය බෙදා ගැනීම ද දෙවියන්වහන්සේගේ කටයුතුවලට ඇතුළත්ය.

**නැගිට බැබළියන්න, මක්නිසාද නුඹේ ආලෝකය පැමුණුණේය. ස්වාමින්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි උදාවිය. එසේය, පොළොව අන්ධකාරයෙන්ද ජනයෝ තද අන්ධකාරයෙන්ද වසනු ලබන්නෝය. නුමුත් නුඹ කෙරෙහි ස්වාමින්වහන්සේ උදාවන සේක. උන්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි පෙනෙන්නේය. (යෙසායා 60:1-2)**

ගීතාවලිය 96:3 හි මෙසේ සඳහන් වේ, විජාතීන් අතර එතුමන්ගේ මහිමය ප්‍රකාශ කරන්න.

**“. . . ඔවුන් ජාතීන් අතරෙහි මාගේ තේජස දන්වනවා ඇත” . (යෙසායා 66:19)**

**දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියාත් උන්වහන්සේගේ රාජ්‍යයේ තේජෝමහිමයත් මනුෂ්‍ය පුත්‍රයන්ට දන්වන පිණිස, (ගීතාවලිය 145:11)**

අප දේශනා කරන පණිවුඩය, “මහිමාන්විත සුබ අස්න” (1 තිමෝති 1:11, 2 කොරින්ති 3:7 සිට 4:6 දක්වා, කොලො. 1:27 බලන්න) ලෙස හැඳින්වේ. ශුභාරංචිය දේශනා කර අදහාගත් විට එය ගෞරවයට පත්වනු ඇත (2 තෙස. 3:1). මනුෂ්‍යයා ශුභාරංචිය ලැබූ විට දෙවියන්වහන්සේට ගෞරවය ලැබේ (2 තෙස. 1:12). එය අසා අදහාගන්නා අය දෙවියන්වහන්සේට ගෞරව කරති (ක්‍රියා 13:48). තැන් තැන්වලට යමින් ශුභාරංචිය දේශනා කරන අය එසේ කරන්නේ දෙවියන්වහන්සේ මහිමයට පැමිණවීමට වේ (2 කොරින්ති 8:9). මහිමයේ සම්පත් ද ශුභාරංචිය තුළින් ඔබගේ වේ (එපිස 1:18, කොලොස්සි 1:11).

ඔබ සේවය කරන විට දෙවියන්වහන්සේ උන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කරන අතර මනුෂ්‍යයෝ උන්වහන්සේට ප්‍රශංසා කරති.

> **සිද්ධවුණු දේ ගැන සියල්ලන් දෙවියන්වහන්සේට ප්‍රශංසාකළ බැවින්, සෙනඟ නිසා ඔවුන්ට දඬුවම් කරන්ට අන්දමක් නොදැක, ඔව්හු ඔවුන්ට තවදුරටත් තර්ජනය කොට යන්ට හැරියෝය. (ක්‍රියා 4:21)**

(බලයේ ප්‍රකාශ වීම තුළින් දෙවියන්වහන්සේ මහිමයට පත්කළ ආකාරය කියවන්න, මතෙ. 9:8, 15:31, මාක් 2:12, ලූක් 2:20, 5:25-26, 7:16, 13:13, 17:15, 18:43, 19:38, 23:47).

ඔබ කැඳවන ලද කාර්යය අවසන් කිරීමෙන් ඔබ දෙවියන්වහන්සේ මහිමයට පමුණුවයි.

> **ඔබ මට කරන්ට දුන් වැඩ මම නිමකර පොළොවේදී ඔබ ගෞරවයට පැමිණෙවිමි. (යොහන් 17:4)**

ඔබ කරන සියලු දෙයින් දෙවියන්වහන්සේ මහිමයට පැමිණවීමට ඔබට පුළුවන.

> **එහෙයින් නුඹලා කතත් බොතත් වෙන යමක් කරතත් සියල්ල දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා. (1 කොරින්ති 10:31)**
>
> **යමෙක් කථාකෙරේ නම්, දෙවියන්වහන්සේගේ වාක්‍ය වශයෙන් කථාකරාවා, යමෙක් සේවය කෙරේ නම්, දෙවියන්වහන්සේ සපයාදෙන ශක්තියේ ප්‍රකාර සේවයකරාවා. දෙවියන්වහන්සේට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන සියලු කාරණාවලදී ගෞරව පැමිණෙන පිණිස එසේ කරන්ට ඕනෑය. මහිමයත් පරාක්‍රමයත් සදාකාලේටම උන්වහන්සේගේය. ආමෙන්, (1 පේතෘස් 4:11)**

ඔබ කරන දේ ඇතැම් විට සාමාන්‍ය විය හැකිය. එහෙත් එය දෙවියන්වහන්සේ මහිමයට පැමිණවීමට කරන විට අධිසාමාන්‍ය වේ.

**උන්වහන්සේගේ වචනය තුළින් පැවතීමෙන් :**

දෙවියන්වහන්සේගේ මහිමය උන්වහන්සේගේ වචනයෙන් එළිදරව් වේ.

> **අපි සියල්ලෝද මුහුණ වැස්මක් නැතුව, ස්වාමින්වහන්සේගේ තේජස කැඩපතකින් මෙන් දක්වමින්, ආත්මයාණන්වහන්සේ වන ස්වාමින්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට වෙනස් කරනු ලබමුව. (2 කොරින්ති 3:18)**

**"ඔබගේ වචන එළිදරව්වීමෙන් ආලෝකය ලැබේ" (ගීතා. 119:130).** . . "ආලෝකය" දෙවියන්වහන්සේගේ මහිමයට සම්බන්ධ බව මතක තබා ගන්න.

ගල් පුවරුවල ලියා තැබූ දෙවියන්වහන්සේගේ වචන මෝසෙස් බිඳ දැමූ විට ඔහුගේ මුහුණේ තේජය නැති විය. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචන ලබාගෙන තබාගන්නා අයට තම මහිමය දෙන සේක. දෙවියන්වහන්සේගේ මහිමය හා වචනය අතර ඇති සම්බන්ධය ගැන මිට වඩා අවධාරණය කිරීමට අපට නොහැකිය, මන්ද වචනය යේසුස්වහන්සේ වන බැවිනි.

**ප්‍රශංසාවෙන් හා නමස්කාරයෙන් :**

දෙවියන්වහන්සේගේ මහිමයෙන් බලපෑම් ලත් මනුෂ්‍යයා, මහිමය දෙමින් උන්වහන්සේට ප්‍රශංසා කරයි.

> **"ස්තුති පූජා පුදන තැනැත්තේ මට ගෞරව කරයි" (ගීතාවලිය 50:23).**

නව ගිවිසුමේ උසස්තම නමස්කාරය ඇත්තේ සත්ත්වයා නිරායාසයෙන්ම දෙවියන්වහන්සේට ගෞරව කරන විට වේ. ගෞරවය වන්නේ,

1. **දෙවියන්වහන්සේට පිරිනමන විට :** 1 සාමුවෙල් 6:5, 1 ලේකම් 16:29

2. **දෙවියන්වහන්සේට පවරන විට :** ගීතාවලිය 29:1-1, මතෙව් 6:13 හි "සදාකාලයටම ගෞරවය ඔබවහන්සේට වේවා" යයි අදහස සඳහන් වේ.

3. **දෙවියන්වහන්සේට දෙන විට :** මලාකි 2:2

4. **අප තුළ ඇති උන්වහන්සේගේ මහිමයෙන් ගෞරවය දෙන විට :** ගීතාවලිය 57:8, 108:1, 30:12,

5. **එක්සත්ව කරන විට :** රෝම 15:6

දෙවියන්වහන්සේට ගෞරව කිරීම රික්තයකදී නොකෙරේ. ඔබ දෙවියන්වහන්සේට ගෞරව කරන්නේ.

1. **එය ආඥාවක් බැවිනි**

   **ස්වාමින්වහන්සේගේ නාමයට අයිති ගෞරවය දෙව්, පඬුරක් රැගෙන උන්වහන්සේ ඉදිරියට එව්, ශුද්ධවූ අලංකාරය ඇතුව ස්වාමින්ට නමස්කාරකරව්. (1 ලේකම් 16:29)**

   **ඔව්හු ස්වාමින්වහන්සේට ගෞරවය දී, උන්වහන්සේගේ ප්‍රශංසාව දිවයින්වල ප්‍රකාශ කෙරෙත්වා. (යෙසායා 42:12)**

   **උන්වහන්සේගේ මහිමය ජාතීන් අතරේද උන්වහන්සේගේ ආශ්චර්ය ක්‍රියා සියලු මනුෂ්‍ය වර්ගයන් අතරේද ප්‍රකාශ කරව්. (ගීතාවලිය 96:3)**

   **ස්වාමින්ගේ නාමයට දියයුතු මහිමය දෙව්. ශුද්ධකමේ අලංකාරයෙන් ස්වාමින්ට නමස්කාර කරව්. (ගීතාවලිය 29:2)**

පහත දැක්වෙන පාඨ ද දෙවියන්වහන්සේට ගෞරව කිරීම පිළිබඳව වේ. නෙහෙ. 9:5, 1 සාමු. 6:5, 1 ලේකම්. 16:10, 28-29, 35, 29:11, 13, යෙරෙ. 13:16, එළිද. 1:6, 4:9, 4:11, 5:12-13,7:12, 14:7, 19:1, ගීතා. 22:23, 29:1-2, 66:2, 96:7-8).

2. **එය උන්වහන්සේට අයත් දෙයකි**

   **ස්වාමින්ගේ නාමයට දියයුතු මහිමය දෙව්. ශුද්ධකමේ අලංකාරයෙන් ස්වාමින්ට නමස්කාර කරව්. (ගීතාවලිය 29:2)**

3. **උන්වහන්සේගේ ස්වභාවය නිසාය**

   **ස්වාමිනි, ඔබගේ නාමයට භය නොවන්නෙත් ගෞරව නොකරන්නෙත් කවුද? මක්නිසාද ඔබ පමණක් ශුද්ධය. එබැවින් සියලු ජාතීන් පැමිණ ඔබ ඉදිරියෙහි නමස්කාරකරනවා ඇත. මක්නිසාද ඔබගේ ධර්මිෂ්ඨ ක්‍රියා ප්‍රකාශකරනලද්දෝයයි කීවෝය. (එළිදරව් 15:4)**

   **අන්‍යජාතීන් විසින් දෙවියන්වහන්සේගේ දයාව ගැන උන්වහන්සේට ගෞරවකරන පිණිසත්ය, ඒ හැටියට: එබැවින් අන්‍යජාතීන් අතරේ ඔබ වර්ණනාකරන්නෙමි. ඔබගේ නාමයට ගීතිකා කියන්නෙමියි ලියා තිබේ. (රෝම 15:9)**

4. **උන්වහන්සේගේ නාමය නිසාය**

   **මාගේ දෙවිවූ ස්වාමිනි, මාගේ මුළු සිතින් ඔබට ප්‍රශංසාකරන්නෙමි. සදාකල් ඔබගේ නාමයට ගෞරව කරන්නෙමි. (ගීතාවලිය 86:12)**

   **ස්වාමිනි, අපට නොව, අපට නොව, ඔබගේ කරුණාව නිසාත් සැබෑකම නිසාත් ඔබගේ නාමයට ගෞරවය දුන මැනව. (ගීතාවලිය 115:1)**

**මොව්හු ස්වාමින්ගේ නාමයට ප්‍රශංසා කෙරෙත්වා. මක්නිසාද උන්වහන්සේගේ නාමය පමණක් උසස්ය. උන්වහන්සේගේ මහිමය ස්වර්ගය හා පොළොව මත්තෙහි පවත්නේය. (ගීතාවලිය 148:13)**

5. **උන්වහන්සේ සියල්ල මැවූ නිසා.**

**අපගේ ස්වාමින්වහන්ස, අපගේ දෙවියන්වහන්ස, ඔබ ප්‍රශංසාවත් ගෞරවයත් බලයත් ලබන්ට වටින තැනැන්වහන්සේය. මක්නිසාද ඔබ සියලු දේ මැවූසේක. ඔබගේ කැමැත්ත නිසා ඒවා තිබුණේය, ඒවා මවනලද්දේයයි කියති. (එළිදරව් 4:11 එළිදරව් 14:7 ද බලන්න)**

6. **උන්වහන්සේ සියල්ල පවත්වාගෙන යන නිසා.**

**මක්නිසාද සියල්ල උන්වහන්සේ කෙරෙන්ය, උන්වහන්සේ කරණකොටගෙනය, උන්වහන්සේ උදෙසාය. උන්වහන්සේට සදාකල්ම මහිමය වේවා. ආමෙන්. (රෝම 11:36)**

7. **මිදීම නිසාය.**

**ඔව්හු ඒ අසා, නිශ්ශබ්දවී, දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින්: එසේවී නම් දෙවියන්වහන්සේ අන්‍යජාතීන්ටත් ජීවනය පිණිස වූ පශ්චාත්තාපය දුන්සේකැයි කීවෝය. (ක්‍රියා 11:18)**

**පූර්වයෙන් නියමකළවුන් උන්වහන්සේ කැඳවාගත්සේක. කැඳවාගත්තවුන් උන්වහන්සේ ධර්මිෂ්ඨකළසේක. ධර්මිෂ්ඨකළ අය උන්වහන්සේ මහිමයට පැමිණෙවූසේක. (රෝම 8:30)**

**තමන්වහන්සේගේ කැමැත්තේ ප්‍රසන්නකමේ හැටියට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන පුත්‍රයන්වීමට අප පෙර නියම කළ සේක. (එපීස 1:6)**

8. **උන්වහන්සේගේ විනිශ්චය නිසාය.**

**ඔහු මහත් ශබ්දයකින් කථාකරමින්: දෙවියන්වහන්සේට භයවී, උන්වහන්සේට ගෞරව දීපල්ලා, මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුණේය. අහසත් පොළොවත් මුහුදත් ජල උල්පතුත් මැවූ තැනැන්වහන්සේට නමස්කාර කරපල්ලායයි කීය. (එළිදරව් 14:7, එළිදරව් 15:4 ද බලන්න)**

9. **උන්වහන්සේ තුළ ඔබගේ උරුමය නිසා**

**ස්වාමිනි, ඔබගේ සෙනඟ කෙරෙහි පවත්වන කරුණාවෙන් මා සිහිකළ මැනව. ඔබගේ ගැළවීම මට ගෙනදුන මැනව. (ගීතාවලිය 106:5)**

නමස්කාරය පිළිබඳව ඇති අටවන හා නවවන පරිච්ඡේදවලින් දෙවියන්වහන්සේට මහිමය දෙන ආකාරය පිළිබඳව ඔබ තවදුරටත් අධ්‍යයනය කරනු ඇත.

## අඛණ්ඩ චක්‍රය

දෙවියන්වහන්සේට මහිමය දෙන ආකාරය ඔබ මෙම පාඩමෙන් අධ්‍යයනය කළෙහිය. මෙම මාර්ගෝපදේශ අනුගමනය කරමින් ඔබ දෙවියන්වහන්සේ මහිමයට පමුණුවන විට දෙවියන්වහන්සේ ඔබ තුළින් තව තවත් උන්වහන්සේගේ මහිමය එළිදරව් කරන සේක. උන්වහන්සේ කර ඇති දෙයට ඔබ මහිමය දෙන විට, ඔබගේ සේවය තව තවත් සන්නද්ධ කිරීමට ඔබට මහිමය ලැබෙන්නේය. මෙම අඛණ්ඩ චක්‍රයට නිමාවක් නැත. එය, දෙවියන්වහන්සේ ඔබ කැඳවා ඇති දෙය අත්පත් කර ගැනීමට පොලඹවන බලයක් වේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. දෙවියන්වහන්සේට මහිමය දෙන ආකාරය පැහැදිලි කරන්න.

3. මහිමය දෙන හා ලබාගන්නා අඛණ්ඩ චක්‍රය සාකච්ජා කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යෙසායා 60 පරිච්ඡේදය කියවන්න. පළමුවන පදය අභියෝග කරන්නේ,

**නැගිට බැබළියන්න, මක්නිසාද නුඹේ ආලෝකය පැමුණුණේය. ස්වාමින්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි උදාවිය. එසේය, පොළොව අන්ධකාරයෙන්ද ජනයෝ තද අන්ධකාරයෙන්ද වසනු ලබන්නෝය. (යෙසායා 60:1)**

යෙසායා මෙම පරිච්ඡේදයේ ඉතිරි කොටස, දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ඔබ මත වූ විට ඇතිවන ප්‍රතිඵල එළිදරව් කරයි.

2 පදය : අඳුර පොළොව මත ඇතිවිට වුවද සමිඳාණන්වහන්සේ හා උන්වහන්සේගේ තේජාලංකාරය ඔබ කෙරෙහි වේ. ඔබ වටා ඇති තත්වයන්ගෙන් ඔබට බලපෑමක් ඇති නොවේ.

3 පදය : උන්වහන්සේගේ තේජාලංකාරයේ දීප්තිය වෙත ජාතීන් පැමිණේ. දේශපාලන නායකයන් වුවද පැමිණෙනු ඇත.

4 පදය : දුර සිට පැමිණෙන "පුත්‍රයන් හා දූවරුන්" යනු ඔබගේම පවුලේ අය පමණක් නොවේ. ආත්මික පුත්‍රයෝ හා දූවරු ද වෙති.

5-12 පද : සතුරාගේ සම්පත් රාජ්‍යය සඳහා යොදවනු ලැබේ (11 පදයේ සඳහන් "සම්පත්" යනු ධනය වේ)

13 පදය : ස්වභාවිකව එකිනෙක වෙනස් දේ අතර ද ඒකත්වයක් පවතිනු ඇත.

14-19 පද: සතුරා විසින් සොරාගත් දේ දෙවියන්වහන්සේ විසින් මුදාගන්නා සේක.

14 පදය : ඔබට පීඩා කළ අය ඔබට යටත්වනු ඇත.

16 පදය : ඔබේ මිදුම්කරු ජයගන්නේය.

17 පදය : සම්පූර්ණ ආපසු හැරීමක් විස්තර කෙරේ.

18 පදය : යුද්ධය නවතී

19 පදය: "ඔබේ දෙවිඳාණෝ" "ඔබේ තේජාලංකාරය" වන්නේය.

20 පදය: දුක්විම අවසන් වේ.

21 පදය : ධර්මිෂ්ඨයන් දේශය උරුම කරගනිති.

22 පදය : කුඩා තැනැත්තා බලවත් වන අතර දෙවියන්වහන්සේ ඉක්මනින් කටයුතු කරන සේක.

දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ ප්‍රතිඵලවල විස්තර යෙසායා 61:1-3 හිද ඇත. ආලේපය ඔබ මත රඳා පවතී. 4-11 පද: පැරණි නටබුන් අලුත් වැඩියා කෙරේ.

2. දැන් යෙසායා 43 අධ්‍යයනය කරන්න. 7 පදය බලන්න. "ඔව්හු මාගේ සෙනඟය, මාගේ මහිමය සඳහා නිර්මාණය කොට තිබේ . . ." "ඔව්හු" යන්න කලින් පවසා ඇති දෙයට සම්බන්ධය. තමන් පිට දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ඇති අයට පහත දැක්වෙන දේ සපයා ඇත.

- මිදීම 1: - ගැළවීම 2 - ආත්මික අස්වැන්න :4-6

3. ගීතාවලිය 24 කියවන්න. මහිමාන්විත රාජයාණෝ පැමිණෙන ආකාරය මෙහි විස්තර කෙරේ. උන්වහන්සේ පැමිණෙන්නේ.

- පිරිසිදු අත් ඇති 4
- සිතින් නිර්මල 4
- නිෂ්ඵල දෙයට වැඳුම් පිදුම් නොකරන 4
- බොරුවට නොදිවුරන 4
- තම ආත්මික දොරවල් හා වාසල දොරවල් 7 සහ 9

උන්වහන්සේ ඉදිරියෙහි විවෘත කරන අය වෙතය.

4. දෙවියන්වහන්සේට මහිමය නොදෙන විට සිදුවන දේ බලන්න.

**මාගේ නාමයට ගෞරවදෙන හැටියට නුඹලා අසා සිතට නොගන්නහු නම් මම නුඹලා අතරට ශාපය එවා, නුඹලාගේ ආශිර්වාදවලට ශාපකරන්නෙමියි සේනාවල ස්වාමින්වහන්සේ කියනසේක. එසේය, නුඹලා සිතට නොගන්න නිසා මම ඒවාට ශාපම කෙළෙමි. (මලාකි 2:2)**

දෙවියන්වහන්සේ බේල්ෂෙශර්ට දුන් පණිවිඩය මෙයට සමාන වේ.

**ස්වර්ගයේ ස්වාමින්වහන්සේට විරුද්ධව උසස්වී... නුමුත් ඔබගේ හුස්ම තමන් හස්තයෙහි ඇත්තාවූ, ඔබගේ සියලු මාර්ග අයිතිවූ, දෙවියන්වහන්සේට ඔබ ගෞරවකළේ නැත. (දානියෙල් 5:23)**

දෙවියන්වහන්සේට ගෞරවය දීමේ පාඩම හෙරොද් ඉගෙන ගත්තේ දරුණු ලෙස වේ. දෙවියන්වහන්සේට දිය යුතු ගෞරවය නුදුන් බැවින්, සමිඳාණන්වහන්සේගේ දූතයෙක් ඔහුට පහර දුන්නේය. ක්‍රියා 12:23 බලන්න.

# හත්වන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේගේ තේජාලංකාරය

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දෙවියන්වහන්සේගේ තේජාලංකාරය උන්වහන්සේගේ සෙනඟගෙන් ඉවත්ව යන්නේ මන්දැයි පැහැදිලි කිරීමට
- ගිවිසුම් කරඬුව පහත දැක්වෙන එක් එක් ස්ථානවල තිබියදී සිදුවූ දේ හා ඒවායේ වැදගත්කම පැහැදිලි කිරීමට
    - එබෙන්-එසෙර්
    - අපෙක්
    - ගාත්
    - අෂ්දොද්
    - එක්‍රොන්
    - බෙත්-ෂෙමෙෂ්
    - කිරියත් - යෙයාරීම්
    - යෙරුසලම
- දෙවියන්වහන්සේගේ තේජාලංකාරය නැවත පැමිණීමට අවශ්‍ය වූ දේවල් හතරක් හැඳින ගැනිමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **මෙසේ සියලු ඉශ්රායෙල්වරු ඔල්වර හඬත් හොරණෑ-ශබ්දයත් ඇතුව නළාවලිනුත් අත්තල්වලිනුත් වීණාවලිනුත් මහා වීණාවලිනුත් ශබ්ද පවත්වමින් ස්වාමින්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ගෙනාවෝය.** (1 ලේකම් 15:28)

### හැඳින්වීම

දෙවියන්වහන්සේ මෝසෙස්ට මෙසේ පැවසූ සේක. “මා නුඹට පෙන්වන සැලැස්ම අනුව මණ්ඩපයද එහි සියලු උපකරණද සාදන්නේ නම් මාගේ තේජාලංකාරය එහි පවතිනු ඇත ” (නික්මයාම 25:9). මනුෂ්‍යයා පටන් ගැන්මේදී මවන ලද්දේ දෙවියන්වහන්සේගේ තේජස පිණිසය. අප උන්වහන්සේගේ ස්වරූපයෙන් මවන ලද්දේ හා උන්වහන්සේගේ වැඩ කෙරෙහි බලය දෙන ලද්දේ උන්වහන්සේට තේජස ගෙනෙන පිණිසය (හෙබ්‍රෙව් 2:7). මනුෂ්‍යයා පව් කළ විට “රටාව” වෙනස් වී තේජස නැති විය.

> **මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. (රෝම 3:23)**

මෝසෙස්ගේ මණ්ඩප මෙන් දෙවියන්වහන්සේගේ මණ්ඩපය වන්නේ ඔබය. ඔබ ඔබගේ, ආත්මික ජීවිතය නිවැරදි රටාව අනුව ගොඩනඟන්නෙහි නම් තේජස එතැන පවතිනු ඇත. ඔබ රටාව වෙනස් කළහොත් තේජස ඉවත්ව යනු ඇත.

> **මක්නිසාද ඔවුහු දෙවියන්වහන්සේ ඇඳිනගනත් උන්වහන්සේට දෙවියන්වහන්සේ මෙන් ගෞරවයවත් ස්තුතිවත් නොකොට, තමුන්ගේ විතර්කවලින් නිර්ර්ථක බවට පැමිණුණෝය, ඔවුන්ගේ අඥාන සිත්ද අඳුරු විය. තුමුම ප්‍රඥාවන්තයෝයයි කියමින් ඔවුහු අඥානයෝව, ජරාවට නොපැමිණෙන්නාවූ දෙවියන්වහන්සේගේ මහිමය ජරාවට පැමිණෙන්නාවූ**

**මනුෂ්‍යයාගේද පක්ෂීන් හා සිවුපාවුන්ගේද බඩගා යන ජාතීන්ගේ රූපවලට සමාන වන ලෙස මාරු කළෝය. (රෝම 1:21-23)**

**මෙසේ ඔවුහු තමුන්ගේ මහිමය වූ තැනැන්වහන්සේ තණකොළ කන ගොනෙකුගේ ස්වරූපයට මාරු කළෝය. (ගීතාවලිය 106:20)**

දෙවියන්වහන්සේගේ විනිශ්චය තුළින් ඇතැම් අය පසුතැවිලි වන අතර තේජස ප්‍රකෘතිමත් වන්නේය.

**එම පැයේදීම මහත් භූමිකම්පාවක් වී, නුවරින් දසයෙන් කොටසක් වැටුණෝය. භූමිකම්පාවෙන් මනුෂ්‍යයන් සත්දහසක් මැරුණෝය. ඉතිරි අය භයපත්ව ස්වර්ගයේ දෙවියන්වහන්සේට ගෞරව දුන්නෝය. (එළිදරව් 11:13)**

සමහරක් අය කිසිදිනක පසුතැවිලි නොවීම නිසා තේජස නැවත ලබාගන්නේ නැත.

**මහත් උෂ්ණයකින් මනුෂ්‍යයෝ දවනු ලැබ, මේ පීඩා කෙරෙහි බලය ඇති දෙවියන්වහන්සේගේ නාමයට අපහාස කළෝය, උන්වහන්සේට ගෞරවය දෙන ලෙස ඔවුහු පශ්චාත්තාපනුණෝය. (එළිදරව් 16:9)**

පව්කරුවාට තේජස නැත. එය ප්‍රකෘතිමත් වන්නේ මිදීමේ ක්‍රියාවලියෙනි.

**පූර්වයෙන් නියම කළවුන් උන්වහන්සේ කැඳවා ගත් සේක. කැඳවා ගත්තවුන් උන්වහන්සේ ධර්මිෂ්ඨ කළ සේක. ධර්මිෂ්ඨ කළ අය උන්වහන්සේ මහිමයට පැමිණෙවූ සේක. (රෝම 8:30)**

පාපය දෙවියන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේගේ අබිමුවෙන් ඈත් කළ විට "තේජස" ද ඉවත් වේ. පාපය මඟින් රටාව වෙනස් කර ඇති බැවින් දෙවියන්වහන්සේගේ තේජස ඉවත් වූ විට කළ හැක්කේ කුමක්ද? මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයන මහා ආත්මික සත්‍යයන්ගේ ස්වාභාවික සමාන්තරතා දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව ඉවත් වීම හා නැවත ඉශ්රායෙලයට ගෙන ඒම පිළිබඳව පැරණි ගිවිසුමේ අධ්‍යයනය තුළින් සපයයි.

## ගිවිසුම් කරඬුව ගෙන යෑම හා නැවත ගෙන ඒම.

දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව උන්වහන්සේගේ සෙනඟ මධ්‍යයේ දෙවියන්වහන්සේගේ තේජස සංකේතවත් කරයි. ඉශ්රායෙල්වරු පාළුකරය මැදින් ගමන් කරද්දී ගිවිසුම් කරඬුව ඔවුන් පෙරටුව ගමන් කළේය. ඔවුන් ජෝර්දාන් ගඟ හරහා කානාන් දේශයට යන අතරතුර එය ඔවුන්ට මග පෙන්වීය. සටනේදී දෙවියන්වහන්සේගේ වැඩ සිටීම පෙන්නුම් කරමින් එය ඔවුන්ට පෙරටුව ගමන් කළේය.

දෙවියන්වහන්සේ සිය සෙනඟ මධ්‍යයේ තමන්වහන්සේගේ වැඩ සිටීම සංකේතවත් කරන මෙම ගිවිසුම් කරඬුව නැතිවූ ආකාරය පිළිබඳ කනගාටුදායක කතාව 1 සාමුවෙල් 4 සිට 7 දක්වාවූ පරිච්ඡේදවල ඇත. මෙම පාඩමේ ඉතිරි කොටස කිරීමට පෙර ඔබගේ බයිබලයෙන් මෙම පරිච්ඡේද කියවන්න.

### ෂිලෝ සිට එබෙන්-එසෙර් දක්වා

1 සාමුවෙල් 4 පරිච්ඡේදය ආරම්භ කරන්නේ පිලිස්තිවරුන් සමඟ ඉශ්රායෙල් ජාතිය කරන යුද්ධයෙනි. ඉශ්රායෙල්වරුන් එබෙන්-එසෙර් නම් ස්ථානයේ කඳවුරු බැඳගත් අතර පිලිස්තිවරු අපෙක්හි කඳවුරු බැඳගත්හ. ඉශ්රායෙල්වරු ඔවුන් අතරේ තිබූ, විශේෂයෙන්ම නායකත්වයේ තිබූ පාපය නිසා යුද්ධයෙන් පරාජය වෙමින් සිටියහ (1 සාමුවෙල් 3 පරිච්ඡේදය බලන්න.). යුද්ධයේදී ඔවුන්ගේ මිනිසුන් 4,000ක් මිය ගිය විට "අද අප පරාජය වන්නට දෙවියන්වහන්සේ ඉඩ දුන්නේ මන්ද"යි අසන්නට පටන් ගත්හ.

සැබෑ ගැටලුව එළිදරව් කර ගැනීම සඳහා ඔවුන් ස්වාමීන්වහන්සේ සොයන්නේ නැතුව හා තම හදවත් විමසන්නේ නැතිව, දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සංකේතය වන ගිවිසුම් කරඬුව ගෙනැවිත් එය යුද්ධයට පෙරටුව යැවීමට ඉශ්රායෙල්වරු තීරණය කළහ. මීට පෙර සටන්වලදී, දෙවියන්වහන්සේගේ අණ පරිදි, ඉශ්රායෙල් හමුදාවට පෙරටුව ගිවිසුම් කරඬුව ගෙන යන ලදී. එහෙත් එය දෙවියන්වහන්සේගේ අභිමුඛය සංකේතවත් කිරීමක් පමණි. එහෙත් මෙම සටනේදී ඔවුන්ගේ පාපය නිසා දෙවියන්වහන්සේ සිය සෙනඟ සමඟ වැඩ සිටියේ නැත. එබැවින් උන්වහන්සේගේ අභිමුඛයේ සංකේතය අර්ථ රහිත විය.

කානාන් දේශය අත්පත් කර ගැනීමේ පළමු පියවරට පසු, කරඬුව තැන්පත් කරන ලද්දේ ෂීලෝ නම් ස්ථානයෙහි වේ. ඔවුහු ෂීලෝ නගරයට මිනිසුන් යවා ගිවිසුම් කරඬුව එබෙන්-එසෙර් වෙත ගෙන්වා ගත්හ. ගිවිසුම් කරඬුව කඳවුරට ගෙනෙනු ලැබූ කල මුළු ඉශ්රායෙල් ජනතාව ප්‍රීතියෙන් මොර හඬ නැගූහ, මන්ද පිලිස්තිවරුන් සමඟ කරන සටනින් ඔවුන් දැන් ජයගන්නේ යයි ඔවුන් සහතික කර ගත් බැවිනි.

එහෙත් දෙවියන්වහන්සේගේ සැබෑ අභිමුඛය නොමැතිව, සංකේතය පමනක් අර්ථ විරහිත වේ. සටන නැවත ආරම්භ කළ විට ඉශ්රායෙල් භටයන් 30,000ක් පමණ මරා දමනු ලැබූ අතර ගිවිසුම් කරඬුව පිලිස්තිවරුන් අතට පත්විය. ඒලීගේ පුත්‍රයෝද මැරුම් කෑහ.

පණිවුඩකරුවෙකු මේ පිළිබඳව ඒලීට පැවසූ අතර ඔහු හුනස්සෙන් වැටී බෙල්ල කැඩී මළේය. දරුවෙකු ලබන්නට ආසන්නව සිටි ඔහුගේ ලේලි ප්‍රසව වේදනාව හට ගෙන දරුවා බිහි කළාය. ඇය ඔහුට "ඊකොබොද්" යන නම තැබුවාය. එහි තේරුම "දෙවියන්වහන්සේගේ තේජස පහව ගියේය" යන්න වේ.

> **ඕතොමෝ: දෙවියන්වහන්සේගේ පෙට්ටිය අසුවූ හෙයින් තේජස ඉශ්රායෙල් කෙරෙන් පහව ගියේයයි කීවාය. (1 සාමුවෙල් 4:22)**

දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සංකේතය දැන් සතුරන් අතේ වූ අතර ඉශ්රායෙල්වරු යුද්ධයෙන් පරාජය වූහ. දෙවියන්වහන්සේගේ අභිමුඛය අපට නැතිවූ විට අප කරන්නේද නිෂ්ඵල සටනකි.

අද බොහෝ ස්ථානවල දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සංකේතවලට සභාවන් පුරුදු වී ඇත. අපට කුරුසියේ හා පරෙවියන්ගේ සංකේතද, ශුද්ධ වූ සහභාගිකමේ දීසි, ඉටිපන්දම් ආදියද විශාල දේවස්ථාන ගොඩනැගිලිද ඇත. එපමණක් නොව ගිවිසුම් කරඬුව ඉශ්රායෙල්වරුන්ගේ කඳවුරට ගෙන ආ කල ඔවුන් මොර ගැසූ පරිදි අපද හැඟීම්බරව දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමට හා මොර ගැසීමට ඉඩ තිබේ.

එහෙත් දෙවියන්වහන්සේ සැබවින්ම අප සමඟ වැඩ වසන සේක්ද? නැතහොත් අපි සංකේත හා වත්පිළිවෙත්වලට සීමා වී සිටින්නෙමුද? අප සංකේත, වත්පිළිවෙත් හා සම්ප්‍රදායන්වලට සීමා වූ ඕනෑම අවස්ථාවක දෙවියන්වහන්සේගේ අභිමුඛය නැතිවේ. දෙවියන්වහන්සේගේ තේජස සතුරා පැහැර ගෙන ඇත. දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සැබෑ තත්ත්වය වෙනුවට ඔබ වත්පිළිවෙත්වලට සීමා වී සිටින්නෙහිද?

## එබෙන්-එසෙර් සිට අපෙක් දක්වා

පිලිස්තිවරු දෙවියන්වහන්සේගේ කරඬුව අත්පත් කරගත් පසු ඔවුහු පළමුවෙන්ම එය අපෙක් නම් ස්ථානයකට ගෙන ගියහ. එහි තේරුම "ශක්තිය හා බලකොටුව" වේ. ඉශ්රායෙල්වරුන් කානාන් දේශය අත්පත් කර ගත් විට, ඔවුන්ට කානානිවරුන්ගෙන් ලබා ගත නොහැකිවූ එක් ප්‍රදේශයක් මෙය වේ. 1 සාමුවෙල් 4:1 හා 29:1හි සඳහන් වන්නේ එය, ඉශ්රායෙල්වරුන්ට පහර දීම් දියත් කරන කඳවුරක් වූ බවය.

අපෙක්හිදී පිලිස්තිවරු දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සංකේතය සැබවින්ම අපවිත්‍ර කරමින් හා කොල්ලකමින්, දූෂණය කළහ. ඔබගේ ජීවිතයේ අත්පත් කර නොගත් ඕනෑම ප්‍රදේශයක් සාතන්ගේ ශක්තියක් හා බලකොටුවක් බවට පත්වේ. එය ඔබට විරුද්ධව ප්‍රහාර එල්ල කිරීමට සතුරා විසින් යොදා ගන්නා අතර දෙවියන්වහන්සේගේ තේජස ඔබට නැතිවී යනු ඇත. ඉතා වටිනා දේ සතුරා විසින් ගෙන එය කෙලෙසමින්, කඩ කරමින් හා කොල්ලකමින් දූෂණය කරනු ඇත. වත් පිළිවෙත් (එබෙන්-එසෙර්) සෑමවිටම දූෂණයට (අපෙක්) මඟ පෙන්වයි.

## අපෙක් සිට අෂ්දොද් දක්වා

1 සාමුවෙල් 5 හි බයිබලය වාර්තා කර ඇත්තේ පිලිස්තිවරුන් ජ්‍ළඟට ගිවිසුම් කරඬුව අෂ්දොද් නම් ස්ථානයකට ගෙන ගිය බවය. අෂ්දොද් වනාහි පිලිස්තිවරුන්ගේ ප්‍රධාන නගර පහෙන් එකක් වන අතර දාගොන් නැමැති ජාතික දෙවියාගේ සුප්‍රසිද්ධ දේවාලයක් විය. අෂ්දොද්හි, පිලිස්තිවරු අනෙක් දෙවිවරු සමඟ ගිවිසුම් කරඬුව තැන්පත් කිරීමට උත්සාහ කළහ. එහෙත් ඔවුන්ගේ දෙවිවරුන් මුනින් තලාවී බිම වැටෙන්නට පටන් ගත් අතර අවසානයේ කැලිවලට කැඩී ගියේය.

වත්පිළිවෙත් මඟින් දෙවියන්වහන්සේගේ තේජස නැතිවූ විට හා සතුරා විසින් ඔබව ආත්මිකව දූෂණය කළ විට, ජ්‍ළඟට ඔබ කරන්නේ ඔබ සිටින ස්ථානය යුක්ති සහගත කිරීමට උත්සාහ කිරීම සඳහා සම්මුතියකට පැමිණීමය. ඔබ එසේ කරන්නේ පිලිස්තිවරුන් මෙන් දෙවියන්වහන්සේගේ තේජස ඔබගේ ජීවිතයේ ලෞකික පිළිරූ සමඟ තැබීමට උත්සාහ කිරීමෙනි. මේවා ගලින් හෝ මැටියෙන් හෝ තැනූ ලෞකික පිළිරූ හෝ දේපළ වැනි පිළිරූ හෝ ලෞකික ආකල්ප හා හැසිරීම් විය හැකිය. ඔබ උත්සාහ කරන්නේ දෙවියන්වහන්සේගේ තේජස ඔබගේ ජීවිතය තුළ තබා ගනිමින්ම ලෝකය කොතරම් දුරට අල්ලා ගත හැකිදැයි බැලීම වේ.

එහෙත් අනෙකුත් සියලුම පිළිරූ දෙවියන්වහන්සේගේ තේජස ඉදිරියේ බිම වැටෙනු ඇත. පිලිස්තිවරු දෙවියන්වහන්සේගේ බලය දුටු විට, බියවී ගිවිසුම් කරඬුව ගාත් නගරයට යැවූහ.

## අෂ්දොද් සිට ගාත් දක්වා

“ගාත්” යන්නෙහි තේරුම “මිදිවැල මිරිකන යන්ත්‍රය” වේ. ඔබ සතුරා සමඟ එකඟතාවකට පැමිණ ඔබගේ ජීවිතයේ බලකොටු ගොඩනඟා ගැනීමට ඉඩ දුන් විට (අපෙක් හා අෂ්දොද් යන වචන දෙකේ තේරුම “බලකොටු” වේ.) ඔබ සාතන්ගේ “මිදිවැල මිරිකන යන්ත්‍රයට” අසුවී සිටින බව පෙනෙනු ඇත. ඔහු ඔබගේ ජීවිතයේ සියලු යහපත් දේ ඉවත් වන තුරු ඔබව මිරිකා දමනු ඇත.

ගාත්හිදී පිලිස්තිවරුන් කෙරෙහි දෙවියන්වහන්සේගේ විනිශ්චය ඔවුන්ගේ ශරීරයේ “රහස් පෙදෙස්” (ශරීරයේ රහස් ඉන්ද්‍රියන්) වෙත එවනු ලැබීය. නැතිවූ තේජසේ විපාක විද්‍යාමාන වන්නට පටන්ගත්තේ හා දෙවියන්වහන්සේගේ විනිශ්චය පැමිණුණේ මෙහිදී වේ.

දෙවියන්වහන්සේ ආත්මික වත්පිළිවෙත්වලින් සෑහීමට පත් නොවන සේක. අපගේ ජීවිත හා සභාවන් තුළ උන්වහන්සේගේ අභිමුඛය දූෂණය කිරීමට ඉඩ නොදෙනු ඇත. අප සම්මුතියන්ට පැමිණෙමින් ඒවා යුක්ති සහගත කිරීමේදී උන්වහන්සේගේ විනිශ්චයේ විපාකයන් නොඑවා දිගුකලක් උන්වහන්සේ ඉවසන්නේ නැත.

## ගාත් සිට එක්‍රොන් දක්වා

එක්‍රොන් යන්නෙහි තේරුම මුලිනුපුටා දැමීම වේ. ඉන් අදහස් වන්නේ “මරණයයි”. මේ නගරය වෙත මරණීය විනාශයන් විනිශ්චයන් ලෙස දෙවියන්වහන්සේගෙන් පැමිණියේය. ආත්මික මරණය, දෙවියන්වහන්සේගේ විනිශ්චයේ විපාකවලින් එතරම් ඈත නොවේ. දෙවියන්වහන්සේගේ පණිවුඩයට අපි සවන් නොදෙමු නම්, නමක් ඇතිව ජීවත්ව සිටියත්, සැබවින් මියගිය සාර්දිස් සභාව මෙන් වන්නෙමු. (එළිදරව් 3:1)

## එක්‍රොන් සිට බෙත්-ෂෙමෙෂ් දක්වා

දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව ගමන් කරන දිශාව වෙනස් වූයේ එක්‍රොන්හිදී වන අතර එය නැවතත් යෙරුසලමට ගෙන ඒමේ දිගු හා සෙමෙන් ගමන ආරම්භ කළේය. එහෙත් දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සංකේතය දෙවියන්වහන්සේගේ සෙනඟ වෙත දැන්මම නොඑනු ඇත. එය යෙරුසලමට පැමිණීමට අවුරුදු 20කට වැඩි කලක් ගතවනු ඇත.

එක්‍රොන්හිදී මරණයෙන් මුලිනුපුටා දැමීමෙන් පසු, ගිවිසුම් කරඬුව නැවතත් එය හිමි ස්ථානයට යැවීම වඩාත් යහපත් යැයි පිලිස්තිවරු තීරණය කළහ (1 සාමුවෙල් 6). ඔවුහු ගැලක් සාදා, ගිවිසුම් කරඬුව එහි තබා, එය ඇදගෙන යාමට කිරි එළදෙනුන් දෙදෙනෙක් යොදා ගත්හ. මෙම එළදෙනුන් දෙදෙනාගේ වසුපැටවුන් ගෙදර තබා යන ලදී. උන්ගේ ජන්ම පුරුද්ද වන්නේ පැටවුන් සොයාගෙන යාම වේ. එහෙත් මේ එළදෙන්නු කෙළින්ම ඉශ්‍රායෙලය දෙසට ගියෝය (මෝඩ සත්තු

වුවද දෙවියන්වහන්සේගේ තේජස අයත් වන්නේ දෙවියන්වහන්සේගේ සෙනඟට මිස සතුරන්ට නොවන බව දනිති).

එළදෙනුන්, උන්ගේ වටිනා භාණ්ඩ ද රැගෙන පළමුව පැමිණියේ බෙත්-ෂෙමෙෂ් නමැති නගරයටය. එහි ඉශ්රායෙල්වරු කිපදෙනෙක් අස්වැන්න නෙළමින් සිටියහ. ඔවුන් ගිවිසුම් කරඬුව දුටු විට ප්‍රීති ඝෝෂා නගන්නට වූහ. ඔවුහු ගැල ද එළදෙන්නු ද ගෙන ඒවා සමිඳාණන්වහන්සේට දවන යාගයක් ලෙස ඔප්පු කළහ.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ අභිමුඛය අපට ආශිර්වාද කිරීම පිණිස පමණක් නොඑවන බව පිළිගැනීම බෙත්-ෂෙමෙෂ්හි මනුෂ්‍යයෝ ප්‍රතික්ෂේප කළහ. ශුද්ධවන්තකම දෙවියන්වහන්සේ කරන ඕනෑම දෙයක හදවතෙහි තිබිය යුතුය. මේ මනුෂයයන්ට ඔවුන් අතර දෙවියන්වහන්සේගේ අභිමුඛය අවශ්‍ය විය. එහෙත් ඒ දෙවියන්වහන්සේගේ ක්‍රමයට නොවිය. ඔවුහු ගිවිසුම් කරඬුව ඇර බැලූහ. එය දෙවියන්වහන්සේ තහනම් කර තිබිණි. ඔවුන්ගේ පාපය නිසා 50,000කට අධික පිරිසක් මිය ගියහ (නික්මයාම 19:21).

දෙවියන්වහන්සේගේ අභිමුඛය අප අතර ඇති විට අපි බොහෝ වාරයක් ප්‍රීති වන්නෙමු. අපි එයට "පිබිදීම" යයි පවසමු. එහෙත් අපි ශුද්ධවන්තකමින් යුතුව විසිම ප්‍රතික්ෂේප කරන්නෙමු. අපට දෙවියන්වහන්සේගේ අභිමුඛය අවශ්‍යය. එහෙත් දෙවියන්වහන්සේගේ ආඥාවන් අනුව පැවැත්ම ප්‍රතික්ෂේප කරමු. මේ නිසා, දෙවියන්වහන්සේගේ අභිමුඛය ඉවත් වේ.

## බෙත් ෂෙමෙෂ්හි සිට කිරියත් යෙයාරීම් වෙත

බෙත් ෂෙමෙෂ් හි වැසියෝ දෙවියන්වහන්සේගේ ප්‍රමිතීන්ට අනුකූලව ජිවත් වීම ප්‍රතික්ෂේප කළ බැවින් ගිවිසුම් කරඬුව කිරියත් යෙයාරීම් වෙත යවනු ලැබූ අතර එය විසි වසරක් එහි තිබිණි.

> **තවද පෙට්ටිය කිරියත් යෙයාරීම්හි තැබූ දවස පටන් දීර්ඝ කාලයක් එනම් විසි අවුරුද්දක් ගත විය. මුළු ඉශ්රායෙල් වංශය ස්වාමීන්වහන්සේ සොයා වැලපුණෝය.**
> **(1 සාමුවෙල් 7:2)**

ගිවිසුම් කරඬුව කිරියත් යෙයාරීම් සෙනඟ මධ්‍යයේ තිබුණද ඔවුහු එහි බලය ප්‍රතික්ෂේප කළහ. දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සංකේතය ඔවුන් මධ්‍යයේ විය. එහෙත් ඔවුන්ද මුළු ඉශ්රායෙල් සෙනඟද සමිඳාණන්වහන්සේගේ උපකාරය සොයා "වැලපුණෝය." මින් අදහස් වන්නේ ඔවුන් උන්වහන්සේගේ බලය සඳහා ආගාවෙන්ද උන්වහන්සේගේ අභිමුඛය සඳහා පිපාසයෙන්ද සිටි බවය. දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව සැතපුම් අටක් ඈතින් තිබියදීත් යෙරුසලමට දෙවියන්වහන්සේගේ වැඩ සිටීම නොතිබිණි.

වසර ගණනාවක් ගිවිසුම් කරඬුව කිසිදු හැඟීමක්, ගෞරවයක් හෝ එහි වැදගත්කම ගැන අවබෝධයක් නොමැතිව නගරයෙන්, නගරයට ගෙන යන ලදී. දෙවියන්වහන්සේගේ අති මහත් බලයෙහි විභව්‍යතාව එහි තිබුණද කිසිදු කෙනෙක් එය අවබෝධ කර ගත්තේ නැත. ඒ ගැන සැලකිල්ලක් දැක්වූයේ නැත. ඊට අවධානයක් යොමු කළේ නැත.

මෙය ඔබගේ ආත්මික තත්ත්වය විස්තර කිරීමක්ද? ඔබ ආගමික වත්පිළිවෙත්වලින් බැඳී ඇති බැවින් දෙවියන්වහන්සේගේ වැඩ සිටීම දූෂ්‍ය වී ඇත්ද? ඔබ ඔබගේ ලෞකික තත්ත්වය සාධාරණීකරණය කර තිබේද? දෙවියන්වහන්සේගේ විනිශ්චයේ විපාක ඔබගේ ජිවිතය කෙරෙහි ආත්මික මරණය එනම් ඔබව මුලන් උපුටා දැමීම ඔබට දැනී තිබේද?

ඔබට හොඳ ආරංචියක් ඇත. දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව, උන්වහන්සේගේ තේජස හා අභිමුඛය දැන් ආසන්නය. එතැනට ඇත්තේ කෙටි දුරක් පමණි. දෙවියන්වහන්සේ බලා සිටින්නේ දෙවියන්වහන්සේගේ බලය ප්‍රකෘතිමත් කිරීම සඳහා මඟ පෙන්වීමට උන්වහන්සේගේ වැඩ සිටීම මහත් ආසාවෙන් බලාපොරොත්තු වන කෙනෙකි.

## කිරියත් යෙයාරීම් සිට යෙරුසලම දක්වා

දෙවියන්වහන්සේගේ තේජසේ ගිවිසුම් කරඬුව උන්වහන්සේගේ සෙනඟ වෙතට නැවත ගෙනෙන තුරු නොඉවසිලිවන්තව සිටින උන්වහන්සේගේ හදවතට සමීප කෙනෙක් සමිඳාණන්වහන්සේට හමුවූ දිනයක් පැමිණියේය. ඔහු දාවිත් විය. දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව නැවතත්

දෙවියන්වහන්සේගේ සෙනඟ වෙතට ගෙන ඒමට දාවිත් ආශාවෙන් බලා සිටියේය. ඔහු මෙසේ ඇසීය: "දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව මාළඟට කෙසේ ගෙනෙම්ද?" (1 ලේකම් 13:12)

බොහෝ අය අද ඒ ප්‍රශ්නයම අසති. "අප මෙතරම් බලා සිටින ආත්මයාණන්ගේ අලුත් පෙලඹවීම වන දෙවියන්වහන්සේගේ අභිමුඛයේ ප්‍රකෘතිමත් කිරීමට අප ඇතුළු වන්නේ කෙසේද?". ඔබ මේ පිළිබඳව අපගේ ඊළඟ පාඩම වන "දාවිත්ගේ මණ්ඩපය ප්‍රකෘතිමත් කිරීම" යන්නෙන් වඩාත් ඉගෙන ගන්නවා ඇත. එහෙත් දැන් අපි දෙවියන්වහන්සේගේ සෙනඟගේ නැතිවූ තේජස නැවත පිහිටුවමින් ගිවිසුම් කරඬුව කිරියත් යෙයාරීම් සිට සියොන් දක්වා "දාවිත් ගෙන ආ ආකාරය අධ්‍යයනය කරමු.

පළමුව ඔබගේ බයිබලයේ 1 ලේකම් 13:1-7 කියවන්න. මෙම කොටසේ සඳහන් වන්නේ ගිවිසුම් කරඬුව නැවතත් දෙවියන්වහන්සේගේ සෙනඟ වෙත ගෙන ඒමට දාවිත් දැරූ ප්‍රථම ප්‍රයත්නය වේ. පිලිස්තිවරුන් එය ගැලක තබාගෙන ගෙන ගිය බැවින් ඉශ්‍රායෙල්වරුන්ටද ඒ ආකාරයෙන්ම ගෙන ආ හැකියයි ඔහු සිතුවේය. එළදෙනුන් දෙදෙනෙක් ඇද ගෙන යන කරත්තයක ගිවිසුම් කරඬුව තබන ලදි. එළදෙනුන් දැඟලූ විට මිනිසුන් දෙදෙනෙක් ගිවිසුම් කරඬුව පෙරළේ යයි සිතා එය ඇල්ලීමට අත දිගු කළහ. එවිට ඔවුන් මරණයට පත්විය.

ඇදහිලිවන්තයන් ලෙස අප ගමන් කළ යුතු වන්නේ අත්දැකීමෙන් හෝ ආදර්ශයෙන් හෝ නොව දෙවියන්වහන්සේගේ වචනයට අදාළවය. නොඇදහිලිවතුන්ට වඩා තම සේවකයන්ගෙන් දෙවියන්වහන්සේ උසස් ප්‍රමිතියක් බලාපොරොත්තු වන සේක. විනිශ්චය පැමිණුණේ දෙවියන්වහන්සේ අණ කළ ආකාරයට ගිවිසුම් කරඬුව ගෙන නොගිය නිසා වේ. දාවිත් 1 ලේකම් 15:1-24න් මෙම අත්දැකීම සිහි කරයි. තේජස ගෙන ඒමට ගත් පළමු ප්‍රයත්නය අසාර්ථක වූයේ "නියෝගය ලෙස" එය නොකළ බැවිනි. තේජස නැවත ගෙන ඒමට නම් එය දෙවියන්වහන්සේගේ ක්‍රමය අනුව කළ යුතු වේ.

## නැවතත් ගෙන ඒමේ ක්‍රියාවලිය

ගිවිසුම් කරඬුව ආපසු ගෙන ඒමේ දාවිත්ගේ සාර්ථක ප්‍රයත්නය 1 ලේකම් 13-17න් කියවන්න. දෙවියන්වහන්සේගේ තේජසේ ගිවිසුම් කරඬුව උන්වහන්සේගේ සෙනඟ වෙතට ගෙන ඒම සඳහා දේවල් හතරක් අවශ්‍ය විය. උන්වහන්සේගේ තේජස අද ආපහු ගෙන ඒම අත්දැකීම සඳහාද මේ දේවල් අවශ්‍ය වේ.

**1. ආසාව**

අවුරුදු 20ක පමණ කාලයක් මුළු ඉශ්‍රායෙලයම සමිඳාණන්වහන්සේ සමඟ වඩාත් සමීප සබඳතාවකට ආසා කළහ. ඔවුන්ට උන්වහන්සේගේ තේජස පිළිබඳ ආසාවක් තිබිණි. ආපසු ඒමේ ක්‍රියාවලියේ පළමු පියවර වන්නේ දෙවියන්වහන්සේගේ තේජස පිළිබඳ ආසාව වේ. එහෙත් ආසාව තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඔබට යම් දෙයක් පිළිබඳ තද ආසාවක් තිබිය හැකිය. එහෙත් එය ලබා ගැනීම සඳහා ඔබට තිබිය යුත්තේ ...

**2. අධිෂ්ඨානය**

ගිවිසුම් කරඬුව ආපසු ගෙන ඒමේ අධිෂ්ඨානයක් දාවිත්ට තිබිණි. ඔහු මෙසේ කීය: "අපේ දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව අප වෙත නැවත ගෙනෙමු" (1 ලේකම් 13:3). දෙවියන්වහන්සේගේ තේජස ගැන ඔබට ආසාවක් පමණක් නොව එය ලබා ගන්නා තුරු උත්සාහය නොනවත්වන බවට අධිෂ්ඨානයක්ද තිබිය යුතුය. අසාර්ථක වීමෙන් පසුව වුවද දාවිත් නැවතුණේ නැත. පළමු උත්සාහය අසාර්ථක වූ විට ඔහු නැවතත් උත්සාහ කළේය.

3. **දිශාව**

ගිවිසුම් කරඬුව නැවත ගෙන ඒමට දාවිත් හා ඔහුගේ මනුෂ්‍යයෝ ඒ දෙසට ගමන් කළහ. ආසාව ප්‍රමාණවත් නොවේ. අධිෂ්ඨානය වුවද ප්‍රමාණවත් නැත. තේජස නැවත ලබා ගැනීමට නම් දෙවියන්වහන්සේ අභිමුඛය දෙසට ඔබ ගමන් කළ යුතුය.

ඔබ විරුද්ධ දිශාවට, ලෝකයාගේ දෙසට ගමන් කරන්නෙහි නම් ඔබ තේජස අත් නොදකිනු ඇත. ඔබ දෙවියන්වහන්සේගෙන් ඉවත් වී, ඔබගේ කැඳවීමට අකීකරු වී, පැන යන්නෙහි නම් ඔබ එය අත් නොදකින්නෙහිය. තේජස විද්‍යමාන වීමට නම් දෙවියන්වහන්සේගේ දෙසට යා යුතුය.

**4. නිවැරදි නියෝගය**

ගිවිසුම් කරඬුව ගෙන ඒමේ පළමු වැනි ප්‍රයත්නයේදී හරක් දැඟලූ බැවින්, කරත්තය පෙරළිණි. මනුෂ්‍යයා සෑදූ ගැලකින් දෙවියන්වහන්සේගේ තේජස ගෙන ආ නොහැකි විය. එය දෙවියන්වහන්සේගේ සැලැස්ම අනුව, "නිවැරදි නියෝගය" අනුව ගෙන ආ යුතු විය. මිනිසා සෑදූ "කරත්තවලින්" දෙවියන්වහන්සේගේ තේජස අප මධ්‍යයට ගෙන ඒමට අප උත්සාහ කර ඇත. අපගේ සැලසුම්, වත්පිළිවෙත් අපට ඇති අතර අපි එක්සත්කම හා සහෝදරත්වය ගැන කතා කරන්නෙමු.

පුදුමයකට මෙන් ගිවිසුම් කරඬුව අල්ලන්නට ගොස් මිය ගිය අයගේ නම්වල තේරුම ශක්තිය (උස්සා) හා සහෝදරකම (අහියෝ) වේ. මනුෂ්‍යයන් සෑදූ අපගේ කරත්ත අලංකාරව හා සහෝදරකමින් යුක්ත බව පෙනෙනු ඇත. එහෙත් ඒවා මනුෂ්‍යයන්ගේ ශක්තිය වේ. මනුෂ්‍යයන් සෑදූ කරත්තවල අවසාන ප්‍රතිඵලය වන්නේ පය පැටලීම, ලිස්සා යෑම, තල්ලු වී යෑම හා අවසානයේ මරණය වේ.

අපගේ සැලසුම්, වැඩසටහන් හා ශක්තිය මඟින් සියොන්හි බලය ගෙන ආ නොහැකිය. එය දෙවියන්වහන්සේගේ ක්‍රමය අනුව උන්වහන්සේගේ වචනය පදනම් කරගෙන පැමිණිය යුතුය. දාවිත් පසුව මෙසේ පසුතැවිලි විය. :

> **පළමු වතාවේදී ඒක ගෙනා අය නුඹලා නොවූ බැවින් අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ අපට පහර දුන්සේක. මක්නිසාද, නියෝගය ලෙස අපි උන්වහන්සේ නොසෙවුවෙමු යයි කීවේය. (1 ලේකම් 15:13)**

දෙවියන්වහන්සේගේ "නියෝගය" අනුගමනය කළ විට තේජස නැවත පැමිණියේය. ඔබ මේ නියෝගය පිළිබඳව "දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිස්ථාපනය කිරීම" නමැති ඊළඟ පාඩමෙන් ඉගෙන ගන්නවා ඇත.

## ගින්න, තේජාලංකාරය හා නමස්කාරය

ගින්න හා තේජස යන දෙකම වැදගත් ආත්මික බලවේග සන්නද්ධ කෙරෙන ඒවා වේ. ගින්න නොමැතිව තේජාලංකාරය අඩු වී යනු ඇත. ගින්නත් තේජාලංකාරයත් නොමැතිව සතුරා ඉදිරියේ අප අක්‍රිය වනු ඇත.

ගින්න හා තේජාලංකාරය පිළිබඳ මෙම අධ්‍යයනය ආරම්භයේදී ගින්න හා තේජාලංකාරය යන දෙකම නමස්කාරයට සම්බන්ධ බව ඔබ උගත්තෙහිය (2 ලේකම් 7:1-3). ඊළඟ පාඩම් තුන මේ සන්නද්ධ කෙරෙන බලවේග තුන එකට සම්බන්ධ කරනු ඇත.

ඒ පාඩම් තුන "දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිස්ථාපනය කිරීම", "නමස්කාර කරන්නන් අවශ්‍යය", හා "නමස්කාර කරන්නේ කෙසේද" යන්න වේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. දෙවියන්වහන්සේගේ තේජාලංකාරය උන්වහන්සේගේ සෙනඟගෙන් පිටව යන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

3. ගිවිසුම් කරඬුව පහත දැක්වෙන තැන්වල තැබූ විට සිදුවූ සිදුවීම් හා ඒවායේ ආත්මික වැදගත්කම් සාරාංශ කරන්න.

   එබෙන්-එසෙර්

   අපෙක්

   අෂ්දොද්

   ගාත්

   එක්‍රොන්

බෙත්-ෂෙමෙෂ්

කිරියත් - යෙයාරීම්

යෙරුසලම

4. දෙවියන්වහන්සේගේ තේජාලංකාරය නැවත ගෙන ඒමට අවශ්‍ය කරුණු හතර මොනවාද?

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

### ගිවිසුමේ කරඬුවේ පටවීම හා නැවත ගෙන ඒම

1. ගිවිසුමේ කරඬුවේ ගමන් මාර්ගය ලකුණු කිරීමට පැරණි කාලයේ පලස්තීනයේ සිතියම භාවිත කරන්න.

| | |
|---|---|
| එබෙන්-එසෙර් | වත් පිළිවෙත් |
| අපෙක් | දූෂ්‍ය වීම |
| අෂ්දොද් | සාධාරණීකරණය |
| ගාත් | විපාක |
| එක්‍රොන් | මුලිනුපුටා දැමීම |
| බෙත්-ෂෙමෙෂ් | ප්‍රතික්ෂේප කිරීම |
| කිරියත් යෙයාරීම් | ඉවතලෑම |
| යෙරුසලම | ප්‍රතිස්ථාපනය |

2. මෙම පිහිටීම් පෞද්ගලිකව යොදා ගත හැකිද? මේවා සභාවකට සාමූහිකව යොදා ගත හැකිද?

# අටවන පරිච්ඡේදය

## දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීම

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- “දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීම” යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කිරීමට
- ප්‍රතිසංස්කරණය අනාවැකියෙන් කියා ඇති අවස්ථාවල ශුද්ධ ලියවිලි යොමුවන් සැපයීමට
- එය ප්‍රතිංස්කරණය කරන්නේ කවදාදැයි පැහැදිලි කිරීමට
- එය ප්‍රතිංස්කරණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට
- දාවිත්ගේ මණ්ඩපයේ ප්‍රතිස්ථාපනය ඔබට සම්බන්ධ වන ආකාරය සාරාංශ කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**මෙයින් පසු මම හැරී ඇවිත් දාවිත්ගේ වැටුණාවූ මණ්ඩපය නැවත ගොඩනඟා, එහි නටබුන් තැන් නැවත ගොඩනඟා ඒක පිහිටුවන්නෙමි... (ක්‍රියා 15:17)**

### හැඳින්වීම

ගිවිසුම් කරඬුව හා ඒ හා සමඟම දෙවියන්වහන්සේගේ අභිමුඛය, බලය හා තේජසද ඉශ්‍රායෙල්වරුන්ට නැති වූ අන්දම පසුගිය පාඩමෙන් ඔබ ඉගෙන ගත්තෙහිය. දාවිත් ගිවිසුම් කරඬුව නැවත ඉශ්‍රායෙලයට ගෙන ආ විට තම සෙනඟ මධ්‍යයේ දෙවියන්වහන්සේගේ අභිමුඛය ප්‍රතිස්ථාපනය විය. ප්‍රතිස්ථාපනය කිරීමේ කතාව වැදගත්ය. මන්ද එය වර්තමාන සභාවට අදාළ වන අතර දෙවියන්වහන්සේගේ පොරොන්දුවට සම්බන්ධ වේ. එනම්,

**මෙයින් පසු මම හැරී ඇවිත් දාවිත්ගේ වැටුණාවූ මණ්ඩපය නැවත ගොඩනඟා, එහි නටබුන් තැන් නැවත ගොඩනඟා ඒක පිහිටුවන්නෙමි... (ක්‍රියා 15:17)**

මෙම පාඩම තවදුරටත් අධ්‍යයනය කිරීමට පෙර 1 ලේකම් 13-17 පරිච්ඡේද අධ්‍යයනය කරන්න.

### ප්‍රතිසංස්කරණය කිරීමේ පොරොන්දුව

පහත දැක්වෙන පද අධ්‍යයනය කරන්න.

**ඒදොමෙන් ඉතිරි වූ කොට්ඨාසයද මාගේ නාමය දරන සියලු ජාතීන්ද ඔවුන් විසින් හිමි කරගන්න පිණිස, වැටී තිබෙන දාවිත්ගේ මණ්ඩපය මම ඒ කාලයේදී පිහිටුවා, එහි කපොලු අහුරා, කඩා දමා තිබෙන දේද පිහිටුවා, පුරාණයේ දවස්වල මෙන් ඒක ගොඩ නඟන්නෙමියි මෙය කරන ස්වාමින්වහන්සේ කියන සේක. හී හාන්නා ගොයම් කපන්නාටත්, මුදිකවල මඩින්නා බීජ වපුරාන්නාටත් කිට්ටුවෙන දවස් පැමිණෙන්නේය. කඳු මිහිරි මිදි පැන් වස්වන්නේය. සෑම හෙල් දියවන්නේයයි ස්වාමින්වහන්සේ කියන සේක. (ආමොස් 9:11-13)**

**මෙයින් පසු මම හැරී ඇවිත් දාවිත්ගේ වැටුණාවූ මණ්ඩපය නැවත ගොඩනඟා, එහි නටබුන් තැන් නැවත ගොඩනඟා ඒක පිහිටුවන්නෙමි... (ක්‍රියා 15:17)**

මෙම පදවල සඳහන් අනාවැකි සාරාංශයක් මෙසේය:

- සමිඳාණන්වහන්සේ නැවත වඩින සේක.

- දාවිත්ගේ වැටී ගිය මණ්ඩපය උන්වහන්සේ නැවත සාදන සේක. එහි නටබුන් යළිත් ගොඩනඟනු ඇත.

- මෙය කිරීමේ පරමාර්ථය වන්නේ එවිට ඒදොම් රටේ ඉතිරි අය ඇතැම් විට සමිඳාණන්වහන්සේ සොයන්නට ඉඩ තිබේ. එමෙන්ම විජාතීන් (විජාතීන් යනු ඉශ්රායෙලය හැර අනෙකුත් සියලු ජාතීන්ටද දෙවියන්වහන්සේගේ නාමය ඔවුන් වෙත වනු ඇත.

- මේ දෙවල් කරන්නේ දෙවියන්වහන්සේ වේ.

- එය ලෝකයේ ආරම්භයේ සිට දෙවියන්වහන්සේගේ සැලැස්මේ කොටසකි.

මෙම ශුද්ධ ලියවිලි පාඨවලින් අදහස් වන්නේ කුමක්ද? ප්‍රතිසංස්කරණය යනු කුමක්ද? ප්‍රතිසංස්කරණය කරන්නේ කුමක්ද? මෙම ප්‍රතිසංස්කරණය පැමිණෙන්නේ කෙසේද? කවදාද? අද සභාවට ඉන් අදහස් වන්නේ කුමක්ද? මෙය සන්නද්ධ කිරීමට සම්බන්ධ වන්නේ කෙසේද?

## ප්‍රතිසංස්කරණය යනු කුමක්ද?

"ප්‍රතිසංස්කරණය" යන්නෙන් අදහස් වන්නේ "සම්පූර්ණ කිරීම හෝ ප්‍රාණවත් කිරීම වේ." එය මුලින් තිබූ තත්ත්වයට පැමිණීමේ ක්‍රියාවය.

## ප්‍රතිසංස්කරණය කරන්නේ කුමක්ද?

දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කරනු ලැබේ. මෙහි තේරුම අවබෝධ කර ගැනීමට අපි ගිවිසුම් කරඬුව පිළිබඳ ඉතිහාසයෙන් බිඳක් මතක් කර ගත යුතු වෙමු.

### ගිවිසුම් කරඬුව සෑදීම:

මෝසෙස් සීනයි කන්දේ සිටියදී, ගිවිසුම් කරඬුව සෑදිය යුතු ආකාරය පිළිබඳ උපදෙස් දෙවියන්වහන්සේ විසින් ඔහුට දෙන ලදි (නික්මයාම 26:10-22) බලන්න. ගිවිසුම් කරඬුව ආයත-චතුරස්‍රයක හැඩය ඇති පෙට්ටියකි. එහි දිග අඩි 3½ක් ද පළල අඩි 2½ක් ද උස අඩි 2½ක් ද විය. එම පෙට්ටිය ලීයෙන් සාදා තිබූ අතර ඇතුල් පැත්තත් පිට පැත්තත් රනින් ආලේප කර තිබිණි.

ගිවිසුම් කරඬුවේ සෑම කොටසකටම සංකේතාත්මක අදහසක් තිබිණි. මින් අදහස් වන්නේ සෑම කොටසකින්ම ආත්මික සත්‍යයක් නියෝජනය කෙරූ බවය. මෙහි ලීයෙන් අපට මතක් කෙරෙන්නේ සමිඳාණන්වහන්සේ, තමන්වහන්සේ පිටට මනුෂ්‍ය මාංසය ගත් අතර අපගේ පාප ලී කුරුසය මත දැරූ බවය. රනින් පෙන්වන්නේ උන්වහන්සේගේ දේවත්වය වේ (1 පේතෘස් 2:24). තට්ටු තුනෙන් (රන්, ලී හා රන්) අපට මතක් කෙරෙන්නේ එක් දෙවි කෙනෙක් තැනැන්වහන්සේලා තිදෙනෙකුගෙන් සදාකල්හිම පවතින බවය.

### ගිවිසුම් කරඬුවේ අන්තර්ගතය:

ගිවිසුම් කරඬුව කොටස් තුනකින් යුක්ත වූ අතර ඒවා තුනම ආත්මික සංකේත විය.

- ගල් පුවරු ශුද්ධත්වය, දෙවියන්වහන්සේගේ "මාර්ගය" යේසුස්වහන්සේ බව සංකේතවත් කළේය.
- මන්නා බඳුන, දේව වචනය නියෝජනය කළේය. යේසුස්වහන්සේ "සත්‍යය" හෝ වචනය හෝ වේ.
- ආරොන්ගේ සැරයටිය ආලේප කිරීම හා යේසුස්වහන්සේ "ජීවනය" ලෙස පෙන්නුම් කෙරේ. (යොහන් 14:6)

## ගිවිසුම් කරඬුවේ වැදගත්කම:

පසුගිය පාඩමෙන් ඔබ උගත් පරිදි ගිවිසුම් කරඬුව, දෙවියන්වහන්සේ සමඟ සමීප, ගැඹුරු ආත්මික සබඳතාවක් පවත්වන ස්ථානය විය. එය දෙවියන්වහන්සේ සිය බලය, අභිමුඛය හා තේජස විද්‍යමාන කළ ස්ථානය විය.

## ගිවිසුම් කරඬුව පිහිටි ස්ථානය:

ආරම්භයේදී, ගිවිසුම් කරඬුව තබා තිබුණේ මෝසෙස්ගේ මණ්ඩපයේ වේ. එය සීනයි කන්දේ සිට පොරොන්දු දේශයේ ෂීලෝ දක්වා වූ පාළුකරයේ ගමනේ දෙවියන්වහන්සේගේ වාසස්ථානය විය. ගිවිසුම් කරඬුව තිබුණේ “අති ශුද්ධස්ථානය” නමැති කාමරයේ වූ අතර එය පිට මළුව හා ශුද්ධස්ථානයෙන් වටවී තිබිණි.

මෝසෙස්ගේ මණ්ඩපයේ මේ කොටස් තුන යේසුස්වහන්සේගේ දිවැසිවර, පූජක හා රජු යන තෙවදෑරුම් සේවය සංකේතවත් කරයි. පිට මළුවෙන් පෙන්වන්නේ යේසුස්වහන්සේගේ දිවැසිවර මෙහෙය වේ. පරණ ගිවිසුම් නමස්කාරයේදී පාපය සමග ගනුදෙනු කළේ පිටත මළුවේ විය. අපගේ පව් සෝදන්නට දෙවියන්වහන්සේ විසින් එවන ලද දිවැසිවරයා යේසුස්වහන්සේ වූ සේක.

මනුෂ්‍යයන්ගේ පව් උදෙසා ඉශ්රායෙල්හි උත්තම පූජකයා මැදිහත් කාරකම් කළේ ශුද්ධස්ථානයෙහිදී වේ. මෙය ඇදහිලිවතුන් වෙනුවෙන් සැමදා මැදිහත් වන යේසුස්වහන්සේගේ පූජක සේවය ගැන කතා කරයි. අති ශුද්ධස්ථානය ඝන තිරයකින් වෙන් කෙරිණි. මේ තිරය පිටුපස කෙනෙකු සිටින්නේ රජු ඉදිරියෙහිය. ආත්මිකව කතා කරන විට, අප තිරය පිටුපසට ඇතුල් වූ විට අපි ක්‍රිස්තුස්වහන්සේ රජුන්ගේ රජු ලෙස මුණ ගැසේ.

පාළුකරයේ ගමනින් පසු, ඉශ්රායෙල්වරුන් කානාන් දේශයට පැමිණි විට, ගිවිසුම් කරඬුව ෂීලෝහි පිහිටුවන ලදී. මෙය වසර ගණනාවක් ඉශ්රායෙල්වරුන්ගේ ආගමික ජීවිතයේ ප්‍රධාන රැස්වීම් ස්ථානය විය. (යෝෂුවා 18:1,8-10, 19:51, 21:2, 22:9, 12, 19, විනිශ්චයකාරයෝ 18:31)

ගිවිසුම් කරඬුව ෂීලෝහි සිට ගෙන එන ලදුව සතුරන් සමඟ සටන්වලදී එය නැතිවූ ආකාරය ඔබ පසුගිය පරිච්ඡේදයෙන් උගත්තෙහිය. ශුද්ධ ලියවිල්ලේ එය මෙසේ සඳහන් වේ:

> **මෙසේ උන්වහන්සේ මනුෂ්‍යයන් අතරේ තමන් පිහිටෙවූ කූඩාරම වන ෂීලෝහි මණ්ඩපය අත්හැර දමා ස්වකීය ශක්තිය වහල්කමටත් ස්වකීය මහිමය එදිරිකාරයාගේ අතටත් පාවා දුන් සේක. (ගීතාවලිය 78:60-61)**

ෂීලෝහිදී ගිවිසුම් කරඬුව මෝසෙස්ගේ මණ්ඩපයෙන් පිටතට ගත් පසු නැවත එය එතැනට ගෙනාවේ නැත. එය ප්‍රතිස්ථාපනය කළ විට ප්‍රතිස්ථාපනය කරනු ලැබුවේ දාවිත්ගේ මණ්ඩපයෙහි වේ.

රුධිර පූජාවන් අඛණ්ඩව කළ පූජකවරු ෂීලෝහි සිටියහ. ඔවුහු පිට මළුවේත් ශුද්ධස්ථානයේත් අති ශුද්ධස්ථානයේත් මෝසෙස්ගේ නීතිමය ආඥා පැවැත්වූහ. එහෙත් ෂීලෝහිදී අති ශුද්ධස්ථානය හිස්ව තිබිණි. දෙවියන්වහන්සේගේ වැඩ විසීම එහි නොවීය.

දෙවියන්වහන්සේගේ වැඩ විසීම දාවිත්ගේ මණ්ඩපයෙහි විය. ගායකයෝ හා වාදකයෝ මෙම මණ්ඩපයෙහි නමස්කාරයෙහි හා ප්‍රශංසාවෙහි පූජාවන් ඔප්පු කළහ. එහි පිට මළුවක් හෝ ශුද්ධස්ථානයක් හෝ අතිශුද්ධස්ථානයක් හෝ නොතිබිණි. දෙවියන්වහන්සේ අභිමුඛයට පැමිණීමට සියල්ලන්ටම හැකි විය.

## ආත්මිකව මෙයින් අදහස් වන්නේ කුමක්ද?

දාවිත්ගේ කාලයේ මණ්ඩපය සැබෑ ස්ථානයක් විය. එය දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව තැන්පත් කිරීමට පිළියෙල කළ කූඩාරමකි. එහෙත් ඔබ මෙම පාඩමේ සඳහන් දෙවියන්වහන්සේ දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ පවසන අනාවැකිවල උන්වහන්සේ කතා කරන්නේ ආත්මික අදහසකිනි.

“දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීම” යනු “මාර්ගයද, සත්‍යයද, ජීවනයද” වන යේසුස්වහන්සේට වැඩ වාසය කිරීම උදෙසා ආත්මික මණ්ඩපයක් ප්‍රතිසංස්කරණය කිරීම වේ. පළමු මණ්ඩපයේ මෙන්ම, මෙම ආත්මික මණ්ඩපයෙහිද ක්‍රිස්තුස්වහන්සේගේ තෙආකාර දිවැසිවර, පූජක හා රාජකීය මෙහෙවර අන්තර්ගත වේ. එය දෙවියන්වහන්සේගේ බලයේ, අභිමුඛයේ හා තේජසේ වාසස්ථානයය. දෙවියන්වහන්සේ වැඩ වාසය කරන්නේ ෂීලෝහි පැවති පැරණි විධිමත් චත් පිළිවෙත් සහිත නමස්කාරයේ නොවේ. උන්වහන්සේගේ අලුත් වාසස්ථානය දාවිත්ගේ මණ්ඩපයේ වේ.

## එය ප්‍රතිසංස්කරණය කරන්නේ කවදාද?

දාවිත්ගේ මණ්ඩපය “පෙර තිබුණු තත්ත්වයට” පමුණුවන බව බයිබලයේ සඳහන් වේ. දාවිත්ගේ මණ්ඩපය නැවත ගොඩනඟනු ලබන්නේ “පෙර තිබුණු තත්ත්වයට” සමාන තත්ත්වයක් ඇතිවූ අවස්ථාවක වේ.

ඒ කාලය කුමන ආකාරයෙන් වූයේද? දාවිත් ඔහුගේ මණ්ඩපය ගොඩනැඟුවේ දෙවියන්වහන්සේගේ වැඩ විසීමේ බලය හා තේජාලංකාරය නැතිව තිබූ කාලයකය. නමස්කාරය චාරිත්‍රානුකූලව සිදුවිය. උන්වහන්සේගේ සෙනඟගේ දූෂ්‍ය ආත්මික තත්ත්වය නිසා දෙවියන්වහන්සේ විධිමත් නමස්කාරය පැවති ස්ථානය අත් හැර ගොස් තිබිණි.

> **එසේ වී නුමුත් ඔවුහු මහෝත්තමයාණන්වූ දෙවියන්වහන්සේ පරීක්ෂා කරමින්, උන්වහන්සේට විරුද්ධව කැරළි ගැසුවෝය. උන්වහන්සේගේ ශික්ෂා රක්ෂා නොකළෝය. තමුන්ගේ පියවරුන් මෙන් ඔවුහු ආපසු හැරී ද්‍රෝහි ලෙස ක්‍රියා කළෝය. හොර දුන්නක් මෙන් වැරදී අතට හැරුණෝය. මක්නිසාද ඔවුහු තමුන්ගේ උස් තැන්වලින් උන්වහන්සේ කෝපයට පැමිණෙවුවෝය. තමුන්ගේ කැපූ රූපවලින් උන්වහන්සේගේ ජ්වලිතය ඇවිස්සුවෝය. දෙවියන්වහන්සේ මේ අසා ඉතා උදහස් වූ සේක. ඉශ්රායෙල් ඉතා පිළිකුල් කළ සේක. මෙසේ උන්වහන්සේ මනුෂ්‍යයන් අතරේ තමන් පිහිටෙවූ කූඩාරම වන ෂීලෝහි මණ්ඩපය අත්හැර දමා ස්වකීය ශක්තිය වහල්කමටත් ස්වකීය මහිමය එදිරිකාරයාගේ අතටත් පාවා දුන් සේක. (ගීතාවලිය 78:56-61)**

ශුද්ධ ලියවිල්ලේ විස්තර කර ඇති මේ හා සමාන තත්ත්වයක් ඔබ සභාවේ දැක තිබේද? එසේ නම් දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීමට කාලය පැමිණ තිබේ.

## එය ප්‍රතිසංස්කරණය කරන්නේ කෙසේද?

දෙවියන්වහන්සේගේ වැඩ විසීමේ අපගේ “කරඬුව”, දාවිත්ගේ කාලයේදී කළ ආකාරයටම ප්‍රතිසංස්කරණය කෙරෙනු ඇත.

### නියෝගය ලෙස :

ගිවිසුම් කරඬුව ගෙන ඒමේදී දාවිත්ගේ පළමු ප්‍රයත්නය අසාර්ථක වූයේ එය “නියෝගය” ලෙස නොකළ බැවිනි. දෙවියන්වහන්සේ අණ කර තිබුණේ ලෙවීගේ පුත්‍රයන් (ආත්මික නායකයන්) ගිවිසුම් කරඬුවේ පොලු තමන්ගේ කරපිට තබාගෙන එය ගෙන එන ලෙසය. දාවිත්, පිලිස්තිවරු කළාක් මෙන් ගැලකින් ගිවිසුම් කරඬුව ගෙන ඒමට උත්සාහ කළ අතර දෙවියන්වහන්සේගේ විනිශ්චය ඔවුන් වෙත පැමිණියේය. එහෙත් දාවිත් “නියෝගය ලෙස” ගිවිසුම් කරඬුව ගෙන ගිය විට එය සාර්ථක විය.

### සූදානම් කළ ස්ථානයක් :

දාවිත් දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුවට ස්ථානයක් පිළියෙල කළේය. (1 ලේකම් 15:1,3,12). දෙවියන්වහන්සේගේ වැඩ වාසය කිරීම සඳහා සුවිශේෂී ලෙස සැලසුම් කර සූදානම් කළ ස්ථානයක් තිබිණි.

## අලුත් මණ්ඩපයක් :

දෙවියන්වහන්සේට වැඩ වාසය කිරීම සඳහා දාවිත් මණ්ඩපයක් (කූඩාරමක්) ඇටවූයේය.

> **මම ඉශ්රායෙල් පුත්‍රයන් මිසරයෙන් ගෙනා දවස පටන් අද දක්වා ගෙයක නොවැස කූඩාරමකද, මණ්ඩපයකද හැසුරුණෙමි.** (2 සාමුවෙල් 7:6)

## දෙවියන්වහන්සේගේ සෙනඟ එක්රැස් කිරීම

ගිවිසුම් කරඬුව දාවිත්ගේ මණ්ඩපයට ගෙන ඒමට සූදානම් වන විට දෙවියන්වහන්සේගේ සෙනඟ ද විශාල සංඛ්‍යාවක් එක්රැස් වූහ. මේ එක්සත් කිරීමට හේතු වූයේ සමිඳාණන්වහන්සේගේ ගිවිසුම් කරඬුව ගෙන ඒම හා සාමුවෙල්ගේ කාලයේ සිට සාවුල් රජුගේ කාලය මුළුල්ලේම ආත්මික වැටීමේ කනගාටුදායක වසර ගණනාවකට පසු සැබෑ නමස්කාරය නැවත ස්ථාපනය කිරීම වේ.

### පාරිශුද්ධිකරණය :

දාවිත්ගේ මණ්ඩපය සූදානම් කිරීමේදී පාරිශුද්ධිකරණයද ඇතුළත් විය. දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව ගෙන ඒම පිණිස පවිත්‍ර වන ලෙස දාවිත් ඉශ්රායෙල්හි ආත්මික නායකයන්ට (පූජකවරු හා ලෙවීවරු) අණ කළේය.

"පාරිශුද්ධිකරණය" යන වචනයෙහි තේරුම "තමා වෙන්වී සිටීම, සමිඳාණන්වහන්සේට ශුද්ධවූවක් ලෙස වෙන් කර තැබීම හෝ ශුද්ධ වූ භාවිතය" වේ. ඔවුන්ගේ පාරිශුද්ධිකරණයට රුධිරයෙන් පිරිසිදු වීම, ජලයෙන් ස්නානය කිරීම හා තෙලින් ආලේප කිරීම" අයත් විය.

### සැබෑ නමස්කාරය නැවත පැමිණීම :

දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව ගෙන එන විට ඒ හා සමඟම ඔල්වර හඬත්, හොරණෑ ශබ්දයත්, නළල්වලිනුත්, අත්තල්වලිනුත්, වීණාවලිනුත්, මහා වීණාවලිනුත් ශබ්ද පැවැත්වීමත් නැටීමත් තිබිණි. එය නිශ්ශබ්ද නමස්කාර මෙහෙයක් නොවූ අතර මහත් ප්‍රීතියේත්, විනෝදයේත්, උද්යෝගයේ හා උනන්දුවේත් නමස්කාරයක් විය.

දාවිත් රජතුමා වුවද සමිඳාණන්වහන්සේ ඉදිරියේ සංගීත භාණ්ඩ වාදනය කරමින් සිය මුළු ශක්තිය යොදා නටමින් ප්‍රීති විය. ගායකයෝ හා සංගීතකරුවෝ ගී ගායනා කළෝය. ගිවිසුම් කරඬුව (දෙවියන්වහන්සේගේ වැඩ විසීම) අවධානය ලබා ගැනීමේ කේන්ද්‍රස්ථානය විය. (ගීතාවලිය 87:7 හා ගීතාවලිය 68:25 කියවන්න.)

## මෙය ඔබට සම්බන්ධ වන්නේ කෙසේද?

ගිවිසුම් කරඬුව සෑදීමේදී සවිස්තර සැලසුම් හා ගිවිසුම් කරඬුවේ ගමනේ විස්තර අද අපට ආදර්ශයකි.

> **ඒ සියල්ල ආදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධවුණේය. ඒවා ලියා තිබෙන්නේ කාලවල කෙළවරට පැමිණ සිටින්නාවූ අපට අවවාද පිණිසය.** (1 කොරින්ති 10:11)

අපගේ ආත්මික කරඬුව දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟ අතර වැඩ සිටීම වේ. උන්වහන්සේගේ බලය හා තේජාලංකාරය නැවත පැමිණීම අත්දකින්නට නම් අප ද දාවිත් රජු හා සමාන සූදානමක් කළ යුතුය.

### නියෝගය ලෙස :

විවිධාකාර, "මිනිසා සෑදූ කරත්තවලින්" දෙවියන්වහන්සේගේ අභිමුඛය නැවත ගෙන එන්නට අපි උත්සාහ කර ඇත්තෙමු. අප කිතුනු විනෝදවීම්, නිකායන්, වත්පිළිවෙත්, වැඩසටහන් හා ආගම්

මගින් උත්සාහ කර ඇත්තෙමු. මේ සියල්ල අසාර්ථක වී ඇත. දෙවියන්වහන්සේගේ අභිමුඛයේ කරඬුව අප මධ්‍යයට නැවත ගෙන ඒමට නම් අප එය දෙවියන්වහන්සේගේ උපදෙස්වලට අනුකූලව කළ යුතුය. දාවිත් හා සමාන සූදානමක් අප කළ යුතුය. ඊට මේ දේවල් ඇතුළත් වේ.

## සූදානම් කළ ස්ථානයක් :

දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීමට නම් අප ස්ථානයක් සූදානම් කළ යුතුය. දෙවියන්වහන්සේගේ වැඩ සිටීමේ මේ අලුත් ගමනට අපගේ පෞද්ගලික ජීවිත ද අපගේ සභාවන් ද සූදානම් කළ යුතුය.

"අලුත් මිදි යුස" පැරණි "සම් බඳුන්වලට" වත් කරන්නේ නැත. අපි සම්ප්‍රදායන් හා වත්පිළිවෙත්වලින් ඉවත්ව සිටිය යුතු වන්නෙමු. අපගේ වැඩ සටහන්ද සම්ප්‍රදායන්ද නොයෙකුත් දේ කරන පිළිවෙළ ද පසෙකින් තබා දෙවියන්වහන්සේගේ මෙම නව ගමනට සූදානම් විය යුතුය.

## අලුත් මණ්ඩපයක් :

දෙවියන්වහන්සේ වැඩ වාසය කිරීමට දැන් කැමති තැන හෝ "කූඩාරම" හෝ වන්නේ ඇදහිලිවතුන්ය. 2 පේතෘස් 1:13-14, 2 කොරින්ති 5:1 හා 1 කොරින්ති 6:19 හි ඇදහිලිවතුන් "කූඩාරම" ලෙස හඳුන්වා ඇත.

සභාව ඇදහිලිවතුන්ගෙන් සමන්විත වේ. එය දෙවියන්වහන්සේ වැඩ වසන සමූහ කූඩාරමය.

- "මාගේ සභාව ගොඩනගන්නෙමි"යි ජේසුස්වහන්සේ කී සේක. මතෙව් 16:18
- "ඔබ දෙවියන්වහන්සේගේ ගොඩනැගිල්ල"යයි පාවුලුතුමා කිය. 1 කොරින්ති 3:9
- "ආත්මික ගෘහයක් ගොඩනගන ලෙස ඔබ ජීවමාන ගල් මෙන් වන්න." 1 පේතෘස් 2:5

ඇදහිලිවතුන් පෞද්ගලිකවත් සාමූහිකවත් දෙවියන්වහන්සේගේ සැබෑ මණ්ඩපය වන අතර, යේසුස්වහන්සේ එහි උත්තම පූජකයා වන සේක.

> **ඉතින් අප කියන දේවලින් ප්‍රධාන එක නම් ස්වර්ගවල මහෝත්තමයාණන්ගේ සිංහාසනයේ දකුණු පැත්තේ හිඳගත්තාවූ, මනුෂ්‍යයා විසින් නොව ස්වාමීන්වහන්සේ විසින් පිහිටුවන ලද ශුද්ධස්ථානයේ හා සැබෑවූ මණ්ඩපයේ සේවකයෙක් වූ උත්තම පූජකයෙක් අපට සිටින බවය. (හෙබ්‍රෙව් 8:1-2)**

දෙවියන්වහන්සේගේ මෙම සැබෑ මණ්ඩපය සියලු ඇදහිලිවතුන් වේ. මිනිසාගේ "ගොඩනැඟිල්ලක", එය සැබෑ දේව මාළිගාවක් වුවද නිකායක් හෝ සංවිධානයක් හෝ වුවද දෙවියන්වහන්සේ ඒ තුළ සිර කර තැබිය නොහැකිය.

## දෙවියන්වහන්සේගේ සෙනඟ එක්රැස් කිරීම :

දෙවියන්වහන්සේගේ වැඩ සිටීමේ අපගේ ආත්මික "ගිවිසුම් කරඬුව" ප්‍රතිසංස්කරණය කිරීම සභාව දැකීමට කැමති නම්, අප එක්සත්ව රැස්විය යුතුය. නායකයන් එක්සත්ව රැස්විය යුතුය (නික්මයාම 4:29). සෙනඟ එක්රැස් විය යුතුය (ක්‍රියා 14:27). ඇදහිලිවතුන් එක්සත්ව එකට රැස්වන විට, සමිඳාණන්වහන්සේ සිය ආශිර්වාද ලබා දෙන ස්ථානය එතැන වේ. අප එක සිතක් ඇතිව, එකම පරමාර්ථයක් ඇතිව, එක් සෙනඟක් විය යුතුය (ගීතාවලිය 133, ක්‍රියා 2:1-4).

## පාරිශුද්ධිකරණය :

දාවිත්ගේ මණ්ඩපය සූදානම් කරන විට පාරිශුද්ධිකරණය අවශ්‍ය වූවා සේම, මණ්ඩපයේ ආත්මික ප්‍රතිසංස්කරණයේදී ද එය අවශ්‍ය වේ. දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව ගෙන ඒම පිණිස ආත්මික නායකයන් පාරිශුද්ධිකරණය විය යුතුය. අප සේවයේ සදාචාරාත්මක හා ආත්මික අවංකභාවයකට නැවත පැමිණිය යුතු අතර මූල්‍යමය ගණන් දීමක් ද තිබිය යුතුය.

දෙවියන්වහන්සේගේ අභිමුඛයේ කරඬුව ලබා ගැනීමට සෙනඟ පාරිශුද්ධිකරණය විය යුතුය. අපගේ සභාවන් තුළ පාපය බහුල ලෙස දිවීම අපට තවදුරටත් ඉවසිය නොහැකිය. අපගේ "කන් කිති කවන", අපට විනෝදය ගෙන දෙන හා ලස්සන කතන්දර මගින් අපව හිනස්වන දේශනාවලට සවන් දෙමින් සිටීම තවදුරටත් අපට නොකළ හැකිය.

පැරණි ගිවිසුමේ පාරිශුද්ධිකරණයට රුධිරයෙන් පවිත්‍ර වීම ජලයෙන් නෑම හා ශුද්ධ තෙලින් ආලේපණය ඇතුලත් වන්නා සේම අපගේ පාරිශුද්ධිකරණය සඳහා යේසුස්වහන්සේගේ රුධිරය (හෙබ්‍රෙව් 13:12) දේව වචනයේ ජලය (යොහන් 17:17) හා ශුද්ධාත්මයාණන්ගේ ආලේපය (1 ජේතෘස් 1:2) ඇතුලත් වේ.

අපි යේසුස්වහන්සේගේ රුධිරයෙන් පවිත්‍ර විය යුතුය. අප සැබෑ ඉගැන්වීම, දේශනා කිරීම හා දේව වචනයට ප්‍රතිචාර දැක්වීම වෙත නැවත යා යුතුය. ශුද්ධාත්මයාණන්ගෙන් ආලේප කිරීම මගින් සෙනඟ හා නායකයන් බලගතු කළ යුතු අතර එය අප මධ්‍යයේ ගලා යමින් එහි දිව්‍යත්වය තුළින් අප කරන වැඩ ස්පර්ශ කළ යුතුය.

## සැබෑ නමස්කාරය වෙත නැවත පැමිණීම

අප සැබෑ නමස්කාරය වෙත නැවත පැමිණි විට දෙවියන්වහන්සේගේ අභිමුඛය වන කරඬුව අප මධ්‍යයට නැවත පැමිණෙනු ඇත. මෙය චාරිත්‍රානුකූල හෝ ඇදහිලි ප්‍රකාශ මගින් හෝ කරන නමස්කාරය නොවේ. එය දාවිත්ගේ මණ්ඩපයේ හා ගිවිසුම් කරඬුව ජෙරුසලමට ගෙන ආ විට සිදු වූ ආකාරයේ නමස්කාරයකි. එය ගී ගයමින්, සංගීත භාණ්ඩ වාදනය කරමින්, කෑ ගසමින්, නටමින්, මහත් ප්‍රීතියෙන්, සතුටින් හා උද්වේගයෙන් යුතුව කරන නමස්කාරයකි.

දාවිත්ගේ කාලයේ ගිවිසුම් කරඬුව අවධානයේ කේන්ද්‍රස්ථානය වූවාක් මෙන් අපගේ වැඩ සටහන්, චාරිත්‍ර හා සම්ප්‍රදායන් නොව දෙවියන්වහන්සේගේ අභිමුඛය කේන්ද්‍රස්ථානය වූ විට දාවිත්ගේ මණ්ඩපය ප්‍රකෘතිමත් කෙරෙනු ඇත. ඔබ සැබෑ නමස්කාරය පිළිබඳව "නමස්කාරය කරන්නන් අවශ්‍යය" යන ඊළඟ පාඩමෙන් හා "නමස්කාරය කරන්නේ කෙසේද?" යන දහවන පරිච්ජේදයෙන් ඉගෙන ගන්නවා ඇත.

## ප්‍රතිසංස්කරණය හා සන්නද්ධ කිරීම

සමිඳාණන්වහන්සේ, දාවිත්ගේ මණ්ඩපය, දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ගේ වාසස්ථානය, ප්‍රතිසංස්කරණය කරන බවට පොරොන්දු වූ සේක. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණෙන අවසාන කාලයේ ආත්ම නෙළා ගැනීම සිදුවන්නේ, එක්සත්කම, පාරිශුද්ධිකරණය හා සැබෑ ප්‍රශංසාව හා නමස්කාරය මගින් ගෙන එන මෙම ප්‍රතිසංස්කරණය මඟිනි.

> **ඒදොමෙන් ඉතිරි වූ කොට්ඨාසයද මාගේ නාමය දරන සියලු ජාතීන්ද ඔවුන් විසින් හිමි කරගන්න පිණිස, වැටී තිබෙන දාවිත්ගේ මණ්ඩපය මම ඒ කාලයේදී පිහිටුවා, එහි කපොලු අහුරා, කඩා දමා තිබෙන දේද පිහිටුවා, පුරාණයේ දවස්වල මෙන් ඒක ගොඩ නඟන්නෙමියි මෙය කරන ස්වාමීන්වහන්සේ කියන සේක. හී හාන්නා ගොයම් කපන්නාටත්, මුදිකවල මඩින්නා බීජ වපුරාන්නාටත් කිට්ටුවෙන දවස් පැමිණෙන්නේය. කඳු මිහිරි මිදී පැන් වස්වන්නේය. සෑම හෙල් දියවන්නේයයි ස්වාමීන්වහන්සේ කියන සේක. (ආමොස් 9:11-13)**

දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කළ විට බහුල අස්වැන්නක් ලැබෙනු ඇත. සත්තකින්ම එකකට පසු එකක් බැගින් අස්වැන්න නොනැවති ලැබෙන්නේය. සමිඳාණන්වහන්සේ නොදන්නා මනුෂ්‍යයන් හා ජාතීන් (ආමොස්ගේ දිවැසි වැකියේ "ඒදොම්" හා "විජාතීන්" යන්නෙන් නියෝජනය කෙරෙන්නන්) සමිඳාණන්වහන්සේ වෙතට පැමිණීම ආරම්භ කරනු ඇත.

එය දෙවියන්වහන්සේ විසින් කරනු ලබන කෙතරම් මහත් ප්‍රගමනයක් ද යත් ලෝකයේ ආත්මික කෙත්වතුවල අස්වැන්න නෙළා ගන්නා අයට එය මහත් අසීරු කාර්යයක් වනු ඇත. අපගේ සියලුම ආත්මික සම්පත් දැන් සන්නද්ධ කළ යුත්තේ එබැවිනි. අප සූදානම්ව සිටිය යුතුය.

## දෙවියන්වහන්සේ වැඩ වාසය කළ මණ්ඩප තුන

දෙවියන්වහන්සේගේ ගිවිසුම් කරඬුව පළමුව තැන්පත් කර තිබුණේ මෝසෙස්ගේ මණ්ඩපයේ වේ. මෙය ව්‍යවස්ථාවේ සංකේතයක් වූ අතර ඒ හා සමඟ වූයේ විධිමත්, ක්‍රමානුකූල නමස්කාරයකි. දෙවියන්වහන්සේ මේ මණ්ඩපය අත්හැර ගිය පසු හා ගිවිසුම් කරඬුව නැතිවූ විට, එය අලුත් වාසස්ථානයක ප්‍රතිස්ථාපනය කෙරිණි. එය දාවිත්ගේ මණ්ඩපය විය. මෙය දෙවියන්වහන්සේගේ වැඩ විසීම පිණිස තැනක් පිළියෙල කිරීම සඳහා නිසි නියෝග අනුගමනය කරන, තමන්ම පවිත්‍ර වෙමින් එක්සත් වෙමින් එක්රැස්වන, දෙවියන්වහන්සේගේ වැඩ විසීම තම ප්‍රධාන අවධානය කරගන්නා සැබෑ සභාව වේ. එය දෙවියන්වහන්සේගේ බලය මහත් උද්‍යෝගයෙන් ද ප්‍රීතියෙන් යුතුව ආත්මයෙන් හා සැබෑකමින් නමස්කාර කරමින් ද අලුත් ආකාරයකින් ප්‍රදර්ශනය කරන දෙවියන්වහන්සේගේ සෙනඟ විසින් නියෝජනය කරනු ඇත.

ෂීලෝහි නමස්කාරය නොනවත්වා කර ගෙන ගිය බොහෝ ඉශ්‍රායෙල්වරුන් මෙන්, ඔබට අවශ්‍ය නම් පැරණි විධිමත් නමස්කාරයේ දිගටම යෙදෙන්නට පුළුවන. එහෙත් දෙවියන්වහන්සේ වැඩ සිටියේ ගිවිසුම් කරඬුව තිබූ ජෙරුසලමේ සීනයි කන්දේ වේ. දෙවියන්වහන්සේගේ ආත්මය යම් අලුත් දෙයක් සීනයි කන්දේ කරන විට ඔබ ෂීලෝහි නැවති සිටීම නොකරන්න.

සියොන්හි සියල්ල ජෙරුසලමේ තිබුණ ද ජෙරුසලමේ සියල්ල සියොන්හි නොතිබීම සැලකිය යුතු කරුණකි. සියොන් නගරයක් තුළ වූ නගරයකි. සියොන් යන නාමය දෙවියන්වහන්සේගේ සෙනඟට දුන් නාමයකි (යෙසායා 51:16). දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සභාව තුළින් සභාවකට දෙවියන්වහන්සේ කැඳවන සේක. මෙය මනුෂ්‍යයා විසින් කරන බෙදීමක් හෝ මාංසමය ලෙස සභාවන් බිඳීමක් හෝ නොවේ. සියොන්හි නමස්කාර කරන අය තවමත් ජෙරුසලමේ කොටසක් වනු ඇත. එහෙත් ඔවුහු දෙවියන්වහන්සේගේ ආත්මයේ ගැලීමේ අලුත් ස්ථානයක සිටින්නහුය.

ගිවිසුම් කරඬුව තබා තිබූ තවත් එක් පැරණි ගිවිසුම් මණ්ඩපයක් තිබුණි. පසු කලෙක දාවිත්ගේ පුත්‍රවූ සලමොන් ගිවිසුම් කරඬුව සඳහා අලංකාර මාළිගාවක් තැනුවේය. මෙය දෙවියන්වහන්සේගේ වැඩ සිටීම සංකේතවත් කරන අවසාන නවාතැන විය. ගිවිසුම් කරඬුව ගෙන ගිය පොලු අවසානයේදී ඉවත් කෙරිණි.

දෙවියන්වහන්සේගේ වැඩ විසීමේ ගිවිසුම් කරඬුව තවත් නොසෙල්වනු ඇත.

සලමොන්ගේ මණ්ඩපයෙන් පෙන්වන්නේ අනාගතයේදී දෙවියන්වහන්සේගේ වැඩ විසීම සදහටම අප මධ්‍යයේ වීමය. ගිවිසුම් කරඬුව ගෙන ගිය පොලු ඉවත් කළේ එබැවිනි.

එය ප්‍රේරිත වූ යොහන් තුමා විස්තර කරන අලුත් අහසක් අලුත් පොළොවක් ගැන කතා කරයි.

> **මම එහි දේව මාළිගාවක් නුදුටිමි. මක්නිසාද සර්ව පරාක්‍රම වූ ස්වාමිවූ දෙවියන්වහන්සේද බැටළුපැටවාණෝද එහි මාළිගාවය. (එළිදරව් 21:22)**
>
> **තවද: මෙන්න දෙවියන්වහන්සේගේ මණ්ඩපය මනුෂ්‍යයන් සමඟය, උන්වහන්සේ ඔවුන් සමඟ වාසය කරන සේක, ඔවුහු උන්වහන්සේගේ සෙනඟ වන්නෝය, දෙවියන්වහන්සේම ඔවුන් සමඟ සිට ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන සේක. (එළිදරව් 21:3)**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීම" යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පහදන්න.

3. දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව කී අනාවැකි සඳහා ශුද්ධ ලියවිලි යොමුවන් සපයන්න.

4. දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කරනු ලබන්නේ කවදාද?

5. එය ප්‍රතිසංස්කරණය කරන්නේ කෙසේද?

6. දාවිත්ගේ මණ්ඩපයේ ප්‍රතිසංස්කරණය ඔබට අදාළ වන්නේ කෙසේද?

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

1. පහත දැක්වෙන සටහනින් මෝසෙස්ගේ මණ්ඩපයේ හා දාවිත්ගේ මණ්ඩපයේ කළ නමස්කාරයක් සසඳා ඇත.

| මෝසෙස්ගේ මණ්ඩපය | දාවිත්ගේ මණ්ඩපය |
|---|---|
| තිරයක් ඇත. දෙවියන්වහන්සේ වැඩ සිටි අති ශුද්ධස්ථානයට පිවිසිය නොහැකිය. | තිරයක් නැත. දෙවියන්වහන්සේ වැඩ සිටින කරඬුව වෙත පිවිසිය හැකිය. |
| සත්ත්වයන් පූජා කිරීම | ප්‍රශංසාවේ හා නමස්කාරයේ පූජාවන් ඇත. |
| මෝසෙස්ගේ පැරණි සේවය හා ක්‍රමය | දාවිත්ගේ අලුත් සේවය හා ක්‍රමය. |
| දෙවියන්වහන්සේගේ කරඬුවක් නොමැත. | දෙවියන්වහන්සේගේ කරඬුව ඇත. |

දාවිත්ගේ මණ්ඩපය

2. දාවිත්ගේ කූඩාරම අටවා තිබුණේ ජෙරුසලම් නගරයේ සියොන් නමැති කන්දෙහිය. මෙම පාඩමේ අවසාන කොටසේ අප දුටුවේ ජෙරුසලමේ සියොන් කන්ද තිබුණේ දෙවියන්වහන්සේගේ වැඩ විසීම තිබූ තැන වන අතර සියොන්හි සියල්ල ජෙරුසලමේ තිබුණ ද ජෙරුසලමේ සියල්ල සියොන්හි නොතිබූ බවය. "නගරයක් තුළ නගරයක්" ලෙස සියොන් මගින් පෙන්වන්නේ දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිස්ථාපනය කරන "සභාවක් තුළ සභාවකි."

බයිබලයේ භූමික සියොන් නගරයක් ගැන සඳහන් වේ. එය දාවිත්ගේ මණ්ඩපය පිහිටි ජෙරුසලමේ සැබවින්ම ඇති භෞතික පෙදෙසකි. බයිබලය ස්වර්ගික සියොන් ගැනද කතා කරයි. භූමික සියොන් එහි සංකේතයකි (2 කොරින්ති 4:18, හෙබ්‍රෙව් 12:22, එළිදරව් 14:1). ආත්මික සියොන් ද ඇත. මිනිසුන් නැවත උත්පාදනය ලැබූ විට ඔවුහු "සියොන්හි දරුවෝ" බවට පත්වෙති. එය ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නමැති අත්තිවාරම් ගල මත ගොඩනැගූ ආත්මික නගරයකි.

එබැවින් ශුද්ධ ලියවිල්ලේ සියොන්හි වැදගත්කම පිළිබඳව පැති තුනක් ඇත. මෙය සිත්හි තබාගෙන සියොන් කන්ද ආත්මිකව යොදා ගත හැකි කරුණු කිහිපයක් බලමු.

සියොන්

- දෙවියන්වහන්සේ වාසය කරන තැන වේ. ගීතාවලිය 9:11, 74:2, 79:1-2, යෝවෙල් 3:16,21 යෙසායා 8:18
- ඉශ්‍රායෙල්වරුන් ගැළවීම ලබන තැන වේ. ගීතාවලිය 53:6, 69:35, යෙසායා 59:20, සෙකරියා 9:9, යෙසායා 46:13, 62:11
- සමිඳාණන්වහන්සේ රජකම් කරන ස්ථානය වේ. ගීතාවලිය 146:10, යෙසායා 60:14
- පව්කාරයන් හා අභක්තිකයන් ගැන කටයුතු කරන ස්ථානය වේ. යෙසායා 33:14-15, 33:5, 31:9, 1:27, ආමොස් 6:1
- අත්තිවාරම් ගල (යේසුස්වහන්සේ) තබන තැන වේ. යෙසායා 28:16, 1 පේතෘස් 2:6-8, මතෙව් 21:42, ක්‍රියා 4:11
- දෙවියන්වහන්සේට විශ්වාසවූ ඇදහිලිවතුන් කණ්ඩායමක් සිටින තැන වේ. යෙසායා 37:31, යෙරෙමියා 3:14, මීකා 4:7, 2 රාජාවලිය 19:31
- දෙවියන්වහන්සේගේ තේජාලංකාරය පැමිණෙන ස්ථානය වේ. යෙසායා 4:5-6, ගීතාවලිය 102:13,16,
- මිදීම ලබන තැනක් වේ. යෝවෙල් 2:32, ක්‍රියා 2:21
- මුළු ලෝකයම සතුටින් පිනා යන ස්ථානයකි. ගීතාවලිය 48:2, 11
- දෙවියන්වහන්සේගේ අලංකාරයෙන් වැජඹෙන ස්ථානය. ගීතාවලිය 50:2
- සමිඳාණන්වහන්සේට පැසසුම් කරන ස්ථානයකි. ගීතාවලිය 65:1
- දෙවියන්වහන්සේගේ සෙනඟට ශක්තිය දෙන ස්ථානයකි. ගීතාවලිය 20:2-3, 84:4-7
- දෙවියන්වහන්සේ විසින් තෝරා ගත් ස්ථානයකි. යෙසායා 14:32
- දෙවියන්වහන්සේ අන් කිසි තැනකට වඩා ප්‍රේම කරන ස්ථානය වේ. ගීතාවලිය 87:1-3
- සෙනඟ උපදින හා වාසය කරන තැන වේ. ගීතාවලිය 87:5-6, යෙසායා 66:8
- සමිඳාණන්වහන්සේගේ නාමය ප්‍රකාශ කරන තැන වේ. ගීතාවලිය 102:21
- ආශිර්වාදලත් තැනකි. ගීතාවලිය 128:5, 135:21, 134:3

- දෙවියන්වහන්සේ සදාකල්හිම වැඩවාසය කරන තැන වේ. ගීතාවලිය 132:13-14
- දේව වචනය උගන්වන තැන වේ. යෙසායා 2:1-5, මීකා 4:1-2
- මොර ගසා ගී ගයන, සැප පහසුවෙන් සිටින තැනකි. යෙසායා 12:6
- දෙවියන්වහන්සේගේ සෙනඟට නාමයකි. යෙසායා 51:16
- සුබ ආරංචි පතුරුවන තැනකි. යෙසායා 40:9, 42:1,2,7,8, 41:27, මීකා 4:13

# නවවන පරිච්ඡේදය

## නමස්කාරකරන්නන් අවශ්‍යව ඇත

### අරමුණ:

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- නමස්කාරය යන්න නිර්වචනය කිරීමට
- ආත්මයෙන් නමස්කාර කිරීම යන්න පැහැදිලි කිරීමට
- සැබෑකමෙන් නමස්කාර කිරීම යන්න පැහැදිලි කිරීමට
- අප නමස්කාර කිරීමට හේතු තුනක් සාරාංශ කිරීමට
- නමස්කාර කිරීමේ රටාව පැහැදිලි කිරීමට
- නමස්කාර කිරීමේ ප්‍රතිඵල පහක් ලැයිස්තු ගත කිරීමට
- නමස්කාර කරන ක්‍රම පහක් හඳුනා ගැනීමට
- නමස්කාර කිරීමට සූදානම් වන ආකාරය පැහැදිලි කිරීම සඳහා ශුද්ධලියවිලි යොමුවක් දීමට
- අප නමස්කාර කළ යුතු වේලාව පැහැදිලි කිරීමට
- අප නමස්කාර කළ යුතු ස්ථානය පැහැදිලි කිරීමට

### ප්‍රධාන පද:

**නුමුත් සැබෑ නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද පියාණන්වහන්සේට නමස්කාර කරන කාලය පැමිණෙන්නේය. දැනටම පැමිණ තිබේ. මක්නිසාද පියාණන්වහන්සේ තමන්ට නමස්කාරකරන්නන් වන පිණිස එබඳුවුවන් සොයන සේක. දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කරළ යුතුයැයි කීසේක. (යොහන් 4:23-24)**

## හැඳින්වීම

අපව සන්නද්ධ කිරීමේ දෙවියන්වහන්සේගේ අභිමුඛය නැවත ඇති කළ හැක්කේ නමස්කාරය තුළින් වේ. දෙවියන්වහන්සේට නමස්කාර කරන්නන් අවශ්‍යය. ඔබ මෙම පරිච්ඡේදයෙන් නමස්කාරය පිළිබඳව අධ්‍යයනය කරන අතර, නමස්කාරයේ නිර්වචනය ඉගෙනීම හා ඒ හා සම්බන්ධ වචන තවදුරටත් ඉගෙන ගන්නවා ඇත. ආත්මයෙන් හා සැබෑකමෙන් නමස්කාර කිරීම යන්නෙන් අදහස් වන්නේ කුමක්ද යන්න හා නමස්කාර කළ යුත්තේ මන්ද, කොතැනද හා කිනම් වේලාවකද යන්නත් ඔබ ඉගෙන ගන්නෙහිය. එමෙන්ම නමස්කාර රටාවන් නමස්කාරයට සූදානම් වන්නේ කෙසේද හා නමස්කාර කිරීමේ ක්‍රම හා එහි ප්‍රතිඵලද ඉගෙන ගන්නෙහිය. ඊළඟ පාඩමෙන් ඔබ ඉගෙන ගන්නේ ඔබ ආත්මයෙන් හා සැබෑකමෙන් නමස්කාර කරන විට දෙවියන්වහන්සේට නමස්කාර කරන්නේ කෙසේද යන්න වේ.

## නිර්වචන

නමස්කාර කිරීමෙන් අදහස්වන්නේ ගෞරව කිරීම, සිඹීම, ප්‍රාණාමය දැක්වීම, සම්මානය පිදීම ගරුබිය ඇතිව සිටීම, භක්තිය පෙන්වීම, වැඳ වැටීම හා බුහුමන් දැක්වීම වේ. නමස්කාරය යනු දෙවියන්වහන්සේ පිළිගැනීම හා උන්වහන්සේගේ ස්වභාවය, ගුණාංග, මාර්ග හා උන්වහන්සේගේ ඉල්ලීම් පිළිගෙන උන්වහන්සේට ප්‍රශංසා කිරීමෙන් හෝ කිතුනු සේවය තුළින් යහපත් ක්‍රියාවක් කිරීම හෝ වේ. "සේවය කිරීමම යන්න නමස්කාර කිරීම යන අදහස දේ. නමස්කාරය යනු යම් කෙනෙකුට වටිනාකමක් දීමය. එය දෙවියන්වහන්සේට කෙරෙන ක්‍රියාකාරී ප්‍රතිචාරයකි. ඉන් අපි උන්වහන්සේගේ වටිනාකම ප්‍රකාශ කරන අතර උන්වහන්සේ උත්සවාකාරයෙන් සමරන්නෙමු. එමෙන්ම උන්වහන්සේගේ නාමය ගැන ආඩම්බර වෙමු.

නමස්කාරය කලාවක් නොවේ. මන්ද දෙවියන්වහන්සේ තම තේජාලංකාරය කලාවක් සමග බෙදා නොගන්න සේක. එය ජන වන්දනාවක්, ඇදහිලි ප්‍රකාශයක්, නිරර්ථක පුනරුක්තියක් හෝ සතියක් පාසා සතියක් දේව මෙහෙයේ අනුපිළිවෙළ පිටපත් කිරීමක් නොවේ. නමස්කාරය යනු දේශනාවකදී සිත් වෙනතකට යොමු කිරීම දරා ගැනීමක්, කොඳුරමින් යාච්ඤා කිරීමක් හෝ ගීතිකාවන් කිසිදු හැඟීමක් හෝ හදවතට දැනීමක් හෝ නැතිව ගායනා කිරීමක් නොවේ. නමස්කාර කිරීමේදී යම් ආකාරයක බයිබලිය ක්‍රමයකට ඔබගේ හදවතට දැනෙන දේ ප්‍රකාශ කරන්නෙහිය. නමස්කාරය චිත්ත ස්වාභාවයක් නොවේ. එය ප්‍රතිචාරයකි. එය හැඟීමක් පමණක්ම නොවේ. ප්‍රකාශ කිරීමක්ද වේ. එය අක්‍රිය නැත. එහෙත් සහභාගිත්වය ඇත.

**නමස්කාරය යනු :**

පුද්ගලයෙකු සමග ඇති සම්බන්ධතාවය නිසා...
ඇතුළාන්තයෙන් පිටාර ගලන්නාවූ
කැපවීමෙන් හා භක්තියෙන් යුතු ප්‍රකාශ කිරීමකි.

ශුද්ධ ලියවිල්ලේ සඳහන් නමස්කාරය හා සම්බන්ධ වචන කිපයක් පහත දැක්වේ.

**තුති දීම:-** තුති දීම යනු පිළිගැනීම, කෘතඥතාව ප්‍රකාශ කිරීම, සැමරීම, හා පාපෝච්චාරණය වේ.

**ප්‍රශංසාව:-** ප්‍රශංසාව යනු වර්ණනා කිරීමකි. ප්‍රශංසාව සිදුවන බොහෝ ක්‍රම බයිබලය විස්තර කරයි. ඉන් එකක් වන්නේ තත් සංගීත භාණ්ඩයක මෙන් බැඳී කත ඇද අත්හැරීම හෝ හදිසියෙන් ඇදීමක් හෝ වේ. නමස්කාරයට, ගීතාවලියේ ගීතිකා ගැයීම, ප්‍රශංසා කිරීම පසුතැවිලිවීම, ආශිර්වාද කිරීම, සැමරීම හා ආඩම්බරවීම, මොර ගැසීම, ප්‍රීති ප්‍රමෝද වීම ඇතුළත් වේ. "ප්‍රශංසාවම යන්නට විවිධ තේරුම් අටක් ඇත. ඉන් දෙකක් සිත්ගන්නා සුලුය. ඒවා නම් "දෙවියන්වහන්සේ ඉදිරියේ නිදහස් වන්නම හා "කෑ මොර ගසමින් මෝඩ වන්නම වේ.

**මහිමවත් කිරීම:-** තත්වයට, අලංකාරයට ගරු කිරීම

**ගරුකිරීම:-** උසස්කිරීම, කැමැත්තක් පෙන්වීම.

**උසස්කිරීම:-** ශ්‍රේෂ්ඨත්වය පැවරීම, මහිමවත් කිරීම.

## ස්තුතිදීම, ප්‍රශංසාව හා නමස්කාරය අතර සබඳතාව

ස්තුතිදීම, ප්‍රශංසාව හා නමස්කාරය වෙන් කෙරෙන නිශ්චිත බෙදීමක් නැත. ඔබ නමස්කාර කරනවිට පහසුවෙන්ම ගීතාවලිය පොතෙන් පෙන්වා ඇති ආකාරයට, එකකින් අනෙක් එකට ගලා යා හැකිය. කෙසේ වුවද මේ තුන අතර පාරිභාෂිකව වෙනසක් ඇත.

**ස්තුති දීම:-** දෙවියන්වහන්සේ කර ඇති දේ කෙරෙහි අවධානය යොමු කරයි. "උන්වහන්සේගේ වරප්‍රසාද අමතක නොකරන (ඔබ වෙනුවෙන් උන්වහන්සේ කර ඇති දේ) ලෙස බයිබලයේ සඳහන් වේ.

**ප්‍රශංසාව:-** දෙවියන්වහන්සේ ද උන්වහන්සේ කවුරුන්ද යන්න හා උන්වහන්සේගේ ගති ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරයි. දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමේ එක් ක්‍රමයක් වන්නේ උන්වහන්සේගේ නම් හා ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීමය.

පැරණි ගිවිසුමේ මණ්ඩපයට ඇතුලු වීමට නිර්දේශිත මාර්ගයක් තිබුණු ලෙසම දෙවියන්වහන්සේගේ අබිමුවට පැමිණීමට ද නිසි පිළිවෙළක් ඇත. ඔබ "ස්තුති කරමින් උන්වහන්සේගේ දොරටුවලින් ඇතුල්ව, ප්‍රශංසා කරමින් උන්වහන්සේගේ මණ්ඩපවලට පැමිණෙව්. උන්වහන්සේ වැඩ වාසයකරන තැනට යන්නේ ස්තුතිකරමින් හා ප්‍රශංසා කරමිනි. ප්‍රශංසා කරනවිට, ඔබ දෙවියන්වහන්සේට වැඩම කර වාසය කිරීම පිණිස ආත්මික ස්ථානයක් ගොඩනඟන්නෙහිය. එවිට ඔබට ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කළ හැකිය.

**නමස්කාරය** යනු ඔබ දෙවියන්වහන්සේට කරන මෙහෙය වේ. අපි බොහෝ දෙනෙක් දේශනා කිරීමෙන්, ඉගැන්වීමෙන්, පුහුණු කිරීමෙන් ආදියෙන් දෙවියන්වහන්සේට සේවය කිරීමට විශාල වැඩ කොටසක් කරන්නෙමු. එහෙත් වැදගත්ම සේවය වන්නේ දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමෙන් හා නමස්කාර කිරීමෙන් කරන සේවය වේ.

## මූලික අදහස්

නමස්කාරයේදී දෙවියන්වහන්සේ වැඩ වසන බව හා මිනිසාට උන්වහන්සේ ගැන දැනගත හැකි බව උපකල්පනය කෙරේ. ප්‍රශංසාව හා නමස්කාරය පුද්ගලිකව ද ප්‍රසිද්ධියේ ද කළ යුතු බව බයිබලය උගන්වයි. නමස්කාරයේදී වැදගත් සාධකය වන්නේ දෙවියන්වහන්සේට ලැදිවූ හදවතක් තිබීම වේ. සභාවේ නමස්කාරය සිදු නොවීමට හේතුව එය දෛනික ජීවිත රටාවේ නොතිබීම වේ. සාමූහික දේව මෙහෙයන්හිදී සැබවින්ම නමස්කාර කරන අය වන්නේ, ප්‍රසිද්ධියේ කරන දෙය ඔවුන් පෞද්ගලිකව දැනටමත් කර තිබීමය. නමස්කාර කිරීමේ ජීවිත රටාවක ප්‍රතිඵලය නමස්කාරය වන අතර එය මනා ලෙස සැලසුම් කළ සාමූහික නමස්කාර පැයක් නොවේ. ප්‍රශංසාව හා නමස්කාරය විශාල මහජන රැස්වීමක් නොවේ. එය පුද්ගලයන් දෙවියන්වහන්සේට දක්වන ප්‍රතිචාරයකි. අපි ප්‍රශංසා කිරීමෙන් එක් වන විට සමූහ ප්‍රතිචාරයක් දක්වන්නෙමු. එහෙත් ඒ සෑම ප්‍රකාශයක්ම තනි පුද්ගලයෙකුගෙන් කෙරෙන්නකි.

තවත් කෙනෙකු ප්‍රතිචාර නොදැක්වීම, ඔබගේ ප්‍රතිචාරය කෙරෙහි බල නොපෑ යුතුය. ඔබ වටා සිටින අයගේ හැසිරීම කුමක් වුවත් ඔබට දෙවියන්වහන්සේට ප්‍රශංසා කළ හැකිය. එය ගයන්න, බෙදාගන්න, පෙන්වන්න, කෑ ගසන්න, වාදනය කරන්න, එහෙත් ආරම්භ කරන්න.

පසුගිය පරම්පරාවේ ලක්ෂණයක් වූයේ ස්තුතිවන්ත නොවී බලය නොමැති යම් ආකාරයක භක්තිවන්ත කමක් තිබීම වේ. නමස්කාරය ගැන ඉගැන්වීම අවශ්‍ය එබැවිනි. නමස්කාරය ඔබගේ හැඟීම්වලින් නොව ඔබගේ අධිෂ්ඨානයෙන් පාලනය විය යුතුය. දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතය පාලනය කරන බව ඔබ සැබවින්ම විශ්වාස කරන්නේ නම්, ඔබට ප්‍රීති ප්‍රමෝද විය හැකිය. සියල්ලෙහිදී තුති දීම දෙවියන්වහන්සේගේ කැමැත්ත බව බයිබලයේ සඳහන් වේ (1 තෙසලෝනික 5:18).

නොකඩවා දෙවියන්වහන්සේට පැසසුම් කිරීම, නව ගිවිසුමේ කිතුනුවන්ට දෙවියන්වහන්සේ දෙන අණකි.

> **එබැවින් දෙවියන්වහන්සේගේ නාමයට ස්තුතිකරන තොල්වල ඵල වන ප්‍රශංසාව නමැති පූජාව උන්වහන්සේම කරණකොටගෙන නිතරම දෙවියන්වහන්සේට ඔප්පු කරමු. (හෙබ්‍රෙව් 13:15)**

අපි බොහෝ දෙනෙක් පුරුදු වී ඇත්තේ වෙනත් කෙනෙකු අපව නමස්කාරයට ඇතුළු කරවීමයි. "ඔබ ඇතුළුවන්නම හා "ප්‍රශංසාවේ යාගයක් ඔප්පු කරන්නම යයි දෙවියන්වහන්සේ පවසන සේක. බොහෝ ජාතීන්ට ව්‍යවස්ථාවෙන් නමස්කාර කිරීමේ නිදහස සහතික කොට තිබේ. බොහෝ විට ඇදහිලිවත්හු කිතුනුවන්ට වඩා පුරවැසියෝ වෙති. නමස්කාර කළ යුත්තේ කොයි වේලෙහිද හා කෙසේද යන්න තෝරා ගැනීමට ඔවුන්ට නිදහසක් ඇතැයි ඔව්හු සිතති. එහෙත් නමස්කාරය ගැන බයිබලය බොහෝ සේ සුවිශේෂිය.

## ආත්මයෙන් හා සැබෑකමෙන්

මෙම පාඩමේ ප්‍රධාන පදයට අනුව නමස්කාරය පිළිගැනීම සඳහා එය "ආත්මයෙන්ද සැබෑකමෙන්දම කළ යුතුය. ආත්මයෙන් හා සැබෑකමෙන් නමස්කාර කිරීම යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? යොහන් 4:33-34 පද මතෙව් ශුභාරංචියේ තවත් පදයකට සම්බන්ධය. යේසුස්වහන්සේ එකල සිටි ආගමික නායකයන්ට මෙසේ පැවසූ සේක.

> **යේසුස්වහන්සේ උත්තරදෙමින්, නුඹලා ශුද්ධලියවිලිවත් දෙවියන්වහන්සේගේ බලයවත් නොදැන වරද්දාගනිහුය. (මතෙව් 22:29)**

"ශුද්ධ ලියවිල්ලම අපගේ නමස්කාරයේ සැබෑකම පෙන්වයි. "දෙවියන්වහන්සේගේ බලයම අපගේ නමස්කාරයේ ආත්මය පෙන්වයි. ආත්මික දේ අවබෝධ කරගැනීමට ශුද්ධ ලියවිල්ල හා දෙවියන්වහන්සේගේ බලය අවශ්‍ය වන්නා සේම, පිළිගත හැකි නමස්කාරයක් සඳහා ආත්මය හා සැබෑකම අවශ්‍ය වේ.

නමස්කාරය පිළිබඳව යේසුස්වහන්සේ පැවසූ දෙය අවබෝධ කරගැනීමට, උන්වහන්සේ එම ප්‍රකාශය කළ අවස්ථාව සලකා බලමු. ඔබගේ බයිබලයේ යොහන් 4ට පෙරළන්න.

## බයිබලිය පාඨය

යේසුස්වහන්සේට තමාට අවශ්‍යවූ ස්ථානයට යාමට සමාරිය තුළින් යෑමට අවශ්‍ය වුයේ නැත. එහෙත් උන්වහන්සේ පැවසුවේ ඒ මාර්ගයේ යෑම උන්වහන්සේට අවශ්‍ය බවය. උන්වහන්සේට දිව්‍යමය හමුවීමක් තිබිණි. තම ශ්‍රාවකයන් ආහාර මිලදී ගැනීම සඳහා නගරයට ගිය අතරතුරේ යේසුස්වහන්සේ ළිඳක් අසල විවේකගත් සේක. ඒ අවස්ථාවේ සමාරිය ස්ත්‍රියක් වතුර අදිනු පිණිස පැමිණියාය. ඇයට වතුර ගෙන ඒම පිණිස සේවකයන් නොසිටි බැවින් ඇය සැබවින්ම ද්‍රව්‍යමය වශයෙන් දුගී වන්නට ඇත. එහෙත් ඇය ආත්මික වශයෙන් ද ඊටත් වඩා දුගීව සිටියාය.

යේසුස්වහන්සේ සැණෙකින්, ආත්මික උපකාර ඇයට ලැබෙන බාධක ඉවත් කළ සේක. අපද පිපාසිත ලෝකයාට ආත්මික "ජලයම ගෙන ඒම පිණිස වාර්ගික, සංස්කෘතික, නිකායික හා දේවධාර්මික බාධක ද පෞද්ගලික පූර්ව නිගමනද ඉවත් කළ යුතුය. යේසුස්වහන්සේ මේ ස්ත්‍රිය සමග කළ සාකච්ඡාවේදී මේ සෑම කරුණක්ම සැලකිල්ලට ගත් සේක.

යේසුස්වහන්සේ මේ ස්ත්‍රියට "ඔබ දැන සිටියෙහි නම්ම යයි පැවසූ සේක (යොහන් 4:10). ඔබ දන්නා තත්වයක සිට නමස්කාර කළ යුතුය (මේ පිළිබඳව, මේ පාඩමේම පසුව "සැබෑවම ගැන සාකච්ඡා කරන විට, අපි වඩාත් සොයා බලමු). සමිඳුණන්වහන්සේ කවුරුන්ද යන්න සැබවින්ම අවබෝධ කරගන්නා විට ප්‍රතිඵලය "දැනුමම (සත්‍ය) වනු ඇති අතර එය නමස්කාරයට මගපෙන්වයි. "ඔබ දැනසිටියෙහි නම් ඔබ ඔහුගෙන් ඉල්ලනු ඇතැයි යේසුස්වහන්සේ පැවසූ සේක. දැනුමට (සත්‍යය) සෑම විටම ප්‍රතිචාරයක් අවශ්‍ය වේ. අපේ වගකීම ඉල්ලීමය. උන්වහන්සේගේ ප්‍රතිචාරය දීමය.

"වතුර අඳින්නට ඔබට භාජනයක් නැතැයි ස්ත්‍රිය යේසුස්වහන්සේට පැවසුවාය. ඇය බැලුවේ ස්වාභාවිකව වේ. දෘශ්‍ය ලෝකය පමණි. අඳින්න භාජනයක් නැතිම බැවින් ඈ කරදර වුවාය. එහෙත් ජීවනදායක වතුර එතැන ඈ සමග විය. මෙම ස්ත්‍රිය මෙන් අප බොහෝ දෙනෙකු අවධානය යොමු කරන්නේ ජීවිතයේ කළ නොහැකි දේ වෙතය. එහෙත් අප සිටින්නේ හාස්කම් කරන තැනැන්වහන්සේ අබිමුවෙහි වේ. යේසුස්වහන්සේ දෙන ජීවිතයේ ප්‍රතිඵලය නමස්කාරයයි. ඔබගේ පිපාසය සංසිඳුවන්නේ, ඔබගේ ආත්මයේ ගැඹුර තුළින් ඇදගන්නා ආත්මික ජලයෙනි.

මේ ස්ත්‍රියට මේ ආත්මික ජීවනයේ ගැලීම ලබාගැනීමට හා සැබෑ නමස්කාරයෙන් ප්‍රතිචාර දැක්වීමට පෙර යේසුස්වහන්සේ විසින් ඉවත් කළ යුතු බාධක තිබිණි. "ඔබ අපේ පියා වන යාකොබ්ට වඩා උතුම්දැයි මේ ස්ත්‍රිය ඇසුවාය. මෙය නමස්කාරය පිළිගැනීමට පෙර යේසුස්වහන්සේ විසින් ඉවත් කළ යුතු ස්වාභාවික සබඳතාවල සංස්කෘතික බාධාවක් විය (පසුව උන්වහන්සේ නමස්කාර කිරීමේ සම්ප්‍රදායන් පිළිබඳව කටයුතු කළ සේක. ආත්මයෙන් හා සැබෑකමෙන් නමස්කාර කිරීමට මහත් බාධකයන් දෙකක් වන්නේ සම්ප්‍රදාය හා සංස්කෘතිය වේ).

මේ ස්ත්‍රිය මිනිසුන් සත් දෙනෙකුගේ සබඳතාවන්ගෙන් තෘප්තිමත් නොවූ කරුණ යේසුස්වහන්සේ කී සේක. ඈ තුළ ඇති ආත්මික හිස්භාවය ස්වභාවික සබඳතාවලින් පිරවීමට ඈ උත්සාහ කළාය (15-19 පද).

නමස්කාරයේ තැන වෙන කිසිවකට ගත නොහැකි බව මතක තබාගන්න. ඔබ සැබෑ නමස්කාර කරන්නෙකු වන තුරු, ස්වාභාවික සබඳතාවලින් ද ඔබගේ පෞද්ගලික ජීවිතයෙන් ද ඔබගේ සභාවෙන්ද ඔබ කළකිරෙනු ඇත. සැබෑ තෘප්තිමත් වීමක් සේවය තුළින් වුවද නොලැබෙනු ඇත. ස්වාමින්වහන්සේට ආවතේව කිරීමට කාර්ය බහුලව සිටි මාර්තාට යේසුස්වහන්සේ කී දේ සිහි කරන්න. උන්වහන්සේ සමග සිටීමේ වඩාත් හොඳ සේවය මරියා තෝරාගෙන ඇති බව උන්වහන්සේ වදාළ සේක. වැඩ කිරීමට වඩා නමස්කාර කිරීම යහපත්ය. සේවය කිරීමට වඩා වාඩිවී සිටීම යහපත්ය.

මේ ස්ත්‍රියගේ ආත්මික තත්වය පිළිබඳව යේසුස්වහන්සේ කටයුතු කරමින් සිටි සේක. එහෙත් ඇය දේවධර්මයට සංවාදය වෙනස් කළාය (ආත්මික දේ පිළිබඳව මිනිසුන් සමග කටයුතු කරන විට ඔබට ද මේ දෙය විය හැකිය).

සමාරිතයන් ආත්මයෙන් නමස්කාර කළ ද සැබෑකමක් නොතිබූ බව යේසුස්වහන්සේ පැවසූ සේක (19-24 පද). එස්රා හා නෙහෙමියාගේ කාලයේ, දේවමාලිගාව සෑදීමට ඉශ්රායෙල්වරුන්ට උපකාර කිරීමට සමාරිතයන්ට ඉඩ නුදුන් විට ඔව්හු ඔවුන්ගේම දේවමාලිගාවක් ගෙරිසීම් කන්දේ

ගොඩනැඟුහ. ඔවුන් විශ්වාස කළේ ආබ්‍රහම්, ඊසාක්ව පූජා කළෙත් යාකොබ් සිහිනය දුටුවේත් මෙතැන බවය. ඔව්හු බොහෝ අවස්ථාවල මේ කන්ද නැග නමස්කාර කළහ. එහෙත් ඔවුන් නමස්කාර කරන්නේ කුමකටදැයි දැන සිටියේ නැත. ඔවුන් නමස්කාරය පිළිබඳව උනන්දුවක් දැක්වුවද ශුභාරංචියේ සත්‍යය නොතිබිණි.

ජුදෙව්වන්, සැබෑකමින් (නීතිය) නමස්කාර කළ ද ආත්මය නොතිබිණි. ජුදෙව්වෙකු වූ යේසුස්වහන්සේ පැවසුවේ "අප නමස්කාර කරන්නේ අප දන්නා කෙනෙකුටය. මන්ද ගැළවීම පැමිණෙන්නේ ජුදෙව්වන්ගෙන්ය යනුවෙනි. ජුදෙව්වරු සත්‍ය දැන සිටියහ. එහෙත් ඔව්හු නොසැලකිලිමත්, නීතියට අනුකූල, කෞරාටික හා වත් පිළිවෙත්වල එල්බගත් අය වූහ. ඔවුන් නමස්කාරය අකුරට කළ ද හදවත එහි නොවීය. "පියාණන්වහන්සේම හා "ආත්මයාණන්වහන්සේම ලෙස දෙවියන්වහන්සේට නමස්කාර කළ යුතුය. ආත්මයාණන් යනු ස්වභාවය වේ. පියාණන්වහන්සේගේ සබඳතාව වේ. නමස්කාරය කරන තැන හෝ වේලාව හෝ එතරම්ම වැදගත් නොවේ. වැදගත් වන්නේ කරන තැනැත්තා හා ක්‍රමය වේ.

යේසුස්වහන්සේ කටයුතු කළේ නමස්කාරයේ යථාර්ථය සමග මිස නමස්කාර ක්‍රමය ගැන නොවේ. නමස්කාරයෙහි "සැබෑ නමස්කාර කරන්නන්ම ලෙස අප කවුරුන්ද හා අප "සැබෑ ලෙස නමස්කාර කරන්නේම කෙසේද යන්න අන්තර්ගතය. නමස්කාරය දේවස්ථාන ගොඩනැඟිල්ලක් වැනි තැනකට තවදුරටත් සීමා නොවේ, එහෙත් නමස්කාර කිරීම සඳහා සාමූහික කණ්ඩායමක් ලෙස රැස්වීම අත් නොහළ යුතුය (හෙබ්‍රෙව් 10:25අ). ඔබ සැබෑ ලෙස නමස්කාර කරන්නෙකු නම් දෙවියන්වහන්සේ සොයමින් යා යුතු නැත. උන්වහන්සේ ඔබ සොයමින් සිටින සේක. දෙවියන්වහන්සේ සොයන්නේ උන්වහන්සේට ආත්මයෙන් හා සැබෑකමෙන් නමස්කාර කරන අය වේ.

28-42 පද කියවන්න. වෙනත් කෙනෙකුගේ අත්දැකීම් මත නමස්කාරය පදනම් විය නොහැකිය. සමාරියේ සෙනඟ නමස්කාරය වෙත පැමිණියේ සත්‍යය (දැනුම) හා ආත්මය (අත්දැකීම) නිසාය. ඔව්හු පැමිණ යේසුස්වහන්සේගෙන්ම සත්‍යය දැනගත්හ.

ප්‍රධාන පද දෙන ලද වාතාවරණය දැන් අප විමසූ බැවින්, නමස්කාර සඳහා වන අවශ්‍යතාවන් දෙක, ආත්මය හා සත්‍යය (සැබෑව), දැන් වඩාත් විස්තරාත්මකව විමසා බලමු.

## ආත්මය:

මනුෂ්‍යයා ත්‍රිත්ව සත්තාවකි. ඔහු දැකිය හැකි ශරීරයකින්ද දැකිය නොහැකි ප්‍රාණයකින් හා ආත්මයකින් ද සමන්විත වේ. ප්‍රාණය යනු මිනිසාගේ "ප්‍රාණියම ස්වභාවය, එනම් මනස, කැමැත්ත හා චිත්ත වේගයන් වේ. ආත්මය යනු ආත්මික අභ්‍යන්තර මිනිසාය. ප්‍රාණයට මෙන් ආත්මයට ද චිත්තවේගී ප්‍රතිචාර ඇත. ප්‍රාණය හා ආත්මය අතර සමීප සබඳතාවක් ඇත. එහෙත් ඒවා වෙන්ව පවතී. මන්ද දේව වචනය තියුණු බවත් ඒවා ප්‍රාණය හා ආත්මය වෙන් කළ හැකි බවත් බයිබලය පවසයි. ඔබගේ ආත්මය පිළිබඳ වෙනත් කරුණු සමහරක් පහත දැක්වේ.

- දෙවියන්වහන්සේ ඔබට ආත්මය දී ඇති අතර මරණයෙන් පසු එය උන්වහන්සේ වෙතට යයි. දේශනාකාරයා 12:7, යෙසායා 42:5, සෙකරියා 12:1
- දෙවියන්වහන්සේ සියලු මාංසයන්ගේ ආත්මවල දෙවියන්වහන්සේ වේ. ගණන්. 27:16
- ඔබගේ දිව ඔබගේ ආත්මය කෙරෙහි බලපායි. හිතෝපදේශ 15:13
- බයිබලීය කාලයේදී නගරයක් වටා තැබූ පවුරු එහි ආරක්ෂාව සඳහා විය. ඔබ ඔබගේ ආත්මය පාලනය නොකරන්නෙහි නම් ඔබ පවුරු බිඳී ගිය නගරයක් වැනිය. හිතෝපදේශ 16:32, 25:28
- දෙවියන්වහන්සේ කතා කරන්නේ ඔබගේ ආත්මය තුළිනි. "ආත්මය ස්වාමින්වහන්සේගේ පහනය. හිතෝපදේශ 20:27
- ඔබගේ ආත්මය රැකගන්නා ලෙස ඔබට අවවාද කෙරේ. මලාකි 2:16
- "ආත්මයෙන් නමස්කාර කිරීම, යනු ඇතුළතින් පිටතට කෙරෙන නමස්කාරයකි. "මාගේ ආත්මයෙන්ම දෙවියන්වහන්සේට සේවය කිරීම ගැන පාවුලුතුමා පවසයි. රෝම 1:9
- "මා තුළ ඇති මාගේ ආත්මයකින්ම සමිඳුණන්වහන්සේ සෙවීම ගැන යෙසායා සඳහන් කරයි. යෙසා. 26:9
- දාවිත් තමා තුළ ඇති සියල්ලෙන් සමිඳුණන්වහන්සේට ආශිර්වාද කරයි. ගීතාවලිය 103:1
- ඔබ, ඔබගේ ආත්මයෙන් දෙවියන්වහන්සේ මහිමයට පත් කළ යුතුය. 1 කොරින්ති 6:20
- ඔබ අන්‍ය භාෂාවලින් යාච්ඤා කරන විට, ඔබගේ ආත්මය යාච්ඤා කරයි. 1 කොරින්ති 14:14-15
- ඔබගේ ආත්මය ශුද්ධාත්මයාණන්ගෙන් ශක්තිමත් නොකරන්නේ නම් ඔබට ආත්මයෙන් නමස්කාර කළ නොහැකිය. එබැවින් ආත්මයෙන් නමස්කාර කිරීමෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ ද සිටින සේක.

ඔබ නමස්කාර කරන විට දෙවියන්වහන්සේගේ ආත්මය ඔබගේ ආත්මය සමග සාක්ෂි දරනු ඇත (රෝම 8:16).
- "ආත්මයෙන්ම යනු ඇතුළාන්ත නමස්කාරයට වඩා වැඩිමනත් දෙයකි. මනුෂ්‍යයා ත්‍රිත්ව පුද්ගලයෙක් බැවින්, ඔබ ආත්මයෙන් නමස්කාර කරන විට ඔබ ප්‍රාණයෙන්ද ඔබගේ ත්‍රිත්ව ස්වභාවය වන ශාරීරක කොටස්වලින් ද නමස්කාර කළ යුතුය.

## සත්‍යය (සැබෑව)

"සත්‍යයම යන වචනයේ තේරුම අනාවරණය කිරීම, විවෘත කිරීම, නොසැඟවීම වේ. යම් දෙයක් සැබෑවීමට, එය නිර්ණායක තුනක් සම්පූර්ණ කළ යුතුය.

1. **එය විශ්වීය විය යුතුය.** එය සෑම කෙනෙකුටම අදාළ වේ.
2. **එය ඒකාකර විය යුතුය.** එය සෑම කෙනෙකුටම ඒකාකාරයෙන් අදාළ වේ. මේ නිර්ණායක මහලු, තරුණ, දුප්පත්, පොහොසත්, කලු, සුදු ආදි සෑම කෙනෙකුටම එකම වේ.
3. **එයට කෙළවරක් නොතිබිය යුතුය.** මින් අදහස් වන්නේ එය සදාතනිකවම වලංගු බවයි.

දෙවියන්වහන්සේ සමග ගත කළ කාලයක ලබාගත් සත්‍යයේ ප්‍රතිඵලයක් ලෙස නමස්කාරය පදනම් කරගත යුතුවේ. ඔබ මනහර දේශනා කරන්නෙහි නම්, බොහෝ කතන්දර හා විහිලුවලින් හැඟීම් අවුස්සන්නෙහි නම් දෙවියන්වහන්සේට නමස්කාර කිරීම වෙනුවට සෙනඟ "ඔහු සැබවින්ම අනර්ඝ කථිකයෙකුම යයි පවසනු ඇත. ඔබ දේව වචනය විස්තර කරන (අර්ථව්‍යාපක) ඉගැන්වීම් හා දේශනාවලට කැපවිය යුත්තේ එබැවිනි.

මුල් සභාවේ සත්‍යය අවධාරණය කෙරිණි. ඔව්හු ධර්මය ස්ථිරව ගෙන ගියහ (ක්‍රියා 2:42). ධර්මය කියවීමට හා අනුශාසනා කිරීමට පාවුලුතුමා තිමෝතිට කීවේය (1 තිමෝති 4:13). දේව වචනය අවධාරණය කෙරිනි (කොලොස්සි 3:16-17). අරියෝපගය ශාලාවේ සෙනඟගේ නමස්කාරය පාවුලුතුමා දුටු විට, ඔහුට එය පිළිගත නොහැකි විය, මන්ද එය දෙවියන්වහන්සේ පිළිබඳ සැබෑ දැනුම මත පදනම් නුවූ බැවිනි. ඔවුන් "නොදැන නමස්කාර කරන˜ බව ඔහු පැවසීය (ක්‍රියා 17:23).

ඔබ නමස්කාර කරන්නෙහි නම්, චිත්තවේගී හැඟීමකට නොව දේව වචනයට ඔබ කැපවිය යුතුය. දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ සැබෑකමින් නමස්කාර කිරීමය.

> **නුඹලා නුඹලාගේ පියවූ යක්ෂයාගෙන්ය. . . . ඔහු තුළ සැබෑකම නැති හෙයින් ඔහු සැබෑවෙහි නොපැවතුණේය. ඔහු බොරුවක් කියන කල තමාගේම දේ කියයි. (යොහන් 8:44)**

> **නුඹලා සැබෑව දැනගන්නවා ඇත. සැබෑවද නුඹලා නිදහස් කරන්නේයයි කීසේක. (යොහන් 8:32)**

ඔබ "සැබෑකමින්ම නමස්කාර කරන්නට යන්නෙහි නම් බයිබලය සත්‍යයයි පවසන දෙය ඔබ දැනගත යුතුය. ලෝකයේ "සත්‍යයේ ආත්මය ද˜ "වරදේ ආත්මයද˜ ක්‍රියා කරන බැවින් මෙය වැදගත් වේ. "සදාතනිකවම ඉගෙන ගන්නා එහෙත් කිසි දිනෙක සත්‍යය පිළිබඳ දැනීම නොලබන" අය ගැන බයිබලයේ සඳහන් වේ. "සත්‍යය කුමක්ද?" යන පිලාත්ගේ ප්‍රශ්නයට පිළිතුර මෙන්න. මේ සාරාංශය "සත්‍යය" පිළිබඳ බයිබලයේ ඇති සියලු යොමුවන්ගෙන් ගන්නා ලදී.

**1. දෙවියන්වහන්සේ සත්‍යය වේ.**
- උන්වහන්සේ සත්‍යයේ ජීවත්වේ.
- උන්වහන්සේගේ ඇස් සත්‍යය කෙරෙහි වේ.
- උන්වහන්සේගේ මාර්ග සත්‍යය
- උන්වහන්සේගේ ක්‍රියා සත්‍යය
- උන්වහන්සේගේ වචනය සත්‍යය
- උන්වහන්සේගේ අනුශාසනා සත්‍යය
- උන්වහන්සේගේ දයාව සත්‍යය
- උන්වහන්සේගේ සත්‍යය එළිදරව් කරයි
- උන්වහන්සේ විනිශ්චය කරන්නේ සත්‍යය පදනම් කරගෙන වේ.
- උන්වහන්සේගේ සත්‍යය සදාතනිකය, සීමා රහිතය.

- සියලුම මනුෂ්‍යයන් සත්‍යය දැනගැනීම උන්වහන්සේට අවශ්‍යය
- උන්වහන්සේ ඔබගේ සේවය අනුමත කරන්නේ සත්‍යය පදනම් කරගෙනය
- උන්වහන්සේ ඔබ “ජනිත කරන ලද්දේ” සත්‍යයෙහිය.

**2. යේසුස්වහන්සේ සත්‍යය**
- උන්වහන්සේ මාංසකාරව පැමිණි සත්‍යය වේ
- උන්වහන්සේ සැබෑ ආලෝකය වේ.
- උන්වහන්සේ සැබෑ රොටි වේ.
- උන්වහන්සේම සැබෑ මිදිවැල වේ.
- උන්වහන්සේ සත්‍යයෙන් පූර්ණය
- සත්‍යය පැමිණියේ උන්වහන්සේගෙන්ය
- සත්‍යය උන්වහන්සේ තුළ විය
- උන්වහන්සේ විශ්වාසවන්ත සැබෑ සාක්ෂිකරුවාණෝය
- උන්වහන්සේ සත්‍යයේ වාර්තාව දැරූ සේක,
- උන්වහන්සේ “මාර්ගය ද සත්‍යය ද වේ”

3. **ශුද්ධාත්මයාණන්වහන්සේ** සත්‍යයේ ආත්මය ලෙස හැඳින්වේ.

4. **වාක්‍යයාණෝ** සත්‍ය වෙති. දෙවියන්වහන්සේගේ විනිශ්වය ඒ මත පදනම් වේ.

5. ශුභාරංචිය මත පදනම් වූ **ගැළවීම** සත්‍යය

6. **ආත්මයේ ඵල** නම් සියලු ආකාර යහපත්කමත් දමිටුකමත් සැබෑකමත්ය (එපිස 5:9). එබැවින් එය සත්‍යය වේ.

7. **සභාව** සත්‍යයේ මුල් බැස තිබිය යුතු වේ.

8. **දෙවියන්වහන්සේගේ ආලේපය** සත්‍ය වේ (1 යොහන් 2:27)

ඔබ සැබෑ නමස්කාරකරන්නෙකු නම් ඔබ සත්‍යය දැනගන්නවා පමණක් නොව ඊට ඔබ ප්‍රතිචාර දැක්විය යුතුය. සාවුලු රජ ද දාවිත් ද යන දෙදෙනාම නමස්කාර කරන්නෝ වූහ. පාපය පිළිබඳ දාවිත්ට මුහුණට මුහුණලා අසා සිටි විට ඔහු පසුතැවිලිවීමෙන් ප්‍රතිචාර දැක්විය. එහෙත් සාවුල් එසේ කළේ නැත. සාවුල්ගේ නමස්කාරය පිළිගත නොහැකි වූයේ :

1. **සෙනඟ** නිසාය. “මා මිනිසුන් දුටු බැවින් . . .” ඔහු වඩාත් සැලකිලිමත් වූයේ දෙවියන්වහන්සේ සිතු දෙයට වඩා මිනිසා සිතූ දෙය වෙතටය.

2. **භක්තිය** නිසාය. ඔහු ස්වයං-ධර්මිෂ්ඨ විය. යාච්ඤා කිරීමට පෙර යුද්ධයට යෑම ශුද්ධ ලියවිල්ලට අනුකූල නොමැති බැවින් ඔහු දිවැසිවරයාගේ තැන ගත් බව පැවසිය.

3. **අහංකාර** නිසාය. සාවුල් ස්වයං-පෝෂිත විය. ඔහු කියන දෙය බලන්න ”මා, මමම ඔබ එතැන සිටියේ නැත.

දෙවියන්වහන්සේ පශ්චාතාපවීම ඉල්ලන විට සාවුල් නමස්කාරය පිරිනැමිය. එබැවින් ඔහුගේ නමස්කාරය ප්‍රතික්ෂේප කෙරිණි. දෙවියන්වහන්සේ පූජාවට වඩා කීකරුකම ප්‍රිය කරයි. හදවත දෙවියන්වහන්සේ හා සමග නිවැරදි නොවේ නම්, ක්‍රමානුකූල නමස්කාරය, කෙතරම් ශුද්ධ වුවත්, පලක් නැත.

දාවිත්ගේ මිත්‍රයෙකු වූ ඉස්තොබෙල් ද නමස්කාර කරන්නෙකු විය. ඔහු “දෙවියන්වහන්සේගේ අනාවැකි කියන්නෙකු“ ලෙස විස්තර කර තිබේ. ඔහු දෙවියන්වහන්සේගේ ගෘහයට දාවිත් සමග ගමන් කළේය. ඔහු ආත්මයෙන් නමස්කාර කළද ඔහු වෙනස් කිරීමට සත්‍යයට ඉඩ දුන්නේ නැත. ඔහු පසුව දාවිත්ට විරුද්ධව කැරැල්ලකට එක් විය.

## ආත්මය හා සත්‍යය එකට ගත් කල

ආත්මයෙන් නමස්කාර කිරීම යනු, ආත්මයක් වන දෙවියන්වහන්සේ වෙතට නැගීම සඳහා ප්‍රේමය, ආදරය, කැපවීම, ගෞරවය හා ගරු කිරීම ඇති කරමින් ඔබගේ මිදුනු ආත්මය වෙත ශුද්ධාත්මයාණන්වහන්සේට හැසිරීමට ඉඩ දීම වේ. සැබෑකමින් නමස්කාර කිරීම යනු දේව වචනයට අනුව නමස්කාර කිරීම හා දෙවියන්වහන්සේගේ සත්‍යයට නියමාකාරයෙන් ප්‍රතිචාර දැක්වීම වේ.

මේ ආකාරයෙන් "ආත්මයෙන් ද සැබෑකමෙන් ද නමස්කාර කිරීමෙහි" දේව වචනයට අනුකූලව ශුද්ධාත්මයාණන් ප්‍රාණවත් කිරීම මගින් ඇදහිලිවන්තයා දෙවියන්වහන්සේට ගරු කිරීම හා ප්‍රේම කිරීම අන්තර්ගතය. සැබෑ නමස්කාරයක් සිදුවීමට ශුද්ධාත්මයාණන්වහන්සේ මෙන්ම දේව වචනය ද අවශ්‍ය වේ. ශුද්ධාත්මයාණන්වහන්සේ වැඩ නොසිටියහොත් නමස්කාරය මළානිකය. මිය ගොස් ඇත. දේව වචනය නොතිබුණි නම් නමස්කාරය, හැඟීම් බර හෝ චාරිත්‍රානුකූල හෝ පමණක් වනු ඇත.

## අප නමස්කාර කරන්නේ මන්ද?

අප නමස්කාර කරන්නේ :

### ආදර්ශය නිසාය:

ශුද්ධ ලියවිල්ල නමස්කාර කිරීමේ ආදර්ශයන්ගෙන් පිරී තිබේ.

### අනුශාසනා නිසාය:

නමස්කාර කිරීමට ශුද්ධ ලියවිල්ල අපට අණ කරයි.

> **මා විසින් මටම උපදවාගතක් ඒ සෙනඟ මාගේ ප්‍රශංසාව දක්වනවා ඇත. (යෙසායා 43:21)**
>
> **නුඹලාත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේට ප්‍රසන්නවූ ආත්මික පූජා ඔප්පුකරන පිණිස ශුද්ධ පූජක සමූහයක් වීමට ආත්මික ගෘහයක් කොට ජීවමාන ගල් මෙන් ගොඩනඟනු ලබන්නහුය.**
> **නුමුත් අන්ධකාරයෙන් තමන්ගේ විස්මපත් ආලෝකයට නුඹලා කැඳවාගත් තැනැන්වහන්සේගේ උත්කෘෂ්ටතාවන් දක්වන පිණිස නුඹලා වනාහි තෝරාගත් වංශයක්ද, රාජකීය පූජකයෝ ද ශුද්ධවූ ජාතියක්ද, දෙවියන්වහන්සේ සන්තක සෙනඟක්ද වන්නහුය. (1 පේතෘස් 2:5, 9)**
>
> **ස්වාමින්ට ප්‍රශංසාකරව්, මක්නිසාද අපේ දෙවියන්වහන්සේට ප්‍රශංසා ගී කීම යහපත්ය. එයින් ප්‍රීතිය උපදනේය. ප්‍රශංසා කිරීම හොබනේය. (ගීතාවලිය 147:1)**

පළමුවන ආඥාව වන්නේ දෙවියන්වහන්සේට නමස්කාර කිරීමටය (නික්ම. 20:1-5, ගීතාවලිය 45:11). ඔබගේ ශ්‍රේෂ්ඨතම සේවය වන්නේ දෙවියන්වහන්සේට නමස්කාර කිරීම මිස දෙවියන්වහන්සේට වැඩ කිරීම නොවේ.

> **ස්වාමින්වහන්ස, මහත්තත්වයද පරාක්‍රමයද තේජසද ජයද මහිමයද අයත් ඔබටය. මක්නිසාද ස්වර්ගයෙහිත් පොළොවෙහිත් ඇති සියල්ල ඔබගේය. රාජ්‍යයත්, ස්වාමින්වහන්ස, ඔබට අයිතිය. ඔබ සියල්ල කෙරෙහි හිස මෙන් උසස්ව සිටිනසේක. (2 ලේකම් 29:11)**

### සදාතනික ඉරණම නිසාය:

ඔබ මවා ඇත්තේ නමස්කාර කිරීමට වන අතර ඔබගේ සදාතනික ඉරණම වන්නේ ඔබ සැබෑවූ දෙවියන්වහන්සේට නමස්කාර කරන්නේද නැද්ද යන්න මත වේ.

## නමස්කාර කිරීමේ රටා

නමස්කාර කිරීමේ රටාවන්හි පහත සඳහන් දේ අන්තර්ගතය.

| | |
|---|---|
| මහිමවත් කිරීම | දෙවියන්වහන්සේ (ඉහළට) |
| ගුණ නැණ වැඩීම | ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ( ඇතුලට) |
| ශුභාරංචිය ප්‍රකාශ කිරීම | විනාශ වන්නන් (පිටතට) |

නමස්කාරයට ඉහත තුනම අවශ්‍ය වේ. මුල් සභාව මෙම රටාව අනුගමනය කළේය (ක්‍රියා 24:3, 46. 47). යොහන්ද මෙය අවධාරණය කළේය (යොහ. 15:1-11, 12-17, 18-27). ඔබ මහිමවත් කරන විට, ගොඩ නැගිමක් සිදුවේ. ගොඩ නැගිමක් සිදුවන විට ශුභාරංචිය ප්‍රකාශ කිරීම සිදුකෙරේ. ශුභාරංචිය ප්‍රකාශ කිරීම කෙරෙන විට, මහිමවත් කිරීම සිදුවේ. මේ ආකාරයෙන් රටාව නොකඩවා පවතී.

## නමස්කාරයේ ප්‍රතිඵල

නමස්කාරයේ අගනා ප්‍රතිඵල සමහරක් පහත දැක්වේ.

### දෙවියන්වහන්සේ මහිමයට පත් කෙරේ.

> **ස්තුතිපූජා කරන තැනැත්තේ මට ගෞරවකරයි. ස්වකීය හැසිරීම හරි ලෙස පවත්වා ගන්නාට දෙවියන්වහන්සේගෙන් ලැබෙන ගැළවීම දක්වන්නෙමි. (ගීතාවලිය 50:23)**

### සොයන්නන් හඳුනාගනු ලැබේ:

සොයන්නන්, දෙවියන්වහන්සේගේ අබිමුවට පිළිගනු ලැබේ.

> **ස්තුතිකරමින් උන්වහන්සේගේ දොරටුවලින් ඇතුල්ව, ප්‍රශංසාකරමින් උන්වහන්සේගේ මණ්ඩපවලට පැමිණෙව්, උන්වහන්සේට ස්තුතිකරමින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසාකරව්. (ගීතාවලිය 100:4)**

> **නුඹලා කිසිවක් ගැන කනගාටු නොසිතා, සියල්ලෙහිදී ස්තුතිදීම සමග යාච්ඤාවෙන්ද කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දන්වාපල්ලා. (පිලිප්පි 4:6)**

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ජනතාවගේ ප්‍රශංසාව මැද වැඩ වසන බව බයිබලයේ සඳහන් වේ (ගීතා. 22:3). ඔබ උන්වහන්සේට ප්‍රශංසා කරන විට, උන්වහන්සේ පැමිණ වැඩ වසන ආත්මික මණ්ඩපයක් ඔබ ගොඩනඟන්නෙහිය.

### ඇදහිලිවතුන් පවිත්‍ර කරනු ලැබේ.

නමස්කාරය මගින් ඔබ දෙවියන්වහන්සේ අභිමුවට පැමිණි විට, ඔබ පවිත්‍ර කෙරේ.

> **ස්වාමින්ගේ කන්දට නගින්නේ කවුද? උන්වහන්සේගේ ශුද්ධස්ථානයෙහි සිටින්නේ කවුද? පවිත්‍ර අත් සහ පිරිසිදු සිතක් ඇත්තාවූ, තමාගේ ආත්මය නිෂ්ඵලකමට යොමුනොකළාවූ, වංචාවෙන් නොදිවුළාවූ තැනැත්තේමය. ඔහු ස්වාමින්ගෙන් ආශිර්වාදයක්ද තමාගේ ගැළවීමේ දෙවියන්වහන්සේගෙන් ධර්මිෂ්ඨකමද ලබන්නේය. (ගීතාවලිය 24:3-5)**

> **රිදීවලට කෝවයද රන්වලට උදුනද තිබේ. මනුෂ්‍යයෙක් ඔහුට ලැබෙන ප්‍රශංසාවෙන් පරීක්ෂාකරනු ලබයි. (හිතෝපදේශ 27:21)**

උන්වහන්සේ අභිමුවෙහි ඔබ රත්කර බිඳ දමන විට, ඔබගේ ජීවිතයේ අප ද්‍රව්‍ය වටිනා ලෝහයෙන් වෙන් කෙරෙන අතර ඒවා මතුපිටට පැමිණේ. එවිට කුරුසියේදී ඒවා ගැන ගනුදෙනු කළ හැකිය. ඔබ උන්වහන්සේ සමග කාලය ගත කරන විට, ඔබ වෙනස් වනු ඇත.

- දෙවියන්වහන්සේගේ තේජාලංකාරය මෝසෙස්ගේ මුහුණෙන් පෙන්විය.
- ශ්‍රාවකයන් දෙවියන්වහන්සේ සමග සිටි බව සෙනඟ තේරුම්ගත්හ.
- අපවිත්‍ර තොල් තිබී මනුෂ්‍යයෙකු වූ යෙසායා, දෙවියන්වහන්සේගේ ගින්නෙන් පවිත්‍ර විය.

**සභාව ගොඩනැංවේ:**

ප්‍රශංසා කරන්නාවූ සභාවක ප්‍රතිඵලය වන්නේ සෙනඟ එක්සත්වීම, පරිත්‍යාග කිරීම, උද්යෝගිමත් වීම හා නිවසේදීත් සාමූහිකවත් නමස්කාර කිරීම වේ (ක්‍රියා 2:42-47).

## නැතිවූ අයට ශුභාරංචිය දීම කරනු ලැබේ:

ඇදහිලිවතුන් දෙවියන්වහන්සේ ප්‍රශංසා කරමින් සිටි අතර බොහෝ අය සභාවට එක්වූ බව ක්‍රියා 2:47 හි සඳහන් වේ. ඔබ ආත්මයෙන් ද සැබෑකමෙන් ද නමස්කාර කරන්නෙහි නම් ඔබ මධ්‍යයට එන නොඇදහිලිවතුන් දෙවියන්වහන්සේ වෙතට ආකර්ෂණය කෙරෙනු ඇත.

### නමස්කාරය සඳහා සූදානම් වීම

ඔබගේ සිත නමස්කාරය සඳහා සූදානම් කරගන්නා ආකාරය පැහැදිලි කරන පදයක් මෙසේ වේ.

> **නපුරු හෘදයසාක්ෂියකින් පිරිසිදුවීම පිණිස අපගේ සිත් ඉසිනු ලැබ, අපේ ශරීරය පිරිසිදු වතුරෙන් සෝදනු ලැබ, සැබෑවූ සිතක් ඇතුව ඇදහීමේ නිසැකකමින් ළඟාවෙමු. (හෙබ්‍රෙව් 10:22)**

නමස්කාර කිරීමට කැඳවීම වන්නේ, "දෙවියන්වහන්සේ වෙත ළඟා වෙමු" යන්නය. ඔබ ළඟාවන විට පරීක්ෂා කරනු ලබන්නේ:

| | |
|---|---|
| **අවංකභාවය :** | අවංක සිතක් |
| **සහතිකය :** | ඇදහිල්ලේ සහතිකය ඇතිව |
| **නිහතමානිකම:** | රුධිරය තුළින් හැර ඔබ නොවටිනා බව දැනගැනීම |
| **පවිත්‍රතාවය :** | දිනපතාම දේව වචනය නමැති පිරිසිදු වතුරෙන් සේදීම |

### නමස්කාර ක්‍රම

බයිබලයේ විවිධ නමස්කාර ක්‍රම සඳහන් වේ.

**පශ්චාතාපවීමේ නමස්කාරය**

ගීතාවලිය 51, පශ්චාතාපවීමේ නමස්කාරය පිළිබඳ කදිම නිදසුනකි. මෙය දාවිත් බැත්-ෂෙබා සමග පාපයේ යෙදුණු පසු කළ යැදුමකි.

**පිළිගැනීමේ නමස්කාරය**

යෝබ්ට සිය දරුවන් හා දේපළ නැති විය. එහෙත් ඔහු නමස්කාර කළේය.

> **එවිට යෝබ් නැගිට, තමාගේ සළුව ඉරාගෙන, ඉස මුඩුකරගෙන, බිම වැටී වැඳ: නග්නව මාගේ මවු කුසින් ආවෙමි. එසේම නග්නව හැරී යන්නෙමි. ස්වාමින්වහන්සේ දුන්සේක. ස්වාමින්වහන්සේ ගත්සේක. ස්වාමින්වහන්සේගේ නාමයට ප්‍රශංසාවේවයි කීවේය. (යෝබ් 1:20-21)**

**භක්තිමත් නමස්කාරය**

උත්පත්ති 22:1-14 කියවන්න. ආබ්‍රහම් හා ඊසාක්ගේ කතාව, භක්තිමත් නමස්කාරය පිළිබඳ ශ්‍රේෂ්ඨතම නිදසුන වේ. ආබ්‍රහම් නමස්කාරයට ප්‍රමුඛස්ථානයක් දුන් ආකාරය බලන්න. ඔහු නමස්කාර කිරීම සඳහා "උදෑසනින්" නැගිට්ටේය. එසේ කළේ තමා වඩාත්ම ප්‍රේම කරන පුත්‍රයා තමාට නැති වන බව දැන දැනය (අප සමහර දෙනෙකුට නමස්කාර කිරීම සඳහා උදෑසනින් නැගිටීම කරදරයකි. එය ගෙවිය යුතු මහත් මිලක් ලෙස දැනේ).

භක්තිමත් නමස්කාරය සඳහා දෙවියන්වහන්සේට වෙන්වීම අවශ්‍යය. ආබ්‍රහම් තම සේවකයන්ට "මෙහි නවතින්න" යයි කීවේය. සැබෑ නමස්කාරය, සිත් වෙනතකට ඇදගැනීම නැවැත්වීමට ඕනෑකමින්ම වෙන් විය යුතුය. සැබෑ නමස්කාරය තනිව කෙරෙන්නකි. ඔබ තනිව කරන තුරු සැබෑ භක්තිමත් නමස්කාරයක් නොකෙරේ.

භක්තිමත් නමස්කාරයේ මිල අධිකය. ආබ්‍රහම්ගේ සිද්ධියේදී ඔහුට ඔහුගේ එකම පුත්‍රයා දීමට අණ කළේය. තමාට කිසිදු වටිනාකමක් නැති දෙයක් දෙවියන්වහන්සේට නොදෙන බව දාවිත් පැවසීය (1 සාමුවෙල් 24:24). භක්තිමත් නමස්කාරය ආත්මාර්ථකාමී ආශාවන් ඉවත දමයි. අවධානය දෙවියන්වහන්සේ කෙරෙහි පමණි. භක්තිමත් නමස්කාරයක් වෙනුවෙන් ආබ්‍රහම්ට පුත්‍රයා කෙරෙහි ඇති ආශාවට මිය යෑමට සිදුවිය. එහෙත් ආබ්‍රහම්ගේ නමස්කාරය දෙවියන්වහන්සේ මහිමයට පත් කළේය. කැපකිරීමේ නමස්කාරය සැමවිටම දෙවියන්වහන්සේට මහිමය ගෙන එයි.

## කැපවීමේ නමස්කාරය:

කැපවීමේ නමස්කාරයට හොඳ නිදසුනක් සඳහා, 2 ලේකම් 15:10-15 බලන්න. නමස්කාර කරන අතර දෙවියන්වහන්සේට සේවය කිරීම සඳහා ඉශ්‍රායෙලය ගිවිසුමක් ඇති කරගත් බව වාර්තා වී ඇත.

## යුද්ධ කිරීමේ නමස්කාරය:

මුලිකව, ඔබගේ සතුරා පහර දෙන ප්‍රදේශ හතරක් ඇත. සාතන් ඔබ දෙවියන්වහන්සේට කරන නමස්කාරය, දේව වචනය, ඔබගේ කිතුනු ගමන හා ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් කරන සේවයට පහර දෙයි.

ගීතාවලිය 149:6-9 කියවන්න. මෙය ප්‍රශංසාව, යුද්ධායුධයක් ලෙස භාවිත කිරීම පිළිබඳ කදිම නිදසුනකි. දේව වචනය හා සම්බන්ධ කිරීමෙන් එය :

1. **මිථ්‍යාදෘෂ්ටීන් කෙරෙහි පළිගනියි.** දෙවියන්වහන්සේ නොදන්නා අය සමග කරන සංග්‍රාමයකදී ප්‍රශංසාව ඵලදායි වේ.

2. **දඬුවම් පමුණුවයි.** යුක්තිය හා විනිශ්චය ප්‍රශංසාවේ ප්‍රතිඵලයකි.

3. **ඔවුන්ගේ රජවරුන් විලංගුවලින් බැඳ තබයි.** යක්ෂයන් බැඳ පලවා හරින ලෙස කියා ඇත.

4. **ලියන ලද විනිශ්චය ඔවුන් කෙරෙහි ඉටු කරයි.** ඔබ ප්‍රශංසා කරන විට, ඔබගේ සතුරා දේව වචනය මත විනිශ්චය කරනු ලැබේ.

ආත්මික යුද්ධායුධයක් ලෙස භාවිත කෙරෙන තව බොහෝ ප්‍රශංසා හා නමස්කාරය පිළිබඳ බයිබලීය නිදසුන් තිබේ. එවැනි නිදසුන් කීපයක් මෙසේ වේ.

- මිදියන්වරුන් හා කරන සටනට පෙර ගිඩියොන් නමස්කාර කළේය. එමෙන්ම ඔහු හා ඔහුගේ මනුෂ්‍යයෝ සටනට පෙර කෑ ගැසූහ.
- පාවුලුතුමා හා සීලස් ඔවුන් සිරගෙයින් නිදහස් කිරීමට පෙර නමස්කාර කළහ.
- යෝනා, ඔහු මත්ස්‍යයාගෙන් බේරීමට පෙර නමස්කාර කළේය.

## නමස්කාර කළ යුතු වේලාව

ඔබ නමස්කාර කළ යුත්තේ:

### දිනපතා වේ

ඉශ්රායෙල්වරු “සමිඳුණන්වහන්සේට දවසින් දවස ප්‍රශංසා කළෝය” (2 ලේකම් 30:21) නව ගිවිසුම් සභාව දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් ගෙයින් ගෙට ගියහ (ක්‍රියා 2:46-47).

### අඛණ්ඩවය

**සෑම කල්හිම ස්වාමින්ට ප්‍රශංසා කරමි. උන්වහන්සේගේ වර්ණනාව මාගේ මුඛයෙහි නිතරම පවත්නේය. (ගීතාවලිය 34:1)**

**මාගේ ධර්මිෂ්ඨ කාරණයට ප්‍රියවන්නෝ ප්‍රීති ඝෝෂා කෙරෙත්වා, සන්තෝෂවෙත්වා. එසේය, තමන් මෙහෙකරුවාගේ යහපතට ප්‍රියවූ ස්වාමින්වහන්සේ උසස්වනසේක්වයි ඔව්හු නිතරම කියත්වා. (ගීතාවලිය 35:27)**

**එබැවින් දෙවියන්වහන්සේගේ නාමයට ස්තුතිකරන තොල්වල ඵල වන ප්‍රශංසාව නමැතකි පූජාව උන්වහන්සේම කරණකොටගෙන නිතරම දෙවියන්වහන්සේට ඔප්පු කරමු. (හෙබ්‍රෙව් 13:15)**

**නිතරම දේවමාලිගාවේ දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් සිටියෝය. (ලූක් 24:53)**

**ඔබගේ ගෘහයේ වැඩවසන්නෝ ආශිර්වාදලත්තෝය. ඔව්හු නිරතුරුම ඔබට ප්‍රශංසා කරන්නෝය. (ගීතාවලිය 84:4)**

**නුමුත් නුඹලා ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලබන්නහු නම්, නුඹලා ව්‍යවස්ථාව යටතේ නොවන්නහුය. ඉඳින් මාංසයේ ක්‍රියා ප්‍රකාශව තිබේ. එනම් වේශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම, රූප වැඳීම, මායාව, සතුරුකම්, විවාදය ඊර්ෂ්‍යා, ක්‍රෝධ පක්ෂවාදිකම්, භේද, ලබ්ධිභේද, (එපීස 5:18-20)**

### සමිඳුණන්වහන්සේ විශේෂාකාරයෙන් විදමාන වූ පසුව වේ:

උත්පත්ති 12 හි දෙවියන්වහන්සේ විශේෂාකාරයෙන් ආබ්‍රහම්ට දර්ශනය වූ ආකාරය කියවන්න. නික්මයාම 34 හි දෙවියන්වහන්සේ මෝසෙස්ට විදමාන වීම පිළිබඳව කියවන්න. දෙවියන්වහන්සේ විශේෂාකාරයෙන් මනුෂ්‍යයන්ට එළිදරව් වූ විට ඔව්හු නමස්කාර කළහ.

### දෙවියන්වහන්සේගේ පොරොන්දු ලැබුණු විටය:

උත්පත්ති 13:14-18 හි, ආබ්‍රහම්ට දෙවියන්වහන්සේගෙන් විශේෂ පොරොන්දුවක් ලැබුණු විට ඔහු ප්‍රතිචාර දැක්වූයේ නමස්කාර කිරීමෙනි.

### පිළිතුරු ලද යාච්ඤාවලටය:

තම යාච්ඤාවලට පිළිතුරු ලැබුණු පසු එලියේසර් නමස්කාර කළේය (උත්පත්ති 24).

### මනුෂ්‍යයෙකු විසින් උපකාර කළ විටය

උත්පත්ති 24:52 හි, එලියේසර්ට මනුෂ්‍යයෙකු උපකාර කළ පසු, ඔහු දෙවියන්වහන්සේට නමස්කාර කළේය.

## අර්බුදයකට පසුවය

තම දරුවා මිය ගිය පසු දාවිත් දෙවියන්වහන්සේට නමස්කාර කළේය. මෙය ප්‍රශංසාව සැබවින්ම පුද කිරීමකි. ගීතාවලිය 27:5 හි සඳහන් වන්නේ විපත් කාලයක් පිළිබඳවය. එහෙත් 6 පදයෙහි "ප්‍රීති පූජා" පුදකිරීමක් ගැන සඳහන් වේ.

**මම ඔබට ස්තුති පූජාව පුදන්නෙමි, ස්වාමින්ගේ නාමයෙන් යාච්ඤාකරන්නෙමි. (ගීතාවලිය 116:17)**

**ඔව්හු ස්තුති පූජා පුදා, ගී කීමෙන් උන්වහන්සේගේ ක්‍රියාවන් ප්‍රකාශකෙරෙත්වා. (ගීතාවලිය 107:22)**

සියල්ල හොඳින් සිදුවන විට හා දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමට ඔබට සිත් දුන් විට කෙරෙන ප්‍රශංසාව හා නමස්කාරය පූජාවක් නොවේ. එය පූජාවක් වන්නේ, සියල්ල අසාර්ථක වන විට වුවද ඔබ උන්වහන්සේට ප්‍රශංසා කිරීමේදී වේ.

## පරීක්ෂාවන්හි දී හා යුද සංග්‍රාමවලදී වේ:

අඳුරු කාලයේදී හා ආත්මික යුද සංග්‍රාමවලදී යෝබ් දෙවියන්වහන්සේට නමස්කාර කළේය.

## ඔබ කරන සෑම දෙයකදීම වේ:

ඔබ කරන සෑම දෙයකදී අඛණ්ඩව ඔබ දෙවියන්වහන්සේට නමස්කාර කළ යුතුය. ඔබ සියල්ල දෙවියන්වහන්සේගේ තේජස පිණිස කරන විට ඔබ මෙය කරන්නෙහිය.

## සදහටම වේ.

**මම සදහටම ඔබ පසසන්නෙමි (ගීතාවලිය 52:9)**

## නමස්කාර කළ යුතු ස්ථානය

## සමූහයා සමග (දේවස්ථානයේදී):

**ඔබගේ නාමය මාගේ සහෝදරයන්ට ප්‍රකාශකරන්නෙමි. සභා මධ්‍යයෙහි ඔබට ප්‍රශංසාකරන්නෙමි. (ගීතාවලිය 22:22)**

**මහත් සභාවේදී ඔබට ස්තුතිකරන්නෙමි. බොහෝ සෙනඟ අතරේ ඔබට ප්‍රශංසා කරන්නෙමි. (ගීතාවලිය 35:18)**

**ස්වාමින්ට ප්‍රශංසාකරව්, ස්වාමින්ට අලුත් ගීතිකාවක්ද ශුද්ධවන්තයන්ගේ සභාවේදී උන්වහන්සේගේ ප්‍රශංසාවද ගායනාකරව්. (ගීතාවලිය 149:1)**

## ඔබේ නිවසේදී:

**ශුද්ධවන්තයෝ මහිමයෙන් යුක්තව සන්තෝෂවෙත්වා, තමුන්ගේ යහන්වල ඉඳ ප්‍රීතියෙන් ගායනාකෙරෙත්වා. (ගීතාවලිය 149:5)**

## නොඇදහිලිවතුන් ඉදිරියේ:

**උන්වහන්සේ අලුත් ගීතිකාවක් එනම් අපේ දෙවියන්වහන්සේට ස්තුති ගීතිකාවක් මාගේ මුඛයෙහි තැබූසේක. (ගීතාවලිය 40:3)**

**උන්වහන්සේගේ මහිමය ජාතීන් අතරේද උන්වහන්සේගේ ආශ්චර්ය ක්‍රියා සියලු මනුෂ්‍ය වර්ගයන් අතරේද ප්‍රකාශ කරව්. (ගීතාවලිය 96:3)**

## ලෝකයේ ජාතීන් අතර:

**ස්වාමිනි, මනුෂ්‍ය වර්ගයන් අතරේ ඔබට ස්තුතිකරන්නෙමි. ජාතීන් අතරේ ඔබට ප්‍රශංසා ගී කියන්නෙමි. (ගීතාවලිය 108:3)**

**උන්වහන්සේගේ මහිමය ජාතීන් අතරේද උන්වහන්සේගේ ආශ්චර්ය ක්‍රියා සියලු මනුෂ්‍ය වර්ගයන් අතරේද ප්‍රකාශ කරව්. (ගීතාවලිය 96:3)**

ඊළඟ පාඩමෙන් ඔබ ආත්මයෙන් හා සැබෑකමෙන් නමස්කාර කරන විට නමස්කාර කරන ආකාරය ඔබ වඩාත් සුවිශේෂිව ඉගෙන ගන්නා අතර ඔබගේ නමස්කාර පිළිබඳ අධ්‍යයනය තවදුරටත් සිදු කෙරෙනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. නමස්කාරය යන්න නිර්වචනය කරන්න.

3. ආත්මයෙන් නමස්කාර කිරීම යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කරන්න.

4. සැබෑකමෙන් නමස්කාර කිරීම යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කරන්න.

5. අප නමස්කාර කිරීමට හේතු තුනක් සාරාංශ කරන්න.

6. නමස්කාර කිරීමේ රටාව පැහැදිලි කරන්න.

7. නමස්කාර කිරීමේ ප්‍රතිඵල පහක් ලයිස්තු ගත කරන්න.

8. නමස්කාර කරන ක්‍රම පහක් හඳුනාගන්න.

9. නමස්කාරයට සුදානම් වන ආකාරය පැහැදිලි කෙරෙන ශුද්ධ ලියවිලි පාඨයක් සඳහන් කරන්න.

10. අප නමස්කාර කළ යුත්තේ කවදාදැයි පැහැදිලි කරන්න.

11. අප නමස්කාර කළ යුතු ස්ථානය පැහැදිලි කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. පහත දැක්වෙන දේ පිළිබඳව වඩාත් ඉගෙනීමට නමස්කාරය පිළිබඳ ඉතිහාසය බලන්න.

### මැවීමට ප්‍රථම නමස්කාරය:

යෝබ් 38:4-7 ඇති වාර්තාව බලන්න.

### වැටීමට ප්‍රථම නමස්කාරය

පව්කිරීමට පෙර ආදම් හා ඒව දෙවියන්වහන්සේට නමස්කාර කළහ. ඔව්හු දෙවියන්වහන්සේට නමස්කාර කිරීම නැවැත්වූ වහාම පාපයට වැටුණේය (උත්. 3:1-13).

### පැරණි ගිවිසුමේ නමස්කාරය

කායින් සහ ආබෙල් : උත්. 4,

ආදි පියවරුන්: උත්පත්ති-ද්විතිය කථාව
පාළුකරයේ හා පොරොන්දු දේශයෙහි ඉශ්‍රායෙල් ජාතිය, නික්මයාම සිට රූත් කතාව දක්වා

පැරණි ගිවිසුමේ නමස්කාරය මහත්සේ විස්තර සහිතය. පරිච්ඡේද හතක් (පද 243 ක්) මණ්ඩපය විස්තර කිරීම සඳහා යොදාගෙන ඇති අතර මුළු විශ්වයම මැවීම විස්තර කිරීම සඳහා ඇත්තේ පද 31 කි.

අති ශුද්ධ ස්ථානයට පිවිසෙන ඕනෑම කෙනෙක් එක් දොරටුවකින් ඇතුළු වී මළුව හරහා දෙවියන්වහන්සේ වැඩ සිටින ස්ථානයට යා යුතු විය. එම දොරටුව “ස්තුති දීම” ලෙසද මළුව “ප්‍රශංසාව” ලෙස ද හඳුන්වා තිබේ.

දෙවියන්වහන්සේ තම සෙනඟගේ ප්‍රශංසාවන් මැද වාසය කරන බව ගීතාවලිය 22:3 න් පෙන්වයි. උන්වහන්සේ වැඩ වාසය කරන්නේ ප්‍රශංසා කරන මළුව මධ්‍යයේ වේ. අයැදීම වුවද එහි කළ හැකිය (පිලි. 4:6).

ඔබ උන්වහන්සේගේ අබිමුවට ඇතුළු වූ විට ඔබට උන්වහන්සේ සමග කතා කළ හැකි හා සවන් දිය හැකි සන්නිවේදනය මාර්ගයක් විවෘත වේ. ඔබට පිට මළුවේ කිතුනුවෙකු ලෙස මුළු ජීවිත කාලයම ගත කළ හැකිය. නැතහොත් සැබෑ නමස්කාරය සඳහා ඇතුළු මළුවට පැමිණිය හැකිය.

### නව ගිවිසුම් නමස්කාරය

යේසුස්වහන්සේ තුළින් නමස්කාරය. හෙබ්‍රෙව් 2:12
මුල් සභාවේ නමස්කාරය, සමිඳාණන්වහන්සේගේ දවසේදී ඔව්හු නිවෙස්වල රැස්වූහ.
යොහන් 20:19, 26, ක්‍රියා 20:7, 1 කොරි. 16:2.

ධර්මශාලාවේ හා දේව මාලිගාවේ ඔවුන් රැස්වුණද ඔවුන්ට සැබවින්ම නිවෙස්වල සභාවන් තිබිණි. පිලෙමොන් 2, රෝම 16:5, කොලො. 4:15

### නව ගිවිසුමේ නමස්කාරයේ මේවාද අන්තර්ගත විය.

දේශනා කිරීම: ක්‍රියා 20:7, 1 කොරි. 14:19

දේව වචනය කියවීම: යාකොබ් 1:22, කොලො. 4:16

යාච්ඤාව : 1 කොරි. 14:14-16

ගී ගැයීම : එපිස 5:19, කොලො. 3:16
බව්තිස්ම කිරීම හා ස්වාමින්වහන්සේගේ රාත්‍රී භෝජනය: ක්‍රියා 2:41, 1 කොරි. 11:18-34

දන්දීම : 1 කොරි. 16:12

ශුද්ධාත්ම දීමනා : 1 කොරි. 12

### වර්තමානයේ නමස්කාරය

ඔබගේ ශරීරය දැන් දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දේව මාලිගාව වේ.

**නුඹලා දෙවියන්වහන්සේගේ මාළිගාව බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන බවද නොදනිවුද? (1 කොරින්ති 3:16)**

රෝම පොතේ පළමුවන පරිච්ඡේද 11 කතා කරන්නේ අනගි ශුභාරංචිය පිළිබඳවය. ඊට අපගේ ප්‍රතිචාරය රෝම 12:1-2 හි දී ඇත. අප අපගේ ශරීර (අපගේ සම්පූර්ණ ශරීරයන්, ප්‍රාණය හා ආත්මය) ජීවමාන යාගයක් කොට ඔප්පු කළ යුතු වේ.

## අනාගත නමස්කාරය

නමස්කාරයේ අනාගත රටාවන් එළිදරව් පොතේ පහත දැක්වෙන කොටස්වලින් එළිදරව් කර ඇත. 4:10-11, 5:14, 11:15-17, 14:6-7, 15:4, 19:4, 10, 22:8-9.

2. දෙවියන්වහන්සේට නමස්කාරය පිළිගැනීමට නොහැකි වීමේ කරුණු කිපයක් පහත දැක්වේ:

### සාතනික රාජ්‍යයේ බාධා කිරීම්:

ආත්ම බන්ධන, සිත වික්ෂිප්ත වීම හා බාධා කිරීම් ආදිය සාතන් විසින් නමස්කාරයට බාධා කෙරේ.

### පාපය:

ඕනෑම ආකාරයක පාපයක් නමස්කාරයට බාධාවකි.

**අයුතුකම් කිරීමේ අභිප්‍රායක් මාගේ සිතෙහි ඇත්නම්, ස්වාමින්වහන්සේ මාගේ බස් නාසන සේක. (ගීතාවලිය 66:18)**

**නුමුත් නුඹලාගේ අපරාධම නුඹලා සහ දෙවියන්වහන්සේ අතරේ වෙන් වීමක් කළේය, උන්වහන්සේ නොඅසන ලෙස නුඹලාගේ පාපද උන්වහන්සේගේ මුහුණ නුඹලාගෙන් සැඟෙවුවේය. (යෙසායා 59:2)**

කීකරුකම වෙනුවට ඔබ නමස්කාරය ආදේශ කරන්නෙහි නම්, එය පිළිනොගැනේ.

**සාමුවෙල්ද : ස්වාමින්වහන්සේගේ හඬට කීකරුවීම පමණ දවන පූජාවලටත් යාග පූජාවලටත් ස්වාමින්වහන්සේ ප්‍රසන්න වනසේක්ද? පූජාවට වඩා කීකරුවීමත් බැටළුවන්ගේ තෙලට වඩා ඇහුම්කන්දීමත් හොඳය. මක්නිසාද කැරලිකාරකම පේනකීමේ පාපයටත් මුරණ්ඩුකම දේවතාවන් හා රූප ඇදහීමටත් සමානය. නුඹ ස්වාමින්වහන්සේගේ වචනය පහකළ නිසා උන්වහන්සේත් නුඹ රජකමෙන් පහකළසේකැයි කීවේය. (1 සාමුවෙල් 15:22-23)**

## වරදකරු යන හැඟීම:

වරදකරුවෙකු බවට ඇතිවන ව්‍යාජ හැඟීම, ඔබ දෙවියන්වහන්සේ අභිමුවෙහි නමස්කාරයෙන් සිටීම වළකාලයි. වරදකාරකම හා ශුද්ධාත්මයාණන්වහන්සේ පෙන්නන්නාවූ වරදක් අතර වෙනස තීරණය කිරීමට හොඳම ක්‍රමය වන්නේ සාතන්ගේ වරදකාර හැඟීම අනිශ්චිත වන අතර ශුද්ධාත්මයාණන්වහන්සේ වරද පෙන්වන විට නිශ්චිතවම එය පෙන්වා දෙන සේක.

## බිය

අන් අයගේ මතය ගැන බියවීම, හැඟීම් පිටකිරීමට බියවීම, ප්‍රතික්ෂේප වෙතැයි බියවීම හා උපහාසයට බියවීම යන මේ සියල්ල නමස්කාරයට බාධාවකි.

## අහංකාරය

අහංකාරයට දෙවියන්වහන්සේ එරෙහි වන බව බයිබලයේ සඳහන් වේ. දෙවියන්වහන්සේට එරෙහි වන කිසිවෙකුට උන්වහන්සේට නමස්කාර කළ නොහැකිය.

## දෙවියන්වහන්සේ පිළිබඳ වැරදි සංකල්පයක්

ඇතැම් අය සිතන්නේ දෙවියන්වහන්සේ දරුණු කෲර හා මරා දැමීම සඳහා පහර දීමට සූදානම්ව සිටින කෙනෙකු ලෙසය. ගරු කිරීමේ පැත්තෙන් අප උන්වහන්සේට බිය විය යුතු වුවද බිය ගැන්වීමක් ඉන් අදහස් නොවේ.

## බර ගතියක් දැනීමේ ආත්මය

දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම සඳහා ඔබ, බරගතිය දැනීමේ ආත්මය අත්හළ යුතුය. මීට ආත්මානුකම්පාව, දොම්නස, කාලකණ්ණියෙකු යන හැඟීම හා සෘණාත්මක චින්තනය අන්තර්ගත වේ.

## නිදහසට බාධා පමුණුවන විධිමත් බව

දෙවියන්වහන්සේගේ බලය ප්‍රතික්ෂේප කරන භක්තිමත් ස්වභාවයක් සහිත අය ගැන බයිබලයේ සඳහන් වේ. විධිමත් බව හා චාරිත්‍ර නමස්කාර කිරීම නිදහසට බාධා පමුණුවන ඇති අතර එය වෙහෙස ගෙන දෙයි (මලාකි 1:11-13 බලන්න). නමස්කාරය වෙහෙස ගෙන දෙන්නක් වුවහොත්, එහි ප්‍රීති ප්‍රමෝදයක් නැත (යෝවෙල් 1:16).

## සම්ප්‍රදායන්

යේසුස්වහන්සේ එකල සිටි ආගමික නායකයන් ගැන මෙසේ කී සේක.

**මනුෂ්‍යයන්ගේ ශික්ෂාවන් ගුරුකම්කොට උගන්වමින්, ඔවුන් මට නමස්කාරකරන්නේ නිරර්ථකයේයයි අනාගත වචන මනාකොට කීයේය කීසේක. (මතෙව් 15:9)**

මිනිසාගේ නීතිමය සම්ප්‍රදායන්, චර්යා ක්‍රම හා නිෂ්ඵල පුනරුක්තියන් ආදිය සැබෑ නමස්කාරයට බාධා පමුණුවයි (මතෙ. 6:7, පිලි. 3:13). සෑම සභාවක්ම සම්ප්‍රදායන් ගොඩනගා ඇති අතර බොහෝ අවස්ථාවල නොසලකා හරින්නේ සම්ප්‍රදාය නොව සැබෑ නමස්කාරය වේ.

## ප්‍රතිමාවන්

පැරණි සංස්කෘතියයන් ප්‍රතිමාවන්ගෙන් පිරී පැවතියේය. ප්‍රතිමාවල ගති ලක්ෂණ තුනක් ගීතාවලිය 115 හි සඳහන් වේ.

1. ඒවා මිනිසුන් විසින් සාදන ලද්දකි.
2. ඒවාට ප්‍රාණයක් නොතිබූ අතර බලයක් ද නොවීය.
3. මනුෂ්‍යයෝ ඔවුන් නමස්කාර කළ දේ මෙන් වූහ. නිදසුනක් ලෙස ඉශ්‍රායෙල්වරුන් අන්ධ හා බිහිරි ප්‍රතිමාවන් නමස්කාර කළ නිසා ඔව්හු සැබෑ දෙවියන්වහන්සේට අන්ධ හා බිහිරි වූහ.

අද අපගේ ප්‍රතිමා ගැන කුමක් කිව හැකිද? අපගේ ඇතැම් ප්‍රතිමා එම ගණයට වැටේ. දෙවියන්වහන්සේට වඩා ඔබගේ කාලය, අවධානය හා ආදරය ගන්නා ඕනෑම දෙයක් ප්‍රතිමාවකි. ද්‍රව්‍යවාදය "රන් හා රිදීවල" ප්‍රතිමාවක් ලෙස යෝබ් සඳහන් කරයි (යෝබ් 31:24-28). සේවය වුවද ප්‍රතිමාවක් විය හැකිය (ලූක් 10:41).

### ඔබගේ සහකාරිය/සහකාරයා සමග එකමුතු බවක් නැතිකම:

ඔබගේ සැමියා හෝ බිරිඳ හෝ සමග එකමුතු බවක් නොතිබීම ඔබගේ යාච්ඤාවට බාධාවක් විය හැකිය. නමස්කාරය යාච්ඤාවේ කොටසක් බැවින් ඔබගේ නමස්කාරයට ද ඉන් බාධා පැමිණේ (1 පේතෘස් 3:7).

### සහභාගිකයෙකු වීම වෙනුවට ප්‍රේක්ෂකයෙකු වීම:

ඔබ සහභාගිකයෙකු නොවී ප්‍රේක්ෂකයෙකු වූ විට ඔබද දාවිත්ගේ බිරිඳ මෙන් වන්නේය. ඈ සහභාගිකයෙකු නොව ප්‍රේක්ෂකයෙකු වී ඔහුගේ නමස්කාරය නිරීක්ෂණය කරමින් විවේචනය කළේය.

### ලෝකයේ කාරණා ගැන කනස්සලු වීම:

ක්‍රිස්තු විරෝධී ආත්මයන් කරන එක් දෙයක් වන්නේ දෙවියන්වහන්සේගේ සාන්තුවරයන් ලෝකයේ දේ පිළිබඳව කනස්සලු වීමට සැලැස්වීමෙන් "වෙහෙසට පත් කරවයි. ලෝකයේ දේ ආත්මික දේ යටපත් කරමින් නමස්කාරයට බාධා කරයි (දානි. 7:25, මාක් 4:19).

### අධ්‍යාපනය:

ඒදන් උයනේ දැනගැනීමේ ගස තැබූ දා පටන්, සාතන්ගේ ප්‍රයත්නයන් අධ්‍යාපනය වටා කේන්ද්‍ර ගත වූ බව පෙනේ. කිතුනු අධ්‍යාපනයේ දී වුවද ඔබට දෙවියන්වහන්සේ ගැන සියල්ල ඉගෙනගත හැකිය. එහෙත් කිසිදු ප්‍රශංසාවෙන් හා යාච්ඤාවෙන් උන්වහන්සේට ප්‍රතිචාර නොදක්වා සිටිය හැකිය.

### සැබෑ දෙවියන්වහන්සේට වැරදි ආකාරයෙන් නමස්කාර කිරීම:

ඔබට නිවැරදි දෙවියන්වහන්සේට වැරදි ආකාරයෙන් නමස්කාර කළ හැකිය. පහත දැක්වෙන ආකාරයට නමස්කාර කළ විට ඔබ දෙවියන්වහන්සේට නමස්කාර කරන්නේ වැරදි ආකාරයෙන් වේ.

1. **ඔබට වැටහෙන ආකාරයට**
නික්මයාම 32 හි ඉශ්‍රායෙලය රන් වහු රූපයකිනි දෙවියන්වහන්සේට සමාන කළේය. ඔව්හු උන්වහන්සේ රූපයක් බවට පත් කර පිළිගත නොහැකි අකාරයෙන් නමස්කාර කළහ. යෙසායා 40:18-26 න් පෙන්වන්නේ දෙවියන්වහන්සේ රූපයකට සමාන කළ නොහැකි බවය. අද ඇතැමුන් පවසන්නේ "මා දෙවියන්වහන්සේට නමස්කාර කරන්නේ මට වැටහෙන පරිදි වේ" යනුවෙනි. එහෙත් මෙය පිළිගත නොහැකිය. දෙවියන්වහන්සේ පිළිබඳ නිර්වචනය ශුද්ධ ලියවිල්ලේ නිර්ණායකවලට ගැළපිය යුතුය.

2. **තමා කැමති රටාවකට:**
- කායින් තමාට අවශ්‍ය ආකාරයට දෙවියන්වහන්සේට නමස්කාර කිරීමට උත්සාහ කළේය. එහෙත් දෙවියන්වහන්සේ එය ප්‍රතික්ෂේප කළ සේක (උත්පත්ති 4)
- නාදබ් හා අබිහු නීති විරෝධී ගිනි පූජා කර මළේය (ලෙවී. 10:1-2)
- පසුතැවිලිවීම අවශ්‍ය වූ විට සාවුල් නමස්කාර කළේය (1 සාමු. 13:8-14)

- පරිසිවරු තමාගේම නිත්‍යනුකුල, සම්ප්‍රදායික ක්‍රමයට නමස්කාර කළහ. එහෙත් ඉන් පලක් නොවීය (මතෙ. 15:1-9, 23:23-28).

3. **වැරදි ආකල්පයක් ඇතිව**
මලාකි 1:6-14, 3:13-14, 4:1, 3 හි සඳහන් වන්නේ චාරිත්‍රානුකුලව, පුරුදු පරිදි කළ නමස්කාරය පිළිබඳවය. මේ පාපයේ නායකයෝ වූයේ පූජකයෝය. එහෙත් එය සෙනඟ දක්වා පැතිරිණි. "මේ මොන කරදරයක්ද,"යි නමස්කාරය පිළිබඳව සෙනඟ පැවසූහ. පිළිගත නොහැකි නමස්කාරයේ ප්‍රතිඵල මලාකි 4:1, 3 හි බලන්න. යෙසායා 1:11-20 කියවන්න. සෙනඟ නිවැරදි දේ නිවැරදි ආකාරයට නිවැරදි දෙවියන්වහන්සේට කළහ. එහෙත් එසේ කළේ වැරදි ආකල්පයකිනි.

## තේජාලංකාරය ඉවත්ව ගොස් ඇති විට

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය පිලිබඳ ඔබ දැනටමත් අධ්‍යයනය කර ඇති අතරම ගිවිසුම් කරඬුව ඉශ්රායෙල් සෙනගගෙන් ගෙන ගිය විට තේජාලංකාරය ඉවත්වූ ආකාරය ඔබ දන්නවා ඇත. දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ගත් විට, දෙවියන්වහන්සේ තවදුරටත් ඉශ්රායෙල්හි නමස්කාර මෙහෙයට සහභාගි නොවූ සේක. යෙසායා 1:11-15 කියවන්න. දෙවියන්වහන්සේ නොසිටි බව කිසිවෙකුට දැනුනේවත් නැත. අද මෙම කොටස දෙවියන්වහන්සේ නවීන සභාවන්ට ලියන සේක් නම් එය මෙසේ විය හැකිය.

"ඔබගේ දසයෙන් කොටස් හා පූජාවන් රාශිය . . . ඒවා මට කුමන අකාරයේද? ඔබගේ කැපවීම් ලෙස සලකන බොහෝ දේ . . . ඔබගේ යහපත් ක්‍රියා, වැඩි දියුණු කිරීමේ ව්‍යාපාර හා අරමුදල් තර කිරීමේ රාත්‍රි භෝජන සංග්‍රහයන් ආදිය ඕනෑවටත් වඩා මට ලැබී ඇත. ඔබගේ විනෝදය ගෙන දේන, වාචාල, විහිලූ කරන ගායකයන් හා දේශකයන්ගෙන් මට වින්දනයක් නොමැත.

ඔබ මා හමුවීමට පැමිණෙන විට, ගරු කිරීමක් නොමැතිව මාගේ මළුව පාගන අය හා මා සමග සහභාගිත්වය පවත්වනවාට වඩා එකිනෙකාට ශුභ පැතීමට වෙහෙසෙන අය මට කුමකටද?

තේරුමක් නැති පූජා ගෙන ඒමෙන් වළකින්න. ඔබගේ සේවාවන් මට කරදරයකි. ඉරිදා උදය හා සවස, බදාදා රාත්‍රි පවත්වන ඔබගේ රැස්වීම් මට ඉවසිය නොහැකිය.

ඔබගේ පෙරහැර, නාට්‍ය හා උත්සව මාගේ ආත්මය අප්‍රිය කරයි. ඒවා මට බරක් වී ඇත. ඒවා ඉසිලීමෙන් මා වෙහෙසට පත්ව ඇත.
යාච්ඤා කිරීමට ඔබේ දෑත් විහිදුවන විට මා මාගේ ඇස් ඔබගෙන් සඟවා ගන්නෙමි. ඔබ යාච්ඤා කරන විට මා සවන් දෙන්නේ නැත."

3. ඔබගේ ආත්මය ගැන තවදුරටත් අධ්‍යයනය කරන්න. ඊට මේවා තිබිය හැකිය.

| | |
|---|---|
| සිත් වේදනාව | නික්මයාම 6:9 |
| බන්ධන | ක්‍රියා 20:22, රෝම 8:15 |
| බිඳුණු | ගීතාවලිය 51:17, හිතෝපදේශ 15:13 |
| ඊර්ෂ්‍යාව | යාකොබ් 4:5 |
| විශිෂ්ට | දානියෙල් 5:12, හිතෝපදේශ 17:27 |
| බයාදු | 2 තිමෝති 1:7 |
| උත්සාහවන්ත | ක්‍රියා 18:25 |
| පිළිකුල් සහගත/කිලිටුකම | 2 කොරින්ති 7:1 |
| යහපත් | නෙහෙමියා 9:20 |
| ශෝකවීම | දානියෙල් 7:15, යෙසායා 54:6 |
| වංචාව | ගීතාවලිය 32:2 |
| දුෂ්කර | ද්විතිය කථාව 2:30 |
| ඉක්මන්වීම | හිතෝපදේශ 14:29, දේශනාකාරයා 7:9 |
| අහංකාරකම | හිතෝපදේශ 16:18 |
| යටහත් | හිතෝපදේශ 16:19, යෙසායා 57:15 |

| | |
|---|---|
| ඊර්ෂ්‍යා සහගත | ගණන් කථාව 5:14 |
| විනිශ්චයේ | යෙසායා 28:6 |
| තෘෂ්ණාව | යාකොබ් 4:5 |
| මෘදුකම | ගලාති 6:1, 1 කොරි. 4:21, 1 පේතෘස් 3:4 |
| අලුත්/නව | එසකියෙල් 11:19, 18, 31, 36: 26, රෝම 7:6 |
| සම්පූර්ණයෙන් පිරියාම | ගීතා. 77:3, 142:3, 143:4. 7 |
| ඉවසීම | දේශනාකාරයා 7:8, |
| ප්‍රත්‍යක්ෂඥානය | මාක් 2:8 |
| දිළිඳු | යෙසා. 66:2, මතෙ. 5:3, |
| විරුද්ධ බලපෑම් | ක්‍රියා 18:5 |
| උඩඟු | දේශනාකරයා 7:8 |
| පරමාර්ථයක් ඇතිව | ක්‍රියා 19:21 |
| අන් අය නම්මා ගැනීමට සමත් | ක්‍රියා 6:10 |
| බලවත් කිරීම | 1 කොරි. 15:45 |
| නිශ්ශබ්දය | සෙකරියා 6:8, 1 පේතෘස් 3:4 |
| සහනය දෙයි | 1 කොරි. 16:18, 2 කොරි. 7:13 |
| ප්‍රීති ප්‍රමෝදය සහිතය | ලූක් 1:47 |
| සහනදායීය | 2 කොරි. 2:13 |
| නිවැරදිය | ගීතාවලිය 51:10 |
| සොයයි | ගීතාවලිය 77:6 |
| සේවය කරයි | රෝම 12:11 |
| සුසුම්ලයි | මාර්ක් 2:8 |
| උදාසීනයි | රෝම 11:8 |
| කනගාටුදායකය | යෙසායා 1:15 |
| ස්ථිරය | ගීතාවලිය 78:8 |
| කැළඹිලි සහිතය | එස්රා 1:1, ක්‍රියා 17:16, හග්. 1:14 |
| ශක්තිමත්ය | ලූක් 2:40 |
| කරදර සහිතය | උත්. 41:8, දානි. 2:3, යොහ. 13:21, 2 තෙස. 2:2 |
| නිස්සාරය | දේශනාකරයා 1:14 |
| වාද විවාද සහිතය | දේශනාකරයා 1:17, 2:11.17 |
| කැමතිය | මතෙ. 26:41, මාක් 14:38 (ආත්මය හා මාංසය අතර ගැටුමක් කතා කරයි) |
| ප්‍රඥාවන්තය | නික්මයාම 28:3 |
| තුවාළ සහිතය | හිතෝපදේශ 18:14 |
| සාවද්‍යය | ලූක් 9:55 |

# දසවන පරිච්ඡේදය

## නමස්කාර කරන්නේ කෙසේද?

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- නමස්කාර කරන්නේ කෙසේද යන්න පිළිබඳව බයිබලය උගන්වන දේ සාරාංශ කිරීමට
- ගින්න, තේජාලංකාරය හා නමස්කාරය අතර සබඳතාව පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **රබානෙන් හා නැටීමෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්. වීණා තතින් හා නලාවෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්.** (ගීතාවලිය 150: 4)

### හැඳින්වීම

ඔබ ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කළ යුතු බව ඔබ දැනටමත් උගත්තෙහිය. එහෙත් නියත වශයෙන්ම ඔබ නමස්කාර කළ යුත්තේ කෙසේද? දෙවියන්වහන්සේ විසින් අලුත් කරනු ලබන මෙම "දාවිත්ගේ මණ්ඩපයේ" පිළිගත හැක්කේ කවර ආකාරයේ නමස්කාරයක්ද?

බයිබලයේ සඳහන් නමස්කාරය ඇතැම් අවස්ථාවල ගෞරවනීය වේ. මනුෂ්‍යයෝ මුනින් තලා වැටුණෝය. භාවනා කළහ. එමෙන්ම දෙවියන්වහන්සේ ඉදිරියේ නිශ්ශබ්ද වූහ. එහෙත් නමස්කාරය ඇතැම් විට ප්‍රීතියෙන් යුක්ත, ඝෝෂා සහිත හා ආකර්ෂණීයද විය. ඉශ්‍රායෙලය පිළිබඳව මෙසේ පවසා ඇත. "රජතුමාගේ කෑ ගැසීම ඔවුන් අතරය." මණ්ඩපයේ ඝෝෂා ශබ්දය තිබූ විට දෙවියන්වහන්සේ එතැන වැඩ සිටි සේක. ශබ්දයක් නැති විට උන්වහන්සේ සිටියේ නැත.

ඇතැම් අය මේ ආකාරයෙන් ප්‍රීතියෙන් ඝෝෂා කරන නමස්කාරයට විරුද්ධ වෙති. "එය අසභ්‍ය හා පිළිවෙළක් නැති බව" ඔවුහු පවසති. "සියල්ල විනීතවද විධිමත්වද කළ යුතුය" යි බයිබලයේ සඳහන් වේ. (1 කොරින්ති 14:40) එහෙත් අවධාරණය කළ යුත්තේ "සියල්ල ... කළ යුතුය" යන්න වෙත වේ.

ප්‍රීති ඝෝෂා සහිත නමස්කාරය අනවශ්‍ය හා මෝඩ එකක්යයි සමහරු කියති. එහෙත් අප මෝඩයයි සිතන දෙයත් දෙවියන්වහන්සේගේ බලය හා ආශිර්වාදයත් අතර සබඳතාවක් බයිබලය පෙන්වයි. මේ "මෝඩ" දේවල් ගැන සිතා බලන්න.

- මෝසෙස් සිය සැරයටිය රතු මුහුදට ඉහළින් එසවූ විට ජලය දෙබෑ වීම.
- ඉශ්‍රායෙල්වරුන් මොර ගැසීම හා යෙරිකෝවේ පවුරු බිඳ වැටීම.
- ගිඩියොන් හා මිනිසුන් 300ක් පැන් කළස්, පහන් හා හොරණෑ මඟින් මිදියන් හමුදාව පරාජය කිරීම.
- අන්ධ මිනිසා සිලෝවම් පොකුණෙන් ඇස් සේදූ පසු පෙනීම ලැබීම.
- ලාදුරු රෝගයෙන් සුවය ලබා ගැනීම සඳහා නාමන්, ජෝර්දාන් ගඟේ මඩ වතුරේ නෑම.
- ජේසුස් බදු මුදල් මාලුවාගේ කටින් ලබා ගැනීම.

ඔබ මෙම පාඩමෙන් ගෞරවයෙන් යුක්ත මෙන්ම ප්‍රීති ප්‍රමෝදයෙන් කෙරෙන නමස්කාරයන් ගැන ඉගෙන ගන්නෙහිය. නමස්කාරය සේවය සඳහා සන්නද්ධ කෙරෙන එක් ශ්‍රේෂ්ඨතම බයිබලීය මූලධර්මයකි, මන්ද සැබෑ නමස්කාරය දෙවියන්වහන්සේගේ සෙනඟ පොලඹවන අතර සන්නද්ධ කරයි.

### අප නමස්කාර කරන ආකාරය

ස්වාමීන්වහන්සේට නමස්කාර කරන බයිබලීය ක්‍රම සමහරක් මෙසේ වේ.

### සේවය කිරීමෙන්

සේවය කිරීමෙහිදී ඔබගේ ශ්‍රේෂ්ඨතම මෙහෙවර වන්නේ ප්‍රශංසාව හා නමස්කාරය වේ. එහෙත් උන්වහන්සේගේ සත්‍යය පදනම් කරගෙන දෙවියන්වහන්සේගේ වැඩ කිරීමෙන් කරන සේවයෙන්ද ඔබ නමස්කාර කරන්නෙහිය. නිදසුනක් ලෙස දෙවියන්වහන්සේට සේවය කිරීමේ එක් ක්‍රමයක් වන්නේ "ගොස් සියලු ජාතීන්ට උගන්වන්න" යන කැඳවීමට ප්‍රතිචාර දැක්වීමෙනි.

### දීමෙන්

ද්‍රව්‍යමය සම්පත් දීම සාමාන්‍ය සේවයේ කොටසක් වූ අතර එය නමස්කාරයේ ක්‍රියාවක් ලෙස සැලකිණි.

### උන්වහන්සේ ඉදිරියේ නිශ්ශබ්දව සිටීම.

මෙම ගෞරව දැක්වීම සඳහා නිශ්ශබ්දව සිටීමේ ආකල්පයට දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ වචනය මත භාවනා කිරීමද අන්තර්ගත වේ.

> **මාංසමය වූ සියල්ලෙනි, ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි නිශ්ශබ්ද වෙන්න. මක්නිසාද උන්වහන්සේ ස්වකීය ශුද්ධ වාසස්ථානයෙන් නැගුටුණ සේක. (සෙකරියා 2:13)**

### ඔබගේ මුඛයෙන් නමස්කාර කිරීම

ඇඟිලි සලකුණු මෙන් සෑම මනුෂ්‍යයෙකුගේම කටහඬද "සලකුණක්" බව විද්‍යාව ඔප්පු කර තිබේ. ඔබගේ "කටහඬේ සලකුණ" ඇඟිලි සලකුණු මෙන්ම අනෙකුත් කටහඬවලට වඩා වෙනස් වේ. දෙවියන්වහන්සේ ඔබගේ කටහඬ දන්නා අතර දිනපතා උන්වහන්සේට ප්‍රශංසා කිරීමට ඔසවන අන්දමට සවන් දීමට උන්වහන්සේ බලා සිටින සේක. දෙවියන්වහන්සේට නමස්කාර කිරීම පිණිස ඔබට ඔබගේ කටහඬ භාවිත කළ හැකි ක්‍රම කිපයක් මෙසේ වේ:

### ප්‍රශංසාව මුවින් ප්‍රකාශ කිරීම

> **එබැවින් දෙවියන්වහන්සේගේ නාමයට ස්තුතිකරන තොල්වල ඵල වන ප්‍රශංසාව නමැති පූජාව උන්වහන්සේම කරණකොටගෙන නිතරම දෙවියන්වහන්සේට ඔප්පු කරමු. (හෙබ්‍රෙව් 13:15)**

"අපගේ තොල්වල ඵල වන්නේ" දෙවියන්වහන්සේට නමස්කාර කිරීම වේ. ප්‍රශංසාව මුවින් ප්‍රකාශ කිරීම.

### මුල් කිතුනුවන්ගේ පුරුද්ද විය.

> **නිතරම දේව මාළිගාවෙහි දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් සිටියෝය. (ලූක් 24:53)**

> **සෑම කිතුනුවෙකු වෙනුවෙන්ම දෙවියන්වහන්සේගේ බලාපොරොත්තුව එය වේ.**

> **සියල්ලේදී ස්තුති කරන්න. මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලා ගැන දෙවියන්වහන්සේගේ කැමැත්ත මේය. (1 තෙසලෝනික 5:18)**

### ආත්මයෙන් පිරී ජීවිතයක් ඇති බව ඔප්පු කෙරේ.

> **මුද්‍රික පානයෙන් මත් නොවෙන්න. එයින් අනාචාරකම් හට ගන්නේය. නුමුත් ආත්මයාණන්ගෙන් පූර්ණ වී, ගීතිකාවලින්ද කවිවලින්ද ආත්මික ගී වලින්ද එකිනෙකාට කතා කොට නුඹලාගේ සිත්වලින් ස්වාමීන්වහන්සේට ගායනාද ගීතිකාද කරමින් අපගේ ස්වාමිවූ යේසුස්**

ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සියලු දේ ගැන පියවූ දෙවියන්වහන්සේට නිතරම ස්තුති කරන්න.( එපීස 5:18-20)

## රාජකීය පූජක පෙළක (ඇදහිලිවතුන්ගේ) ප්‍රධාන කාර්යය වේ.

නුමුත් අන්ධකාරයෙන් තමන්ගේ විස්මපත් ආලෝකයට නුඹලා කැඳවා ගත් තැනැන්වහන්සේගේ උත්කෘෂ්ටතාවන් දක්වන පිණිස නුඹලා වනාහි තෝරාගත් වංශයක්ද රාජකීය පූජකයෝද ශුද්ධ වූ ජාතියක්ද දෙවියන්වහන්සේගේ සන්තක සෙනඟක්ද වන්නහුය. (1 පේතෘස් 2:9)

## උන්වහන්සේ අභිමඛයට පිවිසීම සපයයි.

ස්තුති කරමින් උන්වහන්සේගේ දොරටුවලින් ඇතුල්ව, ප්‍රශංසා කරමින් උන්වහන්සේගේ මණ්ඩපවලට පැමිණෙව්. උන්වහන්සේට ස්තුති කරමින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසා කරව්. (ගීතාවලිය 100:4)

## සිංහාසනයේ සිට දෙන ලද පණිවුඩයක් මඟින් අණ කෙරිණි.

තවද: අපේ දෙවියන්වහන්සේගේ සියලු මෙහෙකරුවෙනි, උන්වහන්සේට භය ඇති ලොකු කුඩා සියල්ලෙනි, උන්වහන්සේට ප්‍රශංසා කරන්නැයි කියන ශබ්දයක් සිංහාසනයෙන් නිකුත් විය. (එළිදරව් 19:5)

## ඔබට හුස්ම තිබෙන තුරු ඔබ කළ යුත්තක්ම වේ.

හුස්ම ඇති සියල්ලෝම ස්වාමීන්ට ප්‍රශංසා කෙරෙත්වා. ස්වාමීන්ට ප්‍රශංසා කරව්. (ගීතාවලිය 150:6)

## මුළු දවස පුරාම කිරීමේ පුරුද්දක් විය යුතුය.

නැගෙනහිර පටන් බස්නාහිර දක්වා ස්වාමීන්ගේ නාමයට ප්‍රශංසා කටයුතුය. (ගීතාවලිය 113:3)

## ශ්‍රාවකත්වයේ ලකුණකි.

මාගේ පියාණන්වහන්සේට ගෞරව ලැබෙන්නේ නුඹලා විසින් බොහෝ ඵල දැරීමෙන්ය. මෙසේ නුඹලා මාගේ ගෝලයෝ වන්නෝය. (යොහන් 15:8)

## මහලු ශාන්තුවරයන්ට වුවද කළ හැකිය.

...ඔවුහු මහලු වයසේදීත් ඵලදෙමින් සාරවත් වන්නෝය. සශ්‍රීක වන්නෝය. (ගීතාවලිය 92:15)

## තෘප්තිමත් වීමේ ප්‍රතිඵලයකි.

මනුෂ්‍යයෙක් තමාගේ මුඛයේ ඵලය නිසා යහපතෙන් තෘප්තිමත් වන්නේය. මනුෂ්‍යයෙකුගේ දෑතේ ක්‍රියාවල ඵලයද ඔහුට දෙනු ලැබේ. (හිතෝපදේශ 12:14)

## අන්‍ය භාෂාවලින් කතා කිරීම

1 කොරින්ති 14:14-18 ඔබගේ බයිබලයෙන් කියවන්න. ඔබ ස්වර්ගීය භාෂාවෙන් නමස්කාර කරන විට ඔබගේ ප්‍රශංසාව පරිපූර්ණ වේ. තමා කිසිවෙකුටත් වඩා අන්‍ය භාෂාවලින් කථා කළ බැවින් තමා සතුටු වන බව පාවුල්තුමා පැවසුවේ එබැවිනි.

## කෑ ගැසීම :

යුගයේ ආරම්භයේ සිටම දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම සඳහා කෑ ගැසීම භාවිත කරන ලදී.

> **පහන් තාරකා එක්ව ගීතිකා කරමින්, දෙවියන්වහන්සේගේ සියලු පුත්‍රයන් ප්‍රීතිඝෝෂා පවත්වද්දී, ඒකේ කොණේ ගල තැබුවේ කවුද? (ජෝබ් 38:7)**
>
> **... ඒවා ප්‍රීතියෙන් ඝෝෂා කරමින් ගායනා කරති. (ගීතාවලිය 65:13)**
>
> **ස්වර්ගයෙනි, ගී කියන්න. මක්නිසාද ස්වාමීන්වහන්සේ ඒක කළ සේක. පොළොවේ පහත් තැන් ඝෝෂා කරන්න. කඳුද වනයද එහි සියලු ගස්ද යන නුඹලා ප්‍රීතියෙන් ශබ්ද නඟන්න. මක්නිසාද ස්වාමීන්වහන්සේ යාකොබ් මිදූ සේක. ඉශ්‍රායෙල් කරණ කොටගෙන ගෞරව ලබා ගන්න සේක. (යෙසායා 44:23)**

කෑ ගැසීම පිළිබඳ බයිබලයේ ඉගැන්වීම් සමහරක් මෙසේය:

- දෙවියන්වහන්සේ ජය ගොස නංවා සිහසුන මත නැඟුණ සේක. ගීතාවලිය 47:5
- යේසුස්වහන්සේ හඬ නගමින් වඩින සේක. 1 තෙසලෝනික 4:16
- ප්‍රීතිය හා සන්තෝෂය නොමැති විට, ඝෝෂාවක් නැත. යෙරෙමියා 48:33

ස්වාභාවික ලෝකයේ ඔබ ක්‍රීඩා තරඟයක් නරඹන විට, ඔබට ක්‍රීඩාව ගැන අවබෝධයක් නොමැති නම්, ඔබ කැමති කණ්ඩායම වෙනුවෙන් ජයඝෝෂා නැගිය යුත්තේ කුමන අවස්ථාවෙහිදැයි ඔබ නොදනී. ආත්මිකවද එය සත්‍යයකි. ආත්මික ක්ෂේත්‍රයේ සිදුවන දෙය කෑ නොගසන අයට සැබවින්ම අවබෝධ වූයේ නම්, ඔවුන්ද කෑ ගසනු ඇත. යේසුස්වහන්සේ අපගේ සතුරා පරාජය කර ඇත. අප මරණයෙන් ගැලවී ඇති අතර අපට සදාතන ජීවනය තිබේ. උන්වහන්සේ අපගේ සුවය හා සැපයීම වේ. අප තුළ කෑ ගැසීමක් පැන නැඟීම නොහැඟෙන්නේ කෙසේද?

බයිබලයේ කෑ ගැසීම භාවිත කර ඇති අවස්ථා සමහරක් මෙසේ වේ:

### දෙවියන්වහන්සේ වැඩ වසන නිසා කෑ ගැසීම:

"ඔවුන් අතර රජෙකුගේ කෑ ගැසීම" තිබූ විට ලෝකය සැලකිලිමත් විය. (ගණන් කතාව 23:21)

> **මෙසේ සියලු ඉශ්‍රායෙල්වරු ඔල්වර හඬත් - හොරණෑ ශබ්දයත් ඇතුව, නළාවලිනුත් අත්තල්වලිනුත්, වීණාවලිනුත් මහාවීණාවලිනුත් ශබ්ද පවත්වමින්, ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ගෙනාවෝය. (1 ලේකම් 15:28)**
>
> **ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය කඳවුරට පැමිණි කල සියලු ඉශ්‍රායෙල්වරු පොළොව දෝංකාර දෙන මහත් ඝෝෂාවකින් ඝෝෂා කළෝය.**
>
> **පිලිස්තිවරු ඒ ඝෝෂාවේ ශබ්දය අසා: හෙබ්‍රෙව්වරුන්ගේ කඳවුරේ තිබෙන මේ මහත් ඝෝෂාවේ ශබ්දය කිමෙක්දැයි කීවෝය. ස්වාමීන්වහන්සේගේ පෙට්ටිය කඳවුරට පැමිණි බව ඔවුහු දැන ගත්තෝය. (1 සාමුවෙල් 4:5-6)**

### සමිඳාණන්වහන්සේ එළිදරව් වීමේදී කෑ ගැසීම:

> **"සියලු සෙනඟ හඬ නගා මුනින් තළා වැටුණාහ." (ලෙවී කතාව 9:24)**

### කැපවීම සඳහා කෑ ගැසීම:

> **ඔවුහු මහත් හඬද ඝෝෂාවද හොරණෑවලත් නළාවලත් ශබ්දයද ඇතුව ස්වාමීන්වහන්සේට දිවුරුම් දුන්නෝය. (2 ලේකම් 15:14)**

### දෙවියන්වහන්සේගේ වැඩ කටයුතු නිසා කෑ ගැසීම:

දෙවියන්වහන්සේගේ මාළිගාවෙහි අත්තිවාරම් දමන විට ඔවුහු ප්‍රීතියෙන් හඬ නගා කෑ ගැසූහ. (එස්රා 3:11-13)

## යුද සංග්‍රාමයේදී කෑ ගැසීම

- හඬ ගසන විට පෙරිකෝවේ පවුරු බිම වැටිණි. යෝෂුවා 6
- “ඔල්වර හඬ නඟන්න. මන්ද, සමිඳාණන්වහන්සේ ඔබ හැමට නුවර දී තිබේ.” යෝෂුවා 6:16
- දාවිත් රණ බිමට පැමිණ ඔල්වර හඬ නැගීය. 1 සාමුවෙල් 17:20
- පිලිස්තිවරුන් ලුහුබැඳ යන විට දෙවියන්වහන්සේගේ හමුදාව ඔල්වර හඬ නැඟූහ. 1 සාමුවෙල් 17:52
- නොදැහැමියන් නසින විට නගරය ඔල්වර හඬ නගයි. හිතෝපදේශ 11:10

**නුමුත් ඔබ සරණ කොටගන්න සියල්ලෝ සන්තෝෂ වෙත්වා. ඔබ ඔවුන් ආරක්ෂා කරන බැවින් සදාකල් ප්‍රීති නාද කෙරෙත්වා. ඔබගේ නාමයට ප්‍රේම කරන්නෝ ඔබ කෙරෙහි ප්‍රීතිවෙත්වා. (ගීතාවලිය 5:11)**

**එවිට යුදා මනුෂ්‍යයන් ඔල්වර හඬ ගැසූකල දෙවියන්වහන්සේ යෙරොබොවම් සහ සියලු ඉශ්‍රායෙල්වරුන් අබියාටත් යුදාවරුන්ටත් පැරදවූසේක. (2 ලේකම් 13:15)**

**එම්බා මහත් කන්ද, නුඹ කවුද? ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි නුඹ සම භූමියක් වන්නෙහිය. ඔහුද: ඊට කරුණාව ලැබේවා, කරුණාව ලැබේවයි මොර ගසමින් ප්‍රධාන ගල පිටතට ගෙනෙනවා ඇතැයි කීය. (සෙකරියා 4:7)**

## අපට කෑගසන ලෙස අණකොට ඇත:

**නුමුත් ඔබ සරණ කොටගන්න සියල්ලෝ සන්තෝෂ වෙත්වා. ඔබ ඔවුන් ආරක්ෂා කරන බැවින් සදාකල් ප්‍රීතිනාද කෙරෙත්වා. ඔබගේ නාමයට ප්‍රේම කරන්නෝ ඔබ කෙරෙහි ප්‍රීතිවෙත්වා. (ගීතාවලිය 5:11)**

**මාගේ ධර්මිෂ්ඨ කාරණයට ප්‍රියවන්නෝ ප්‍රීති ඝෝෂා කෙරෙත්වා, සන්තෝෂ වෙත්වා. එසේය: තමන් මෙහෙකරුවාගේ යහපතට ප්‍රිය වූ ස්වාමීන්වහන්සේ උසස් වන සේක්වයි ඔවුන් නිතරම කියත්වා. (ගීතාවලිය 35:27)**

**සියලු මනුෂ්‍ය වර්ගයෙනි අත්පොළසන් දෙව්, ජය නාදයෙන් දෙවියන්වහන්සේට හඬ නගව්. (ගීතාවලිය 47:1)**

**ඔබගේ පූජකයෝ ධර්මිෂ්ඨකමින් සැරසෙත්වා. ඔබගේ ශුද්ධවන්තයෝද ප්‍රීති ශබ්ද කෙරෙත්වා. (ගීතාවලිය 132:9)**

**එහි පූජකයන්ද ගැළවීමෙන් පළඳවන්නෙමි. එහි ශුද්ධවන්තයෝත් ප්‍රීතියෙන් ඝෝෂා කරන්නේය. (ගීතාවලිය 132:16)**

**එම්බා සියොන් වැසිය, ශබ්ද පවත්වා මොර ගසන්න. මක්නිසාද නුඹ මධ්‍යයෙහි ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේ උතුම්ව සිටින සේක. (යෙසායා 12:6)**

**සියොන් දියණියෙනි, ගී කියන්න. ඉශ්‍රායෙල් ඝෝෂා කරන්න. යෙරුසලම් දියණියෙනි, මුළු සිතෙන් සන්තෝෂ වී ප්‍රීතිමත්වෙන්න. (ශෙපනියා 3:14)**

**සියොන් දියණියෙනි, බොහෝ සෙයින් ප්‍රීතිමත් වෙන්න, යෙරුසලම් දියණියෙනි, ශබ්ද පවත්වන්න. බලව, නුඹේ රජ නුඹ වෙතට එන සේක. උන්වහන්සේ ධර්මිෂ්ඨය. ගැළවීම ඇත්තාය... (සෙකරියා 9:9)**

**එසේය, ස්වාමීන්වහන්සේ මෙසේ කියන සේක: යාකොබ් ගැන ප්‍රීතියෙන් ගී කියා ජාතීන්ට ප්‍රධාන ජාතිය ගැන ශබ්ද නගන්න. ප්‍රශංසා කරමින්ද වර්ණනා කරමින්ද: ස්වාමීන්වහන්ස, ඔබගේ සෙනඟ වන ඉතුරුව සිටින ඉශ්‍රායෙල්වරුන් ගැළවුව මැනවයි කියන්න. (යෙරෙමියා 31:7)**

## සිනහව:

සිනහවද දෙවියන්වහන්සේට වාචිකව ප්‍රශංසා කිරීමේ ක්‍රමයකි.

**ස්වාමීන්වහන්සේ සියොන් කෙරෙන් වාලට යන්නවුන් ආපසු ගෙනා කල, අපි හීනයක් දුටුවන් මෙන් වීමුව. එකල අපේ කට සිනාවෙන්ද අපේ දිව ගායනාවෙන්ද පිරුණේය. එකල: ස්වාමීන්වහන්සේ මොවුන් උදෙසා මහත් දේ කරන ලදැයි ජාතීන් අතරේ කියන ලද්දේය. ස්වාමීන්වහන්සේ අප උදෙසා මහත් දේ කළ සේක. එබැවින් අපි සන්තෝෂ වෙමුව. (ගීතාවලිය 126:1-3)**

## ගී ගැයීම :

නමස්කාර දේව මෙහෙයක සංගීතය, දේශනා කිරීමේ ප්‍රධාන කාර්යයට පෙර කෙරෙන දෙයක් නොවේ. එහෙත් එය ප්‍රධාන කාර්යයේ කොටසක් වන නමස්කාරයයි. පැරණි ගිවිසුමේ "ගී ගැයීම" ලෙස පරිවර්තනය කොට ඇත්තේ එකිනෙකාට වෙනස් වචන අටකි. එක් වචනයකින් අදහස් වන්නේ ප්‍රීතිවීම වෙනුවෙන් ඔල්වර හඬ නගන්න හෝ හඬ නගා ගී ගයන්න වේ. තවත් වචනයකින් අදහස් වන්නේ ගී ගැයීම හා හොරණෑ පිඹීමේ ප්‍රීතිමත් හඬක් යන්නය.

ආත්මික ගී ගැයීමෙන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කළ හැකි සූදානම් කළ වාග් මාලාවක් සැපයෙන අතර අප සියලු දෙනාම එකට ගී ගයන විට එක්සත්ව ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් සැලසේ. දාවිත් සෑම වේලාවෙහිම අන් අයගෙන් ඉල්ලා සිටියේ නමස්කාර ගී ගැයීමට තමා සමඟ එක්වන ලෙසය. සංගීතයේ හා ගී ගැයීමේ බලය සාතන් දනී. ඔහුගේ බොරු පැතිරීම සඳහා දුෂ්ට ගීත සාතන් භාවිත කර ඇත්තේ එබැවිනි.

නමස්කාරයේදී ගී ගැයීම පිළිබඳ උපදෙස් කොලොස්සි 3:16න් හා එපිස 5:19න් සපයා ඇත. අප භාවිත කළ යුත්තේ :

- බැති ගී: බයිබලයේ ගීතාවලිය පොත වන ඉශ්‍රායෙල්වරුන්ගේ ගීතිකා පොතෙන් ගීත
- ගීතිකා: දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ ගුණාංග පිළිබඳ ගී හා දෙවියන්වහන්සේ ආමන්ත්‍රණය කරන ගී.
- ආත්මික ගී: හදවතින් පැන නගින ගී. "ආත්මයෙන් හා අවබෝධයෙන් යුක්තව" ගැයීම.

ආත්මයෙන් ගී ගැයීම යනු බුද්ධියෙන් ගී ගැයීම නොවේ. ඇතැම් අවස්ථාවලදී දෙවියන්වහන්සේ යම් කිසි ප්‍රශංසා කිරීමේ ගියක් තුළින් ක්‍රියා කළ හැකිය. උන්වහන්සේ එසේ කරන විට ඒ හා සමඟ ගැලීමට බිය නොවන්න. "ඔබ එය බොහෝ වාරයක් ගායනා කර ඇත" යයි පැවසීමට බුද්ධියට හෝ තර්කනයට ඉඩ නොදෙන්න. තේරුමක් නැති ගීත "පලක් නැති ගීත" ගැයීමෙන් වැළකී සිටින ලෙස අපට අනතුරු අඟවා ඇත (ආමොස් 6:5). අප ගායනා කළ යුත්තේ මිදීමේ ගීත (1 සාමුවෙල් 6:23) හා ප්‍රශංසා කිරීමේ ගීත (ගීතාවලිය 68:4) වේ.

නමස්කාර දේව මෙහෙයක සංගීතයෙන් කෙරෙන සේවය වැදගත් වේ. දාවිත් සංගීත සේවය සඳහා ලෙවීවරු 4000ක් තෝරා ගත්තේය. 1 ලේකම් 25:6-7හි සඳහන් වන්නේ "සමිඳාණන්වහන්සේගේ මාළිගාවෙහි ගායනා කිරීමට ... සිටි" අය පිළිබඳව වේ.

**ඉශ්‍රායෙලය සංගීතයෙන් හා ගී ගැයීමෙන් "සමිඳාණන්වහන්සේට ප්‍රශංසා කිරීමෙන් ශබ්ද පැවැත්වූ කල ... සමිඳාණන්වහන්සේගේ මාළිගාව වළාපටලයෙන් පිරී ගියේය. (2 ලේකම් 5:12-14)**

යේසුස්වහන්සේ මෙසේ කී සේක:

**මම මාගේ සහෝදරයන්ට ඔබගේ නාමය ප්‍රකාශ කරන්නෙමි. සභාව මධ්‍යයෙහි ඔබට ප්‍රශංසා ගීතිකා කරන්නෙමියි කියන සේක. (හෙබ්‍රෙව් 2:12)**

## සංගීත භාණ්ඩවලින් දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම:

නමස්කාරය පිණිස තූර්යය භාණ්ඩ සෑදීම ගැන දාවිත්ට ප්‍රශංසාව දී ඇත. එහෙත් ඔහු තැනුවේ කුමන ඒවාදැයි නිශ්චිතව අපි නොදන්නෙමු (ආමොස් 6:5). බයිබලයේ තූර්ය භාණ්ඩ වර්ග තුනක් ගැන සඳහන් වේ.

### 1. ඝට්ටනය වන භාණ්ඩ

පූජකවරුන්ගේ ඇඳුමේ වාටියේ ඇති මිණි ගෙඩි : නික්මයාම 28:33-35, සෙකරියා 14:20
අත්තල් : 1 ලේකම් 15:16,19, 19:28, 2 ලේකම් 5:13, 29:25, එස්රා 3:10, නෙහෙමියා 12:27. ඇතැම් තැන්වල "අත්තල්" ලෙස පරිවර්තනය කර ඇති වචනය වර්තමාන කැස්ටනෙට් හා සොලවන භාණ්ඩවලට සමානය.

(ටැම්බරීනය) කිකිණි රබන් : ගීතාවලිය 81:2, 149:3, 150:4, නික්මයාම 15:20.

ඝාණ්ඨාර : 1 කොරින්ති 13:1, ගීතාවලිය 150හි ඝාණ්ඨාර වර්ග දෙකක් ගැන සඳහන් වේ. මහත් ශබ්ද දෙන හා උස් නාද දෙන ඒවා වේ.

### 2. තත් භාණ්ඩ

වීණාව : 1 සාමුවෙල් 10:5
කුඩා වීණා, මහා වීණා, තත් දසයේ වීණා ආදිය. ගීතාවලිය 33:2, 144:9, 92:3
දුල්සිමර් : හොරණෑව හා සමාන භාණ්ඩයක් දානියෙල් 3:5,7,10,15
ලූට් : තත් තුනේ භාණ්ඩයක්
ලයර් : තත් භාණ්ඩයකි. උත්පත්ති 4:21

### 3. ශුෂිර භාණ්ඩ

නළා (ක්ලැරිටනය) : යෙසායා 5:12, 30:29, යෙරෙමියා 48:36
බට නළා හා ඕර්ගනය : උත්පත්ති 4:21, 1 සාමුවෙල් 10:5
1 රාජාවලිය 1:40හි සඳහන්ව ඇත්තේ වර්තමාන "ඔබෝ" :ධඉදැ- හා සමාන ද්විත්ව බට නළා භාණ්ඩයක් වේ.

බට නළාව : යෙසායා 30:29
හොරණෑව හා හිස් කළ ගෙඩි (ෂෝෆාර්) : හොරණෑව සමඟ හිස් කළ ගෙඩි මාරුවෙන් මාරුවට භාවිත කර ඇත. මේවා සතුරාව බිය ගැන්වීම පිණිස යොදාගෙන තිබේ. (විනිශ්චයකාරයෝ 7:19-20). එමෙන්ම සංඥාවක් දීමට භාවිත කර ඇත (යෝෂුවා 6:20, විනිශ්චයකාරයෝ 7:16-22, සෙකරියා 9:14, 15). එළිදරව්වේ, තම දර්ශනයට පෙර යොහන්ට හොරණෑවල ශබ්දය ඇසුණි (එළිදරව් 1:10). හොරණෑව, විනිශ්චයේ සංකේතයක් වේ (1 කොරින්ති 15:52, 1 තෙසලෝනික 4:16, එළිදරව් 8:3).

යුදෙව් සෙනඟ නමස්කාරයට කැඳවීමට අද වුවද ෂෝෆාර් භාවිත කෙරේ.

සංගීත භාණ්ඩ භාවිතයෙන් සමිඳුන් පැසසීමට දිරිගන්වන පද කිපයක් පහත දැක්වේ:

**හොරණෑ ශබ්දයෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්. කුඩා වීණාව හා මහා වීණාවෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්. රබානෙන් හා නැටීමෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්. වීණා තතින් හා නළාවෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්. මහත් ශබ්ද දෙන අත්තලින් උන්වහන්සේට ප්‍රශංසා කරව්. උස් රැව් දෙන අත්තලින් උන්වහන්සේට ප්‍රශංසා කරව්. (ගීතාවලිය 150:3-5)**

**දෙවියන්වහන්ස, ඔබට අලුත් ගියක් ගායනා කරන්නෙමි. තත් දසයේ වීණාව ගෙන ඔබට ප්‍රශංසා ගී කියන්නෙමි. (ගීතාවලිය 144:9)**

**ස්තුති දීමෙන් ස්වාමින්ට ගී කියව්. වීණාවෙන් අපේ දෙවියන්වහන්සේට ප්‍රශංසා ගී කියව්. (ගීතාවලිය 147:7)**

**වීණාවෙන් ස්වාමින්ට ස්තුති කරව්. තත් දසයේ වීණාව රැගෙන උන්වහන්සේට ප්‍රශංසා ගීතිකා කියව්. (ගීතාවලිය 33:2)**

## ඔබගේ ශරීරයෙන් නමස්කාර කිරීම:

මිනිසා ප්‍රාණය හෝ ආත්මය හෝ ශරීරය හෝ පමණක් ලෙස තනිව සිටීමට මවා නැත. ඔහු මේ ත්‍රිත්වයෙන් සමන්විත ත්‍රිත්ව පුද්ගලයකි. ඔබට ආත්මයෙන් හා/හෝ ප්‍රාණයෙන් හෝ පමණක් නමස්කාර කළ නොහැකිය. ඔබ ශරීරයෙන්ද නමස්කාර කළ යුතුය.

ඇතැම් විට අමුතු ලෙස පෙනේ යයි සිතා එසේ කිරීමට අපි අකමැති වෙමු. අපි "මාංසික වනු ඇතැයි" බිය වෙමු. එහෙත් අපගේ අහංකාරය හා කැරලිකාරකම ජයගත් විට අපි අලංකාර ලෙස ප්‍රශංසා හා නමස්කාර කරන්නෙමු.

ශරීරයෙන් නමස්කාර කිරීමට අප අකමැති වීමට හේතු කිපයක් මෙසේ වේ:

1. අහංකාරය
2. අප මීට පෙර එසේ කර නොමැති බැවින් අපට අපහසුතාවක් දැනේ.
3. මිනිසාගේ සම්ප්‍රදායන් පවසන්නේ "අපි මෙවැනි දේ මෙතැන නොකරන්නෙමු" යනුවෙනි.
4. එය ආඥාවක් බව නොදනිමු.
5. එය ආඥාවක් බව අපි පිළිගනිමු. එහෙත් අප කැරලිකාර බැවින් එසේ කිරීමට කැමති නැත.

මේ විරෝධතා අප ජයගෙන ප්‍රාණයෙන් හා ආත්මයෙන් පමණක් නොව ශරීරයෙන්ද නමස්කාර කිරීමට පටන් ගත් විට සමිඳාණන්වහන්සේගේ තේජාලංකාරය අප මධ්‍යයට පැමිණෙනු ඇත. ශරීරයෙන් නමස්කාර කිරීමේ ක්‍රම කිපයක් මෙසේය:

## උන්වහන්සේගේ අභිමුවෙහි සිට ගැනිම:

දෙවියන්වහන්සේට නමස්කාර කිරීම සඳහා උන්වහන්සේගේ අභිමුවෙහි සිටීම ගැන නිදසුන් සමහරක් මෙසේ වේ: 2 ලේකම් 20:19, එසකියෙල් 44:15, ගීතාවලිය 135:1-2, 134:1

## ඔබේ අත් එසවීමෙන් :

අත් එසවීම දෙවියන්වහන්සේට තුති දීම ප්‍රකාශ කිරීමේ බයිබලීය ක්‍රමයකි.

**මක්නිසාද ඔබගේ කරුණා ගුණය ජීවිතයට වඩා යහපත. මාගේ තොල් ඔබට ප්‍රශංසා කරන්නේය. මෙසේ මම ජීවත්ව සිටින තෙක් ඔබට ප්‍රශංසා කරන්නෙමි. ඔබගේ නාමයෙන් මාගේ අත් ඔසවන්නෙමි. (ගීතාවලිය 63:3-4)**

ඉහළට එසවෙන නමස්කාරය ප්‍රකාශ කිරීමේ සංකේතාත්මක ක්‍රමයකි.

**මාගේ යාච්ඤාව ඔබ ඉදිරියේ සුවඳ දුම් මෙන්ද මාගේ අත් එසවීම සන්ධ්‍යා පූජාව මෙන්ද පිහිටා ගනිවා. (ගීතාවලිය 141:2)**

ඔබ අත් ඔසවන විට ඔබගේ හදවත නමස්කාරයෙන් එසවීමක් වේ.

**ස්වර්ගයෙහි සිටින දෙවියන්වහන්සේ වෙතට අපගේ අත් සමග අපේ සිත්ද ඔසවමු. (විලාප ගී 3:41)**

ආත්මික පිපාසය ප්‍රකාශ කිරීමේ එක් ක්‍රමයක් වන්නේ ඔබගේ අත් එසවීම වේ.

> **මාගේ අත් ඔබ දෙසට දිගු කරමි. වියළි බිමක් මෙන් මාගේ ආත්මය ඔබට පිපාසා වේ. (ගීතාවලිය 143:6)**

ඔබ අත් එසවූ විට, ඔබ දෙවියන්වහන්සේට විවෘත වෙමින් පවසන්නේ, “සැමිණ, ඔබවහන්සේගේ අභිමුඛයෙන් මා පුරවන්න” යන්න වේ. ආශිර්වාදනය දීමේදී ද අන් අයට හා දෙවියන්වහන්සේට ආශිර්වාද කිරීමක් ලෙස අත් ඔසවනු ලැබේ. යේසුස්වහන්සේ, තම පියාණන්වහන්සේ ළඟට වැඩියේ අත් ඔසවාගෙන උන්වහන්සේ ප්‍රේම කළ අය වෙනුවෙන් මැදහත්කාරකම් කරමින් හා ආශිර්වාද කරමිනි (ලූක් 24:50-51). එය දේව වචනය නිශ්ශබ්දව ස්ථිර කරයි.

> **මා ප්‍රේම කළාවූ ඔබගේ ආඥාවන් දෙස මාගේ අත් ඔසවමින් ඔබගේ පනත් භාවනා කරන්නෙමි. (ගීතාවලිය 119:48)**

බයිබලය එය ධෛර්යවත් කරයි.

> **එබැවින් පුරුෂයන් සැමතැන්හිම කෝපයත් විවාදයත් නැතුව, පිරිසිදු අත් ඔසවා යාච්ඤා කරනවාට කැමැත්තෙමි. (1 තිමෝති 2:8)**

බයිබලය එය අණ කරයි.

> **ශුද්ධස්ථානය දෙසට අත් ඔසවා, ස්වාමීන්ට ප්‍රශංසා කරව්. (ගීතාවලිය 134:2)**

## අත්පුඩි ගැසීම

> **සියලු මනුෂ්‍ය වර්ගයෙනි, අත්පොළසන් දෙව්. ජය නාදයෙන් දෙවියන්වහන්සේට හඬ නගව්. (ගීතාවලිය 47:1)**

## හිස නැමීම හා දණ ගැසීම

“නැමීම” යනු හිස හෝ මුළු ශරීරයම හෝ විය හැකිය. නමස්කාර කිරීමේ ක්‍රමයක් වශයෙන් හිස/ශරීරය නැමීම හා දණ ගැසීම පෙන්වන නිදසුන් සඳහා පහත දැක්වෙන පද කියවන්න: උත්පත්ති 24:48, නික්මයාම 4:31, 12:27, 1 ලේකම් 29:20,30, 2 ලේකම් 6:13, 1 රාජාවලිය 8:54, නෙහෙමියා 8:6, දානියෙල් 6:10, මතෙව් 17:14, මාර්ක් 1:40, 10:17, ලූක් 22:41, ක්‍රියා 7:60, 9:40, 20:36, 21:5.

හිස නමා නමස්කාර කිරීමට අපට අණ කර තිබේ:

> **එව්, නමස්කාර කරමින් වැඳ වැටෙමු. අපේ මැවුම්කාර ස්වාමීන් ඉදිරියේ දණ ගසමු. (ගීතාවලිය 95:6)**

සමිඳාණන් ඉදිරියේ “සෑම දණක්ම නැමිය යුතු” බව බයිබලය පවසයි.

> **සියලු දණහිස් මට නැමෙනවා ඇත, සියලු දිව්ද මා ගැන දිවුරනවා ඇත කියා මමම මා ගැන දිවුළෙමි, අවලංගු නොවන ධර්මිෂ්ඨකමේ වචනයක් මාගේ මුඛයෙන් නික්මුණේය. (යෙසායා 45:23)**

> **මක්නිසාද : මා ජීවත්ව සිටිනු සැබෑවා සේම සෑම දණහිස් මට නමන්නේය. සෑම දිව්ද දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්නේය කියා ස්වාමීන්වහන්සේ කියන සේකැයි ලියා තිබේ. (රෝම 14:11)**

> **එසේ කළේ ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමීන්වන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඒත්තු ගන්න පිණිසත්ය. (පිලිප්පි 2:10-11)**

ශුභාරංචිය පිළිබඳ අපගේ දැනුම හා සහාව තුළ අපට ඇති ස්ථානය හා යේසුස්වහන්සේ ගැන පාවුලුතුමා කතා කරන විට අප දණ නැමිය යුතු හේතුව පවසයි.

**මේ හේතුව නිසා ... මම දණින් වැටී යාච්ඤා කරමි. (එපීස 3:14-15)**

හිස නැමීමේ වැදගත්කම නිසා ව්‍යාජ දෙවිවරුන්ට හිස නැමීමේ විපාක ගැන බයිබලය අනතුරු අඟවයි. නික්මයාම 23:24, ලෙවී කතාව 26:1, ද්විතීය කතාව 5:9, ගණන් කතාව 25:2, යෝෂුවා 23:7, විනිශ්චයකාරයෝ 2:12, 17, 19, 1 රාජාවලිය 19: 18, රෝම 11:4, 2 රාජාවලිය 17:35, 2 ලේකම් 25:14.

## උඩ පැනීම හා ඇවිදීම:

දෙවියන්වහන්සේට නමස්කාර කිරීමේදී උඩ පැනීම හා ඇවිදීමද සම්බන්ධ කර ගත හැකිය. ගිවිසුම් කරඬුව ඉශ්රායෙලයට නැවත ගෙන එන විට දාවිත් උඩ පැන්නේය (2 සාමුවෙල් 6:16). සුවය ලැබූ කොර මිනිසා ඇවිදිමින්ද උඩපනිමින්ද දෙවියන්වහන්සේට ප්‍රශංසා කළේය (ක්‍රියා 3:8). (දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ද සුවවීම වැනි ලකුණු ද අපගේ දේව මෙහෙයන්හිදී දැක ගත හැකි වන්නේ නම් සෙනඟ ප්‍රශංසා කිරීම හා නමස්කාර කිරීම වඩ වඩාත් කරනු දැක ගැනීමට අපට හැකිවනු ඇත.)

## නැටීම :

සමිඳාණන් ඉදිරියේ නැටීම පළමුවරට සඳහන් වන්නේ නික්මයාම පොතේ වේ.

**එවිට ආරොන්ගේ සහෝදරී වූ මිරියාම් ප්‍රොපේත දූ තොමෝ රබානක් අතින් ගත්තිය. සියලු ස්ත්‍රීහු රබන්ද නැටුම් ද ඇතිව ඈ පස්සේ ගියෝය. (නික්මයාම 15:20)**

එවෙලෙහිම සාතන් නැටීම දූෂණය කළේය.

**තවද ඔහු කඳවුරට ළංවූ වහාම වස්සාද නැටීමද දුටුවේය. (නික්මයාම 32:19)**

දහස් ගණන් හා දස දහස් ගණන් මැරූ සාවුල් හා දාවිත් වෙනුවෙන් ඔවුන් ගී ගයමින් හා නටමින් සිටි බව අපි 1 සාමුවෙල් 18:6න් කියවමු. අපගේ සතුරා පරාජය කළ උන්වහන්සේ ගැන අප කොතරම් එසේ කළ යුතුද?

සමිඳාණන්වහන්සේ ඉදිරියේ දාවිත් නැටුවේය.

**දාවිත් හණ ඒඵෝද් සැට්ටයක් ඇඳ ගෙන ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි මුළු ශක්තියෙන් නැටුවේය. (2 සාමුවෙල් 6:14)**

ඔහුගේ බිරිඳ මීකල් එය විවේචනය කළ බැවින් ඇය වඳ වුවාය (2 සාමුවෙල් 6:16-17, 1 ලේකම් 15:29-30). ආරම්භයේදීම ඇය කැරලිකාර වුවාය. ගිවිසුම් කරඬුව ගෙන එන විට දාවිත් මුළු ඉශ්රායෙල්වරුන්වම කැඳවූ නුමුත් ඇය නොපැමිණියාය. ඇය ඇයගේම කුඩා මුල්ලේ සිටිමින් එය විවේචනය කරමින් හෙළා දැක්කාය.

මීකල් පිළිබඳ වැදගත් කරුණු කීපයක් මෙසේ වේ:

1. ඇය රජුගේ දුව වුවාය. 1 සාමුවෙල් 14:49, 18:20,27
2. ඇය දාවිත්ගේ මනාලිය වුවාය. 1 සාමුවෙල් 18:27
3. ඇය රුධිරයෙන් මිලදී ගත් තැනැත්තියක් වුවාය. 1 සාමුවෙල් 18:25-27
4. ඇය සැමියාට ප්‍රේම කළ අතර ඔහු වෙනුවෙන් ඇය තම ජීවිතය අනතුරට ලක් කළාය. 1 සාමුවෙල් 18:20

5. දාවිත් ඇයට ප්‍රේම කළ අතර ඔහුට ඇය ලැබෙන තෙක් රජ වීම ප්‍රතික්ෂේප කළේය.
1 සාමුවෙල් 19:12

මේ සියල්ල තිබුණ ද ඇය දාවිත් ප්‍රීතියෙන් නමස්කාර කිරීමේ ක්‍රමයට අකමැති වූ බැවින් ඇය වඳ වූවාය.

රජුගේ දරුවන් වන, ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය වන, උන්වහන්සේ ප්‍රේම කරන්නාවූ, උන්වහන්සේගේ රුධිරයෙන් මිලදී ගත්තාවූ හා ක්‍රිස්තුස්වහන්සේ වෙත නැවත ස්ථාපනය කරන්නාවූ සභාව මීකා හා සමානය. අපගේ ආත්මික වඳ භාවයට හේතුව ඇතැම් විට ශුද්ධ ලියවිල්ලේ විස්තර කර ඇති විවිධාකාර නමස්කාර ක්‍රම කෙරෙහි ඇති අපගේ අහංකාර, යුක්ති සහගත කෙරෙන, විවේචනාත්මක ආකල්ප විය හැකිද?

ලූක් 15හි සඳහන් අකීකරු පුත්‍රයා පිළිබඳ කතාවේ තමා යහපත් යයි සිතූ වැඩිමහල් පුත්‍රයා ප්‍රීතිවීම හා නැටීම විවේචනය කළේය. එහෙත් පව්කාරයන් පසුතැවිලි වන විට එවැනිම ප්‍රීතියක් ස්වර්ගයෙහි ඇතැයි බයිබලයේ සඳහන් වේ (ලූක් 15:10).

සමිඳාණන්වහන්සේ තුළ නැටීම, ප්‍රීතිය හා සම්බන්ධ වේ. ඔබගේ හැඬීම නැටීමකට හැරවීමට දෙවියන්වහන්සේට අවශ්‍යය.

> **ඔබ මාගේ වැලපීම නැටීමට පෙරළූ සේක. ඔබ මාගේ ගෝණි රෙදි මුදා සතුටු පිළියෙන් මාගේ ඉණ සැරසූ සේක. (ගීතාවලිය 30:11)**
>
> **එවිට තරුණියෝ ප්‍රීතියෙන් නටන්නෝය. මම ඔවුන්ගේ වැලපීම ප්‍රීතියට හරවන්නෙමි. (ජෙරෙමියා 31:13)**

නැටීමට වේලාවක් ඇති බව බයිබලයේ සඳහන් වේ (ධර්මදේශකයා 3:4). එමෙන්ම සමිඳාණන්වහන්සේ ඉදිරියේ නැටීමට අපට අණ කර ඇත.

> **නටමින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසා කෙරෙත්වා. රබාන සහ වීණාව ගෙන උන්වහන්සේට ප්‍රශංසා ගී කියත්වා. (ගීතාවලිය 149:3)**
>
> **රබානෙන් හා නැටීමෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්. කුඩා වීණාව හා මහා වීණාවෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්. (ගීතාවලිය 150:4)**

## ගින්න, තේජාලංකාරය හා නමස්කාරය

ඔබ මෙම පාඩමාලාවේ තෙවන පරිච්ඡේදයෙන් දෙවියන්වහන්සේගේ ගින්න, තේජාලංකාරය හා නමස්කාරය ගැන ඉගෙනීම ආරම්භ කළෙහිය. මෙම ප්‍රබල සන්නද්ධ කිරීමේ ආත්මික බලවේග තුන පුදුමාකාර ලෙස සම්බන්ධය.

දෙවියන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව් වන තෙක් අපි බලා සිටින්නෙමු. එහෙත් මෙතෙක් උන්වහන්සේගේ පිරිසිදු කිරීමේ ගින්න අපි අත් දැක නොමැත. අපි නමස්කාර කරන්නට කැමැත්තෙමු. එහෙත් එය නියමාකාරයෙන් නොකෙරෙන්නේ එය දෙවියන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව් වීමෙන් නොව ස්වයං පෙලඹවීමෙන් කෙරෙන බැවිනි.

ශුද්ධ කිරීමේ හා පවිත්‍ර කිරීමේ මහත් බලයෙන් යුක්ත දෙවියන්වහන්සේගේ ගින්න, උන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව් කිරීමට අවශ්‍ය වේ. එවිට දෙවියන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපි ආත්මයෙන් හා සැබෑකමින් නමස්කාර කිරීම තුළින් දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිස්ථාපනය කරන බැවින් සැබෑ නමස්කාරයේ යෙදෙන්නෙමු.

මෙය පැරණි ගිවිසුමේ අත්දුටු රටාව වේ. ගින්න, තේජාලංකාරය ඉන්පසු නමස්කාරය.

> **සාලමොන් යාච්ඤා කොට නිමකළ විට අහසින් ගිනි බැස ඇවිත් දවන පූජාවද යාගයන්ද දවා දැමීමේය. ස්වාමින්වහන්සේගේ තේජසින් ගෘහය පිරී ගියේය. ස්වාමින්වහන්සේගේ තේජසින් ස්වාමින්වහන්සේගේ ගෘහය පිරී තිබුණු නිසා පූජකයන්ට ස්වාමින්වහන්සේගේ ගෘහයට ඇතුල් වෙන්ට බැරි විය. සියලු ඉශ්රායෙල් පුත්‍රයෝ ගිනි බසිනවාත්**

**ස්වාමීන්වහන්සේගේ තේජස ගෘහය පිට තිබෙනවාත් දැක ගල් අතුළ බිමට තමුන්ගේ මුහුණු නමා නමස්කාර කොට: මක්නිසාද උන්වහන්සේ යහපත්ය. උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය කියමින් ස්වාමීන්වහන්සේට ස්තුති කළෝය. (2 ලේකම් 7:1-3)**

ඔබව ගින්නෙන් ස්පර්ශ කර, දෙවියන්වහන්සේගේ තේජාලංකාරයේ එළිදරව් වීම ලබා ගත්විට හා ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කිරීමට පටන් ගත් විට පිබිදීම ඉතා ඉක්මණින්ම අත් දකින්නෙහිය. දෙවියන්වහන්සේගේ සෙනඟ සන්නද්ධ කෙරෙන තවත් බලගතු පෙලඹවීමක් වන පිබිදීම ගැන ඔබ ඊළඟ පාඩම් තුනෙන් අධ්‍යයනය කරනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

-
-
-

2. නමස්කාර කරන ආකාරය පිළිබඳව බයිබලය උගන්වන දේ සාරාංශ කරන්න.

-
-
-
-
-
-

3. ගින්න, තේජාලංකාරය හා නමස්කාරය අතර ඇති සබඳතාව පැහැදිලි කරන්න.

-
-
-
-
-

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

බයිබලයේ නමස්කාර පොත් වන්නේ ගීතාවලිය වන අතර එය ඒ පිළිබඳව බොහෝ දේ උගන්වයි. දාවිත් මෙසේ පැවසිය:

> **දෙවියන්වහන්ස, ඔබ මාගේ දෙවියන්වහන්සේය. අලුයම ඔබ සොයන්නෙමි. වතුර නැති, වියලුණු, වෙහෙස උපදවන්නාවූ දේශයකදී මාගේ ආත්මය ඔබ කෙරෙහි පිපාසා ඇත්තේය. මාගේ මාංසය ඔබ කෙරෙහි ආශා ඇත්තේය. (ගීතාවලිය 63:1-2)**

තමාට වෙහෙස ගෙන දුන් හා දෙවියන්වහන්සේගේ බලය විද්‍යමාන නොවූ පැරණි මියගිය දේවමාළිගාවකට යෑමට දාවිත් පුරුදුව සිටියේ නැත.

ප්‍රශංසාව පිළිබඳ ගීතාවලියේ ඉගැන්වීම්වලට නිදසුනක් ලෙස පහත දැක්වෙන ගීතාවලි අධ්‍යයනය කරන්න.

## ගීතාවලිය 81 - ප්‍රශංසාව පිළිබඳ ගිවිසුම

දෙවියන්වහන්සේ ඉශ්රායෙල්වරුන් සමග ගිවිසුමක් (එකඟතාවක්) ඇති කරගත් සේක. 8 පදය "ඔබ මට සවන් දෙන්නහු නම් කොපමණ යහපත්ද?"

**අපගේ කොටස : 1-7 පද**

ප්‍රශංසා කිරීමේ ක්‍රම සතරකි. 1-3

- ශබ්ද නගා ගී කියව්. - ප්‍රීති නාද පවත්වව්. - ගීතිකා ගයන්න.
- කිකිණි රබන්, මිහිරි වීණාව, කුඩා වීණාව, හොරණෑව ආදිය වයන්න.

ප්‍රශංසාව පෙලඹවීම් පහකි.

- දේව වචනය එය නියෝග කරයි. : 4 - ප්‍රශංසා කරන සෙනඟ දෙවියන්වහන්සේට සාක්ෂියකි. 5- අප උන්වහන්සේගේ මහිමයේ ප්‍රශංසාව වේ. (එපීස 1:12) - අතීතයෙන් නිදහස් කළ බැවින් 6-7
- පිළිතුරු ලද යාච්ඤාවන් නිසා 7- පරීක්ෂාවන් හා සෝදිසි කිරීම් සඳහා 7

**දෙවියන්වහන්සේගේ කොටස 9-10 පද**

- අප රූප වන්දනාවෙන් ඉවත් කෙරේ. සියලු රූප වන්දනාවන් පසුපස යක්ෂයාගේ බලය ඇත. (ද්විතිය කතාව 32හි රටාව බලන්න. ඉශ්රායෙලය අත්හැරියේ 15, උදහස් කළහ 16, පූජා කළහ 17, අමතක කළහ 18)
- පවිත්‍රතාවෙන් යුතුව නමස්කාර කිරීමට අපට හැකිවේ. "විදේශීය දෙවි දේවතාවුන් හට නමස්කාර නොකළ යුතුය."
- සම්බන්ධතාව නැවත ඇති කෙරේ. "දෙවි සමිඳාණෝ මම වන්නෙමි."
- අප ප්‍රශංසාවෙන් පිරෙනු ඇත. උන්වහන්සේට අවශ්‍ය දේ (නමස්කාරය) සමඟ ඔබට දෙවියන්වහන්සේ වෙතට පැමිණිය නොහැකි නම් උන්වහන්සේට අවශ්‍ය දේ වෙනුවෙන් උන්වහන්සේ හමුවට එන්න. ප්‍රශංසාව ගෙන එන්න. එවිට උන්වහන්සේ ඔබගේ මුඛය ප්‍රශංසාවෙන් පුරවනු ඇත.

**කනගාටුදායක සාරාංශයක් : 11-13 පද**

දෙවියන්වහන්සේගේ හඬ නොසලකා හැරියේය. උන්වහන්සේගේ වැඩ සිටීම ප්‍රතික්ෂේප කළේය. එබැවින් ඔවුන්ට අවශ්‍ය පරිදි කටයුතු කිරීමට දෙවියන්වහන්සේ ඔවුන්ට ඉඩ දුන් සේක. ඉශ්රායෙලයට අයත් වීමට තිබූ ගිවිසුම් ප්‍රතිලාභ අතර මේවාද වේ.

- පරාජය කළ සතුරෝ : 14-15 - ආහාරපානාදිය සැපයීම 16, තෘප්තිය 16

## ගීතාවලිය 149 - ප්‍රශංසාව පිළිබඳ පාඩමක්

**එය කරන්නේ කෙසේද?**

ඔබ සමිඳාණන්වහන්සේට ප්‍රශංසා කරන්න. ඔබ ඔබගේ හැඟීම් යම් දිශාවකට යොමු කළ යුතුය. නැතහොත් ඒවා ඔබ යොමු කරනු ඇත.

- ගී ගයන්න.
- සාමූහික ප්‍රශංසාව සඳහා එක්වන්න.
- ඔබගේ ශරීරයෙන් සමිඳාණන්වහන්සේට ප්‍රශංසා කරන්න.
- ඔබට යම් භාණ්ඩයක් වාදනය කළ හැකි නම් එසේ කරන්න.

**එසේ කරන්නේ මන්ද?**

- උන්වහන්සේ උන්වහන්සේ නිසා - 1
- උන්වහන්සේ කළ දේ නිසා - 2
- උන්වහන්සේ ඉන් ප්‍රසන්න වන නිසා - 4
- ඔබගේ ජීවිතයේ උන්වහන්සේ කරන දේ නිසා - 4
- සැදැහැවතුන්ගේ සභාව සමඟ ඔබ ඒකීයත්වයෙන් යුක්තව සහභාගී වන නිසා (1 හා 5 පද) මින් අදහස් වන්නේ දැනටමත් ස්වර්ගයේ ඇති සභාවත් සමඟ ඔබ එක්සත්ව සිටින බවය. හෙබ්‍රෙව් 12:22-24 පද බලන්න)
- ප්‍රශංසා කිරීම ආයුධයක් නිසා 7-9

දැන් ඔබගේ වාරයයි. සෑම පරිච්ඡේදයකින්ම නමස්කාරය පිළිබඳව ඔබ උගත් දේ වාර්තා කරමින් ගීතාවලිය පොත කියවන්න. නිදසුනක් ලෙස අපි ගීතාවලිය 93 විමසා බලමු.

## ගීතාවලිය 93

- ඔබ දෙවියන්වහන්සේට නමස්කාර කළ යුත්තේ මන්ද? 3- 5 හා 7 පද
- මෙම ගීතිකාව ඔබට නමස්කාර කිරීමට උපදෙස් දෙන්නේ කෙසේද?
  - ගායනා කරමින් 1 පදය - ප්‍රීති ඝෝෂා කරමින් 1 පදය
  - ගීතිකා වලින් 1 පදය - හිස හා දණ නමමින් 6 පදය (ගරු කිරීම)
  - දෙවියන්වහන්සේ තුළ උදම් අනමින් 1-5 පද

- ඔබගේ පෙලඹවීම කුමක් විය යුතුද? (3 පදය බලන්න... "අපගේ දෙවියන්වහන්සේ මෙන් කිසිවෙක් නැත.)
- හදවත දැඩි කර ගැනීමේ හා නමස්කාරය තුළින් දෙවියන්වහන්සේගේ සර්ව බලධාරීත්වය පිළිනොගැනීමේ විපාක මොනවාද?

**ඔබගේ පළමු ස්වාධීන අධ්‍යයනය සඳහා ගීතාවලිය 100 "නමස්කාරයට කැඳවීමක්" භාවිත කරන්න.**

## ගීතාවලිය 100

### නමස්කාරයට කැඳවීමක්

**නමස්කාරයේ රටාවන්**

නමස්කාරයේ මූලාරම්භය මිනිසා නොවේ. දෙවියන්වහන්සේ වේ. එය මිනිසාගේ දෙයක් වූයේ නම් අපට එය සංශෝධනය කිරීමට, වෙනස් කිරීමට, විවේචනය කිරීමට, ඇතැම් කොටස් ප්‍රතික්ෂේප

කිරීමට හා එය වැඩි දියුණු කිරීමට අපට පුළුවන. පිළිගත හැකි ආකාරයෙන් නමස්කාර කිරීමට නම් අප නමස්කාරයේ ආකෘති හා රටාවන් උගත යුතුය.

දේව වචනයේ වාර්තා තුළින් ස්වර්ගයේ ඇති පරිපූර්ණ ප්‍රශංසාව අපට සැබවින්ම දැකගත හැකිවිට රටාවක් හමුවේ. ප්‍රශංසා කිරීමේ ආකෘති අප පොළොවෙහි දකින ඒවා වේ. අප පොළොවේ දකින ආකෘතිවල දේව වචනයේ රටාවලට වඩා වෙනස් යමක් ඇද්ද එය "මිනිසා විසින් සාදන ලදී" යන ලේබලය ඇත.

**යෙසායාහි ඇති රටා:**

නමස්කාරයේ බයිබලීය රටාවක් යෙසායා 6න් එළිදරව් වේ. ඔබ පහත දැක්වෙන දේ කරන විට ප්‍රතිඵලය සැබෑ නමස්කාරය වේ.

- දෙවියන්වහන්සේට ගෞරවාන්විත ශුද්ධත්වය හා බලය පිළිබඳ දැක්මක් ලබාගන්න: 1-4 පද
- ඔබගේ සම්පූර්ණ ශක්තියෙන් නමස්කාර කරන විට ප්‍රශංසාවේ හඬ කෙතරම් ප්‍රබලවීද යත් දොරේ උළුවහු සසල වේ. 4 පදය
- ඔබගේ පාපී ස්වභාවය හඳුනා ගන්න. 5 පදය
- ඔබ ඇති සැටියෙන් දැක ගැනීමට නමස්කාරය උපකාරී වේ. දෙවියන්වහන්සේ අබිමුවට පැමිණිවිට අප බොහෝ දෙනෙකුට ඇති වැදගැම්මකට නැති ආකල්ප නැති වේ. තමා දූවිලි හා අළු පමණක් බවට ආබ්‍රහම් පාපොච්චාරණය කළේය (උත්පත්ති 18:27). ජෝබ් තමාවම පිළිකුල් කර ගනිමින් අළු හා දූවිලිවල පසුතැවිලි විය (ජෝබ් 42:6).

  "අප දෙවියන්වහන්සේ දුටු නිසා ඒකාන්තයෙන්ම නසින්නෙමුයි" මානෝවා කීය. (විරාවලිය13:22)

  "මේ සියල්ල අසා මම කැළඹෙමි. මාගේ තොල් බියෙන් වෙවුලයි. මාගේ ඇටකටු දිරායයි. (හබක්කුක් 3:16)

  එස්රා මෙසේ පැවසීය. "මම ලජ්ජාවට පත්වී, මාගේ මුහුණ ඔසවන්නට බියෙන් සිටිමි."
  මේ කාරණය (අපරාධ) නිසා ඔබට මුණදී සිටින්නට අපට නොහැකිය. (එස්රා 9:6,16)

- ඔබ පවිත්‍රවීම හා කමාව අත්දකී. 6,7 පද
- දෙවියන්වහන්සේගේ පණිවුඩය ඔබ තොල්වල දැවෙමින් පවතින පණිවුඩකාරයෙකු වනු ඇත. 8 පදය
- ඔබ දෙවියන්වහන්සේට යටත් වන්නේය. යෙසායා "මා මෙහිය" යි කීවේ තමා සිටින්නේ කොතැනද, කවදාද, මන්ද යයි නොදැන වන අතර ඔහු කවරෙකු වන්නේ යැයිද ඔහු දැන සිටියේ නැත. ඔහුගේ නමස්කාර අත්දැකීම් නිසා මේවා ගණන් ගත්තේ නැත. මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේට කැපවූ විට විස්තර සඳහා බලා සිටීම අවශ්‍ය නැත. නමස්කාර නොකරන දෙවියන්වහන්සේගේ සේවකයන්ට විස්තර අවශ්‍යය. මන්ද ඔවුන් උන්වහන්සේ විශ්වාස නොකරන බැවිනි.

**එළිදරව්ව පොතෙහි ඇති රටා**

එළිදරව්ව 4-5 පරිච්ඡේද කියවන්න. ඒවා පහත දැක්වෙන දේ උගන්වයි.

ස්වර්ගයෙහි

- අවධානය යොමු වන්නේ දෙවියන්වහන්සේට වේ. 4:2-6 හා 5:13 පද
- නමස්කාරය ශුද්ධ වූ වැඩකි. ඔව්හු නිරන්තරයෙන්ම තේජසද, ගෞරවයද, ස්තුතියද පුද කරති. 4:8
- ඔව්හු වැඳ වැටී උන්වහන්සේ ඉදිරියෙහි ඔටුනු හෙළති. 4:10
- එහි ගී ගැයීම ඇත. 5:9-10
- දේවදූතයෝද නමස්කාරයට සහභාගි වෙති. 5:12
- නමස්කාරය ශබ්දනගා වේ. 5:12

- ඔවුහු බිම වැටී නමස්කාර කරති. 5:8 හා 14
- ඔවුන්ගේ නමස්කාරයේ සුවිශේෂී අන්තර්ගතයක් ඇත. 4:8, 11 හා 5:9-10, 12-14

අන්තර්ගතය අවධාරණය කෙරෙන්නේ:

- දෙවියන්වහන්සේගේ ශුද්ධත්වය - 4:8
- උන්වහන්සේගේ බල පරාක්‍රමය 4:8
- උන්වහන්සේගේ සදාතනික ස්වභාවය 4:8
- දෙවියන්වහන්සේගේ වටිනාකම, ගරුත්වය හා බලය 4:11
- මැවීම 4:11
- ගැළවීම හා මිදීම 5:9
- ආශිර්වාද 5:12-13

යන මේවා වේ.

එළිදරව්ව 19 ද කියවන්න. 1-7 පදවලින් මේ හා සමාන නමස්කාර රටාවක් පෙන්නුම් කෙරේ. 6 පදයෙන් පෙන්වන්නේ නමස්කාරය "බලවත් හෙණ හඬක්" මෙන් මහ හඬින් සිදුවූ බවය. 1,2, 6-8 පදවලින් පෙන්නුම් කෙරෙන්නේ නමස්කාරයේ අවධානය දෙවියන්වහන්සේ පමණක්ද උන්වහන්සේගේ මහිමය, ගෞරවය, බලය, ශුද්ධත්වය, සැබෑ හා ධර්මිෂ්ඨ විනිශ්චය මත වන බවය. ඊට හේතුව උන්වහන්සේගේ පාලනය සර්වබලධාරී බැවිනි. 4 පදයේ දැක්වෙන්නේ ඔවුන් "ආමෙන්" හා "ආලේලූයා" කියමින් වැඳ වැටුණු බවය. මහත් ප්‍රීති සන්තෝෂ වීමක් තිබුණු බව 7 පදයේ සඳහන් වේ.

# එකොළොස්වන පරිච්ඡේදය

## පිබිදීම යනු කුමක්ද?

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- පිබිදීම යන්න නිර්වචනය කිරීමට
- පිබිදීම සඳහා අපට සූදානම් විය හැකි ආකාරය පැහැදිලි කිරීමට
- පිබිදීම අවශ්‍ය වේලාව හඳුනා ගැනීමට
- පසුබට වන අවස්ථාවන් පිළිබඳ සාක්ෂි සාකච්ඡා කිරීමට
- පිබිදීම ගෙන ඒම සඳහා දෙවියන්වහන්සේ යොදා ගන්නා මිනිසා කවර ආකාරයේද යන්න පිළිබඳව නව ගිවිසුමෙන් නිදසුනක් දීමට
- පිබිදීම සඳහා ඇති බාධක සාරාංශ කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**එබැවින් ස්වාමීන්වහන්සේ ඉදිරියෙන් සැනසිලි කාලයන් පැමිණෙන ලෙසද, නුඹලා උදෙසා නියමකරනලද්දාවූ ක්‍රිස්තුස්වහන්සේ, එනම් යේසුස්වහන්සේ එවන පිණිසද, නුඹලාගේ පාපයන් මකාදමනු ලබන පිණිසද පශ්චාත්තාපව හැරෙන්න. (ක්‍රියා 3:19-20)**

### හැඳින්වීම

පිබිදීමෙහිදී දෙවියන්වහන්සේගේ සර්වබලධාරී ක්‍රියාව නොමැතිව කිසිදු සේවාවක් සන්නද්ධව නොපවතිනු ඇත. මෙම පාඩමෙන් හා ඊළඟ පාඩම් දෙකෙන් ඔබ පිබිදීම ගැන අධ්‍යයනය කරන අතර පිබිදීම පිළිබඳ පැරණි ගිවිසුමෙහි වාර්තා අධ්‍යයනය කරන්නෙහිය. එමෙන්ම පිබිදීමේ මූලධර්ම ඉගෙන ගන්නෙහිය.

### පෞද්ගලික අත්දැකීමක්

ඔබගේ වර්තමාන සභාව හෝ නිකාය හෝ ආත්මිකව මියගොස් ඇති බවක් ඔබට දැනෙන්නට පුළුවන. එමෙන්ම ඔබ නිවැරදිද විය හැකිය. එහෙත් ඔබ පෞද්ගලිකව අත්දුටු දෙය සාමූහිකව අත්දැකිය නොහැකිය. ඔබ කොටසක්වී සිටින සාමූහික සභාවට පිබිදීම පැමිණෙන්නට නම් පළමුව ඔබ එය පෞද්ගලිකව අත් දැකිය යුතුය. පෙන්තකොස්තය වුවද පෞද්ගලික අත්දැකීමකි. "සෑම කෙනෙක්ම" අන්‍ය භාෂා කතා කළ අතර එකිනෙකාට ආත්මය විසින් ඒ ප්‍රකාශ කිරීම දෙන ලදී.

අපි පිබිදීම සඳහා යාච්ඤා කරමු. නිරාහාරව සිටිමු. ආයාචනා කරමු. එහෙත් අප එය සාමූහිකව අත්දැකීමට නම් පළමුව පෞද්ගලිකව අත් දැකිය යුතුය. මෙම අධ්‍යයනය ආරම්භයේදීම පහත දැක්වෙන පෞද්ගලික තහවුරු කිරීම් කර ගන්න.

- මා පිබිදීම ලබන්නේ දේව වචනයේ මූලධර්ම හා පොරොන්දුවල පදනම මතය.
- මාගේ නිවසේ, සභාවේ, ප්‍රජාවේ හෝ ජාතියේ කුමක් සිදුවෙමින් පැවතුණද මා පිබිදෙනු ඇත.
- පිබිදීමේ උපකරණයක් ලෙස දෙවියන්වහන්සේ මා භාවිත කරනු ඇත.

### පිබිදීමේ නිර්වචන

පළමුව පිබිදීම නොවන්නේ කුමක්දැයි පළමුව අපි විමසා බලමු. පිබිදීම චිත්තවේගියත්වයම නොවේ. මිනිසුන් පිබිදීමට චිත්තවේගීව ප්‍රතිචාර දක්වනු ඇත. එහෙත් චිත්තවේගයන් පිබිදීමේ කොටසක් පමණි, පිබිදීම නොවේ. සැබෑ පිබිදීම, චිත්තවේගයද ඇතුළුව මුළු මිනිසා කෙරෙහිම බලපාන්නෙහිය. කරුණු පිළිබඳ දැනුම පමණක් මිනිසා ඉදිරියට ගෙන එන්නේ නැත. මත්ද්‍රව්‍ය සහිත බීම වර්ගවලින් සිදුවන මරණ පිළිබඳ සංඛ්‍යාලේඛන මඟින් බේබද්දෙකු වෙනස් වන්නේ නැත. අපරාධ වැඩිවීම පිළිබඳ සංඛ්‍යාවන් අපරාධකරුවන් වෙනස් නොකරයි. වෙනසක් සිදු කිරීමට නම් ශුද්ධාත්මාණන්වහන්සේගේ වෙනස් කිරීමේ බලය ආත්මිකවත් චිත්තවේගියවත් මිනිසෙකු ස්පර්ශ කළ යුතුය.

පිබිදීම යනු මහා හඬැති සංගීතය හා "නිරයේ ගින්න" පිළිබඳ දේශනාවන් නොවේ. එය අලුත් සාමාජිකයන්ගේ පැමිණීම වැඩි කර ගැනීමට කෙරෙන ප්‍රයත්නයක්ද නොවේ. සභා වර්ධනය පිබිදීමේ ප්‍රතිඵලයකි. එහෙත් එය පිබිදීම හා සමාන නැත.

පිබිදීම ශුභාරංචි ප්‍රචාරණය නොවේ. ශුභාරංචි ප්‍රචාරණය යනු ශුභාරංචියේ යහපත් පුවත් ප්‍රකාශ කිරීමය. පිබිදීම, ශුභාරංචි ප්‍රචාරණයට පෙර සිදුවන්නකි. මන්ද මැරුණු සාමාජිකයන් "පිබිදුනු" විට ශුභාරංචි ප්‍රචාරණය නිතැතින්ම සිදුවේ.

අවසාන වශයෙන් පිබිදීම යනු විශේෂ රැස්වීම් මාලාවක් පමණක්ම නොවේ. එසේ වීමට මේ විශේෂ රැස්වීම් දෙවියන්වහන්සේගේ සර්වබලධාරී ප්‍රයත්නයෙන් ස්පර්ශ විය යුතුය.

පිබිදීම යනු....

> පිබිදීම පිළිබඳ දේව වචනයේ රේමා එළිදරව් වීමක් ඇතිව එම මූලධර්ම ඉගෙනගන හා භාවිත කරන සෙනඟ වෙනුවෙන් හා සෙනග තුළින් කෙරෙන දෙවියන්වහන්සේගේ අධිසාමාන්‍ය, සර්වබලධාරී ක්‍රියාවකි.

පිබිදීම සර්ව බලධාරීය. එබැවින් එය මිනිසෙකුට කළ නොහැකිය. එය දෙවියන්වහන්සේගේ විශේෂ කාර්යයක් වන බැවින් එය අධිසාමාන්‍ය වේ. පිබිදීම සිදුවන්නේ මනුෂ්‍ය කණ්ඩායමක් තුළ හා ඔවුන් වෙනුවෙනි. පිබිදීමට සූදානම් වීම සඳහා පිබිදීම පිළිබඳ දේව වචනයේ එළිදරව් කර ඇති මූලධර්ම අප ව්‍යවහාර කළ යුතුය. පිබිදීම පිළිබඳ බයිබලය උගන්වන සෑම දෙයක්ම "රේමා" :ඍයැප්ය- හෙවත් මේ විෂයය පිළිබඳ දෙවියන්වහන්සේගේ "සුවිශේෂී" වචනය වේ.

පිබිදීම ගැන මෙසේද කිව හැකිය:

- දෙවියන්වහන්සේගේ සෙනඟ අවදි කිරීමක්, ප්‍රාණවත් කිරීමක්, පුනරුත්ථාපනය කිරීමක් වන අතර ඉතිරිව ඇති දෙය ශක්තිමත් කිරීමකි.

- විඥානය හෝ ජීවනය නැවත ලැබීමකි. පිබිදුනු දෙයක් නැවතත් ක්‍රියාශීලී වී වැඩි දියුණු වේ.

- මිනියක් ලෙස ක්‍රියා කිරීමට තැත් කරන ශරීරයකට ආත්මය වේගයෙන් ගලා ඒමට සැලසීම.

- සමිඳාණන්වහන්සේගේ වැඩ සිටීම තුළින් නව ජීවන යුගයක් පැමිණීම. (ක්‍රියා 3:19)

## පිබිදීම සඳහා සූදානම් වීම.

පිබිදීම සඳහා සූදානම් වීම ගොවිතැනකට සමාන කළ හැකිය. හොඳ අස්වැන්නක් ලැබීමට ගොවියෙකුට වාඩි වී සිටිමින් යාච්ඤා කිරීමට පුළුවන. එහෙත් ඔහු කෙත සූදානම් නොකළහොත්, බීජ පැළ නොකළහොත්, පැලවලට ජලය නොදැම්මොත් හොඳ අස්වැන්නක් නොලැබෙනු ඇත.

එමෙන්ම ගොවියා තම කොටස මනා ලෙස ඉටු කළ බැවින් අස්වැන්න ගැන සහතික වීමද එක හා සමාන මෝඩකමකි. අස්වැන්න පැසීම සඳහා වර්ෂාව, හිරු එළිය හා යහපත් කාළගුණ තත්ත්වයන් ලබාදීම සර්වබලධාරී දෙවියන්වහන්සේ කළ යුතුය. ගොවියා දේව වචනයෙන් එළිදරව් කර ඇති

පරිදි වැපිරීම හා නෙළීම, බීජ කාලය හා අස්වැන්න ආදිය ගැන එකඟත්වයෙන් වැඩ කළ යුතුය. දෙවියන්වහන්සේ තවමත් සර්වබලධාරී වන සේක. මන්ද වැස්ස, අව්ව හා යහපත් කාළගුණික තත්ත්වයන් උන්වහන්සේගෙන් පැමිණෙන බැවිනි.

මෙම නිදර්ශනයම පිබිදීම සඳහාද භාවිත කළ හැකිය. එය දෙවියන්වහන්සේගේ සර්වබලධාරී ක්‍රියාවකි. එහෙත් පිබිදීම "නෙළා ගැනීමට" අප දේව වචනයේ එළිදරව් කර ඇති මූලධර්ම අනුගමනය කළ යුතුය. පිබිදීම යනු දෙවියන්වහන්සේගේ ආත්මයත් දෙවියන්වහන්සේගේ සෙනඟගේ ප්‍රතිචාරයෙත් ඒකාබද්ධ ක්‍රියාවක් වේ.

## අපට සැබවින්ම පිබිදීම අවශ්‍යද?

අපට පිබිදීම අවශ්‍ය යයි කීමට පෙර අප අපගේ හදවත් පිරික්සිය යුතුය. අප සැබවින්ම අවංකද? අප ඉල්ලන දේ අපි සැබවින්ම දනිමුද? "සියලු මාංසය වෙත ඔබගේ ආත්මය වැගිරෙව්ව මැනව" යි අප පවසමු. එහෙත් පරෙස්සම් වීමක් වශයෙන් තව දෙයක් එක් කරන්නෙමු. "එහෙත් අපගේ දූවරුන්ට අනාවැකි කීමට හෝ තරුණයන්ට දර්ශන දැකීමට හෝ ඉඩ නොදෙනු මැනව... එය ඕනැවට වඩා චිත්තවේගී නොවුන මැනව."

නව ගිවිසුම් සභාවේ පිබිදීම ඇතිවූයේ ඇදහිලිවතුන් විසිරී යෑම, පීඩාවන් පැමිණීම, සිරගත වීම, දිවි පිදීම හා සභාව පවිත්‍ර කිරීම ආදිය තුළින් වේ. සැබවින්ම සිදුවන පිබිදීමකදී අපගේ සාමාජිකයන් කොපමණ දෙනෙක්, අනනියස් හා සප්පිරා මෙන්, "මැරී වැටෙත්ද?" අපට සැබවින්ම පිබිදීමක් අවශ්‍යද?

## පිබිදීමක් අවශ්‍ය වන්නේ කවදාද?

පිබිදීම සැමවිටම අවශ්‍ය බව සැබවි. එහෙත් එය වඩාත්ම අවශ්‍ය වන්නේ පසුබට වීම් පෙනෙන විට වේ. පසුබටවීම අවබෝධ වීම පිණිස ඉශ්‍රායෙල් නිදසුනක් ලෙස ගන්න. යෙරෙමියා ඉශ්‍රායෙල්හි ගැටලු "පසුබටවීම්" ලෙස හැඳින්වීය (යෙරෙමියා 1:3-4). බයිබලය මෙසේ පවසයි:

> **සිතින් පසුබට වෙන්නා තමාගේම මාර්ගවලින්ද යහපත් මනුෂ්‍යයා තමාගේම පැවැත්මෙන්ද තෘප්තියට පැමිණෙයි. (හිතෝපදේශ 14:14)**

යෙරෙමියා 2 පරිච්ජේදයට පෙරළන්න. ඉශ්‍රායෙලය පහත දැක්වෙන දේ කළ බව එහි සඳහන් වේ.

- දෙවියන්වහන්සේ පෙර තරම් ඔවුන්ට වැදගත් නැති බව ඔව්හු තීරණය කළහ. 2:5
- දෙවියන්වහන්සේ ඔවුන්ට කළ මහත් දේ ඔව්හු අමතක කළහ. 2:6-7
- ඉශ්‍රායෙල්හි ආගමික නායකයන් වුවද පසුබට ආගන්තුකයන් හා එක්ව ඇත. "සමිඳාණන්වහන්සේ කොහිද," යි ඇසීමට පූජකවරුද අසමත් වූහ. 2:8
- දෙවියන්වහන්සේ තම ජීවිතවලින් පිටත තබාගෙන, ඔව්හු වෙනත් දෙයට හැරුණාහ. මෙතැනදී දේව රූපවලට වේ. 2:11-12, 27-28
- ඔව්හු ජීවන වතුර උල්පත අත්හැර දමා, වතුර නාල්ලන බිඳුණු කටාරම් කපා ගත්හ. ඔව්හු ජීවන වතුර, එකතැන පල්වෙන වතුරට මාරු කළහ. 2:13
- ඔව්හු ආත්මිකව ඈත්වෙන්ට පටන් ගත්හ. 2:19
- ඔව්හු ස්වයං ධර්මිෂ්ඨ තත්ත්වයකට ඇතුළු වූහ. 2:22-23
- ඔව්හු සමාවට කරුණු තුළින් යුක්ති සහගත වූහ. 3:11
- ඔව්හු අන් අයවද ඔවුන්ගේ දූෂිත වැඩවලට ඇදගත්හ. 2:33-34

පසුබට වීම යනු තම ජීවිතයෙන් දෙවියන්වහන්සේ නෙරපා හැර ආත්මාර්ථයෙන් පුරවා ගැනීමේ පාපය වේ. එය ඌරෙක් නැවතත් මඩ වගුරකට යෑම හා බල්ලෙක් උගේ වමනය වෙත හැරී යාමට සමාන කර ඇත (2 පේතෘස් 2:21-22).

## පසුබට වීමේ තත්ත්වයක් සඳහා සාක්ෂි

පසුබට වීමේ තත්ත්වයක් සඳහා සාක්ෂි සමහරක් පහත දැක්වේ. මෙම ලැයිස්තුව අධ්‍යයනය කරන අතරතුර ඔබගේම හදවත හා ජීවිතය විමසා බලන්න. ඔබ පසුබට තත්ත්වයකට ඇතුළු වන්නේ පහත දැක්වෙන දේ නිසා වේ.

1. යාච්ඤාව ඔබගේ ජීවිතයේ වැදගත් ස්ථානයක් වීම නතර වූ විට. "පිබිදීම පසුවන්නේ යාච්ඤාව දිරාපත් වන බැවිනි" යි කියනු ලැබේ. අලුත් ගිවිසුම් යුගයේ අපට හමුවූයේ උඩුමහල් කාමරයේ වේදනාවට පත් මනුෂ්‍යයන් වූ අතර දැන් අපට හමුවන්නේ භෝජන ශාලාවේ සංවිධානය කරන ඇදහිලිවතුන් වේ.

2. බයිබලීය සත්‍යයන් වෙත ඇති පිපාසය නැතිවී දැනටමත් ඔබ සතු දැනුම පිළිබඳව සතුටට පත් වූ විට. පසුබට වූවන් බයිබලය නොකියවන බවක් මින් අදහස් නොවේ. මේ බොහෝ දෙනෙකුට යුතුකමක් ලෙස නිහඬ කාලයක් තිබේ. එහෙත් ඔවුන් දේව වචනය කියවන විට ඔවුන්ට සත්‍යය පිළිබඳ අලුත් එළිදරව්වක් හෝ ව්‍යවහාරයක් නොවේ. ඔවුන් ලබාගන්නා දැනුම කරුණු ලෙස පිළිගන්නා අතර ඔවුන්ගේ ජීවිතවලට යෙදීම නොකෙරේ.

3. සදාතනික දේ පිළිබඳ සිතිවිලි නිතර නිතර ඇති නොවීම හා /හෝ වැදගත් ලෙස නොසිතීම.

4. ඔබ, ඔබගේ පාපවලට "මා දුවිල්ල පමණක් බව සමිඳාණන්වහන්සේ දන්නා සේක" හෝ "ඒ මාගේ හැටි" යයි පවසමින් ස්වයං ධර්මිෂ්ඨකමින් තමටම සමාව දුන්විට.

5. එක එල්ලේ කෙරෙන ආත්මික සාකච්ඡා මගින් අපහසුතාවයට පත්වන විට, නිදසුනක් ලෙස වරදකරු කෙරෙන හා /හෝ නැතිවූවන්ට සාක්ෂියක් වන දේ ගැන හෝ කෙරෙන සාකච්ඡා ඔබ අපහසුතාවට පත් කරයි.

6. විනෝදය, ක්‍රීඩා හා සංග්‍රහ ආදියට ඔබගේ ජීවිතයේ ප්‍රමුඛස්ථානයක් දුන්විට.

7. ඔබගේ හෘදයසාක්ෂියෙන් විරෝධතාවක් නොමැතිව පාපය භුක්ති විඳීමට හැකිවූ විට.

8. ක්‍රිස්තුස්වහන්සේගේ ශුද්ධත්වයට ඇති ආසාව තව දුරටත් ඔබගේ ජීවිතයේ ප්‍රමුඛ නොවූ විට.

9. මුදල් හා දේපළ අත්පත් කරගැනීම ඔබගේ සිතිවිලිවල ප්‍රමුඛ වූ විට.

10. සමිඳාණන්වහන්සේගේ නම නිකරුණේ භාවිත කිරීම, ආත්මික හැඟීම් විහිළුවට ලක් කිරීම, හා සදාතනික කරුණු සැහැල්ලු ලෙස සලකා බැලීම ආදියට ඔබ තුළ කෝපයක් ඇති නොකර සිටීමට හැකිවූ විට.

11. "නමස්කාරය" වෙහෙසකර දෙයක් වූ විට දේව මෙහෙයන් උනන්දුවක් ඇති නොකරයි. ආගමික ගීත හා වචන හැඟීමක් නොමැතිව ප්‍රකාශ කළ හැකිය. ප්‍රීතියෙන් යුතුව ප්‍රශංසා නොකෙරේ.

12. සහභාගිකත්වයේ එක්සත් බව බිඳුණු විට ඔබට ඒ ගැන හැඟීමක් නැති වූ විට.

13. කිතුනු සේවාවන්ගෙන් ඈත්වී සිටීමට කුඩා දෙයක් වුවද ප්‍රමාණවත් වූ විට.

14. ඔබගේ මාංසික ඉන්ද්‍රියයන් පාලනය කළ නොහැකි වූ විට ඔබ පහත් රූපවාහිනී හා වෙනත් චිත්‍රපට බලයි. අභක්තික සංගීතයට සවන් දෙයි. එමෙන්ම සදාචාරාත්මක නොවන සාහිත්‍ය පත පොත කියවයි.

15. ලෞකික ජීවිතයේ ශෛලයයට ඔබ ප්‍රීතියෙන් සකස් වූ විට, නිදසුනක් ලෙස නොගෙවන ලද ණය, බංකොලොත් බව, බොරු කීම, වංකකම, ඉටු නොකළ පොරොන්දු, තම සේවයයා රැවටීම ආදිය.

16. ඔබගේ ආත්මික බලය හිඟවීම ගැන ඔබට තවදුරටත් හැඟීමක් නොමැති වූ විට. ඔබගේ ජීවිතයේ දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ බලය සඳහා පිපාසයක් නැති විට.

17. ඔබගේ සභාව ආත්මික පසුබැසීමකට ලක්ව ඇති විට : මාංසිකත්වය මඟින් එවැනි ආත්මික පසුබැසීමක් පෙන්නුම් කෙරේ. මාංසික සභාවකට පහත දැක්වෙන දෑ තිබිය හැකිය.

- උපකරණ, එහෙත් ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ සේවය නොමැත.
- කැළඹීම, එහෙත් නිර්මාණශීලිත්වයක් නොමැත.
- ක්‍රියාකාරීකම, එහෙත් සැනසිල්ලක් නොමැත.
- කලබලකම, එහෙත් පිබිදීමක් නොමැත.
- සිද්ධාන්තවාදී ආකල්පයක්, එහෙත් දෙවියන්වහන්සේ වෙනුවෙන් ගතිකත්වයක් නොමැත.

ඔබගේ දේවස්ථානයේ දේව වචනය බලයෙන් යුක්තව දේශනා නොකරන විට හා එසේ වුවත් ඔබ ඉන් තෘප්තියට පැමිණ සිටින විටද එවැනි ආත්මික පසුබැසීමක් පෙන්නුම් කෙරේ.

18. ලෝකයේ හා ඔබගේ රටේ සදාචාරාත්මක, දේශපාලනික, ආත්මික හා ආර්ථික තත්ත්වයක් ගැන ඔබට හැඟීමක් නොමැති වූ විට.

19. ඔබට දැඩි සිතක් ඇති විට: ඔබට පහසු කඳුළු නොගලයි. ඔබ නොසැලකිලිමත්ය. ඉක්මන්ය. විනාශ වන්නාවූ නගරය, මිනිසාගේ ආත්මික තත්ත්වය, අන් අයගේ දුක ආදිය ගැන යේසුස්වහන්සේ හැඬුවාක් මෙන් ඔබ හඬන්නේ නැත.

20. ඔබට ඔබගේ ආත්මික ශක්තිය නැතිවුවත් ඒ පිළිබඳව ඔබ නොදන්නා විට: සභාවක් හෝ පුද්ගලයෙක් හෝ තමා ජයග්‍රහණය කර ඇතැයි සිතුවද සත්‍යවශයෙන්ම පසුබට වූ අයගේ මළමිණී ඔබ වටා තිබෙන කාලයකදී තරම් පිබිදීමක් අවශ්‍ය වන තවත් යුගයක් නැත.

## දෙවියන්වහන්සේ භාවිත කරන මිනිසා

පිබිදීම ගෙන ඒම සඳහා දෙවියන්වහන්සේ භාවිත කරන මිනිසා කොයි ආකාරයේද යන්න පිළිබඳ ශ්‍රේෂ්ඨතම නිදර්ශනය වන්නේ යොහන් බව්තිස්ත වේ. පසුතැවීම පිළිබඳ ජනප්‍රිය නොවන පණිවිඩයක් යොහන් බව්තිස්ත ගෙන ආ නුමුත් ඔහුගේ දෙමව්පියන්ට දැන්වූයේ "ඔහු සමිඳාණන් අබිමුවෙහි ශ්‍රේෂ්ඨ වන්නේය" යනුවෙනි. ශුභාරංචියේ සේවකයන් වශයෙන් හා දෙවියන්වහන්සේගේ මිනිසුන් වශයෙන් අප සැලකිලිමත් විය යුත්තේ මිනිසා ඉදිරියෙහි නොව සමිඳාණන් ඉදිරියේ "ශ්‍රේෂ්ඨ" වීමට වේ.

යොහන් "තනිව ගමන් කළ මිනිසෙකු" ලෙස හැඳින්වේ. ශ්‍රේෂ්ඨ රාජාලියන් ඉගිළෙන්නේ තනිවමය. ශ්‍රේෂ්ඨ සිංහයන් දඩයම් කරන්නේ තනිවමය. ශ්‍රේෂ්ඨ ප්‍රාණ තනිවම ගමන් කරයි. ඔබ පිබිදීමේ උපකරණයක් වීමට නම් දෙවියන්වහන්සේ සමඟ තනිව ඇවිදීම අවශ්‍යය.

ධර්මයෙන්ද, ඇඳුමෙන්ද, ආහාර ගැනීමෙන්ද යොහන් බව්තිස්ත වෙනස් පුද්ගලයෙකු විය. ඔහු දෝංකාරයක් නොව හඬක් විය. බොහෝ දේශකයන්ට තමා කියවූ අලුත්ම පොතෙන් උපුටා දැක්වීම් ඉදිරිපත් කළ හැකිය. එහෙත් දේව වචනයෙන් එසේ කළ හැක්කේ ස්වල්පයකි.

අපි "දෙවියන්වහන්සේගේ දිවැසිවරු" යයි පවසමු. දිවැසිවරයන්ට භාසකම් කළ හැකිය. එහෙත් ඔවුන්ට තිබිය යුතුම දෙය වන්නේ පණිවුඩයක් වේ. යොහන් බව්තිස්තට පණිවුඩයක් තිබිණි. අද යොහන් බව්තිස්ත කළ, හද කිතිකවන උද්‍යෝගිමත් තර්ජනාත්මක හා අවවාද සහිත දේශනාවලට වඩා ඇසිය හැක්කේ බියසුලු අකර්මණ්‍ය ඒවා වේ. බොහෝ විට දේශනාකරුවන් සොයන්නේ ප්‍රශංසාව මිස මිනිසුන් නොවේ.

බලරහිත දේශන අප නොපෙලඹවන්නේ ඒවා ඉපදී ඇත්තේ සොහොනක මිස ගර්භාෂයක නොවන බැවින්. බොහෝ අයගේ දේශනා ස්වරූපයේ දක්ෂ, ඔප දමන ලද, කඳුළු රහිත, ලැදිකමක් නැති

බවක් පෙනේ. වේදිකාව තම තලෙන්ත හා දීමනා ප්‍රදර්ශනය කරන තැනක් බවට පත් වී ඇත. අපි ශුභාරංචිය පැතිරීම වෙනුවට "ප්‍රචාර" කටයුතු කරන්නෙමු. අප දේශනා කළ යුත්තේත්, ඉගැන්විය යුත්තේත් මැරුනාවූ මනුෂ්‍යයෙක් ලෙස මැරුනාවූ මනුෂ්‍යයන්ට කරන ලෙසය. එහෙත් අප ඒ වෙනුවට කිතුනුවන්ට විහිළුවලින් සමන්විත "අවන්හලක" දෙන රසකාරක "බණ" දෙසන්නෙමු.

අපගේ පණිවුඩය පේතෘස්ගේ පණිවුඩයෙන් අනනියස් හා සප්පිරා මිය ගියාක් මෙන් හෝ එලිමස්, පාවුලුතුමා දුන් පණිවුඩයෙන් අන්ධවූවාක් මෙන් හෝ වුවහොත් කුමක් සිදුවේවිද? නරක නමක් ලැබෙනු ඇතැයි අපි බියවන්නෙමු. (යම් කෙනෙක් පමණට වඩා චිත්තවේගී වීමෙන් අපට නරක නාමයක් ලැබෙතැයි බිය වෙමු).

අප සවන් දිය යුතු දේව වචනයේ දැවෙන සත්‍යයන් ආත්මයේ බලයෙන් පැවසිය හැකි පුද්ගලයන් මේ මොහොතේ රහසින් සඟවමින් දෙවියන්වහන්සේ නැගිටුවමින් සිටින සේක. දෙවියන්වහන්සේගේ මේ ශ්‍රේෂ්ඨ ක්‍රියාවේ කොටස්කරුවෙකු වීමට ඔබට අවශ්‍යද? එසේ නම් පළමුව ඔබ පිබිදීම අත්දැකිය යුතුය. ඇතැම්විට සභාවේ තත්ත්වය ඔබට වෙනස් කළ නොහැකි විය හැකිය. එහෙත් ඔබගේ ආත්මයේ තත්ත්වය ඔබට වෙනස් කර ගැනීමට හැකිය. ප්‍රමාණවත් තරම් පුද්ගලයන් එසේ වෙනස් කරගනී නම් එවිට, **එමඟින්** සභාව වෙනස් වනු ඇත.

## පිබිදීමට ඇති බාධා

පැරණි ගිවිසුමේ පිබිදීම හා පිබිදීමේ බයිබලීය මූලධර්ම අධ්‍යයනය කිරීමට පෙර අපි පළමුවෙන් පිබිදීමට ඇති බාධා විමසා බලමු. මේවා අපගේ සභාවන් තුළ දෙවියන්වහන්සේගේ සර්වබලධාරී ගමන වළක්වන දේ වේ.

### නායකත්ව බාධා:

දේව වචනය බලයෙන් යුක්තව දේශනා නොකරන හෝ උගන්වන්නේ නොමැති නායකයෝ පිබිදීමට බාධා පමුණුවති. යාච්ඤා ජීවිතයක් නැති, බයිබල් අධ්‍යයන වැඩසටහන් නැති, බලය පෙන්විය නොහැකි හා දේශනා කිරීමට ආශාවක් නැති අයද පිබිදීමට බාධා කරති. තම සභාවේ සෙනඟ පාලනය කරන හා දෙවියන්වහන්සේගේ ආත්මය නිවාලන අයද උන්වහන්සේගේ සර්වබලධාරී මෙහෙයට බාධා කරති.

තම බැටළුවන් ගැන සැලකිලිමත් නොවන නායකයෝ පිබිදීමට බාධකයක් වෙති. ඔව්හු තම බැටළු රැළ නිල් තණබිම් වෙත හා නිසල දිය වෙත ගෙන නොයති. ඔවුන්ට පිබිදීම සඳහා එය අවශ්‍යය. මියයන ලෝකයක් වෙනුවෙන් අනුකම්පාවක් නොමැති නායකයෝ පිබිදීමට බාධා පමුණුවති. පිබිදීමේ නායකයන් වීමේ වගකීම ඔවුන් හැඳිනගෙන නැත. බයිබලය දේව සේවකයන්ට මෙසේ අවවාද අනුශාසනා කරයි.

> **සියොන්හි හොරණෑව පිඹ, ශුද්ධ වූ උපවාසයක්ද, රැස්වීමක්ද ප්‍රසිද්ධ කරන්න. සෙනඟ රැස්කර, ශුද්ධ වූ සභාවක් පවත්වන්න. සෙනඟ රැස්කර ශුද්ධ වූ සභාවක් පවත්වන්න. මහල්ලන් එකතු කර ළමයින්ද කිරිදරුවන්ද එක්කාසු කරන්න. මනමාලයා තමාගේ ගෙයින්ද මනමාලි තමාගේ ඇතුල් ගෙයින්ද පිටත එත්වා. ස්වාමින්වහන්සේගේ සේවකයෝ වූ පූජකයෝ ද්වාර මණ්ඩපය සහ පූජාසනය අතර සිට අඬමින්: ස්වාමීන්වහන්ස ඔබගේ සෙනඟට කරුණා කළ මැනව. ඔවුන් කෙරෙහි ජාතීන් විසින් ආණ්ඩු කරන හැටියට ඔබගේ උරුමය නින්දාවට පාවා නුදුන මැනව. ඔවුන්ගේ දෙවියන්වහන්සේ කොතැන්හිදැයි ජනයන් අතරේ මක්නිසා කියනු ලබන්නේදැයි කියත්වා. එකල ස්වාමීන්වහන්සේ තමන්ගේ දේශය ගැන ජ්වලිත වී තමන්ගේ සෙනඟට අනුකම්පා කළ සේක. (යෝවෙල් 2:15-18)**

### සභා සමූහයෙන් ඇතිවන බාධා

දෙවියන්වහන්සේගේ සභා සමූහයෙන් පිබිදීමට බාධා ඇතිවිය හැකිය. සම්ප්‍රදායන්ට සමූහයේ ඇති ඇල්ම නිසා පිබිදීමට බාධා ඇතිවේ. පිබිදීමත් වෙනස් වීමත් එකට සිදුවේ. දෙවියන්වහන්සේ ක්‍රමවත්ය. බලාපොරොත්තු රැඳවිය හැකිය. එහෙත් ඒ හා සමඟම උන්වහන්සේ නැවුම්ය. ක්‍රියාශීලිය. උන්වහන්සේ සාම්ප්‍රදායිකයෙක් නොවේ. සභාවක් මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායන්ට අනුකූලව

කටයුතු කරන්නේ නම් එය දෙවියන්වහන්සේගේ වැඩ සිටීම හා බලය නොමැතිව කටයුතු කරනු ඇත.

විධිමත් ක්‍රමයකට ඇති සභා සමූහනයේ ලැදියාව පිබිදීමට බාධාවකි. දාවිත්ගේ බිරිඳ වූ මීකල් ඔහුට ගැරහුවේ ඔහුගේ හැඟිම්බර නමස්කාරය නිසාය. එබැවින් ඇය වඳ වූවාය. වඳවූ සභාවක් විධිමත් වැඩසටහනකට හා චාරිත්‍රවලට ප්‍රිය කරයි.

කෙටි වීමට ඇති ආසාවද පිබිදීමට බාධාවකි. අපට අවශ්‍ය වන්නේ අප උන්වහන්සේට වෙන්කර ඇති ඉරිදා උදෑසන පැය දෙක ඇතුළත පිබිදීම එවිම වේ. දහවල් 12 පසු නොවිය යුතුය.

බොහෝ සභා සමූහනයන් ආසාවන්නේ සැප පහසු සත්‍යයට වේ. ක්‍රිස්තුස්වහන්සේගේ ඉල්ලීම්වලට මුහුණ දීමට හෝ පාපය හා විනිශ්වය පිළිබඳ දේශනාවලට හෝ ඔව්හු කැමති නොවෙති. පිබිදීමට අවශ්‍ය සත්‍යය සැම වේලෙහිම සැප පහසු නැත. අන් අයගේ ගරු කිරීමට ඇති ආසාවද පිබිදීමට බාධා පමුණුවයි. ඇතැම් සභා සමූහනයන් දෙවියන්වහන්සේ සිතන දෙයට වඩා "මිනිසුන් සිතන දෙය" ගැන සැලකිලිමත් වේ.

### පොදු බාධා:

සමූහනයේත් නායකත්වයේත් තිබිය හැකි වෙනත් බාධා තිබේ. දේශනා කුඩුවේ හෝ දේවස්ථාන බංකුවේ හෝ සිටින තැනැත්තා තුළ තිබෙන අපරාධ පිබිදීමට බාධාවකි.

> **බලව, ගලවන්ට බැරි ලෙස ස්වාමීන්වහන්සේගේ අත කොටවෙලාවත් නැසෙන ලෙස උන්වහන්සේගේ කන බිහිරි වෙලාවත් නැත. නුමුත් නුඹලාගේ අපරාධම නුඹලා සහ දෙවියන්වහන්සේ අතරේ වෙන්වීමක් කළේය. උන්වහන්සේ නොඅසන ලෙස නුඹලාගේ පාපද උන්වහන්සේගේ මුහුණ නුඹලාගෙන් සැඟෙවුවේය. (යෙසායා 59:1-2)**
>
> **තමාගේ වරද සඟවන්නා සඵල නොවන්නේය. එහෙත් ඒවා කියාදී අත්හරින්නාට කරුණාව ලැබේ. (හිතෝපදේශ 28:13)**

"මේ අවසාන දවස් වේ. ඒ නිසා සැම දෙයම දිනෙන් දින නරක අතට හැරෙනු මිස අපට වෙන දෙයක් බලාපොරොත්තු විය නොහැකිය" යන ආකල්පය පිබිදීමට බාධා පමුණුවයි. යාච්ඤාවට හා දේව වචනයට අවධානය නොදීම, නිහතමානී වීම ප්‍රතික්ෂේප කිරීම, හා දෙවියන්වහන්සේ සෙවීම ප්‍රතික්ෂේප කිරීමද පිබිදීමට බාධාවකි.

දෙවියන්වහන්සේ සීමා කිරීමෙන් අප මධ්‍යයේ උන්වහන්සේගේ සර්වබලධාරී වැඩ සිටීමට බාධා පැමිණේ.

> **ඔව්හු නැවත නැවත දෙවියන්වහන්සේ පරීක්ෂා කළෝය. ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේ උදහස් කළෝය. (ගීතාවලිය 78:41)**
>
> **ඔවුන්ගේ ඇදහිලි නැතිකම නිසා උන්වහන්සේ එහිදී බොහෝ ආශ්චර්යයන් නොකළ සේක. (මතෙව් 13:58)**

නොසැලකිලිමත්කමද පිබිදීම වළකාලයි. ක්‍රිස්තුස්වහන්සේගේ ඉල්ලීම්වලටද අන් අයගේ අවශ්‍යතාවලටද මනුෂ්‍යයෝ නොසැලකිලිමත් වෙති. අපගේ ආත්මික තත්ත්වයට හා දෙවියන්වහන්සේගේ ආත්මයේ පැමිණීමට සංවේදී නොවීමද පිබිදීමට බාධාවකි.

අවසාන වශයෙන් අපගේම අවිනිශ්චිතභාවය පිබිදීමට බාධා පමුණුවයි. **අපට සැබවින්ම පිබිදීමක් අවශ්‍යද?**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. පිබිදීම නිර්වචනය කරන්න.

3. පිබිදීමට සූදානම් විය හැක්කේ කෙසේද?

4. පිබිදීම අවශ්‍ය කවදාද?

5. මෙම පාඩමේ සාකච්ඡා කර ඇති පසුබට වීමේ තත්ත්වයක් සඳහා සාක්ෂි හඳුනාගන්න.

6. පිබිදීම ගෙන ඒම සඳහා දෙවියන්වහන්සේ යොදා ගන්නා මනුෂ්‍යයෙකුගේ ආකාරය පිළිබඳව නව ගිවිසුමේ උදාහරණයක් දෙන්න.

7. පිබිදීමට ඇති බාධා සමහරක් සාරාංශ කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

1. මෙම පාඩමෙන් ඔබ ඉගෙන ගත්තේ යෙරෙමියා 2 පරිච්ඡේදයේ සඳහන් ඉශ්‍රායෙල්හි පසුබට තත්ත්වය පිළිබඳවය. යෙරෙමියා 1හි සඳහන් වන්නේ ඉශ්‍රායෙලයේ පිබිදීම සඳහා නැවතත් දෙවියන්වහන්සේ වෙතට ගෙන ඒම පිණිස සූදානම් කිරීමට දෙවියන්වහන්සේ මෙම දිවැසිවරයාව නැගිටවූ ආකාරය වේ. මේ සේවය සඳහා තමාට සුදුසුකම් ඇති බව යෙරෙමියාට හැඟුණේ නැත. එහෙත් දෙවියන්වහන්සේ කෙසේ හෝ ඔහු යොදාගත් සේක.

   අන් අය පිබිදීම සඳහා සූදානම් කිරීමට දෙවියන්වහන්සේ විසින් ඔබ යොදා ගැනීම සුදුසු නැති බවක් ඔබට හැඟෙන්නට පුළුවන. එහෙත් ඔබ ඔබගේ බිය ජයගෙන ඔබගේ ආත්මයට තම පණිවුඩය දැමීමට දෙවියන්වහන්සේට ඉඩ දෙන්නේ නම් ඔබට පිබිදීමේ උපකරණයක් විය හැකිය.

2. යම් කෙනෙක් මෙසේ පවසා ඇත.
   නිදියන සියලු දෙනා අවදි වුවහොත්
   ඇල්මැරුණ සියලු දෙනා ජ්වලිත වුවහොත්
   අමනාපයෙන් සිටින අය මිහිරි වුවහොත්
   කලකිරීමෙන් සිටින අය සතුටු වුවහොත්
   පීඩිත අය බලාපොරොත්තු ඇති කරගතහොත්
   භේද වූ අය සමගි වුවහොත්
   ඕප දූප කියන්නන් නිශ්ශබ්ද වුවහොත්
   එසේ නම් පිබිදීමක් ඇති විය හැකිය.

3. හෙබ්‍රෙව් 11හි සඳහන් වන්නේ රාජ්‍යයන් පරාජය කර සිංහයන්ගේ කට වැසූ ඇදහිලිවතුන් ගැනය. අප දෙවියන්වහන්සේගේ බලය අත්දැකිය යුතුය. ඒ ගැන කතා කිරීම ප්‍රමාණවත් නැත. අත්දැකීම් ඇති මනුෂ්‍යයෙකුට කිසි දිනක තර්ක කෙරෙන්නෙකුට යටත්ව සිටීම අවශ්‍ය නැත.

# දොළොස්වන පරිච්ඡේදය

## පැරණි ගිවිසුමේ පිබිදීම්

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- පැරණි ගිවිසුම් වාර්තාවල ඇති පිබිදීම මූලධර්ම හඳුනා ගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

> **ඒ සියල්ල ආදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධවුණේය. ඒවා ලියා තිබෙන්නේ කාලවල කෙළවරට පැමිණ සිටින්නාවූ අපට අවවාද පිණිසය. (1 කොරින්ති 10:11)**

### හැඳින්වීම

දෙවියන්වහන්සේ මෙලොව ක්‍රියාකරන්නේ උන්වහන්සේගේ වචනයෙන් එළිදරව්වූ මූලධර්මවලට කීකරුව කටයුතු කරන අය තුළිනි. පැරණි ගිවිසුමේ පිබිදීම පිළිබඳ අධ්‍යයනය ඔබගේම ජීවිතයේ දෙවියන්වහන්සේගේ පිබිදීමේ ක්‍රියාව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබව සූදානම් කිරීමට යොදා ගත හැකි මූලධර්ම සපයනු ඇත. අපට ඒ සඳහා ශුද්ධ ලියවිල්ලේ සහතිකය තිබේ.

> **මක්නිසාද ඉවසිල්ල කරණකොටගෙනද ලියවිලිවලින් හටගන්න සැනසිල්ල කරණකොටගෙනද අප බලාපොරොත්තු ඇතුව සිටින පිණිස, පූර්වයෙහි ලියනලද සියල්ල අපගේ ඉගෙන ගැනීම සඳහා ලියනලද්දේය. (රෝම 15:4)**

> **ඒ සියල්ල ආදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධවුණේය. ඒවා ලියා තිබෙන්නේ කාලවල කෙළවරට පැමිණ සිටින්නාවූ අපට අවවාද පිණිසය. (1 කොරින්ති 10:11)**

මෙම පාඩමෙන් ඔබ පැරණි ගිවිසුමේ සඳහන් පිබිදීම් ඉගෙන ගන්නෙහිය. ඊළඟ පාඩමෙන් ඔබ ඉගෙන ගන්නේ මේ වාර්තාවලින් ලබා ගත් ඔබගේ ජීවිතයට හා සේවයට යොදා ගත හැකි පිබිදීම පිළිබඳ මූලධර්ම වේ.

මෙම පාඩමේ භාවිත කෙරෙන පිළිවෙළ මෙසේය:

සෑම පිබිදීමක් පිළිබඳවම බයිබලයේ ඔබට කියවිය හැකි **යොමු** සපයා තිබේ.

කලින් පැවති හා පිබිදීමට තුඩු දුන් දැන් **පවතින තත්ත්වයන්** පැහැදිලි කර තිබේ.

පිබිදීමේ ආරම්භ කළ **අවදිකිරීමේ සාධක** සටහන්කර ඇත.

පිබිදීමේ **ප්‍රතිඵල** විශ්ලේෂණයකර තිබේ.

මෙම පාඩමේ අධ්‍යයන ආකෘතිය නිසා ස්වයං පරීක්ෂණය හෝ තවදුරටත් අධ්‍යයනය හෝ යන කොටස් මෙම පරිච්ඡේදයේ අවසානයේ නොමැත.

## යාකොබ් යටතේ පිබිදීම

### යොමුවන්:

උත්පත්ති 35:1-15.

### දැන් පවතින තත්ත්වය :

1. පවුලේ ප්‍රධානියා දෙවියන්වහන්සේ සමග සහභාගිත්වයෙන් ඉවත්ව සිටියේය. මුල සිටම යාකොබ් රැවටිලිකාරයෙක් හා වරදට ඉඩදුන කෙනෙක් විය. ඒසව්ගෙන් පලායද්දී දෙවියන්වහන්සේට සේවය කිරීමට පොරොන්දුවිය. එහෙත් ඒ පොරොන්දුව ඉක්මනින්ම අමතක විය.

   යාකොබ් ස්වයංපෝෂිතව සිටියේය. ඔහු සමිඳාණන්වහන්සේගේ ආශිර්වාද බලාපොරොත්තු වුවද ඔහුගේ ජයග්‍රහණ දෙවියන්වහන්සේගෙන් ලද දේවල් ලෙස දුටුවේ නැත. ඔහු විශ්වාස කළේ ඔහු ලද සියලු ආශිර්වාද ඔහු විසින්ම ලබාගත් බවය. යාකොබ් භෞතිකවාදියෙකු වූ අතර ඔහු සැලකිලිමත් වූයේ ඔහුට අයත් දේ හා තමාටත් තම පවුලටත් සැපයන දේ ගැන මිස දෙවියන්වහන්සේ සමග ඇති සබඳතාව ගැන නොවේ.

2. ඔහුගේ පවුලේ ව්‍යුහය බයිබලියට අනුකූල වූයේ නැත. යෝසෙප්ට වැඩි ප්‍රේමයක් තිබිණි. යාකොබ් තම පවුල නිසියාකාරව පාලනය නොකළ අතර ඔහුගේ දුව දූෂණයට ලක්වීම වෙනුවෙන් උත්පත්ති 34) පුත්‍රයෝ පළිගත්හ. ඔහුගේ භාර්යාවෝ රැවටිලිකාර ඊර්ෂ්‍යා සහගත අයවූ අතර වරදට ඉඩදුන්හ.

3. දුර්වල ආත්මික වාතාවරණයක් තිබිණි. ඔහුගේ භාර්යාවෝ ඔහුගේ පියාගේ ව්‍යාජ දේවතා රූප සොරකම් කළහ. ඔහුගේ පුත්‍රයෝ මිනීමැරූහ, සොරකම් කළහ. කොල්ලකෑහ. ඔහු හා ඔහුගේ පවුලේ අය පව්කාර අයවූ අතර රූපවන්දනාවේ යෙදුනෝය (උත්පත්ති 35)

### අවදිකිරීමේ සාධක:

1. ඉතා දරුණු සිදුවීම් යාකොබ් අවදි කෙළේය: උත්පත්ති 35.

2. පිබිදීම දේව වචනයෙන් ආරම්භ විය: උත්පත්ති 35:1

### ප්‍රතිඵල:

මෙම පිබිදීම ආරම්භ වූයේ නිවෙසේදී වේ. අපගේ නිවස පිබිදුනහොත් අයගේ සභාවන් පිබිදෙනු ඇත.

1. පවුලේ අය ඔවුන්ගේ දේවතාරූප ඉවත් කොට පවිත්‍ර වූහ. උත්පත්ති 35:2

2. ඔව්හු සැබෑ දෙවියන්වහන්සේ පිළිගත්හ. උත්පත්ති 35:3

3. ඔව්හු ආත්මික අත්දැකීම් ලද ස්ථානයට (බෙතෙල් වලට) ආපසු ගියහ. උත්පත්ති 35:3

4. ඔව්හු පූජාසනයක් තනා පසුතැවිලි වී සැබෑ නමස්කාරයට හැරුනෝය. උත්පත්ති 35:7

5. ඔවුන්ගේ ජීවිත වෙනස් විය. මෙම ආත්මික වෙනස්වීම සංකේතවත් කිරීමට යාකොබ්ගේ නම වෙනස් කෙරිනි. උත්පත්ති 32:24-32

6. යාකොබ් දෙවියන්වහන්සේ පිළිබඳ අලුත් එළිදරව්වක් ලැබුවේය. දෙවියන්වහන්සේ තමන් වහන්සේ සර්වබලධාරී දෙවියන්වහන්සේ යයි කීසේක. එයින් අදහස් වන්නේ සියලු බලය ඇති හා සියල්ල සැපයිය හැකි දෙවියන්වහන්සේ බවය. උත්පත්ති 32:24-32

## මොසෙස් යටතේ පිබිදීම

### යොමුවන් :

නික්මයාම 32:1-35 33:1-23 34-35 පරිච්ඡේදය.

### දැන් පවතින තත්ත්වය:

(පෙර පැවති තත්ත්ව: දෙවියන්වහන්සේගේ නායකයා ප්‍රතික්ෂේප කිරීම, චෝදනා කිරීම, මාංසික ආශාවන්)

1. සෙනඟගේ ඇස් යොමුවී තිබුණේ මනුෂ්‍යයා වෙතය. මොසෙස් කන්දෙන් බැස ඒමට ප්‍රමාද වූ විට ඔව්හු ආරොන් වෙත හැරුණේය. ඔහු දුර්වල නායකයෙකි. නික්මයාම 32:1

2. සැබෑ දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කිරීම : නික්මයාම 32:1

3. නිස්සාරත්වය : කෑම, බීම, විනෝදවීම : නික්මයාම 32:6 ("විනෝදවීම" යන්නට ඇති වචනයේ නිවැරදි තේරුම ලිංගික පාප වේ)

4. දූෂණය: නික්මයාම 32:7

5. දේවවචනය ප්‍රතික්ෂේප කිරීම : නික්මයාම 32:8

6. මුරණ්ඩුකම (මුරණ්ඩුවූ අතරම ඔවුන්ගේ පාපී මාර්ගවලම ගමන් ගත්හ): නික්මයාම 32:9

7. පාපය සඳහා වරද අන් අය වෙත පැවරීම: නික්මයාම 32:21-24

### අවදිකිරීමේ සාධක

1. ඔවුන්ගේ පාපයේ විපාක ඔවුන් අවදි කෙළේය. ඔවුන්ට මරණය හෝ ජීවිතය හෝ තෝරා ගැනීමට අවස්ථාවක් දෙන ලදී. නික්මයාම 32:25-28

2. දෙවියන්වහන්සේගේ වැඩ විසීම ඉවත් කෙරිනි. මණ්ඩපය තිබුණේ කඳවුරෙන් පිටත වේ. ඊට හේතුව දෙවියන්වහන්සේ තවදුරටත් ඔවුන් සමග නොවන බව මතක්කිරීමටය. "නුඹ සමග මම නොඑමි" යි දෙවියන්වහන්සේ වදාළ සේක. එය ඔවුන්ගේ අවධානයට ලක් විය. මෘදු හා සිත් දිනාගන්නා පණිවුඩ කිසිදා වරද ඒත්තු කර දෙන්නේ නැත. නික්මයාම 33: 3-11

3. මොසෙස්ගේ මැදහත්වීම : නික්මයාම 32:11-14, 30-34, 33:12-16

### ප්‍රතිඵල:

1. ඔවුන් මධ්‍යයේ සම්මුඛ මණ්ඩපය. මහිමාලංකාරයෙන් පිරී ගියේය. (නික්මයාම 40:34-35)

2. පාළුකරයේ සිට පොරොන්දු දේශයට යෑමට ඔවුන්ව සන්නද්ධ කෙරිණි. (නික්මයාම 40 පරිච්ඡේදයේ අවසානය).

3. ඔව්හු පාපයෙන් වෙන් වූහ. පිබිදීම අවශ්‍ය වූ අයට "දෙවියන්වහන්සේගේ සෙනඟ" මධ්‍යයෙන් පිටතට යෑමට සිදුවිය. නික්මයාම 33:7-11. සෙනඟට ද යා හැකිව තිබිණි (නික්මයාම 33:7). යෝෂුවා ද ගියේය (නික්මයාම 33:11). එහෙත් බොහෝ දෙනෙක් තවමත් මිනිසා දෙස බලා සිටියහ (නික්මයාම 33:8).

4. දීම: ඉශ්රායෙල්වරු දෙවියන්වහන්සේ ඉදිරියෙහි සිය කනකර ආභරණ ගැලෙව්වෝය. ආභරණ පැළඳීම වැරදි බවක් මින් අදහස් නොවේ. මේ අවස්ථාවේ ඔවුන් කරදරයට පත්වූයේ ආභරණ නිසාය. මන්ද ඔවුන් ඒවා දේවරූප තැනීමට භාවිත කළ බැවිනි. තමාට අයත් දේ මෙන්ම තම කාලය හා හැකියාවන් ද සමිඳාණන්වහන්සේට දීමේ අලුත් කැපවීමක් මෙහි දී තිබුණි. (නික්මයාම 33:6. 35:5, 21-26, 29: පරිච්ඡේද 30-35, 36:1-7)

5. සෙනඟ පසුතැවිලි වූ අතර ඉශ්රායෙල්වරු තම පාප වෙනුවෙන් දුක්වූහ. (නික්මයාම 33:4-6)

6. දේවවචනය සමග අලුත් ගිවිසුමක් ඇති කෙරිණි. (නික්මයාම 34:11)

7. යුද සංග්‍රාමවලදී ඒවා ඵලදායි විය. (නික්මයාම 34:12-13)

8. නමස්කාරය පිළිබඳව අලුත් අවධානයක් ඇතිවිය. (නික්මයාම 34:14)

9. දේවරූපවලින් නිදහස ලැබිණි. (නික්මයාම 34:15-16)

10. සාමුහික හා පෞද්ගලික ශුද්ධවන්තකම. (නික්මයාම 34:12, 15-17)

11. සබත පිළිපැදීම නැවත ඇරඹිණි. (නික්මයාම 34:21)

12. දෙවියන්වහන්සේගේ වැඩ විසීම සඳහා ඔව්හු මණ්ඩපයන් පිළියෙල කළහ. (නික්මයාම පොතේ ඉතිරි කොටස)

## සාමුවෙල් යටතේ පිබිදීම

### යොමුව:

1 සාමුවෙල් 7:1-17

### දැන් පවතින තත්ත්වය:

1 "ඒ කාලයේ දී ඉශ්රායෙල්හි රජකෙනෙක් නොසිටියේය. එක් එක්කෙනා තම තමාට රිසි දේ කෙළේය. (විනිශ්චයකාරයා 17:6, 18:1, 19:1, 21:25)

2 ආගමික දූෂණය තිබිණි. ඒලිගේ පුත්‍රයෝ තමාට ගැළපෙන පරිදි පූජාවිධි වෙනස් කළහ. ඔවුන් වළක්වාලීමට කිසිදු පියවරක් ඒලි ගත්තේ නැත. (1 සාමුවෙල් 2:11-17, 3:13)

3 ආත්මික අන්ධභාවය: දේවවචනයට පිවිසුමක් නොවීය. දර්ශන ද විරල විය. (1 සාමුවෙල් 3:1 හා 4:1-11)

4 සතුරන්ගේ ආක්‍රමණය: අභ්‍යන්තර ගැටලු පවතින විට දෙවියන්වහන්සේගේ සෙනඟ සතුරන්ගේ ඉලක්කය බවට පත්වේ. ඉශ්රායෙලය ආක්‍රමණය කළ අතර එහි අති ශුද්ධ ආත්මික වස්තුව වූ ගිවිසුම් කරඬුව නැතිවිය. (1 සාමුවෙල් 4:3 හා 7:3)

### අවදිකිරීමේ සාධක

1. මෙම පිබිදීම සැබවින්ම ආරම්භ වූයේ පරම්පරාවකට පෙර කැපවූ ස්ත්‍රියකගේ හදවත තුළය. (1 සාමුවෙල් 1:10)

2. හන්නාගේ හදවත තුළ දෙවියන්වහන්සේ ක්‍රියා කළ නිසා දෙවියන්වහන්සේගේ පිබිදීමට යොදා ගැනීමට සාමුවෙල් නැගුටුවන ලදී. මෙම අඳුරු කාලය මුළුල්ලේම දෙවියන්වහන්සේ ඔහු සූදානම් කෙළේය. (1 සාමුවෙල් 3:19)

3. සාමුවෙල්ගේ බලගතු පණිවුඩය පසුතැවිලිවීමට මග පෙන්වීය. ඔහු සෙනඟට මෙසේ පැවසීය.

   (1) අප සමිඳාණන්වහන්සේට කැපවිය යුතුය. 1 සාමුවෙල් 7:1-4 (හැරී ඒම, පහ කිරීම, සූදානම් කිරීම, සේවය කිරීම)

   (2) අප පව් කියා දෙමින් සමිඳාණන්වහන්සේට යාච්ඤා කළ යුතුය. (1 සාමුවෙල් 7:5-9)

   (3) දෙවියන්වහන්සේගේ උපකාරය මත යැපෙමින් නිර්භයව ක්‍රියා කළ යුතුය. (1 සාමුවෙල් 7:10-13)

   (4) දෙවියන්වහන්සේ අතීතයේදී කළදේ සිහි කළයුතුය. (1 සාමුවෙල් 7:12)

## ප්‍රතිඵල

1. මිශ්පා නගරයට සෙනඟ රැස් කළේය. එක්සිත් ඇති මිනිසුන්ගේ රැස්වීමක බලය හා බලපෑම බලන්න. (1 සාමුවෙල් 7:5)

2. කැපවීම පිළිබඳව අලුත් අවධාරණයක් විය. පොළොවට වත්කළ ජලය ආපසු ගත නොහැකිය. අපගේ කැපවීමද එසේ විය යුතුය. (1 සාමුවෙල් 7:6)

3. නිරාහාරව සිටීම. (1 සාමුවෙල් 7:6)

4. පව් කියාදීම. (1 සාමුවෙල් 7:6)

5. සතුරාගේ ප්‍රහාරය: ආත්මික කැළඹීමක් ඇති සෑම විටම සතුරා පහර දෙයි. ඇතැම් විට එය අපට අමතක වන පිබිදීම පිළිබඳ වැදගත් මූලධර්මයකි. (1 සාමුවෙල් 7:7-11)

## එලියා යටතේ පිබිදීම

### යොමුව:

1 රාජාවලිය 17-18

### දැන් පවතින තත්ත්වය:

1. ඉශ්රායෙලය පාලනය කරනු ලැබුවේ දුෂ්ට නායකයන් විසිනි. යෙරොබෝවම් දෙවියන්වහන්සේට නමස්කාර කිරීම රන්වස්සන් දෙදෙනෙකු මගින් ප්‍රතිස්ථාපනය කෙරිනි. (1 රාජාවලිය 12:28-32)

   නාදාබ් තම පියාවූ යෙරොබෝවම්ගේ පාපී මාර්ගයේ ගමන් කෙළේය. (1 රාජාවලිය 15:22)

   බාෂා නාදාබ් මැරූ තැනැත්තා විය. (1 රාජාවලිය 15:27)

   ඒලා බේබද්දෙක් හා මිනීමරුවෙකි. (1 රාජාවලිය 16:8-9)

   සිම්රි රාජද්‍රෝහියෙකි. (1 රාජාවලිය 16:20)

ඔම්රි ඔහුට පෙර සිටි සියලු දෙනාටම වඩා නපුරු දේ කළ කෙනෙකි. (1 රාජාවලිය 16:25-26)

ආහබ් ඔම්රිගේ පුත්‍රයා වේ. ඔහුද ඔහුට පළමු වෙන් සිටි සියල්ලන්ටම වඩා දුෂ්ට ලෙස ක්‍රියා කෙළේය.

2. කානාන්හි දෙවිවරුන්ට විශේෂයෙන්ම බාල්ට නමස්කාර කිරීමට ජාතිය යොමු වී තිබුනි.

3. ආත්මිකව හා දේශපාලනිකව නරක කාලයක් විය.

## අවදි කිරීමේ සාධක

1. පසුබට තත්ත්වය ගැන මිනිසුන් අවදි කිරීමට එලියා පුරුදුව සිටියේය. එලියාගේ නමම ඒ යුගයට පටහැනි වුවකි. එලියා යන්නෙහි තේරුම "යාවේ මාගේ දෙවියන්වහන්සේ වේ" යන්නය.

2. විනිශ්වයේදි දෙවියන්වහන්සේ එලියා භාවිත කළ සේක. දෙවියන්වහන්සේ වැස්ස නවතා ඉන් ද්‍රව්‍යම දේහි ඇතිවූ විනාශකාරී ප්‍රතිඵල ඉශ්රායෙල්වරුන්ට කතා කිරීමට යොදා ගැනිණි. මන්ද ඔවුන් ද්‍රව්‍යමය දේවලින් වෙලී සිටි බැවිනි. (1 රාජාවලිය 17:1)

   (මෙම විශේෂ විනිශ්වය කුමක් නිසාද? ආහබ් හා යෙශබෙල්ගේ දෙවිවරු වැස්ස, පින්න හා ගෙරවීම ගැන විශේෂත්වයක් දැරූහ)

3. මනුෂ්‍යයෝ විනිශ්වයට ප්‍රතිචාර නොදැක්වූහ. ඔව්හු කව්රු හෝ පිට වරද පටවන්නට බැලූහ. ආහබ් එලියාගෙන් මෙසේ ඇසීය. 'ඉශ්රායෙල් ජනයා කළඹන තැනැත්තේ ඔබ ද?' ඔහු වරද තමාගෙන් දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා වෙත පැටවීමට උත්සාහ කෙළේය. (1 රාජාවලිය 18:18)

## ප්‍රතිඵල:

1. පිබිදීමේ උපකරණයක් ලෙස දෙවියන්වහන්සේ එලියා සූදානම් කළ සේක.

   (1) දෙවියන්වහන්සේගේ වචනය ඔහු වෙත පැමිණියේය. (1 රාජාවලිය 18:1)

   (2) ඔහු ප්‍රතිචාර දැක්වීය. (1 රාජාවලිය 18:2)

   (3) කැපවෙන ලෙස ඔහු අනෙක් අයට අභියෝග කෙළේය. 'තීරණයක් නොගෙන දෙගිඩියාවෙන් ඔබ කොපමණ කල් සිටින්නහු දැයි එලියා ඇසූ විට කෙළේ ආරාධනාවක් පමණි. එහෙත් දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කෙරෙනු සෙනඟ දුටු විට ඔව්හු ප්‍රතිචාර දැක්වූහ. (1 රාජාවලිය 18:21)

2. භූමිය විනිශ්වය යටතේ තිබුණාද එලියා ආරක්ෂ කෙරිනි. ඔබ වටා මරණය තිබුණාද ඔබට පිබිදීම අත්දැකීමට පුළුවන. (1 රාජාවලිය 17:2-4, 9, 10)

3. එලියා ශාරෙපත් (එහි තේරුම 'උණුවන බඳුන' වේ) නම් නගරයට යවනු ලැබීය. ඔහු එහිදි විශේෂ සැපයුම් හා හාස්කම්වලින්ද පොදුවේ ඉශ්රායෙල්හි නොපිබිදුනු තත්ත්වයෙන්ද පිබිදීම අත්දුටුවේය.
4. එලියා දෙවියන්වහන්සේ පරීක්ෂාවට භාජනය කෙළේය. (1 රාජාවලිය 18:22-37)

5. ඔහු නමස්කාරයේ කේන්ද්‍රස්ථානය වූ පූජාසනය ප්‍රතිසංස්කරණය කෙළේය. (1 රාජාවලිය 18:30)

6. ගිනි බැස්සේය. ආරාධනාවට කළ නොහැකි දේ දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමෙන් කළ හැකිවේ. (1 රාජාවලිය 18:38)

7. එකම සැබෑ දෙවියන්වහන්සේ මහිමයට පත් කෙරිනි. (1 රාජාවලිය 18:39-40)

8. ව්‍යාජ දිවැසිවරු විනාශ වූහ. (1 රාජාවලිය 18:40)

9. දෙවියන්වහන්සේ විනිශ්චය භූමියෙන් ඉවත් කෙරිනි. (1 රාජාවලිය 18:41-46)

## ආසා යටතේ පිබිදීම

### යොමුව :

2 ලේකම් 14-15 මීට සමාන්තර විස්තරයක් 1 රාජාවලිය 15:9-24 හි ඇත.

### දැන් පවතින තත්ත්වය:

1. ඉශ්රායෙලය පැවතියේ සමෘධිමත් යුගයක වේ. එය කරදර කාලයක් මෙන්ම හෝ ඊටත් වඩා භයානක විය හැකිය. පිබිදුම මෙතෙනට පැමිණියේ සමෘද්ධිය හා ජයග්‍රහණය පැවති කාලයක වේ. (2 ලේකම් 14)

   පිබිදීමකට පෙර භයානක තත්ත්වයක් තිබීම අවශ්‍ය නැත. දෙවියන්වහන්සේගේ යහපත පසුතැවිලි වීමට මග පෙන්විය හැකිය. (රෝම 2:4)

### අවදි කිරීමේ සාධක :

**1.** පිබිදීම ආරම්භ වූයේ ආසා රජතුමාගේ හදවතෙහි වේ. (2 ලේකම් 14:4, 7, 15:2, 4, 12, 13 ,15 16:12)

   (1) ආසා රජතුමා රූප වන්දනාව නැති කෙළේය. (2 ලේකම් 14:3-5)
   (2) සතුරා විනාශ කළ දේ නැවත ගොඩනැගීය. (2 ලේකම් 14:6-7)
   (3) සමිඳාණන්වහන්සේ සෙවීමට සෙනඟට බල කළේය. (2 ලේකම් 14:5)
   (4) දේව වචනය ඊට හිමි ස්ථානයට ගෙනාවේය. (2 ලේකම් 14:5)
   (5) යුද්ධයේදී සමිඳාණන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීය. (2 ලේකම් 14:8-15)

2. අසරියාගේ පිබිදීමේ පණිවුඩය (2 ලේකම් 15:2-7)

   (1) ඔවුන්ට තීරණයක් ගැනීමට ඔහු කැඳවිය. (2 ලේකම් 15:2)
   (2) ඔහු අතීත ඉතිහාසය මතක්කර පෙන්වා දුන්නේ දුර්වලව සිටියදී දෙවියන්වහන්සේ පිබිදීම එවූ සේක් නම් ජයග්‍රාහකව සිටියදී ද සැබවින්ම පිබිදීම එවිය හැකි බවය. (2 ලේකම් 15:3-6)
   (3) ශක්තිමත් අවස්ථාවකට පැමිණෙන ලෙස ඔහු ඔවුන්ට අභියෝග කෙළේය. (2 ලේකම් 15:7)

3. මෙම පිබිදීමට පෙර ආගමික ප්‍රතිසංස්කරණයක් සිදුවිය. ආගමික ප්‍රතිසංස්කරණය පිබිදීමම නොවේ. එහෙත් එය වසර 15 ක් තුළ පැවති අතර සෙනඟ පිබිදීම සඳහා සූදානම් කෙළේය. (2 ලේකම් 14:3-5)

### ප්‍රතිඵල :

1. සාමය (2 ලේකම් 15:19)

2. සමිඳාණන්වහන්සේ වැඩ සිටීම. (2 ලේකම් 15:1-7)

3. ඔවුන්ගේ සතුරන් ජය ගැනීම. (2 ලේකම් 14:9-15, 15:19)

4. පිළිම ඉවත් කිරීම : ආසා පිළිම ඉවත් කෙළේය (2 ලේකම් 15:16 බලන්න. තමාගේම මව සමග වුවද එසේ කළේය). සමිදාණන්වහන්සේගේ පූජාසනය අලුත් කළ අතර සෙනඟ දෙවියන්වහන්සේ සෙවීමට ගිවිසුමකට ඇතුළු වූහ (2 ලේකම් 15:12). ඔවුන් එසේ කළ විට දෙවියන්වහන්සේ ඔවුන්ට හමුවිය. (2 ලේකම් 15:15)

5. මේ දේවල් සිදුවිය

- ද්‍රව්‍යමය සේ නිදහස් කිරීම 2 ලේකම් 15:11
- එක්සත්කම නැවත ඇතිවීම 2 ලේකම් 15:9-10
- ගිවිසුම අලුත් කිරීම 2 ලේකම් 15:12-13
- නමස්කාරයට නැවත පැමිණීම 2 ලේකම් 15:14-15
- දේවමාලිගාව අලුත්වැඩියා කිරීම 2 ලේකම් 15:19

**අවවාදයයි:** මිනිසුන් දෙවියන්වහන්සේ වෙතට හැරුණු විට පිබිදීම ඉපදේ. ඔවුන් දෙවියන්වහන්සේගෙන් ඉවතට හැරුණු විට ඔව්හු මියයති (2 ලේකම් 15:2). පිබිදීම නවතින්නේ මේ දේ නිසාය.

1. වැරදි සබඳතා: දෙවියන්වහන්සේ කෙරෙහි නොව මිනිසා කෙරෙහි විශ්වාසය තැබීම: (2 ලේකම් 16:1-9). රටාව දෙස බලන්න. වැරදි සබඳතා නිසා බැඳීම් ඇතිවේ. එය ආත්මික රෝගවලට මගපෙන්වන අතර එහි ප්‍රතිඵලය මරණය වේ. ඔබ පාපය සමග කටයුතු නොකළහොත්:
   (1) ඔබට බලපෑම් ඇති වේ. (2 ලේකම් 16:10)
   (2) අනෙක් අයට බලපෑම් ඇතිවේ: (2 ලේකම් 16:10)
2. ඔව්හු දෙවියන්වහන්සේගේ දිවැසිවරයා සිරගෙයි දැමූහ. (2 ලේකම් 16:10)
3. ඔව්හු සමිදාණන්වහන්සේ සෙවීම ප්‍රතික්ෂේප කළහ. (2 ලේකම් 16:11-14)

## යෙහෝෂාපාට් යටතේ පිබිදීම

### යොමුව:

2 ලේකම් 20

### දැන් පවතින තත්ත්වය:

1. යුද්ධය පැවති කාලයකි.

2. අභක්තික සබඳතා: අභක්තික සබඳතා පැවැත්වීම පිළිබඳව දෙවියන්වහන්සේගේ දිවැසිවරු හතර දෙනෙක් තරවටු කරමින් යෙහෝෂාපාට්ට අනතුරු අඟවූහ.

   යේහු: ආහබ්ට හා සමිදාණන්වහන්සේට වෛර කරන්නන්ට උපකාර කිරීම ගැන ඔහුට චෝදනා කළේය. 2 ලේකම් 19:2

   එලියෙසර්: නැව් සෑදීමේ කටයුත්තකට අසමාන ලෙස එකතුවීම ගැන ඔහුට චෝදනා කෙළේය. 2 ලේකම් 20:36-37

   මීකායා: රාමොත් ගිලියද්ට විරුද්ධව ආහබ්ට එක්වීම ගැන තරවටු කෙළේය.
   2 ලේකම් 18:18

### අවදිකිරීමේ සාධක:

සිරියන් ජාතිකයන්ට පහර දීම: 2 ලේකම් 20:1-3

### ප්‍රතිඵල :

1. පෞද්ගලිකව, යෙහෝෂපාට්ම සමිදාණන්වහන්සේ සෙවීම සඳහා උපවාසයක් ඇරඹීය: (2 ලේකම්

2. ඔහු ඉශ්රායෙල්වරුන් සෙනඟ ලෙස (2 ලේකම් 20:4) හා පවුල් ලෙස (2 ලේකම් 20:13) කැඳවීය.

3. යෙහෝෂපාට් යාච්ඤාවේ මිනිසෙක් විය. ඔහු කළ 'පිබිදීමේ යාච්ඤාවේ' විශ්ලේෂණයක් මෙසේ වේ. පිබිදීම සඳහා ඔබ යාච්ඤා කරන විට මෙම රටාව අනුගමනය කිරීම උචිතය.

   - ඔහු දෙවියන්වහන්සේ නමස්කාර කෙළේය (2 ලේකම් 20:6-7)

   - ඔහුගේ නමස්කාරයේදී ඔහු අතිතයේදී ස්වර්ගයේ දී හා සියලු රාජ්‍යවලදී සහ අනාගතයේ දී දෙවියන්වහන්සේ කළ දෙය නැවත සිතා බැලුවේය.

   - ඔහු ඔහුගේ ඉල්ලීම් දෙවියන්වහන්සේගේ පොරොන්දු මත පදනම් කෙළේය. (2 ලේකම් 20:7-9)

   - ඔහු ගැටලුව ඉදිරිපත් කෙළේය. (2 ලේකම් 20:10-11)

   - එම ගැටලුව ගැන කටයුතු කිරීමට තමාට ඇති නොහැකියාව හඳුනා ගත්තේය. (2 ලේකම් 20:12)

   - එම ගැටලුව ගැන කටයුතු කිරීමට දෙවියන්වහන්සේට ඇති හැකියාව ඔහු හඳුනා ගත්තේය. (2 ලේකම් 20:12)

4. යහසියෙල් විසින් දෙන ලද අනාවැකියක් මගින් දෙවියන්වහන්සේ ප්‍රතිචාර දැක්වූ සේක. (2 ලේකම් 20:14-17)

ඔහුගේ අනාවැකියේ සාරාංශයක් පහත දැක්වේ. එය මිදීම සඳහා පියවර 9ක් සපයයි

(1) දෙවියන්වහන්සේට සවන් දෙන්න. "සමිදාණන්වහන්සේ මෙසේ කියන සේක". (2 ලේකම් 20:15)

(2) පිටස්තර අවස්ථා දෙස නොබලන්න. (2 ලේකම් 20:15)

(3) බිය නොවන්න. (2 ලේකම් 20:15,17)

(4) නොකැළඹෙන්න. (2 ලේකම් 20:17)

(5) සටන දෙවියන්වහන්සේගේ බව පිළිගන්න. (2 ලේකම් 20:15)

(6) සමිදාණන්වහන්සේ ඔබ සමග බව පිළිගන්න (2 ලේකම් 20:17)

(7) දෙවියන්වහන්සේගේ සැලැස්ම අනුගමනය කරන්න. (2 ලේකම් 20:16)

(8) සැරසී, නිශ්චලව සිට සමිදාණන්වහන්සේ ඔබට දෙන ගැළවීම බලා සිටින්න. (2 ලේකම් 20:17)

(9) දෙවියන්වහන්සේගේ වේලාව එන තෙක් සිටින්න. (මේ අවස්ථාවේ එය "හෙට" විය) (2 ලේකම් 20:17)

5. පිබිදීම ගෙන ආ, අනාවැකියට දැක්වූ ප්‍රතිචාරය මෙසේ වේ.
   - නමස්කාරය 2 ලේකම් 20:18
   - විශ්වාසය 2 ලේකම් 20:20
   - ප්‍රශංසාව 2 ලේකම් 20:19, 21:22.

ඉන් ලද ප්‍රතිඵල මෙසේය:

| | | |
|---|---|---|
| - | සතුරා කෙරෙහි ජයග්‍රහණය | 2 ලේකම් 20:23-24 |
| - | ඔවුන් උරුමය ලබා ගැනීම | 2 ලේකම් 20:25 |
| - | සතුරා ගැන ප්‍රීති ප්‍රමෝදවීම | 2 ලේකම් 20:27-28 |
| - | ප්‍රශංසාව හා නමස්කාරය නැවත පැමිණීම | 2 ලේකම් 20:28 |
| - | සතුරා මත දෙවියන්වහන්සේට බියවීම | 2 ලේකම් 20:29 |
| - | සාමය | 2 ලේකම් 20:30 |

**ප්‍රවේසම්වන්න**: 2 ලේකම් 20:31-37න් යෙහෝෂාපාට් යටතේ පිබිදීමේ පිරිහීම කියවන්න. එය සිදුවුයේ,

(1) ඔහු දුර්වල ආදර්ශ අනුගමනය කෙළේය.
(2) ඔහු කෙළේ "යහපත් නොවන දේ වේ."
(3) ඔහු අභ්‍යන්තර බාධා (රූප වන්දනාව) ඉවත් කෙළේ නැත.
(4) ඔහු බාහිර බාධා (සබඳතා) ඉවත් කෙළේ නැත.
(5) ඔහු සිය සිත සුදානම් කරගත්තේ නැත.

## හෙසකියා යටතේ පිබිදීම

### යොමුව:

2 ලේකම් 29:1-36, 30:1-27,31:1-21.

### දැන් පවතින තත්ත්වය:

හෙසකියා නායකත්වය බාර ගත් විට ඔහු මුහුණ දුන් තත්ත්වයන් මෙසේය:

1. ආහාස්ගේ රාජ්‍ය කාලය ඉතා අයහපත් විය (2 ලේකම් 28:1-27). ඔහු කළ සෑම දෙයකින්ම සෙනඟ දෙවියන්වහන්සේගෙන් ඈත්වුහ. ඔහු සියලු අවහිරකම් ඉවත් කළ අතර සමිදාණන්වහන්සේට ද්‍රෝහි විය. (2 ලේකම් 29:19)

2. මේ නිසා යුද පසුබෑම් බොහෝ සිදු වූ අතර සෙනඟ බොහොමයක් සිරියාවට අල්ලාගෙන ගිය අතර උතුරු රාජ්‍යය, ජුදා දේශය පරාජය කෙළේය. ආහස්ට පිලිස්තිවරුන්ගෙන්ද ඒදොම්වරුන්ගෙන්ද කරදර සිදුවිය.

3. උපකාර ඉල්ලුවේ දෙවියන්වහන්සේගෙන් නොව අසිරියාවේ රජුගෙනි. ඔහු බලාපොරොත්තු වූ උපකාර වෙනුවට, තමාගේ මිත්‍රයෙක් යයි සිතූ රජ ඔහු කොල්ලකෑවේය. (2 ලේකම් 29:16-21)

4. තවමත් ඔහු දෙවියන්වහන්සේ වෙතට හැරුනේ නැත (2 ලේකම් 29:22). දැන් ඔහු සිරියාවේ දෙවිවරුන්ට පුද පූජා පැවැත්වීය (2 ලේකම් 29:23). ඔහු දේවමාලිගාවේ දොරවල් වැසුහ (2 ලේකම් 29:24). අන් දෙවිවරුන්ට පූජාසන ගොඩනැගුහ (2 ලේකම් 29:25).

### අවදි කිරීමේ සාධක :

1. දුර්වල වූ යුදමය, ආර්ථික හා ආත්මික තත්ත්ව.

2. හෙසකියා, සමිදාණන්වහන්සේ වෙතට හැරීමට අදහස් කළේය. දේශය, ආර්ථිකව පහත් තත්ත්වයකට වැටී තිබිණි. එහෙත් හෙසකියා ආත්මික ගැටලුව සමග ආරම්භ කළේය (2 ලේකම් 29:10).

## ප්‍රතිඵල:

හෙසකියා:

1. දෙවියන්වහන්සේගේ ඇස් හමුයෙහි හරි දේ කෙළේය. (2 ලේකම් 29:2)
2. යහපත් ආදර්ශ අනුගමනය කෙළේය. (2 ලේකම් 29:2)
3. සමිදාණන්වහන්සේගේ මාලිගාවේ දොරවල් ඇරියේය (2 ලේකම් 29:3)
4. නායකයන්ගේ පරමාර්ථ අලුත් කෙළේය (2 ලේකම් 29:4-11)
5. දේව සේවය පවිත්‍ර කෙළේය. (2 ලේකම් 29:11)
6. දේව මාලිගාව පවිත්‍ර කෙළේය. (2 ලේකම් 29:15-19)
7. පසුතැවිලිවීමට සෙනඟට මග පෙන්වීය. (2 ලේකම් 29:20-24)
8. ප්‍රශංසාව හා නමස්කාරය කෙරෙහි අවධානය අලුත් කෙළේය. (2 ලේකම් 29:25-28, 31:2, 30:17-21, 23, 25-26).
9. සමගිකිරීම උදෙසා අනුබල දුන්නේය. (2 ලේකම් 29:24)
10. දෙවියන්වහන්සේගේ අඟද පනත ( පාස්කු මංගල්‍යය) නැවත පිහිටුවේය (2 ලේකම් 30:1-5)
11. පසුතැවිලිවීමට කැදෙව්වේය (හැරෙන්න එවිට උන්වහන්සේ නැවත පැමිණෙන සේක) (2 ලේකම් 30:6-9)
12. තමා නිහතමානී විය. (2 ලේකම් 30:11)
13. එක්සත් වීමට අනුබල දුන්නේය. (2 ලේකම් 30:12)
14. දෙවියන්වහන්සේට කීකරු විය (2 ලේකම් 30:12)
15. ශුද්ධවන්තකම අලුත් කෙළේය (2 ලේකම් 30:17)
16. දේව වචනය ඉගැන්වීය (2 ලේකම් 30:22)
17. ආගමික නායකයන්ට, ඔවුන්ට හිමි ස්ථානය ලබා ගැනීමට උපකාර කෙළේය. (2 ලේකම් 30:3,16,27)
18. රූපස්තම්භ බිඳ දැමුවේය. (2 ලේකම් 31:1)
19. යහපත් ගබඩාකාරත්වයට අනුබල දුන්නේය (2 ලේකම් 29:31, 31:4,15).
20. සමෘද්ධිය සඳහා නැවත මග පෙන්වීය. (2 ලේකම් 32:27)
21. යුදමය අතින් ශක්තිමත් විය. (2 ලේකම් 32:6-8)
22. අලුත් වීම සඳහා අවශ්‍ය ප්‍රධාන දේ පෙන්වීය. සුදානම් කළ සෙනඟක් දෙවියන්වහන්සේට ඇති විට පිබිදීම පමා නොවේ. (2 ලේකම් 29:36)

## යොෂියා යටතේ පිබිදීම

### යොමුව :

2 ලේකම් 34:1-33, 35:1-19.

### දැන් පවතින තත්ත්වය:

1. බයිබලය බොහෝ සේ නොසලකා හැර තිබු බැවින් එය විනාශ වී තිබිණි. (2 ලේකම් 34:14)

2. දේව මාලිකාව (නමස්කාරය) නොසලකා හැර තිබිණි. (2 ලේකම් 34:10)

3. රූප වන්දනාව හා පාපය: (2 ලේකම් 34:3)

### අවදි කිරීමේ සාධක:

1. දෙවියන්වහන්සේ නායකයාගේ හදවත ස්පර්ශ කළ සේක. යොෂියා අට අවුරුදු වයසේදී රජ වී තිස් අවුරුද්දක් රජකම් කෙළේය. (2 ලේකම් 34:1)

2. ඔහුට ජයගැනීමට බොහෝ බාධක තිබිණි. ඔහුගේ සීයාගේ දිගුකාලීන දුෂ්ට පාලනය, පාපය හා ඔහුගේ පියා කෲර ලෙස මරා දැමීම, ගරා වැටුණු, නමස්කාර ගෘහයේ අපකීර්තිය, දේව වචනය නැති වීම යනාදි බාධක වේ.

3. ඔහුගේ සාර්ථකත්වයට ප්‍රධාන හේතු 2 ලේකම් 34:2-3 හි සඳහන් වේ.

   - ඔහු දෙවියන්වහන්සේගේ ඇස් හමුවේ හරි දේ කෙළේය.
   - ඔහු නපුරු ආදර්ශ වෙනුවට යහපත් ආදර්ශ අනුගමනය කෙළේය.
   - ඔහු වමට හෝ දකුණට හෝ හැරුනේ නැත (දෙවියන්වහන්සේ වෙතින් සිත වෙනතකට යොමු නොවීය)
   - ඔහුගේ තරුණ කාලයේ සිටම දෙවියන්වහන්සේ සෙවීය.
   - පාපයට හා රූප වන්දනාවට විරුද්ධව නිවැරදි මාර්ගයක් ඔහු ගත්තේය.
   - දෙවියන්වහන්සේ වෙතට නැවත පැමිණීමට ඔහු මග පෙන්වීය. ඒවා අතර, දේව මාලිගාව අලුත් වැඩියා කිරීම (2 ලේකම් 34:8) පාස්කු මංගල්‍යය නැවත පැවැත්වීම (2 ලේකම් 35:1) හා දේව වචනය නැවත ගෙන ඒම (2 ලේකම් 34:15,21,31) වේ.

| **2 ලේකම් 34** | | **ද්විතිය නීති සංග්‍රහය 29** |
|---|---|---|
| 24 පදය | "ලියා තිබෙන සියලු පාප" | 20,21,27 |
| 25 පදය | "ඔවුන් මා අත්හැර........ ගිය බැවින්" | 25 |
| 25 පදය | "වෙන දෙවිවරුන්ට සුවඳ දුම් ඔප්පු කළ බැවින්" | 26 |
| 25 පදය | "මා කෝප කරවන හැටියට" | 20,23,28 |
| 25 පදය | "උදහස ..... වගුරුවා තිබේ" | 23,28 |
| 25 පදය | "එය නිවෙන්නේ නැත" | 20 |

4. යොෂියා දෙවියන්වහන්සේගේ ඉදිරියෙහි නිහතමානී විය (2 ලේකම් 34:1-13). උන්වහන්සේගේ වචනය (2 ලේකම් 34:14-28), හා සෙනඟ (2 ලේකම් 34:29-33)]

### ප්‍රතිඵල

1. පිළිම රූප විනාශ කෙරිනි. (2 ලේකම් 34:7)

2. දේව මාලිගාව ප්‍රතිසංස්කරණය කෙරිනි. (2 ලේකම් 34:8)

3. පාස්කු මංගල්‍යය නැවත පිහිටුවීය. (2 ලේකම් 35:1)

4. ඔව්හු නැවත දේව වචනය වෙත පැමිණියහ. එය (2 ලේකම් 34:15), අධ්‍යයනය කෙළේය. (2 ලේකම් 34:21) ඊට ප්‍රතිචාර දැක්විය (2 ලේකම් 34:31).

 සෙනඟගේ ප්‍රතිචාර දෙක අද වුවද අත්දැකිය හැකිය.

 (1) රජතුමා වැනි අය ධනාත්මකව ප්‍රතිචාර දැක්වූහ. එමෙන්ම දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථා පොතේ ලියා ඇති සියල්ල කිරීමට තිරණය කෙරිනි. (2 ලේකම් 34:31)

 (2) අන් අයද ඔවුන්ට එකතු වූහ. එහෙත් මුළු හදවතින්ම හෝ පශ්චාතාප වී හෝ නොවේ. ඔවුන් දෙවියන්වහන්සේට සේවය කෙළේ ප්‍රබල නායකයන් සිටින විට පමණි. (2 ලේකම් 34:32-33)

**ප්‍රවේසම්වන්න:**

පිබිදීමේ පිරිහීම පිළිබඳව 2 ලේකම් 35:20-27 කොටස කියවන්න. දේවමාලිගාව ප්‍රතිසංස්කරණය කෙරුණු අතර පිබිදීම සිදුවෙමින් පැවතිණි. එහෙත් යොෂියා පහත දැක්වෙන දේ මගින් පරාජය විය.

 (1) සිත වික්ෂිප්ත වීම: ඔහුට සම්බන්ධයක් නැති යුද්ධයකට ඔහු ගියේය. (2 ලේකම් 35:20)

 (2) අකීකරු වීම: යොෂියා සවන් දීම ප්‍රතික්ෂේප කෙළේය. (2 ලේකම් 35:21-22)

 (3) රැවටිල්ල : ඔහු වෙස් මාරුකර ගත්තේය. (2 ලේකම් 35:22)

 (4) පරාජය විය: ඔහුට සටනේදී තුවාළ සිදුවිය. (2 ලේකම් 35:23)

 (5) මරණය: යෝෂුවාට මිය යෑමට සිදුවිය. (2 ලේකම් 35:24)

ප්‍රවේසම්වන්න ඔබද එම ආත්මික පිරිහීමම අනුගමනය කිරීමට ඉඩ තිබේ.

- සිත වික්ෂිත වීම
- අකීකරු වීමටද, එය
- රැවටීමටද, එය
- පරාජයට ද,
- අවසානයේ ආත්මික මරණයට ද මග පෙන්වනු ඇත.

## සෙරුබ්බාබෙල් යටතේ පිබිදීම

**යොමුව:**

හග්ගයි 1, සෙකරියා 1:1-6

සෙරුබ්බාබෙල්, ෂෙෂ්බශර් නමින් ද හැඳින්විනි (එස්රා 5:16). ඔහු ජුදාහි ආණ්ඩුකාරයාද, දෙවියන්වහන්සේ විසින් තෝරාගනු ලැබූ දෙවියන්වහන්සේගේ සේවකයෙක්ද, සමිඳාණන්වහන්සේට ජෙරුස් මුද්දක් ද විය.

ජෙරුස් මුද්ද, රාජකීයත්වය හඳුනාගැනීමේ ලකුණකි. ලියුම් හා ලිපි ලේඛණ අත්සන් කිරීමට එය යොදා ගැණුනි. තම වචනය මුද්‍රා කිරීමට ඔහු එය භාවිත කෙළේය. එය ඔහුව නියෝජනය කළ

බැවින්, ඔහු එය ප්‍රවේශමෙන් ආරක්ෂා කළ අතර සාමාන්‍යයෙන් පැළඳ සිටියේය. එය ඉතාමත්ම වටිනා වස්තුව විය.

යෙකොනියා සමිදාණන්වහන්සේගේ දකුණතේ මුදාව මෙන් සිටි නුමුත් ඔහුව උදුරා දමන ලදී. (යෙරෙමියා 22:24)

## දැන් පවතින තත්ත්වය

1. යොෂියා යටතේ පිබිදීම සිදු වු පසු, දෙවියන්වහන්සේගේ සෙනඟ නැවතත් පාපයට ඇදී ගියේය. දේව වචනයට ප්‍රතිචාර දැක්වීමෙන් ඉගෙන ගැනිමට තිබූ අවස්ථාව ඔවුන් ප්‍රතික්ෂේප කළ අතර විපත් මගින් ඉගෙනීම අවශ්‍ය විය.

2. ජුදාවරු 70 වසරක් බිබිලෝනියේ වහලුන් ලෙස සිටියෝය. දෙවියන්වහන්සේ දයාවන්ත ලෙස මැදිහත් වී, මේ සෙනඟ නිදහස් කරන ලෙස හා ඔවුන්ට උපකාර කරන ලෙස සයිරස් රජුගේ සිත පෙලඹවු සේක. එබැවින් ක්‍රිස්තු පූර්ව 538 දී, පණස් දහසකට අඩු සංඛ්‍යාවක කුඩා කණ්ඩායමක් යෙරුසලමට ආපසු පැමිණියහ.

3. හග්ගයි 1:2 බලන්න. "මේ සෙනඟ" යන්නෙත් පෙන්වන්නේ දෙවියන්වහන්සේ අතර හා උන්වහන්සේ කලින් හැඳින්වු "මාගේ සෙනඟ" අතර ඇති පරතරය වේ.

4. මේ කාලයේ පවතින තත්ත්වය එස්රා 1:6,9-10,5-6 පරිච්ඡේද 2:10-17 හි සඳහන් වේ.

## අවදි කිරීමේ සාධක:

1. දෙවියන්වහන්සේ දිවැසිවරු දෙදෙනෙකු එවු සේක. හග්ගයි හා සෙකරියා යන දෙදෙනාම ක්‍රිස්තු පූර්ව 520දී සමිදාණන්වහන්සේගේ වචනය දේශනා කරමින් පැමිණියහ.

   හග්ගයිගේ පණිවුඩය මෙසේය:

   **ඔබගේ ප්‍රමුඛතාවන් සලකා බලන්න.** ඔබ පිබිදීම අත්දකින්නට නම්, ඔබගේ වැඩට පෙර දෙවියන්වහන්සේ වැඩ කළ යුතුය. ඔබගේ කාලයේත්. දීමනාවලත්, ශක්තියේත්, මුදල්වලත් ඉවත ලන කොටස් දෙවියන්වහන්සේට දීම නවත්වන්න.

   ඔවුන්ට 16 වසරකට පෙර අවශ්‍ය ද්‍රව්‍ය දුන්නද දේව මාලිගාව නැවත ගොඩනැගුවේ නැත. ඔව්හු ඔවුන්ගේ නිවෙස් තනා ගත්හ. (හග්ගයි 1:4)

   දෙවියන්වහන්සේගේ වැඩට ප්‍රමුඛස්ථානය දෙන ලෙස ඔවුන්ට කියන ලදී. එවිට උන්වහන්සේ සතුටු වන අතර මහිමයට පත් කෙරෙනු ඇත. (හග්ගයි 1:8)

   **ඔබගේ ජිවිත පිළිවෙල ගැන සිතා බලන්න.** සෙනඟගේ ජිවිත පිළිවෙළ දෙවියන්වහන්සේට අප්‍රසන්න විය. (හග්ගයි 1:5,7)

   **ඔබගේ තත්වය ගැන සිතා බලන්න.**
   ද්‍රව්‍යමය ලෙස: (හග්ගයි 1:6, 9-11,2:15-17)
   ආත්මික ලෙස: (හග්ගයි 2:10-14)

   සෙකරියාගේ පණිවුඩය පසුතැවිලි වීම සඳහා ප්‍රබල කැඳවීමක් විය (සෙකරි. 1:1-6). ඔහු සෙනඟට මෙසේ පැවසිය.

   - ප්‍රතිචාර දක්වන්න. සෙකරියා 1:3 හි ප්‍රධාන දෙය බලන්න, "මා වෙත හැරී එන්න. මම ද නුඹලා වෙත හැරී එන්නෙමි"
   - නිරීක්ෂණය මගින් ඉගෙන ගන්න. (හග්ගයි 1:4)
   - ජිවිතයේ සංක්ෂිප්තභාවය හඳුනා ගන්න. (සෙකරියා 1:5)
     දෙවියන්වහන්සේ ඉල්ලා සිටින්නේ ඔවුන්ගේ කාලයත්, ශක්තියත් කල් පවතින දෙයට දෙන ලෙසය.

- දේව වචනයට ආපසු හැරෙන්න. සෙකරියා 1:6
- දෙවියන්වහන්සේ අප සමග කටයුතු කරන්නේ අපගේ ජීවිත පිළිවෙළ හා අප කරන දේ අනුව වේ. (හග්ගයි 1:6)

### ප්‍රතිඵල:

1. නායකයෝ හා සෙනඟ කීකරු වූහ. දේශපාලන නායකයා (සෙරුබ්බාබෙල්) හා ආත්මික නායකයෝ මග පෙන්වූහ. (හග්ගයි 1:12)

2. ඔව්හු "බියවූහ" නැතහොත් පණිවුඩය වැදගත් සේ සැලකූහ. (හග්ගයි 1:12)

3. ප්‍රතිචාර දැක්වූවන්ට දෙවියන්වහන්සේ (තම වැඩ විමසීමෙන් හා ආත්මයෙන්) දිරිගැන්වූ සේක.

4. ප්‍රමුඛතාවන් නිසි පිළිවෙළට සකස් කෙරිනි. (හග්ගයි 1:14)

5. දෙවියන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කළ සේක. හග්ගයි 2:15-17 හා 18-20 අතර තත්ත්ව සංසන්දනය කරන්න.

## සලමොන් යටතේ පිබිදීම

### යොමුව:

2 ලේකම් 6-7

### දැන් පවතින තත්ත්වය:

දේව මාලිගාව දෙවියන්වහන්සේට ගෞරව කිරීම සඳහා පිළියෙල කෙරිනි. "සුදානම් කළ මාලිගාව" ඔබගේ ජීවිතයට ආත්මිකව යෙදිය හැකිය. ඔබ ඔබගේ මාලිගාව සුදානම් කළහොත් දෙවියන්වහන්සේ ගරු කරනු ඇත.

### අවදි කිරීමේ සාධක:

මෙම පිබිදීමේ ප්‍රතිඵලයක් ලෙස "සුදානම් කළ මාලිගාව" දෙවියන්වහන්සේට කැප කරන ලදි. 2 ලේකම් 6 හි සලමොන් :

- දෙවියන්වහන්සේට නමස්කාර කරයි.
- අතීතයේ දෙවියන්වහන්සේ කළ දෙය පුනරීක්ෂණය කරයි.
- දේවවචනයට අනුකූලව ආයාචනා කරයි.

### ප්‍රතිඵල:

7 පරිච්ඡෙදයේ දෙවියන්වහන්සේ ප්‍රතිචාර දැක්වූයේ,

- පූජකයන්ට සේවය කිරීමට නොහැකි තරම් වන තේජාලංකාරයක ඇතිවය.
- නමස්කාරයේ හා කැපවීමේ අලුත් කළ ආත්මයක් සහිතවය.
- තෝරාගැනීමක් ඇත. දෙවියන්වහන්සේගේ වචනයට මිනිසා දක්වන ප්‍රතිචාරය මත පිබිදීම අඛණ්ඩව පැවතිය හැකිය නැතහොත් නැවැත්විය හැකිය.
- එළිදරව්ව පිබිදීමට ප්‍රධාන වන දෙය වේ. (2 ලේකම් 7:14)

## යෝනා යටතේ පිබිදීම

### යොමුව:

යෝනා පොත

### දැන් පවතින තත්ත්වය:

1. යෝනා හිතුවක්කාර වු අතර දෙවියන්වහන්සේගේ අණට කීකරු නොවුවාසේම පිබිදීමේ උපකරණයක් ලෙස යොදා ගැනීම ප්‍රතික්ෂේප කෙළේය.

2. නිනිවය ඉතා දුෂ්ට නගරයක් විය.

### අවදි කිරීමේ සාධක:

1. පිබිදීම සැබවින්ම ආරම්භ වුයේ මිථ්‍යාදෘෂ්ටි නාවිකයන් අතර (යෝනා 1:16) හා යෝනා මත්ස්‍යයාගේ කුසෙහි සිටියදිය (යෝනා 2).

2. පසුතැවීම පිළිබඳ පණිවුඩය යෝනා, නිනිවෙහිදී දේශනා කිරීම.

### ප්‍රතිඵල:

1. මුළු නගරයට පසුතැවිලි විය.

2. මෙය විදේශීය රටක හා විජාතීන් අතර වාර්තා වී ඇති එකම පිබිදීම වේ. යෝනා පොතෙන් පෙන්වන්නේ දෙවියන්වහන්සේ යුදෙව්වන්ගේ පමණක් වු ගොත්‍රික දෙවි කෙනෙක් නොව සියලු ජාතීන්ගේ දෙවි කෙනෙක් බවය. යෝනා 2:9 න් පෙන්වන්නේ ගැළවීම සමිදාණන්වහන්සේගෙන් මිස, සංස්කෘතික, අධ්‍යාපනික, නිකායික හෝ පුජාවන් හා සම්බන්ධ දෙයක් නොවන බවය.

## නෙහෙමියා යටතේ පිබිදීම

### යොමුව:

නෙහෙමියා 8-10

### දැන් පවතින තත්වය:

ප්‍රතිසංස්කරණය මෙම පිබිදීමට පෙර සිදුවිය. නෙහෙමියා 1-6 කියවන්න. සිදුවු සිද්ධීන්, අප පිබිදීමක් අත්දැකීමට පෙර සිදුවිය යුතු දෙයෙහි ස්වභාවික සමාන්තරයක් වේ.

- අපද්‍රව්‍ය ඉවත්කිරීම
- අත්තිවාරම් නැවත ඉදිකිරීම
- සතුරා පරාජය කළ යුතු අන්දම ඉගෙනීම

### අවදි කිරීමේ සාධක:

1. පවුර (නෙහෙමියා) හා දේව මාලිගාව (එස්රා) නැවත ඉදිකිරීම

2. එස්රා හා නෙහෙමියා යන දෙදෙනාගේම සේවය

3. සෙනඟගේ එක්සත් බව හා සහයෝගය: නෙහෙමියා 3 හා 4:6

## ප්‍රතිඵල:

නෙහෙමියා යටතේ සිදුවූ පිබිදීමේ මූලික කරුණු නවයක් තිබිණි.

1. දේව වචනය ගැන අලුත් කළ අවධාරණය: ව්‍යවස්ථා පොත සෙනඟ, නායකයන් වෙත ගෙන ආවේය. එවිට සිදුවූ දේවල්,

| | | |
|---|---|---|
| - | දේව වචනය කියවීම | නෙහෙමියා 8:1-5,18 |
| - | දේව වචනය ඉගෙන්වීම හා දේශනා කිරීම | නෙහෙමියා 8:8 |
| - | දේව වචනය අවබෝධ කර ගැනීම | නෙහෙමියා 8:12 |
| - | දේව වචනයට කීකරු වීම. | නෙහෙමියා 10:29 |

පිබිදීම ආරම්භ වුයේ සෙනඟ දේව වචනය වෙත ආපසු පැමිණීමෙනි. පිබිදුනු මනුෂ්‍යයෝ පිබිදීමේ උපකරණ වෙති. පිබිදුණු තනි පුද්ගලයන් නිසා සාමුහික පිබිදීම ඇතිවිය.

මෙම පිබිදීම, දේව වචනයට කැපවූ නායකයෙකු කැඳවීය. මේ භූමිකාව සඳහා දෙවියන්වහන්සේට එස්රා යොදා ගත හැකි වුයේ....

> **දෙවියන්වහන්සේගේ යහපත් හස්තය ප්‍රකාරයට ... එස්රා ස්වාමින්වහන්සේගේ ව්‍යවස්ථාව සොයන්ටත් පවත්වන්ටත් ඉශ්‍රායෙල්හි පනත්ද විනිශ්චයන්ද උගන්වන්ටත් තමාගේ සිත. යොමුකරගත්තේය. (එස්රා 7:9-10)**

2. අතීතයේත් වර්තමානයේත් දෙවියන්වහන්සේ හඳුනාගැනීම හා පිළිගැනීම. නෙහෙමියා 9

3. ගරු කිරීම : නෙහෙමියා 8:5

   - දෙවියන්වහන්සේට
   - දේව වචනයට
   - සමිඳාණන්වහන්සේගේ දවසට

4. සැබෑ නමස්කාරයට නැවත පැමිණීම : නෙහෙමියා 8:6 හා 9 පරිච්ජේදය.

5. ලෝකය ප්‍රතික්ෂේප කිරීම. වෙන්වීම, නැවත සදාචාරාත්මක විම, නෙහෙමියා 9:2,28,10؛ 13:3

6. අලුත් කළ කැපවීම : නෙහෙමියා 9:38؛ 10:29

   - දේව මාලිගාවට : නෙහෙමියා 10:39
   - ශබ්ඩාකාරිත්වයට: නෙහෙමියා 8:10؛10:37؛13:11-12
   - නිරාහාරව සිටිමට : නෙහෙමියා 9:1,
   - යාච්ඤාවට : නෙහෙමියා.

7. සිය කැමැත්තෙන් සේවය කිරීම.
   - දෙවියන්වහන්සේට: නෙහෙමියා 11:1-2
   - ස්වාමීන් තුළ සහෝදරයන්ට හා සහෝදරියන්ට: නෙහෙමියා 8:10

8. එක්සත්කම නැවත ඇති කිරීම : නෙහෙමියා 8:1

9. පාපී ස්වභාවය පිළිගැනීම 9:33
   - පාපය හැඳින ගැනීම : නෙහෙමියා 9:33
   - පසුතැවිලි වීම හා පාපොච්චාරණය : 9:1-3

# දහතුන්වන පරිච්ඡේදය

## පිබිදීම පිළිබඳ බයිබලීය මූලධර්ම

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- පැරණි ගිවිසුම් වාර්තාවේ පැහැදිලි කර ඇති පිබිදීමේ මූලධර්ම හතක් ලයිස්තු ගත කිරීමට
- දෙවියන්වහන්සේගේ පිබිදීමේ සැලැස්ම පැහැදිලි කෙරෙන බයිබලීය යොමුවක් සැපයීමට
- පිබිදීම අත්දැකීමට නම් ඇදහිලිවතුන් කළ යුතු දේ හතරක් ලයිස්තු ගත කිරීමට
- ප්‍රතිචාරයක් දැක්වීමක් වශයෙන් දෙවියන්වහන්සේ කරන්නාවූ කාරණා තුනක් සාරාංශ කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**මාගේ නාමය දරන මාගේ සෙනඟ යටත් වී යාච්ඤාකර මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු මාර්ග අත්හැරියොත්, මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමාකොට ඔවුන්ගේ දේශය සුව කරන්නෙමි**. (2 ලේකම් 7:14)

### හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයෙන් ඔබ පැරණි ගිවිසුමේ පිබිදීම් අධ්‍යයනය කළෙහිය. මෙම පරිච්ඡේදයෙන් පරණ ගිවිසුමේ නිදර්ශනවලින් ලබාගත් පිබිදීමේ බයිබලීය මූලධර්ම සාරාංශ ගත කරනු ලැබේ.

### පිබිදීමේ බයිබලීය මූලධර්ම

පිබිදීම් දෙකක් කිසි විටෙකත් සර්වසම නොවේ. එහෙත් පහත දැක්වෙන මූලධර්ම පැරණි ගිවිසුම් වාර්තාවේ පැහැදිලිව පෙනේ.

1. පැරණි ගිවිසුමේ බොහෝ පිබිදීම්වලට පෙර ගැඹුරු ආත්මික පිරිහීමේ හා බලාපොරොත්තු කඩවීමේ කාලයක් පැවතිණි. ඔබ වටා ඇති තත්ත්වයන් පිරිහෙන විට හා ඔබ කලකිරීමට පෙලඹෙනවිට ප්‍රීති ප්‍රමෝදවන්න. ... ඔබ පිබිදීමට ආසන්නව සිටිනවා විය හැකිය.

2. සෑම පිබිදීමක්ම ආරම්භ වූයේ එක් මිනිසෙකුගේ සිත තුළය. ඔහු අන් අය පෙලඹවීම සඳහා දෙවියන්වහන්සේගේ උපකරණය විය. දෙවියන්වහන්සේ ඔබගේ හදවත පිබිදීමේ ගින්නෙන් ස්පර්ශ කරන විට ඔබ අන් අයගේ පිබිදීමේ ගිනි දැල්ලට පවන් ගසන්නෙහිය. මෙය සන්නද්ධ කරන්නෙකුගේ සැබෑ කාර්යය වේ.

3. පැරණි ගිවිසුමෙහි සෑම පිබිදීමක්ම දේව වචනය ප්‍රබලව ප්‍රකාශ කිරීම මත පදනම් විය. පිබිදීමේ පණිවුඩය අවධාරණය කළ යුත්තේ පාපය, නිරය හා දෙවියන්වහන්සේගේ විනිශ්චය මත මිස බලය, ප්‍රේමය, සාමය හා සමෘද්ධිය මත නොවේ. මෝසෙස්ගේ පිබිදීමේ පණිවුඩය සලකා බලන්න.

   **මම අද නුඹලා ඉදිරියෙහි ආශිර්වාදයක්ද ශාපයක්ද තබමි. ආශිර්වාදය වන්නේ මා අද නුඹලාට අණ කරන නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ ආඥාවලට නුඹලා කීකරු වුණොත්ය. ශාපය වන්නේ නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ ආඥාවලට කීකරු නොවී,**

**නුඹලා නාඳුනන අන් දෙවිවරු අනුව යමින්, මා විසින් අද නුඹලාට අණ කරන මාර්ගයෙන් අහක්ව ගියොත්ය. (ද්විතීය කතාව 11:26-28).**

සාමුවෙල්ගේ වචන අසන්න:

**සාමුවෙල් මුළු ඉශ්රායෙල් වංශයට කතා කොට: නුඹලාගේ මුළු සිතින් නුඹලා ස්වාමීන්වහන්සේ වෙතට හැරී එන්නහු නම්, නුඹලා අතරෙන් අන්‍ය දෙවිවරුන්ද අෂ්ටාරොත්ද පහකර දමා නුඹලාගේ සිත් ස්වාමීන්වහන්සේ දෙසටම යොමුකොට උන්වහන්සේට පමණක් සේවය කරන්න. උන්වහන්සේද පිලිස්තිවරුන්ගේ අතින් නුඹලා ගලවා ගන්නවා ඇතැයි කීවේය. (1 සාමුවෙල් 7:3)**

එසකියෙල්ගේ වචන විමසන්න:

**එසේම මනුෂ්‍ය පුත්‍රය, මම නුඹ ඉශ්රායෙල් වංශයට මුරකාරයෙකු කළෙමි. නුඹද මාගේ මුඛයෙන් වචනය අසා, මාගේ නාමයෙන් ඔවුන්ට අවවාද කරන්න. එම්බා දුෂ්ටය, නුඹ නසිනවාම ඇතැයි මා විසින් දුෂ්ටයාට කී කල්හි, තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස දුෂ්ටයාට අවවාද කිරීමට නුඹ කතා නොකර සිටියොත්, දුෂ්ට වූ ඔහු තමාගේ අයුතුකම නිසා නසිනවා ඇත. එහෙත් ඔහුගේ ලේ නුඹ අතින් අය කරන්නෙමි. (එසකියෙල් 33:7-8)**

එලියාගේ වචන අසන්න:

**එවිට එලියා මුළු සෙනඟ ළඟට ඇවිත් කතාකොට: නුඹලා කොපමණ කල් කල්පනා දෙකක් අතරේ හිරවී සිටිනවාද? ස්වාමීන්වහන්සේ දෙවියන්වහන්සේ නම් උන්වහන්සේ අනුව යන්න. බාල් දෙවියන්වහන්සේ නම් ඔහු අනුව යන්නැයි කීවේය. නුමුත් සෙනඟ ඔහුට කිසි උත්තරයක් දුන්නේ නැත. (1 රාජාවලිය 18:21)**

4. පිබිදීමට පෙර සෑම විටම පාපය ගැන පසුතැවීම සිදු විය. පසුතැවිලිවීමට, සෑම පිළිරුවක් විනාශ කිරීමද ලෝකයාගෙන් වෙන්වීමද අන්තර් ගත වේ.

5. නිසි ප්‍රමුඛතාවන් සඳහා නැවත හැරීම සිදුවුනේය. මේවා අතර අන් අය පිළිබඳ සැලකීම, සබත පැවැත්වීම, දීම, යාච්ඤාව හා දේව වචනය විය.

6. සැබෑ ලෙස දෙවියන්වහන්සේ නමස්කාර කිරීම නැවත ඇරඹිණි. මෙම නමස්කාරය ඇල්මැරුණු හා විධිමත් පිළිවෙත් සහිත වුවක් නොවූ අතර එය උද්‍යෝගිමත්, ඔවුන්ගේ ස්වාමීන්වහන්සේට සෙනඟගේ හැඟිම්බර ප්‍රතිචාරයක් විය.

7. සෑම පිබිදීමකටම පසු සාරවත්, සමෘද්ධිමත්, ප්‍රීතිමත් හා සතුටෙන් පිරී කාලයක් විය.

## දෙවියන්වහන්සේගේ පිබිදීමේ සැලැස්ම

පැරණි ගිවිසුම් වාර්තාවල පිබිදීම සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්මද තිබේ.

**මාගේ නාමය දරන මාගේ සෙනඟ යටත් වී යාච්ඤා කර මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු මාර්ග අත්හැරියොත්, මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමාකොට ඔවුන්ගේ දේශය සුව කරන්නෙමි. (2 ලේකම් 7:14)**

මෙම පදයේ පිබිදීම පිළිබඳ වැදගත් මූලධර්ම බොහොමයක් අන්තර්ගතය. පළමුව උන්වහන්සේගේ සෙනඟට ("මාගේ සෙනඟ") කතා කරන සේක. උන්වහන්සේ පව්කාරයන්ට හෝ ලෝකයාට හෝ පොදුවේ ඕනෑම කෙනෙකුට හෝ කතා නොකරන සේක. දෙවියන්වහන්සේ "උන්වහන්සේගේ නාමය දරන" උන්වහන්සේගේ සෙනඟට කතා කරන සේක. පිබිදීම අත්දැකීමට නම් දෙවියන්වහන්සේගේ සෙනඟ කළ යුතු දේ මෙසේ වේ.

**1. යටහත් වීම**

යටහත් වීම යනු දෙවියන්වහන්සේ ඉදිරියේ ඔබ නිහතමානි වීම වේ. (ලෙවී කතාව 26:40-41 බලන්න.) මෙම යටහත් වීමට දෙවියන්වහන්සේ (2 ලේකම් 34:1-13), උන්වහන්සේගේ වචනය (2

ලේකම් 34:14-28), හා උන්වහන්සේගේ සෙනඟ (2 ලේකම් 34:29-33) ඉදිරියේ යටහත් වීම අයත් වේ.

### 2. "යාච්ඤා කිරීම"

ඔබ යාච්ඤා කළ යුත්තේ (1) දෙවියන්වහන්සේව සෙවීමේ හා (2) නපුරු මාර්ග අත්හැරීමේ සුවිශේෂී යාච්ඤාවන් වේ. අපට බොහෝ විට "නොලැබෙන්නේ" අප "නොඉල්ලන" නිසා හෝ "වැරදි ලෙස" ඉල්ලන නිසා හෝ වේ. අප පුබුදන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලිය යුතු අතර ශුද්ධාත්මයාණන්වහන්සේ අප හදවත් තුළ ක්‍රියා කිරීම සඳහා සූදානම් වීමට පාපොච්චාරණයේ හා පශ්චාතාප වීමේ සුවිශේෂී යාච්ඤා කළ යුතුය.

### 3. "මාගේ මුහුණ සොයා"

"දෙවියන්වහන්සේව සෙවීම" යන වාක්‍ය ඛණ්ඩය පහත දැක්වෙන පරණ ගිවිසුම් ඡේදවල ඇත. නික්මයාම 33:7, ද්විතිය කතාව 4:29, එස්රා 8:22, 2 සාමුවෙල් 12:16, 21:1, 1 ලේකම් 16:10-11, 2 ලේකම් 7:14, 11:16, 15:4, 20:4, ගීතාවලිය 105:3-4, 24:6, 27:8, 40:17, 69:7, 70:5, හිතෝපදේශ 28:5, යෙසායා 51:1, යෙරෙමියා 29:13, 50:4, හොෂෙයා 3:5, 5:6-7, 15, 7:10, දානියෙල් 9:3, ශෙපනියා 1:6, සෙකරියා 8:21, මලාකි 3:1.

මෙම ඡේද විමසා බැලිමේදී පෙනෙන්නේ සමිඳාණන්වහන්සේ සෙවීමට පහත දැක්වෙන දේ අයත් බවය.

1. මුළු හදවතින්ම හා ස්වේච්ඡාවෙන්ම දෙවියන්වහන්සේ වෙතට හැරීම
2. උන්වහන්සේට සේවය කිරීමේ අභ්‍යන්තර ආකල්පයක් තිබීම.
3. නපුරෙන් ඉවත් කිරීමට තීරණය කිරීම.
4. උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට තීරණය කිරීම.
5. නොකඩවා යාච්ඤා කිරීමට කැපවීම.

නපුර මඟ හැරීමේ ප්‍රධාන මාර්ගය වන්නේ සමිඳාණන්වහන්සේ සෙවීම වේ. (ආමොස් 5:4,14). එය යටහත්වීමේ සාක්ෂියකි (ශෙපනියා 2:3). එය දෙවියන්වහන්සේ වැඩ සිටීම දැනෙන පදනම වේ (හොෂෙයා 5:15). එය ජීවනය ගෙන එයි (ආමොස් 5:4,6). එමන්ම එය මුළු හදවතින්ම කළ යුතු වේ (යෙරෙමියා 29:12-13).

### 4. "නපුරු මාර්ග අත්හැරීම"

යාච්ඤා කිරීම හා දෙවියන්වහන්සේ සෙවීම පමණක් ප්‍රමාණවත් නොවේ. මේ සමඟ සැබෑ පශ්චාත්තාප වීමද තිබිය යුතුය. එයින් අදහස් වන්නේ මාර්ගය වෙනස් කිරීමකි. ඔබ ඔබගේ නපුරු මාර්ග අත්හැර දෙවියන්වහන්සේ වෙතට පැමිණිය යුතුය. පශ්චාත්තාප වීම යනු බයිබලිය පිබිදීම්වල අවධාරණය කර තිබෙන සත්‍යය වේ. එය සියලු පැරණි ගිවිසුම් පිබිදීම්වලම දැකිය හැකිය. සභාව ආරම්භ වූයේ පශ්චාතාප වීමට කැඳවීමෙනි (ක්‍රියා 2). එළිදරව් පොතේ අවසාන කැඳවීම වන්නේද පශ්චාතාප වීමට වේ (එළිදරව් 22:16).

පසුතැවීම යනු ඔබගේ ජීවන මඟ වෙනස් කිරීමට හැකිවන දෙවියන්වහන්සේගේ ත්‍යාගයකි (ක්‍රියා 5:29-31, 11:15-18, 2 තිමෝති 2:22-26). පසුතැවී සිත් හරවාගන්නා ලෙස සියලු මනුෂ්‍යයන්ට අණ දී තිබේ (ක්‍රියා 17:30). සියලු දෙනා පසුතැවිලි වීම දෙවියන්වහන්සේගේ කැමැත්තය (2 පේතෘස් 3:9). එමෙන්ම මිනිසුන් පසුතැවීම වෙත ගෙන ඒමට දෙවියන්වහන්සේ මහත් කරුණාවෙන් යුතුව ක්‍රියා කරන සේක (රෝම 2:4). පසුතැවීම නොමැතිව ඔබ විනාශ වනු ඇත (ලූක් 13:3,5). සකල ලෝක වාසීන්ට පසුතැවී සිත් හරවා ගැනීමද පව් කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරන ලෙස යේසුස්වහන්සේ අණ කළ සේක (ලූක් 24:47).

පසුතැවීමට යමක් නොකිරීම (ඔබ කළ යුතු දෙය නොකිරීම), කිරීම (ඔබ කරන වැරදි දේ) හා උපකල්පනය (දෙවියන්වහන්සේගෙන් මාර්ගෝපදේශ නොඉල්ලීම හා ඒ නිසා පව් කිරීම) යන මෙම පාපවලින් හැරීම අයත් වේ.

"නිෂ්ඵල ක්‍රියාවලින්" හැරීමද පසුතැවීමට අයත්ය (හෙබ්‍රෙව් 6:1-3). "නිෂ්ඵල ක්‍රියා" යනු මනුෂ්‍ය ප්‍රයත්නයෙන් දෙවියන්වහන්සේගේ ප්‍රසාදය දිනා ගැනීමට කරන ආගමික කටයුතු වේ.

නිෂ්ඵල ක්‍රියාවලට නමස්කාරය, දසයෙන් කොටස දීම හා දයානුකම්පිත ක්‍රියා වුවද ඇතුළත් විය හැකිය. නමස්කාරය ආත්මයෙන් හා සැබෑකමින් විය යුතු වේ. නැතහොත් එය නිෂ්ඵල ක්‍රියාවකි. බලාත්කාරයෙන්, චිත්තවේගී හැඟීම් නිසා හෝ සම්මාදම් තැටිය ඔබ ඉදිරියෙන් ගෙන යන විට නොදී සිටීමෙන් අපහසුතාවයට පත් වීම නිසා දීම නිෂ්ඵල ක්‍රියා වේ. යුතුකමක් වශයෙන් හෝ කීර්තිය ලබා ගැනීමට හෝ කරන කාරුණික කටයුතු හා සේවය ද නිෂ්ඵල ක්‍රියාවන්ය.

දෙවියන්වහන්සේගේ ආත්මයෙන් ප්‍රාණවත් නොකෙරෙන ඕනෑම ක්‍රියාවක් නිෂ්ඵල ක්‍රියාවකි. නිදසුනක් ලෙස දෙවියන්වහන්සේගේ ආත්මයේ සිහින් හඬට සැලකිල්ලක් නොදක්වා ශුභාරංචිය සෑම වේලෙහිම හා සෑම තැනකම බෙදා ගැනීම ඌරන් ඉදිරියේ මුතු ඇට දැමීමක් වැනිය (මතෙව් 7:6). එමෙන්ම ගරහන්නන්ට අවවාද දීමද නිෂ්ඵලය (හිතෝපදේශ 9:7-8). ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් නොව මාංසික ශක්තියෙන් කරන කාරුණික කටයුතු හා සේවය ද නිෂ්ඵල ක්‍රියාවන්ය.

මෙය නිරන්තරයෙන්ම ඔබගේ ආත්මික තත්ත්වය, ඔබගේ චේතනාවන් හා සේවය කරන ක්‍රමය විමසා බලා යමක් කිරීම, නොකිරීම, උපකල්පනයන් හා නිෂ්ඵල ක්‍රියා ගැන පසුතැවිලි විය යුතුය.

**සාරාංශය :**

පිබිදීම සඳහා සූදානම් වීමට ඔබ කළ යුතු දේ මෙසේය:

- යටහත් වන්න.
- යාච්ඤා කරන්න.
- දෙවියන්වහන්සේගේ මුහුණ සොයන්න.
- නපුරු මාර්ග අත්හරින්න.

මේවාට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් දෙවියන්වහන්සේ මේ දේවල් කරනු ඇත.

- "ස්වර්ගයේ සිට සවන් දීම" ප්‍රතිචාරය
- "ඔවුන්ගේ පාපවලට කමාව දීම" සමාදානය කිරීම
- "ඔවුන්ගේ දේශය සුව කිරීම" පුනරුත්ථාපනය

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. පැරණි ගිවිසුම් වාර්තාවල විස්තර කර ඇති පිබිදීමේ මූලධර්ම හතක් ලියන්න.

3. දෙවියන්වහන්සේගේ පිබිදීමේ සැලැස්ම පැහැදිලි කෙරෙන බයිබලීය යොමු කවරේද?

4. පිබිදීම අත්දැකීමට නම් ඇදහිලිවතුන් කළ යුතු දේ හතරක් ලයිස්තු ගත කරන්න.

5. ප්‍රතිචාරයක් දැක්වීමක් වශයෙන් දෙවියන්වහන්සේ කරන දේවල් තුනක් සාරාංශ කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

# තව දුරටත් අධ්‍යයනය සඳහා

1. අලුත් ගිවිසුමේ පිබිදීමේ පණිවුඩවල අන්තර්ගතය අධ්‍යයනය කරන්න. මේ අයගේ වචන සලකා
   බලන්න:
   යොහන් බව්තිස්ත — මතෙව් 3:11
   යේසුස්වහන්සේ — මාර්ක් 1:14-15, ලූක් 13:1-5
   පේතෘස් — ක්‍රියා 2:22-24

2. පැරණි ගිවිසුම් වාර්තාවල පිබිදීමේ වෙනත් බයිබලීය මූලධර්ම ඔබට සොයාගත හැකිද? එසේ නම් ඒවා මෙම පාඩමේ දී ඇති ලැයිස්තුවට එකතු කරන්න.

3. දෙවියන්වහන්සේ පිබිදීම ක්‍රියාත්මක කිරීමට තැත්කරන විට, දෙවියන්වහන්සේගේ ආත්මය ගැලීම නැවැත්වීමට සාතන් ප්‍රහාරය එල්ල කරයි. ඔබ පිබිදීම අත් දකින විට පහත දැක්වෙන අවදානම්වලින් ප්‍රවේසම් වන්න.

- දෙවියන්වහන්සේට දිය යුතු මහිමය මනුෂ්‍යයාට දීම. නායකයන්ට ගෞරව පිදිය හැකිය. එහෙත් මහිමාන්විත නොකළ යුතුය. පිබිදීම මනුෂ්‍යයන්ගේ අවධානය දෙවියන්වහන්සේ වෙතට යොමු කිරීම සඳහා වේ. මනුෂ්‍යයාට අවධාරණය යොමු කිරීමෙන් දෙවියන්වහන්සේ භාවිත කරන උපකරණ අයහපත් සැසඳීම්වලට භාජනය කළ හැකි අතර එමඟින් බෙදීම් ඇතිවිය හැකිය.
- දිව්‍යමය ලෙස පමණක් කළ හැකි දේ මනුෂ්‍ය ප්‍රයත්නයන් මඟින්ද කිරීමට උත්සාහ කිරීම. දෙවියන්වහන්සේ වෙනත් තැනක කරන දෙයක් එම ප්‍රතිඵලම ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් අනුකරණය කිරීමට මිනිස්සු උත්සාහ කරති.
- අමුතු හා සංවේදනාත්මක දේ වෙත අවධානය යොමු කිරීම. මෙමඟින් අවධානය දෙවියන්වහන්සේ වෙතින් ඉවත් කෙරේ. අවධාරණය කළ යුත්තේ සෙනඟ, කඳුළු, පාපෝච්චාරණය, දෙවියන්වහන්සේ වෙතට හැරීම, ප්‍රීතිය, උනන්දුව හෝ මිනිසාගේ ප්‍රතිචාරයන් විද්‍යමාන වන වෙනත් දෙයක් මත නොව දෙවියන්වහන්සේ මත විය යුතුය.
- දේව වචනය ඉගැන්වීම හා දේශනා කිරීම නොසලකා හැරීම. දේව වචනය පිබිදීමට පත්වූ පසුබටවූවන්ගේ සාක්ෂිවලින් හෝ අලුතෙන් හැරුනාවූ අයගෙන් හෝ ප්‍රතිස්ථාපනය කළ නොහැකිය. යාච්ඤා රැස්වීම් හෝ ප්‍රීතිවීමේ කාලයන් වැදගත් වුවත් ඒවා මඟින් වුවද දේව වචනය ප්‍රතිස්ථාපනය කිරීමට ඉඩ නොදෙන්න.
- පිබිදීමේ කටයුතුවලින් ඇතිවන පීඩනය නිසා දෙවියන්වහන්සේ සමග ගතකරන පෞද්ගලික කාලය නොසලකා හැරීම. ඔබ වටා සිටින අයගේ ජීවිත තුළ දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් දැකීමෙන් ඔබ ප්‍රීති ප්‍රමෝදයට පත්ව සිටින අතර තුර ස්වාමීන්වහන්සේ සමඟ ඔබ ගතකරන කාලය මඟ නොහරින්න වගබලා ගන්න.
- ආලුත් ඇදහිලිවන්තයන් උසස් කිරීම. පිබිදීම මඟින් දෙවියන්වහන්සේ වෙතට හැරුණාවූ අය ඇතැම්විට ඉතා ඉක්මණින් ප්‍රශංසාවට ලක් කරමින් උසස් කෙරේ.
- අහංකාරය හා ඊර්ෂ්‍යාව
- අතිශයෝක්තිය හා සත්‍යය විකෘති කිරීම. සංඛ්‍යා ලේඛන අතිශයෝක්තියෙන් ඉදිරිපත් කිරීම (දෙවියන්වහන්සේ වෙතට හැරුණාවූ හා සුවය ලැබූවන්). ඇතැම් සත්‍යයන් අවධාරණය කිරීම අවශ්‍යය (එනම් පසුතැවිලි වීම). එහෙත් වෙනත් ඒවා ඇතුළු නොවන සේ වැඩිකොට නොදැක්විය යුතුය. දෙවියන්වහන්සේගේ සම්පූර්ණ උපදෙස් සැලකිල්ලට ගත යුතුය. මන්ද එය මුළුමනින්ම පිබිදීමේ පණිවුඩයකි.
- අපකීර්තිය ඇති කෙරෙන පාපොච්චාරණයන්. අප පසුතැවිලිවීමට හා අන් අය සමග වැරදි සාදා ගැනීම පටන් ගන්නා විට පාපොච්චාරණය අවශ්‍යය. එහෙත් අපකීර්තිය ඇති කෙරෙන පාපොච්චාරණ මඟින් යහපතට වඩා අයහපත සිදුවිය හැකිය. එය නොපෙනෙන ලෙස ඕපාදූප කීමේ ක්‍රමයකි. පාපොච්චාරණය ප්‍රසිද්ධියේ කරන විට මෙම ප්‍රශ්නය අසන්න. "මාගේ පාපොච්චාරණය මඟින් දෙවියන්වහන්සේගේ කටයුතුවලට බාධා ඇතිවේද? නැතහොත් අනුබලයක් වේද?"

# දහහතරවන පරිච්ඡේදය

## සන්නද්ධ කරන්න.

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- අන් අය සන්නද්ධ කිරීම උදෙසා දෙවියන්වහන්සේ භාවිත කළ මිනිසෙකු පිළිබඳ නිදර්ශනයක් පැරණි ගිවිසුමෙන් හඳුනා ගැනීමට
- "සන්නද්ධ කරන්නෙකුට" අවශ්‍ය ගුණාංග තුනක් සාරාංශ කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**එහෙත් මා සමඟ ගිය මාගේ සහෝදරයෝ සෙනඟගේ සිත් දියව යන්ට සැලැස්සුවෝය. නුමුත් මම සම්පූර්ණ ලෙස මාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ අනුව ගියෙමි.** (යෝෂුවා 14:8)

### හැඳින්වීම

යෝෂුවා හා ඉශ්‍රායෙල් ජාතිය, දෙවියන්වහන්සේ ඔවුන්ට පෙන්වූ දේශය වෙත ගොස් එය අල්ලා ගැනීම සඳහා සන්නද්ධ කළ ආකාරය වෙත අවධානය යොමු කෙරෙන පරිච්ඡේද හතරක පාඩම් මාලාවක් මෙම පාඩමෙන් ආරම්භ වේ. ඔබ ඔබගේ ගම, නගරය හා ජාතිය දෙවියන්වහන්සේ වෙනුවෙන් අත්පත් කර ගැනීම සඳහා සන්නද්ධ කර ඇති විට ඒ සඳහා යොදා ගත හැකි මූලධර්ම බොහෝමයක් යෝෂුවා පොතේ අන්තර්ගත වේ.

අන් අය සන්නද්ධ කිරීම සඳහා දෙවියන්වහන්සේ යොදා ගන්නා මිනිසෙකුගේ ස්වභාවය මෙම පාඩමෙන් අවධාරණය කෙරේ. පහළොස්වන පරිච්ඡේදයෙන් එළිදරව් වන්නේ, සෙනඟ කණ්ඩායමක් සන්නද්ධ කිරීමට පෙර අවශ්‍ය සූදානමය. දහසය වැනි පරිච්ඡේදයේ අන්තර්ගත වන්නේ "විනිවිද යෑමේ මූලධර්ම" වේ. දහහත්වන පරිච්ඡේදයේ ඇත්තේ පරාජය සමඟ කටයුතු කරන ආකාරය වේ. "තෙනුවරක කථාන්දරය" නමැති දහඅටවන පරිච්ඡේදය ආත්මික යෝධයන් අල්ලා ගැනීම පිණිස බයිබලීය මූලධර්ම සපයයි.

### කානාන් දේශය

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට දෙන්නට පොරොන්දු වූ දේශය, කානාන් වේ (යෝෂුවා 1:2). දේශය අල්ලා ගැනීම පිණිස ඔවුන් සන්නද්ධව ඉදිරියට යන විට ඔවුන් අත්නාරින බවට දෙවියන්වහන්සේ පොරොන්දු වූ සේක (යෝෂුවා 1:5). ඔවුන් යන ඕනෑම තැනක ඔවුන් සමඟ සිටීමටද උන්වහන්සේ පොරොන්දු වූ සේක (1:9). මේවා හිමිකම් කිම සඳහා පුදුමාකාර සත්‍යයන් වේ.

එහෙත් කිසිවක් නොකර නිකම් ඉඳගෙන සිටිය යුතු බවක් මෙම පොරොන්දුවලින් අදහස් නොකෙරිනි. ඇදහිල්ලේ පියවරක් ගත යුතුව තිබිණි. පළමු පියවර ගමන් කළේ යෝර්දාන් ගඟ වෙතය. යෝර්දාන් වෙත "නැගිට යන්නැ"යි දෙවියන්වහන්සේ සෙනඟට කී සේක. පළමු පියවර තැබීම ආරම්භ කළ යුත්තේ සෙනඟ මිස දෙවියන්වහන්සේ නොවේ. කානාන් දේශයේදී යෝධයන් හමුවන බවත් සටන් කිරීමට සිදුවන බවත් සෙනඟ දැන සිටියහ. එහෙත් ඔවුන් සමඟ සිටීමට දෙවියන්වහන්සේ පොරොන්දු වී සිටි සේක.

ලෝකයේ ජාතීන් වෙත ශුභාරංචිය ගෙන යන අය සමඟද දෙවියන්වහන්සේ සිටින බවට පොරොන්දුවක් දී ඇත (මතෙව් 28:19-20). ඔබව අමතක නොකරන බවටද දෙවියන්වහන්සේ

පොරොන්දු වී ඇත. එහෙත් ඔබට කිසිවක් නොකර සිටිය හැකි බවක් මින් අදහස් නොකෙරේ. ඔබ ගත යුතු ඇදහිල්ලේ පියවරක් ඇත.

ඔබගේ ගම, නගරය හා ජාතිය දෙවියන්වහන්සේ වෙනුවෙන් අල්ලා ගැනීමට ඔබ සන්නද්ධ කර විය යුතුය. ඔබගේ පළමු පියවර ඔබ "යොර්දාන් ගඟක්" හරහා ගෙන යන්නාක් මෙන් පෙණුනද ඔබ නායකයෙකු නම්, අන් අයව සන්නද්ධ කිරීමද ඔබ කළ යුතුය. "ඔබ සමඟ ගොස්" දේශය අත්පත් කරගන්නා අය ඔබ සන්නද්ධ කළ යුතුය.

## සන්නද්ධ කරන්නා

දෙවියන්වහන්සේ, යෝෂුවාට පැවසුවේ නැගිට ජෝර්දාන් ගඟෙන් එතෙරව ගොස්, පොරොන්දු දේශය අත්පත් කරගන්නා ලෙසය. එපමණක් නොව, සන්නද්ධ මුළු ඉශ්රායෙල් ජාතියම ගෙන යන ලෙස ඔහුට අණ කළ සේක (යෝෂුවා 1:2).

දෙවියන්වහන්සේ වෙනුවෙන් ගම්, නගර හා දේශය අත්පත් කර ගන්නා පිණිස දෙවියන්වහන්සේගේ සෙනඟ සන්නද්ධ කිරීමට තෝරා ගත් මිනිසා කවර ආකාරයේ කෙනෙක්ද? ඔබගේ බයිබලයේ යෝෂුවා පොත පෙරළා ගන්න. දෙවියන්වහන්සේගේ වැඩ කිරීම සඳහා මිනිසුන් මිලියන ගණනක් සන්නද්ධ කළ මිනිසෙකු වන යෝෂුවාගේ ගතිගුණ අපි විමසා බලමු (සෑම යොමු කිරීමක්ම ඔබගේ බයිබලයේ කියවා බැලීමට සහතික වන්න).

පළමුවෙන්ම, යෝෂුවා ඇදහිලිවන්තයෙක් විය. ඔහුගේ නමේ තේරුම "දෙවියන්වහන්සේ ගැළවුම්කාරයාණෝය" යන්න වේ. තවද ඔහු මෙවැනි කෙනෙකි.

### දෙවියන්වහන්සේ පවසන දෙය ඇසිණි:

දෙවියන්වහන්සේ කතා කළ විට උන්වහන්සේගේ හඬ යෝෂුවා දැන සිටියේය (යෝෂුවා 1:1).

### අතීතය අමතක කළ හැකි විය:

යෝෂුවාට අතීතය අමතක කළ හැකි කෙනෙක් විය. "මාගේ සේවක වූ මෝසෙස් මළේය"යි දෙවියන්වහන්සේ පැවසූ විට, උන්වහන්සේ යෝෂුවාට කියන්නේ අතීතය අමතක කර සමිඳාණන්වහන්සේ වෙනුවෙන් ඉදිරියට යන ලෙසය.

යෝෂුවා, මෝසෙස්ට ප්‍රේම කළේය. ඔහු මෝසෙස් සමඟ සටනේදී සේවය කළේය. ඔහු සමඟ පාළුකරයේ ගමන් කළේය. ඔහු වෙනුවෙන් කානාන් දේශයේ ඔත්තු බැලීම පිණිස යවනු ලැබීය. මෝසෙස් කළ බොහෝ හාස්කම් යෝෂුවා දැක තිබිණි. එමෙන්ම දෙවියන්වහන්සේ තම තේජාලංකාරය එළිදරව් කර, ඉශ්රායෙල්වරුන්ට ව්‍යවස්ථාව දෙන අවස්ථාවේ ඔහු සමඟ සීනයි කන්දේ සිටියේය.

යෝෂුවාට මෝසෙස් නැති අඩුපාඩුව කොපමණ දැනෙන්නට ඇද්ද? එහෙත් දැන් මෝසෙස් මිය ගොස් ඇති බැවින්, යෝෂුවා දෙවියන්වහන්සේ වෙනුවෙන් ඉදිරියට යා යුතුය. ඔබට අතීතයේදී කොපමණ මහත් දේ නැති වුවත් දෙවියන්වහන්සේ ඔබට "එය මියගොස් ඇතැ"යි අද කියනු ඇසෙන්නට අවශ්‍යය. අතීතය අමතක කර දෙවියන්වහන්සේගේ අලුත් දේවල් වෙත ඉදිරියට යන්න.

පාවුලුතුමා මෙසේ කිය, "පසුගිය දේ අමතක කරන්න" (පිලිප්පි 3:13). අමතක කළ යුතු බොහෝ නරක දේ පාවුලුතුමාට තිබිණි. ඔහු සභාවට පීඩා කළ අතර ස්තේපන්ට ගල්ගසා මැරීම බලා සිටියේය. එහෙත් අතීතයේ කළ හොඳ දේද තිබිණි. සමිඳාණන්වහන්සේ සඳහා මහත් හාස්කම් කරනු ඔහු දැක තිබූ අතර ශුභාරංචිය දේශනා කරමින් රට රටවල ඇවිද්දේය. එහෙත් දෙවියන්වහන්සේගේ අලුත් දේ තුළ "ඉදිරියට යාම" සඳහා ඊයේ පරාජයන්හි හෝ ජයග්‍රහණයන්හි හෝ ජීවත් විය නොහැකි බව ඔහු දැන සිටියේය.

## ඔහුට අයත් දේ ඔහු දැන සිටියේය:

ඉශ්රායෙල්ට අයත් දේ දෙවියන්වහන්සේ යෝෂුවා 1:3-4හි විස්තර කර ඇත. තමාට දෙවියන්වහන්සේ තුළ අයත් දේ යෝෂුවා නිශ්චිතව දැන සිටියේය.

ඇදහිලිවන්තයෙකුට අයත් කරගත හැකි බොහෝ දේ බයිබලයේ විස්තර කර ඇත. ගැළවීම, ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා හා ඵල, දෙවියන්වහන්සේගේ සියලු පොරොන්දු, මේවා ඔබට අයත් දේ වේ. ඒවා ඔබට ලබා ගැනීමට හා ඒවා අන් අය ලබා ගැනීමට සන්නද්ධ කිරීමට ඒවා මොනවාදැයි ඔබ දැන සිටිය යුතුය.

## ශක්තිමත්ය, ධෛර්යවත්ය:

යෝෂුවා ශක්තිමත්ව හා ධෛර්යවත්ව සිටියේය. ඔහු බොහෝ වරක් සටන්වලදී මේ බව ඔප්පු කර තිබේ. එහෙත් තම ශක්තියේ ප්‍රභවය දෙවියන්වහන්සේ බව ඔහු දැන සිටියේය (යෝෂුවා 1:5-6). දෙවියන්වහන්සේගේ බලය, අභිමුඛය, සැපයුම හා ආරක්ෂාව දෙන අයුරු මේ පදවල බලන්න. ඔබට නිවැරදි ආකල්පයක්ද ("ශක්තිමත්ව හා ධෛර්යවත්ව") නිවැරදි ක්‍රියාවක්ද ("නැගිට.......... එගොඩ වී යන්න") තිබිය යුතුවේ.

## සාර්ථකත්වයට මූලික වන දෙය දැන සිටියේය:

සාර්ථකත්වය සඳහා යෝෂුවාට තිබුණේ එක් මූලික දෙයක් පමණි. ඒ දේව වචනය වේ. සාර්ථකත්වයේ එක් ශ්‍රේෂ්ඨ තත්ත්වයක් වන්නේ දේව වචනයය. එය දිව්‍යමය පෙළඹවීම හා සන්නද්ධ කිරීම වේ. යෝෂුවා වචනය අසන්නෙකුම පමණක් නොව කරන්නෙකුද විය. දේව වචනය පදනම් කරගෙන තම චර්යාව සකස් කරගන්නා ලෙස ඔහුට අණ කෙරිණි. ඔහු නොකඩවා එය මෙනෙහි කළ යුතු විය.

දේව වචනය මෙනෙහි කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බවට සමාව අයැද යුතු කෙනෙක් කවදා හෝ සිටියේ නම් ඒ යෝෂුවා වේ. ඔහු සෙනඟ දහස් ගණනක් නොදන්නා දේශයකට රැගෙන යමින් සිටියේය (දේව වචනය තුළ සිටීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බවට සමාව ගැනීම සඳහා අප ඉදිරිපත් කරන හේතු නොසෑහෙන බව මින් අපට පෙනෙනවා නොවේද?).

ඔබට මිනිසුන් සාර්ථකව සන්නද්ධ කිරීමට අවශ්‍ය නම් ඔබ දේව වචනය තුළ කාලය ගත කළ යුතු අතර දේව වචනය පදනම් කරගෙන ඔබේ දෛනික වැඩ කටයුතුත් සේවයත් සංවිධානය කර ගත යුතුය.

## තමා වෙත දෙවියන්වහන්සේගේ ආත්මය තිබිණි:

යෝෂුවා වෙත දෙවියන්වහන්සේගේ ආත්මය තිබිණි.

> **ස්වාමින්වහන්සේ මෝසෙස්ට කතා කොට: ආත්මය ඇති මනුෂ්‍යයෙක් වන නූන්ගේ පුත්‍රවූ යෝෂුවා කැඳවා නුඹේ අත ඔහු පිට තබන්න. (ගණන් කථාව 27:18)**

## ඔහුට දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තිබිණි:

යෝෂුවා, දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තිබූ කෙනෙක් විය. "යොර්දාන් ගඟින් එතෙරට යන්නට උත්සාහ කරන හෙයින්" යයි ඔහු පැවසුවේ නැත. ඔහු පැවසුවේ "යොර්දාන් ගඟින් එතෙර යන හෙයින්" යනුවෙනි (යෝෂුවා 1:11).

## ඇදහිල්ලේ මිනිසෙක් විය :

ගණන් කථාව 13-14 කියවන්න. කානාන් දේශය අත්පත් කර ගත හැකි බව විශ්වාස කළේ යෝෂුවා හා කාලෙබ් පමණි. යෝෂුවා ඇදහිල්ලේ මිනිසෙකු වූ අතර ඔහු ඇදහිල්ලේ අනෙක් අය දිරිමත් කළේය. බිය අක්‍රිය කරන අතර ඇදහිල්ල සන්නද්ධ කරන බව ඔහු දැන සිටියේය.

## සේවකයෙකුගේ සිතක් තිබිණි:

යෝෂුවා ශ්‍රේෂ්ඨ නායකයෙකු වුවද ඔහුට සේවකයෙකුගේ සිතක් තිබිණි. ඔහු පළමුව තරුණයෙකු ලෙස සම්මුඛ මණ්ඩපයේදී සේවය කිරීමට උගත්තේය (නික්මයාම 33:11). ඔහු මෝසෙස්ගේ "සේවකයා" ලෙස හැඳින්විණි (යෝෂුවා 1:1).

## ප්‍රඥාවෙන් පූර්ණව සිටියේය:

යෝෂුවා, දෙවියන්වහන්සේගේ ප්‍රඥාවෙන් පූර්ණව සිටි කෙනෙක් විය.

> **"නූන්ගේ පුත්‍රවූ යෝෂුවා ... ප්‍රඥාවේ ආත්මයෙන් පූර්ණ වූයේය." (ද්වීතිය කතාව 34:9)**

## පහසුවෙන් ඉගැන්විය හැකි පුද්ගලයෙක් විය.

යෝෂුවා පහසුවෙන් ඉගැන්විය හැකි කෙනෙක් විය. සමිඳාණන්වහන්සේගේ නාමයෙන් අන් අය අනාවැකි කියනවා ගණන් කතාව 11 වන පරිච්ඡේදයේ ඔහු දැක්කේය. මෝසෙස් ස්වාමීන්වහන්සේගේ අනාගතවක්තෘ කෙනෙකු බැවින් අන් අය අනාවැකි කීම නවත්වන්නදැයි ඔහු මෝසෙස් ගෙන් ඇසිය.

මෝසෙස් මෙසේ පිළිතුරු දුන්නේය:

> **මෝසෙස්ද: නුඹ මා නිසා ඊර්ෂ්‍යා වෙනවාද? ස්වාමීන්වහන්සේගේ සියලු සෙනඟ ප්‍රොපේතවරුන් වෙන ලෙස ස්වාමීන්වහන්සේ තමන්ගේ ආත්මය ඔවුන් කෙරෙහි තැබුවොත් යෙහෙකැයි කීවේය. (ගණන් කතාව 11:29)**

යෝෂුවා මේ නිසා අමනාප වූයේ නැත. ඔහු ඉන් ඉගෙන ගත්තේය.

## ඔහු මනුෂ්‍යයන් පොලඹවන්නෙකු විය:

ඔබ අන් අය පෙලඹවීමට නම් ඔබ පළමුවෙන්ම පෙලඹී සිටිය යුතුය. යෝෂුවා 1:1-9හි දෙවියන්වහන්සේ යෝෂුවාට කළේ මේ දෙය වේ. එවිට යෝෂුවාට නායකයන් හා සෙනඟ පෙලඹවිය හැකි විය. (යෝෂුවා 1:10-15, 1:16-18)

## සම්පූර්ණ ලෙස සමිඳාණන්වහන්සේ අනුගමනය කළේය:

යෝෂුවා, සමිඳාණන්වහන්සේ සම්පූර්ණ ලෙස අනුගමනය කළ කෙනෙක් විය.

> **එහෙත් මා සමඟ ගිය මාගේ සහෝදරයෝ සෙනඟගේ සිත් දියව යන්ට සැලැස්සුවෝය. නුමුත් මම සම්පූර්ණ ලෙස මාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ අනුව ගියෙමි. (යෝෂුවා 14:8)**

## තනිව සිටගෙන සිටීමට දැන සිටියේය:

දැක්මෙන් ගමන් කරන අය බොහෝ විට ඇදහිල්ලෙන් ගමන් කරන අයට විරුද්ධ වෙති. ඉශ්රායෙල්වරුන් ප්‍රථම වරට පොරොන්දු දේශයේ සීමාවට පැමිණි විට සිදු වූයේද මෙය වේ. අනෙක් අය ඔහු සමඟ සිටීමට එකඟ නොවූවද නිවැරදි දෙය වෙනුවෙන් තනිව සිටගෙන සිටීමට යෝෂුවා දැන සිටියේය. මෙම කතාව ගණන් කථාව 13-14න් කියවන්න.

## යුධ සංග්‍රාමවල අත්දැකීම් තිබිණි:

යෝෂුවා, යුධ සංග්‍රාමවල අත්දැකීම් තිබූ කෙනෙකි. ඔහු ගැන පළමුවෙන් ශුද්ධ ලියවිල්ලේ සඳහන් වන අවස්ථාවේ ඔහු අමලෙක්වරුන් සමඟ සටන් කරමින් සිටියේය. (නික්මයාම 17:9-14 බලන්න.) කානාන් දේශයේ සතුරන් පරාජය කිරීමට ඔහුට මේ අත්දැකීම අවශ්‍ය වනු ඇත.

ඔබ අන් අය සන්නද්ධ කර ඔවුන් දෙවියන්වහන්සේගේ පොරොන්දු වෙත ගෙන යන විට මුහුණ දීමට යෝධයන්ද සටන් කිරීමට යුද්ධද තිබෙනු ඇත. ආත්මික යුධ සංග්‍රාම පිළිබඳ අත්දැකීම් ඇති අය අද දෙවියන්වහන්සේ සන්නද්ධ කරන්නන් ලෙස භාවිත කරනු ඇත.

## දෙවියන්වහන්සේ සමඟ පළමු පෙළේ අත්දැකීමක් තිබිණි:

ජීවිතයේ මුල් කාලයේදීම දෙවියන්වහන්සේ සමඟ මුල් පෙළේ අත්දැකීමක් යෝෂුවාට තිබිණි.

> **එකල මම යෝෂුවාට අණ දෙමින්: නුඹලාගේ ස්වාමින්වහන්සේ මේ රජුන් දෙදෙනාට කළ සියල්ල නුඹේ ඇසින් දුටුවෙහිය. නුඹ පැමිණෙන සියලු රාජ්‍යවලට ස්වාමින්වහන්සේ එසේම කරන සේක. ඔවුන්ට භය නොවෙන්න. මක්නිසාද නුඹලා උදෙසා සටන් කරන්නේ නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේයයි කීමි. (ද්විතිය කථාව 3:21-22)**

වෙනත් කෙනෙකුගේ ආත්මික අත්දැකීම් මත සතුරාට මුහුණ දීමට හා අන් අය සන්නද්ධ කිරීමට ඔබට නොහැකිය. දෙවියන්වහන්සේ මෝසෙස් සමඟ සිටියාක් මෙන්ම ඔහු සමඟද සිටින බව යෝෂුවා දැනගත යුතු විය.

## දෙවියන්වහන්සේගේ ආලේපය ලද කෙනෙකි:

ද්විතිය කථාවේ 34:9හි සඳහන් වන්නේ ඉශ්රායෙල් ජාතියට මඟ පෙන්වීම සඳහා මෝසෙස්, යෝෂුවා පිට අත තබා ඔහු ආලේප කළ බවය. ගණන් කථාව 27:18 හා 22න් දක්වන්නේ මෝසෙස් ඔහුව ආලේප කර ඔහුට වගකීම පැවරූ බවය.

අන් අය සන්නද්ධ කරන්නෙකු පළමුවෙන් දෙවියන්වහන්සේ විසින් ආලේප කර වගකීම පැවරිය යුතුය. සේවයේ වැඩ කටයුතු සඳහා ඔබ සන්නද්ධ කෙරෙන්නේ එම ආලේපයෙනි.

> **ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය. මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්ට උන්වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශ කරන්ටද මඩනාලද්දවුන් නිදහස් කර හරින්ටද ....( ලූක් 4:18)**

## දෙවියන්වහන්සේගේ මහිමාලංකාරය අත්දැක තිබිණි:

දෙවියන්වහන්සේගේ මහිමාලංකාරයේ වැදගත්කම ගැන ඔබ ඉහත පරිච්ඡේදවලින් උගත්තෙහිය. යෝෂුවා, දෙවියන්වහන්සේගේ මහිමාලංකාරය අත්දුටු කෙනෙකි.

> **මෝසෙස්ද ඔහුගේ සේවක වූ යෝෂුවාද නැගිට ගියෝය. මෝසෙස් දෙවියන්වහන්සේගේ කන්දට නැගුණේය. ...ස්වාමින්වහන්සේගේ තේජසේ කන්ද මුදුනේ ඇවිළී යන ගිනි මෙන් ඉශ්රායෙල් පුත්‍රයන්ගේ ඇස්වලට පෙණුණේය. (නික්මයාම 24:13 හා 17).**

## සන්නද්ධ කරන්නෙකුගේ බලපෑම

යෝෂුවාගේ ජීවිතය ඔහු වටා සිටි අයට කෙතරම් බලපෑමක් වුයේද යත් ඔහුගේ මරණයෙන් පසුව වුවද ඔහු පුහුණු කල නායකයෝ හා සෙනඟ නොනවත්වාම දෙවියන්වහන්සේට සේවය කළහ.

> **සෙනඟ යෝෂුවාගේ සියලු දවස්වලද යෝෂුවාට පසුවත් ජීවත්ව සිටියාවූ, ස්වාමින්වහන්සේ ඉශ්රායෙල් උදෙසා කළ උන්වහන්සේගේ සියලුම මහත් ක්‍රියා දුටුවාවූ වැඩිමහල්ලන්ගේ සියලු දවස්වලද ස්වාමින්වන්සේට සේවය කළෝය. (විනිශ්චයකාරයා 2:7)**

ඔබගේ ජීවිතයෙන් මෙවැනි බලපෑමක් කිරීම ඔබට අවශ්‍යද? දෙවියන්වහන්සේ සන්නද්ධ කරන්නෙකු ලෙස යොදවන්නේ මෙවැනි අය වේ. ඔබගේ ජීවිතය කෙසේද? යෝෂුවා මෙවැනි කෙනෙක් විය.

- දෙවියන්වහන්සේ පවසන දෙය ඇසිණි.
- අතීතය අමතක කළ හැකි විය.

- තමාට අයත් දේ දැන සිටියේය.
- ශක්තිමත්ව ධෛර්යවත්ව සිටියේය.
- සාර්ථකත්වයට අවශ්‍ය මූලික දෙය දැන සිටියේය.
- තමා මත දෙවියන්වහන්සේගේ ආත්මය තිබිණි.
- දෙවියන්වහන්සේ ගැන විශ්වාසය තිබිණි.
- ඇදහිල්ලේ මනුෂ්‍යයෙක් විය.
- සේවකයෙකුගේ සිතක් තිබිණි.
- ප්‍රඥාවෙන් පූර්ණව සිටියේය.
- පහසුවෙන් ඉගැන්විය හැකි විය.
- මිනිසුන් පොලඹවන්නෙක් විය.
- සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේ අනුගමනය කළේය.
- තනිව සිටගෙන සිටීමට දැන සිටියේය.
- යුධ සංග්‍රාම ගැන අත්දැකීම් තිබිණි.
- දෙවියන්වහන්සේ සමඟ පළමු පෙළේ අත්දැකීම් තිබිණි.
- දෙවියන්වහන්සේ විසින් ආලේප කරන ලදී.
- දෙවියන්වහන්සේගේ මහිමාලංකාරය අත්දැක තිබිණි.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. අන් අය සන්නද්ධ කිරීම සඳහා දෙවියන්වහන්සේ භාවිත කළ මනුෂ්‍යයෙකු පැරණි ගිවිසුමෙන් හඳුනා ගන්න.

3. “සන්නද්ධ කරන්නෙකුට” අවශ්‍ය ගුණාංග ලැයිස්තු ගත කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

1. මෙම පාඩමත් ඉදිරි පාඩම් හතරත් සඳහා පසුබිම් තොරතුරු ලබා ගැනීමට යෝෂුවා පොත කියවන්න.

2. ඔබට යෝෂුවා පොතේ කාලෙබ් නම් එක් වැදගත් පුද්ගලයෙක් හමුවනු ඇත. ඔහු සන්නද්ධ කළාවූ පුද්ගලයෙකු විය. දෙවියන්වහන්සේ වෙනුවෙන් කන්දක් අත්පත් කර ගැනීමට ඔහු පොලඹවනු ලැබීය.

   කාලෙබ් කානාන් දේශයට පළමුව ගියේ මෝසෙස්ගේ නායකත්වය යටතේ වේ. එහෙත් එවිට කන්දක් අත්පත් කර ගැනීමට ඔහුට උපදෙස් නොතිබිණි. කාලෙබ්, යෝෂුවාගේ නායකත්වය යටතේ කානාන් දේශයට පැමිණි විට, දෙවියන්වහන්සේ මත රඳා පැවතිය යුතු බව ඔහු දැන සිටියේය. ඔහු ඇතුළු වන්නේ මීට හතළිස් පස් වසරකට පෙර එක් වතාවක් පමණක් ගිය අමුතු පෙදෙසකට වේ.

   එහෙත් පාලුකරයේ සිටි කාලයේ සිටම කාලෙබ් මේ සඳහා සූදානම් විය. ඔහු **ශාරීරිකවත් මානසිකවත්** සූදානම්ව සිටියේය. හතළිස් වසරකට පෙර සිටියාසේම දන් අසූපහෙදීත් තමා ශක්තිමත් බව ඔහු යෝෂුවාට දැන්විය.

   කාලෙබ් **චිත්තවේගියවත්** සූදානම්ව සිටියේය. ඔහු සිතේ ආශාව අවුරුදු තිස්පහක් වයසැති කෙනෙකුගේ මෙන් විය. ඔහුට ඒ කන්ද අවශ්‍ය විය. කාලෙබ් ඔහුගේ සිහිනය, හතළිස් පස් වසරක් තුළ රෝග, හද කකියවීම් තුළින්ද හත් වසරක් පොරොන්දු දේශයේ සටන් කරමින්ද ගෙන ගියේය. ඔහුට අයත් දේ ලබාගැනීමට ඔහු පසුබට වූයේ නැත.

   කාලෙබ් **ආත්මිකවද** සූදානම්ව සිටියේය. ඔහු "සම්පූර්ණයෙන්ම" දෙවියන්වහන්සේ අනුගමනය කළ බව ශුද්ධ ලියවිල්ලේ සඳහන් වෙයි. "කන්දක්" අත්පත් කරගැනීමේ හොඳම සූදානම, ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකම දෙවියන්වහන්සේට කීකරු වීම වේ.

   ඔබගේ ආත්මික "කන්ද" ගැන කිවහැක්කේ කුමක්ද? දෙවියන්වහන්සේ වෙනුවෙන් ඔබට අත්පත් කර ගැනීමට අවශ්‍ය කුමන ක්ෂේත්‍රයද? ඔබගේ සිතේ පවතින සිහිනය කුමක්ද?

   දෙවියන්වහන්සේ ඔබ මානසිකවත්, ශාරීරිකවත්, චිත්තවේගීවත්, ආත්මිකවත් සූදානම් වන තුරු බලා සිටින සේක්ද? එසේ කළ හැක්කේ කෙසේද යයි සිතන්න.

# පහළොස්වන පරිච්ඡේදය

## සන්නද්ධ වීම

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට
- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සන්නද්ධ කිරීම සඳහා අවශ්‍ය ආත්මික සත්‍යයේ ස්වාභාවික නිදසුන් හතරක් පැහැදිලි කිරීමට
- ඇදහිලිවන්තයන් දේව වචනයේ "කිරි" සිට "මස්" දක්වා වර්ධනය නොවීමට හේතු තුනක් ලැයිස්තු ගත කිරීමට
- ඇදහිලිවන්තයෙකුට දේව වචනයේ "කිරි" සිට "මස්" දක්වා වර්ධනය විය හැකි ආකාරය පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**... ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා පසුකර, සම්පූර්ණවීමට පැමිණෙමු. (හෙබ්‍රෙව් 6:2)**

### හැඳින්වීම

දෙවියන්වහන්සේගේ සෙනඟ සන්නද්ධ කරන්නෙකු වීම සඳහා අවශ්‍ය සුදුසුකම් අපි පසුගිය පරිච්ඡේදයෙන් උගත්තෙමු. නායකයන් වීමට අප සියල්ලන්ම කැඳවන්නේ නැත. එහෙත් අප සෑම කෙනෙකුටම ආත්මයෙන් "යෝෂුවා මෙන්" විය හැකි අතර ඒ ගුණාංග පෙන්විය හැකිය.

සෑම නායකයෙකුටම අනුගාමිකයන් සිටිය යුතුය. දෙවියන්වහන්සේගේ නායකයන් අනුගමනය කිරීමට දෙවියන්වහන්සේගේ සෙනඟ සන්නද්ධ කළ යුතුය. නැතහොත් අක්‍රමවත් බවක් හා ව්‍යාකුලත්වයක් තිබෙනු ඇත. මෙම පාඩමෙන් ඔබ ඉගෙන ගන්නේ දෙවියන්වහන්සේගේ සෙනඟ ආත්මිකව සන්නද්ධ කරන ආකාරය වේ. මෙම පාඨමාලාවේ දහනවවන පරිච්ඡේදයෙන් ඔබ "දීමනා පදනම් කරගත් සන්නද්ධ කිරීම" ගැන ඉගෙන ගන්නා විට සන්නද්ධ කිරීමේ ප්‍රායෝගික පැත්ත ඉගෙන ගන්නවා ඇත.

### සන්නද්ධ කෙරුණු සෙනඟ

කානාන් දේශය අත්පත් කර ගැනීම සඳහා විශේෂ සිද්ධීන් හතරක් සිදුවිය. ආත්මික සත්‍යයේ ස්වාභාවික උදාහරණ වන මේවා ඔබව පෞද්ගලිකව සන්නද්ධ කරන අතර අන් අය සාමූහිකව සන්නද්ධ කිරීමට ඔබට හැකියාව ලබා දෙනු ඇත. සතුරා අල්ලා ගෙන සිටින පෙදෙස් ලබා ගැනීමට පෙර ඔබ මේවා පෞද්ගලිකව ඔබගේම ජීවිතයේ අත් දැකිය යුතුය. එමෙන්ම සතුරා අල්ලාගෙන සිටින ගම, නගරය හෝ ජාතිය නැවත ජය ගැනීමට හෝ සන්නද්ධ කිරීමට පෙර සභාවක් මේවා අත්දැකිය යුතුය. මෙම පාඩම අධ්‍යයනය කිරමට පෙර යෝෂුවා 5 පරිච්ඡේදය කියවන්න.

### රුධිරය:

**ඉශ්රායෙල් පුත්‍රයෝ ගිල්ගාල්හි කඳවුරු බැඳගෙන මාසේ දස සතරවෙනිදා සවස යෙරිකෝවේ සමහුම්වලදී පාස්කුව පැවැත්තුවෝය. (යෝෂුවා 5:10)**

ඉශ්රායෙලය පාස්කුව සැමරුවේ පාපයෙන් මුදා ගැනීම සිහිකිරීම සඳහාය. පාස්කුවෙන් ප්‍රකාශවන්නේ "තැවරූ රුධිරය" ගැනය. දෙවියන්වහන්සේ සඳහා සන්නද්ධ වීම පිණිස පළමුවෙන්

ඔබගේ ජීවිතයට රුධිරය තැවරීම අවශ්‍යය. ආත්මිකව කතා කරන විට පාස්කුව අත්දැකීම සඳහා කල්වරියේ කුරුසිය මත යේසුස්වහන්සේගේ මරණය තුළින් ඔබ නැවත ඉපදිය යුතු වේ. පාපයෙන් හා මරණයෙන් ඔබ මුදා ගැනීමට ඔබගේ ජීවිතයට උන්වහන්සේගේ රුධිරය තැවරිය යුතුය.

## පිහිය:

දෙවියන්වහන්සේගේ සෙනඟ සන්නද්ධ කිරීමේදී ඇති තවත් සිද්ධියක් ගැන සිතා බැලීමට යෝෂුවා 5:2-9 කියවන්න. එය "චර්මච්ඡේදනයේ" සලකුණ වේ. ඉශ්රායෙල්හි සියලුම පිරිමින්, ඔවුන් හා දෙවියන්වහන්සේ අතර ඇති ගිවිසුමේ ලකුණක් වශයෙන් චර්මච්ඡේදනය කළ යුතු විය. මෙය ආබ්‍රහම්ගේ කාලයේ ස්ථාපිත කරන ලද්දක් වුවද පාළුකර ගමනේදී එය ක්‍රියාවට නොදමන ලදී. මේ නිසා ඉශ්රායෙල්හි අලුත් පරම්පරාව චර්මච්ඡේදනයට භාජනය වූයේ නැත. එබැවින් ගිවිසුමේ ලකුණ ඔවුන් මත නොවීය. මේ අවස්ථාවේදී ඉශ්රායෙලය කානාන් දේශයේ ජාතීන්ට විරුද්ධව යුද්ධ කිරීමට සූදානම් වෙමින් සිටි අතර ඔවුන්ව චර්මච්ඡේදනය කරන ලෙස දෙවියන්වහන්සේ අණ කළේය. ඔවුන්ගේ මාංසය චර්මච්ඡේදනය කිරීම තුළින් මඟින් ඉශ්රායෙල් සෙනග සතුරා ඉදිරියේ අක්‍රිය වූහ.

දෙවියන්වහන්සේ උදෙසා සන්නද්ධ කෙරෙන සෙනඟ ඔවුන්ගේ ජීවිත මත වෙනස් වීමේ ලකුණු තබා ගත යුතුය. ඇදහිලිවතුන් ලෙස අප තවදුරටත් මාංසයෙන් චර්මච්ඡේදනය නොකෙරේ. එහෙත් සිතින් අප චර්මච්ඡේදනය විය යුතුය.

> **අතින් නොකළ චර්මච්ඡේදයක් වන මාංසයේ ශරීරය පහ කිරීම නමැති ක්‍රිස්තුස්වහන්සේගේ චර්මච්ඡේදයෙන් උන්වහන්සේ තුළ නුඹලා චර්මච්ඡේද කරනු ලැබූවහුය. (කොලොස්සි 2:11)**

අපගේ චර්මච්ඡේදනය ආත්මික වන අතර එය මාංසයේ නොව සිත්හි වේ. එහෙත් ඔබ සිතින් චර්මච්ඡේදනය වූයෙහි නම් ඉශ්රායෙලය මාංසයෙන් චර්මච්ඡේදනය වූ විට මෙන් බාහිර ලකුණු තිබේ. ඔබ ක්‍රියා කරන්නේත් කතා කරන්නේත් ජීවත් වන්නේත් වෙනත් ආකාරයකිනි. ඔබගේ ජීවිතයේ වෙනස් වීමේ සලකුණු තිබෙනු ඇත. ඒවා දෙවියන්වහන්සේ සමඟ ඇති ඔබගේ ගිවිසුමේ සලකුණුය.

> **මක්නිසාද පිටාතර පෙනීමෙන් යුදෙව්වෙක්ව සිටින්නා යුදෙව්වෙක් නොවේ. මාංසයේ පිටාතර චර්මච්ඡේදය චර්මච්ඡේදයක් නොවේ. නුමුත් ඇතුළතින් යුදෙව්වෙක්ව සිටින්නා යුදෙව්වෙක් වේ. චර්මච්ඡේදය නම් ලියවිල්ලේ හැටියට නොව ආත්මයේ හැටියට සිතෙහි වූ එකය. එබඳු අයට මනුෂ්‍යයන්ගෙන් නොව දෙවියන්වහන්සේගෙන් ප්‍රශංසාව ලැබේ. (රෝම 2:28-29)**

ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් සන්නද්ධ වීමට නම් ඔබගේ ජීවිතයේ වෙනස් වීමේ ලකුණු තිබිය යුතුය. දේව වචනයේ "පිහිය" ඔබගේ ජීවිතයේ ලකුණු ඇති කරන විට බිය නොවන්න. මිසරයේ (පාපයේ) නිග්‍රහයන් ඉවත් කර දැමිය යුතුය. මාංසයේ ඇති අපවිත්‍ර ඔබ ඉවත් කළ යුතුය.

සතුරාගේ සෙවණැල්ලේ ඔබ කඳවුරු බඳින විට ඔබට මාංසයෙන් සටන් කළ නොහැකි බව මතක තබාගන්න. ඔබ ඔබගේ මාංසය අක්‍රිය කර සර්ව බලධාරී දෙවියන්වහන්සේ මත පමණක් විශ්වාසය තැබිය යුතුය. දේශය තුළින් ගොස් එය අත්පත් කර ගැනීමට හැකිවන්නේ මාංසයේ දුර්වලතාවෙන් හා ආත්මයේ බලයෙනි.

සිත චර්මච්ඡේදනය කිරීම දෙවදැරුම් වේ. දෙවියන්වහන්සේට එහි කොටසක් ඇත.

> **"නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ ... නුඹේ සිතද ... චර්මච්ඡේදනය කරන සේක. (ද්විතීය කතාව 30:6)**

දෙවියන්වහන්සේ ඔබ වෙනස් කරන සේක. එහෙත් ඔබට ද චර්මච්ඡේදනයේ වගකීමක් තිබේ.

> **"නුඹලා ස්වාමීන්වහන්සේ උදෙසා චර්මච්ඡේදිත වී නුඹලාගේ සිත්වල චර්මාග්‍රය පහ කරන්න. (යෙරෙමියා 4:4)**

ඔබ මාංසයේ අපවිත්‍රකමෙන් පවිත්‍ර විය යුතුය. උන්වහන්සේ උන්වහන්සේගේ කොටස කරන තුරු ඔබට ඔබගේ කොටස කළ නොහැකි බව මතක තබා ගැනීම වැදගත් වේ. එය තමාම දියුණු වීමේ ප්‍රයත්නයක් පමණි.

ඔබ සේවය සඳහා සන්නද්ධ කිරීමට පෙර දෙවියන්වහන්සේගේ ලකුණ ඔබ මත තිබිය යුතුය. නික්මයාම 4:24-26 කියවන්න. මෝසෙස් ඉශ්රායෙලය මුදා ගැනීමට මිසරයේ සිට පැමිණෙන විට ඔහු දේවදූතයෙකු විසින් නැවැත්වීය. ගිවිසුමේ ලකුණ ඔහුගේ ජීවිතය මත නොතිබුණු නිසා දෙවියන්වහන්සේගේ සෙනඟ මුදා ගැනීමට ඔහු සූදානම්ව සිටියේ නැත. ඔහුගේ චර්මඡේදනයෙන් පසු දෙවියන්වහන්සේ වෙනුවෙන් මහත් දේ කිරීමට මෝසෙස් සන්නද්ධ කෙරිණි. අන් අය වෙනුවෙන් සේවය කිරීම සඳහා වෙනස් වීමේ ලකුණු ඔබ ජීවිතය මත තිබිය යුතුය.

## ඵලය :

යෝෂුවා 5:9-12 කියවන්න. පාළුකරයේදී ඉශ්රායෙල්වරුන් ආහාරයට ගත් මන්නා වැටීම නැවතුණු අතර ඔවුහු කානාන් දේශයේ භෝග ඵල ආහාරයට ගැනීමට පටන් ගත්හ. මන්නා දෙවියන්වහන්සේ විසින් එවන ලද අතර ඒවා එම අවස්ථාවේ වැදගත් විය. එය මූලික අවශ්‍යතා සැපයූ අතර පාළුකරයේ ගමනට සුදුසු විය. එහෙත් දැන් ඒ දේශයේ භෝග ඵල කෑමට කාලය පැමිණ තිබේ. මෙම “ඵල” වලින් පෙන්වන්නේ ආත්මික පරිණත භාවය වේ.

**... ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා පසුකර, සම්පූර්ණවීමට පැමිණෙමු. (හෙබ්‍රෙව් 6:2)**

දෙවියන්වහන්සේගේ බලයක් ලෙස සන්නද්ධ කිරීමට සෙනඟ මූලික කිතුනු ගමනින් ආත්මික පරිණතභාවයට ගමන් කළ යුතුය. ඔවුන් “කිරි” වල සිට දේව වචනයේ “මස්” වෙත යා යුතුය. මන්නා සේම දේව වචනයේ “කිරි” වැදගත් වේ.

**ආත්මිකවූ අමිශ්‍රවූ කිරිවලින්, නුඹලා ගැළවීම සඳහා වර්ධනය වන පිණිස අලුත උපන් බිලිඳුන් මෙන් එයට බොහෝ ආශාවෙයල්ලා. (1 පේතෘස් 2:3)**

අලුත උපන් දරුවන් සන්නද්ධ කර සැණෙකින් යුද්ධයට යවන්නේ නැත. ඔවුන් “මස්” වෙත යා යුතුය. ඇදහිලිවතුන් “කිරි”වල සිට දේව වචනයේ “මස්” වෙත නොයෑමට හේතු තුනක් ඇත.

පළමුව ඔබ දේව වචනය තුළ නුපුහුණු අය වෙති.

**ඉතින් කිරි බොන සෑම දෙනම ළදරුවන් බැවින් ඔවුහු ධර්මිෂ්ඨකමේ වචනය ගැන අසමර්ථව සිටිති. (හෙබ්‍රෙව් 5:13)**

දෙවනුව ඔවුන්ට ඉගැන්වූ දේ ඔවුහු ව්‍යවහාර නොකරති.

**මක්නිසාද කාලය ප්‍රකාරයට නුඹලා ගුරුවරයෝව සිටින්ට යුතුව තිබියදීත් දෙවියන්වහන්සේගේ වාක්‍යවල මුල් ගුරුකම් නැවත යමෙකු විසින් නුඹලාට උගන්වන්ට ඕනෑව තිබේ. නුඹලා ඝන ආහාර නොව කිරි ඕනෑ කරන අයව සිටින්නෝය. (හෙබ්‍රෙව් 5:12)**

ඔබ දැනටමත් උගත් දේ ඔබ ව්‍යවහාර කරන තුරු දෙවියන්වහන්සේ ඔබට උන්වහන්සේගේ වචනය පිළිබඳ අලුත් අන්තර්දෘෂ්ටියක් නොදෙනු ඇත.

තෙවනුව ඒවා මාංසිකය. පාවුලුතුමා කොරින්ති සභාවට මෙසේ කිය.

**මක්නිසාද නුඹලා තවම මාංසිකය. නුඹලා අතරේ ඊර්ෂ්‍යාවද විවාදයද ඇති බැවින්, නුඹලා මාංසිකව මනුෂ්‍ය ප්‍රකාරයෙන් හැසිරෙනවා නොවේද? මක්නිසාද එක්කෙනෙක්: මම පාවුල්ගේය, වෙන කෙනෙක් මම අපොල්ලොස්ගේයයි කියන කල, නුඹලා මාංසිකයෝ නොවෙත්ද? (1 කොරින්ති 3:3,4)**

ඔබට කිරිවල සිට දේව වචනයේ මස්වලට යා හැක්කේ කෙසේද?

පළමුව වර්ධනය වීම සඳහා දේව වචනයේ කිරිවලට ඔබ ආශාවිය යුතුය (1 පේතෘස් 2:2). දේව වචනයේ කිරිවලට කීකරු වීමට ඔබ ඔබ විසින්ම හික්මවා ගත්කල ඔබට දේව වචනයේ මස් ලබා ගත හැකිය (මාංසික කොරින්තිවරුන් දේව වචනය තමන්ගේ ජීවිතයට අදාළ කරනොගත් බැවින් “මස්” වෙත යාමට නොහැකි වූ බව මතක තබාගන්න“).

දෙවනුව මස් සෙවීම සඳහා ඔබ කැපවිය යුතුය" හිතෝපදේශ 2:1-5 කියවන්න" මෙම පරිච්ඡේදයේ විස්තර කර ඇති කැපවීමම ඇතිව ඔබ දේව වචනයේ මස් සෙවුවහොත් ඔබට එය ලැබෙනු ඇත" අවසානයේදී ඔබගේ හික්මීම දේව වචනයේ මස් තුළ ඔබට ප්‍රීතිය ගෙන දෙන්නේය" දේව වචනයද ඔබගේ සිතට ප්‍රීතිය ගෙන දෙන්නේය" (හිතෝපදේශ 2:10).

**කඩුව:**

යෝෂුවා 5:13-15 කියවන්න. සංග්‍රාමයේ පැය ළංවෙත්ම යෝෂුවාට පැමිණීමට නියමිත සටනේ පෞද්ගලික වගකීම වඩ වඩා දැණිනි. කොපුවෙන් ඇදගත් කඩුවක් ඇති මිනිසෙකු දුටු විට යෝෂුවා ඔහුගෙන් "ඔබ අපේ පැත්තටද නැතහොත් අපගේ විරුද්ධකාරයන්ගේ පැත්තටදැ"යි විමසීය. යෝෂුවා දැක්කේ පැති දෙකක් පමණි. ඔහුගේ පැත්ත හා සතුරාගේ පැත්ත වේ.

සමිඳාණන්වහන්සේගේ සේනාවේ අධිපතියා ලෙස මේ මිනිසා තමාව හඳුන්වා දුන්නේය. කොපුවෙන් ඇදගත් කඩුවෙන් සංකේතවත් වුයේ සටන සමිඳාණන්වහන්සේගේ බවත් සටන් කරන්නේ උන්වහන්සේගේ වචනය පදනම් කරගෙන බවත්ය. දෙවියන්වහන්සේගේ පොරොන්දු ඉටු කිරීම සඳහා කරන ඕනෑම සටනක් දෙවියන්වහන්සේගේ සටනක් වන අතර එය සටන් කළ යුත්තේ උන්වහන්සේගේ මාර්ගය අනුවය. යෝෂුවා සිටින්නේ ශුද්ධ භූමියක නිසා ඔහුගේ පාවහන් ගලවන්නැයි ඔහුට කීවේය. ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් සන්නද්ධ කර ඇති බැවින් ඔබ සිටින්නේ මිදීමේ භූමියේ වේ. එහෙත් තවමත් ඔබ සතුරාට මුහුණ දෙයි.

"දෙවියන්වහන්සේගේ සේනාවේ අධිපති" ඔබගේ මිතුරා ද නැතහොත් සතුරා ද? දෙවියන්වහන්සේ වෙනුවෙන් සැබවින්ම සන්නද්ධ වීමට නම් ඔබ ද යෝෂුවා මෙන් "ස්වාමීන්වහන්සේ ඔබේ මෙහෙකරුවාට කුමක් වදාරනසේක්දැ" යි අසමින් ඔබ උන්වහන්සේ අභිමුවට පැමිණිය යුතුය. ඔබගේ පිළිතුර උන්වහන්සේගේ වචනයේ "ඇදගත් කඩුවෙහි" තිබෙනු ඇත.

## සන්නද්ධ කිරීමේ ලකුණු සතර

දෙවියන්වහන්සේගේ වැඩක් කිරීම සඳහා මනුෂ්‍යයන්ගේ සූදානම් වීම පිළිබඳව යෝෂුවා 5හි සඳහන් වේ. මෙම පාඩම ආත්මිකව ඔබ ඔබගේ ජීවිතයට යොදන විට සන්නද්ධ කළ සෙනඟක් රුධිරයෙන් පවිත්‍ර විය යුතු බවත් ඔවුන්ගේ ජීවිත තුළ වෙනස් වීමේ ලකුණු තිබිය යුතු බවත් මන්නාවලින් භෝග ඵලවලට මාරු විය යුතු බවත් (කිරිවල සිට දේව වචනයේ මස්වලට) දේව වචනයේ "ඇදගත් කඩුව" පදනම් කරගෙන සතුරාගේ භූමිය තුළට කාවැදිය යුතු බවත් ඔබට පැහැදිලි වනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

______________________________________________

2. සන්නද්ධ කිරීම සඳහා අවශ්‍ය ආත්මික සත්‍යයේ ස්වාභාවික උදාහරණ හතරක් පැහැදිලි කරන්න.

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

3. "කිරිවල" සිට දේව වචනයේ "මස්" වලට ඇදහිලිවතුන් ප්‍රගතියක් නොදැක්වීමට හේතු තුනක් දෙන්න.

______________________________________________

______________________________________________

______________________________________________

4. "කිරි"වල සිට දේව වචනයේ "මස්" වලට ඇදහිලිවන්තයෙකුට යා හැකි ආකාරය පැහැදිලි කරන්න.

______________________________________________

______________________________________________

______________________________________________

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

දේව වචනයේ "මස්" සෙවීම සඳහා උපක්‍රම හිතෝපදේශ 2:1-5න් එළිදරව් කරයි. මෙම කොටස අධ්‍යයනය කර ඒ උපක්‍රම ඔබගේ වචනවලින් සාරාංශ කරන්න.

ඒවා ඔබේ ජීවිතයට යොදා ගත හැක්කේ කෙසේද?

# දහසයවන පරිච්ඡේදය

## විනිවිද යෑමේ මූලධර්ම

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- යෝෂුවා පොතේ සඳහන් විනිවිද යෑමේ මූලධර්ම සාරාංශ කිරීමට
- මේ මූලධර්ම ක්‍රියාවේ යෙදවීමට හැකිවන සේ අන් අය සන්නද්ධ කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **යුද්ධයට සැරසුණු අය සතළිස් දහසක් පමණ ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි යෙරිකෝවේ සමභූමිවලට යුද්ධය පිණිස මෙතෙරට ආවෝය. (යෝෂුවා 4:13)**

### හැඳින්වීම

ශ්‍රේෂ්ඨ සන්නද්ධ කරන්නෙකු වූ යෝෂුවා මිනිසුන් හතළිස් දහසක් සන්නද්ධ කළේය. සටන් කිරීමට සූදානම්ව ඔවුහු යෝර්දානය තරණය කළහ. මෙම ස්ත්‍රීන් හා පුරුෂයන් පාපය සංකේතවත් කළ මිසරයෙන් නික්මයාමෙන් නැවතුණේ නැත. දෙවියන්වහන්සේ ඔවුන්ට පොරොන්දු වූ සියල්ල ලබා ගැනීමට ඔවුහු පොරොන්දු දේශයට ගඟ හරහා ගියහ.

පාපයෙන් "පිටතට" පැමිණීම ඔබ වෙනුවෙන් දෙවියන්වහන්සේට ඇති සැලැස්මේ කොටසක් පමණි. උන්වහන්සේගේ පොරොන්දු හා ආශීර්වාද සහිත පොරොන්දු දේශය "ඇතුලට" ඔබ ගෙනයාමටද උන්වහන්සේට අවශ්‍යය. සතුරා පරාජය කිරීමට හා ඔබ සමිඳාණන්වහන්සේ උදෙසා නගර හා ජාතීන් අත්පත් කර ගැනීම සඳහා සන්නද්ධ කළ ජයග්‍රාහී කිතුනුවෙකු කිරීමට උන්වහන්සේට අවශ්‍යය.

දෙවියන්වහන්සේගේ සැලැස්ම පිළිබඳ මෝසෙස්ගේ සාරාංශය මෙසේ වේ:

> **"...එහි අප ඇතුල් කිරීමට, මිසරයෙන් පිටතට අප ගෙනා සේක." (ද්විතීය කථාව 6:23 - නව අනුවාදය)**

නික්මයාමේදී මිසරයේ වහල්කමේ දේශයෙන් උන්වහන්සේගේ සෙනඟ පිටතට ගෙන ඒම සඳහා දෙවියන්වහන්සේ රතු මුහුදේ ජලය දෙබෑ කළ සේක. ආශීර්වාදලත් භූමිය වන කානාන් දේශයට තම සෙනඟ ගෙන ඒම සඳහා දෙවියන්වහන්සේ යෝර්දාන් ගඟේ ජලය දෙබෑ කළ ආකාරය යෝෂුවා පොතේ සඳහන් වේ.

කානාන් දේශයේ ඉශ්රායෙල්වරුන් ලද සටන් අත්දැකීම් ස්වාභාවික නිදසුන් වන අතර ඒවා ඔබගේම ආත්මික ජීවිතයට යොදා ගත හැකිය.

> **මක්නිසාද ඉවසිල්ල කරණකොටගෙනද ලියවිලිවලින් හටගන්න සැනසිල්ල කරණකොටගෙනද අප බලාපොරොත්තු ඇතුව සිටින පිණිස පූර්වයෙහි ලියන ලද සියල්ල අපගේ ඉගෙන ගැනීම සඳහා ලියන ලද්දේය. (රෝම 15:4)**

කානාන් දේශය අල්ලා ගැනීමට ඉශ්රායෙලය භාවිත කළ විනිවිද යෑමේ මූලධර්ම ඔබ මෙම පාඩමෙන් ඉගෙන ගන්නෙහිය. මේ මූලධර්ම දෙවියන්වහන්සේ උදෙසා ඔබගේ ගම, නගරය හෝ ජාතිය විනිවිද යෑමට යොදා ගත හැකිය.

## ආපසු හැරීමට නොහැකි තැන

ඉශ්රායෙල්වරු මීට පෙරද කානාන් දේශ සීමාවේ සිටියහ (ගණන් කථාව 13 හා 14 බලන්න). ඔබ කානාන් දේශ සීමාවට පැමිණිවිට ඔබ සන්නද්ධ වී ඉදිරියට යන්නෙහිය. නැතහොත් ආත්මික ඉබාගාතේ යෑමේ පාළුකරයට ආපසු පැමිණෙන්නෙහිය.

ඉශ්රායෙල්වරු කානාන් දේශ සීමාවට පැමිණි පළමු වතාවේ "සෙනඟ පරාජය කිරීමට තරම් අප බලසම්පන්න නොවන්නට පුළුවන, ඔවුහු අපට වඩා ශක්ති සම්පන්නය"යි කීහ. (ගණන් කථාව 13:31). අවිශ්වාසය ඔබව දෙවියන්වහන්සේගේ පොරොන්දුවල එළිපත්තේ තබනු ඇත. ඉශ්රායෙල්වරුන් මෙන් ඔබද බියවී අවිශ්වාස කළ විට ඔබ:

- කනගාටුවන්නටද ගණන් කථාව 14:1
- කෙඳිරිගාන්නටද ගණන් කථාව 14:1
- ආපසු බැලීමටද ගණන් කථාව 14:2
- ප්‍රශ්න කිරීමටද ගණන් කථාව 14:3
- කැරලිගැසීමටද ගණන් කථාව 14:4 පටන් ගන්නෙහිය.

විශ්වාසය මඳකම නිසා ඉශ්රායෙල්වරු පළමුව අධෛර්යයටද ඉන්පසු මුළාවීමටද ඉන්පසු අකීකරු වීමටද පටන් ගත්හ.

එහෙත් මෙවර එය වෙනස් විය. සටනට සූදානම්ව සිටි සතළිස් දහසක සෙනඟක් යෝර්දාන් හරහා ගියහ. යෝෂුවා ලද පණිවුඩය වූයේ "නැගිට යෝර්දානය වෙත යන්න" වේ. මේ අණ ලැබුණේ එය ස්වාභාවිකව කළ නොහැකි අවස්ථාවකදී වේ. මෙය ගංවතුර කාලය විය. ජලය ගැඹුරුව හා පුළුල්ව තිබිණි. එහෙත් යෝෂුවා පැකිළුණේ නැත. ඔහු ඉශ්රායෙල්වරුන්ව ගංතෙර වෙත ගෙන ගියේය. යෝෂුවාට සෙනඟ ගෙන යා හැකි දුර එපමණ විය.

ඔබද ඔබගේ ආත්මික අත්දැකීම්වලදී "යෝර්දාන් ගඟක්" මුහුණ දෙමින් සිටිනවා විය හැකිය. එය ඉතා ගැඹුරු හා පළල් ලෙස පෙනේ. ඔබගේ ජීවිතය හා සේවය සඳහා වන දෙවියන්වහන්සේගේ පොරොන්දු ලබා ගන්නට හැකිවන්නේ කෙසේදැයි ඔබ නොදනී. එහෙත් "නැගිට යන්නැ"යි දෙවියන්වහන්සේ කියන සේක.

ඔබ සන්නද්ධ වී ඔබට යා හැකි දුර ඔබ ගියහොත් ඉතිරිය දෙවියන්වහන්සේ අධිස්වාභාවිකව කරනු ඇත. ඔබට එය තරණය කිරීමට පමණක් නොව යෝෂුවාට අණ කළාක් මෙන් "අන් අයද ඔබ සමඟ" රැගෙන යෑමට හැකිවේ. දෙවියන්වහන්සේ ඔබ ඉදිරියේ උන්වහන්සේගේ අභිමුඛය නොමැතිව ඔබට කිසිවක් කිරීමට නොපවසන බව මතක තබා ගන්න. දෙවියන්වහන්සේගේ වැඩ විසීම සංකේතවත් කළ ගිවිසුම් කරඬුව ඉශ්රායෙල්වරුන්ට පෙර ගඟ තරණය කර තිබිණි.

ඉශ්රායෙල්වරුන් දිය බෙදුණු යෝර්දානය තරණය කරන විට හා එය ආපසු එක්වීම නරඹන විට ඔවුන් කැපවී සිටියහ. ඔවුන් සිටියේ ආපසු හැරීමට නොහැකි අවස්ථාවක වේ. මෙම පාඨමාලාව අධ්‍යයනය තුළින් දෙවියන්වහන්සේට ඔබ ගෙන ඒමට අවශ්‍ය වන්නේ මෙතැනට වේ.

## විනිවිද යෑමේ මූලධර්මය

ඉශ්රායෙල්වරුන් යෝර්දානය තරණය කර කානාන් දේශයට ගිය විට ඔවුන්ගේ කෑ ගැසීමට නගරවල පවුරු බිඳ වැටෙන අයුරු, ඔවුන් වාසය කරන නිසා ජාතීන් වෙවුලන අයුරු හා සතුරු රජවරුන් ඔවුන්ට යටත් වන අයුරු අපට පෙනේ. මෙම ඉබාගාතේ යන අකීකරු, මැසිවිලි කියන සෙනඟක් කෑ ගැසීමෙන් පමණක් මහා නගර බිඳ වැටෙන ශ්‍රේෂ්ඨ රණකාමීන් බවට පත්වීමට වෙනස් වූයේ කුමන ආත්මික මූලධර්මද?

ඔවුන් කානාන් දේශයට පැමිණි පසු යෝෂුවා සටන් සැලසුම් ගැන සාකච්ඡා කිරීමට කමිටු පත්කළේ නැත. ඔවුන් කළ යුතු දේ පිළිබඳව ජනමත විචාරණයක්ද කළේ නැත. ඔවුන් ඡන්දය දුන්නේද නැත. කානාන් දේශ සීමාවට පැමිණි පළමු අවස්ථාවෙන් ඔවුහු පාඩමක් ඉගෙන ගත්හ. (නික්මයාම 13 හා 14 බලන්න.) ඒ වෙනුවට දෙවියන්වහන්සේගේ අණ පරිදි සන්නද්ධ ඒකකයක් ලෙස ඉදිරියට ගොස් භූමිය දෙවියන්වහන්සේ වෙනුවෙන් ගත්හ. ඔවුන් යොදා ගත් සටන් මූලධර්ම ආත්මික ලෙස ඔබගේ ජීවිතයට හා සේවයට යොදා ගත හැකිය.

යෝෂුවා පොතේ සඳහන් වන ප්‍රධාන සටන්වලින් ලබාගත් විනිවිද යෑමේ මූලධර්ම සමහරක් මෙසේ වේ:

- මධ්‍යම යුද්ධ ව්‍යාපාරය 6:1-8:35
- දකුණු යුද්ධ ව්‍යාපාරය 9:1-10:43
- උතුරු යුද්ධ ව්‍යාපාරය 11:1-15

## යුද්ධයට සූදානම:

පළමුවන මූලධර්මය වන්නේ සතුරු ප්‍රදේශයට ඇතුළුවීමට පෙර යුද්ධයට සූදානම් වීම වේ. ඔබ දැනටමත් 13 හා 14 පාඩම්වලින් යෝෂුවාගේ හා සෙනඟගේ සූදානම ගැන අධ්‍යයනය කළෙහිය. ඉශ්‍රායෙල්වරුන් දෙවියන්වහන්සේ විසින් සන්නද්ධ කර බලය පවරා තිබිණි.

> **නුඹලා අඩිය තබන සියලුම ස්ථාන මා විසින් මෝසෙස්ට කී ලෙස නුඹලාට දුනිමි. (යෝෂුවා 1:3)**

දෙවියන්වහන්සේ ඔවුන්ට භූමිය දී තිබිණි. එහෙත් ඔවුන්ට අයත් වූයේ ඔවුන් අයිතිවාසිකම් කී කොටස් පමණි. යෝෂුවා 1:1-9 කියවන්න. තම වගකීම් මොනවාදැයි සෙනඟ අවබෝධ කරගෙන තිබිණි. ඒවා මෙසේ වේ:

- නැගිටින්න. 1:2
- එගොඩ වී යන්න. 1:2
- ශක්තිමත් වන්න. 1:6 - 7:9
- ධෛර්යවත් වන්න. 1:6 - 7:9
- බිය නොවන්න. 1:9
- නොකැළඹෙන්න. 1:9
- බෙදන්න, උරුමය ඉල්ලන්න. 1:6
- සාර්ථකවීම සඳහා දේව වචනය භාවිත කරන්න.
  - නිරීක්ෂණය කරන්න. 1:7-8
  - ක්‍රියා කරන්න. 1:7:8
  - ඉන් ඉවත් නොවන්න. 1:7
  - ප්‍රකාශ කරන්න. 1:8
  - ඒ ගැන භාවනා කරන්න. 1:8
  - මුළුමනින්ම කීකරුවන්න. 1:8

(නිරීක්ෂණය කිරීමට හා වචනයට අනුව ක්‍රියා කිරීමට හැකිවන්නේ ඒ ගැන කතා කිරීමෙන් හා භාවනා කිරීමෙනි.)

දෙවියන්වහන්සේ වෙනුවෙන් දේශයන් විනිවිද යෑම සඳහා ඔබ සන්නද්ධ කළ විට ඔබගේ වගකීම් වන්නේද මේවා වේ. ඉශ්‍රායෙල්වරුන්ටද දෙවියන්වහන්සේගේ වගකීම් ගැන පැහැදිලි අදහසක් තිබිණි.

යෝෂුවා 1 වන පරිච්ඡේදය

- උන්වහන්සේ ඔවුන්ට භූමිය දෙන සේක. 1:2-4
- කිසිවෙකුට ඔවුන්ට විරුද්ධව නැගී සිටින්ට නොහැකිය. 1:5
- උන්වහන්සේ ඔවුන් සමඟ සිටින සේක. 1:5
  - ඔවුන් පිළිබඳ අසමත් වන්නේ නැත. 1:5
  - ඔවුන් අත්හරින්නේ නැත. 1:5
  - ඔවුන් සමඟ සෑම තැන්හිම සිටින සේක. 1:5
  - උන්වහන්සේගේ වචනයෙන් ඔවුන් සඵල කරන සේක. 1:7-8

සන්නද්ධ කරනු ලැබ දෙවියන්වහන්සේ උදෙසා තම දේශයෙන් ගෙන යෑමට සූදානම්ව සිටින අයට දෙවියන්වහන්සේ දෙන පොරොන්දු මේවා වේ.

## ඔබගේ සතුරා දැනගන්න:

යෝෂුවා පොතේ සතුරෝ කානානිවරු වූහ. ලෙවී කථාව 18 හා ද්විතිය කථාව 12:31, 7 පරිච්ඡේදය, හා 20:16-18හි, දෙවියන්වහන්සේ සතුරන් හඳුනාගෙන ඇති අතර ඔවුන් සමඟ කටයුතු කිරීම සඳහා සුවිශේෂී උපක්‍රම දී ඇත.

ලෝකය, මාංසය සහ යක්ෂයා ඔබගේ සතුරන් ලෙස දේව වචනය හඳුනාගනී. මේ සතුරු බලවේගවලට මුහුණ දිය යුතු ආකාරය පිළිබඳව බයිබලය තුළ විශේෂ උපදෙස් ඇතුළත් වේ. ජයග්‍රාහී ලෙස භූමිය අත්පත් කරගැනීමට නම් ඔබේ සතුරා වන සාතන් හඳුනා ගත යුතු අතර ඔහුට මුහුණ දෙන අයුරු දැනගත යුතුය. ආත්මික සටන පිළිබඳව ඔබට නුහුරු නම් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් ප්‍රකාශිත " ආත්මික උපක්‍රම: ආත්මික සටන පිළිබඳ අත්පොත" ලබාගන්න.

## සතුරා සිටින තැන හඳුනා ගැනීම:

ඔබ සතුරා හඳුනා ගැනීමට නම් ඔබ ඔහුට මුහුණ දිය යුතුය. බියෙන් පලා යාමෙන් වැඩක් නැත. සතුරු බලවේගවල ප්‍රමාණය ගැන බිය නොවන්න. ඇදහිල්ලෙන් යුතුව ඔබ ඉදිරියට යන විට දෙවියන්වහන්සේගේ හස්තය දැනටමත් ඔවුන් මත බව ඔබට වැටහෙනවා ඇත. සන්නද්ධ කිරීම යනු මෙය වේ.

රජවරුන් පස් දෙනෙකු සන්ධානගත වී ඉශ්‍රායෙල්වරුන් සමඟ කරන සටන පිළිබඳ කතාව යෝෂුවා 10න් කියවන්න. ජෙරුසලම, හෙබ්‍රොන්, යර්මුත්, ලාකීෂ් හා එග්ලොන් යන රටවල රජවරු ඉශ්‍රායෙලයට විරුද්ධව එක් වූහ. එම සටන විස්තර කර ඇත්තේ යෝෂුවා 10:6-11 වේ. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙලය වෙනුවෙන් මහත් භාස්කමකින් ඊට මැදිහත් වූ සේක. ඔබට මේ පිළිබඳව යෝෂුවා 10:12-15 න් කියවිය හැකිය. කානානිවරු ඉරට හා හඳට නමස්කාර කළහ. ඉර හා හඳ ඉශ්‍රායෙලය උදෙසා නිසොල්මන්ව සිටි විට, ඉශ්‍රායෙල්හි දෙවියන්වහන්සේ තම දෙවිවරුන්ට වඩා උසස් බව ඔවුහු පිළිගත්හ.

ගුහාවක සැඟවී සිටි මේ රජවරුන් පස්දෙනා ගෙන ආ කල යෝෂුවා ඉශ්‍රායෙල්වරුන්ට කතා කොට ඔවුන්ගේ පාද රජුන්ගේ ගෙල මත තබන්නැයි කීය. මෙය ඇදහිලිවතුන්ගේ සතුරන්ගේ තත්ත්වය පෙන්වීමේ ස්වාභාවික, දෘෂ්‍යමාන නිදසුනක් විය. කල්වරියේදී යේසුස්වහන්සේ සාතන්ගේ හිස පොඩි කළ සේක. යේසුස්වහන්සේ සභාවේ හිස වන අතර අපි ශරීරය වෙමු. උත්පත්ති 2:14-15 න් පොරොන්දු වී ඇති පරිදි සාතන් උන්වහන්සේගේ විලුඹ යට නම්, ඔහු අපගේද පාද යට වේ. ලෝකයේ සිටින සතුරන් හා මාංසය ඔබගේ ජීවිතය තුළ සැඟවී සිටී නම්, ඔවුන් එළියට ගෙන සටන් කරන්න. එවිට, ආත්මිකව කතා කරන්නේ නම්, ඔබගේ පාද සතුරාගේ ගෙල මත තබා ඔහු පරාජය කරන්න.

## දෙවියන්වහන්සේ අභිමුඛය ඔබ සමග ඇති බවට සහතිකය ලබාගන්න:

දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සංකේතය වූ ගිවිසුම් කරඬුව යොර්දාන් නදිය වෙත ඉශ්‍රායෙලයට පෙරටුව ගිය අතර සටනටද ඔවුන්ට පෙරටුව ගියේය. ආයි නගරයේදී මෙන් (යෝෂුවා 7) ඉශ්‍රායෙල්වරුන් පව්කළ විට දෙවියන්වහන්සේ ඔවුන් අත්හැර ගිය බැවින් සතුරන් විසින් ඔවුන් පරාජය කරන ලදී. ඔබව සන්නද්ධ කර ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් ගමන් කරන විට, දෙවියන්වහන්සේගේ අභිමුඛය ඔබට පෙරටුව යන බව සහතික කරගන්න. ඔබ ජීවිතයේ පාපය ඇත්නම් ඒ ගැන කටයුතු කරන්න. පාපය දෙවියන්වහන්සේගේ අභිමුඛයෙන් ඔබ වෙන් කෙරේ.

## සටන දෙවියන්වහන්සේගේ බව හඳුනා ගන්න.

දෙවියන්වහන්සේ යෝෂුවාටත් ඉශ්‍රායෙල්වරුන්ටත් නැවත නැවතත් පැවසුවේ "සටන සමිඳාණන්වහන්සේගේය, කෑ ගසන්න. සමිඳාණන්වහන්සේ ඔබට නගරය දී ඇත. ... මා ඔබ අතට භූමිය දී ඇත" යනුවෙනි. දෙවියන්වහන්සේ ජයග්‍රහණය දී ඇති බව සටන දියත් කරන හමුදා භටයන්ගේ සිත් තුළට මෙම සත්‍යය කා වදින තෙක් "යුද්ධයේ සන්නද්ධ භටයන්ට" නිරන්තරයෙන් පවසන්න. ඔවුන් තමාගේම හැකියාවන් හා දක්ෂතා මඟින් භූමිය අත්පත් කර ගැනීම අවශ්‍ය නැත. සටන සමිඳාණන්වහන්සේගේ වේ.

## ස්වාභාවික තර්කයන් මත බලාපොරොත්තු නොතබන්න:

යෝෂුවා ස්වාභාවික තර්ක මත තම බලාපොරොත්තු රැඳවූයේ නම් කෑ ගසමින්, හොරණෑ පිඹිමින්, ජෙරිකෝව වටේට යමින් එය අත්පත් කර ගැනීමට උත්සාහ නොකරනු ඇත. දෙවියන්වහන්සේ උදෙසා ආත්මික බලවේග සන්නද්ධ කරන විට, උන්වහන්සේගේ මාර්ග ඔබගේ මාර්ග නොවන බව මතක තබා ගන්න. ස්වාභාවිකව එය කෙතරම් මෝඩකමක් ලෙස පෙණුනද, ඔබ සෑමවිටම දෙවියන්වහන්සේ විශ්වාස කළ යුතුය.

> **මක්නිසාද මාගේ යෝජනා නුඹලාගේ යෝජනා නොවේය. නුඹලාගේ මාර්ගද මාගේ මාර්ග නොවේ යයි ස්වාමීන්වහන්සේ කියන සේක. (යෙසායා 55:8)**

ලෝකයා දුර්වල උපක්‍රම ලෙස බලන ඒවා දෙවියන්වහන්සේ බලවත් ශක්තිමත් අය ලජ්ජාවට පත් කිරීමට භාවිත කරන සේක.

> **මක්නිසාද දෙවියන්වහන්සේගේ මෝඩකම මනුෂ්‍යයන්ට වඩා ප්‍රඥාවන්තය. දෙවියන්වහන්සේගේ දුර්වලකම් මනුෂ්‍යයන්ට වඩා බලවත්ය.**
> **... නුමුත් දෙවියන්වහන්සේ ප්‍රඥාවන්තයන් ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ මෝඩ දේවල් තෝරා ගත් සේක. දෙවියන්වහන්සේ ශක්තිමත් දේ ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ දුර්වල දේවල් තෝරා ගත් සේක.**
> **... එසේ කළේ කොයි මනුෂ්‍යයෙක්වත් දෙවියන්වහන්සේ ඉදිරියෙහි පාරට්ටු කර නොගන්නා පිණිසය. (1 කොරින්ති 1:25, 27, 29)**

යෝෂුවා ස්වාභාවික තර්ක මත බලාපොරොත්තු රැඳවූ සෑම අවස්ථාවකම ගැටලු මතු විය. මෙය පැහැදිලි කෙරෙන යෝෂුවා 9:1-27හි සඳහන් ගිබියෝන්වරුන් සමඟ ඔහු ඇති කරගත් ගිවිසුම ගැන කියවන්න. මේ අවස්ථාවේ පෙනුමින් යෝෂුවා රැවටිණි. ඔබට අධිස්වාභාවික හෝ ස්වාභාවික හෝ ක්ෂේත්‍රවලින් පැමිණෙන සෑම දෙයක්ම දේව වචනයෙන්, යාච්ඤාවෙන් හා සිත ඇතුළාන්තයේ සාමයේ සාක්ෂියෙන් විමසා බලන්න.

පළමු බැල්මෙන්ම සෑම දෙයකම විමසා බලා නිරීක්ෂණය කිරීමට ඔබට නොහැකි වීමට ඉඩ තිබේ. මන්ද රැවටීම සතුරාගේ ආයුධයක් බැවිණි. යෝෂුවා ඉක්මන් වැඩිවිය. සන්නද්ධ කිරීම යන්නෙන් අදහස් වන්නේ දිව්‍යමය මඟ පෙන්වීමක් නොමැතිව ඉදිරියට යාම නොවේ. අවිශ්වාසයක් ඇත්නම් මොහොතක් නවතින්න.

## ආරක්ෂක නොව ආක්‍රමණික සටනක යෙදෙන්න:

සතුරා පහර දෙන තෙක් යෝෂුවා බලා සිටියේ නැත. ඔහු ආරක්ෂක නොව ආක්‍රමණික සටනක යෙදිණි. බොහෝ ඇදහිලිවතුන් තම ජීවිත කාලය ගත කරන්නේ සතුරාගේ පහර දීම්වලට එරෙහිව සටන් කරමින් මිස ආක්‍රමණික ආත්මික සටනක යෙදෙමින් "පොරොන්දු දේශය" අත්පත් කරගැනීමට නොවේ.

## උපක්‍රමශීලීව ජංගම වන්න:

පුද්ගලයෙක් "උපක්‍රමික ලෙස ජංගම" වූ විට ඔහු නිරන්තරයෙන් ගමනේ යෙදෙමින් සිටී. ඔහු තමාගේ මාර්ගවල නැවතී සිටින්නේ හෝ ලෝකයේ දේවල් සමඟ පැටලී සිටින්නේ හෝ අතීත ජයග්‍රහණ හා පරාජයන් මත ජීවත් වන්නේ හෝ නැත. ඔහු නිරන්තරයෙන්ම ගමන් කරමින් දෙවියන්වහන්සේට අලුත් ප්‍රදේශ අත්පත් කර ගනී. යෝෂුවා කානාන් දේශයේදී උපක්‍රමශීලීව ජංගම වූයේය. ඔහු නිරන්තරයෙන්ම ගමන් කරමින් අලුත් පෙදෙස්වලට යමින් යුධ හමුදාව සන්නද්ධ කරමින් දෙවියන්වහන්සේගේ අලුත් උපදෙස් මත ක්‍රියා කරමින් සිටියේය.

මුල් සභාව උපක්‍රමශීලීව ජංගම වූ බව බයිබලයේ සඳහන් වේ. එහි සාමාජිකයෝ දේව වචනය දේශනා කරමින් සෑම තැනකටම ගියහ. උපක්‍රමශීලීව ජංගම වීමට ඔබට "අස්වැන්න නෙළීමේ" හා "හමුදා භටයෙකුගේ" මානසිකත්වයක් වර්ධනය කර ගත යුතුය.

ඔබ "අස්වැන්න නෙළීමේ මානසිකත්වයක" සිටින විට අස්වැන්න නෙළා ගැනීම සඳහා දෙවියන්වහන්සේගේ අණ පරිදි නැවතී සිටීමට හෝ ගමන් කිරීමට කැමති වන්නේය. ඇතැම්

ජාතීන් තුළ මහා අස්වැන්නක් ඇති කාලයක නෙළා ගැනීමට සේවකයන් අඩු නිසා බොහෝ විට ගැටලුවලට මුහුණ පෑමට සිදුවිය. අස්වැන්න ඇති තැන්වලට යාමට සභාව අලුතින් කැපවිය යුතුය. අන්තියෝකියේ සිටින යුදෙව්වන් පාවුලුතුමා ප්‍රතික්ෂේප කළ විට ඔහු හා ඔහුගේ කණ්ඩායම ඉකෝනියට ගියහ (ක්‍රියා 13:51-52). ඔවුහු එක් නුවරකින් නෙරපා දැමූ විට පාදවල "දූවිලි ගසාදමා" ආත්මික අස්වැන්න පැසී ඇති වෙනත් පෙදෙස්වලට ගියහ.

ඔබට "හමුදා භටයෙකුගේ" මානසිකත්වයක්ද තිබිය යුතුය. ඔබට "හමුදා භටයෙකුගේ" මානසිකත්වයක් ඇතිවිට ඔබ සෑම විටම අණදෙන නිලධාරියාගේ නියෝගවලට සවන් දෙමින් සිටී. හමුදා භටයෙකු අවුරුදු 20කට හෝ 30කට පමණ දුන් නියෝගවලට හැර අනෙක් ඒවා අනුගමනය කිරීම ප්‍රතික්ෂේප කිරීමක් ගැන සිතා බලන්න. ඒවා නිකුත් කරන අවස්ථාවේ උචිත නියෝග වන්නට පුළුවන. එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේගේ කල්පනාවට අනුව එය වෙනස්වී බොහෝ කල් විය හැකිය.

යේසුස්වහන්සේ මෙලොව සිටි කාලයේ උන්වහන්සේ උපක්‍රමශීලීව ජංගම වූ සේක. උන්වහන්සේ ගමින් ගමට, තැනින් තැනට වැඩිය සේක (ලූක් 4:43). උන්වහන්සේ සෑමවිටම පියාණන්වහන්සේගේ නියෝගවලට ප්‍රතිචාර දැක්වූ සේක. අප ද පැසී ඇති කාලයේ හා තැන්වල අස්වැන්න නෙළා ගැනීමට නම් හා වැදගත් පෙදෙස්වල සටන් කිරීමට නම් එසේ කළ යුතු වේ.

## වැදගත් බලකොටුවලට පහර දෙන්න:

කානාන් දේශයේ යෝෂුවාගේ උපක්‍රමය වූයේ කානානි නගරයේ ප්‍රධාන නගර කිහිපයකට කිහිප විටක්ම ප්‍රහාර එල්ල කිරීම වේ (යෝෂුවා 9 හා 10:28-43 බලන්න). යෝෂුවා කානාන් දේශයේ මැද පෙදෙසට පහර දී රට දෙකට බෙදා ඉතිරි හමුදාවලට එකට සම්බන්ධ වී ඒකාබද්ධ පෙරමුණක් සෑදීම වැළැක්වීය. ඔහු සතුරාගේ වැදගත් බලකොටුවලට ප්‍රහාර එල්ල කළේය.

සතුරාට තීරණාත්මක ලෙස පහර දෙන්න. පූර්ණ ජයග්‍රහණයට වඩා අඩු දෙයකින් සතුටු නොවන්න. ඔබගේ ජීවිතයේ බලකොටුවලට පහරදීමෙන් ඔබව අල්ලා ගැනීමේ සාතන්ගේ ශක්තිය ඔබ දුර්වල කරයි.

## මාංසය මත බලාපොරොත්තු නොරඳවන්න:

ඉශ්‍රායෙල්වරුන් සිය අශ්වයන් හා අශ්ව රථ මත ජයග්‍රහණයේ බලාපොරොත්තු රැඳවීම දෙවියන්වහන්සේට අවශ්‍ය නොවීය. එබැවින් ඔවුන් කානානිවරුන්ගේ හමුදාවන් පරාජය කළ විට ඉශ්‍රායෙල්වරු සතුරන්ගේ අශ්වයන්ගේ පාදවල මාංශ පේශීන් ඉවත් කර උන් අක්‍රිය කළහ. මේ ආකාරයෙන් අශ්වයන් හා අශ්වරථ මත විශ්වාසය තැබීමේ පරීක්ෂාවට ඔවුන් වැටුණේ නැත.

ඔබ ආත්මික සටන්වල යෙදෙද්දී ලෝකයා කරන්නාක් මෙන් "සතුරාගේ අශ්වයන් හා අශ්ව රථ මත" ඔබගේ විශ්වාසය තැබුවෙහිද?

## මතුපිට රෝග ලක්ෂණවලට නොව මූලික හේතුවලට පහර දෙන්න:

ඉශ්‍රායෙල්වරු සතුරන් "කිසිවෙක් ඉතිරි නොවන" තෙක් "සම්පූර්ණයෙන්ම විනාශ කළහ." භූමිය විනිවිද යා හැක්කේ සතුරා සම්පූර්ණයෙන්ම විනාශ කළ විට පමණි. ඉශ්‍රායෙල්වරුන් කිසිදු සතුරෙකු ඉතිරි කළේ නම් ඔවුන්ගේ පාපයේ "මූල" නැවතත් වර්ධනය වී ඔවුන් නැවතත් කරදරයට වැටෙනු ඇත.

මතුපිට සටනින් පමණක් නොනවතින්න. අර්ධ ජයග්‍රහණයකින් තෘප්තිමත් නොවන්න. ඔබගේ ආත්මික බලවේග තවදුරටත් සන්නද්ධ කරමින් සතුරා "සම්පූර්ණයෙන්ම විනාශ වන තුරු" භූමිය විනිවිද යන්න.

## දෙවියන්වහන්සේට කීකරු වන්න:

විනිවිද යෑමේ ඉතා වැදගත් එක් මූලධර්මයක් වන්නේ කීකරු වීම වේ. බයිබලයේ මෙසේ සඳහන් වේ.

**ස්වාමීන්වහන්සේ තමන්ගේ මෙහෙකරු වූ මෝසෙස්ට අණ කළ ලෙස මෝසෙස් යෝෂුවාට අණ කළේය. යෝෂුවාද එසේ කෙළේය. ස්වාමීන්වහන්සේ මෝසෙස්ට අණ කළ සියල්ලෙන් ඔහු කිසිවක් නොකොට නොසිටියේය. (යෝෂුවා 11:15)**

ඔබගේ සන්නද්ධ කිරීමේ හා විනිවිද යෑමේ හැකියාව දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඔබේ කීකරුකමට සෘජුවම සම්බන්ධ වේ.

### සටනේ නොකඩවා යෙදෙන්න:

යෙරිකෝවේ සටන මෙන් යෝෂුවාගේ සියලුම සටන් ඉක්මණින් ජයගත්තේ නැත. යෝෂුවා 11 කියවන්න. දේශයේ රජවරුන් සමඟ යෝෂුවා හය අවුරුද්දක් යුද්ධ කළේය (යෝෂුවා 11:18). බලකොටු අල්ලා ගැනීමේදීත් සතුරා පලවා හැරීමේදීත් දෙවියන්වහන්සේ ඔබට පොරොන්දු වූ සියල්ල අත්පත් කර ගැනීමේදීත් නොකඩවාම ඉදිරියට යෑම අවශ්‍යය (සටනේදී විශ්වාසවන්තව සිටීම).

### ජයග්‍රහණය වෙත නොව ජයග්‍රාහකයා වෙත අවධානය යොමු කරන්න:

යෝෂුවා ඉශ්රායෙල්වරුන්ව, ඔවුන්ගේ යුධමය ජයග්‍රහණවලින් පසු, දෙවියන්වහන්සේට නමස්කාර කිරීමට යොමු කළේය (යෝෂුවා 8:29-31 බලන්න). ඇතැම්විට අපද සටන හා එහි අප ගත් කොටස කෙරෙහි අවධානය යොමු කිරීමේ වරද කරන්නෙමු. ජයග්‍රාහකයා, සේනාවල ස්වාමීන්වහන්සේ වෙත නොව ජයග්‍රහණය වෙත අවධානය යොමු කරයි.

### පරාජය ජයග්‍රහණයකට හරවන්නේ කෙසේදැයි ඉගෙන ගන්න:

ඉශ්රායෙලය, කුඩා නගරයක් වූ ආයිහිදී මහත් වූ පරාජයක් අත් දුටුවේය. ඔබට ඒ පිළිබඳව යෝෂුවා 7-8න් කියවිය හැකිය. පරාජය, ජයග්‍රහණයට හැරවීමේ මෙම මූලධර්මය ඉතා වැදගත් නිසා ඒ සඳහා සම්පූර්ණ පරිච්ඡේදයක් කැප කර ඇත. "අකෝර්වලින් පසු" කළ යුතු දෙය ඔබ දහහත්වන පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නෙහිය.

## ඉතිරිව ඇති භූමිය

යෝෂුවා 13:1-7 කියවන්න. යෝෂුවා මැරෙන්නට ආසන්නව සිටියදී ඉශ්රායෙල්වරුන් අත්පත් කරගත යුතු ප්‍රදේශ තව බොහෝ තිබිණි. යෝෂුවා ඉශ්රායෙල්වරුන්ට ආරම්භ කිරීමට මඟ පෙන්වූ දේ ඔවුන් අවසන් කළ යුතුව තිබුනි.

තම නායකයා ඉවත් කළ පසුව වුවද සතුරු ප්‍රදේශ යටත් කර ගැනීමට සත්‍ය ලෙස සන්නද්ධ කළ සෙනඟකට හැකි විය යුතුය. සෙනඟ කණ්ඩායමක් සත්‍ය ලෙස සන්නද්ධ කිරීමට, ඔවුන් ඔබ මත යැපීම නතර කළ යුතුය. යෝෂුවා මිය ගිය පසු සෑම ගෝත්‍රයකටම, සටන දිගටම ගෙන යමින්, ඔවුන්ගේ භූමියේ සිටි සතුරන් ඉවත් කිරීමට සිදුවිය. සාමූහිකව උගත් දේ පෞද්ගලිකව යෙදවීම අවශ්‍යය.

දෙවියන්වහන්සේ ඉශ්රායෙල්වරුන්ට පොරොන්දු වූයේ ඔවුන්ගේ සතුරන් ටිකෙන් ටික පලවා හැරීමට වේ (නික්මයාම 23:29-30). ඔබ ඔබගේ ආත්මික සතුරන් සටන් කීපයකින් පලවා හරින්නේ නැත. ඔබ ජීවිතයේ විවිධ අවස්ථාවන්ට මුහුණ දෙමින් ඒවා ජය ගන්නා විට දෙවියන්වහන්සේ ඔබ ජීවිතයේ ඇති සතුරු බලවේග ටිකෙන් ටික පලවා හරින සේක. මේ සඳහා ඔබ නිරන්තරයෙන්ම උන්වහන්සේ මත රඳා පැවතිය යුතු වේ.

ඔබට ලබා ගැනීමට තිබෙන දෙවියන්වහන්සේගේ පොරොන්දු මොනවාද? සතුරාගේ කුමන බලකොටු ජයගැනීමට තිබේද? ඔබගේ ආත්මික ජීවිතයේ තවමත් අත්පත් කරගෙන නැති ප්‍රදේශ මොනවාද? "ඉතිරිව ඇති ප්‍රදේශ" ලබා ගැනීම සඳහා ඔබ සන්නද්ධ කිරීමට මෙම විනිවිද යෑමේ මූලධර්ම උපකාර වනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. යෝෂුවා පොතේ සඳහන් විනිවිද යෑමේ මූලධර්ම සාරාංශ කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

1. යෝෂුවා පොත සැබවින්ම ආත්මික යුද්ධ කරන ආකාරය පිළිබඳ අත්පොතකි. පහත දැක්වෙන සැකිල්ල ඇසුරින් යෝෂුවා පොත අධ්‍යයනය කරන්න.

   - සූදානම් වීම — 1-2, 5 පරිච්ඡේද
     - පුද්ගලයෙකු සූදානම් කිරීම. : යෝෂුවා
     - සෙනඟක් සූදානම් කිරීම. : ඉශ්රායෙලය
   - විනිවිද යෑම — 3-12 පරිච්ඡේද
   - අත්පත් කර ගැනීම — 13-24 පරිච්ඡේද

2. යෝෂුවා 12:7-24 කියවන්න. මෙම කොටසෙහි සතුරා පරාජය කරමින් යෝෂුවා ලබාගත් ජයග්‍රහණ 31ක් සඳහන් වේ. ඔබ මෙම වසරේ ජයග්‍රහණ කීයක් ලැබුවෙහිද? ඔබ සතුරා පරාජය කළේ කෙසේද?

3. යෝෂුවා පොතේ සඳහන් කානාන් දේශය සන්නද්ධ කිරීම හා විනිවිද යෑම හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ විෂය මාලා සැලැස්ම අනුගමනය කර ඇත. යෝෂුවා පොත නැවතත් පහත දැක්වෙන දේ මත අධ්‍යයනය කරන්න.

   - දෘශ්‍යකරණය: 1:1-6
   - නියෝජනය : 1:7-9
   - ගුණනය කිරීම: 1:10, 16-17
   - සංවිධානය කිරීම: 1:11
   - සන්නද්ධ කිරීම: 3 පරිච්ඡේදය, 4:13
   - ශුභාරංචිකරණය කිරීම: කානාන් දේශය වටා ඇති ජාතීන්ට ඉශ්රායෙලය ආදර්ශයක් වනු ඇත.

   හාවස්ටයිම් වැඩ සටහනේ අප කරන්නාක් මෙන් නායකයන්ද (යෝෂුවා 23) අනුගාමිකයන්ද (යෝෂුවා 24) පුහුණු කෙරිණි.

4. "කානාන් දේශය ඉශ්රායෙල්වරුන්ට උරුම කර ගන්නට" යෝෂුවා සලසනු ඇත. (ද්විතීය කතාව 1:38 හා 3:28). දෙවියන්වහන්සේගේ පොරොන්දු උරුම කරගන්නට ඔබ වටා සිටින අය සන්නද්ධ කිරීමට ඔබ කැඳවා ඇත.

5. යෝෂුවා පොත නැවත කියවන්න. මෙම පරිච්ඡේදයේ සඳහන් කර නොමැති විනිවිද යෑමේ වෙනත් මූලධර්ම ඔබට හඳුනා ගත හැකිද? එසේ තිබේ නම් ඒවා මෙම පාඩමේ අධ්‍යයන සටහන්වලට එකතු කරන්න.

6. කානානි දේශයේ වාසය කළ අයට දෙන ලද පොදු නාමය වූයේ "කානානිවරු" යන්න වේ. ඊට හේතුව ඔවුන් කානාන් දේශයේ ජීවත් වීම වේ. කානානිවරුන් සැබවින්ම ගෝත්‍ර කිහිපයකින් සමන්විත වූ අතර ඔවුන්ට පොදුවේ පහත දැක්වෙන දේ තිබිණි.

   - ඔවුන් නමස්කාර කළේ බාල් නමැති ව්‍යාජ දෙවියෙකි. බාල්ගේ බිරිඳ වූ "අෂ්ටාරොත්" ඔවුන්ගේ දේවතාවිය වූවාය. බාල් හි බහුවචනය වන "බාලිම්", එනම් බාල්ගේ පිළිම විය.

   - මාළිගාවේ සිටි ඔවුන්ගේ පූජකවරු ගණිකාවෝ වූහ. සොදොම්වරු පිරිමි ගණිකාවෝ වෙති.

   - ඔවුන් බාල්ට නමස්කාර කළේ "උස් තැන්වල"ය. ඊට හේතුව ඔවුන් ඔහුට වඩා ළංව සිටීමට වේ. මේ උස්තැන් තනා ඇත්තේ බාල්ට කැප කළ ළදරුවන්ගේ මිනිවල කොටස් අඩංගු භාජන අත්තිවාරම් ලෙස යොදා ගනිමිනි.

   - ඔවුහු දුරාචාරය, ජේනකීම, පිළිම වන්දනාව, ඉර, හඳ, මුහුද හා කුණාටු දෙවිවරුන් නමස්කාර කිරීම ආදියෙහි නිරත වූහ. ඔවුහු ඩයනාද නමස්කාර කළහ.

- ඔවුන්ගේ ද්‍රව්‍යවාදයේ ප්‍රතිඵලය වූයේ බාහිර සමෘද්ධිය හා අභ්‍යන්තර දුෂ්ටකමය.

- කානාන් දේශයේ ජාතීන් හත මෙසේ වේ : කානානිවරු, හිත්තිවරු, හිවීවරු, පෙරිසිවරු, ගිර්ගාෂින්වරු, අමෝරිවරු හා ජෙබූසිවරු වේ.

- කානානිවරුන් විනාශ කිරීමට හේතුව ලෙවී කතාව 18 හා ද්විතීය කතාව 12:31, 7 පරිච්ඡේදය,හා 20:16-18 හි සඳහන් වේ.

# දහහත්වන පරිච්ඡේදය
## ආකෝර්වලින් පසු

**අරමුණු :**
මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට
- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ආත්මික පරාජයන් සඳහා හේතු හතරක් හඳුනාගැනීමට
- ආත්මික පරාජයේ ප්‍රතිඵල සාරාංශ කිරීමට
- ප්‍රකෘති ස්වභාවය නැවත ලබාගැනීමේ පියවර සතර පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

> **ඔහුගේ මලපතෙන් මිදෙන පිණිසද, දෙවියන්වහන්සේ ඔවුන්ට පසුතැවිල්ල දෙනසේක්දෝයි බලමින් මෘදුකමින් ඔවුන්ට තරවටුකරන්ට ඕනෑය. (2 තිමෝති 2:26)**

### හැඳින්වීම

කානාන් දේශය අත්පත් කරගැනීම සඳහා දෙවියන්වහන්සේ සන්නද්ධ කරන්නෙකු (යෝෂුවා) සූදානම් කර උන්වහන්සේගේ සෙනඟ (ඉශ්රායෙල්වරුන්) ඒ සඳහා සූදානම් කළ ආකාරය ඔබ පසුගිය පරිච්ඡේදවලින් ඉගෙන ගත්තෙහිය. එමෙන්ම ඔබගේ ජීවිතයට හා සේවයට යොදා ගත හැකි විනිවිද යෑමේ මූලධර්ම ද ඉගෙන ගත්තෙහිය.

මෙම පාඩමෙන් ඔබ ඉගෙන ගන්නේ පරාජය හමුවේ ඉශ්රායෙල්වරුන් කටයුතු කළ ආකාරය වේ. දෙවියන්වහන්සේ උදෙසා ඔබ සන්නද්ධ වී, උන්වහන්සේගේ නාමයෙන් ප්‍රදේශ අල්ලාගැනීමට ආරම්භ කරන ඕනෑම අවස්ථාවක ඔබට ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවනු ඇත. ඇතැම්විට ඔබ පරාජය අත්දකිනු ඇත. මෙම පාඩමෙන් ඔබ ඉගෙන ගන්නේ "ආකෝර්වලින් පසු" කළ යුතු දෙය වේ.

### යෙරිකෝවේ සටන

යෝර්දාන් ගඟින් එගොඩ වූ පසු ඉශ්රායෙල්වරුන් මුහුණ දුන් පළමුවන මහා සටන සිදුවූයේ යෙරිකෝවෙහි වේ. ඔබට යෙරිකෝ පිළිබඳ කතාව යෝෂුවා 6 පරිච්ඡේදයෙන් කියවිය හැකිය. මෙම නගරය අත්පත් කරගැනීම සඳහා දෙවියන්වහන්සේ ඉශ්රායෙල්වරුන්ට සුවිශේෂී උපක්‍රමයක් දුන් සේක. ඔවුන් නගරය වටා නිශ්ශබ්දව දවස් හයක් යා යුතුය. සත්වන දවසේ ඔවුන් වටේට සත්වරක් යා යුතුය. ඉන්පසු පූජකවරුන් හොරණෑ පිඹිය යුතු අතර සෙනඟ "සමිඳුණන්වහන්සේ ඔබ හැමට නුවර දී තිබේ" කියමින් ඔල්වර හඬ නැඟිය යුතුය (යෝෂුවා 6:16).

ඔබ ආත්මිකව ඕනෑම වේලාවක "යෝර්දාන් ගඟකින්" එතෙර වී දෙවියන්වහන්සේ උදෙසා අලුත් ප්‍රදේශ අත්පත් කරගැනීමට යන අවස්ථාවේ "යෙරිකෝවකට" මුහුණ දීමට නිසැකවම සිදුවනු ඇත. ඔබගේ "යෙරිකෝව" කුමක් වුවද සටන් කිරීම සඳහා දෙවියන්වහන්සේ ඔබට සුවිශේෂී උපක්‍රම දෙන සේක.

ඇතැම් විට දෙවියන්වහන්සේගේ සැලැස්ම යෙරිකෝව වෙනුවෙන් යෝෂුවාට දුන්නාක් මෙන්, මෝඩ ලෙස පෙනෙන්නට හැකිය. එහෙත් පරෙස්සමෙන් දෙවියන්වහන්සේගේ මගපෙන්වීම අනුගමනය කරමින් උන්වහන්සේ සමග ශුද්ධත්වයෙන් යුතුව ගමන් කරන්නේ නම්, ඔබට ජයග්‍රහණය අත්වනු නියතය. එහෙත් මෙම පාඩමෙන් යෙරිකෝව පිළිබඳව අප අවධානය යොමු කරන්නේ නැත. ඔබට සාමාන්‍යයෙන් ජීවිතයේ ජයග්‍රහණ සමග ප්‍රශ්න ඇති නොවේ. අපගේ "යෙරිකෝවල" ජයග්‍රහණයෙන් යුතුව ගමන් කිරීම උද්වේග ජනකය.

අපට බොහෝ විට ගැටලු ඇතිවන්නේ පරාජවලට මුහුණ දෙන අවස්ථාවලදී වේ.
දෙවියන්වහන්සේගේ සෙනඟ මහත් පරාජයක් අත්දුටු අවස්ථාවක් යෝෂුවා 7 හා 8 පරිච්ඡේදවල වාර්තා කර ඇත. මෙම පාඩම ඉගෙනීමට පෙර එම පරිච්ඡේද කියවන්න.

# ආකෝර් මිටියාවත

"ආකෝර්" යන වචනයේ තේරුම "කරදර" යන්නය. ආයි නම් කුඩා නගරයට එරෙහිව ඉශ්රායෙල්වරුන් සටන් දියත් කළ විට, ඔවුන්ට මුහුණ දීමට සිදුවූයේ කරදරවලට වේ. ආයි නගරය හා ආකෝර් මිටියාවත පිළිබඳ කතාව යෝෂුවා 7:1 න් "එහෙත්" යන්නෙන් ආරම්භ වේ. 6 වන පරිච්ජේදයේ ඉශ්රායෙල්වරුන් ගමන් කළේ ජයග්‍රහණයෙනි, "එහෙත්" 8 පරිච්ජේදය ඔවුන් කරදරවලට මුහුණ දෙන අන්දම ඇත.

ඉශ්රායෙල් පරාජය වීමට හේතු, ප්‍රතිඵල හා ඔවුන්ගේ ගැටලුවලට පිළියම් අප පරීක්ෂාකර බලනු ඇත. මෙයින් ඔබට ඔබගේ ජිවිතයට අදාළ වන පරාජයන්ට හේතු, ප්‍රතිඵල හා එම ගැටලුවලට පිළියම් සොයා ගත හැකිය.

## මේ සඳහා හේතු:

සමිඳුණන්වහන්සේ උදෙසා ඔබ ප්‍රදේශ තුළින් ගමන් කරමින් අත්පත් කරගන්නා විට පරාජය වුවහොත් සෑමවිටම ඊට හේතුවක් තිබේ. ආකෝර් පිළිබඳ කතාවේ පරාජය සඳහා හේතු හතරක් ඇති අතර මේ සියල්ල අප අත්දකින පරාජවලට පොදුය.

### 1. ප්‍රතිපත්ති:

දෙවියන්වහන්සේ ප්‍රතිපත්ති කඩ කිරීම (පාපය) සෑම විටම පරාජය ගෙන දෙයි. යෙරිකෝවේ කොල්ලයෙන් කිසිවක් නොගන්නා ලෙස දෙවියන්වහන්සේ ඉශ්රායෙල්වරුන්ට පවසා තිබිණි. මේවා සටනේ "නාඹුල් ඵල" බැවින් සමිඳුණන්වහන්සේට කැප කළ යුතු විය. "විනාශයට වෙන් කළ දෙයින් ඔබ වැළකී සිටිය යුතුය"යි ඔවුන්ට අවවාද කෙරිණි.

> **විනාශයට කැපවූ දෙයින් කොහොමහරි වැලකියල්ලා, නැතහොත් නුඹලා කැපකළ පසු කැපවූ දෙයින් යමක් ගත්තොත්, නුඹලා ඉශ්රායෙල් අන්දායමට ශාප ලැබෙන්ට සලස්වා එය කලඹනවා ඇත. රන් රිදී සියල්ලද පිත්තල සහ යකඩ බඩුද ස්වාමින්වහන්සේට කැපය. ඒවා ස්වාමින්වහන්සේගේ ගබඩාවෙහි තිබිය යුතුයැයි කිවේය. (යෝෂුවා 6:18-19)**

ආකාන් නැමැත්තෙකු "විනාශයට කැපවූ දෙයින්" ගත් ආකාරය 7:1 හි සඳහන් වේ. ඔහුගේ පරීක්ෂාව ද ඒව මුහණ දුන් මුල් පාපය හා සමාන වේ. ඔහු "දැක්කේය, ආශාවක් ඇතිවිය, ගත්තේය, සැගවුයේය".

> **කොල්ලය අතරේ ශෝභන බබිලෝනිය සළුවක්ද රිදී ෂෙකෙල් දෙසියයක්ද ෂෙකෙල් පනසක් බර ඇති රන් ජෙනුවක්ද මම දැක, ඒවාට ආශාවී, ඒවා ගත්තෙමි. ඒවා මාගේ කූඩාරම මැද පොළොව යට සඟවා තිබේ. ඊට යටින් රිදී තිබේ යයි කීවේය. (යෝෂුවා 7:21)**

පාපය සෑමවිටම මනසෙහි ආරම්භ වේ. පාපයේ ආකල්පය ක්‍රියාවට පෙර ඇතිවන්නකි. ආකාන් මෙසේ සිතන්නට ඇත. "කවුරු දකින්නද? කවුරු දැනගනීද?". සෑම පාපයකටම පොදු වන පරිදි ඔහු දැක්කේ ඒ මොහොතේ ඇති සතුට වේ. ඔහුගේ ක්‍රියාවේ දිගුකාලීන විපාක ඔහු දැක්කේ නැත. ආකාන් තෘෂ්ණාවේ ඇස්වලින් වෙනුවට ඇදහිල්ලේ ඇස්වලින් බැලුවේ නම් ඔහු ගත්තාවූ දේවල් දකින්නේ "විනාශකාරී" දේ ලෙසය. ඒ වෙනුවට ඔහු ඒවා දෙස බැලුවේ ස්වභාවික ඉන්ද්‍රියයන්ගෙන් පමණී.

ඔබගේ ආත්මික සතුරන් වන්නේ ලෝකයා, මාංසය හා යක්ෂයා වේ. මේ සියල්ල ඔබ මාංසික තෘෂ්ණාවෙන්ද ඇස්වල තෘෂ්ණාවෙන් හා ජිවිතයේ උඩගුකමින් ද ඔබ පරීක්ෂා කිරීමට එක්ව ක්‍රියා කරයි. ඔබ පරීක්ෂාවෙන් දෙස තෘෂ්ණාවේ ඇස්වලින් නොව ඇදහිල්ලේ ඇස්වලින් බැලුවහොත්, "විනාශකාරී දේ" ලෙස තහනම් කර ඇති දේ දකිනු ඇත.

ආකාන්ගේ සුවිශේෂී පාපය වුයේ දෙවියන්වහන්සේගේ මහිමය සඳහා බලාපොරොත්තු වූ දේ පෞද්ගලික භාවිතයට ගැනීම වේ. අපද කිසිදාක එම උගුලට අසුනොවන ලෙසට දෙවියන්වහන්සේ අපට උපකාර කරන සේක්වා! ආකාන්ගේ පාපය මුළු ඉශ්රායෙල් දේශයටම බලපෑවේය. මූලිකවම ඉශ්රායෙලය පරාජය වුයේ ඔවුන් දෙවියන්වහන්සේගේ ප්‍රතිපත්ති කඩ කළ බැවිනි.

**ඉශ්රායෙල්වරු පව්කළෝය. එසේය, මා ඔවුන්ට අණකළ මාගේ ගිවිසුම ඔවුන් කඩකර තිබේ. එසේය, ඔවුන් කැපකළ දේවලින් අරගන සොරකම්කර, ඒවා සඟවා, ඒවා තමුන්ගේම බඩු අතරේ තබා තිබේ. (යෝෂුවා 7:11)**

**2. උඩඟුකම:**

ආකොර් කතාවේ වරදකරු ආකාන් පමණක්ම නොවේ. යෝෂුවා දේශය සෝදිසිකිරීමට යෙරිකෝවේ සිට ආයි වෙත මිනිසුන් යැවූ විට, ඔවුන් පෙරළා පැමිණ තිබේ.

**යෝෂුවා වෙතට හැරී ඇවිත් ඔහුට කතාකොට: මුළු සෙනඟ යන්ට ඕනෑ නැත. දෙතුන් දහසක් පමණ මනුෂ්‍යයෝ ගොස් හායිට පහරදෙත්වා. එහි සිටින අය ස්වල්ප නිසා මුළු සෙනඟ එහි යැවීමෙන් වෙහෙස කරවන්ට ඕනෑ නැතැයි කීවෝය. (යෝෂුවා 7:3)**

ඉශ්රායෙලය අල්ලාගත් යෙරිකෝවට වඩා සංසන්දනාත්මකව ආයි නගරය කුඩාවේ. උඩඟුකමෙන් යුතුව මේ මිනිසුන් සිතුවේ, "ආයි නගරය ගැටලුවක් නොවනු ඇත. මීට වඩා විශාල දේවලට අපි මුහුණ දී ජය ගතිමු. මේ ගැන කරදර විය යුතු නැත" යනුවෙනි. ඉශ්රායෙල්වරුන් දෙවියන්වහන්සේ ගැන නොව තම ශක්තිය ගැන විශ්වාසය තබන ලදී.

අපගේම ජීවන සටන්වලදී බොහෝ විට අපට හැඟෙන්නේ සුළු ගැටලු අපටම විසඳිය හැකි බවය. එහෙත් දෙවියන්වහන්සේ අපට සපයා ඇති සියලු සම්පත් භාවිත කිරීමට අවශ්‍ය නැති, සතුරා සමග කෙරෙන කිසිඳු සුළු සටනක් නැත. ඔබ ආත්ම-විශ්වාසයෙන් යුතුව උඩගුකමින් "කරදරවීමට කිසිවක් නැත" යන විශ්වාසය ඇතිව කටයුතු කළහොත් ඔබ අවදානම් සහිත පෙදෙසකට යන්නෙහිය.

**3. අවබෝධය:**

ආයි නගරය සෝදිසි කිරීමට ගිය මිනිසුන් එහි ඇති දේ දුටුවේ ස්වභාවික ඉන්ද්‍රියයන්ගෙන් පමණි. මතුපිටින් පෙනෙන දේ පසුපස ඇත්තේ කුමක්දැයි දැක සතුරාගේ බලය හැඳිනගැනීමේ ආත්මික අවබෝධය ඔවුන් වෙත නොවීය.

ආත්මික අන්තර් දෘෂ්ටිය වෙනුවට ස්වභාවික අවබෝධය අනුගමනය කිරීමෙන් ලබා දුන් වාර්තා වැරදි විය. අයි නගරයේ සිටින සටන්කාමීන් සංඛ්‍යාව "ස්වල්ප" යයි මොවුන් පැවසුව බව යෝෂුවා 7:3 හි සඳහන් වේ. එහෙත් සත්‍ය වශයෙන් 12000ක් එහි සිටියහ (යෝෂුවා 8:25).

දෙවියන්වහන්සේගේ කටයුතුවල මාංසික මිනිසුන් යෙදවූ විට ඔවුන් සෑම විටම තීරණ ගන්නේ ඔවුන්ගේ ස්වභාවික මාංසික අවබෝධය පදනම් කරගෙන වේ. මින් සැමවිටම ලැබෙන්නේ මාංසික උපදෙස්ය. "අපගේ මිනිසුන් ප්‍රමාණවත්ය"යි ඔව්හු යෝෂුවාට පැවසුහ. මාංසික උපදේශනය සැමවිටම පරාජයට මඟපෙන්වයි.

**4. යාච්ඤා රහිතකම**

ආයි නගරයෙහි පරාජය ගැන යෝෂුවා මතද වරද පැටවේ. නගරය සෝදිසි කර පැමිණි අයගේ වාර්තා ඔහු ඉතා පරෙස්සමෙන් සලකා බැලුව ද ඔහු ඒ වාර්තාව ගැන යාච්ඤා කළේ නැත. ඔහු එක්වරම සටන් කිරීම සඳහා ආයි නගරයට යැවීමට යුද භටයින් 3000ක් සූදානම් කළේය.

යෝෂුවා යාච්ඤා කිරීමට කාලයක් ගත්තේ නම්, නිසැකවම දෙවියන්වහන්සේ ඉශ්රායෙල්හි පාපය ඇති බව ඔහුට එළිදරව් කර සටනට නොයන ලෙස අවවාද කරන්නට ඇත. එමෙන්ම යෝෂුවා යාච්ඤා කිරීමට කාලයක් ගත්තේ නම්, ආයි නගරයට පහරදීමේ රටාව යෙරිකෝවට පහර දුන් රටාවම නොවන බව ද ඔහු දැනගන්නවා ඇත. අප ජීවිතයේ ඇති "යෙරිකෝවරුන්" අත්පත් කර ගන්නා ආකාරයටම "ආයිවරුන්" අත්පත් කරගත නොහැකිය. අපට අතීත ජයග්‍රහණ තුළ හෝ ඊයේ සම්ප්‍රදායන් තුළ හෝ ජීවත්විය නොහැකිය. උන්වහන්සේගේ නාමයෙන් ප්‍රදේශ අත්පත් කරගැනීමට අප සන්නද්ධව ඉදිරියට යන විට දෙවියන්වහන්සේට සැමවිටම අලුත් උපක්‍රම තිබේ.

ඔබ තුන්වන පරිච්ඡේදයෙන් ගිඩියොන් ගැන ඉගෙන ගත්තෙහිය. ඔහු සටනට යන අවස්ථාවේ දෙවියන්වහන්සේ බෙහෙවින් සිටි ඔහුගේ සෙනඟ අඩු කළ බව ඔබට මතක ඇත. ආයිහි දී දෙවියන්වහන්සේ ස්වල්පය වැඩි කරන සේක. ඔබට සීමාවන් පනවා දෙවියන්වහන්සේ අතීතයේ රටාව දැනුත් අනුගමනය කරනු ඇතැයි බලාපොරොත්තු විය නොහැකිය. උන්වහන්සේ "මම අලුත් දෙයක් කරන්නෙමි"යි පැවසූ අලුත් දෙයෙහි දෙවියන්වහන්සේ වේ.

එහෙත් යෝෂුවා යාච්ඤා කිරීමට කාලයක් ගත්තේ නැත. ඔහු භටයින් ස්වල්ප දෙනෙකු යැවූ අතර ඔව්හු දරුණු ලෙස පරාජය වී සතුරා ඉදිරියෙන් පලා ගියහ.

**සාරාංශය:**

ආයි නගරයේ දී ඉශ්රායෙල්වරුන් පරාජය වූ ක්ෂේත්‍ර සතර

- ප්‍රතිපත්ති
- උඩඟුකම
- අවබෝධය
- යාච්ඤා රහිත බව වේ.

## ප්‍රතිඵල

> **එබැවින් ඉශ්රායෙල් පුත්‍රයන්ට තමුන්ගේ සතුරන් ඉදිරියෙහි සිටින්ට බැරිය. ඔව්හු ශාපයට අසුවුණ බැවින් තමුන්ගේ සතුරන්ට පිටුපාති. ඒ කැපවූ දේ නුඹලා අතරෙන් නාස්තිකර නොදැමුවොත් මම තවත් නුඹලා සමග නොසිටින්නෙමි. (යෝෂුවා 7:12)**

සැම වේලෙහිම පරාජයට හේතු ඇත්තාසේම අසාර්ථකවීමේ ප්‍රතිඵල ද ඇත. ඉශ්රායෙල්හි පරාජයේ ප්‍රතිඵල බලන්න.

| | |
|---|---|
| යෝෂුවා 7:4-5 | සතුරා ඉදිරියෙන් පලා යෑම |
| යෝෂුවා 7:5 | ආත්මික මරණය |
| යෝෂුවා 7:5 | බිය හා මිනිසුන්ගේ අධෛර්යවත් භාවය |
| යෝෂුවා 7:6 | නායකත්වයේ අධෛර්යවත් භාවය |
| යෝෂුවා 7:7 | "ඉතා හොඳ පැරණි දවස්" දෙස ආපසු හැරී බැලීම |
| යෝෂුවා 7:8-9 | ප්‍රශ්න කිරීම |

ඉශ්රායෙලය ගැන අපට ඇත්තේ කෙතරම් කනගාටුදායක පින්තූරයක්ද? ඔව්හු තවදුරටත් දෙවියන්වහන්සේ උදෙසා පෙලඹුනු හා සන්නද්ධ වූ බලවේගයක් නොවේ. ඔව්හු අධෛර්යයට පත් නායකයෙකු සහිත, ප්‍රශ්න අසන, බියගුලු හා සතුරා ඉදිරියෙන් පලායන අධෛර්යයට පත් සෙනඟක් වෙති.

දෙවියන්වහන්සේගේ ප්‍රතිපත්ති කඩකිරීම්, උඩඟුකම, මාංසික අවබෝධය හා යාච්ඤා රහිතභාවය සැමවිටම ඔබ සතුරා ඉදිරියේ පරාජය කෙරේ. එහෙත් අවසාන ප්‍රතිඵලය දෙස වර්තමාන තාවකාලික පරාජය පදනම් කරගෙන නොබලන්න. අසාර්ථකවීම් සඳහා සැමවිටම හේතු හා ප්‍රතිඵල ඇත්තා සේම පිළියම්ද ඇත.

## පිළියම:

සැම අසාර්ථකවීමකටම පිළියමක් තිබේ. ඔබගේ සතුරා වූ සාතන් ඔබ සිරකරුවෙකු බවට පත් කර ගත්තත් එයින් ඔබට මිදෙන්නට හැකිය.

> **ඔහුගේ මලපතෙන් මිදෙන පිණිසද, දෙවියන්වහන්සේ ඔවුන්ට පසුතැවිල්ල දෙනසේක්දෝයි බලමින් මෘදුකමින් ඔවුන්ට තරවටුකරන්ට ඕනෑය. (2 තිමෝති 2:26)**

ඔබ පරාජය තුළ සිටින විට, ඔබ සිටින්නේ සතුරාගේ කැමැත්ත පරිදි වේ. දෙවියන්වහන්සේ ඔබට මිදෙන්නට උපකාර කරනු ඇත. එහෙත් ඔබ මිදීම පිළිබඳ බයිබලයේ මූලධර්ම අනුගමනය

කරමින්, “ඔබම මිදෙන්නට” පියවර ගත යුතුවේ. යෝෂුවා 7:10-13 කියවන්න. මෙම කොටසේ, ඔබ සතුරාගෙන් පරාජය වූ විට මිදීම ලැබීමට භාවිත කළ හැකි පියවර සතරක් ඇත.

**1. එළිදරව්ව**

> **“ඉශ්රායෙල්වරුන් පව් කර ඇතැයි . . . සමිඳාණන්වහන්සේ කීසේක”_(යෝෂුවා 7:10-11 න් කොටස** නව අනුවාදය)

මිදීම ලැබීමේ පළමු පියවර වන්නේ, ගැටලුව පිළිබඳ නිවැරදි එළිදරව්වකි. යෝෂුවා යාච්ඤා කිරීමට පටන්ගත් විට ඉශ්රායෙල්වරුන් පව් කර ඇති බව දෙවියන්වහන්සේ ඔහුට එළිදරව් කළ සේක.
ඔබ හා ජයග්‍රහණය අතර ද ඔබ සන්නද්ධවීම හා සන්නද්ධකරුවෙකු වීම අතර ද ඇති “විනාශකාරී දෙය” එළිදරව් කිරීමට දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

පෞද්ගලික පාපය මුළු සාමුහික මණ්ඩලයටම බලපාන බව දැනගැනීම වැදගත් වේ. දෙවියන්වහන්සේ යෝෂුවාට පැවසුවේ (“ඔවුන්”) ඉශ්රායෙල්වරුන් (ආකාන් පමණක් නොවේ) පව්කර ඇති බවය (යෝෂුවා 7:11).

සභාවේ ඇති ගැටලු අපි ඉතා ඉක්මනින්ම දකිමු. එහෙත් මේ ගැටලු සඳහා මුල් වූ පෞද්ගලිකව තමාගේ භූමිකාව බොහෝ විට අපි අමතක කරමු. සෑම ඇදහිලිවන්තයෙකුම ක්‍රිස්තුන්වහන්සේගේ සාමුහික ශරීරයේ කොටසක් වේ. එක් සාමාජිකයෙකුගේ පාපය මුළු ශරීරයේම ක්‍රියාකාරීත්වය හා සන්නද්ධ වීම කෙරෙහි බලපායි.

**2. පසුතැවිලිවීම:**

දෙවියන්වහන්සේ යෝෂුවාට ගැටලුව එළිදරව් කළ අතරම ඒ සඳහා කටයුතු කිරීමට ද පැවසූ සේක.

> **එවිට ස්වාමින්වහන්සේ යෝෂුවාට කථාකොට: නැගිටියන්න. මක්නිසා මෙසේ මුහුණින් වැතිර ඉන්නෙහිද? (යෝෂුවා 7:10)**

සතුරාගේ උගුලෙන් ගැලවීමට ගැටලුව එළිදරව් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඔබ නැගිට එම ගැටලුව ගැන කටයුතු කළ යුතුය. දෙවියන්වහන්සේ ඔබට එළිදරව් කළ දේ අනුව යාච්ඤාව නවත්වා ක්‍රියා කිරීමට අවස්ථාවක් එළඹේ.

සෙනඟ එක්රැස් කර ඔවුන් මධ්‍යයේ පාපය පිළිබඳව කටයුතු කරන මෙන් දෙවියන්වහන්සේ යෝෂුවාට පැවසූ සේක. ඔබ සතුරාගේ උගුලෙන් ගැලවෙන්නට නම් ගැටලුවට මුහුණ දිය යුතුය. යෝෂුවා කීකරුවීමට ප්‍රමාද වූයේ නැත. දෙවියන්වහන්සේගේ උපදෙස් අනුගමනය කිරීම සඳහා යෝෂුවා “අලුයම නැගිටි” බව සඳහන් වේ (යෝෂුවා 7:16). පව්කරුවා ආකාන් බව දෙවියන්වහන්සේ එළිදරව් කළ විට, පාපී දේ ගෙන ඒමට යෝෂුවා මිනිසුන් යැවූ විට ඔව්හු “දිවගොස්” ඒවා කූඩාරමින් ගෙන ආහ. අප මධ්‍යයේ ඇති පාප සමග කටයුතු කිරීමට අප ඉක්මන් විය යුතු වේ. ප්‍රමාදවීම අකීකරුවීමකි. එහෙත් . . .

> **අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක.** (1 යොහන් 1:9)

**3. ප්‍රතිස්ථාපනය:**

පසුතැවිලිවීමෙන් පසු ඊළඟ පියවර පුනරුත්ථාපනය වේ. ආයි නගරය පරාජය කිරීමෙන් පසු විනාශකාරී දේ ගැන කටයුතු කළ අතර ආකාන්ගේ මුළු පවුලටම දඬුවම් කෙරිණි. ආකෝර් මිටියාවතේදී ඔවුහු ගල් ගසා මරනු ලැබූහ. දෙවියන්වහන්සේගේ සෙනඟට ශුද්ධවන්තකම නැවත ලැබිණි. ප්‍රතිපත්ති කඩ කිරීමෙන්, මාංසික අවබෝධයෙන්, උඩඟුකමින් හා යාච්ඤා රහිතභාවයෙන් සිදුවූ වෙන්වීම නිවැරදි කෙරිණි.

ඔබගේ පරාජයට හේතුව දෙවියන්වහන්සේ එළිදරව් කළ විට හා ඒ ගැන පසුතැවිලිවූ පසු ඔබ ඒ සඳහා වන්දි ගෙවිය යුතුය. “විනාශකාරී දෙය” ඔබගේ ජීවිතයෙන් ඉවත් කළ යුතුය. ඔබ අන්

අයට කමාව දිය යුතුය නැතහොත් කමාව ඉල්ලිය යුතුය. ඔබගේ අකිකරුවීමෙන් ඇතිවූ පාපී අවස්ථාවක් නිවැරදි කරගැනීමට ද සිදුවිය හැකිය.

**4. ආපසු පැමිණීම:**

පාපය නිසා දෙවියන්වහන්සේ සමග ඇති සබඳතාව බිඳුණු විට ප්‍රකෘති ස්වභාවය නැවත ඇති වන්නේ වෙන්වූ ස්ථානයට නැවත පැමිණීමෙන් හා සතුරා ජය ගැනීමෙනි. දෙවියන්වහන්සේ සමග යන ඔබගේ ගමන අලුත් කළ යුතුය. ඔබගේ පරාජය සමග කටයුතු කිරීමට ඔබ සටන් භූමියට නැවත පැමිණිය යුතුය. එබැවින් පාපය එළිදරව් වීම, පසුතැවිලිවීම හා ප්‍රතිස්ථාපනයෙන් පසු ඉශ්රායෙල්වරුන්ට දෙවියන්වහන්සේගේ උපදෙස් වූයේ "ආයි නගරයට යන්න" වේ.

සතුරා සමග ගිවිසුමක් හා උදාසීන බවක් තිබිය නොහැකිය. ඔබ අසාර්ථකවූ විට සතුරා ඔබට පරාජයේ වචන කතා කරනු ඇත.

- "ඔබ මෙය අත්හරින්න" - "අන් අය ඔබ කෙරෙහි තිබූ විශ්වාසය නැතිවී තිබේ"
- "දෙවියන්වහන්සේ ඔබ ගැන සලකන්නේ නැත, නැතහොත් උන්වහන්සේ ඔබට උපකාර කරනවා ඇත".
- "ඔබ දුර්වල කෙනෙකි. ඔබට කිසිවක් කිරීමට නොහැකිය".
- "නැවත උත්සාහ කළ ද ඔබ පරාජය වේ".

එහෙත් ඔබ සටන් භූමියට ආපසු යා යුතුය. ඔබ සතුරාට මුහුණ දී ජයග්‍රහණය කළ යුතුය. ඔබ පැරදුනු ස්ථානය වන "ආයි නගරය" නැවත ජයග්‍රහණය නොකළ හොත් අනෙකුත් සටන් කිරීමට ඔබට නුපුළුවන. ඉශ්රායෙල්වරුන්ගේ ආපසු පැමිණීම හා ජයග්‍රහණය ගැන යෝෂුවා 8 පරිච්ඡේදයෙන් කියවන්න. යෝෂුවා ඉශ්රායෙල්හි සියලු රණශූරයන් සහභාගි කරගත් අවස්ථාව මෙය බව සලකන්න.

**සාරාංශය:**

ප්‍රකෘති ස්වභාවය නැවත ලබාගැනීම සඳහා බයිබලීය පිළියම මෙසේ වේ.

- එළිදරව්වීම
- පසුතැවිලි වීම
- ප්‍රතිස්ථාපනය
- ආපසු පැමිණීම

## බලාපොරොත්තුවේ දොරටුව

ප්‍රකෘති ස්වභාවයට නැවත පත්වීම සඳහා ඔබ දෙවියන්වහන්සේගේ පිළියම් අනුගමනය කරන විට, උන්වහන්සේ ඔබගේ ආකෝර් මිටියාවත (කරදර) රැගෙන එය බලාපොරොත්තුවේ දොරටුවකට හරවන සේක.

> **"ආකෝර් නම් අවසාන නිම්නය වාසනා දොරටුවක් බවට පමුණුවන්නෙමි" (හොසියා 2:15 - නව අනුවාදය)**

7 පරිච්ඡේදය ආරම්භ වන්නේ සෙනඟට විරුද්ධව සමිඳාණන්වහන්සේගේ කෝපය ඇවිලීමේ අඳුරු පින්තූරයෙනි. එහෙත් 8 පරිච්ඡේදයෙන් අපට නැවතත් ඉශ්රායෙල්වරුන් ජයග්‍රහණය සඳහා සන්නද්ධ කර ඇති ආකාරය දක්නට ලැබේ.

| | |
|---|---|
| යෝෂුවා 8:3-8 | දෙවියන්වහන්සේ උපක්‍රමයක් දුන් සේක. |
| යෝෂුවා 8: 7, 18 | ජයග්‍රහණය සහතික කෙරිණි. |
| යෝෂුවා 8:10-29 | නායකයා හා සෙනඟ කීකරුකමින් හා ඇදහිල්ලෙන් යුක්තව ක්‍රියා කළහ. |
| යෝෂුවා 8:20 | සතුරාට පලා යන්නට නොහැකි විය. |
| යෝෂුවා 8:22-26 | සතුරා සම්පූර්ණයෙන්ම විනාශ කෙරිණි |
| යෝෂුවා 8:30-35 | දෙවියන්වහන්සේට මහිමය ලැබිණි. |

යෝෂුවා 9:2 ඉතිරි වී සිටි සතුරන් දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ සෙනඟ ගැන බිය වූහ.

ඔබ මෙම පිළියම, ප්‍රකෘතිමත්වීමට යොදා ගන්නෙහි නම්, දෙවියන්වහන්සේ ඔබගේම ආකෝර් මිටියාවත, බලාපොරොත්තුවේ දොරටුවක් බවට හරවන අයුරු ද ඔබට දැකගත හැකිවනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. ආයි නගරයේදී ඉශ්රායෙල්වරුන් පරාජයවීමට හේතු හතරක් හඳුනාගන්න.

3. ආයි නගරයේදී ඉශ්රායෙල්වරුන්ගේ පරාජයේ ප්‍රතිඵල සාරාංශ කරන්න

4. ප්‍රකෘතිවීම සඳහා ගත් පිළියම් පියවර හතරක් මගින් ලයිස්තුගත කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ආයි නගරයේදී ඉශ්‍රායෙල්වරුන් පරාජයවීමට හේතු මෙම ක්ෂේත්‍රවල වේ.
   - ප්‍රතිපත්ති
   - උඩඟුකම
   - අවබෝධය
   - යාච්ඤා රහිත බව

   ඔබ මුහුණ දී ඇති සමහර ආත්මික පරාජයන් ගැන සිතන්න. ඉන් කවරක් මේ මූලික ගැටලු එකක් හෝ වැඩි ගණනක් නිසා ඇතිවූයේද?

2. යෝෂුවා හා දෙවියන්වහන්සේ අතර සංවාදය වඩාත් විස්තර සහිතව අධ්‍යයනය කරන්න.

   - ප්‍රශ්නය 7:7අ
   - ප්‍රකාශය 7:7ආ
   - ප්‍රශ්නය 7:8
   - ප්‍රකාශය 7:9අ
   - ප්‍රශ්නය 7:9ආ

   යෝෂුවාගේ ප්‍රශ්නකිරීම්වල මහත් අඩුපාඩුවක් තිබේ. ඔහු ඉශ්‍රායෙල්වරුන්ගේ පරාජයට හේතු අසන්නේ නැත. යෝෂුවා දෙවියන්වහන්සේගෙන් ඇසූ මෙම ප්‍රශ්නය බලන්න.

   **"ඔබේ ගරු නාමය රැකීමට ඔබ කුමක් කරන සේක්ද?" (යෝෂුවා 7:9** නව අනුවාදය)

   ඔබ අත්දකින සෑම පරාජයක්ම සමිඳුණන්වහන්සේගේ නාමයට බලපාන බව මතක තබා ගන්න.

3. ඔබගේ අතීත ආත්මික පරාජයන් විශ්ලේෂණය කරන්න. ඒවායේ ප්‍රතිඵල ඉශ්‍රායෙල්වරුන් අත්දුටු අත්දැකීම්වලට සමානද?

| | |
|---|---|
| යෝෂුවා 7:4 | සතුරා ඉදිරියේ පලායෑම |
| යෝෂුවා 7:5 | ආත්මික මරණය |
| යෝෂුවා 7:5 | සෙනඟගේ බිය හා අධෛර්යට පත්වීම |
| යෝෂුවා 7:6 | නායකත්වය අධෛර්යට පත්වීම |
| යෝෂුවා 7:7 | "පැරණි යහපත් දවස්" දෙස ආපසු හැරී බැලීම |
| යෝෂුවා 7:8-9 | ප්‍රශ්න කිරීම |

4. ආයිහි පරාජයෙන් පසු යාච්ඤා නොකිරීම හා ස්වභාවික අවබෝධයට අනුව විවිධ දේ දෙස බැලීම පිළිබඳව යෝෂුවා පාඩමක් ඉගෙන ගන්නට ඇතැයි ඔබ සිතනු ඇත. ගිබියොන්වරුන් පිළිබඳ කතාව නැවත මතක් කරන යෝෂුවා 9 පරිච්ඡේදය කියවන්න. යෝෂුවා සතුරාගේ එම උගුලට නැවත අසුවනු ඔබට පෙනෙනු ඇත. ඔහු ඒ අවස්ථාව දෙස බලන්නේ ඔහුගේ ස්වාභාවික අවබෝධයෙනි. එමෙන්ම යාච්ඤා කිරීමට පෙර ක්‍රියා කරයි.

   ඔබ පරාජයක් අත්දුටු විට ඔබ ඉන් ප්‍රකෘතිමත් විය යුතු අතරම නැවතත් එම ප්‍රහාරයටම ගොදුරු නොවීම පිණිස ඉන් ඉගෙන ගැනීම ද අවශ්‍යය.

5. ආකාන්ගේ මුළු පවුලම විනාශ කෙරුණේ මන්දැයි ඔබට සිතෙන්නට හැකිය. ආකාන්ගේ දුර්වලතාව ඔහුගේ මුළු පවුලටම පැතිරී තිබූ බව දෙවියන්වහන්සේ දුටු සේක. පියාගේ පව් තුන්වන හතරවන දරු පරපුර දක්වා යා හැකි බව බයිබලය පෙන්වා දෙයි (නික්ම. 20:15, 34:7, ද්වි. 5:9 බලන්න).

   එහෙත් බිය නොවන්න. ඔබගේ දෙමව්පියන්ගේ හා ඔවුන්ගේ දෙමව්පියන්ගේ පාප, ඔබ කෙරෙහි බලපෑ යුතු නැත. මන්ද යේසුස්වහන්සේගේ කුරුසියේ මරණයෙන් පරම්පරාගත පාපයන්ගේ ශාපය බිඳ දමා ඇත. මරණයේ දේවදූතයා මිසරය හරහා යන විට බැටළුවෙකුගේ රුධිරය තැවරූ ආකාරයට යේසුස්වහන්සේගේ රුධිරය ඔබගේ ජීවිතයේ තැවරීමෙන් මෙය සිදුවේ.

# දහ අටවන පරිච්ඡේදය

## තෙනුවරක කතන්දරය

### අරමුණු:

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ඔබගේ ජීවිතයේ ආත්මික යෝධයන් පරාජය කිරීම වැදගත්වන්නේ මන්දැයි පැහැදිලි කිරීමට
- "යෝධයන් කිහිප දෙනෙකු" ඉතිරිව සිටි නගර තුනක් හඳුනාගැනීමට
- මෙම නගර තුනේ යෝධයන් තබා යෑමේ ප්‍රතිඵල පැහැදිලි කිරීමට
- ආත්මික යෝධයන් මැරීමේ ශිල්පීය ක්‍රම හතක් ලයිස්තුගත කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ දේශයෙහි අනාක්වරුන් එක්කෙනෙක්වත් ඉතුරු නොවීය. ගාසාහිද ගාත්හිද අෂ්දොද්හි ද පමණක් ඔව්හු ඉතුරුව සිටියෝය. (යෝෂුවා 11:22)**

### හැඳින්වීම

ඉශ්‍රායෙල්වරු කානාන් දේශයට ඇතුළු වූ විට එහි යෝධයන් සිටින බව ඔව්හු දුටුවෝය.

> **එහි යෝධයන්ගෙන් පැවත එන අනාක්ගේ පුත්‍රයන් වන යෝධයන් දුටිමුව. අප පළඟැටියන් මෙන් අපටම පෙනුණේය. එසේම ඔවුන්ටත් අප පෙනුණේයයි කීවෝය. (ගණන් කථාව 13:33)**

ආත්මිකව කතා කරන විට "යෝධයන්" ගෙන් පෙන්නුම් කෙරෙන්නේ ඔබ ජීවිතයේ මුහුණ දෙන මහත් අසීරුතාවන් වේ. ඔබට ඔබගේ පවුලේත්, සභාවේත්, සමාජ ජීවිතයේත්, සේවයේත්, රැකියාවේත් හා ඔබගේම සිතෙත් "යෝධ" ගැටලුවලට මුහුණ පෑමට සිදුවිය හැකිය.

ඔබට යෝධයන් හමුවන්නේ ඔබ යුතුකම් ඉටුකරන විටදී වේ. ඉශ්‍රායෙල්වරුන් ඉදිරියට යන විට යෝධයන් මුණගැසුණි. ඔවුන් පාළුකරය දෙසට ආපසු හැරුණු විට එක් යෝධයෙකු හෝ සිටියේ නැත. ඔබගේ ජීවිතයේ හා සේවයේ ඔබට "යෝධ" ගැටලුවලට මුහුණ දීමට සිදුවන්නේ නම් එහි ශුභ ආරංචිය ඔබ දෙවියන්වහන්සේ තුළ ඉදිරියට යන බවය. ඔබ ඔබගේ කානාන් දේශයේ සීමාවේ සිටින අතර දෙවියන්වහන්සේගේ පොරොන්දු ලබාගැනීමට ඉදිරියට යමින් සිටී. සන්නද්ධ කළ සෙනඟට යෝධයන් මුණ ගැසේ.

### යෝධයන් විනාශ කිරීම

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට පැවසුවේ යෝධයන් ඇතුළුව කානාන් දේශයේ සිටින සියලුම දෙනා විනාශකරන ලෙසය. එහෙත් ඉශ්‍රායෙල්වරු අනතුරු ඇඟවීම නොසලකා හැරියහ.

> **"නුඹලා මාගේ හඬට ඇහුම්කන් නුදුන්නහුය. එබැවින් . . . ඔව්හු නුඹලාගේ ඇලපත්වලට කටු මෙන් වන්නෝය. ඔවුන්ගේ දෙවිවරු නුඹලාට මළපතක්ව සිටින්නෝය" (විනිශ්චයකාරයා 2:2-3).**

ඉශ්‍රායෙල්වරු කානාන් දේශයේ විශාල ප්‍රදේශයක් අල්ලාගත්හ. එහෙත් ඔව්හු නගර තුනක "යෝධයින් ස්වල්පයක්" ඉතිරි කළෝය. මෙම පාඩමෙන් මතක් කර දෙන්නේ ඒවා "තෙනුවර කතන්දරය" හා මෙම යෝධයන් ඉශ්‍රායෙල්වරුන්ට "කටු හා මලපත්" වූ ආකාරය වේ. ඔබගේ ජීවිතයේ යෝධයන් ඉවත් නොකළහොත් ඔව්හු ඔබගේ ආත්මික අත්දැකීම්වල "කටු හා මලපත්" වන්නාහ. මේ හේතුව නිසා මෙම පාඩමෙන්, ඔබගේම ජීවිතයේ යෝධයන් පරාජය කළ හැකි "යක්ෂයන් ඝාතනය කිරීමේ ශිල්පීය ක්‍රම" පැහැදිලි කෙරේ.

## තෙනුවර කතන්දරය

**ඉශ්රායෙල් පුත්‍රයන්ගේ දේශයෙහි අනාක්වරුන් එක්කෙනෙක්වත් ඉතුරු නොවීය. ගාසාහිද ගාත්හිද අෂ්දොද්හි ද පමණක් ඔව්හු ඉතුරුව සිටියෝය. (යෝෂුවා 11:22)**

නැවති සිටීමට අවසර ලද අනානිවරු යෝධයෝ වෙති. විනාශ කිරීමට දෙවියන්වහන්සේ අණ කළ කානානිවරුන් අතර ඔව්හු ද සිටියහ. ගාසාහි ද ගාත්හි ද අෂ්දොද් ද මෙම "යෝධයන් ස්වල්පදෙනාට" සිටීමට ඉශ්රායෙල්වරු ඉඩ දුන්හ. පසුව ඉශ්රායෙල්වරුන්ට කරදර පැමිණියේ මේ පෙදෙස්වලින් වන අතර අපගේ "තෙනුවර කතන්දරයද" මේ පෙදෙස් පිළිබඳව වේ.

### ගාසා

විනිශ්චයකාරයන්ගේ පොත (වීරාවලිය) 16 කියවන්න. දෙවියන්වහන්සේගේ මිනිසෙකු වූ සම්සොන් කරදරයට පත්වූයේ ගාසා වෙහිදී වේ. යෝධයන් නොමරා ඉතිරි කළ නගරයක සම්මොන්ට දෙලීලා හමුවූ අතර අවසානයේ ඔහුගේ ජීවිතයත්, සේවයත් විනාශ විය. ඔබ ස්වාමින්වහන්සේ මත කෙතරම් ශක්තිමත්ව සිටියත් යටත්කර නොගත් යෝධයන්ට ජීවත්වීමට ඉඩ දුන්නහොත් ඔවුන්ට ඔබගේ ජීවිතයත් සේවයත් විනාශ කිරීමට පුළුවන.

### අෂ්දොද්

ඉශ්රායෙල් වෙතින් දෙවියන්වහන්සේගේ තේජාලංකාරය ඉවත්වීම පිළිබඳව ඔබ 1 සාමුවෙල් 4-5න් අධ්‍යයනය කරද්දී අෂ්දෝද් නගරය පිළිබඳව ද ඉගෙන ගත්තෙහිය. දෙවියන්වහන්සේගේ වැඩසිටීම හා මහිමයේ සංකේතය වන ගිවිසුම් කරඬුව පිලිස්තිවරුන් අතට පත්වූ එක් නගරයක් අෂ්දොද් බව ඔබට මතක ඇත. ඉශ්රායෙල්වරුන් "යෝධයන් ස්වල්පදෙනෙකු" ඉතිරි කළේ මෙම නගරයෙහිම වේ. යටත්කර නොගත් යෝධයන් දෙවියන්වහන්සේගේ වැඩසිටීම හා මහිමය ඔබගෙන් සොරා ගන්නවා ඇත.

### ගාත්

යෝධයන් ඉතිරි කිරීමේ එක් වරදක් වන්නේ "යෝධයන් යෝධයන්ව ඉපදවීම" වේ. ගොලියත් නම්වූ යෝධයෙක් දෙවියන්වහන්සේගේ මිනිසුන් ප්‍රාණ ඇපකරුවන් ලෙස තබාගත් බව 1 සාමුවෙල් 17 හි සඳහන් වේ. ගොලියත් ඉශ්රායෙල්වරුන් "යෝධයන් ස්වල්ප දෙනෙකු" ඉතිරි කළ ගාත් නගරයේ කෙනෙකි.

ආරම්භයේදීම සියලුම යෝධයන් යෝෂුවා විනාශ කළේ නම් ඉශ්රායෙල් සෙනගට මෙම ගැටලුවට මුහුණ දීමට සිදු නොවනු ඇත. එහෙත් මෙහිදී අපට දැකගත හැකිවන්නේ දිනක් පාසා දිනක් ගොලියත් කඳවුරෙන් එළියට විත් අපහාස කරන විට ඉශ්රායෙල් හමුදාව බියෙන් සැඟවී සිටි ආකාරය වේ. ඉශ්රායෙල්වරු යුද්ධය සඳහා සැරසී සිටියහ (1 සාමුවෙල් 17:2). ඔවුන්ට යුද්ධ කිරීමට යුද්ධායුධ තිබිණි. එහෙත් ඔව්හු යෝධයා නිසා තැතිගෙන බොහෝ සේ බියපත්ව සිටියහ (1 සාමුවෙල් 17:11).

ඔබගේ ජීවිතයේ යටත් නොකළ යෝධයෝ තවත් යෝධයන් බිහි කරති. මේ යෝධයන් ඔබට අපහාස කිරීමට පැමිණෙන අතර අවසානයේ ඔබ බියෙන් ප්‍රාණ ඇපකරුවෙක් වන්නෙහිය. ඔබ සටන් බිමට ගොස් යෝධයාට මුහුණ නුදුන්නහොත් ඔබට ආත්මික යුද්ධායුධ තිබුණ ද ආත්මික යුද්ධයට පුහුණුව සිටිය ද ඔබ තැතිගෙන අක්‍රිය වනු ඇත.

## යෝධයන් මැරීමේ ශිල්පීය ක්‍රම

යම්කිසි කෙනෙකු යෝධයාට මුහුණ දීමට තිබුනි. දෙවියන්වහන්සේ දාවිත් නම් තරුණයෙකු මේ සඳහා භාවිත කළ සේක. ඔහු මත උන්වහන්සේගේ ආත්මය හා ආලේපය තිබිණි. දාවිත් විසින් මේ ස්වාභාවික යුද්ධයේදී භාවිත කළ "යෝධයන් මැරීමේ ශිල්පීය ක්‍රමය" ඔබගේ ජීවිතයේ ඔබ යෝධයන්ට මුහුණ දෙන විට ආත්මිකව යොදා ගත හැකිය.

## පළමුව: සූදානම්වන්න:

ජීවිතයේ යෝධයන්ට මුහුණදීම සඳහා, සූදානම් විය යුත්තේ සුළු සටන්වලට මුහුණ දීමෙනි. දාවිත්ද ඔහු බැටළුවන් රැකබලා ගනිද්දී උන් අල්ලාගන්නට පැමිණි සිංහයන් හා වලසුන් සමග සටන් කළ ආකාරය සිහිපත් කළේය (1 සාමුවෙල් 17:34-36). ඔහු ජීවිතයේ "සුළු සටන්වලින්" පුහුණුව ලබා ඇති නිසා මේ යෝධයාට මුහුණ දීමට හැකි බව ඔහුට හැඟිණි.

ඔබ යෝධයාට මුහුණ දීමට තීරණය කළ විට අන් අයගෙන් එන ප්‍රහාරවලට සූදානම්වන්න. බියෙන් ගමන් කරන අය ඇදහිල්ලෙන් ගමන් කරන්නන්ට සැමවිටම අභියෝග එල්ල කරන බව මතක තබාගන්න. දාවිත්ට ඔහුට ඉතා සමීපව සිටි අයගෙන්, ඔහුගේම පවුලෙන් ප්‍රහාර එල්ල විය (1 සාමුවෙල් 17:28). නායකත්වයෙන් ද ඔහුට ප්‍රහාර එල්ල විය (1 සාමුවෙල් 17:33). එමෙන්ම යෝධයා ඔහුට සමච්චල් කළේය (1 සාමුවෙල් 17:44).

ඔබගේ ජීවිතයේ යෝධයන්ට මුහුණ දීමට ඔබ සූදානම් වන විට, ඔබට සමීපතම අයගෙන්, ඔබගේම පවුලේ අය ඇතුළුව, ඔබට පහර දිය හැකිය. එය කළ නොහැකි බව නායකත්වය වුවද පැවසිය හැකිය. යෝධයන්ම ඔබට සමච්චල් කරනු ඇත. එහෙත් ජීවිතයේ සුළු සටන්වලින් ඔබ ආත්මිකව සූදානම්ව සිටින්නෙහි නම්, ඔබ ආත්ම විශ්වාසයෙන් යුතුව "මේ යෝධයා පරාජය කිරීමට මට පුළුවනි" යි ඔබ පවසනු ඇත.

## දෙවනුව : ප්‍රකාශ කරන්න:

දාවිත්ට නිවැරදි ප්‍රකාශයක් තිබිණි. ඔහු දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඔහුගේ විශ්වාසය මෙසේ ප්‍රකාශ කළේය. "සමිඳුණන්වහන්සේගේ නාමයෙන් මේ යෝධයා පරාජය කළ හැකි බව මම දනිමි" (1 සාමුවෙල් 17:26, 32, 37 හා 45-46 බලන්න).

## තෙවනුව: ඔප්පු කරන්න.

1 සාමුවෙල් 17:38-40 කියවන්න. යෝධයන් ඝාතනය කිරීම සාර්ථක වීමට නම් ඔබ ඔබගේ යුද්ධායුධ ඔප්පු කර තිබිය යුතුය. සාවුල් තමාගේම යුද්ධ ඇඳුම් දාවිත්ට ඇන්දවීමට උත්සාහ කළේය. එහෙත් සාවුල්ගේ යුද්ධ ඇඳුම් පාවිච්චි කිරීමට දාවිත් ඔප්පු කර නොතිබුනි. ඔබට අන් අයගේ බලය හෝ අත්දැකීම් හෝ මත යෝධයන් පරාජය කළ නොහැකිය. ඔබ එපීස 6 සඳහන් දෙවියන්වහන්සේගේ සම්පූර්ණ යුද ඇඳුම පැළඳිය යුතු අතර ඔබ විසින්ම එය ඔප්පු කළ යුතුය. දෛනික ජීවිතයේ ගැටලු හා අභියෝගවලට මුහුණ දීමට ඔබ දෙවියන්වහන්සේගේ යුද ඇඳුම් භාවිත කරන විට, ඔබ එය "ඔප්පු" කරන්නෙහිය. සැබෑ මහා යෝධයන් හමුවන විට ඔබ සූදානම්ය.

## සතරවෙනුව: සතුරා වෙතට යන්න

පිලිස්තියයා නැගිට දාවිත් හමුවීමට පැමිණි විට දාවිත් විගසින් පිලිස්තියයා හමුවීමට සේනාව දෙසට දුව ගියේය (1 සාමුවෙල් 17:48). ඔබගේ සූදානම්වීම යහපත් විය හැකිය. ඔබගේ යුද ඇඳුම් ඔබ ඔප්පු කර තිබෙන්නට හැකිය. ඔබට දෙවියන්වහන්සේ තුළ යහපත් ඇදහිල්ලක් තිබිය හැකිය. එහෙත් ඔබ යෝධයා වෙතින් පලා ගියහොත් ඔබට කිසිදා ඔහු අල්ලාගත නොහැකිය.

දාවිත් "දිවගියේ" යෝධයා වෙතටය. ඔබට සතුරා පරාජය කිරීමට අවශ්‍ය නම් ඔබද එසේ කළ යුතුය. ඔබ සතුරාගේ ප්‍රදේශයට යා යුතුය. ඔබ කඳුපාමුල තර්ක කරමින්, එකඟතාවලට එමින් හෝ ඔබගේ නිරන්තර පරාජය ගැන සමාව අයදිමින් අක්‍රියව ඉඳගෙන සිටීමෙන් ජයග්‍රහණය කළ නොහැකිය.

කානාන් දේශයේ ඔත්තු බැලීමට චරපුරුෂයන් 12 දෙනා ආපසු පැමිණි විට, යෝෂුවා හා කාලෙබ් යෝධයන් ගැන පැවසුවේ "ඔව්හු අපට රොටි වෙති. . . අපි ඔවුන් කා දමමු" යනුවෙනි. ඉන් අදහස් වන්නේ "පරාජය කිරීමට යෝධයන් නොසිටියාක් මෙන් නොව යෝධයන් පරාජය කිරීමෙන් අපි ශක්තිමත් වන්නෙමු" වැන්නකි.

## පස්වෙනුව : නිවැරදි චේතනාව:

ඔබ ජීවිතයේ යෝධයන්ට මුහුණ දෙන විට, නිවැරදි චේතනාවක් ඇතිව මුහුණ දිය යුතුය.

> **අද දවසේ ස්වාමින්වහන්සේ තා මා අතට පාවා දෙන සේක. මම තට ගසා, තාගේ හිස කපාදමා, පිලිස්තිවරුන්ගේ සේනාවේ මළකඳන් අද දවසේ ආකාශයේ පක්ෂීන්ට ද පොළොවේ වන මෘගයන්ට ද දෙන්නෙමි. මෙසේ ඉශ්රායෙල් කෙරෙහි දෙවිකෙනෙක් ඉන්න බව පොළොවේ සියල්ලන්ට දැනගන්නවා ඇත. ස්වාමින්වහන්සේ කඩුවෙන් හා හෙල්ලයෙන් නොගළවන බව මේ මුළු සමූහයාත් දැනගන්නවා ඇත. මක්නිසාද යුද්ධය ස්වාමින්වහන්සේගේය. උන්වහන්සේද නුඹලා අප අතට පාවාදෙනසේකැයි පිලිස්තියයාට කීවේය. (1 සාමුවෙල් 17:46-47)**

දාවිත්ගේ චේතනාව වූයේ තමාටම මහිමය ලබා ගැනීම හෝ තමා කෙතරම් ශක්තිමත්දැයි පෙන්වීම හෝ නොවේ. ඔහුගේ චේතනාව දෙවියන්වහන්සේට මහිමය ගෙන ඒමය.

## සය වෙනුව: පරිපූර්ණ රටාව:

දාවිත්ගේ ජයග්‍රහණය සඳහා දෙවියන්වහන්සේට පරිපූර්ණ රටාවක් තිබිණි. එය ගල් පටියක් හා සිනිඳු ගල් පහකි. ඉන් පළමුවැන්නම ඉලක්කයට වැදී යෝධයා මුණින්තළා බිමට වැටිණි. ඔබගේ යෝධයා දෙවියන්වහන්සේගේ සතුරා වන අතර ඔබ සටන් කළ යුත්තේ උන්වහන්සේගේ යුද්ධායුධවලිනි. එපීස 6 හි විස්තර කර ඇති යුද්ධායුධ යෝධයන් පරාජය කළ ගල් පහ මෙන් නොපෙනුණ ද ඒවායින් කාර්යය ඉටු වන්නේය. ඔබට ආත්මික යෝධයන් සමග ස්වාභාවික, මාංසික යුද්ධායුධවලින් සටන් කළ නොහැකිය. ඔබ දෙවියන්වහන්සේගේ පරිපූර්ණ රටාව අනුගමනය කළ යුතුය.

## සත්වැන්න: බල පැවත්වීම:

ඔබ යෝධයා මත පැවතිය යුතුය. මින් අදහස් වන්නේ ඔහුව සම්පූර්ණයෙන්ම විනාශ කළ යුතු බව වේ. දාවිත් විද්ද ගලෙන් යෝධයා වැටුණු විට, ඔහු දුවගොස් යෝධයාගේම කඩුව ගෙන ඉන් ඔහුගේ හිස ගසා දැමුවේය.

ඔබ දෙවියන්වහන්සේගේ ක්‍රමය අනුව සටන් කරන විට, සතුරා පරාජය කිරීමට ඔහු තර්ජනය කළ දෙයම භාවිත කරනු ඇත. එහෙත්, මෙම තෙනුවර කතාවේදී මෙන් ඔබ සම්පූර්ණයෙන්ම යෝධයා විනාශ යුතුය. නැතහොත් ඔහු ආපසු පැමිණ ඔබට කරදර දෙනු ඇත.

## සාරාංශය

යෝධයන් පරාජය කිරීම සඳහා ඔබ

- නියමාකාරයෙන් සූදානම් වන්න.
- දෙවියන්වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය ප්‍රකාශ කරන්න.
- ඔබගේ ආත්මික යුද ඇඳුම් ඔප්පු කරන්න.
- යෝධයාගේ ප්‍රදේශයට යන්න
- නිවැරදි චේතනාවක් තබාගන්න
- පරිපූර්ණ රටාවක් අනුගමනය කරන්න
- සතුරා සම්පූර්ණයෙන් විනාශ කරන්න.

දෙවියන්වහන්සේගේ සෙනඟ සන්නද්ධ කිරීම යෝධයෝ වළක්වති. ඔවුන් පරාජය කළ යුතුය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. යෝෂුවා "යෝධයන් ස්වල්ප දෙනෙකු" ඉතිරි කර ගියේ කුමන නගර තුනේද?

3. මේ එක් එක් නගරයේ යෝධයන් ස්වල්ප දෙනෙකු ඉතිරි කිරීමේ ප්‍රතිඵලය කුමක් විණිද?

4. ඔබගේ ජීවිතයේ පරාජය නොකළ යෝධයන් ඉතිරි කළහොත් කුමක් සිදුවේද?

5. මේ පාඩමේ සාකච්ඡා කළ යෝධයන් මැරීමේ ශිල්පීය ක්‍රම හත ලයිස්තු ගත කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

පරාජය නොකළ යෝධයන් ඔබගේ ජීවිතයේ සිටිත්ද? එසේ නම් ඒ කවුරුන්ද? ඔවුන් ලයිස්තුගත කරන්න.

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

"යෝධයන් මැරීමේ ශිල්පීය ක්‍රම" ඔබගේ ජීවිතයේ යෝධයන්ට යොදාගත හැකි ආකාරය ගැන සිතා බලන්න.

1. සූදානම් වන්න
2. ප්‍රකාශ කරන්න
3. ඔප්පු කරන්න
4. ප්‍රදේශයට යන්න
5. නිවැරදි චේතනාව
6. පරිපූර්ණ රටාව
7. විනාශ කිරීම

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

# දහ නවවන පරිච්ඡේදය

## දීමනා-පාදක කරගත් සන්නද්ධ කිරීම

### අරමුණු

මෙම පරිච්ජේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "දීමනා පාදක කරගත්" සන්නද්ධ කිරීම යනු කුමක්දැයි පැහැදිලි කිරීමට
- ආත්මික දීමනා පදනම් කරගෙන ඔබගේ සභාව සන්නද්ධ කිරීමට
- යම් පුද්ගලයෙකු නිවැරදි සේවයේ යෙදී ඇද්දැයි ඇගයීමක් භාවිතයෙන් එළිදරව් වන ආකාරය පැහැදිලි කිරීමට
- ආත්මික දීමනා භාවිත කිරීමට මූලික වන දෙය හඳුනාගැනීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**සහෝදරයෙනි, ආත්මික දීමනා ගැන නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමි. (1 කොරින්ති 12:1)**

### හැඳින්වීම

දේව සේවයේ වැඩ කටයුතුවලට සෙනඟ සන්නද්ධ කිරීමට අවශ්‍ය ආත්මික සාධක කෙරෙහි මෙම පාඨමාලාව අවධානය යොමු කර ඇත. මෙම අත්පොතේ පටුනට පෙරළා පරිච්ජේදවල මාතෘකා බලන්න. මේ සෑම පාඩමක්ම සන්නද්ධ කිරීමේ ක්‍රියාවලියේ කොටසකි. සන්නද්ධ කිරීමේ මෙම මූලධර්ම ඔබ අවබෝධ කරගෙන භාවිත කළහොත් ඔබට ඔබවත් ඔබ වටා සිටින අයත් සන්නද්ධ කිරීමට හැකිවනු ඇත.

*"සන්නද්ධ කිරීමේ ක්‍රමවේද"* සහිත මෙම පොතේ අවසාන පාඩම සලකා බලන්නේ "දීමනා පාදක කරගෙන සන්නද්ධ කිරීම" පිළිබඳව වේ. ඔබ අන් අයගේ නායකයෙකු නම් මේ පාඩම ඉතා වැදගත්ය. එය ආත්මිකව පොලඹවනු ලැබූ සෙනඟ කණ්ඩායමක් රැගෙන ඔවුන් දේව සේවයේ වැඩ කටයුතු සඳහා සන්නද්ධ කිරීම පිණිස ප්‍රායෝගික මාර්ග නිර්දේශයක් සපයයි.

### දීමනා පාදක කරගෙන සන්නද්ධ කිරීම

සභාවක් විවිධාකාරයෙන් සංවිධානය කළ හැකිය. එය නිකායක හෝ එම පෙදෙසේ නායකයන්ගේ හෝ අභිප්‍රායන්ට අනුකූලව සංවිධානය කළ හැකිය. එය පාලකවරයාට හෝ ආත්මික නායකයන්ට හෝ වඩාත් ඵලදායි යයි හැඟෙන ආකාරයට ද සංවිධානය කළ හැකිය. ඇතැම් සභාවන් කොහොමටවත් සංවිධානය වී නොමැත. ඒවා ව්‍යාකූල තත්වයක පවතී.

දෙවියන්වහන්සේගේ සැබෑ ඵලදායි බලවේගයක් වීම සඳහා, සභාවක් සංවිධානය විය යුත්තේ ආත්මික දීමනා පදනම් කරගෙන වේ. දේව සේවයේ වැඩ සඳහා ආත්මික දීමනා අප සන්නද්ධ කරයි. සෑම සාමූහික දේව සේවයක්ම සංවිධානය කර සන්නද්ධ කළ යුත්තේ දේව සේවයේ වැඩ සඳහා දී ඇති මෙම විශේෂ හැකියාවන් පදනම් කරගෙන වේ.

"දීමනා-පාදක කරගෙන සන්නද්ධ කිරීම" යනු සෙනඟ කණ්ඩායමක් ඔවුන්ගේ ආත්මික දීමනා පදනම් කරගෙන දේව සේවයේ වැඩ කටයුතු සඳහා සංවිධානය කිරීම වේ. මෙහි සංක්ෂිප්තව දක්වා ඇති ක්‍රියා පිළිවෙළ මූලිකවම සෙනඟට ඔවුන් කැඳවා ඇති හා සන්නද්ධ කර ඇති දේ කිරීමට මඟපෙන්වයි.

මෙහි ඉලක්කය කිසිවෙකු නැති තැනක පුරප්පාඩුවක් පිරවීම හෝ "සෙනඟ සම්බන්ධ කරගැනීම" හෝ නොවේ. එය ඇදහිලිවතුන් ඔවුන්ගේ ආත්මික දීමනා හා අත්දැකීම් වඩාත් හොඳින් සන්නද්ධ

කරන හා ඔවුන් කැඳවා ඇති සේවයට යාච්ඤාවෙන් යුක්තව මගපෙන්වීමකි. එහි ප්‍රතිඵලය වන්නේ දෙවියන්වහන්සේ සැලසුම් කර ඇති ආකාරයට මුළු කණ්ඩායමම (ශරීරය) එකට ක්‍රියා කිරීම වේ.

දීමනා-පාදක කරගෙන සන්නද්ධ කිරීමේ ප්‍රධාන පියවර තුනක් ඇත.

1. සෙනඟ, තම ආත්මික දීමනා සොයා ගන්නා පිණිස මගපෙන්විම.
2. දේව සේවයේ ඇති අවශ්‍යතා හඳුනාගැනීම
3. හඳුනාගත් අවශ්‍යතා වෙත ඊට අදාළ දීමනා ඇති අය සම්බන්ධ කිරීම

## පළමු පියවර - ආත්මික දීමනා සොයාගන්න

ආත්මික දීමනා සොයාගන්නා පිණිස ඔබ සෙනඟට මගපෙන්වීමට නම් ඔබට හා ඔබගේ අනුගාමිකයන්ට ආත්මික දීමනා ගැන දැනුමක් තිබිය යුතුය.

හාවස්ටයිම් ජාත්‍යන්තර ජාලය *"ශුද්ධාත්මයාණන්ගේ සේවය"* නමැති පාඨමාලාවක් සපයා ඇති අතර විවිධ ආත්මික දීමනා පිළිබඳව විස්තරාත්මක උපදෙස් එහි අඩංගු වේ. ඔබ යෝජනා ඇති ක්‍රම පිළිවෙළ අනුව මෙම පාඨමාලා කරන්නෙහි නම් දැනටමත් ඔබ එය අවසන් කර ඇත.

*"ශුද්ධාත්මයාණන්ගේ සේවය"* සෑම ආත්මික දීමනාවක්ම සාකච්ඡා කරන අතර ආත්මික දීමනා සොයා ගැනීමට සහාය වීමට විශ්ලේෂණයක් ද සපයයි. දීමනා පාදක කරගත් සන්නද්ධ කිරීම මත සංවිධානය කිරීමට උත්සාහ කිරීමට පෙර ඔබ *"ශුද්ධාත්මයාණන්ගේ සේවය"* පාඨමාලාව ලබාගෙන එය ඔබ සභාවේ ඉගැන්වීමට අපි යෝජනා කරමු (ඔබට මෙම පාඨමාලාව නොමැති නම් හා ලබා ගැනීමට ද නොහැකි නම් ආත්මික දීමනාවල කෙටි සාරාංශයක් මෙම පාඨමාලාවේ "උප ග්‍රන්ථයේ" ඇත).

මෙම අත්පොතේ උප ග්‍රන්ථයේ විස්තර කර ඇති ආත්මික දීමනා සොයා ගැනීමේ පියවර දහහතර තුළින් ඔබගේ සභාවේ සෑම සාමජික සාමාජිකාවක්ම යාච්ඤාවෙන් යුතුව ගෙන යන්න. පහත දැක්වෙන පියවර එහි අඩංගු වේ.

පළමු පියවර : නැවත - උත්පාදනය ලබාගන්න.
දෙවන පියවර : ශුද්ධාත්ම බව්තිස්මය ලබාගන්න.
තුන්වන පියවර : ආත්මික දීමනා දැන හඳුනාගන්න.
හතරවන පියවර : දීමනා ඇති අයගේ ආදර්ශයන් නිරීක්ෂණය කරන්න.
පස්වන පියවර : නිරාහාරව සිටීමෙන් හා යාච්ඤා කිරීමෙන් ආත්මික දීමනාවක් සොයන්න.
හයවන පියවර : ඔවුන් පිට අත තැබීමෙන් හා ඔවුන්ගේ දීමනා හෙළි කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටීම.
හත්වන පියවර : ඔබගේ ආත්මික ආශාවන් විශ්ලේෂණය කරන්න.
අටවෙනි පියවර : ඔවුන්ගේ ආත්මික නායකයා ලෙස ඔබ විසින් විශ්ලේෂණය කරනු ලැබීම.

නවවෙනි පියවර : ඔබගේ පසුගිය ක්‍රිස්තියානි සේවාවන් විශ්ලේෂණය කර බලන්න.
දහවන පියවර : *"ශුද්ධාත්මයාණන්ගේ සේවය"* නමැති හාවස්ටයිම් පාඨමාලාවේ සපයා ඇති ආත්මික දීමනා ප්‍රශ්නාවලිය සම්පූර්ණ කිරීම.

එකොළොස් වන පියවර : ඔබට තිබේයැයි ඔබ සිතන දීමනා හඳුනාගන්න.

දොළොස්වන පියවර : ඔවුන්ට සභාවේ ඇති සේවයේ ආත්මික අවශ්‍යතා පිළිබඳ ලයිස්තුවක් සැපයීම
දහතුන් වන පියවර : ඔවුන්ගේ ආත්මික දීමනා සභාවේ ආත්මික දීමනා හා සැසඳීමට උපකාර කිරීම

දහහතර වන පියවර : ඔබගේ සේවය අගැයීමට ලක්කර බලන්න.
ඔබගේ සභා සාමාජිකයන්ගේ ආත්මික දීමනා යාච්ඤාවෙන් යුතුව ඔබ විශ්ලේෂණය කළ පසු සාමාජිකයන්ගේ නම් හා ඒ සෑම කෙනෙකුගේම දෙවියන්වහන්සේ එළිදරව් කළ ආත්මික දීමනා ඇතුළත් ලයිස්තුවක් සකස් කරන්න. ඒ සඳහා මේ පාඩමේ "තවදුරටත් අධ්‍යයනය" සඳහා කොටසේ සපයා ඇති ආකෘතිය යොදාගන්න.

## දෙවැනි පියවර : සේවයේ අවශ්‍යතා හඳුනාගන්න.

දැන් ඔබ, ඔබ සභාවේ සේවයේ අවශ්‍යතා හඳුනාගත යුතුය. දැනට ඇති අවශ්‍යතා මොනවාද? ඔබ සභාවේ පුරවා නැති තනතුරු මොනවාද? ඔබ ආරම්භ කළ යුතු බවට ස්වාමීන්වහන්සේ බලාපොරොත්තු වන්නේ යයි ඔබ විශ්වාස කරන අලුත් සේවාවන්ට සේවකයන් අවශ්‍යද? පහත දැක්වෙන්නේ තිබිය හැකි අවශ්‍යතා සමහරකි.

බැහැදැකීම් : රෝගීන්, අලුත් සාමාජිකයන්, සභා සාමාජිකයන්, රෝහල්, වැන්දඹුවන්, සිරගෙවල්, වැඩි මහලු නිවාස.

ඉවැන්ජලිස්ත සේවය : නිවෙසින්-නිවෙසට යෑම, ඉවැන්ජලිස්ත මෙහෙයන්, එළිමහන් මෙහෙයන්.

පසුව කෙරෙන සේවයන් : අලුතෙන් දෙවියන්වහන්සේ වෙතට හැරුණු අය සඳහා

කාර්යාල/පරිපාලන සහාය : යතුරු ලියනය, ඇළීම, ෆයිල් කිරීම, ද්‍රව්‍ය නැවත නිපදවීම, ලිපි යැවීම, දුරකථන, වාර්තා තැබීම.

ආගන්තුක සත්කාරය : අවශ්‍යතා ඇති අයට හෝ පිටතින් පැමිණෙන පාලකවරුන්ට ධර්මදූතයන්ට, කිතුනුවන්ට ආහාර පිසීම, නවාතැන් සැපයීම ආදිය.

දුගී අය සඳහා සේවය : ආහාර, ඇඳුම්-පැළඳුම්, නවාතැන් සැපයීම

දේවස්ථාන ගොඩනැඟිලි නඩත්තුව : භූ දර්ශන, සායම් කිරීම, වඩු වැඩ, විදුලි කාර්මික සේවා, ජල නල කටයුතු, පවිත්‍ර කිරීම.
සංගීතය : ගීතිකා කණ්ඩායම, සංගීත භාණ්ඩ, ගීතිකා නායකයන්, විශේෂ සංගීත කණ්ඩායම්, තනිව ගයන්නන්, සංගීත ලිවීම්.

ආගමික නාට්‍ය සංදර්ශන :

මූල්‍යමය කටයුතු : අරමුදල් රැස්කිරීම, ගණන් තැබීම, සේවයන් සඳහා මූල්‍යමය සැලසුම් සකස් කිරීම

ලිවීම : කිතුනු පොත්, පුවත් ලිපි, අත් පත්‍රිකා, ප්‍රවෘත්ති හා සඟරා ලිපි, කාව්‍ය

බහු මාධ්‍ය : දෘශ්‍ය හා ශ්‍රව්‍ය පට, ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනි

උපදේශනය : පොදු උපදේශනය හෝ සුවිශේෂී කණ්ඩායම් සඳහා උපදේශනය, දුරකථන මගින් උපදේශනය.

විශේෂිත කණ්ඩායම් සඳහා සේවය : අන්ධ, ගොළු, බිහිරි අය මානසික රෝගීන්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්, බේබද්දන්, සංචාරක සේවකයන් කණ්ඩායම්, අවිවාහක මව්වරුන්, සමලිංගික අය, ජුදෙව්වන්, සුළු ජාතීන්, ස්ත්‍රීන්, පුරුෂයන්, පවුල්, විවාහක ජෝඩු, අපචාරයට ලක්වූ දරුවන්, පැන ගිය අය, පාසලින් ගිලිහුවන්, අකුරු නොදත් අය, සිරකරුවන්, හමුදා භටයන්, ළමයින්, තරුණයන්, මහල්ලන්.

සභා නිලධාරීන් : වැඩිහිටි අය, උපස්ථායක උපස්ථායිකාවන්, ඉරිදා පාසල් ගුරුවරුන්, ගොඩනැඟිලි හා මූල්‍යමය වැඩ කටයුතු කරන අය.

පරිවර්තකයන් : බයිබලය හා කිතුනු සාහිත්‍යය

කිතුනු අධ්‍යාපනඥයන් : ඉරිදා පාසල්, නිවාඩු කාලීන බයිබල් පාසැල්, කිතුනු පෙර පාසල්, මූලික පාසල්, උසස් පාසල්, විද්‍යාල, භාවස්ථයිම් ජාත්‍යන්තර පාඨමාලා භාවිත කරමින් ගිහියන් පුහුණු කිරීම, නිවෙස්වල බයිබල් අධ්‍යයන

ධර්මදූත/සභා රෝපණය : ඔබ ප්‍රදේශයේ ශුභාරංචිය නොගිය අය වෙත.

සාහිත්‍යය : කිතුනු පුස්තකාල, පොත් සාප්පු, බයිබලය හා කිතුනු සාහිත්‍යය බෙදා හැරීම

කඳවුරු හා ධර්මවිවේක :

විවිධ සේවා අවශ්‍යතා හඳුනාගත් පසු, සෑම සේවාවකම වගකීම ගැන කෙටි විස්තරයක් ලියන්න. නිදසුනක්.

බැහැදැකීමේ සේවය : සෑම අඟහරුවාදා රාත්‍රියකම රෝගීව සිටින, රෝහල්ගත හෝ දිරිමත් කිරීම් හා යාච්ඤාවන් අවශ්‍ය අය බැහැ දකින්න. බැහැදැකීමේ ප්‍රතිඵල පිළිබඳ වාර්තාවක් සෑම ඉරු දිනකම පාලකවරයාට සපයන්න.

*"අරමුණු මගින් කළමනාකරණය"* නමැති භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාවෙන් සේවා විස්තරයක් ලියන ආකාරය පිළිබඳ තොරතුරු සපයා ඇත.

ඉන්පසු මේ සේවාව සාර්ථකව ඉටු කිරීමට අවශ්‍ය ආත්මික දීමනා තීරණය කරන්න. නිදසුනක් ලෙස, බැහැදැකීමට යන තැනැත්තාට සුව කිරීමේ හෝ අනුශාසනා කිරීමේ හෝ දීමනාව අවශ්‍ය විය හැකිය.

"තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා" කොටසේ චාට් සටහන, සේවා අවශ්‍යතා විස්තර ලිවීම හා සෑම සේවාවක්ම සාර්ථකව ඉටුකිරීමට අවශ්‍ය ආත්මික දීමනා හඳුනාගැනීම ආදිය සඳහා භාවිත කරන්න.

## තෙවැනි පියවර : සෙනඟ, දීමනා හා අවශ්‍යතා සසඳන්න

ඔබ පළමු හා දෙවන පියවර සම්පූර්ණ කර ඇත්නම් ඔබට:

1. ඔබ සභාවේ සෑම කෙනෙකුගේම ආත්මික දීමනා පිළිබඳ ලයිස්තුවක්
2. පිරවිය යුතු සේවා තනතුරු පිළිබඳ ලයිස්තුවක්, මේ සෑම සේවාවකම වගකීම් පිළිබඳ විස්තරයක් හා සෑම සේවාවකටම අවශ්‍ය ආත්මික දීමනා.

දැන් ඔබ, ඔබ හඳුනාගත් සේවා අවශ්‍යතාවලට අදාළ දීමනාවන් ඇති අය සැසඳීමට සූදානම්ය. "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසේ සපයා ඇති පෝරමය මේ සඳහා භාවිත කරන්න. ඔබගේ අරමුණ වන්නේ සෑම කෙනෙකුටම ඵලදායිව ක්‍රියා කිරීමට හැකිවන සේ ඔවුන්ගේ ආත්මික දීමනා අනුව සේවා තනතුරු පිරවීම වේ.

බොහෝ දෙනෙකුට, තමාගේ පැවරුම පිළිගැනීමට පෙර යාච්ඤා කිරීම අවශ්‍ය විය හැකිය. ඔවුන්ට ඔවුන්ගේ තනතුරේ වගකීම් දැන ගැනීම පිණිස සේවා විස්තරයේ පිටපතක් දීමට වගබලා ගන්න. තමාට දෙන ලද සේවා තනතුර ප්‍රතික්ෂේප කරන අයට වෙනත් සේවයක් දීම පිළිබඳව සාකච්ඡා කරන්න.

යම්කිසි සේවා තනතුරකට උචිත දීමනාවන් සහිත සාමාජිකයෙකු සොයා ගත නොහැකි වුවහොත් ඔබට විකල්ප දෙකක් ඇත.

1. නිසි දීමනාවන් සහිත ඇදහිලිවන්තයෙකු ලැබෙන තුරු එම සේවාව අවලංගු කිරීම හෝ කල් දැමීම හෝ ඒ පිළිබඳව යාච්ඤා කරන්න.

2. ඒ සේවය ඉතා වැදගත් නම් එම තනතුර තාවකාලිකව පරිපාලනය පිළිබඳ දීමනාවත් සහිත කෙනෙකුගෙන් පුරවන්න. එම දීමනාව ඇති තැනැත්තාට බොහෝ විට තාවකාලිකව එය කළ හැකිය. මන්ද පරිපාලන දීමනාව අන් අය වෙනුවෙන් වගකීම ගත හැකි එකකි.

### ඇගයීම

වරින් වර සෑම සාමාජිකයෙකුම හා ඔවුන්ගේ සේවාව ඇගයීමට ලක් කරන්න. ඔවුන් ඔවුන්ගේ දීමනාවන්ට අනුව නියමිත ස්ථානයේ තබා ඇත්දැයි ඔබට මෙසේ දැනගත හැකිය.

- ඔහු සේවය කරන ක්ෂේත්‍රයේ ඵලදායිව කටයුතු කරයි. මින් අදහස් වන්නේ ඔබට ඔහුගේ සේවයේ ධනාත්මක ප්‍රතිඵල දැකගත හැකි බවය.

- ඔහු ප්‍රීතියෙන් හා තෘප්තිමත්ව සේවය කරයි. ඔහු කළකිරී ඇත්නම් ඔහු සේවය කරන්නේ ඔහුට දීමනාවක් නැති ක්ෂේත්‍රයක විය හැකි වේ.

- ඔහුගේ සේවය ලබන අයගෙන් ලැබෙන ප්‍රතිපෝෂණය ධනාත්මක නම් ඉන් පෙන්වන්නේ ඔහු සේවය කරන තනතුරේ ඵලදායිව කටයුතු කරන බවය.

යම් කෙනෙකුගේ සේවය ඵලදායි නොමැති නම්, ඒ ගැන සාකච්ඡා කිරීමට හා ඔවුන්ගේ ආත්මික දීමනා ගැන යාච්ඤා කිරීමට ඔවුන් නැවත හමුවන්න. ඔබ සාර්ථක වන තුරු උත්සාහයේ යෙදෙන්න. වරින් වර ප්‍රතිසංවිධානය කිරීම, සෙනඟ අක්‍රියව දේවස්ථාන බංකු මත හිඳගෙන සිටීමට වඩා යහපත්ය. වරින් වර කෙරෙන ඇගයීම ඔබගේ සාමාජිකත්වයේ දීමනා-පාදක කරගෙන සන්නද්ධ කිරීම තවදුරටත් දියුණු කිරීමට උපකාරී වේ. එමෙන්ම සභාව වර්ධනය වන විට අවශ්‍ය අතිරේක සේවා අවශ්‍යතා හඳුනාගැනීමට ද එය උපකාර වනු ඇත.

## දීමනා භාවිත කිරීමට මූලික දේ

ඔබගේ සභාව ප්‍රතිසංවිධානය කර, ආත්මික දීමනා පදනම් කරගෙන සන්නද්ධ කිරීමට කාලයක් ගත විය හැකිය. වෙනස්වීම්වලට සෙනඟ විවෘත නැත්නම් හා "අවුරුදු 40කට පෙර" පැවති ක්‍රමයටම කැමති නම් ඔබ අධෛර්ය නොවන්න. මෙවැනි අවස්ථාවල සියලු ආත්මික දීමනා භාවිත කිරීමේ ප්‍රධානතම මාර්ගය ප්‍රේමය වේ. පාවුලුතුමා ශුද්ධාත්මයාණන්ගේ දීමනාවන් ගැන සාකච්ජා කරන විට මේ මාර්ගය හැඳින්වීය. ඔහු මෙසේ පැවසීය.

**"... දැන් මම ඔබට වඩාත් විශිෂ්ට මාර්ගයක් පෙන්වමි" (1 කොරින්ති 12:31-** නව අනුවාදය)

"වඩාත් විශිෂ්ට මාර්ගයක්" පෙන්වන 1 කොරි 13 කියවන්න. ඔබ දිවැස්වැකි කියනු ඇත. සුවකිරීමේ, ඇදහිල්ලේ, දන්දීමේ ආදී දීමනා සියල්ල ඔබ සභාවේ ක්‍රියාත්මක විය හැකිය. එහෙත් ප්‍රේමය නොමැතිව මේවා ඵලදායි නොවනු ඇත. ප්‍රේමය නොමැතිව දීමනා භාවිත කළ විට ඒවා ඵලදායි නොවේ. අන්‍ය භාෂාවලින් කතා කිරීම ඝෝෂා කරන ඝාණ්ඨාරයක් වැනිය. සෑම දීමනාවක්ම ප්‍රේමය නොමැති නම් ඵලරහිතය. ඉන් "කිසි ඵලක් නැත" ආත්මික දීමනා මත සභාවක් සන්නද්ධ කිරීම වුවද ප්‍රේමයේ පිහිටුවිය නොහැකි නම් ඵල රහිතය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "දිමනා පාදක කරගෙන" සන්නද්ධ කිරීම යනු කවරක්ද?

3. ආත්මික දිමනා මත සභාවක් සන්නද්ධ කිරීමේ පියවර තුන ලයිස්තුගත කරන්න.

4. යම් පුද්ගලයෙකු සේවයේ නිවැරදි ලෙස ස්ථානගත කර ඇත්දැයි බලන්නේ කෙසේද?

5. ආත්මික දිමනා භාවිත කිරීමට මූලික දේ කුමක්ද?

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොත අවසානයේ දී ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දීමනා පාදක කරගෙන සන්නද්ධ කිරීම පිහිටුවීමට උත්සාහ කරන විට ඔබගේ සභාවේ සෙනඟගෙන් අසිරුතා ඇති වන්නේ නම් පහත දැක්වෙන ප්‍රශ්න අසන්න.

   - අපගේ සාමාජිකයන්ගෙන් කවර ප්‍රතිශතයක් ක්‍රියාකාරී කිතුනු සේවයේ යෙදෙත්ද?

   - සේවා පුරප්පාඩු පිරවීමට සුදුසු අය බඳවාගැනීමේ වගකීම අයත් කවුරුන්ටද?

   - අපගේ ප්‍රජාවටත්, අපගේ ජාතියටත්, අපගේ ලෝකයටත්, අපගේ විවිධ සේවාවන් නිරන්තරයෙන්ම වැඩි වර්ධනය කරන්නෙමුද?

   - ආත්මික අස්වැන්න නෙළීමට ප්‍රමාණවත් තරම් සේවකයෝ සිටිත්ද?

   - අපගේ ප්‍රධාන නායකත්ව තනතුරු සමහරක් තවමත් පුරවා නැත්ද?

   - විවිධ සේවාවන්වල යෙදෙන ඇතැම් අය සිටින්නේ කළකිරීමෙන්ද?

   - අලුතින් ගැළවීම ලැබුවන් හා අලුත් සභා සාමාජිකයන් දේව සේවයට යොදා ගැනීමේ ක්‍රමයක් අපට තිබේද?

   - සෙනඟට ඔවුන්ගේ ආත්මික දීමනා සොයාගැනීමට, වැඩි වර්ධනය කිරීමට හා භාවිත කිරීමට දිරි ගැන්වීම සඳහා අපගේ සභාව කුමක් කරයිද?

   - මෙම ප්‍රශ්නවලට ලැබෙන පිළිතුරු වෙනස්වීමේ අවශ්‍යතාව පිළිබඳව අන් අයට ඒත්තු ගැන්වීමට උපකාර වනු ඇත.

2. ආත්මික දීමනාවන් මත සභාව සන්නද්ධ කරන විට පහත දැක්වෙන චාට් සටහන් භාවිත කරන්න.

## දීමනා-පාදක කරගත් සන්නද්ධ කිරීම
### සාමාජිකයන්ගේ දීමනා සාරාංශය

1. සෑම සාමාජිකයෙකුගේම නම පළමු තීරුවේ සටහන් කරන්න.

2. දෙවන තීරුවේ, දැනට ඔවුන් යම් කිසි තනතුරක් සභාවේ දරන්නේ නම් එය සඳහන් කරන්න (ඇතැම් අයට දැනට දරන තනතුරු උචිත නොවන බව ඇතැම් විට ඔබට පෙනෙනු ඇත.)

3. මෙම පාඨමාලාවේ දහනව වන පරිච්ඡේදයේ හා උපග්‍රන්ථයේ දී ඇති මාර්ග නිර්දේශ පදනම් කරගෙන ඔවුන්ගේ ආත්මික දීමනා හඳුනාගෙන ඒවා තෙවන තීරුවේ සඳහන් කරන්න.

| (1) නම | (2) දැනට සභාවේ දරන තනතුර | (3) ආත්මික දීමනා |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

## දිමනා පාදක කරගත් සන්නද්ධ කිරීම
### සේවා අවශ්‍යතා

1. පළමු තිරුවේ සේවා අවශ්‍යතා හඳුනාගන්න.

2. දෙවන තිරුවේ, ආත්මික සේව තනතුරේ වගකීම් විස්තර කරන්න.

3. තෙවන තිරුවේ, මේ සේවාව ඵලදායීව ඉටු කිරීමට අවශ්‍ය ආත්මික දිමනා හඳුනාගන්න.

| (1) සේවා අවශ්‍යතා | (2) වගකීම් | (3) අවශ්‍ය ආත්මික දිමනා |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

## දීමනා පාදක කරගත් සන්නද්ධ කිරීම

### සෙනඟ, අවශ්‍යතා හා දීමනා සැසඳීම

1. පළමු තීරුවේ නම ලියන්න.

2. දෙවන තීරුවේ, ඔවුන් දැනට දරන සේවා තනතුර ලියන්න.

3. තෙවන තීරුවේ, ඔවුන්ගේ ආත්මික දීමනා ලියන්න.

4. සතරවන තීරුවේ, ඔවුන්ගේ නව සේවා තනතුරු ලියන්න. (ඇතැම් අයගේ දැනට දරන තනතුරු ඔවුන්ගේ සේවයට මනාසේ ගැළපෙන බව ඔබට පෙනෙනු ඇත. එවිට ඒ තනතුරු වෙනස් නොවේ)

| (1)<br>නම | (2)<br>දැනට දරන තනතුර | (3)<br>ආත්මික දීමනා | (4)<br>නව තනතුර |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

# උපග්‍රන්ථය

පහත ඇත්තේ ශුද්ධාත්මයාණන්ගේ දීමනාවන් පිළිබඳ සාරාංශයකි. වැඩි විස්තර සඳහා භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "ශුද්ධාත්මයාණන්ගේ මෙහෙය" යන පාඩම බලන්න.

## ශුද්ධාත්මයාණන්ගේ දීමනාවන්

යේසුස්වහන්සේ ලෝකයේ කෙළවරවල් දක්වා ශුභාරංචි පණිවිඩය ගෙනයාමේ වගකීම තම ගෝලයන්ට පවරා ගිය සේක. ශුද්ධාත්මයාණන්ගේ බලය මෙම කාර්යය සම්පූර්ණ කිරීමට ඔවුන්ට උපකාර වනු ඇත (ක්‍රියා 1:8). යේසුස්වහන්සේ මෙම අභියෝගය ජයගැනීමේ හැකියාව තම ගෝලයන්ට ලබාදීමෙන් තොරව මහත් වගකීමක් ඔවුන්ට පවරා දුන්නේ නැත. ආත්මික දීමනා යනු ශුභාරංචියේ බලවත් සාක්ෂිකරුවන් වීම උදෙසා ඇදහිලිවන්තයන් බලගැන්වීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ලබා දෙනු ලබන අධිස්වභාවික හැකියාවන්ය.

ආත්මික දීමනා සහ ස්වභාවික තලෙන්ත අතර වෙනසක් පවතී. තලෙන්තයක් යනු උපතින්ම ලැබෙන හෝ පුහුණුව තුළින් වර්ධනය කරගනු ලබන ස්වභාවික හැකියාවන්ය. ආත්මික දීමනාවක් යනු උපතින් හෝ පුහුණුව තුළින් ලබාගත නොහැකි අධිස්වභාවික හැකියාවකි. එය විශේෂිත ආත්මික අරමුණු උදෙසා යොදාගැනීමට ශුද්ධාත්මයාණන් විසින් ලබාදෙන විශේෂ හැකියාවකි.

කෙනෙකු ඇදහිලිවන්තයෙකු බවට පත් වූ පසු ස්වභාවික තලෙන්තය ශුද්ධාත්මයාණන් මගින් එකඟවීමක් (අනුමත කිරීම හා ආශිර්වාද කිරීම) සිදුවිය හැකිය. මෙය සිදුවීමෙන් අනතුරුව තලෙන්තය, තලෙන්තයක් මෙන් දීමනාවක් බවටද පත්වේ. උදාහරණයක් ලෙස කෙනෙකු ලබා ඇති පුහුණුව තුළින් ඔහුට පරිපාලනය පිළිබඳ ස්වභාවික තලෙන්තයක් තිබිය හැකිය. ශුද්ධාත්ම බව්තිස්මය ලැබීමෙන් අනතුරුව ශුද්ධාත්මයාණන් මගින් එකඟ වනු ලැබ (අනුමත කර) පරිපාලනයේ ආත්මික දීමනාව තුළ ඔහු පාවිච්චි කරනු ලැබිය හැකිය.

ඉතාම හොඳම ස්වභාවික තලෙන්තවලට වඩා ආත්මික දීමනා තුළින් ආත්මික හැකියාවන් ලබා දේ. ස්වාමින්වහන්සේගේ කාර්යයන් උදෙසා අප අපගේ සියලුම ස්වභාවික තලෙන්ත පාවිච්චි කළ යුතු වුවත් අපට තවදුරටත් ආත්මික දීමනා අවශ්‍ය වේ.

### දීමනාවන්වල පරමාර්ථය

ශුද්ධාත්ම දීමනාවලින් බලාපොරොත්තු වන දේවල් එපීස 4:12-15 දක්වා සටහන් වේ.
මෙම කොටසට අනුව ශුද්ධාත්මයාණන්ගෙන් බලාපොරොත්තු වන දේවල් නම්

- ශුද්ධවන්තයන්ව සම්පූර්ණ කිරීම
- සේවයේ කාර්යයන්ට අනුබල දීම
- ක්‍රිස්තුස්වහන්සේ හා සභාව ගුණයෙන් වර්ධනය කිරීම

ආත්මික දීමනාවන්ගේ අරමුණු හෙවත් ඉලක්ක නම්: අප,

- ඇදහිල්ලෙන් එක්සත් කරනු ලැබීම
- ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ අපගේ දැනුම වර්ධනය කරගැනීම
- ක්‍රිස්තුස්වහන්සේ අපගේ ආදර්ශය කරගනිමින් සම්පූර්ණත්වය තුළ වර්ධනයවීම
- වැරදි ඉගැන්වීම්වලින් රැවටිය නොහැකි වන පරිදි ස්ථාවර වීම
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ආත්මිකව පරිණත වීමයි

### දීමනා බෙදාහැරීම

සෑම ඇදහිලිවන්තයෙකුටම අවම වශයෙන් එක් දීමනාවක් හෝ තිබේ (1 පේතෘස් 4:10). සෑම ඇදහිලිවන්තයෙකුටම අවම වශයෙන් එක් ආත්මික දීමනාවක් හෝ ඇති බැවින් අපගේ දීමනාව හඳුනාගෙන එය පාවිච්චි කිරීමේ වගකීම අප සතුය. ඔබව විනිශ්චය කරනු ලබන්නේ ඔබට ඇති

ආත්මික දීමනා සංඛ්‍යාව අනුව නොවේ. ඔබව විනිශ්චය කරනු ලබනුයේ ඔබට දී ඇති ආත්මික දීමනාව හෝ දීමනා පාවිච්චි කිරීමේදී ඔබ දක්වන විශ්වාසවන්තභාවය අනුවය. මතෙව් 25:14-30 හි සඳහන් තලෙන්ත පිළිබඳ උපමාව මෙම සත්‍ය තහවුරු කරයි.

ආත්මික දීමනා බොහොමයක් තිබේ, නමුත් කිසිම ඇදහිලිවන්තයෙකුට සියලුම ශුද්ධාත්ම දීමනා නැත (1 කොරින්ති 12:29-30 කියවන්න) .කෙනෙකුට එක දීමනාවකට වඩා තිබිය හැකි නමුත් කිසිවෙකුටවත් සියලුම ශුද්ධාත්ම දීමනා නැත. යමෙකුට එසේ තිබුණේ නම්, ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ අනෙකුත් පුද්ගලයන්ගේ අවශ්‍යතාවයක් ඔහුට නොදැනෙනු ඇත.

එක් උල්පතකින් පැමිණෙන දීමනා රැසක් ඇති බව බයිබලයේ සඳහන් වේ. ආත්මික දීමනාවන්ගේ උල්පත ශුද්ධාත්මයාණන්වහන්සේය. උන්වහන්සේ ඇදහිලිවන්තයන්ගේ ජීවිතවලට මෙම දීමනා ලබා දී ඒවා ක්‍රියාත්මක කරවන සේක (1 කොරින්ති 12:4-7 හා රෝම 12:6-8 කියවන්න). ආත්මික දීමනාවන්ට ඇත්තේ එක උල්පතක් වන නමුත් දීමනා රැසක් තිබේ. කිසිදු දීමනාවක් තව එකකට වඩා වැඩියෙන් වැදගත් නැත.

මිනිස් සිරුරේ ඇතැම් කොටස් වලට අනෙක් කොටස්වලට වඩා වගකීම් පැවරී ඇත. උදාහරණයක් ලෙස ඇස ඔබ අවට ඇති දේවල් නැරඹීමේ හැකියාව ඔබට ලබාදේ. ඔබ ඇවිදින විට එය ඔබට මගපෙන්වයි. එය කියවීමේ, දේව මැවිල්ල නැරඹීමේ හා රසවිඳීමේ අවස්ථාව ඔබට ලබාදෙයි. ඇසට වැඩි වගකීමක් පැවරී ඇත, නමුත් ඔබ ඇවිදින විට සමබරතාව ලබාදෙන ඔබේ පයේ මහපට ඇඟිල්ලට වඩා එය වැදගත් නොවේ. ඔබට ඇවිදීමට දෙපා නොතිබුනේ නම්, ඇවිදින විට දෑසෙන් ලැබෙන මගපෙන්වීමෙන් ප්‍රයෝජනයක් නැත. ඔබ කියවන දේ තේරුම්ගැනීමට ඔබට මොළයක් නොමැතිනම් ඇසෙන් ලැබෙන කියැවීමේ හැකියාවෙන් වලක් නැත.

ඇතැම්විට ඇදහිලිවන්තයන් අන් අයගේ ආත්මික දීමනා නිසි ලෙස හඳුනානොගත් විට සභාව තුළ වැරදි වැටහීම් ඇති වේ. උදාහරණයක් ලෙස කෙනෙකුට දීමේ දීමනාව තිබිය හැකි අතර ඔහු තරම් ත්‍යාගශීලි ලෙස නොදෙන කෙනෙකුව ඔහුට තේරුම් ගත හැකි නොවනු ඇත. නැතිනම්, කෙනෙකුට පරිපාලනයේ දීමනාව තිබිය හැකි අතර එතරම් සංවිධානාත්මකව කටයුතු නොකරන පුද්ගලයන් පිළිබඳව ඔහු නොඉවසිලිවන්ත වනු ඇත.

සෑම ඇදහිලිවන්තයෙක්ම විවිධ දීමනා ඇති අනෙක් ඇදහිලිවන්තයන් සමග එක්ව කටයුතු කිරීම සඳහා තම ආත්මික දීමනා යොදාගත යුතුය. මෙය සිදුවන විට, සභාව ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වශයෙන් බලවත් ලෙස ක්‍රියාත්මක වෙයි.

## දීමනාවන්ගේ ගබඩාකරුවෝ

ඔබ ආත්මික දීමනාවන්ගේ ගබඩාකරුවකු පමණි. ගබඩාකරුවකු යනු තමන් කටයුතු කරන දේවල් පිළිබඳ හිමිකාරීත්වයක් නැති කෙනෙකි. ඔහු පාවිච්චි කරනුයේ වෙනත් කෙනෙක් ඔහුට දී ඇති දේවල්ය. ඔහු ඒවා පාවිච්චි කරනුයේ ඔහුට ඒවා ලබාදුන් තැනැත්තා උදෙසාය. (1 කොරින්ති 4: හා 1 පේතෘස් 4:10). ගබඩාකරුවකු ලෙස ඔබට ලබාදී ඇති දීමනාවන් පාවිච්චි කිරීමේදී ඔබ පෙන්වන විශ්වාසවන්තභාවයට අනුව ඔබ විනිශ්චය කරනු ලබනු ඇත (1 කොරින්ති 4:2).

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා

ආත්මික දීමනාවන් හඳුනාගත හැකි ප්‍රධාන බයිබල් පාඨ පහත දක්වා ඇත.

- රෝම 12:1-8
- 1 කොරින්ති 12:1-31
- එපීස 4:1-16
- 1 පේතෘස් 4:7-11

අධ්‍යයනය පහසුව සඳහා අප දීමනා ප්‍රධාන කොටස් හතරකට බෙදා දක්වා ඇත.

-විශේෂ දීමනා

-වාචික (කතා) කිරීමේ දීමනා
-සේවය කිරීමේ දීමනා
-ලකුණු පිළිබඳ දීමනා

බයිබලය තුළ දීමනා මෙලෙස බෙදා දක්වා නැත. අප එසේ සකස් කර ඇත්තේ විවිධාකාර දීමනා පහසුවෙන් මතක තබා ගැනීමට ඔබට උපකාර කිරීම සඳහාය. ආත්මික දීමනාවන්වල ලැයිස්තුවක් පහත දැක්වේ.,

## විශේෂ දීමනා

ආත්මික දීමනාවන්ගේ පළමු කොටස අපි "විශේෂ දීමනා" ලෙස හඳුන්වමු. මෙම දීමනා සඳහා අප මෙම මාතෘකාව යොදාගන්නේ මේ සෑම දීමනාවක්ම සභාවේ විශේෂ නායකත්ව ස්ථානයක් වන බැවිනි. විශේෂ නායකත්ව දීමනා වන්නේ,

**ප්‍රේරිතයන් :** ප්‍රේරිතයෙකු යනු විවිධ ස්ථානවල හා විවිධ සංස්කෘතීන් තුළ නව සභාවන් ගොඩනැගීමට හා අධීක්ෂකයෙකු ලෙස සභාවන් ගණනාවක් බලාගැනීමේ විශේෂ හැකියාවක් ඇති පුද්ගලයෙකි. ප්‍රේරිතයෙක් යන්නෙහි අදහස, " මුළු බලය හා ආධිපත්‍යය ඇතිව කෙනෙකු උදෙසා ක්‍රියා කිරීමට යවන ලද, නියෝජිතයෙකුය". ඇදහිලිවන්තයන්ගේ සංවිධානාත්මක සභාවන් වර්ධනය කිරීම තුළින් ලෝකය පුරා ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට විශේෂ ආධිපත්‍යයක් හෝ බලයක් ප්‍රේරිතයෙකුට ඇත. සභාව තුළ ප්‍රේරිතවරු හැඳින්වීමට නූතනයේ භාවිත කරන වචන වනුයේ මිෂනාරිවරු හා සභා රෝපණය කරන්නන් යන ඒවාය.

**අනාගතවක්තෘවරු :** අනාගතවක්තෘමය දීමනා දෙකක් තිබේ. එකක් නම්, අනාගතවක්තෘවරයෙකුවීමේ විශේෂ දීමනාවයි. අනෙක නම් අනාගතවාක්‍ය පැවසීමේ දීමනාවයි. පොදුවේ ගත් විට, අනාගතවාක්‍ය යන්නෙන් දැක්වෙන්නේ දෙවියන්වහන්සේගේ විශේෂ ආනුභාවය යටතේ කතා කිරීමයි. එනම් දෙවියන්වහන්සේගෙන් ක්ෂණිකව පණිවුඩයක් ලැබ දිව්‍යමය ආලේපලත් ප්‍රකාශයක් තුළින් එය උන්වහන්සේගේ ජනයාට පැවසීම ඇති විශේෂ හැකියාවයි. අනාගතවක්තෘවරයෙක් සභාවේ නායකයෙකු වන අතරම අනාගතවාක්‍ය පැවසීමේ දීමනාවට තිබේ.

**එවැන්ජලිස්තවරු :** ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකුට මිනිසුන් හා ස්ත්‍රීන් ප්‍රතිචාර දක්වා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකිවයුතු සාමාජිකයන් බවට පත්වන ආකාරයට නොඇදහිලිවන්තයන් සමග ශුභාරංචිය බෙදාගැනීමේ විශේෂ හැකියාවක් ඇත. එවැන්ජලිස්තවරයා යන වචනයේ අදහස "ශුභාරංචිය ගෙන එන තැනැත්තා" යන්නයි.

**සභාපාලකයන් :** සභාපාලකයන් යනු ඇදහිලිවන්තයන් කණ්ඩායමකගේ ආත්මික සුභසාදනය උදෙසා දිගු කාලීන පෞද්ගලික වගකීමක් දරන නායකයන්ය. සභාපාලකවරයෙකුගේ ආත්මික වගකීම් නම් තම සේවය යටතේ සිටින දේව වචනය ඉගැන්වීමෙන් ඔවුන්ගේ පෞද්ගලිකව හා ආත්මිකව පෝෂණය කරමින් රැක බලා ගැනීමයි.

**ගුරුවරු :** ගුරුවරුන් යනු ඇදහිලිවන්තයන්ට ඉගෙන ගැනීමට හා තම ජිවිතවල ඒවා ප්‍රයෝගිකව යොදා ගැනීමට සමත් ලෙස දේව වචනය ඉගැන්වීමට හැකි පුද්ගලයන් වේ. අනාගතවක්තෘවරයෙකුවීමේ දීමනාව අනාගතවාක්‍ය පැවසීමේ දීමනාවෙන් වෙනස් වන ලෙසම ගුරුවරයෙකුවීමේ විශේෂ දීමනාව ඉගැන්වීමේ දීමනාවෙන් වෙනස් සෑම ඇදහිලිවන්තයෙකුටම ගුරුවරයෙකු වීමේ විශේෂ දීමනාව හෝ ඉගැන්වීමේ දීමනාව ලැබී නැත. නමුත් සෑම ඇදහිලිවන්තයෙක්ම මූලික ශුභාරංචි පණිවුඩය ඉගැන්වීමේ කාර්යයට දායක විය යුතුය (හෙබ්‍රෙව් 5:12).

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ වාචික දීමනාවන් (කතාකරන).

දීමනා පහක් "වාචික දීමනා". ලෙස නම් කර ඇත්තේ එම දීමනා කතාව සම්බන්ධ දීමනා බැවිනි. එම වාචික දීමනා පහ නම්:

**ධර්මවාක්‍ය පැවසීම:** ධර්මවාක්‍ය පැවසීමේ දීමනාව සහිත පුද්ගලයා දෙවියන්වහන්සේගෙන් ලැබෙන විශේෂ ආනුභාවයෙන් යුතුව එතුමාගේ ජනතාව උදෙසා දෙවියන්වහන්සේ ප්‍රකාශ කරන පණිවුඩය  සන්නිවේදනය කරයි.

යම් කෙනෙකු හට ධර්මවාක්‍ය පැවසීමේ දීමනාව තිබීමෙන් ඔහුට අනාගතවකතෘවරයෙකු වීමේ විශේෂ දීමනාව ලැබී තිබේයයි කල්පනා කළ නොහැක. දෙවියන්වහන්සේ සභාවෙහි නායකත්වයෙහි අනාගතවකතෘවරු ලෙස (ඔවුන් සතුව ධර්මවාක්‍ය පැවසීමේ දීමනාවද පවතී) පත් කළ කොටසක් සිටිති. ධර්මවාක්‍ය පැවසීමේ දීමනාව සහිත පුද්ගලයෝ අනාගතවකතෘවරු මෙන්ම ධර්මවාක්‍ය පැවසුවද ඔවුනට නායකත්වයෙහි විශේෂිත ස්ථානයක් වන අනාගතවක්තෘ පදවිය හිමි නොවේ. ඔව්හු ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආනුභාවය යටතේ විශේෂ පණිවුඩ බෙදා ගනිති.

**ඉගැන්වීම :** ධර්මවාක්‍ය පැවසීම හා අනාගතවකතෘවරයා අතර පැවති වෙනස මෙන්ම ඉගැන්වීමේ වාචික දීමනාව හිමි පුද්ගලයා හා විශේෂ දීමනාවක් ඇති ගුරුවරයා අතර ද වෙනසක් පවතී. දෙවියන්වහන්සේ සභාවෙහි විශේෂ නායකත්වය සඳහා ගුරුවරු (ඉගැන්වීමේ දීමනාව සහිත) පත්කරන සේක. ඉගැන්වීමේ විශේෂ දීමනාව දේව වචනය සන්නිවේදනය කිරීම වුවත් සභාවෙහි ගුරුවරයකු වීමේ නායකත්වය දීමනාව නොවේ.

**උපදෙස්දීම :** උපදෙස් දීමේ දීමනාව නම් කිසිවෙකු අවශ්‍යතාවයෙන් පෙළෙන මොහොතෙහිදී ඔවුනට සමීප වීමට හා දේව වචනයෙන් නිවැරදිව උපදෙස් සපයා දීමට ලැබෙන හැකියාවය. "උපදෙස් දීම" යනු වචනාර්ථයෙන් ගත් කල අදහස් වනුයේ කෙනෙක්ව පැත්තකට කැඳවාගෙන, අවවාදකිරීම, නිර්දේශකිරීම, වැරදි පෙන්වාදීම, දිරිගැන්වීම හෝ සැනසීමය. උපදෙස්දීම යනු ප්‍රඥාවන්ත වූ ආත්මික අනුශාසනා දීමය. මෙම දීමනාව සහිත පුද්ගලයෝ මනුෂ්‍යයන් හට උපකාර කරන්නාවූ වචන, සහනය ගෙන දෙන, සැනසුම සපයන, දිරිගන්වන වචන මගින් මෙහෙකරති. නූතනයෙහි මෙම දීමනාව "උපදේශන දීමනාව" ලෙස නම් කළ හැකිය.

**ප්‍රඥාවේ වචනය :** ප්‍රඥාවේ වචනය නම් විශේෂිත අවශ්‍යතාවයක් සඳහා දැනුම භාවිත කර ගත හැක්කේ කෙලෙසද කියා දැනගන්නා පිණිස නව දැක්මක් ගැඹුරින් ලැබීමට ඇති හැකියාවයි. ඕනෑම අවස්ථාවකදී  මෙම දීමනාව ඇති පුද්ගලයා හට ප්‍රඥාවන්ත විසඳුමක් සොයා ගැනීම සඳහා පවතින දැනුම අදාළ කරගත යුත්තේ කෙලෙසද කියා දැන ගත හැක. ප්‍රඥාවේ දීමනාව නම් පියවි ඇසින් සාමාන්‍ය මිනිසාට දැකිය නොහැකි, පුද්ගලයන් පිළිබඳ හා සිදුවීම් පිළිබඳ දිව්‍යමය ගැඹුරු දැක්මකි. දෙවියන්වහන්සේගෙන් ලද මෙම ප්‍රඥාව යමක් කළයුතු ආකාරය සහ කළ යුත්තේ කුමක්ද යන කරුණු සමග මුසුව ක්‍රියාත්මක වේ. මෙම දීමනාව "ප්‍රඥාවේ දීමනාව" ලෙස නම් නොකෙරේ. එයට හේතුව දෙවියන්වහන්සේගේ සම්පූර්ණ ප්‍රඥාව කෙනෙකුට මෙමගින් නොලැබෙන බැවිනි. එය දෙවියන්වහන්සේගේ අනන්ත වූ ප්‍රඥාවෙන් සුළු කොටසක් වන ප්‍රඥාවේ වචනයක් පමණි. ප්‍රඥාවේ වචනයේ දීමනාව අධ්‍යාපනය තුළින් හිමිවන දෙයක් නොවේ. එවන් ප්‍රඥාවේ උල්පත දෙවියන්වහන්සේය.

**දැනගැන්මේ වචනය :** දැනගැන්මේ වචනය යනු අනෙක් අයට අවබෝධ නොවන නොදන්නාවූ කාරණා වටහාගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආනුභාවය යටතේ ලැබෙන හැකියාවය. ප්‍රඥාවේ වචනය මෙන්ම මෙයද "දැනගැන්මේ දීමනාව" ලෙසින් නම් නොකෙරේ. එය "දැනගන්මේ වචනය" නම් දීමනාවයි. එය දෙවියන්වහන්සේගේ සම්පූර්ණවූ දැනගැන්ම නොව එතුමාගේ දැනීමෙන් සුළු කොටසක් පමණක් වේ. මෙම ආත්මික දැනගැන්මෙහි මුල් උල්පත දෙවියන්වහන්සේය. දැනගැන්මේ වචනය නම් දීමනාවෙහිදී ලැබෙන දැනීම හෙළිදරව් වන්නාවූ දැනුමකි. එහි තේරුම නම් එම දැනුම දෙවියන්වහන්සේ විසින් එළිදරව් කර දෙන්නක් බවය. එම දැනුම අධ්‍යාපනය තුළින් හෝ අධ්‍යයනය කිරීමකින් ලබාගත් දැනුමක් නොවේ.

## සේවයේ දීමනා

අප "මෙහෙකිරීමේ දීමනා" "සේවයේ දීමනා" නමින් හඳුන්වන ආත්මික දීමනා නවයක් පවතී. මෙම දීමනා නවය සභාවට අවශ්‍ය ආකෘතිය, සංවිධානය සහ ආත්මික මෙන්ම ප්‍රායෝගික සහය සැපයීමෙන් "සේවය" ලබා දෙයි. "සේවා දීමනා" නවය නම්:

**ආත්ම විමසීම:** ආත්ම විමසීම නම් මනුෂ්‍යයන්ව, දේව ධර්ම, සහ අවස්ථාවන් අගැයීමකට ලක් කොට එය දෙවියන්වහන්සේගෙන්ද නැතහොත් සාතන්ගෙන්ද දැයි දැනගැනීමට ඇති හැකියාවය. ආත්ම විමසීම, විවේචනාත්මක ආත්මය සමග කිසිවිටක පටලවා නොගන්න. මෙම දීමනාව ආත්මික දීමනාවකි. ආත්මික කාරණා ස්වාභාවික මනසින් විමසිය නොහැක. මෙම දීමනාව ආත්ම විමසීමට පමණක් සීමා වී තිබේ. එය සාමාන්‍යයෙන් පොදුවේ කාරණා විමසීමක් නොවේ. මෙම දීමනාව මගින් සභාවට වැරදි අරමුණු සහිතව පැමිණෙන අය, වැරදි ධර්ම, සහ වැරදි ආකල්ප මගින් සභාව දෙකඩ කිරීමට මාන බලන අයව හඳුනාගනු ලැබේ.

**නායකත්වය :** නායකත්වය නම් ආත්මික දීමනාව යනු දෙවියන්වහන්සේගේ පරමාර්ථයට අනුකූලවූ ඉලක්ක තැබීමටත් එම ඉලක්ක අන්‍යයන් සමග සන්නිවේදනය කිරීමටත් ඇති හැකියාවය. මෙම දීමනාව සහිත පුද්ගලයා දේව මහිමය උදෙසා එම ඉලක්ක සපුරා ලීමට අනෙක් මනුෂ්‍යයන්ව පොලඹවා මගපෙන්වනු ඇත. රෝම 12 හි නායකත්වය සඳහන් කොට ඇත. මෙම දීමනාව සඳහා අවශ්‍ය සුදුසුකම නම් එම තැනැත්තා උනන්දුවෙන් යුක්තව මගපෙන්වීමය. උනන්දුවෙන් යුක්තව යන පදයෙන් සනිටුහන් කරන්නේ භාරගත් වැඩය නිරන්තර සැලකිල්ලෙන් යුක්තව නිසියාකාරව ඉටුකිරීමට ප්‍රයත්න දැරීම යන්නය. එහි අර්ථය නම්, කාර්යශූර, අවධානය යොමු කරන, දිගටම නොසැලී සිටීම යනුයි.

**පරිපාලනය :** පරිපාලන දීමනාව බයිබලයෙහි නම් කොට ඇත්තේ "ආණ්ඩු කිරීම" ලෙසිනි. පරිපාලන දීමනාව සහිත පුද්ගලයා හට උපදෙස් දීමට, මග පෙන්වීමට, සංවිධානය කිරීමට, අන්‍යයන් වෙනුවෙන් තීරණ ගැනීමට හැකියාව තිබේ. පරිපාලන යන වචනයෙහි අර්ථය නැවක මගපෙන්වන කපිතාන් කෙනෙකුගේ කාර්යභාරයට සමානය. බයිබලයෙහි මෙම කටයුතු දෙක සඳහාම එකම පදයක් භාවිත කොට තිබේ. මෙම දීමනාව සහිත පුද්ගලයා මග පෙන්වීමට හා තීරණ ගැනීමට වගකියනු ලැබේ. නැවක කපිතාන් වරයෙකු මෙන්, ඔහු එම නැවේ හිමිකරුවා නොවුවත්, ගමන යෑම සඳහා මගපෙන්වීමේ වගකීම ඔහුට භාර වී තිබේ.

නායකත්ව දීමනාව හා පරිපාලන දීමනාව යන දෙකම ආත්මික ඉලක්ක ඉටු කර ගැනීම සඳහා සංවිධානාත්මක දක්ෂතා ක්‍රියාවට නැංවීම සිදුවේ. බොහෝ අවස්ථාවලදී එකම ඇදහිලිවන්තයා සතුව නායකත්ව හා පරිපාලන දීමනා දෙකම පිහිටිය හැකිය. යම් කිසිවෙකු සතුව පරිපාලන දීමනාව පැවතියද ඔහු සතුව නායකත්ව දීමනාව නොමැති නම් ඔහුට එම දීමනාව සහිත කෙනෙකුගේ සහාය ලබාගත යුතුවේ. පරිපාලන දීමනාව සහිත පුද්ගලයා හට මගපෙන්වීමට, සංවිධානය කිරීමට, තීරණ ගැනීමට හැකියාව පවතී. එහෙත් නායකත්ව දීමනාවෙන් තොරව ඔහුට මනුෂ්‍යයන්ව පොලඹවා ඉලක්ක අත්පත් කරගැනීමට හැකියාව නොපවතී.

**ඇදහිල්ල :** ඇදහිල්ලේ දීමනාව සතු පුද්ගලයා හට අපහසු අවස්ථාවන්හිදී දෙවියන්වහන්සේ විශ්වාස කිරීමටත් අති ස්වාභාවික අයුරින් එතුමා කෙරෙහි ස්ථිරව නිසැකකමින් සිටීමටත් හැකියාව ඇත. විශේෂ අවශ්‍යතා සැපරීම සඳහා එය විශේෂ ඇදහිල්ලකි. දෙවියන්වහන්සේ කළ නොහැකි කාර්යයන් ඉටු කරන බව ඔහු දනී. ඔහු අවට සිටින අනෙකුත් ඇදහිලිවන්තයන් මෙය විශ්වාස නොකරන කල පවා ඔහු තම ඇදහිල්ල ක්‍රියාවට නංවයි. බයිබලය අපට උගන්වන්නේ දෙවියන්වහන්සේ එක එක මනුෂ්‍යයා හට ත්‍යාගයක් ලෙසට යම් ප්‍රමාණයක ඇදහිල්ලක් දී ඇති බවය. (රෝම 12:3) අප ගැළවීම ලබා සිටින්නේද ඇදහිල්ලෙන් බව එය උගන්වයි (එපීස 2:8). එනමුත් ඇදහිල්ලේ දීමනාව නම් ඔබගේ ජීවිතයෙහි සියලුම ක්ෂේත්‍ර කෙරෙහි දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට ඔබට ඇති විශේෂ අසාමාන්‍ය හැකියාවය. මෙම ඇදහිල්ල කළ නොහැකි දෙයක් නොදනී. දෙවියන්වහන්සේට කළ හැකි කාරණා පිළිබඳව එම ඇදහිල්ල සීමා නොකරයි.

**දීම :** දීමේ දීමනාව සහිත පුද්ගලයා හට ස්වාමීන්වහන්සේගේ සේවය සඳහා ද්‍රව්‍යමය වශයෙන් හා මූල්‍යමය වශයෙන් දීමට විශේෂ හැකියාවක් ඇත. ඔහු එය ප්‍රීතියෙන් හා මහත් උනන්දුවෙන් සිදු කරයි. දීමේ දීමනාවට ස්වාමීන්වහන්සේගේ කාර්යය උදෙසා තම කාලය, ශක්තිය, හැකියාව දීම ද ඇතුලත්ය.

**උපකාරකයන් :** උපකාරක දීමනාව ඇති පුද්ගලයෙකු අන් අයට ස්වාමීන්වහන්සේගේ සේවය ඉටු කිරීමට සහය ලබා දෙනු ඇත. ඔවුන්ගේ ආත්මික දීමනා තව වැඩි දියුණු කර ගැනීමට සහාය දෙනු ඇත. දේවස්ථානය රැකබලාගැනීමේ සිට සංගීත වාදකයෙකු හෝ දේව සේවයෙහි, සභාවෙහි වැඩකටයුතුවල කුමනාකාරයෙන් හෝ උපකාර කිරීම උපකාරක දීමනාවට ඇතුලත්ය.

**සේවයෙහි යෙදීම :** මෙම පදයෙහි "සේවයෙහි" යන පදයෙහි අර්ථය මෙහෙ කිරීමය. සේවයෙහි යෙදීමේ දීමනාව නම් ස්වාමීන්වහන්සේගේ වැඩවල ප්‍රායෝගික වැඩ කටයුතු ඉටු කිරීමට ඇති හැකියාවය. සේවා දීමනාව ඇති පුද්ගලයා ආත්මික ඉලක්ක සපුරාගැනීම සඳහා දිනපතා කිරීමට අවශ්‍ය වැඩ කටයුතුවලින් අන් අයව නිදහස් කරයි.

**කරුණාව පෙන්වීම :** "කරුණාව" යනු දයානුකම්පාවය. එනම් ඔබට අනෙක් පුද්ගලයාගේ තත්වය අවබෝධකරගත හැකිවීමය. කරුණාවේ දීමනාව සතු පුද්ගලයා හට දුක් වේදනා විඳින තැනැත්තාව හඳුනාගත හැකි වන අතර ඔවුනට උපකාර කිරීමට හැකියාව ලැබේ.

**ආගන්තුක සත්කාරය :** ආගන්තුක සත්කාරය නම් සභාවෙහි සමහර සාමාජිකයන් හට, අවශ්‍යතාවයන්ගෙන් පෙළෙන අය උදෙසා ආහාර පාන හා නවාතැන් පහසුකම් ලබාදීමට ඇති විශේෂ හැකියාවය.

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ සලකුණු දීමනා.

අපි සලකුණු දීමනා ලෙසට හඳුන්වන දීමනා හතරක් ඇත. ඒවාට සලකුණු දීමනා යයි නම් දී ඇත්තේ ඒවා දෙවියන්වහන්සේගේ වචනය තහවුරු කිරීමට උන්වහන්සේගේ බලය කරණකොටගෙන ඇදහිලිවන්තයන් තුළින් ක්‍රියාකරන්නාවූ අධි ස්වාභාවික වූ සලකුණු වීම නිසාය. සලකුණු දීමනා නම් ,

**හාස්කම් :** හාස්කමේ දීමනාව සහිත පුද්ගලයෙකු තුලින්, දෙවියන්වහන්සේ ස්වාභාවික සිදුවිය නොහැකි කාරණා ඉටු කරන සේක. මෙවන් අධි ස්වාභාවික වූ ක්‍රියාවන් සාතන්ගේ බලයට වඩා දෙවියන්වහන්සේගේ බලය අතිමහත් බව පෙන්නුම් වන සලකුණකි. මෙවායින් දෙවියන්වහන්සේට ගෞරවය ලැබේ.

**සුවකිරීම :** සුවකිරීමේ දීමනාව සතුවූ ඇදහිලිවන්තයා හට දෙවියන්වහන්සේගේ බලය ඔහු තුළින් ගලාගොස් අසනීප පුද්ගලයාව වෙන කිසි ස්වාභාවික ක්‍රම භාවිත නොකොට නැවත යථා තත්වයට ගෙන ඒමට හැකියාව ඇත. "සුවවීම" යනු යහපත් අතට හැරීමය.

**අන්භාෂා දීමනාව :** අන් භාෂා දීමනාව නම් ඔබ කිසිදිනක ඉගෙනගෙන නොමැති භාෂාවකින් දෙවියන්වහන්සේගේ ජනතාව උදෙසා උන්වහන්සේගේ පණිවුඩයක් ලබාගැනීමට හා එය සන්නිවේදනය කිරීමට ඇති හැකියාවය. "අන්භාෂා" යනු යම්කිසි භාෂාවකි. මෙය "වාචික" දීමනාවක් ලෙස නොව "සලකුණු" දීමනාවක් ලෙස නම් කොට ඇත්තේ සලකුණක් ලෙස දී ඇති බව බයිබලය පැහැදිලිව ප්‍රකාශ කොට ඇති බැවිනි.

අන් භාෂා දීමනාවෙන් යමෙක් කතාකරන කල එම භාෂාව අසාගෙන සිටින වෙනයම් පුද්ගලයෙකු හට එය හඳුනාගත හැකි භාෂාවක් විය හැකිය (ක්‍රියා 2:6-8). එසේම එය මනුෂ්‍යයා විසින් නොදන්නාවූ භාෂාවක්ද විය හැකිය. මෙය නොදන්නා භාෂාවකින් කතාකිරීම ලෙසද හැඳින්වේ (1 කොරින්ති 14:2). අන් භාෂාවලින් කතා කිරීම ශුද්ධාත්ම බව්තිස්මය ලැබීමේ බාහිර භෞතික ලක්ෂණයකි. එහෙත් මෙම අන්භාෂාවලින් කතාකිරීම, අන්භාෂා දීමනාවට වඩා වෙනස්ය. අන්භාෂා දීමනාව නම් එය කථාකරන තැනැත්තා නොදන්නා භාෂාවකින් සභාව උදෙසා දෙවියන්වහන්සේගේ පණිවුඩය ගෙන ඒමට ඇති විශේෂ හැකියාවය.

**අන් භාෂා පරිවර්තනය :** අන් භාෂා පරිවර්තනය නම් කෙනෙකු අන් භාෂාවෙන් පැවසූ පණිවුඩය තේරුම් යන භාෂාවකින් පරිවර්තනය කොට ප්‍රකාශ කිරීමට ඇති විශේෂ හැකියාවය. ශුද්ධාත්මයාණන්වහන්සේ පරිවර්තන දීමනාව ඇති පුද්ගලයා හට පණිවුඩයෙහි අර්ථය දෙන සේක. එය භාෂාවන් ඉගෙනීමෙන් දැන ගෙන කරන පරිවර්තනය කිරීමක් නොවේ. එය ශුද්ධාත්මයාණන්වහන්සේගේ එළිදරව් කිරීමෙන් සිදුවන්නකි.

**මතක තබා ගන්න:** විවිධාකාර ලෙස සේවය කිරීම පිණිස මෙම දීමනා දෙවියන්වහන්සේගෙන් ලද විශේෂ දීමනා වේ. ඉහත දීමනා වල සාක්ෂි සමහරක් අපගේ ජීවිතවල තිබුනද එයින් අදහස්

කරන්නේ අපට යම් දීමනාවක් තිබෙන බව නොවේ. උදාහරණයක් ලෙස සියලුම ඇදහිලිවන්තයන් ඔතු හා දීමනාවලින් සේවය සදහා දිය යුතු වේ. එහෙත් දීමේ දීමනාව දෙවියන්වහන්සේගේ ආත්මය කරණකොටගෙන ලබන්නාවූ ත්‍යගශිලිභාවය වේ. දෙවියන්වහන්සේගේ වචනය අනුව සියලුම ඇදහිලිවන්තයන්ට යම් ප්‍රමාණයක ඇදහිල්ලක් දී ඇත. එහෙත් ඇදහිල්ලේ දීමනාව කරණකොටගෙන සාමාන්‍ය කිතුබැතියෙකුට විශ්වාස කළ හැකි ප්‍රමාණයට වඩා ඇදහිල්ලක් ඇත.

## ආත්මික දීමනා සොයාගැනීමේ ඇති වැදගත්කම

ඔබගේ ආත්මික දීමනා සොයාගැනීම වැදගත් වනුයේ ඇදහිලිවන්තයන් කැදවා ඇති ආත්මික පරමාර්ථ සහ අරමුණු ඉෂ්ඨ කිරීමට වේ (එපීස 4:12-15) . ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සභාවට දී ඇති තවත් හේතුවක් නම්, සාතන්ගේ දුෂ්ට බලවේගවලට එරෙහිව සටන් වදින පිණිස ආත්මික ආයුධ ලෙස භාවිත කිරීම සදහාය. ඔබගේ ආත්මික සතුරා සමග කාර්යක්ෂම අයුරින් සටන් වැදීම සදහා ඔබ සතු ආත්මික දීමනා හඳුනාගෙන භාවිත කිරීම වැදගත්ය.

ඔබ ඔබගේ ආත්මික දීමනාව හඳුනා නොගතහොත් ඔබ හට සේවය කිරීම සදහා දෙවියන්වහන්සේ ඔබට දීමනාවක් දී නොමැති ක්ෂේත්‍රයක ඔබ සේවයෙහි යෙදී සිටීමට උත්සහ දැරීමෙන් ප්‍රශ්න ඇති විය හැකිය. එමෙන්ම දෙවියන්වහන්සේ ඔබට දී ඇති දීමනාවන් භාවිත නොකිරීම නිසා ගණන් දීමටද සිදු වේ.

ඔබගේ ආත්මික දීමනාව හඳුනා ගැනීමෙන් ඔබ හට සේවය කිරීම සදහා දෙවියන්වහන්සේ ඔබට දීමනාවක් දී නොමැති ක්ෂේත්‍රයක ඔබ සේවයෙහි යෙදී සිටීමෙන් ඇතිවන අසහනයට පත් වීම වළක්වා ගත හැකිවනු ඇත. එමෙන්ම දෙවියන්වහන්සේගේ ශරීරය තුළ ඔබට ඇත්තාවූ පරමාර්ථය සම්පූර්ණ කිරීමට ඔබ සන්නද්ධ කරයි.

## ඔබගේ ආත්මික දීමනා (ව) සොයා ගැනීම

ඔබගේ ආත්මික දීමනා (ව) සොයා ගැනීම පිණිස පහත සදහන් උපදෙස් උපකාරී වනු ඇත.

### පළමු පියවර : නැවත - උත්පාදනය ලබාගන්න.

ඔබ නැවත - උත්පාදනය ලැබිය යුතුය. ස්වාභාවික උපත මගින් ඔබගේ ස්වාභාවික තලෙන්ත බිහිවූවාක් මෙන් ආත්මික උපත තුළින් ආත්මික දීමනා හිමි වේ. ඔබ ස්වාභාවික ලෝකයේ ඉපදුනේ නැත්නම් තලෙන්ත නොලැබෙනු ඇත. එසේම ඔබ ආත්මික ලෝකයට බිහි නොවූවහොත් ආත්මික දීමනා ලැබිය නොහැක (ක්‍රියා 2:38).

### දෙවන පියවර : ශුද්ධාත්ම බව්තිස්මය ලබාගන්න.

ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් පුරවන පිණිස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. ක්‍රියා 2 අධ්‍යයනය කරන්න.

### තුන්වන පියවර : ආත්මික දීමනා දැන හඳුනාගන්න.

පවතින ආත්මික දීමනා මොනවාදැයි ඔබ නොදනී නම්, දෙවියන්වහන්සේ ඔබට දී ඇති දීමනා (ව) කුමක්දැයි ඔබට හඳුනාගත නොහැකි වනු ඇත. ඔබ මෙම පාඨමාලාවෙහිදී ඉගෙන ගත් කරුණු මගින් දෙවියන්වහන්සේ ඇදහිලිවතුනට සපයා ඇති විවිධ දීමනා හඳුනාගැනීමේ හැකියාව ඔබට සපයා ඇත.

### හතරවන පියවර : දීමනා ඇති අයගේ ආදර්ශයන් නිරීක්ෂණය කරන්න.

ඔබ සතු දීමනාව සොයා යන අතර, විවිධ දීමනාවන් සතු පරිණත ආදර්ශ නිරීක්ෂණය කර බලන්න. "පරිණත ආදර්ශයක්" නම් කිසියම් ඇදහිලිවන්තයෙකු දිගු කාලීනව තමා සතු දීමනා කාර්යක්ෂම ලෙස භාවිත කරන පුද්ගලයාය.

උදාහරණයක් ලෙස, ඉගැන්වීමේ දීමනාව සතු කෙනෙකු සමග කතාකර බලන්න. ඔවුනට එම දීමනාව තිබෙන බව දැනගත්තේ කෙසේද, එය භාවිත කිරීමට ආරම්භ කළේ කෙසේද, තමුන්ගේ දීමනාව දියුණු කර ගැනීමට ඔවුන් කළේ කුමක්ද යනාදී කරුණු විමසා දැනගන්න. අනෙකුත් දීමනා සම්බන්ධයෙන්ද එසේම කරන්න. අනෙක් පරිනත ඇදහිලිවතුන් ඔවුන්ගේ දීමනා සොයා ගත් අයුරු දැනගැනීමත්, ඔවුන් එය භාවිත කරන ක්‍රමය නිරීක්ෂණය කිරීමත් මගින් ඔබට ඔබගේ දීමනාව හඳුනාගැනීමට උපකාරීවේ.

## පස්වන පියවර : ආත්මික දීමනාවක් සොයන්න.

ඔබ යම් දීමනාවකට ආශා නම් එය ගැන නිරාහාරව සිට යාච්ඤා කරන්න. ආත්මික දීමනාවලට ආශාවන්න කියා බයිබලය අපට පවසයි (1 කොරින්ති 12:31). අප සෑම කෙනෙකු සතුවම අඩු තරමින් එක් දීමනාවක්වත් පවතී. එහෙත් දැනට අප සතුව නොමැති එහෙත් අප ආශාවන දීමනාවක් සෙවිය හැකි බව මෙම පදය සනිටුහන් කරයි.

## හයවන පියවර : අත් තැබීම.

ඔබගේ ආත්මික නායකයා ඔබ මත අත් තබා යාච්ඤා කොට දෙවියන්වහන්සේ ඔබට ඔබගේ ආත්මික දීමනා පෙන්වා දෙන මෙන් ඉල්ලා සිටිය හැකිය (1 තිමෝති 4:14) .

> **සටහන:** පියවර එකේ සිට හය දක්වා අනුගමනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙසට දෙවියන්වහන්සේ ඔබ හට ආත්මික දීමනාව හෙළිකරදී තිබිය හැක. තවමත් මෙය සිදු වූයේ නැත්නම් ඊළඟ පියවර කිහිපය අනුගමනය කරන්න.

## හත්වන පියවර : ඔබගේ ආත්මික ආශාවන් විශ්ලේෂණය කරන්න.

ඔබ සේවය කිරීමේදී වඩාත්ම ප්‍රීතියෙන් යුක්තව නියැලෙන අංශ ඔබට දෙවියන්වහන්සේගේ දීමනා සපයා ඇති අංශ වේ. ස්වාභාවික ලෝකයෙහිදී ඔබ ලබන දීමනාවක් මගින් ඔබ ප්‍රීතියට පත් වෙන්නාක් මෙන් ආත්මික දීමනාද ප්‍රීතිය ගෙන දෙයි. ඔබ කිසියම් සේවා අංශයක් කෙරෙහි දැඩි "ඇල්මක්" හෝ "ලැදියාවක්" (දැඩි ආශාවක්,බරක්) දැක්වීම එම අංශයෙහි සාර්ථකව දෙවියන්වහන්සේට සේවය කිරීමට අවශ්‍යය.

උදාහරණ ලෙස පරිපාලන දීමනාව සහිත පුද්ගලයෙකු හට ඕනෑම කාරණාවක් සංවිධානය කොට මගපෙන්විය හැකිය. ඔහුට සභාවක් පාලනය කළ හැක, ක්‍රිස්තියානි පාසැලක් පාලනය කිරීම, මත් ද්‍රව්‍ය නිවාරණ මධ්‍යස්ථානයක් පරිපාලනය යනාදී සියල්ල කළ හැක. ඔහු තම දීමනාව භාවිත කිරීමට කිසියම් අංශයක් පිළිබඳ ලැදියාවක් හෝ බරක් දැරිය යුතුය. ඔහුට ක්‍රිස්තියානි පාසැලක් පිළිබද ලැදියාවක් නොමැති නම්, ඔහු සතුව පරිපාලන දීමනාව තිබෙන නුමුත් ඔහු එහි වැඩිකල් පවතින්නේ නැත.

ඔබගේ ආත්මික ලැදිකම හෝ උනන්දුව දක්වන බරක් ඇති අංශය සොයා ගැනීමට උපකාරි වන මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයන්න.

1. ඔබ වඩාත්ම ආකර්ෂණය වනුයේ කුමන ආකාර ජන කණ්ඩායමක් වෙතටද?

---

(ඔබව කිසියම් නිශ්චිත ජන කොටසකට කැඳවා ඇත්නම් ඔබගේ ආත්මික දීමනාව ඔවුන්ගේ අවශ්‍යතාවය හා බැඳී පවතී. උදාහරණයක් ලෙස ඔබ දරුවන් වෙතට කැඳවා ඇත්නම් ඔවුන් දෙවියන්වහන්සේ පිළිබදව අධ්‍යාපනය ලබනු දැකීමට ඔබ සතුටු නම්, ඔබට ඉගැන්වීමේ දීමනාව තිබිය හැක.)

2. ඔබගේ හැඟීම් ඉතාමත්ම දැඩිව ඇවිස්සීමට භාජනය වන්නේ කුමන අවශ්‍යතා සහිත අංශයන් දකිනවිටද?

---

(දෙවියන්වහන්සේ ඔබව කිසියම් අවශ්‍යතාවයක් පිරිමැසීමට කැඳවන විට එම අවශ්‍යතාවය කෙරෙහි ඔබගේ හැඟීම් දැඩි ලෙස කැළඹීමට පත්වේ)

3. ඔබ අසමත් විය නොහැකි නම්, ඔබ ස්වාමීන්වහන්සේ උදෙසා ඉටු කිරීමට කැමති දෙය කුමක්ද?

---

(දෙවියන්වහන්සේ පෞද්ගලික ආශාවනට ගරු කරන සේක.)

4. මෙම වාක්‍යය සම්පූර්ණ කරන්න : "මා තුල වර්ධනය වෙමින් පවතින දැඩි ඒත්තු ගැන්වීම නම් මම සහභාගිවී වැඩ කළ යුත්තේ...".

---

(එවැනි දැඩි ඒත්තුගැන්වීම බොහෝ විට දෙවියන්වහන්සේ ඔබගේ ආත්මයට කතාකොට ඔබ සේවය කළ යුතු ක්ෂේත්‍රය පෙන්වා දීමකි)

5. දෙවියන්වහන්සේ මාව ... සේවා අංශය වෙතට කැඳවා ඇති බව මම දැඩි ලෙස විශ්වාස කරමි.

---

(දෙවියන්වහන්සේ ඔබව කැඳවා ඇති සේවා අංශය ඔබ දනී නම්, ඔබගේ ආත්මික දීමනා හඳුනාගැනීමට පහසු වේ. මන්ද දෙවියන්වහන්සේ ඔබගේ කැඳවීම සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය ආත්මික දීමනා සපයන සේක)

6. ඔබ කුමන දීමනා පිළිබඳ සිතන විට හා භාවිත කරන විට වඩාත්ම සතුටක් ලැබේවිද?

---

(උදාහරණ ලෙස, ඔබ ඉගැන්වීමේ රස විඳිනවාද? ඔබ ආගන්තුක සත්කාරයට කැමතිද? සෙනඟ ඔබගේ නිවසට එනවාට කැමතිද? ඔබ නිරන්තරයෙන් මුදල් විශාල වශයෙන් දේව සේවයට දීමට පෙලඹෙනවාද?)

## අටවෙනි පියවර : ක්‍රිස්තියානි නායකයෙකු මගින් විශ්ලේෂණය කර බලන්න.

ඔබගේ ආත්මික හැකියාවන් ක්‍රිස්තියානි නායකයෙකු මගින් විශ්ලේෂණයට භාජනය කර බලන්න. පහත සඳහන් ප්‍රශ්න අසා එයට පිළිතුරු සටහන් කරගන්න.

1. ඔබ දැක ඇති පරිදි මම ක්‍රිස්තියානි සේවයෙහි කුමන අංශවල කාර්යක්ෂමව ක්‍රියා කරනවාද?

2. මාගේ කාර්යක්ෂමතාවය නිරීක්ෂණය කිරීමේ පදනම මත, ඔබ සිතන පරිදි මා සතු ආත්මික දීමනා මොනවාද?

## නවවෙනි පියවර : ඔබගේ පසුගිය ක්‍රිස්තියානි සේවාවන් විශ්ලේෂණය කර බලන්න.

ඔබගේ පසුගිය සේවය විශ්ලේෂණය කර බලන්න. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඔබ මිට පෙර සේවය කර ඇත්තේ ක්‍රිස්තියානි සේවයෙහි කුමන අංශවලද?

2. මින් ඔබ සාර්ථක වුයේ කුමන අංශවලදීද?

3. ඒ අතරින් සේවයෙහි යෙදීමෙන් වඩාත්ම ප්‍රීතිමත් වුයේ කුමන අංශවලදීද?

4. මේවා අතුරින් ඔබගේ කාර්යක්ෂමතාව ඔබගේ නායකයා/අනෙක් අය දුටුවේ කුමකදීද?

## දහවන පියවර : ආත්මික දීමනා ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන්න.

භාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් ඇති *"ශුද්ධාත්මයානන්ගේ සේවය"* යන පාඩමෙහි ආත්මික දීමනා පිළිබඳ ප්‍රශ්නාවලි දෙකක් සපයා දී තිබේ. මෙම පාඩම් මාලාව ලබාගෙන එම ප්‍රශ්නවලට ඔබ සපයන පිළිතුරු මගින් ඔබගේ ආත්මික දීමනා හඳුනාගැනීමට ඔබට උපකාරී වනු ඇත.

## එකොළොස් වන පියවර : ඔබට තිබේයැයි ඔබ සිතන දීමනා හඳුනාගන්න.

පහත සඳහන් කරුණු මත පදනම් කොට ගෙන ඔබට ඇතැයි ඔබ සිතන දීමනා හඳුනාගන්න.

1. අධ්‍යයනය තුළින් ඔබ ලබා ඇති දීමනා පිළිබඳ දැනුම

2. යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ ඔබට හෙළිකර දී ඇති කරුණු.

3. ඔබම විශ්ලේෂණය කොට සොයා ගත් දෑ.

4. ඔබගේ ජීවිතය පිළිබඳව ප්‍රධාන කිතුනු නායකයෙකු දැක ඇති කරුණු මත.

5. ඔබ මීට පෙර සේවය කර ඇති ක්ෂේත්‍රවල ඔබ ලැබූ කාර්යක්ෂම තත්වය මත.

6. ආත්මික දීමනා ප්‍රශ්නාවලිය සම්පූර්ණ කොට.

## දොළොස්වන පියවර : ආත්මික අවශ්‍යතා හඳුනාගන්න.

ඔබ මෙම ආත්මික දීමනා විශ්ලේෂණ ලැයිස්තුව සම්පූර්ණ කරන්නේ ඔබගේ සභාවේ දීමනා පාදක කරගත් සන්නද්ධ කිරීමේ කොටසක් ලෙස බැවින් ඔබගේ සභාවේ ආත්මික අවශ්‍යතා පාලකතුමා විසින් දැනටමත් සොයාගෙන ඇත. මෙම සභාවේ ආත්මික අවශ්‍යතාවල ලැයිස්තුවක් ඔබට දෙන මෙන් ඉල්ලන්න.

## දහතුන් වන පියවර : ආත්මික අවශ්‍යතාවයක් සම්පූර්ණ කරන්න.

ඔබ සෑදූ ආත්මික අවශ්‍යතා ලැයිස්තුවත් ඔබ හට දෙවියන්වහන්සේ සපයා දී තිබේයැයි ඔබ සිතන දීමනා ලැයිස්තුව හා සංසන්දනය කරන්න ඔබගේ පාලකවරයා ඔබට උපකාර වනවා ඇත. ඔබ සතුව ඇති දීමනාවලට ගැළපෙන ආත්මික අවශ්‍යතාවය සපුරාලීමට කැපවීමක් කරන්න. උදාහරණයක් ලෙස,

ඔබ සභාවේ ගුරුවරුන්ගේ අවශ්‍යතාවයක් තිබේයැයි ඔබ සිතනවා නම්, ඔබ සතුව ඉගැන්වීමේ දීමනාව තිබේයැයි දනී නම්, ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන්න. ඊළඟ පිටුවෙහි සපයා ඇති පෝරමය භාවිත කරන්න.

## දහහතර වන පියවර : ඔබගේ සේවය අගැයීමට ලක්කර බලන්න.

ඔබගේ දීමනාව සහිත ක්ෂේත්‍රයෙහි ටික කලක් සේවය කර බලා අගැයීමක් කරන්න. ඔබගේ ආත්මික දීමනාවෙහි සැබෑ ගබඩාකරවෙකු වනුයේ පහත සඳහන් කාරණා අනුවය.

- ඔබ සේවය කරන ක්ෂේත්‍රයෙහි සඵලවත් වන විට. එහි ප්‍රතිඵලය නම් ඔබ සේවය කරන අංශයෙහි සුභවාදී ප්‍රතිඵල දැකීමය.

- ඔබ තෘප්තිමත් වන විට... ඔබගේ සේවය ඔබට වින්දනයක් ගෙන දේ. ඔබ අසහනයට පත්වනවා නම්, ඔබගේ දීමනාවට ගැළපෙන ක්ෂේත්‍රයෙහි මෙහෙකරනවා නොවිය හැක.

- ඔබට ලැබෙන ප්‍රතිචාර (ඔබගේ ආත්මිත නායකයන්ගෙන් ඔබට ලැබෙන ප්‍රතිචාර) ඔබ හොඳට කාර්යක්ෂමව වැඩ කරන බවට.

ඔබ දැනට යෙදී සිටින සේවාව ඔබගේ ආත්මික හැකියාවනට නොගැළපේ නම් සහ ඔබ සාර්ථක නොවේ නම්, ඔබගේ දීමනා ලැයිස්තුව නැවත බලන්න. ඔබගේ දීමනාවලට ගැළපෙන පරිදි සේවය කිරීමට වෙනයම් ක්ෂේත්‍රයක් ලබාදෙන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

## ඔබගේ ආත්මික දීමනා හඳුනාගැනීමට සෝදිසි කිරීමේ ලැයිස්තුව

| | |
|---|---|
| පළමු පියවර : | - මම නැවත - උත්පාදනය ලබා ඇත්තෙමි. |
| දෙවන පියවර : | - මම ශුද්ධාත්ම බව්තිස්මය ලබා ඇත්තෙමි. |
| තුන්වන පියවර : | - මා හට විවිධ ආත්මික දීමනා හඳුනාගතහැක. |
| හතරවන පියවර : | - මම ආත්මික දීමනා පරිහරණය කරන පරිණත කිතුනුවන්ගේ ආදර්ශ නිරීක්ෂණය කර ඇත්තෙමි. |
| පස්වන පියවර : | - මම යාච්ඤාවෙන් හා නිරාහාරයෙන් යුතුව ආත්මික දීමනාවක් සොයා ඇත්තෙමි. |
| හයවන පියවර : | - මගේ ආත්මික නායකයන් මා පිට අත් තබා මගේ දීමනා(ව) එළිකරදෙන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා ඇත්තෙමි. |
| හත්වන පියවර : | - මම මගේ ආත්මික ඇල්ම විශ්ලේෂණය කර බලා ඇත්තෙමි. |
| අටවන පියවර : | - මාව මගේ ආත්මික නායකයා විශ්ලේෂණය කර ඇත. |
| නව වන පියවර : | - මම මගේ පසුගිය ක්‍රිස්තියානි සේවාව විශ්ලේෂණය කොට බැලුවෙමි. |
| දහවන පියවර : | - මම ආත්මික දීමනා ප්‍රශ්නමාලාව සම්පූර්ණ කළෙමි. |
| එකොළොස්වන පියවර : | - මා හට තිබේයයි මම විශ්වාස කරන ආත්මික දීමනා මම හඳුනාගෙන ඇත්තෙමි. |
| දොළොස්වන පියවර : | - මම මාගේ නිවසෙහි, ප්‍රජාවෙහි හා සභාවෙහි පවතින ආත්මික අවශ්‍යතා හඳුනාගෙන ඇත්තෙමි. |
| දහතුන්වන පියවර : | - මම මාගේ දීමනාව, අවශ්‍යතාවයක් සමග ගළපා එය ඉටු කිරීමට අරඹා ඇත්තෙමි. |
| දහ හතර වන පියවර : | - මම එම ක්ෂේත්‍රයෙහි මගේ සේවය අගැයීමට ලක් කොට, එය සාර්ථක බව සොයා ගතිමි. |

# ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමු වන පරිච්ඡේදය :

1. නුමුත් යේසුස්වහන්සේ ඔවුන් තමන් ළඟට කැඳවා, අන්‍යජාතීන්ගේ ආණ්ඩුකාරයන් ඔවුන් කෙරේ අධිපතිකම් කරන බවත් ඔවුන්ගේ උත්තමයන් ඔවුන් කෙරේ බලය පත්වන බවත් නුඹලා දනිහුය. නුඹලා අතරේ එසේ නොවන්නේය. නුඹලා අතරේ යමෙක් උතුම් වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ සේවකයා වන්නේය. (මතෙව් 20: 25,26)
2. "හැසිරවීම" යනු "ආත්මාර්ථකාමී පරමාර්ථයන් සඳහා යම් පුද්ගලයෙකු දක්ෂ ලෙස පාලනය කිරීම හෝ යොමු කිරීම වේ". හසුරුවන්නෙකු අන් අය තමාගේ අරමුණු ඉටු කිරීමට "ද්‍රව්‍ය" ලෙස භාවිත කරයි. සූරාකයි.
3. "සන්නද්ධ කිරීම" යනු "ක්‍රියාකාරී සේවයක් සඳහා යම් කෙනෙකු සූදානම් තත්ත්වයකට ගෙන ඒම, යම් කෙනෙකු ගේ ශක්තිය ක්‍රියාවක් සඳහා භාවිත කිරීම" වේ. පුළුල්ව බැලූවිට සන්නද්ධ කිරීම යන්නෙන් දක්වන්නේ, ලෝකයා ඉවැන්ජලිස්ත කිරීමේ කාර්යය සම්පූර්ණ කිරීමට තමාගේ උපක්‍රමික ස්ථානය සොයාගන්නා තුරු දෙවියන්වහන්සේගේ සෙනඟ අවදි කරන, සිත් යොමු කරන හා වර්ධනය වන සිද්ධියකට වේ.
4. ආත්මික සන්නද්ධ කිරීම අන් පුද්ගලයන් මගින් හැසිරවීමට වඩා වෙනස් වේ. මන්ද එය පදනම් වන්නේ බයිබලීය මූලධර්ම මත වන අතර එහි පෙලඹවීම කේන්ද්‍රගත කර ඇත්තේ මනුෂ්‍යයා වෙත නොව දෙවියන්වහන්සේ වෙත බැවිනි. එය මාංසය මත හෝ තමා වෙත කේන්ද්‍ර ගත කර ගෙන නැත. එය අවශ්‍යතා මුල් කර ගත් සේවයක් නොව නියෝග මුල් කර ගත් සේවයකි.
5. පළමු පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න.
6. ආත්මික සම්පත් සන්නද්ධ කිරීම පිළිබඳව අප සැලකිලිමත් විය යුතුය. මන්ද අපගේ ලෝකයේ මහා ආත්මික අස්වැන්න නෙළා ගැනීමට ඇති එකම මාර්ගය එය බැවිනි. අප ආත්මික සම්පත් සන්නද්ධ කරන්නේ ධර්මදානය සඳහා වේ.

## දෙවන පරිච්ඡේදය :

1. "එබැවින් විසුරුවනු ලැබූ ඔව්හු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය." (ක්‍රියා 8:4)

2. ස්වාමීන්වහන්සේ සභාවට විශේෂ නායකත්ව දීමනා දී ඇත්තේ දේව සේවය සඳහා මනුෂ්‍යයන් සන්නද්ධ කිරීම සඳහා බවය. ප්‍රේරිතයන්, දිවැසිවරුන්, ඉවැන්ජලිස්තවරුන්, සභා පාලකයන් ගුරුවරුන් යන සියලු දෙනා "සන්නද්ධ" කරන්නෝ වනු ඇත. ඔවුන් දේව සේවයේ වැඩකටයුතු සඳහා ඇදහිලිවතුන් සන්නද්ධ කිරීමට දෙවියන්වහන්සේ දී ඇති විශේෂ සේවක දීමනා වේ.
   සෑම ඇදහිලිවන්තයෙකුම තුළම ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩ විසීම හා ඔවුන්ට ආත්මික දීමනා දායාද කොට දීමෙන් ද සහතික කෙරෙන්නේ ක්‍රිස්තුන්වහන්සේගේ මුළු ශරීරයම සන්නද්ධ කිරීම දිව්‍යමය ආලේප කිරීමක් බවය. (රෝම 12:3-8 හා 1කොරින්ති 12:1-31 බලන්න)

3. ඔබගේ පිළිතුරු 2 පරිච්ඡේදයේ සන්නද්ධ කිරීම ගම්‍ය කෙරෙන බයිබලීය පද පිළිබඳ සාකච්ජාව හා සංසන්දනය කරන්න.

4. ඔබගේ පිළිතුර දෙවන පරිච්ඡේදයේ දී ඇති ආඥාව හා සසඳන්න.

5. ඔබගේ පිළිතුර දෙවන පරිච්ඡේදයේ සාකච්ජාව හා සසඳන්න.

6. ඔබගේ ලයිස්තුව දෙවන පරිච්ඡේදයේ දී ඇති නිදසුන් හා සසඳන්න.

7. ඔබගේ සාරාංශය දෙවන පරිච්ඡේදයේ සාකච්ජාව හා සසඳන්න.

## තුන්වන පරිච්ඡේදය :

1ශ "සාලමොන් යාච්ඤාකොට නිමකළ විට අහසින් ගිනි බැස ඇවිත් දවන පූජාවද යාගයන්ද දවාදැම්මේය. ස්වාමින්වහන්සේගේ තේජසින් ගෘහය පිරීගියේය. ස්වාමින්වහන්සේගේ තේජසින් ස්වාමින්වහන්සේගේ ගෘහය පිරී තිබුණු නිසා පූජකයන්ට ස්වාමීන්වහන්සේගේ ගෘහයට ඇතුල්වෙන්ට බැරිවිය. සියලු ඉශ්‍රායෙල් පුත්‍රයෝ ගිනි බසිනවාත් ස්වාමීන්වහන්සේගේ තේජය ගෘහය පිට තිබෙනවාත් දැක, ගල් අතුළ බිමට තිබෙනවාත් දැක, ගල් අතුළ බිමට තමුන්ගේ මුහුණු නමා නමස්කාරකොට: මක්නිසාද උන්වහන්සේ කරුණාව සදාකල් පවත්නේය කියමින් ස්වාමින්වහන්සේට ස්තුති කළෝය." (2 ලේකම් 7:1-3)

2. ස්වාභාවික ලෝකයෙහි ගින්නෙහි ධනාත්මක වාසි බොහෝ තිබේ. ගින්න ශක්තිය හා උණුසුම සපයයි. එය ආහාර පිළියෙල කිරීමට භාවිත කරයි. පාලනය කළ ගින්නකින්, වඩාත් යහපත් අස්වැන්නක් ලබා ගැනීමට පොළොව සාරවත් කරන අළු ලැබේ.
ගින්න අපද්‍රව්‍ය දවාලයි. එය රන් හා රිදීවල අපද්‍රව්‍යද දවාලයි. ගින්න මිනිසුන් ආකර්ෂණය කරයි. යම්කිසි දෙයක් ගිනි ගත් විට එතැනට රැස්වෙන සෙනඟගෙන් මෙය පෙනේ. ගින්නක් තවත් ගිනි දල්වයි. එහෙත් අඛණ්ඩව ඉන්ධන නොසැපයුවහොත් ගින්නක් නිවී යෑම සාමාන්‍ය දෙයකි. කෙසේ වුවද නිවෙන්නට ආසන්න ගිනි දැල්ලක්, පවන් ගැසීමෙන් නැවතත් දීප්තිමත් ලෙස ඇවිළිය හැකිය.

3. දෙවියන්වහන්සේගේ ගින්න යනු පෙන්තකොස්ත දින අත්දුටු ගින්න වේ. එය කතා කිරීමට ඔබගේ දිව ලිහිල් කරන හා ශ්‍රේෂ්ඨ පැවරුම සාක්ෂාත් කිරීමට ඔබට බලය දෙන ගින්නකි.

4. තෙවන පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න.

5. තෙවන පරි. දෙවියන්වහන්සේගේ ගින්නේ පරවාර්ථය යන සාකච්ජාව බලන්න.

6. - නැවත උත්පාදනය ලැබිය යුතුවේ.
- ශුද්ධාත්මයාණන්ගේ බව්තිස්මය ලබාගන්න.
- ගින්න මගින් ඔබගේ ජීවිතය පවිත්‍ර කෙරේවා.
- වෙනත් ගිනි අවුලන්න.
- ගින්නට අඛණ්ඩව ඉන්ධන සපයන්න.

## හතරවන පරිච්ඡේදය

1. නැගිට බැබළියන්න. මක්නිසාද නුඹේ ආලෝකය පැමිණුණේය. ස්වාමින්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි උදාවිය. එසේය පොළොව අන්ධකාරයෙන්ද ජනයෝ තද අන්ධකාරයෙන්ද වසනු ලබන්නෝය. නුමුත් නුඹ කෙරෙහි ස්වාමින්වහන්සේ උදාවන සේක. උන්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි පෙනෙන්නේය. (යෙසායා 60:1-2)

2. "තේජාලංකාරය" යන්න ඉතා විශිෂ්ට වචනයකි. ඊට සමාන පදයක් ලෙස එක් වචනයක් නොමැත. එහෙත් "තේජාලංකාරය" විස්තර කළ හැකි පද කීපයක් මෙසේ වේ: ගෞරවය, ප්‍රශංසාව, ප්‍රශස්ත බව, දීප්තිය, බලය, මහේශාඛ්‍ය බව, වටිනාකම, සමානත්වය, අලංකාරය, කීර්තිය, තරාතිරම.
දෙවියන්වහන්සේ පිළිබඳව තේජාලංකාරය යන වචනය භාවිත කළ විට ඉන් ප්‍රකාශ වන්නේ උන්වහන්සේගේ දිව්‍යමය සාරය වේ. දෙවියන්වහන්සේගේ තේජාලංකාරය යනු උන්වහන්සේගේ විශිෂ්ටත්වය, අලංකාරය, මහේශාඛ්‍ය බව, බලය හා පරිපූර්ණත්වය ප්‍රදර්ශනය කිරීමකි.

3. තේජාලංකාරයේ ප්‍රභවය දෙවියන්වහන්සේ වේ.

4. ඔබගේ සාකච්ජාව හතරවන පරිච්ඡේදයේ සඳහන් දේ හා සංසන්දනය කරන්න.

5. ඔබගේ සාකච්ජාව හතරවන පරිච්ඡේදයේ සඳහන් දේ හා සංසන්දනය කරන්න.

6. මෙම ප්‍රකාශය වැරදිය. තේජාලංකාරය දෙවියන්වහන්සේගේ ත්‍යාගයකි.

## පස්වන පරිච්ඡේදය

1. එවිට ස්වාමින් වහන්සේගේ තේජස ප්‍රකාශවන්නේය. සියලු මනුෂ්‍යයෝ එක්ව එය දකින්නෝය. මක්නිසාද ස්වාමින්වහන්සේගේ මුඛය එය වදාළ සේකැයි මොරගසන්නෙකුගේ හඬක් වන්නේය. (යෙසායා 40:5)
2. පස්වන පරිච්ඡේදයේ සාකච්ජාව නැවත බලන්න

## හයවන පරිච්ඡේදය

1. යේසුස්වහන්සේ : නුඹ විශ්වාස කළොත් දෙවියන්වහන්සේගේ මහිමය දකින්නෙහිය කියා මා කීවා නොවේදැයි ඇට කීසේක. (යොහන් 11:40)
2. හයවන පරිච්ඡේදයේ ඇති සාකච්ජාව සමග ඔබගේ පිළිතුර සසඳන්න
3. ඔබ දෙවියන්වහන්සේ මහිමයට පත්කරන විට උන්වහන්සේ ඔබ තුළින් උන්වහන්සේගේ මහිමය වඩවඩාත් එළිදරව් කරනු ඇත. උන්වහන්සේ කර ඇති දෙයට ඔබ මහිමය දෙන විට. ඔබගේ සේවය සඳහා ඔබ සන්නද්ධ කිරීමට ඔබට තව තවත් මහිමය ලැබෙනු ඇත.

## හත්වන පරිච්ඡේදය

1. මෙසේ සියලු ඉශ්‍රායෙල්වරු ඔල්වර හඬත් හොරණෑ-ශබ්දයත් ඇතුව නළාවලිනුත් අත්තල්වලිනුත් වීණාවලිනුත් මහා වීණාවලිනුත් ශබ්ද පවත්වමින් ස්වාමින්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ගෙනාවෝය. (1 ලේකම් 15:28)
2. මෝසෙස්ගේ මණ්ඩපය මෙන්, ඔබ දෙවියන්වහන්සේගේ මණ්ඩපය වේ. ඔබ ඔබගේ ආත්මික ජීවිතය නියමිත සැලැස්ම අනුව ගොඩනගන්නෙහි නම් තේජාලංකාරය එහි පවතිනු ඇත. ඔබ රටාව ඉවත කළහොත් තේජාලංකාරය ඉවත් වේ.

3. එබෙන්-එශෙර්, අපෙක්, අෂ්දොද්, ගාත්, එක්‍රොන්, බෙත්-ෂෙමෙෂ්, කිරියත්-ජෙයාරීම්, යෙරුසලම

4. 
   1. ආශාව
   2. අධිෂ්ඨානය
   3. දිගාව
   4. නිවැරදි නියෝගය

## අටවන පරිච්ඡේදය

1. මෙයින් පසු මම හැරී ඇවිත් දාවිත්ගේ වැටුණාවූ මණ්ඩපය නැවත ගොඩනඟා, එහි නටබුන් තැන් නැවත ගොඩනඟා ඒක පිහිටුවන්නෙමි... (ක්‍රියා 15:17)

2. "දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීම" යනු "මාර්ගයද, සත්‍යයද, ජීවනයද" වන යේසුස්වහන්සේට වැඩ වාසය කිරීම උදෙසා ආත්මික මණ්ඩපයක් ප්‍රතිසංස්කරණය කිරීම වේ. පළමු මණ්ඩපයේ මෙන්ම, මෙම ආත්මික මණ්ඩපයෙහිද ක්‍රිස්තුස්වහන්සේගේ තෙආකාර දිවැසිවර, පූජක හා රාජකීය මෙහෙවර අන්තර්ගත වේ. එය දෙවියන්වහන්සේගේ බලයේ, අභිමුඛයේ හා තේජසේ වාසස්ථානයය. දෙවියන්වහන්සේ වැඩ වාසය කරන්නේ ෂීලෝහි පැවති පැරණි විධිමත් වත් පිළිවෙත් සහිත නමස්කාරයේ නොවේ. උන්වහන්සේගේ අලුත් වාසස්ථානය දාවිත්ගේ මණ්ඩපයේ වේ.

3. අටවන පරිච්ඡේදයේ සඳහන් කරන ඕනෑම යොමුවක් ඔබට සඳහන් කරන්නට හැකිවේ.

4. දාවිත්ගේ මණ්ඩපය නැවත ගොඩනඟනු ලබන්නේ "පෙර තිබුණු තත්ත්වයට" සමාන තත්ත්වයක් ඇතිවූ අවස්ථාවක වේ.
5. එය "නියෝගය" ලෙස ප්‍රතිසංස්කරණය කරනු ඇත.

6. අටවන පරිච්ඡේදයේ ඇති සාකච්ඡාව සමඟ ඔබගේ පිළිතුර සසඳන්න.

## නවවන පරිච්ඡේදය

1. නුමුත් සැබෑ නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද පියාණන්වහන්සේට නමස්කාර කරන කාලය පැමිණෙන්නේය. දැනටම පැමිණ තිබේ. මක්නිසාද පියාණන්වහන්සේ තමන්ට නමස්කාරකරන්නන් වන පිණිස එබඳුවූවන් සොයන සේක. දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කර යුතුයැයි කීසේක. (යොහන් 4:23-24)
2. නමස්කාර කිරීමෙන් අදහස්වන්නේ ගෞරව කිරිම, සිඹිම, ප්‍රාණමය දැක්විම, සම්මානය පිදීම ගරුබිය ඇතිව සිටීම, භක්තිය පෙන්විම, වැඳ වැටීම හා බුහුමන් දැක්විම වේ. නමස්කාරය යනු දෙවියන්වහන්සේ පිළිගැනීම හා උන්වහන්සේගේ ස්වභාවය, ගුණාංග, මාර්ග හා උන්වහන්සේගේ ඉල්ලීම් පිළිගෙන උන්වහන්සේට ප්‍රශංසා කිරීමෙන් හෝ කිතුනු සේවය තුළින් යහපත් ක්‍රියාවක් කිරිම හෝ වේ. “සේවය කිරිමම යන්න නමස්කාර කිරීම යන අදහස දේ. නමස්කාරය යනු යම් කෙනෙකුට වටිනාකමක් දීමය. එය දෙවියන්වහන්සේට කෙරෙන ක්‍රියාකාරි ප්‍රතිචාරයකි. ඉන් අපි උන්වහන්සේගේ වටිනාකම ප්‍රකාශ කරන අතර උන්වහන්සේ උත්සවාකාරයෙන් සමරන්නෙමු. එමෙන්ම උන්වහන්සේගේ නාමය ගැන ආඩම්බර වෙමු.
3. නවවන පරිච්ඡේදය ආත්මයෙන් නමස්කාර කිරීම පිළිබඳ සාකච්ජාව බලන්න.
4. නවවන පරිච්ඡේදයේ සැබෑ ලෙස නමස්කාර කිරීම පිළිබඳ සාකච්ජාව බලන්න.
5. අප නමස්කාර කරන්නේ ආදර්ශය, අනුශාසනාව හා සදාතන ඉරණම නිසාය.
6. නමස්කාර කිරීමේ රටාවට මේවා අන්තර්ගතය.

| | |
|---|---|
| - මහිමවත් කිරීම | දෙවියන්වහන්සේ (ඉහළට) |
| ගුණ නැණ වැඩීම | ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ( ඇතුලට) |
| ශුභාරංචිය ප්‍රකාශ කිරිම | විනාශ වන්නන් (පිටතට) |

7. නවවන පරිච්ඡේදයේ සාකච්ජා කර ඇති ඕනෑම ප්‍රතිඵල පහක් ලයිස්තුගත කළ හැකිය.
8. නමස්කාර කිරීමේ ක්‍රම පහ වන්නේ මේවාය.
   ස. පශ්චාතාපවීමේ නමස්කාරය
   සස. පිළිගැනීමේ නමස්කාරය
   සසස. භක්තිමත් නමස්කාරය
   සඩ. කැපවීමේ නමස්කාරය
   ඩ. යුද්ධ කිරීමේ නමස්කාරය
9. හෙබ්‍රෙව් 10:22
10. නවවන පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න
11. නවවන පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න

## දහවන පරිච්ඡේදය

1. රබානෙන් හා නැටීමෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්. කුඩා වීණාව හා මහා වීණාවෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්. (ගීතාවලිය 150:4)

2. නමස්කාර කරන ආකාරය පිළිබඳව බයිබලය උගන්වන දේ ගැන දහවන පරිච්ඡේදයේ ඇති සාකච්ජාව බලන්න.

3. ශුද්ධ කිරීමේ හා පවිත්‍ර කිරීමේ මහත් බලයෙන් යුක්ත දෙවියන්වහන්සේගේ ගින්න, උන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව් කිරීමට අවශ්‍ය වේ. එවිට දෙවියන්වහන්සේගේ තේජාලංකාරය එළිදරව් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපි ආත්මයෙන් හා සැබෑකමින් නමස්කාර කිරීම තුළින් දාවිත්ගේ මණ්ඩපය ප්‍රතිස්ථාපනය කරන බැවින් සැබෑ නමස්කාරයේ යෙදෙන්නෙමු.

## එකොළොස්වන පරිච්ඡේදය

1. එබැවින් ස්වාමීන්වහන්සේ ඉදිරියෙන් සැනසිලි කාලයන් පැමිණෙන ලෙසද, නුඹලා උදෙසා නියම කරන ලද්දාවූ ක්‍රිස්තුස්වහන්සේ, එනම් යේසුස්වහන්සේ එවන පිණිසද, නුඹලාගේ පාපයත් මකාදමනු ලබන පිණිසද පශ්චාත්තාපව හැරෙන්න. (ක්‍රියා 3:19-20)

2. පිබිදීම පිළිබඳ දේව වචනයේ රේමා එළිදරව් විමක් ඇතිව එම මූලධර්ම ඉගෙනගන හා භාවිත කරන සෙනඟ වෙනුවෙන් හා සෙනග තුළින් කෙරෙන දෙවියන්වහන්සේගේ අධිසාමාන්‍ය, සර්වබලධාරී ක්‍රියාවකි.
3. දේව වචනයේ එළිදරව් කර ඇති මූලධර්ම අනුගමනය කිරීමෙන් අප ඊට සූදානම් විය යුතුය. පිබිදීම යනු දෙවියන්වහන්සේගේ ආත්මයේත් දෙවියන්වහන්සේගේ සෙනඟගේ ප්‍රතිචාරයේත් ඒකාබද්ධ දෙයකි.

4. පිබිදීම සැම විටම අවශ්‍ය වේ. එහෙත් එය වඩාත්ම අවශ්‍ය වන්නේ පසුබට තත්ත්වයක් පෙනෙන්නට ඇති විටය.

5. පසුබට තත්ත්වයක් ගැන පිළිබඳව සාක්ෂි ගැන 11 වන පරිච්ඡේදයේ සාකච්ජාව බලන්න.

6. පිබිදීම ගෙන ඒමට දෙවියන්වහන්සේ යොදාගන්නා මනුෂ්‍යයෙකුගේ ආකාරය පිළිබඳව නව ගිවිසුමේ උදාහරණය වන්නේ යොහාන් බව්තීස්ත තුමාවේ.

7. පිබිදීමට ඇති බාධා පිළිබඳව 11 වන පරිච්ඡේදයේ ඇති සාකච්ජාව බලන්න.

## දොළොස්වන පරිච්ඡේදය

දොළොස්වන පරිච්ඡේදය සඳහා ස්වයං පරීක්ෂණයක් නොමැත.

## දහතුන්වන පරිච්ඡේදය

1. මාගේ නාමය දරන මාගේ සෙනඟ යටත් වී යාච්ඤා කර මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු මාර්ග අත්හැරියොත්, මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමාකොට ඔවුන්ගේ දේශය සුව කරන්නෙමි. (2 ලේකම් 7:14)

2. දහතුන්වන පරිච්ඡේදයේ සඳහන් කර ඇති පිබිදීමේ මූලධර්ම හත බලන්න.

3. 2 ලේකම් 7:14

4. යටහත් වීම, යාච්ඤා කිරීම, දෙවියන්වහන්සේගේ මුහුණ සෙවීම හා නපුරු මාර්ග අත් හැරීම.

5. ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් දෙවියන්වහන්සේ කරන දේවල් තුනක්

- "ස්වර්ගයේ සිට සවන් දීම" ප්‍රතිචාරය
- "ඔවුන්ගේ පාපවලට කමාව දීම" සමාදානය කිරීම
- "ඔවුන්ගේ දේශය සුව කිරීම" පුනරුත්ථාපනය

## දහහතරවන පරිච්ඡේදය

1. එහෙත් මා සමඟ ගිය මාගේ සහෝදරයෝ සෙනඟගේ සිත් දියව යන්ට සැලැස්සුවෝය. නුමුත්
මම සම්පූර්ණ ලෙස මාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ අනුව ගියෙමි. (යෝෂුවා 14:8)

2. යෝෂුවා

3. ඔහු මෙවැනි කෙනෙක් විය.
   - දෙවියන්වහන්සේ පවසන දෙය ඇසිණි.

- අතීතය අමතක කළ හැකි විය.
- තමාට අයත් දේ දැන සිටියේය.
- ශක්තිමත්ව ධෛර්යවත්ව සිටියේය.
- සාර්ථකත්වයට අවශ්‍ය මූලික දෙය දැන සිටියේය.
- තමා මත දෙවියන්වහන්සේගේ ආත්මය තිබිණි.
- දෙවියන්වහන්සේ ගැන විශ්වාසය තිබිණි.
- ඇදහිල්ලේ මනුෂ්‍යයෙක් විය.
- සේවකයෙකුගේ සිතක් තිබිණි.
- ප්‍රඥාවෙන් පූර්ණව සිටියේය.
- පහසුවෙන් ඉගැන්විය හැකි විය.
- මිනිසුන් පොලඹවන්නෙක් විය.
- සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේ අනුගමනය කළේය.
- තනිව සිටගෙන සිටීමට දැන සිටියේය.
- යුධ සංග්‍රාම ගැන අත්දැකීම් තිබිණි.
- දෙවියන්වහන්සේ සමඟ පළමු පෙළේ අත්දැකීම් තිබිණි.
- දෙවියන්වහන්සේ විසින් ආලේප කරන ලදී.
- දෙවියන්වහන්සේගේ මහිමාලංකාරය අත්දැක තිබිණි.

## පහළොස්වන පරිච්ඡේදය

1. ... ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා පසුකර, සම්පූර්ණවීමට පැමිණෙමු. (හෙබ්‍රෙව් 6:2)
2. පහළොස්වන පරිච්ඡේදයේ සඳහන් රුධිරය, පිහිය, එල හා කඩුව පිළිබඳ සාකච්ඡා බලන්න.

3. “කිරි”වල සිට දේවවචනයේ “මස්”වලට ඇදහිලිවතුන් නොයෑමට හේතු තුනක්:
   - පළමුව, ඔවුහු දේව වචනයේ නුපුහුණු අය වෙති.
   - දෙවනුව, ඔවුන්ට ඉගැන්වූ දේ ඔවුහු ව්‍යවහාර නොකරති.
   - තෙවනුව, ඔවුන් මාංසිකය. පාවුලුතුමා කොරින්ති සභාවට පැවසිය.

4. “කිරි” වල සිට දේවවචනයේ “මස්”වලට ඇදහිලිවන්තයෙකුට යා හැක්කේ වචනයේ කිරිවලට ආසාවක් ඇති වීම, දේව වචනයේ කිරිවලට කීකරුවීමට ඔවුන් ඔවුන්වම හික්මවා ගැනීම සහ දේව වචනයේ මස් සෙවීමට ඔවුන්ගේ කැපවීම ආදියෙනි.

## දහසයවන පරිච්ඡේදය

1. යුද්ධයට සැරසුණු අය සතළිස් දහසක් පමණ ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි යෙරිකෝවේ සමභූමිවලට යුද්ධය පිණිස මෙතෙරට ආවෝය. (යෝෂුවා 4:13)
2. දහසය වන පරිච්ඡේදයේ සාකච්ජාව පුනරීක්ෂණය කරන්න.

## දහහත්වන පරිච්ඡේදය

1. ඔහුගේ මලපතෙන් මිදෙන පිණිසද, දෙවියන්වහන්සේ ඔවුන්ට පසුතැවිල්ලද දෙනසේක්දෝයි බලමින් මෘදුකමින් ඔවුන්ට තරවටුකරන්ට ඕනෑය. (2 තිමෝති 2:26)

2. ප්‍රතිපත්ති, උඩඟුකම, අවබෝධය, යාච්ඤා රහිත බව

3. ඔබගේ සාරාංශය 17 පරිච්ඡේදයේ දී ඇති සාකච්ජාව හා සසඳන්න.

4. - එළිදරව්වීම,
   - පසුතැවිලිවීම,
   - ප්‍රතිස්ථාපනය,
   - ආපසු පැමිණීම.

## දහඅටවන පරිච්ඡේදය

1. ඉශ්රායෙල් පුත්‍රයන්ගේ දේශයෙහි අනාක්වරුන් එක්කෙනෙක්වත් ඉතුරු නොවීය. ගාසාහිද ගාත්හිද අෂ්දොද්හි ද පමණක් ඔව්හු ඉතුරුව සිටියෝය. (යෝෂුවා 11:22)

2. ගාසා, ගාත් හා අෂ්දොද්

3. දහඅටවන පරිච්ඡේදයේ සාකච්ඡාව බලන්න.

4. ඔබගේ ජීවිතයේ යෝධයන් ඉවත් නොකළහොත් ඔවුන් “කටු හා මලපත්” බවට පත්වනවා ඇත.

5.
   1. සූදානම් වන්න
   2. ප්‍රකාශ කරන්න
   3. ඔප්පු කරන්න
   4. සතුරා වෙතට යන්න
   5. නිවැරදි චේතනාව
   6. පරිපූර්ණ රටාව
   7. බල පැවැත්වීම

## දහනවවන පරිච්ඡේදය

1. සහෝදරයෙනි, ආත්මික දීමනා ගැන නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමි. (1 කොරින්ති 12:1)

2. “දීමනා-පාදක කරගෙන සන්නද්ධ කිරීම” යනු සෙනඟ කණ්ඩායමක් ඔවුන්ගේ ආත්මික දීමනා පදනම් කරගෙන දේව සේවයේ වැඩ කටයුතු සඳහා සංවිධානය කිරීම වේ. මෙහි සංක්ෂිප්තව දක්වා ඇති ක්‍රියා පිළිවෙළ මූලිකවම සෙනඟට ඔවුන් කැඳවා ඇති හා සන්නද්ධ කර ඇති දේ කිරීමට මඟපෙන්වයි.

3. ආත්මික දීමනා සොයාගන්න. සේවා අවශ්‍යතා හඳුනාගන්න. සෙනඟ දීමනා හා අවශ්‍යතා සසඳන්න.

4. වරින් වර සෑම සාමාජිකයෙකුම හා ඔවුන්ගේ සේවාව ඇගයීමට ලක් කරන්න. ඔවුන් ඔවුන්ගේ දීමනාවන්ට අනුව නියමිත ස්ථානයේ තබා ඇත්දැයි ඔබට මෙසේ දැනගත හැකිය.

   - ඔහු සේවය කරන ක්ෂේත්‍රයේ ඵලදායීව කටයුතු කරයි. මින් අදහස් වන්නේ ඔබට ඔහුගේ සේවයේ ධනාත්මක ප්‍රතිඵල දැකගත හැකි බවය.

   - ඔහු ප්‍රීතියෙන් හා තෘප්තිමත්ව සේවය කරයි. ඔහු කළකිරී ඇත්නම් ඔහු සේවය කරන්නේ ඔහුට දීමනාවක් නැති ක්ෂේත්‍රයක විය හැකි වේ.

   - ඔහුගේ සේවය ලබන අයගෙන් ලැබෙන ප්‍රතිපෝෂණය ධනාත්මක නම් ඉන් පෙන්වන්නේ ඔහු සේවය කරන තනතුරේ ඵලදායීව කටයුතු කරන බවය.

5. ප්‍රේමය